213 වන කාණ්ඩය - 5වන කලාපය
தொகுதி 213 - இல. 5
Volume 213 - No. 5

2012 නොවැම්බර් 23වන සිකුරාදා
2012 நவம்பர் 23, வெள்ளிக்கிழமை
Friday, 23rd November, 2012

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
විරාගත සම්ප්‍රදායානුකූලව සෙංකෝලයට ගරු කිරීම

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2013 - [දොළොස්වන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 118, 285 (කෘෂිකර්ම); ශීර්ෂ 179, 281, 284 (ගොවිජන සේවා සහ වනජීවී ); ශීර්ෂ 140, 292 (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන); ශීර්ෂ 139, 290 (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදි

**කල් තැබීමේ යෝජනාව:**
"වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය" මැඩලීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சம்பிரதாயப்படி செங்கோலுக்கு மதிப்பளித்தல்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013: [ஒதுக்கப்பட்ட பன்னிரண்டாம் நாள்]:**
[தலைப்புகள் 118, 285 (கமத்தொழில்); தலைப்புகள் 179, 281, 284 (கமநல சேவைகள் மற்றும் வனசீவராசிகள்); தலைப்புகள் 140, 292 (கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி); தலைப்புகள் 139, 290 (கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி)] – குழுவில் ஆராயப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
"வெலிகம தென்னோலை வாடல் நோயை" கட்டுப்படுத்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Respect for Mace in keeping with time-honoured Traditions

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2013 - [Twelfth Allotted Day]
Considered in Committee – [Heads 118, 285 (Agriculture); Heads 179, 281, 284 (Agrarian Services and Wildlife); Heads 140, 292 (Livestock and Rural Community Development); Heads 139, 290 (Fisheries and Aquatic Resources Development)]

ADJOURNMENT MOTION:
Control of "Weligama Coconut Leaf Wilting Disease"

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 නොවැම්බර් 23වන සිකුරාදා***
*2012 நவம்பர் 23, வெள்ளிக்கிழமை*
*Friday, 23rd November, 2012*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### චිරාගත සම්ප්‍රදායානුකූලව සෙංකෝලයට ගරු කිරීම
### சம்பிரதாயப்படி செங்கோலுக்கு மதிப்பளித்தல்
### RESPECT FOR MACE IN KEEPING WITH TIME-HONOURED TRADITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තුවේ රැස්වීම් ආරම්භයේදී හා අවසානයේදී සෙංකෝලය රැගෙන යාම චිරාත් කාලයක සිට පවත්වා ගෙන යනු ලබන උතුම් සම්ප්‍රදායයකි. පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය, අභිමානය, සහ ගෞරවය සංකේතවත් කරන මෙවැනි උතුම් සම්ප්‍රදායයන් රැක ගනිමින් ඒවා මතු පරපුර වෙනුවෙන් දායාද කර දීමට කටයුතු කිරීම ජනතා නියෝජිතයන් වන අපගේ පරම වගකීමක් හා යුතුකමක් ලෙස මම අදහස් කරමි.

තවද, පාර්ලිමේන්තු රැස්වීම් නැරඹීමට මහජන ගැලරියට පැමිණෙන පාසල් දරුවන් විශේෂයෙන් මෙවැනි සම්ප්‍රදායයන් නිරීක්ෂණය කිරීමෙන් බොහෝ දේ ඉගෙන ගන්නා බව මාගේ හැඟීමයි.

මා විසින් මෙතෙක් කරන ලද නිරීක්ෂණයන්ට අනුව, පාර්ලිමේන්තුවේ රැස්වීම් ආරම්භයේදී සභා ගර්භය තුළට සෙංකෝලය රැගෙන එන අවස්ථාවේදීත්, රැස්වීම් අවසානයේදී පාර්ලිමේන්තු සභා ගර්භයෙන් ඉවතට සෙංකෝලය ආපසු රැගෙන යන අවස්ථාවේදීත් සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තමන්ට වෙන් කර දී තිබෙන ආසනවල රැඳී සීරුවෙන් සිටිමින් පාර්ලිමේන්තුවේ ගරුත්වය සහ අභිමානය ආරක්ෂා වන අයුරින් නිශ්ශබ්දව කටයුතු කිරීම යෝග්‍ය බව සිහිපත් කරනු කැමැත්තෙමි.



**නිවේදනයේ දෙමළ පරිවර්තනය:**
அறிவிப்பினது தமிழ் மொழிபெயர்ப்பு:
TAMIL TRANSLATION OF ANNOUNCEMENT:

பாராளுமன்ற அமர்வுகளின் ஆரம்பத்திலும் இறுதியிலும் செங்கோலை ஏந்திச் செல்லல் காலாகாலமாகப் பேணப்பட்டு வருகின்ற ஓர் உன்னத மரபாகும். பாராளுமன்றத்தின் உயர்வாந்தன்மை, மாண்பு மற்றும் கௌரவத்தை அடையாளப்படுத்துகின்ற இத்தகைய உன்னதமான மரபுகளைப் பேணிப்பாதுகாத்து, இவற்றை எதிர்காலச் சந்ததியினருக்கு வழங்குவதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளல் மக்கள் பிரதிநிதிகளான எமது தலையாய கடமையும் பொறுப்புமாகுமென நான் கருதுகிறேன்.

மேலும், பாராளுமன்றக் கூட்ட அமர்வுகளைப் பார்வையிடுவதற்காகப் பார்வையாளர் கூடத்துக்கு வருகைதரும் பாடசாலை மாணவர்கள், குறிப்பாக இத்தகைய மரபுகளை அவதானிப்பதன்மூலம் ஏராளமான விடயங்களைக் கற்றுக்கொள்கின்றார்கள் என்பது எனது எண்ணமாகும்.

இதுவரையில் நான் அவதானித்தவைகளுக்கு அமைய, பாராளுமன்ற அமர்வுகளின் ஆரம்பத்தில் சபையினுள் செங்கோலை ஏந்திவருகின்ற சந்தர்ப்பத்திலும் அமர்வுகளின் முடிவில் சபாமண்டபத்திலிருந்து செங்கோலை ஏந்திச் செல்கின்ற சந்தர்ப்பத்திலும் கௌரவ பாராளுமன்ற உறுப்பினர்கள் அனைவரும் தமக்கு ஒதுக்கப்பட்டுள்ள ஆசனங்களின் முன்னால் நிமிர்ந்து நின்றவாறு, பாராளுமன்றத்தின் கௌரவத்தையும் மாண்பினையும் பாதுகாக்குமுகமாக அமைதியைப் பேணும்வகையில் நடந்துகொள்வது சிறந்ததென்பதை நினைவூட்ட விரும்புகிறேன்.

**නිවේදනයේ ඉංග්‍රීසි පරිවර්තනය:**
அறிவிப்பினது ஆங்கில மொழிபெயர்ப்பு:
ENGLISH TRANSLATION OF ANNOUNCEMENT:

The carrying of mace at the commencement and conclusion of Parliamentary proceedings is a time-honoured noble tradition. I believe that as representatives of the people, it is our prime responsibility and duty to uphold these traditions which symbolize the supremacy, dignity and honour of Parliament and preserve them for posterity.

Further, I am of the view that school children visiting the public galleries to watch Parliamentary proceedings learn a lot by observing such traditions.

In view of my observations, I wish to remind that it is appropriate for all the Hon. Members of Parliament to remain attentively in the seats allocated to them and remain silent so as to maintain the honour and dignity of Parliament when the mace is carried into the Chamber at the commencement of the proceedings and carried out of the Chamber at the conclusion of the proceedings.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2012 සැප්තැම්බර් 20 දිනැති අංක 1776/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග.- [වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2010 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2010 වර්ෂය සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2010 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු කථානායකතුමනි, මම නුගේගොඩ, උඩහමුල්ල, විනිසුරු නිවාස සංකීර්ණය, අංක 92/18 දරන ස්ථානයෙහි පදිංචි හැරල්ඩ් විජේසිරි ලියනගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ලලිත් දිසානායක මහතා - පැමිණ නැත.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මාතලේ, උකුවෙල, පන්සල්තැන්න වතුයාය, රත්වත්ත, වතු අධිකාරි නිල නිවසෙහි පදිංචි ඩී.එස්.එන්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතලේ, මීවත්තකුඹුර පාර, අංක 34 දරන ස්ථානයෙහි පදිංචි බී.එල්. නිශාන්ත ප්‍රේමලාල් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 1-1941/'11 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2-2245/'12 -(1), ගරු රවි කරුණානායක මහතා

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කොටදෙණියාව වැඩ බිම: විස්තර
### கொட்டதெனியாவ வேலைத்தலம் : விபரம்
### KOTADENIYAWA WORK SITE: DETAILS

2274/'12

**3. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඩෙව්කොෂෝවා සමාගම ලෙසින් ආරම්භ කරන ලද පසුව ෆුජීමා ස්ටේට් කෝපරේෂන් සමාගම නමින් පවත්වා ගෙන යන ආයතනය සතු කොටදෙණියාව වැඩ බිම මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(ii) එහි සේවය කරන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ දක්වා ඔවුන්ගේ වේතන ගෙවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නම සඳහන් ආයතනය සතු යන්ත්‍රසූත්‍ර සහ වාහන කවරේද;

(ii) එකී යන්ත්‍රවල සහ වාහනවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වැඩපල පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ යන්ත්‍රසූත්‍ර ගලවා වෙන්දේසි කිරීමට හෝ විකුණා දැමීමට හෝ කටයුතු යොදා තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආරම්භ කළ වර්ෂයේ සිට මේ දක්වා එම වැඩ බිම ලැබූ ලාභය හෝ පාඩුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැඩ බිම රජයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) டெவ்கோசேவா எனும் பெயரில் ஆரம்பிக்கப்பட்டு பின்பு புஜீமா ஸ்டேட் கோபரேஷன் கம்பனி எனும் பெயரில் நடத்தப்பட்டுவரும் நிறுவனத்திற்குச் சொந்தமான கொட்டதெனியாவ வேலைத்தலம் இப்போது செயற்பட்டுவருகிறதா என்பதையும்;

(ii) அங்கு பணிபுரியும் ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) இவர்களின் சம்பளம் இதுவரை செலுத்தப்பட்டுள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்ட நிறுவனத்திற்குச் சொந்தமான இயந்திரப் பொறிகள் மற்றும் வாகனங்கள் யாவை என்பதையும்;

(ii) இந்த இயந்திரப் பொறிகள் மற்றும் வாகனங்களின் பெறுமதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) இவ் வேலைத்தலத்தை அமைவிடத்திலிருந்து அகற்றுவதற்கோ, இயந்திரப் பொறிகளை அகற்றி ஏல விற்பனை செய்வதற்கோ, விற்பனை செய்வதற்கோ நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) ஆரம்பித்த வருடம் முதல் இதுவரை இந்த வேலைத்தலத்திற்குக் கிடைத்த இலாபம் அல்லது நட்டம் வருடாந்த அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) இத்தொழிற்சாலையை அரசின் அபிவிருத்தி வேலைகளுக்குப் பயன்படுத்த நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) அவ்வாறாயின், அது எப்போது தொடக்கம் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state -

(i) whether the Kotadeniyawa work site, which belongs to an institution which was started under the name of Devkoshowa Company and run subsequently under the name of Fujima Estate Corporation is operative at present;

(ii) the number of workers employed in the aforesaid work site; and

(iii) whether their salaries have been paid upto now?

(b) Will he also state -

(i) the machinery and the vehicles which belong to the institution bearing the aforesaid name;

(ii) separately, the value of the aforesaid machinery and vehicles; and

(iii) whether arrangements have been made to remove the aforesaid work site from the place where it is located at present or to sell or auction it after dismantling the machinery?

(b) Will he inform this House -

(i) separately, of the profit earned or the loss incurred by the aforesaid work site in each year from the year in which it was started up to now;

(ii) whether action will be taken to use this work site for the development work of the government; and

(iii) if so, the date on which it will be done?

(c) If not, why ?

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වන විට ෆූජිමා ස්ටේට් කෝපරේෂන් ආයතනය ක්‍රියාත්මක නොවන නිසා කොටදෙණියාව වැඩ බිම ද ක්‍රියාත්මක නොවේ.

(ii) ස්ථිර සේවක සංඛ්‍යාව 05කි.

(iii) ආයතනයේ සේවය කළ කාල සීමාවට වැටුප් ගෙවා ඇත.

(ආ) (i)

| | |
|---|---|
| ක්‍රෂර් යන්ත්‍රය | 01 |
| වීල් ලෝඩර් | 03 |
| කොම්ප්‍රේසර් | 02 |
| ට්‍රැක් ඩ්‍රිල් | 01 |
| පම්ප් කාර් | 01 |
| ජෙනරේටර් | 04 |
| වෙල්ඩින් ජෙනරේටර් | 01 |
| ට්‍රක් මික්සර් | 06 |
| ටිපර් රථ | 02 |

(ii)

| | |
|---|---|
| ක්‍රෂර් යන්ත්‍රය | 2,68,60,000 |
| වීල් ලෝඩර් | 25,00,000 |
| කොම්ප්‍රේසර් | 30,00,000 |
| ජෙනරේටර් | 62,00,000 |
| ට්‍රක් මික්සර් | 68,75,000 |
| ටිපර් රථ | 45,00,000 |
| ට්‍රාන්ස් ෆෝමර් | 14,00,000 |

(iii) මෙම වැඩ බිම ඉවත් කිරීමට හෝ මෙම යන්ත්‍ර සූත්‍ර ගලවා වෙන්දේසි කිරීමට හෝ විකුණා දැමීමට හෝ කටයුතු කර නැත.

(ඇ) (i)

| කාල පරිච්ඡේදය | පාඩුව |
|---|---|
| 2007 නොවැම්බර් සිට 2009 මාර්තු 31 දක්වා | 25,60,845.66 |
| 2009 මාර්තු සිට 2012 මාර්තු දක්වා | 34,42,865.10 |

❖ ගිණුම් වර්ෂය මාර්තු 31 අවසන් වේ.

(ii) රජයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරමින් පවතියි.

(iii) එහි සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය නීත්‍යානුකූල අවසරය (බලපත්‍ර) ලැබුණු පසුව වේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විශේෂයෙන් ඩෙව්කොෂෝවා සමාගම ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගේ කාලයේ හොඳින් පවත්වා ගෙන ගිහින් පසුව කඩා වැටුණා. ඊට පස්සේ රාජිත සේනාරත්න මැතිතුමා යටතේ නැවත ආරම්භ කර ඒ කටයුතු කර ගෙන ගියා. එතැනින් පස්සේ ඔබතුමාගේ පාලන කාලය තුළ සභාපතිතුමන්ලාගේ ක්‍රියා කලාපය නිසා ඩෙව්කොෂෝවා සමාගම සම්පූර්ණයෙන් කඩා වැටෙන තත්ත්වයට දැන් පත් වෙලා තිබෙනවා. මෙම සමාගමේ සේවක සංඛ්‍යාව 5යි කියා ඔබතුමා කිව්වාට ඇත්ත වශයෙන් සේවකයන් 25දෙනෙක් විතර සිටියා. මා ළඟ තිබෙනවා, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා කථාවක් නේ කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කථාවක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේක කියලා දෙන්න ඕනෑ නේ.

එතකොට මෙහි 25 දෙනකු සේවය කළ බවට මා ළඟ සහතික තිබෙනවා, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි මා අහන්නේ, මෙහි පස් දෙනායි සේවය කරන්නේ කියලා ඔබතුමා කියන්නේ කොහොමද කියලායි. 25 දෙනකුගේ paysheets මා ළඟ තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා ප්‍රශ්නය අහලා ඉවරද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. මා කිව්වේ එහි ස්ථිර සේවක සංඛ්‍යාව පහයි කියලායි. ඊට අමතරව තාවකාලික පදනම සහ සේවා අවශ්‍යතාව මත කම්කරුවන් 25 දෙනකුගේ සේවය ලබා ගෙන තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආ, අන්න එහෙම කියන්න කෝ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
වැඩ බිමේ වැඩ නවතන විට මෙයින් 16 දෙනකු සේවයේ යෙදෙමින් සිට තිබෙනවා. එහෙම කියන්නේ, -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උත්තරයේ අන්න එහෙම කියන්න එපා යැ. ගරු කථානායකතුමනි, එහෙම -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම කියන්නේ, තමුන්නාන්සේට ආපසු අතුරු ප්‍රශ්නයක් අහන්න අවස්ථාවක් තිබෙන්න එපා යැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මා ඒක මුලින්ම කිව්වා නම්, ඔය පළමුවැනි අතුරු ප්‍රශ්නය වෙනුවට වෙන එකක් අහන්නේ. එය මා මුලින් කිව්වේ නැත්තේ ඒ නිසායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් පිළිතුරු දුන්නාට පසුව නේ ඒක කියන්නේ, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන වාදයක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වාදයක් නැහැ? එහෙම නම් මා දෙවැනි අතුරු ප්‍රශ්නයට එන්නම් කෝ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මගේ උගුලට ඔබතුමා හසු වුණා. මම වුවමනාවෙන්ම එහෙම නොකියා සිටියා, ඔබතුමා මගේ ඇම කයිද කියලා බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෙහි කෝටි ගණන් වටිනා යන්ත්‍ර සූත්‍ර විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒවා ඔක්කෝම දිරා පත් වෙනවා. ඉතින් තැන් තැන්වලින්, මේ පෞද්ගලික ආයතනවලින් ගල් ලබා ගන්නවාට වඩා මේ ඩෙව්කොෂෝවා කොම්පැනියෙන් අරගෙන - කෝටි ගණන් දීලා දැන් පාරවල් හදනවා නේ-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාගේ ප්‍රශ්නය ඇහුවා නම් හරි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට ඔබතුමා මේ වැඩබිම පාවිච්චියට ගන්නේ නැත්තේ ඇයි කියලා මා අහන්න කැමැතියි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාගේ ප්‍රශ්නයට මා ලබා දුන් පිළිතුරේ සඳහන් වනවා, මේ ආයතනයට අවශ්‍ය බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලා තිබෙනවා, ඒක නොලැබීම නිසායි මෙහි කටයුතු නතර වෙලා තිබෙන්නේ කියලා. ඒක තමයි උත්තරය. ඒ කියන්නේ, දැනට මේ ආයතනයට තිබෙන්නේ ඉතා සුළු පරිමාණ පුපුරුවා හැරීම් පිළිබඳ බලපත්‍රයක්. ඒක ප්‍රයෝජනවත් නැහැ. ඒ නිසා ඊට වඩා තරමක් ඉහළ ව්‍යාප්තියක් තිබෙන බලපත්‍රයක් ලබා ගැනීමට අපි ඉල්ලා සිටියා. නමුත් පරිසර අධිකාරියෙන්, ඒ අදාළ අනෙකුත් ආයතනවලින්, ඒ ප්‍රදේශයේ අවට මහජනතාවගෙන් ලැබුණු යම් යම් පැමිණිලි මත ඒ අනුමැතිය දීම ප්‍රමාද කර තිබෙනවා. ඒ අනුමැතිය ලැබුණු වහාම මේ වැඩ බිමේ වැඩ කටයුතු නැවත ආරම්භ කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පුපුරුවා හරින්න ලොකු එකක් ඕනෑ. "පිපිරෙන්න තිබෙන කාල බෝම්බයක් වාගේ" කියලා මොකක්ද එකක් ගැන මෙතුමා හැම වේලාවේම කථා කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම කිව්වේ. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් අහෝසි කරන්න තරම් මහා දැවැන්ත සේවයක් කරන කෙනකුට මෙපමණ කාලයක් තිස්සේ පුපුරුවා හැරීම් බලපත්‍රයක් ගන්න බැරි වුණාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම බලාපොරොත්තු වෙනවා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වාගේ දක්ෂ මන්ත්‍රීවරයෙකු හරහා ඒ පුපුරුවා ගැනීමේ කාර්යයට අදාළ බලපත්‍රය කොහෙන් හරි අර ගන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හම්බ වෙයි, හම්බ වෙයි. ඉතාම ඉක්මනින් හම්බ වෙයි. හෙට අනිද්දා වෙන කොට පිපිරෙයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා කොහොමත් පුපුරණ වැඩවලට දක්ෂයි නේ. පසු ගිය කාලයේ අහිංසක සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා පිපිරෙව්වා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද උදේ අපි පාර්ලිමේන්තුවට එන කොට අපේ vehiclesවල ඔක්කෝම shutters පහත් කරන්න කියලා ඇතුළේ මන්ත්‍රීවරුන් ඉන්නවාද, නැද්ද කියලා check කළා. ඒ නිසා මට මෙතැනට එන්නත් ප්‍රමාද වුණා. මගෙන් අහනවා, කවුද කියලා. මම ඇහුවා, මාව මීට පෙර දැකලා නැද්ද කියලා. ඇමතිවරුන්ට අනෙක් පැත්තෙන් එන්න පුළුවන්, vehicles දෙකක් ආවාත්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිවරයායි, මන්ත්‍රීවරයායි අතර පොඩි වෙනසක් තිබෙනවා. තමුන්නාන්සේ කියපු කථාව මම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. මම මේ දැනුත් එතැන ඉඳලායි ආවේ. තමුන්නාන්සේ මීට ඉස්සෙල්ලා කියන ලද කරුණක් පිළිබඳව මම ගිහිල්ලා බැලුවා. ඔබතුමන්ලාගේ වාහනවල shutters කළු කරගෙන නේ එන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මගේ වාහනයේ shutters කළු කර නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හා, නැද්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම පිරිසිදුව විවෘතභාවයෙන් මම එනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඒ ගැන බලන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඇයි අද එහෙම කළේ? අද මොකක්ද සුවිශේෂ දවස? මම අවුරුදු 19ක් තිස්සේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ ඔය කිව්ව කථාව ඇත්තක් නම් ඒ ගැන සොයා බලන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අසත්‍යය කියන්නේ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතනවා, තමුන්නාන්සේ අසත්‍යය කියන්නේ නැහැ කියලා. මොකක්ද වුණේ කියලා මම ඒ ගැන සොයන්නම්. තමුන්නාන්සේට විශේෂ හිරිහැරයක් කළාද කියලා මම සොයා බලන්නම්. බොහොම ස්තුතියි ඒ ගැන සඳහන් කළාට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ වාගේම මම ගියවර කළ පැමිණිල්ල ගැනත් පොඩ්ඩක් සොයා බලන්න ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ගැන සොයා බලන්නම තමයි මම අද ගියේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4- 2335/'12 -(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5- 2830/'12 -(1), ගරු ඉරාන් වික්‍රමරත්න මහතා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

## ප්‍රමිතියෙන් තොර ඩීසල් බෙදා හැරීම : පාඩුව
தரமற்ற டீசலினால் பாதிப்புற்ற வாகனங்கள்: நட்டம்
VEHICLES DAMAGED DUE TO SUBSTANDARD DIESEL : LOSS

3000/'12

**8. ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2012 ජූනි 23වැනි දින සිදුවී ඇති ප්‍රමිතියෙන් තොර ඩීසල් ආනයනය කිරීමේ සිද්ධිය සම්බන්ධව සොයා බැලීමට කමිටුවක් පත් කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iii) ප්‍රමිතියෙන් තොර ඩීසල් ආනයනය කොට බෙදා හැරීම හේතුවෙන් සිදුවී ඇති හානිය තක්සේරු කර තිබේද;

(iv) එසේ නම්, ඒ කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි ආනයනය කළ ප්‍රමිතියෙන් තොර ඩීසල් භාවිතය නිසා හානියට පත්වූ වාහන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි අනුව හානියට පත්වී ඇති රාජ්‍ය ආයතනවල වාහන සංඛ්‍යාව එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වාහනවලට සිදු වූ හානි හේතුවෙන් එක් එක් ආයතනයට සිදුවී ඇති මූල්‍යමය අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ප්‍රමිතියෙන් තොර ඩීසල් භාවිතය නිසා හානියට පත් පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(v) එම බස් රථවලට සිදුවී ඇති හානිවල මූල්‍යමය වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெற்றோலியக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012 யூன் 23ஆம் திகதி நடைபெற்ற தரமற்ற டீசல் இறக்குமதிச் சம்பவம் தொடர்பாக விசாரிப்பதற்கு ஒரு குழு நியமிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், இக்குழு உறுப்பினர்களின் எண்ணிக்கை மற்றும் இவர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) தரமற்ற டீசல் இறக்குமதி செய்து விநியோகிக்கப் பட்டதால் ஏற்பட்டுள்ள சேதம் மதிப்பீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின், அது எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்டவாறு இறக்குமதி செய்யப்பட்ட தரமற்ற டீசல் பயன்பாட்டினால் பாதிப்புற்ற வாகனங்கள் தொடர்பாக கிடைத்துள்ள முறைப் பாடுகளின் எண்ணிக்கை யாவையென் பதையும்;

(ii) இம்முறைப்பாடுகளின்படி பாதிப்படைந்துள்ள அரச நிறுவனங்களுக்குரிய வாகனங்களின் எண்ணிக்கை ஒவ்வொரு நிறுவன அடிப்படை யில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) இவ்வாகனங்களுக்கு ஏற்பட்டுள்ள பாதிப்புக் காரணமாக ஒவ்வொரு நிறுவனத்திற்கும் ஏற்பட்டுள்ள நிதி ரீதியிலான நட்டம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) தரமற்ற டீசல் பயன்பாட்டினால் பாதிப்புற்ற தனியார் பஸ் வண்டிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) இந்த பஸ் வண்டிகளுக்கு ஏற்பட்டுள்ள பாதிப்புகளின் நிதி ரீதியிலான பெறுமதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු රෝසි සේනානායක මහත්මිය]

asked the Minister of Petroleum Industries:

(a) Will he inform this House -

(i) whether a committee has been appointed to inquire into the importation of substandard diesel that took place on 23rd June 2012;

(ii) if so, of the number of members of the said Committee and their names;

(iii) whether the damage caused by the importation and distribution of substandard diesel has been assessed; and

(iv) if so, of the amount ?

(b) Will he state -

(i) the number of complaints received as regards vehicles damaged due to the use of substandard diesel imported as mentioned above ;

(ii) separately, as per each institution, the number of vehicles of public sector institutions that were damaged, according to the above complaints;

(iii) separately, the financial loss incurred by each institution as a result of damages caused to the said vehicles;

(iv) the number of private buses damaged as a result of using substandard diesel; and

(v) the financial value of the damages caused to the said buses ?

(c) If not, why ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) සාමාජිකයන් සංඛ්‍යාව 03කි.

1. සී.ජේ.කේ. පෙරේරා මහතා, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය.

2. ඒ. මාටින් මහතා, ඉංජිනේරු කළමනාකරු - (යාන්ත්‍රික ඉංජිනේරු), ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම.

3. ඊ.ජී.එස්. එදිරිසිංහ මහතා, කළමනාකාර - මෙහෙයුම්, - (රසායනික ඉංජිනේරු), ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - පිරිපහදුව.

(iii) තොග ගබඩා රසායනාගාර පරීක්ෂණ අනුව එම ඩීසල් තොග ප්‍රමිතිය හා ගැලපුණත්, නවීන යන්ත්‍ර හා වාහන කිහිපයක කාර්මික දෝෂ අනාවරණ විය. ආයතන හා පුද්ගලයන්ගෙන් ලද පැමිණිලි අළෙවි අංශය මඟින් විමසුමකට ලක් කිරීමට තොරතුරු රැස් කරනු ලැබේ.

(iv) තොරතුරු නිසි පරිදි ලද පසු නිශ්චිතව ගණනය කළ හැක.

(ආ) (i) වාහන සම්බන්ධයෙන් ලිඛිතව හා වාචිකව ලැබී ඇති පැමිණිලි ගණන 794කි.

(ii) පහත ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

රාජ්‍ය ආයතනවලින් ලද පැමිණිලි 362කි. (ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, වරාය අධිකාරිය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අංශ)

(iii) මූල්‍යමය වටිනාකම වෙන් වෙන් වශයෙන් දැනට ගණනය කර නැත. ගණනය කරමින් පවතී.

(iv) පෞද්ගලික බස් රථ සංඛ්‍යාව 222කි.

(v) මූල්‍යමය වටිනාකම මෙතෙක් ගණනය කර නැත.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම

| NO Of Vehicle | Name of Complainant | Address | Vehicle No | Type of Vehicle/ Machinery |
|---|---|---|---|---|
| 1 | D.M.N.J. Danapala | Chief Engineer, Mahaweli "H" Zone, | WPPB-7686 | To be catagorised Vehicle |
| 2 | Sri Lanka Army | Thisawewa | | To be catagorised Vehicle |
| 3 | Wijesingha, Director | Agriculture, N/C/ Province, Anuradhapura | WPPC-4313 | Cab |
| 4 | S.J.S. Fernando, Group Capton | Sri Lanka Air Force Base, Anuradhpura | G-5419 | Truck |
| 5 | S.J.S. Fernando, Group Capton | Sri Lanka Air Force Base, Anuradhpura | G-5420 | Truck |
| 6 | S.J.S. Fernando, Group Capton | Sri Lanka Air Force Base, Anuradhpura | G-5414 | Truck |
| 7 | S.J.S. Fernando, Group Capton | Sri Lanka Air Force Base, Anuradhpura | G-4950 | Truck |
| 8 | S.J.S. Fernando, Group Capton | Sri Lanka Air Force Base, Anuradhpura | G-6247 | Truck |
| 9 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | EPLW-0225 | Ambulance |
| 10 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | EPLW-0413 | Ambulance |
| 11 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | EP42-7497 | Ambulance |
| 12 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | EPLD-2735 | Ambulance |
| 13 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | EPLW-0421 | Ambulance |
| 14 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | EPLW-0036 | Ambulance |
| 15 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | EPHC-0956 | Ambulance |
| 6 | Akkaraipattu Base Hospital | Base Hospital, Akkaraipattu | | Generator |
| 17 | S.L.T.B., | Trinco Road, Batticaloa | 63-9581 | BUS |
| 18 | S.L.T.B., | Trinco Road, Batticaloa | WPGE-0495 | BUS |
| 19 | S.L.T.B., | Trinco Road, Batticaloa | WPNA-3092 | BUS |
| 20 | S.L.T.B., | Trinco Road, Batticaloa | WPNA-4588 | BUS |
| 21 | S.L.T.B., | Trinco Road, Batticaloa | WPNA-4769 | BUS |
| 22 | S.L.T.B., | Trinco Road, Batticaloa | WPNA-8966 | BUS |
| 23 | S.L.T.B., | Trinco Road, Batticaloa | WPNB-3494 | BUS |
| 24 | S.L.T.B., | Trinco Road, Batticaloa | WPNB-3648 | BUS |
| 25 | The Principal | Technical College, Mansalthoduvi, Batticaloa | EPNA-4526 | Van |
| 26 | The Registar | The Registar, The Estern University, Vantharamul | EPNB-3396 | Van |
| 27 | K. Vimalanadan | Additional GA, Kaccheri, Batticaloa | WPKB-0946 | Cab |
| 28 | Hon. Minister Kumara Welagama | | | Cab |
| 29 | Hon. Minister Kumara Welagama | | | Bus |
| 30 | Hon. Minister Kumara Welagama | | | Bus |
| 31 | Chairman | Mathugama Pradeshiya Sabhawa | | Bus |
| 32 | Chairman | Mathugama Pradeshiya Sabhawa | | Bus |
| 3 | Chairman | Mathugama Pradeshiya Sabhawa | | Bus |
| 34 | Chairman | Mathugama Pradeshiya Sabhawa | | Bus |
| 35 | Chairman | Walallawita Pradeshiya Sabhawa, Meegahatenna | PB-8677 | Cab |
| 36 | Chairman | Walallawita Pradeshiya Sabhawa, Meegahatenna | | JCB |
| 37 | Chairman | Walallawita Pradeshiya Sabhawa, Meegahatenna | 49-0255 | Tractor |
| 38 | Mr. P.N.R. Ganepola, [illegible] Manager, CPSTL, | Kolonnawa | WR-4115 | Jeep |
| 39 | Deputy General Manager - Mechanical | State Development & Construction Corporation, N | KH-0355 | Jeep |
| 40 | Deputy General Manager - Mechanical | State Development & Construction Corporation, N | GI-4636 | Cab |
| 41 | Deputy General Manager - Mechanical | State Development & Construction Corporation, N | GI-5118 | Cab |
| 42 | Deputy General Manager - Mechanical | State Development & Construction Corporation, N | GR-9346 | To be catagorised Vehicle |
| 43 | Deputy General Manager - Mechanical | State Development & Construction Corporation, N | JL-7328 | To be catagorised Vehicle |
| 44 | Deputy General Manager - Mechanical | State Development & Construction Corporation, N | PD-0856 | To be catagorised Vehicle |
| 45 | Mr. Sisira (Petroleum Ministry) | | LH-5929 | To be catagorised Vehicle |
| 46 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 47 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |

| NO Of Vehicle | Name of Complainant | Address | Vehicle No | Type of Vehicle/ Machinery |
|---|---|---|---|---|
| 48 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 49 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 50 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 51 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 52 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 53 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 54 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 55 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 56 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 57 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 58 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 59 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 60 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 61 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 62 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 3 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 64 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 65 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 66 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 67 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 68 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 69 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 70 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 71 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | M08 | Train Engine |
| 72 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | | Train Engine |
| 73 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | M5C | Train Engine |
| 74 | Sri Lanka Railways | Olcott Mawatha, Colombo 10 | S09 | Train Engine |
| 75 | CTB Angoda Mr.Thilakaratne | | NB-1214 | Bus |
| 76 | CTB Angoda Mr.Thilakaratne | | NB-1235 | Bus |
| 77 | CTB Angoda Mr.Thilakaratne | | NA-7002 | Bus |
| 78 | CTB Angoda Mr.Thilakaratne | | NA-3094 | Bus |
| 79 | Director of Health Services | New Town, Ratnapura | BA-7569 | Cab |
| 0 | Director of Health Services | New Town, Ratnapura | PB-6805 | Cab |
| 81 | Mr. Galagama, Mechanical Eng. | Road Development Authority | KQ-7470 | Jeep |
| 82 | Mr. Galagama, Mechanical Eng. | Road Development Authority | KQ-7478 | Jeep |
| 83 | Ratnapura Hospital | | JU-4674 | Ambulance |
| 84 | Ratnapura Hospital | | LW-0037 | Ambulance |
| 85 | Ratnapura Hospital | | HN-9608 | Ambulance |
| 86 | Ministry of Youth Affairs & Skills Develop | "Nipunatha Piyasa", No.354/2, Elvitigala Mw, Co | PE-4521 | Cab |
| 87 | Ministry of Youth Affairs & Skills Develop | "Nipunatha Piyasa", No.354/2, Elvitigala Mw, Co | PD-6193 | Cab |
| 88 | Ministry of Youth Affairs & Skills Develop | "Nipunatha Piyasa", No.354/2, Elvitigala Mw, Co | PE-3521 | Cab |
| 89 | Ministry of Youth Affairs & Skills Develop | "Nipunatha Piyasa", No.354/2, Elvitigala Mw, Co | PE-2521 | Cab |
| 90 | Chandana Soysa South p.c | | NB-2457 | Bus |
| 91 | Chandana Soysa South p.c | | | Bus |
| 92 | Mr. Ranjith Aruna | Gem Corporation | WPPD-9092 | Cab |
| 93 | Secretary Lanka National Estate | 60 Sri Jayawardana pura Mwt, Welikada Rajagiriy | PD-6416 | Cab |
| 94 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 95 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 96 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 97 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 98 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 99 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 100 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 101 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 102 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 103 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 104 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 105 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 106 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 107 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 108 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 109 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 10 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 111 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 112 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 113 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 114 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 115 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 116 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 117 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 118 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 119 | Mr D.L.P.R. Abeyaratne | Post Master General, No.310, D.R. Wijeyawardan | | Van |
| 120 | Depot Suprintendent | C.T.B., Regional Office, No.171 Matara Rd, Mag | | Bus |
| 121 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 122 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 123 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 124 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 125 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 126 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 27 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 128 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 129 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 130 | Depot Suprintendent CTB | Province Engineer, Etampitiya Rd Helamuduna, E | | Bus |
| 131 | Depot Suprintendent CTB | Maharagama | | Bus |
| 132 | Mr Dhananjaya Dharmaratne | Ministry of Defence & Urban Development, No. ( | | To be catagorised Machine |
| 133 | President Deshabandu Gemunu Wijeratne, | 06 Nawala Road Nugegoda | | Bus |
| 134 | Mr G.A.N. Jayantha | Dept of Revenue, Western Province, 660 Galle Rd | PB-9738 | Cab |
| 135 | Mr Luxman Premanath | Provincial Director of Agriculture, North Central | PB-4425 | Cab |
| 136 | Mr Sumith Kumara Director | Dept Of Fisheris& Aqatic, Resources 33 St servat | A0766 MTR | M.P.Wesells |
| 137 | Mr Sumith Kumara Director | Dept Of Fisheris& Aqatic, Resources 33 St servat | A0304 MTR | M.P.Wesells |
| 138 | Mr Sumith Kumara Director | Dept Of Fisheris& Aqatic, Resources 33 St servat | A0407 MTR | M.P.Wesells |
| 139 | Prabath balasuriya Director | College of Technology Galle | NA-4529 | To be catagorised Vehicle |
| 140 | Mr H.Batagoda | Sri Lanka Bureau of Foreigh, Employment | | To be catagorised Vehicle |
| 141 | Chairman National Food, Promotion Board | No 45 Kirimandala Mw, Narahenpita colombo 05 | PD-4490 | Cab |
| 142 | Mr.W.M.H. Wimalasena | Principal, Technical College, Kalutara | NA-4520 | Van |
| 143 | Deputy Director of Agriculture | Dept.of Agriculture, Muwagama, Ratnapura | LG-8939 | Cab |
| 144 | Director, Facilities Management Dept | Central Bank of Sri Lanka, 9th floor, 30, Janadhip | KF-4654 | To be catagorised vehicle |
| 145 | Director, Facilities Management Dept | Central Bank of Sri Lanka, 9th floor, 30, Janadhip | KF-4658 | To be catagorised vehicle |
| 146 | Director, Facilities Management Dept | Central Bank of Sri Lanka, 9th floor, 30, Janadhip | PC-0539 | To be catagorised vehicle |
| 147 | Mr. H. batagoda | General Manager, Sri Lanka Foreign Employment Bureau, Battara | | Generator |
| 148 | Deputy General Manager | Sri Lanka Transport Board, Engineering Division, 200, Kirula Road, Colombo 05 | | |
| 149 | Secretary | Pradeshiya Sabhawa, Mathugama | ZA-0452 | Bacco |
| 150 | Secretary | Pradeshiya Sabhawa, Mathugama | LJ-6098 | Tipper |
| 151 | Mr.T.G.K.M.S.S.K. Karunarathne | 334, Kandy Road, Kirillawala, Kadawatha | GU-3008 | Van |
| 152 | Director transport | General hospital Kegalle | HN-6992 | Ambulance |
| 153 | Director transport | General hospital Kegalle | LW-0432 | Ambulance |
| 154 | Director transport | General hospital Kegalle | 227-5509 | Ambulance |
| 155 | Mr Mahinda Seneviratne | District secretariat A pura | KQ 4815 | Prado |
| 156 | Mr Mahinda Seneviratne | District secretariat A pura | PC-5226 | Cab |
| 57 | Mr Mahinda Seneviratne | District secretariat A pura | PC-2746 | Cab |
| 158 | Mr Mahinda Seneviratne | District secretariat A pura | PD-6828 | Cab |
| 159 | Mr Mahinda Seneviratne | District secretariat A pura | PC-5221 | Cab |
| 160 | Mr Mahinda Seneviratne | District secretariat A pura | PC-5223 | Cab |
| 161 | Mr Mahinda Seneviratne | District secretariat A pura | PD-3809 | Cab |
| 162 | Mr Mahinda Seneviratne | District secretariat A pura | PD-5222 | Cab |
| 163 | C.Jayasooriya Cabinet ministy | Republic Square sir baron, Jayathilaka Mwt Color | PD-8772 | Cab |
| 164 | G.M. west C.E.B. | No 608 galle Road Ratmalana | | To be catagorised vehicle |
| 165 | General Manager | Ceylon Transport Board, Ambalangoda | NA-4241 | Bus |
| 166 | General Manager | Ceylon Transport Board, Ambalangoda | NA-8968 | Bus |
| 167 | General Manager | Ceylon Transport Board, Ambalangoda | NB-3077 | Bus |
| 168 | General Manager | Ceylon Transport Board, Ambalangoda | NB-3084 | Bus |
| 169 | General Manager | Ceylon Transport Board, Ambalangoda | NB-3984 | Bus |
| 170 | Commisioner, Revenue of Southern Provin | No 30, Wackwella, Rd, Galle | NA-6311 | Van |
| 171 | Mechanical Engineer, G D H Kosala | Water Supply Board, Galle | GL-6474 | Cab |
| 172 | Habaraduwa Pradeshiya Sabha | Pradeshiya Sabha, Habaraduwa. | SPGH-6672 | Bakhoe |
| 173 | Habaraduwa Pradeshiya Sabha | Pradeshiya Sabha, Habaraduwa. | RA-6130 | Tractor |
| 74 | Depot Manager | CTB Maharagama | NB-1374 | BUS |
| 175 | Depot Manager | CTB Maharagama | NB-2463 | BUS |
| 176 | Depot Manager | CTB Maharagama | NB-1899 | BUS |
| 177 | Depot Manager | CTB Maharagama | NB-1949 | BUS |
| 178 | Depot Manager | CTB Maharagama | NA-2653 | BUS |
| 179 | Depot Manager | CTB Maharagama | NB-1900 | BUS |
| 180 | Depot Manager | CTB Maharagama | NB-2809 | BUS |
| 181 | Depot Manager | CTB Maharagama | NB-2144 | BUS |
| 182 | Depot Manager | CTB Maharagama | 63-3803 | BUS |
| 183 | Depot Manager | CTB Maharagama | 62-1987 | BUS |
| 184 | Depot Manager | CTB Maharagama | NB-2806 | BUS |
| 185 | Depot Manager | CTB Maharagama | NA-5257 | BUS |
| 186 | Depot Manager | CTB Maharagama | GD-4435 | BUS |
| 187 | Depot Manager | CTB Maharagama | NA-3657 | BUS |
| 188 | Depot Manager | CTB Maharagama | NB-3049 | BUS |
| 189 | Depot Manager | CTB Maharagama | NB-1375 | BUS |
| 190 | Depot Manager | CTB Maharagama | 63-3456 | BUS |
| 191 | Depot Manager | CTB Maharagama | GD-9910 | BUS |
| 192 | Depot Manager | CTB Maharagama | NB-1240 | BUS |
| 193 | Depot Manager | CTB Maharagama | GI-0475 | BUS |
| 194 | Depot Manager | CTB Maharagama | NB-1204 | BUS |
| 195 | Depot Manager | CTB Maharagama | NA-5214 | BUS |
| 196 | Manager administration | Overseas Reality, WTC Colombo, Haveloc city | 23z0-5714 | Caterpiller |
| 197 | Manager administration | Overseas Reality, WTC Colombo, Haveloc city | 23z0-5715 | Caterpiller |
| 198 | Manager administration | Overseas Reality, WTC Colombo, Haveloc city | | Generator |
| 199 | Manager administration | Overseas Reality, WTC Colombo, Haveloc city | 70-2676 | Generator |
| 200 | Manager administration | Overseas Reality, WTC Colombo, Haveloc city | 70-2774 | Generator |
| 201 | Director General | S L B C | NA-9880 | To be catagorised Vehicle |
| 202 | Director General | S L B C | NA-9594 | To be catagorised Vehicle |
| 203 | Director General | S L B C | NA-9895 | To be catagorised Vehicle |
| 04 | Director General | S L B C | NA-9896 | To be catagorised Vehicle |
| 205 | Site Manager | Catic | | To be catagorised Vehicle |
| 206 | Depot Superintendent | SLTB Depot, Kalutara | 61-5852 | Bus |
| 207 | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-4165 | Bus |
| 208 | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-7134 | Bus |
| 209 | Depot Superintendent | SLTB Depot, Kalutara | 62-1881 | Bus |
| 210 | Depot Superintendent | SLTB Depot, Kalutara | 63-3743 | Bus |
| 211 | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-4141 | Bus |
| 212 | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-4873 | Bus |
| 213 | Depot Superintendent | SLTB Depot, Kalutara | GE-3872 | Bus |
| 214 | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-1189 | Bus |
| 215 | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-4730 | Bus |
| 216 | Depot Superintendent | SLTB Depot, Kalutara | GB-3872 | Bus |
| 217 | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-3767 | Bus |
| 218 | Depot Superintendent | SLTB Depot, Kalutara | 63-4519 | Bus |
| 219. | Depot Superintendent | SLTB Depot, Kalutara | NA-4813 | Bus |
| 220 | Depot Superintendent | SLTB Depot, Kalutara | 30-1036 | Bus |
| 21 | Depot Superintendent | SLTB Depot, Kalutara | NB-3191 | Bus |
| 222 | Depot Superintendent | SLTB Depot, Kalutara | NB-3797 | Bus |
| 223 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 224 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 225 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 226 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 227 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 228 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 229 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 230 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 231 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 232 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 233 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 234 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 235 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

| NO Of Vehicle | Name of Complainant | Address | Vehicle No | Type of Vehicle/ Machinery |
|---|---|---|---|---|
| 236 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 237 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 238 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 239 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 240 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Crane |
| 241 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Prime Movers |
| 242 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Prime Movers |
| 243 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Prime Movers |
| 244 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Prime Movers |
| 245 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Prime Movers |
| 246 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Truck |
| 247 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | Truck |
| 248 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | To be catagorised Vehicle |
| 249 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | To be catagorised Vehicle |
| 250 | Sri Lanka Ports Authority | 19,Chaitthya Road, Colombo 10. | | To be catagorised Vehicle |
| 51 | (NEPTDP), Ceylon Electricity Board | Colombo 02. | PB-5146 | To be catagorised Vehicle |
| 252 | (NEPTDP), Ceylon Electricity Board | Colombo 02. | PB-2444 | To be catagorised Vehicle |
| 253 | (NEPTDP), Ceylon Electricity Board | Colombo 02. | PB-5109 | To be catagorised Vehicle |
| 254 | (NEPTDP), Ceylon Electricity Board | Colombo 02. | PB-8415 | To be catagorised Vehicle |
| 255 | K Godigamuwa, Project Manager (Reg.04), | DeVOS Avenue, Colombo 04. | | To be catagorised Vehicle |
| 256 | Ceylon Electricity Board, Distribution Unit | Sir Chittampalam A. Gardiner Mw., Colombo 02 | PC-0547 | To be catagorised Vehicle |
| 257 | Chief Engineer | Ceylon Electricity Board (Colombo West), No.34( | WPPA-5552 | To be catagorised Vehicle |
| 258 | Depot Manager | CTB, Maharagama | NA-1375 | Bus |
| 259 | Depot Manager | CTB, Maharagama | NV-1240 | Bus |
| 260 | Depot Manager | CTB, Maharagama | QI-0475 | Bus |
| 261 | Depot Manager | CTB, Maharagama | NA-3653 | Bus |
| 262 | Depot Manager | CTB, Maharagama | NB-1400 | Bus |
| 263 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | 11 Nos. | Train Engine |
| 264 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 265 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 266 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 57 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 268 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 269 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 270 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 271 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 272 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 273 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | 14 Nos. | Train Engine |
| 274 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 275 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 276 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 277 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 278 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 279 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 280 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |

| NO Of Vehicle | Name of Complainant | Address | Vehicle No | Type of Vehicle/ Machinery |
|---|---|---|---|---|
| 281 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 282 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 283 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 284 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 285 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 286 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 287 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 288 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 289 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 290 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 291 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Van |
| 292 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Van |
| 293 | Kirthi Hewawitharana | Chief Engineer,Railway Dept. | | Train Engine |
| 294 | Hon.Min Kumara Welgama | | | To be catagorised Vehicle |
| 95 | Hon.Min Kumara Welgama | | | Bus |
| 296 | Hon.Min Kumara Welgama | | | Bus |
| 297 | The Chairman | Mathugama Divisonal Secrataiat | | Bus |
| 298 | The Chairman | Mathugama Divisonal Secrataiat | | Bus |
| 299 | The Chairman | Mathugama Divisonal Secrataiat | | Bus |
| 300 | The Chairman | Mathugama Divisonal Secrataiat | | Bus |
| 301 | K.G.Mudiyanse ( Vehicale sbject manager | District Helth Director , Regional Office ,Nuwara | | Ambulance |
| 302 | General Hospital, Transport officer | Embilipitiya | SGLW-0258 | Van |
| 303 | General Hospital, Transport officer | Embilipitiya | SGLW-0219 | Van |
| 304 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | 62- 0438 | Bus |
| 305 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | 63- 4083 | Bus |
| 306 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | NB- 1209 | Bus |
| 307 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | NB -3806 | Bus |
| 308 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | 63-1116 | Bus |
| 309 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | 63-3614 | Bus |
| 310 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | NA- 3478 | Bus |
| 11 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | NA-4825 | Bus |
| 312 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | NA-3458 | Bus |
| 313 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | GD-9895 | Bus |
| 314 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | NA-8958 | Bus |
| 315 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | 62-2747 | Bus |
| 316 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | 61-9540 | Bus |
| 317 | C T B Embilipitiya | Ceylon Transport Board,Ebmbilipitiya | NA-3218 | Bus |
| 318 | Regional Education Office | Regional Education Office, Medagama, Bibile | NA-8847 | Van |
| 319 | General Manager | Tissamaharama MPCS Ltd, Tissamaharama. | SPLG-6841 | Bowser |
| 320 | SLTB | Bandarawela | 62-2329 | Bus |
| 321 | SLTB | Bandarawela | NA-2923 | Bus |
| 322 | SLTB | Bandarawela | NA-1563 | Bus |
| 323 | SLTB | Bandarawela | NA-4314 | Bus |
| 324 | SLTB | Bandarawela | 62-2439 | Bus |

| NO Of Vehicle | Name of Complainant | Address | Vehicle No | Type of Vehicle/ Machinery |
|---|---|---|---|---|
| 325 | SLTB | Bandarawela | 63-1014 | Bus |
| 326 | SLTB | Bandarawela | NB-3086 | Bus |
| 327 | SLTB | Bandarawela | NB-3317 | Bus |
| 328 | SLTB | Bandarawela | NB-3993 | Bus |
| 329 | SLTB | Bandarawela | NA-7133 | Bus |
| 330 | Army Camp | Diyatalawa | | Jeep |
| 331 | Army Camp | Diyatalawa | | Escavator |
| 332 | Army Camp | Diyatalawa | | Tipper |
| 333 | SLTB | Keppetipola | UPNB-3658 | Bus |
| 334 | SLTB | Keppetipola | UPNA-1218 | Bus |
| 335 | SLTB | Keppetipola | UPNA-3210 | Bus |
| 336 | SLTB | Keppetipola | UPNA-1304 | Bus |
| 337 | SLTB | Keppetipola | 63-0611 | Bus |
| 338 | SLTB | Keppetipola | 61-9743 | Bus |
| 339 | SLTB | Bandarawela | NA-4331 | Bus |
| 340 | SLTB | Bandarawela | NA-2654 | Bus |
| 41 | SLTB | Bandarawela | 63-1010 | Bus |
| 342 | SLTB | Bandarawela | 62-9528 | Bus |
| 343 | SLTB | Bandarawela | 62-5594 | Bus |
| 344 | SLTB | Bandarawela | 62-2953 | Bus |
| 345 | SLTB | Bandarawela | 62-1612 | Bus |
| 346 | SLTB | Bandarawela | NA-3214 | Bus |
| 347 | SLTB | Bandarawela | 63-2279 | Bus |
| 348 | SLTB | Bandarawela | NA-4350 | Bus |
| 349 | SLTB | Bandarawela | NA-2299 | Bus |
| 350 | SLTB | Bandarawela | NA-2655 | Bus |
| 351 | SLTB | Bandarawela | 62-2330 | Bus |
| 352 | SLTB | Bandarawela | 62-2923 | Bus |
| 353 | SLTB | Bandarawela | 23-8738 | Bus |
| 354 | SLTB | Bandarawela | NB-8883 | Bus |
| 355 | SLTB | Bandarawela | NA-3331 | Bus |
| 356 | SLTB | Bandarawela | NA-4926 | Bus |
| 357 | SLTB | Bandarawela | 62-2326 | Bus |
| 358 | SLTB | Bandarawela | NA-4937 | Bus |
| 359 | SLTB | Bandarawela | 63-4175 | Bus |
| 30 | SLTB | Bandarawela | NB-2299 | Bus |
| 361 | SLTB | Bandarawela | NA-1290 | Bus |
| 362 | SLTB | Bandarawela | PE-1420 | Bus |

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

මගේ (අ) (i) ප්‍රශ්නයට ඔබතුමා පිළිතුර වශයෙන් "ඔව්, කමිටුවක් පත් කළා." කිව්වා. ගරු ඇමතිතුමනි, ඒ කමිටුවෙන් ඉදිරිපත් කළ වාර්තාවක් තිබෙනවාද? ඒ වාර්තාවේ කරුණු ටිකක් කියන්න පුළුවන්ද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම ඒ වාර්තාව ඔබතුමියට ලැබෙන්න සලස්වන්නම්. වාර්තාවේ සංක්ෂිප්තය මෙසේයි. රසායනාගාර පරීක්ෂණ හා පිරිවිතර ගැළපේ. නමුත් ඒ රසායනාගාර පරීක්ෂණවලින් සොයා ගත නොහැකි ආගන්තුක දෙයක් සම්බන්ධ වී තිබිය හැකි නිසා අපි ඒ සාම්පල අයි.ටී.අයි. ආයතනයට අපි යොමු කර තිබෙනවා, වැඩිදුර පරීක්ෂා කර වාර්තාව ඉදිරිපත් කරන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයේයි මම තවමත් ඉන්නේ. ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනවාද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අනිවාර්යයෙන්ම.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ආ! Partnership.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්න කෝ පොඩ්ඩක්, කරදර කරන්නේ නැතිව. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනවශ්‍ය ශබ්ද අවශ්‍ය නැහැ, අනවශ්‍ය වේලාවට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක නේන්නම්. Thank you.

ගරු කථානායකතුමනි, මේ නිසා පෞද්ගලික බස් රථ 222ක් හානියට පත් වෙලා තිබෙනවා. අපට ඒ බස් රථ තිබෙන්නේත් යන්තම් 4,000යි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ. පෞද්ගලික බස් රථ 19,000ක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්න කෝ ඉතින්. ඉන්න කෝ පොඩ්ඩක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය ඇහුවොත් හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒ වාගේම රාජ්‍ය ආයතනවලට අයිති වාහන 362ක් හානියට පත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි මෙපමණ දෙයක් වෙලාත්, අඩුම තරමින් යම් කිසි කාල සීමාවකට හෝ මේ තෙල් ගෙනා කොම්පැනිය තහනම් කරන්න යම් කිසි ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔව්, අනිවාර්යයෙන්ම. De-list කරලා තිබෙන්නේ. දැන් ඒ සමාගමට ටෙන්ඩර්වලට ඉදිරිපත් වන්න බැහැ. අපි නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒ සම්බන්ධයෙන් වැඩි දුරටත් උපදෙස් ඉල්ලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි අතුරු ප්‍රශ්න අහන්නේ බෙදා ගෙන.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ සංස්ථාවේ පිරිවිතරවලට නොගැළපෙන තෙල් ආනයනය කර තිබුණත්, ඒවා මේ රටට භාර ගත්ත ඒ දූෂිත නිලධාරින්ට විරුද්ධව ගන්නා වූ ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මේ වන විට විනය පියවර අරගෙන තිබෙනවා. ඒ වාර්තාවේ නිර්දේශිත කරුණු හතරම මේ වන විට සංස්ථා බලධාරින් විසින් අනුගමනය කර තිබෙනවා. ප්‍රථම සිද්ධියේදී -පෙට්‍රල් සිද්ධියේදී- ඒ නිර්දේශ හතරම ක්‍රියාත්මක කරලා, අවසාන නිර්දේශය වුණු වන්දි ගෙවූ මුළු මුදලත් පොම්ප අලුත්වැඩියාවට වියදම් කළ මුළු මුදලත් කියන මිලියන 55ම එම සමාගමෙන් අය කර ගැනීම සඳහා මේ පසු ගිය කාලය පුරාවටම කටයුතු කර තිබෙනවා. මේ වන විට ඒ අය දැනුම් දීලා තිබෙනවා, ඒ මුදල අපට ලැබීමට සලස්වනවා කියලා. එතකොට සංස්ථාවට කිසිදු මූල්‍ය හානියක් පෙට්‍රල් සිද්ධිය සම්බන්ධයෙන් සිදු වෙලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 6 - 2917/'12 - (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සංයුක්ත ගණිතය ප්‍රශ්න පත්‍රය : දෝෂ
## க.பொ.த. (உயர்தரப்) பரீட்சை இணைந்த கணித வினாத்தாள்: தவறுகள்
## COMBINED MATHEMATICS PAPER OF GCE (A/L) EXAMINATION : ERRORS

2955/'12

**7. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - கௌரவ அகில விராஜ் காரியவசம் சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Akila Viraj Kariyawasam)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2012 අගෝස්තු 06 වැනි දින පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සංයුක්ත ගණිතය ප්‍රශ්න පත්‍රයේ තිබූ වැරදි හේතුවෙන් එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී සිසුන් මහත් අපහසුතාවකට පත්වූ බවත්;

(ii) ප්‍රශ්න පත්‍රයේ තිබූ දෝෂ සහිත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උත්සාහ ගැනීම නිසා නිසි පරිදි කාලය කළමනාකරණය කර ගැනීමට නොහැකිවූ බැවින් එම සමස්ත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සිසුන් දැඩි පීඩනයක් යටතේ සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උසස් පෙළ විභාග ප්‍රශ්න පත්‍ර සිසුන්ට ලබා දීමට පෙර නැවත පරීක්ෂාවකට ලක් නොකරන්නේද;

(ii) 2012 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය විෂයය සඳහා ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ බලධාරීන්ගේ වගකීමෙන් තොර ක්‍රියාවලිය හේතුවෙන් අපහසුතාවට පත්වූ ගණිත අංශයෙන් ඉහත විභාගයට ඉදිරිපත් වූ සිසුන්ට සාධාරණයක් ඉටු කර දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் பரீட்சைத் திணைக்களத்தினால் 2012 ஆகஸ்ட் 06ஆம் திகதி நடத்தப்பட்ட க.பொ.த. (உயர்தரப்) பரீட்சையின் இணைந்த கணிதம் வினாத்தாளிலிருந்த பிழைகள் காரண மாக இவ்வினாத்தாளுக்கு விடையளிக் கையில் மாணவர்கள் பெரிதும் அசௌகரியத்திற்கு உள்ளானார்கள் என்பதையும்;

(ii) இவ்வினாத்தாளிலிருந்த தவறுகளுடனான வினாக்களுக்கு பதிலளிக்க முயற்சித்தமை யினால் உரிய முறையில் நேரத்தை முகாமைத் துவம் செய்ய முடியாது போனமையால் இந்த மொத்த வினாத்தாளுக்கும் மாணவர்கள் கடும் அழுத்தத்திற்கு மத்தியில் பதிலளித்துள்ளனர் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) உயர்தரப் பரீட்சையின் வினாத்தாள்களை மாணவர்களுக்கு வழங்குவதற்கு முன்னர் மீண்டும் சரிபார்க்கப்படுவதில்லையா என்ப தையும்;

(ii) 2012 க.பொ.த. (உயர்தரப்) பரீட்சையில் இணைந்த கணிதப் பாடத்திற்குத் தோற்றிய மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) உரிய அதிகாரிகளின் பொறுப்பற்ற செயற் பாடு காரணமாக அசௌகரியத்திற் குள்ளான குறிப் பிட்ட பரீட்சையில் கணிதத்துறையில் தோற்றிய மாணவர்களுக்கு நியாயம் வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) the students were greatly inconvenienced when answering the Combined Mathematics paper of the GCE (Advanced Level) Examination held on 6th August 2012 by the Department of Examinations due to the errors in that question paper; and

(ii) the students had to answer the entire question paper under tremendous pressure as they were unable to manage the time in a proper manner because they were attempting to answer the erroneous questions in the question paper?

(b) Will he state -

(i) whether Advanced Level Examination papers are not re-checked before they are given to the students;

(ii) the number of candidates who sat for the Combined Mathematics paper at the GCE (Advanced Level) Examination in 2012; and

(iii) whether steps will be taken to serve justice to the students who sat for the aforesaid exam in the Mathematics stream who were inconvenienced due to the irresponsible action of the relevant authorities?

(c) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(ආ) (i) පළමු ප්‍රශ්න පත්‍රයේ ලකුණු 1.5ක් පමණක් හිමි ප්‍රශ්න අංක 15 (a) හි 4/3 වෙනුවට 8/3 මුද්‍රණය වීම නිසා මුළු ප්‍රශ්න පත්‍රයටම පිළිතුරු සැපයීමේදී සිසුන් අපහසුතාවයට පත් වී නැත.

(ii) සමස්ත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී සිසුන් පීඩනයකට පත් නොවූ බවත් 15(a) ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ගත වන කාලය මිනිත්තු 04ක් වන බවත් සිසුන් සැමටම සාධාරණයක් ඉටු කර දීමට අදාළ පාලක පරීක්ෂකවරුන් විසින් අවශ්‍ය පියවර ගන්නා ලද බවත් දන්වා ඇත.

(ආ) (i) නැවත පරීක්ෂාවට ලක් කෙරේ.

(ii) 2012 අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය විෂයය සඳහා ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව 27025කි.

(iii) ඇගැයීම් අවස්ථාවේදී මහාචාර්යවරුන්, ආචාර්යවරුන් ඇතුළු සියලු පරීක්ෂකවරුන්ගේ එකඟතාවෙන් සිසුන් සැමටම සාධාරණයක් ඉටු කර දීමට පියවර ගත් බව විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දන්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

## විසර්ජන පනත් කෙටුම්පත, 2013
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013
## APPROPRIATION BILL, 2013

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 22]*

*[කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி : நவம்பர் 22]*

*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]*

*Considered further in Committee.- [Progress: 22nd November]*

[MR. SPEAKER *in the Chair.]*

**118 වන ශීර්ෂය.- කෘෂිකර්ම අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 131,250,000

**தலைப்பு 118. - கமத்தொழில் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவரும் செலவு ரூபா 131,250,000

HEAD 118.- MINISTER OF AGRICULTURE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 131,250,000

**179 වන ශීර්ෂය.- ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 76,265,000

**தலைப்பு 179.- கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவரும் செலவு ரூபா 76,265,000

**HEAD 179.- MINISTER OF AGRARIAN SERVICES AND WILDLIFE**

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 76,265,000

**140 වන ශීර්ෂය.- පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 150,406,000

**தலைப்பு 140.- கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவரும் செலவு ரூபா 150,406,000

HEAD 140. - MINISTER OF LIVESTOCK AND RURAL COMMUNITY DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 150,406,000

**139 වන ශීර්ෂය.- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 154,834,000

**தலைப்பு 139. - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவரும் செலவு ரூபா 154,834,000

HEAD 139.- MINISTER OF FISHERIES AND AQUATIC RESOURCES DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 154,834,000

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

පළමුවන උපලේඛනය, ශීර්ෂ අංක 118, 285, 179, 281, 284, 140, 292, 139, 290 සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා. පළමුවෙන්ම විවාදය ආරම්භ කිරීමට විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් පී. හැරිසන් මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**

(மாண்புமிகு தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

Sir, I rise to a point of Order.

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

Hon. Member, what is your point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**

(மாண்புமிகு தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

ගරු සභාපතිතුමනි, ස්ථාවර නියෝග අංක 29ට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"ප්‍රශ්නයක් ඇසීමෙන් ඉටු කර ගැනීම බලාපොරොත්තු වන නිසි අරමුණ වනුයේ ප්‍රශ්න කරනු ලබන ඇමතිවරයාගේ විශේෂ දැනුමට ගොදුරු වන සිද්ධීන් පිළිබඳ තොරතුරු ඔහුගෙන් ලබා ගැනීම හෝ ක්‍රියා කරන ලෙස අයැද සිටීම වේ."

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු සභාපතිතුමනි, ඒ වාගේම ස්ථාවර නියෝග අංක 31(3) ටත් මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"ප්‍රශ්නයක ප්‍රකාශයක් ඇතුළත් වේ නම්, එහි සත්‍යතාව ගැන ප්‍රශ්නය අසන මන්ත්‍රී වගකීම බාරගත යුතු ය."

ගරු සභාපතිතුමනි, මේ කාරණා මත මම 2012.11.19 වන දා ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යවරයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. එදා අගමැතිතුමා හිටියේ නැහැ. අගමැතිතුමා වෙනුවෙන් ප්‍රශ්නයේ වගකීම බාර ගත්තේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට දීලා තිබෙන උත්තරය සම්පූර්ණයෙන් වැරදියි. මම ඔබතුමාට පෙරේදා ඉදිරිපත් කළා අධීක්ෂණ මන්ත්‍රීවරුන් සම්බන්ධව ඇති වෙලා තිබෙන තත්ත්වය. ගරු සභාපතිතුමනි, මෙහි සියල්ලම තිබෙනවා. මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් සියල්ලම තිබෙනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ප්‍රකාශන වලංගු ප්‍රකාශන සේ එහෙම නැත්නම් ඒ අමාත්‍යාංශයේ ප්‍රකාශන සේ සලකනවා.

මේ අනුව අධ්‍යාපන ප්‍රතිපත්ති, යෝජනා 1, 2 කියා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ 1 වන ප්‍රකාශනයේ තිබෙනවා, ඉදිරිපත් කිරීම ගරු මොහාන් ලාල් ග්‍රේරු අධීක්ෂණ මන්ත්‍රීතුමා කියා. ඊළඟට -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
තමුන්නාන්සේට කථාවක් කරන්න බැහැ. තමුන්නාන්සේ කිව්වේ වරප්‍රසාද ප්‍රශ්නයක් පිළිබඳව. ඒ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව තමුන්නාන්සේට ලිඛිතව පිළිතුරු එවා තිබෙනවා. එච්චරයි. ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුව කටයුතු කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, වරප්‍රසාදයක් ගැන නොවෙයි මම කියන්නේ. මම කියන කාරණයේදී -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ප්‍රශ්නය මොකක් හෝ අහන්න ඕනෑ ක්‍රමයක් තිබෙනවා. Point of Order එකක් යටතේ අහද්දී අහන ක්‍රමයක් තිබෙනවා. කථාවක් කරන්න දෙන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රශ්නයකට මෙහෙම වැරදි පිළිතුරක් දුන්නොත් මොකක්ද වන්නේ?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒක තමයි මම පැහැදිලිව ලිඛිතව එවා තිබෙන්නේ. ඒ අනුව ක්‍රියා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, මම කියන්නේ මේකයි. අපි ඉදිරිපත් කළ ප්‍රශ්නයකට පිළිතුරක් දුන්නාම -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මම කියන්නෙත් මේකම තමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, මම කියන දේ කරුණාකර, විනාඩියක් සවන් දෙන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
වැඩියෙන් කියන විට තේරෙන්නේ නැහැ. ඕක කෙටියෙන් කිව්වා නම් තේරෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කෙටියෙන් කියනවා. අපි හිතමු, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය පිළිබඳව වැදගත් ප්‍රශ්නයක් කියා. ගරු අමාත්‍යතුමා ඒ ප්‍රශ්නයට දෙන උත්තරය අපි පිළිගන්න ඕනෑ. ඒ ප්‍රශ්නයට විරුද්ධව මොකුත් කථා කරන්න බැහැ. ඒ කියන්නේ ගරු සභාපතිතුමනි, වැරැදි උත්තරයක් දුන්නොත් -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ක්‍රමවේදයක් තිබෙනවා. ඒකට ලිඛිතව උපදෙස් දීලා තිබෙනවා. ඒ අනුව තමුන්නාන්සේට ඉදිරියේදී ක්‍රියා කරන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් එකම එක කාරණයයි අහන්නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
තමුන්නාන්සේ එකම දේ කියනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා මට කරුණාකර කියන්න. මට එක විනාඩියක් දෙන්න. අපි හිතමු, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සම්බන්ධව රටේ ණය පිළිබඳව අපි ප්‍රශ්නයක් ඇහුවා කියා. ඒ පිළිබඳව ඇමතිවරයෙක් මේ පාර්ලිමේන්තුවට ඇවිත් අසත්‍ය ප්‍රකාශයක් කරනවා. එතකොට ඒක පිළිගන්න කියාද ඔබතුමා කියන්නේ?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
පිළිගන්නේ නැත්නම් තමුන්නාන්සේට ලිඛිතව දැන්වූ ආකාරයේ ක්‍රමවේදයක් අනුගමනය කරන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම මොකුත් දමා නැහැ. ලේකම්තුමා හරහා එවූ ලිපියේ තිබෙන්නේ, මේක ප්‍රශ්න කරන්න බැහැ කියලයි. ඉතින්, ගරු සභාපතිතුමනි, මෙතැන අසත්‍ය ප්‍රකාශ කරනවා නම් -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ පිළිතුරෙන් සෑහීමට පත් වන්නේ නැත්නම් නැවත ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඒකත් බැරි නම් තමුන්නාන්සේට පුළුවන් ඒ අදාළ ඇමතිවරයාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුව නොමඟ යවනවා නම්?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මම දැන් කරුණු දෙකක් කිව්වා. ඒ දෙක තමයි ක්‍රියාත්මක කරන්නේ. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම කියන්නේ, මෙයයි. මේක දිගින් දිගටම වුණොත් එහෙම මොකක්ද වෙන්නේ? මේ පාර්ලිමේන්තුවේ ඕනෑ අසත්‍යයක් කියන්න පුළුවන් නේ. [බාධා කිරීමක්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒක තමයි මම දැන් කිව්වේ.[බාධා කිරීමක්] කරන්න ඕනෑ දෙය තමයි මම කිව්වේ. [බාධා කිරීමක්]කරන්න ඕනෑ දෙය මම කිව්වා. ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 35ක් තිබෙනවා. [බාධා කිරීම්]

[පූ.භා. 9.54]

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු සභාපතිතුමනි, "විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවල අදාළ අංක 118, 285, 179, 281, 284,140, 292, 139, 290 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් මේ කාරණය කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. මා මේ ප්‍රශ්නය ගැන කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අවස්ථා කිහිපයකදීම සඳහන් කළා. ඔබතුමාගේ අවධානයත් යොමු කළා. ඔබතුමාත් අවස්ථා කිහිපයකදීම ඒ අදාළ ඇමතිතුමන්ලාට මේ ප්‍රශ්නය ගැන කිව්වා විශේෂයෙන්ම කෘෂිකර්මයේ නියැලී සිටින විශාල පිරිසක් ගොවි විශ්‍රාම වැටුපට දායක වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අවුරුද්දකට විතර ආසන්න කාලයක් මේ අයගේ ගොවි විශ්‍රාම වැටුප ලැබී නැහැ.

මම තමුන්නාන්සේට විශේෂයෙන්ම අන්න ඒ කාරණය මතක් කරනවා. එහි සාමාජිකත්වය ලබා තිබෙන, ඒ විශ්‍රාම වැටුප හිමි විය යුතු අයට ගිය ඔක්තෝබර් මාසයෙන් පසුව ගොවි විශ්‍රාම වැටුප ලැබිලා නැති එක ගැන අපේ බලවත් අප්‍රසාදය හා කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, 1983 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමතිවරයා හැටියට කටයුතු කරපු ගරු ගාමිණී ජයසූරිය මැතිතුමා මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් ඒ අය මේ රටට කරන සේවාව අගය කර විශේෂයෙන්ම ඒ ජනතාවගේ සාමාජික මුදලුත්, රජයේ මුදලුත් - ඉතාම සොච්චම් මුදලක්- මේ සඳහා යොමු කර මේ අයට විශ්‍රාම වැටුපක් ලබා දෙන්න ඕනෑය කියලා මුලින්ම යෝජනා කළා. මා හිතන්නේ නැහැ මේක රජයකට මහත් බරක් කියලා. මොකද මේක බොහොම පොඩි මුදලක්. ගරු සභාපතිතුමනි, මේ මුදල එක පැත්තකින් පොඩි වුණාට මම දන්නවා ඒ අය මේ රටට කරන සේවාව ඉතාම අගය කිරීමක් හැටියට කරපු ඒ යෝජනාවෙන් ඒ අය බොහොම ආඩම්බරයෙන්, බොහොම ගෞරවයෙන් තමන්ටත් විශ්‍රාම වැටුපක් ලැබෙනවාය කියලා ඒ මුදල ලබා ගත්තා. මට මතකයි, තමුන්නාන්සේ මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා තමනුත් ඒකට දායක වෙලා තිබෙනවාය කියලා. ගරු සභාපතිතුමනි, එහෙම තත්ත්වයක් තියෙද්දී මේ විශ්‍රාම වැටුප මාස කීපයකින් මේ අයට නොලැබුණේ මොන කාරණයක් නිසාද?

මේ ගොවි විශ්‍රාම වැටුප ගොවීන්ට නොලැබිලා අවුරුද්දකට ආසන්න වෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ අයගෙන් සාමාජික මුදල් අරගෙන තිබෙනවා. 1994 වන කල් හැම අවුරුද්දක් පාසා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 15ක් ඒ වෙනුවෙන් වෙන් කළා. හැබැයි එතැනින් පස්සේ අපි දැක්කේ නැහැ එයට රජයේ දායකත්වය ලැබෙනවාද කියලා.

ගරු සභාපතිතුමනි, මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි, මේ ගොවි විශ්‍රාම වැටුප ඉදිරියට ගෙන යන්න රජය මඟින් ක්‍රමවේදයක් හදලා තිබෙන බව. දැනට ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ලබන ගොවීන් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම, මේ ගොවි විශ්‍රාම වැටුපට දායකත්වය ලබා දෙන ලක්ෂ 10ක් විතර ඉන්නවා. ඒ අයගේ මුදලින් තමයි මේ විශ්‍රාම වැටුප ක්‍රියාත්මක වන්නේ. ගිය මාසයේදී -නොවැම්බර් මාසයේදී- මේ සඳහා වූ මුදල් වෙනත් ආයතනයකින් ලබා දීලා නොවැම්බර් මාසයේ විශ්‍රාම වැටුප ලබා දුන්නා. හැබැයි එතැනින් පස්සේ එය නතර කර තිබුණා.

ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතේ ඡන්දය පටන් ගත්තා විතරයි, පුදුම දෙයක් කළා. උතුරු මැද පළාතේ මැති ඇමතිවරු කීපදෙනෙක්ම ඉන්නවා. උතුරු මැද පළාතේ පැවැති මැතිවරණය වෙනුවෙන් පසු ගිය අගෝස්තු මාසයේ 17වැනි දා අනුරාධපුරයේ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තඹුත්තේගම ප්‍රාථමික විද්‍යාලයේ පැවැති රැස්වීමට අතිගරු ජනාධිපතිතුමා ගියාම, සල්ලි ටිකක් දුන්නා; ගොවීන් කීපදෙනකු තෝරා ගෙන ගොවි විශ්‍රාම වැටුප් වශයෙන් රුපියල් 6,000 ගණනේ දුන්නා. මම

[ගරු පී. හැරිසන් මහතා]

දන්නේ නැහැ ඒ මුදල් කොයි අරමුදලින් ගෙනාවාද කියලා. මැතිවරණ කාලයට විතරක් ඒ සල්ලි ආවේ කොහෙන්ද කියලා අපි දන්නේ නැහැ ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, මේ ගොවි විශ්‍රාම වැටුප ක්‍රියාත්මක කරන්න තමයි "ගොවිසෙත" ලොතරැයිය ආරම්භ කරලා තිබෙන්නේ. ගොවියන් ඇතුළු මේ රටේ මහ ජනතාව අද "ගොවිසෙත" ලොතරැයිය බොහොම ඕනෑකමින්, උනන්දුවෙන් මිලදී ගන්නවා. අපට දැන ගන්න ලැබී තිබෙන හැටියට, ගොවීන්ගේ විශ්‍රාම වැටුපට දායක වෙන්න තමයි ගොවිසෙත ලොතරැයියේ මුදල් වෙන් කර තිබෙන්නේ. එක්කෝ ගොවිජන සේවා ඇමතිවරයා ගොවි විශ්‍රාම වැටුප භාරව ඉන්න ඕනෑ. එහෙම නැත්නම් මේ රටේ කෘෂිකර්ම ඇමතිවරයා එය භාරව ඉන්න ඕනෑ. අද මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය භාරයේයි එය තිබෙන්නේ. හැබැයි ගරු සභාපතිතුමනි, මම තමුන්නාන්සේට කියනවා, මේ ගොවි විශ්‍රාම වැටුප ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් අද වන කල් ඇති කර නැහැ කියලා. අපි හිතුවා මේ අය වැයේදීවත් එවැන්නක් ඇති කියලා. මේ රටේ ගොවීන් වෙනුවෙන් කථා කරන, ගොවීන් ශක්තිමත් කරන්න, ගොවීන් නඟා සිටුවන්න කටයුතු කරනවා කියන මේ ආණ්ඩුව මේ අය වැයෙන්වත් ඒ සඳහා මුදලක් වෙන් කරලා නැහැ. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා ගරු සභාපතිතුමනි. ඒ අය මේ රට වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරපු පිරිසක්.

ඒ වාගේම ඔවුන් රට වෙනුවෙන් විශාල කැපවීමක් කළ පිරිසක්. ඒ අයට ශක්තියක් වෙන්න මේ ගොවි විශ්‍රාම වැටුප ලබා දෙන්න කියන කාරණයට මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, අද ආණ්ඩුවට මිලියන 10ක්, 15ක් මේ වෙනුවෙන් වෙන් කරන්න අසීරු වෙලා තිබෙනවා. දැන් බලන්න, එයාර් ලංකා සමාගමේ පාඩුව පසු ගිය අවුරුද්දේ රුපියල් මිලියන 17,172යි. ඒ කියන්නේ එක දවසක පාඩුව භාරකෝටි හැත්තෑලක්ෂයක්. හැබැයි රජයට ඒ පාඩුව වෙනුවෙන් ගෙවන්න මුදල් තිබෙනවා. ඒ වාගේම මිහින් ලංකා ආයතනයේ පාඩුව ගිය අවුරුද්දේ මිලියන 1,966යි. දවසක පාඩුව රුපියල් කෝටි 6යි. ඒ වාගේම තමයි මේ රටේ පාඩු ලබන ආයතන ගණනාවක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒ සඳහා රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. හැබැයි මේ රට වෙනුවෙන් අවුරුදු 30ක්, 40ක්, 50ක් තමන්ගේ ශ්‍රමය වැය කළ ගොවි ජනතාව වෙනුවෙන් රුපියල් දාහක් වාගේ බොහොම පොඩි මුදලක් ගෙවන්න තරම් මේ ආණ්ඩුව සානුකම්පික වෙලා නැහැයි කියන කාරණය මා තමුන්නාන්සේට මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරනවා.

විශේෂයෙන්ම ගොවි ජන ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මගේ යුතුකමක් තිබෙනවා, ඒ ජනතාවගේ හඬ අවදි කරන්න. ඒ ජනතාව වෙනුවෙන් යමක් කරන්න ඕනෑ. ඒ සඳහා මා තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ මේකයි. මේක අලුතින් පටන් ගන්න දෙයක් නොවෙයි. දීර්ඝ කාලයක් තිස්සේ පැවැති හැම රජයක්ම මේ සඳහා කටයුතු කර තිබෙනවා. ඒ නිසා ඉදිරියට අඩුම තරමින් මුදල් අමාත්‍යාංශය වාගේම අනිකුත් ආයතන මැදිහත් වෙලා මේ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම මේ කාරණය කෙරෙහිත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කැමැතියි. ඔබතුමා දැන් දවස් කීපයකට කලින් මේ පාර්ලිමේන්තුවේ භෝජන ශාලාවේදී ඇති වුණු සිද්ධියක් සම්බන්ධයෙන් මතක් කළා. මේ පාර්ලිමේන්තුවේ භෝජන ශාලාවේ කොහිල ව්‍යංජනය ගැන ප්‍රශ්නයක් මතු වුණා. හැබැයි මේ පාර්ලිමේන්තුවේ ඒ ප්‍රශ්නය මතු වුණු නිසා තමුන්නාන්සේ වෙනම රස පරීක්ෂකවරුන් ගෙන්නලා මේවා පරීක්ෂා කළා. ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවට ගෙනාපු කොහිලවල ආසනික් අඩංගු වෙලා තිබුණාය කියලා අපට දැන ගන්න ලැබුණා.

ඒක දැන ගන්න ලැබුණේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය මේ ව්‍යංජනයේ පාට වෙනස් වෙලා තිබෙනවා දැකපු නිසායි. හැබැයි ගරු සභාපතිතුමනි, මේ කොහිලම මේ කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මේ රටේ තවත් තැන්වල ජනතාව අනුභව කරන්න ඇති. ව්‍යංජනයේ පාට වෙනස් වෙලා තිබුණා නම් ඒ අය හිතන්න ඇති, මේ ව්‍යංජනයට මිරිස් ටිකක් වැඩි වෙලා, එහෙම නැත්නම් ව්‍යංජනයට දමපු අමතර දෙයක් වැඩි වෙලා ඇති කියලා. හැබැයි ඒ අය ඒ කොහිල කන්න ඇති. ඇමතිතුමනි, මම විශේෂයෙන් මතක් කරන්නේ අපි අද ලොකුම අර්බුදයකට මැදි වෙලා තිබෙන බවයි. විශේෂයෙන්ම මේ ආසනික් ප්‍රශ්නය අද මුළු රටම වෙළා ගත්ත ප්‍රශ්නයක් බවට පත් වෙලා. උතුරු මැද පළාතේ මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම දැන් ඌව පළාතේත් තිබෙනවා. දකුණු පළාතටත් එය ව්‍යාප්ත වෙලා තිබෙනවා. මම දන්නවා, මේ සම්බන්ධයෙන් අවුරුදු ගණනාවක් පරීක්ෂණ කීපයක් කරලා අන්තිම ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ මේ රටේ ජනතාව පානය කරන වතුර ඒ ප්‍රදේශයේ ජනතාවට අහිතකර විධියට බලපාලා තිබෙනවා කියන එකයි. මම දැක්කා, ඊයේ කෘෂිකර්ම ඇමතිතුමා හොඳ සාකච්ඡාවක් කළා. එතුමා ඒ සම්බන්ධයෙන් විද්වතුන්, අදාළ අය ගෙන්වලා පැවැත් වූ සාකච්ඡාවේදී සමහර කරුණු තවම එක එක මත ගැටුම්වල තිබුණත් ඒ අයගේ පානීය ජල ප්‍රශ්නයත් එක්ක මෙය සම්බන්ධයක් තිබෙනවායි කියන එක අපට තහවුරු වුණා. ඇමතිතුමාත් ඒක පිළිගත්තා. ආසනික් ප්‍රශ්නය මේ ආකාරයෙන් බොහොම තදබල විධියට බලපාන්න පටන් ගත්තේ දැනට අවුරුදු පහක් හයක් වාගේ කෙටි කාලයක් ඇතුළතදීයි.

ගරු සභාපතිතුමනි, මම තමුන්නාන්සේට මතක් කරනවා, සෞඛ්‍ය අමාත්‍යාංශය පවසන පරිදි, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලින් දැන ගන්නට තියෙන පරිදි උතුරු මැද පළාතේ විතරක් පසු ගිය අවුරුදු දහය, පහළොව ඇතුළත 22,000ක් මිය ගිහින් තිබෙන බව. ඒ විතරක් නොවෙයි, තවත් 50,000ක් 60,000ක් විතර දෙනා රජයේ රෝහල්වලින් තවමත් ප්‍රතිකාර ලබනවා. මේ අය අනිවාර්යයෙන්ම මරණයට පත් වෙනවා. මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව තව වසර 10ක්, 15ක් යන කොට මේ ප්‍රදේශවල වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව සියයට 50කටත් වැඩි වනවාය කියන කාරණයට. එහෙම වුණොත් අපට බරපතළ ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිද්ධ වනවා. මෙය දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. ජාතික ප්‍රශ්නයක් හැටියට සලකලා මේ ප්‍රශ්නය විසඳන්න අවශ්‍යයි. විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශවල ජීවත් වන ජනතාවට මේ ප්‍රශ්නය මහත් හිසරදයක් වෙලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පිරිසිදු පානීය ජලය දෙන්නම්.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔබතුමා ඒ පිරිසිදු පානීය ජලය දෙන්න ඕනෑ. ඒක අපි පිළිගන්නවා. හැබැයි පානීය ජලය විතරක් දීලා මදි. මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්න කැමැතියි ගරු සභාපතිතුමනි, මහනුවර මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ,

පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාව පිළිබඳ හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී.බී. දිසානායක මැතිතුමා පුවත් පතකට කළ ප්‍රකාශයක් කෙරෙහි. එතුමා කියනවා, "මිල අඩු පොහොර තත්ත්වයෙන් බාලයි" කියලා. අද අලුත්ම සොයා ගැනීම අනුව ලෝක සෞඛ්‍ය සංවිධානය කියන ආකාරයට triple superphosphate පොහොරවලින් ආසනික් ප්‍රමාණය වැඩි වෙනවායි කියලා සොයා ගෙන තිබෙනවා. ඊයේ පැවති ඒ සාකච්ඡාවට බැසිල් ඇමතිතුමාත් හිටියා. එතුමා කිව්වා, මීට කලින් ඒවා පරීක්ෂණවලට ලක් වුණේ නැහැයි කියලා. මම කියනවා, කරුණාකරලා මේ ගැන අවධානය යොමු කරන්න කියලා. මේ රටේ පරීක්ෂණ කරන්න අය නැත්නම් විදේශවලින් හෝ ගෙන්වලා මේ ප්‍රශ්නයට විසඳුමක් සෙව්වේ නැත්නම් තව අවුරුදු පහක් දහයක් යන කොට බරපතළ ප්‍රශ්න මතු වෙනවා. විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශවල ජනතාවගේ පවුලේ ඉන්න ප්‍රධානියා තමයි මේකෙන් ඉස්සෙල්ලාම මැරෙන්නේ. මොකද, ඔහු තමයි වැඩියෙන්ම වතුර පානය කරන්නේ. එහෙම වුණොත් ඒ පවුලම අනාථ වනවා. දරුවන් ටිකට යන එන මං නැති වෙනවා; බිරිඳ විදේශ රටකට යනවා. මෙය සමාජ ගැටලුවක් බවට පත් වනවා. අද 20,000ක් 22,000ක් දෙනා මැරුණා කියන්නේ ලොකු ගණනක්. එල්ටීටීඊ ත්‍රස්තවාදය බොහොම තදයට තිබිලාත් ඒ හේතුවෙන් අපේ ප්‍රදේශවල ජනතාව මේ තරම් ගණනක් මැරුණේ නැහැ. හැබැයි මේ ප්‍රශ්නය නිසා වකුගඩු ආසාදනය වෙලා අද විශාල පිරිසක් මැරෙනවා.

විශේෂයෙන්ම අපි ස්තුති කරන්න ඕනෑ, අපේ රතන හාමුදුරුවන්ට. උන් වහන්සේ පසු ගිය දවස්වල මේ සම්බන්ධයෙන් ලොකු පරිශ්‍රමයක් දැරුවා, මාධ්‍ය හරහාත් රටේ විද්වතුන් හා අනෙකුත් සියලු දෙනාත් එකතු කර ගෙන මේ ප්‍රශ්නයට හේතුව මොකක්ද කියලා හොයන්න. අපේ කෘෂිකර්ම ඇමතිතුමාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, රසායනික පොහොරවල ආසනික්, බැර ලෝහ වර්ග, රසදිය අඩංගුයි කියලා විද්‍යාඥයෝ ප්‍රකාශ කර තිබෙනවාය කියා.

මේ රටේ විද්‍යාඥයෝ පසු ගිය අවුරුද්දේ වරායේදී අහම්බෙන් වාගේ සොයා ගත්තා, අපේ රටට ගෙන්වපු රසායනික ද්‍රව්‍ය container 10ක ආසනික් අඩංගු වෙලා තිබෙනවා; ඒ වාගේම බැර ලෝහ වර්ග අඩංගු වෙලා තිබෙනවා කියලා. ඒ රසායනික ද්‍රව්‍යවල samples අරගෙන අපේ රතන හාමුදුරුවෝ මැලේසියාවේ විද්‍යාගාරයකට ගිහින් කළ ඒ පරීක්ෂණයෙන් අධික විධියට ආසනික්, රසදිය වාගේ බැර ලෝහ වර්ග ඒවායේ අඩංගුයි කියලා උන් වහන්සේත් ප්‍රකාශ කළා විතරක් නොවෙයි, වාර්තාවකුත් ගෙනැල්ලා දීලා තිබෙනවා. හැබැයි කාගේ හෝ හස්තයකින් වරායේ නවත්වලා තිබුණු ඒ containers ටික එළියට ගියා. හඳිසි හස්තයක් ඒකට බලපාලා තිබෙනවා. මා දන්නේ නැහැ කාගේ වුවමනාවකට එය සිදු වුණාද කියලා. වරායෙන් ඒවා තහනම් කළා. ඒවාට දඩ ගැහුවා. හැබැයි ඒ ටික එළියට ගියා. ඒකේ විපාක විඳින්න වෙලා තිබෙන්නේ අද මේ රටේ ජනතාවටයි. අපි අද විදේශීය සමාගම්වල බහුජාතික සමාගම්වල ගොදුරක් බවට පත් වෙලා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මා තමුන්නාන්සේට කියන්නේ, මේ රටේ මහ ජනතාව වෙනුවෙන් මේ ප්‍රශ්නය ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කියලායි.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපේ කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා ඉල්ලන්න කැමැතියි, පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා මඟින් මේ රටට ගෙනෙන පොහොර, ඒ වාගේම කෘෂි රසායනික ද්‍රව්‍ය මීට වඩා දැඩි පරීක්ෂණයකට ලක් කරන්නය කියලා. මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ යුතුකම ඉටු කරන්න. මොකද, එතුමා තමයි ඒ සඳහා බලයලත් නිලධාරියා හැටියට ඉන්නේ. මේ සම්බන්ධයෙන් වග කිව යුත්තා හැටියට ඔබතුමාගේ වැඩි අවධානයක් මේ සඳහා යොමු කරවන්න මා කැමැතියි.

ගරු සභාපතිතුමනි, මා තමුන්නාන්සේට විශේෂයෙන්ම කියන්න කැමැතියි අපි අද බහුජාතික සමාගම්වල අතකොළු බවට පත් වෙලා ඉවරයි කියලා. මේ රටේ බීජ නිෂ්පාදනය හා බෙදා හැරීම පවත්වා ගෙන යන්න අපට සම්පත් තිබෙනවා. අපට තිබෙනවා, බීජ ගොවිපොළවල් 19ක්. ඒ වාගේම බීජ ගොවිපොළවල් යටතේ ඉඩම් හෙක්ටයාර් 2,083ක් තිබෙනවා. අලෙවි මධ්‍යස්ථාන 33ක් තිබෙනවා. අපට ඉන්නවා ගරු සභාපතිතුමනි, සහකාර අධ්‍යක්ෂවරු 30 දෙනෙක්; කෘෂිකර්ම උපදේශකවරු 136 දෙනෙක්; ස්ථිර කම්කරුවන් 390 දෙනෙක්; අනියම් කම්කරුවන් 1,410 දෙනෙක්. අනෙකුත් කාර්ය මණ්ඩල ඉන්නවා දෙසිය ගණනක්. ඔක්කෝම දෙදහස් ගණනක් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, මා හිතන හැටියට අධ්‍යාපන අමාත්‍යාංශය හැරුණු විට කෘෂිකර්ම අමාත්‍යාංශයේ තමයි උගත් බුද්ධිමත් මහාචාර්යවරු විශාල පිරිසක් ඉන්නේ. ඒත් මම තමුන්නාන්සේට කියන්න කැමතියි, මෙතරම් පර්යේෂණ ගොවිපළවල් තිබෙද්දී, මෙතරම් විද්වතුන් පිරිසක් අපේ රටේ ඉඳිද්දී, අපි අද විදේශීය සමාගම්කාරයින්ට යට වෙලා ඉවරයි කියන එක. මම එහෙම කිව්වේ අද හුඟක් වෙලාවට අපේ රටට අවශ්‍ය බීජ සියල්ලක්ම පාහේ ගෙනෙන්නේ විදේශීය රටවලින් නිසායි.

ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, මම තමුන්නාන්සේත් එක්ක සමහර කරුණුවලදී එකඟ වෙනවා; සමහර කරුණුවලදී එකඟ වෙන්නේ නැහැ. මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් බීජ වර්ග තිබෙනවා. ඒවාට ලොකු මුදලක් වැය වෙන්නේ නැහැ.

මම තමුන්නාන්සේට කියන්න කැමැතියි, බී ලූනු ගැන. අද, බී ලූනු ප්‍රභේද ලංකාවේ හදන්න පුළුවන්. හැබැයි, ඉන්දියානු බී ලූනු බීජ කිලෝ එකක් ගෙන්වන්න අපි අද රුපියල් 3250ක් ගෙවනවා. හැබැයි මේ රටේ දඹුල්ලේ, ඒ වාගේම වෙනත් තැන්වල, පෞද්ගලික ගොවිපොළවල්වල මීට වැඩිය අඩු මිලකට ඒවා හදන්න පුළුවන්. මිරිස් ඇට ගැන බැලුවත් එහෙමයි. මේවා ඔක්කොම hybrid බීජ වර්ග. පාවිච්චි කරන්න පුළුවන් එක වතාවයි. ගරු සභාපතිතුමනි, අපට තිබුණු දේශීය මිරිස් නිෂ්පාදන අද සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ඉවරයි. කන්නයෙන් කන්නයටම ගිහිල්ලා මේ බහුජාතික සමාගම් ගෙනෙන මොනවා හරි ජරාවක් ගන්න අපි අද පුරුදු වෙලා ඉන්නවා. මෙතරම් බීජ ගොවිපළවල් තිබෙද්දී, මෙතරම් කෘෂිකර්ම උපදේශකයන් ඉඳිද්දී, ඒ වාගේම දක්ෂ, හැකියාවන් තිබෙන අය ඉඳිද්දී අපි මොකක්ද කරන්නේ? මිරිස් ඇට ටික තායිලන්තයෙන් ගෙනෙනවා. කිලෝ එකක් රුපියල් 86,900යි. දේශීය වශයෙන් හැදුවා නම් ඒ සඳහා වියදම් වෙන්නේ රුපියල් 1336යි. එහෙම හැකියාව තිබෙද්දී පිට රටින් මේ මිරිස් බීජ ගෙන්වන්නේ ඇයි? අපේ මහඉලුප්පල්ලම ගොවි පර්යේෂණායතනය තිබෙනවා. එහි අක්කර 1000කට වඩා තිබෙනවා. එහි රටටම අවශ්‍ය බීජ නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි ඒ සඳහා පුහුණු, දක්ෂ, හැකියාවන් තිබෙන අය ඉන්නවා. අනිකුත් දේවල් ගැන බැලුවත් එහෙමයි. මිරිස් වාගේම මාළු මිරිස් ආදිය ගැන බැලුවත් එහෙමයි. ගරු සභාපතිතුමනි, අද වට්ටක්කා ඇට ටික පවා විදේශීය සමාගම්වලින් ගෙනෙනවා.

මෙහේ දේශීය වට්ටක්කා ඇට කොපමණ තිබෙනවාද? ඒවා මෙහේ හදන්න පුළුවන්. පිපිඤ්ඤා ඇට ටික පිට රටින් ගෙනෙනවා. වට්ටක්කා ඇට කිලෝග්‍රෑම් එකක් විදේශීය සමාගමකින් ගෙන්වන්න රුපියල් 19,870ක් වැය වනවා. පිපිඤ්ඤා ඇට කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 36,280යි. ඒවා ඔක්කොම ගෙන්වන්නේ තායිලන්තයෙන්. අපි අවුරුද්දක් පාසා කන්නයෙන් කන්නය බලා ගෙන ඉන්නවා, විදේශීය සමාගම්වලින් මේ ඇට ටික ගෙනෙන්න. වම්බොටු ඇට ගෙනෙනවා, ගරු සභාපතිතුමනි.

[ගරු පී. හැරිසන් මහතා]

ඒ වාගේම පතෝල ඇට, කරවිල ඇට, වැටකොළු ඇට, තක්කාලි ඇට, ගෙනෙනවා. දැන් බලන්න, ගරු සභාපතිතුමනි, තක්කාලි ඇට මෙහේ හදන්න පුළුවන්. ගොවි පොළවල් තිබෙනවා; පර්යේෂණායතනය තිබෙනවා. හැබැයි අපි තක්කාලි ඇට කිලෝග්‍රෑම් එකක් තායිලන්තයෙන් රුපියල් 1,23,500කට ගෙනෙනවා. ඒ විතරක් නොවෙයි. කොමඩු ඇට ගෙනෙනවා.

ගරු සභාපතිතුමනි, මේ කාරණය කෙරෙහි කෘෂිකර්ම ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. විශේෂයෙන්ම ගස් ලබු වගාව අද ඉතාමත්ම සාර්ථකව කරන්න පුළුවන්. හැබැයි ගස් ලබු ඇට කිලෝග්‍රෑම් එකක් ගෙන්වන්න තමුන්නාන්සේලා විදේශීය සමාගම්වලට රුපියල් 8,50,000ක් වැය කරනවා. එහෙම නම් අපි මේ සඳහා වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. එහෙම නැතුව කෘෂිකර්ම අමාත්‍යාංශය තිබෙන්නේ CIC සමාගමෙන් හෝ වෙනත් සමාගමකින් ගෙනෙන ඇට ටික බෙදා දෙන්නවත්, එහෙම නැත්නම් සීමාසහිත ලංකා පොහොර සමාගමෙන් දෙන පොහොර ටික නිකම් බෙදා දෙන්නවත් නොවෙයි. ඒ සඳහා විශාල සේවක පිරිසකුත් නඩත්තු කරනවා. ගරු සභාපතිතුමනි, මේ බීජ ගෙන්වීම සඳහා එක අවුරුද්දකට රුපියල් බිලියනයක් වියදම් කරනවාය කියලා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙක් කියනවා. මේ අපරාද සල්ලි නාස්තියක්. ඒ ගැන මා කනගාටු වනවා. එම නිසා මා තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ විශේෂයෙන්ම මේ වැඩ පිළිවෙළ මීට වඩා සාර්ථකව ක්‍රියාත්මක කරන්න කියලායි. එහෙම නැති වුණොත් තව ටික දවසකින් කෘෂිකර්මය සතුව තිබෙන සියලුම දේවල් විදේශීය සමාගම්වලට ලියා දෙන එක විතරයි සිද්ධ වන්නේ.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. ඇමතිතුමාට මා මේ කාරණය ගැන මතක් කරන්න කැමැතියි. මෙවර වී මිල සම්බන්ධයෙන් ගරු කෘෂිකර්ම ඇමතිතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් කැඳවා තිබුණා. මා තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි, එතැනදී එතුමාම පිළිගෙන තිබෙනවා, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම රුපියල් 26.87ක් වනවාය කියලා. ගරු ඇමතිතුමනි, වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම රුපියල් 26.87ක් වනවා නම් වී අක්කරයකින් අපට කොපමණ ආදායමක් ලැබෙනවාද?

තමුන්නාන්සේ කියන හැටියට වී කිලෝ එකක නිෂ්පාදන වියදම වශයෙන් රුපියල් 26ක් වැය වෙනවා නම්, ඔබතුමා කියන විධියට මහවැලි ප්‍රදේශයක් ගත්තොත් හෙක්ටයාර් එකක මුළු ආදායම ලැබෙන්නේ රුපියල් 88,689යි ගරු ඇමතිතුමනි. හෙක්ටර් කොබ්බෑකඩුව පර්යේෂණ ආයතනයෙන් කියනවා, සාමාන්‍යයෙන් හෙක්ටයාර් එකකින් අස්වැන්න කිලෝ 4,000ක් විතර ලැබෙනවා කියලා. එක හය මාසයකට අපට ලැබෙන ආදායම රුපියල් 89,689යි. [බාධා කිරීමක්]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු මන්ත්‍රීතුමනි, ඒක වැරැදියි. වී කිලෝ එකක මිල රුපියල් 32යි, එහෙම නැත්නම් රුපියල් 30යි. එතකොට කිලෝ 4,000ට රුපියල් 1,20,000ක් වෙනවා නේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඉන්න, මා එතැනට එනවා. එතකොට ඔබතුමා කියනවා, වී කිලෝ එකක් රුපියල් 35 ගණනේ තමයි මිලදී ගන්නේ කියලා. රුපියල් 35 ගණනේ වික්කත් අපට මාසයකට රුපියල් දහ, දොළොස් දාහකට වඩා ලැබෙන්නේ නැහැ, ඇමතිතුමනි. මේ හෙක්ටයාර් එකක ආදායමෙන් ගොවියා මාස 06ක් ජීවත් වන්නට ඕනෑ. ඒක නිසා අපි ඔබතුමාට යෝජනා කරන්නේ, විශේෂයෙන්ම මේ පාරම්පරික කෘෂිකර්මාන්තය වෙනුවට අපට නව තාක්ෂණය ඇතිව අලුත් බීජ වර්ගවලින් -කෘෂිකර්මාන්තයෙන් මේ ගොවියාට යහපතක් සිදු වෙලා නැහැ. ඔබතුමාත් එය පිළිගන්නවා ඇති. එහෙම නම් උසස් තාක්ෂණයක් තිබෙන බීජ වර්ගවලින්- වැඩි අස්වැන්නක් ලබා ගන්න පුළුවන් විධියට මේ කෘෂිකර්මාන්තය නව තාක්ෂණය අනුව දියුණු කරන්න ඕනෑ කියලායි. ඒකට අපේ පක්ෂ විපක්ෂ භේදයක් නැහැ. අපි උදවු කරන්න ලැහැස්තියි. මොකද, එහෙම නැති වුණා නම් මේ ක්‍රමය අපට ඉස්සරහට ගෙන යන්න බැහැ. හැමදාමත් ගොවියාට සහනාධාර මත යැපුම් කෘෂිකර්මාන්තයේ යෙදෙන්නට සිදු වෙනවා. අන්න ඒ නිසායි අපි යෝජනා කරන්නේ, නව තාක්ෂණය උපයෝගි කරගෙන ගොවිතැන දියුණු කරන්න කටයුතු කරන්න කියලා. රසායනික පොහොර දැම්මාය කියලා මහා ලොකු අස්වැන්නක් වැඩි වෙලා නැහැ. ඔබතුමාත් එයට එකඟ වනවා ඇති. ඔබතුමාම කියලා තිබෙනවා, "ගොවියා කාබනික පොහොර භාවිතයට යොමු කිරීමට මේ අය වැයෙන් මුලපුරනවා." කියලා. ඒක හොඳයි. මොකද, කාබනික පොහොර භාවිතයට ගියේ නැත්නම් එක පැත්තකින් අපි ලෙඩුන් වෙනවා.

මේ රටේ කෘෂිකර්මාන්තයට යොමු වෙලා සිටින අය අද විශාල විධියට ලෙඩුන් බවට පත් වෙලා සිටිනවා. එහෙම නම් අපි ටිකෙන් ටික මේ රසායනික පොහොර භාවිතයට ගොවියා ඇබ්බැහිවීමෙන් වළක්වා ගන්නට ඕනෑ. එහෙම නැති වුණොත් අපට ආදායමේ වැඩි වීමකුත් නැහැ; අපි බලාපොරොත්තු වන ඉලක්කයකට යන්නත් බැහැ; හැබැයි කෘෂිකර්මයේ යෙදී සිටීමෙන් අපි ලෙඩුන් වෙලා ඉවරයි. ඒක නිසා මා තමුන්නාන්සේට කියන්නේ, කෘෂිකර්මාන්තය නඟා සිටුවනවා වාගේම, ඒ සඳහා නව ක්‍රම උපයෝගි කර ගන්න කියන එකයි. සහනාධාර මත, යැපුම් ආර්ථිකයක් මත ගොවියාට මේ කෘෂිකර්මාන්තය කරගෙන යන්නට ඉඩ නොතබා, කෘෂිකර්මාන්තය නව ආරකට ගෙන යන්නට සම්පූර්ණ වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑයි කියන එකයි ගරු ඇමතිතුමාට මා මේ අවස්ථාවේ දී යෝජනා කරන්නේ.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, මම තමුන්නාන්සේට මේ කාරණයත් මතක් කරනවා. පසු ගිය කාලයේ උතුරු මැද පළාතේ පැවැති නියඟයෙන් පීඩාවට පත් වුණු ගොවීන්ගේ වගා ණයවල පොලිය කපා හරින්න ආණ්ඩුව තීන්දුවක් අරගෙන තිබුණා. මම දන්නවා, මුදල් අමාත්‍යාංශයෙන් -ජනාධිපතිතුමා- නියෝගයක් දීලා තිබුණා, ඒ අයගේ පොලී කපා හරින්න කියලා. ගරු ඇමතිතුමනි, ඒ දුන්නු නියෝගය අද ඒ ගොවීන්ටම සාපයක් වෙලා. මම එහෙම කිව්වේ මෙන්න මේ කාරණය නිසායි. බැංකුවෙන් ගොවියෙකුට එවපු ලියුමක් මට ලැබිලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, "ටී.ජී. ජයවතී, සිරිමාගම, අවුකන" කියන ලිපිනයට මහජන බැංකුවෙන් ලියුමක් එවලා තිබෙනවා, 2012 යල කන්නය සඳහා ගන්නා ලද රුපියල් 25,000ක ණය මුදල පොලිය සමඟ ගෙවන්න කියලා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව නතර කළොත් හොඳයි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මේ ආණ්ඩුවෙන් කියලා තිබෙනවා, පොලිය කපා හරින්න, ඒ වාගේම ඒ ණය අය කිරීම අත් හිටුවන්න කියලා. ගරු ඇමතිතුමනි, මෙතැන ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ මෙයයි. ජනාධිපතිතුමා වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය ගොවි ණය කපා හැරීම පිළිබඳ කොළයක් මුද්‍රණය කරලා ඒ ගොවීන්ට බෙදා දුන්නා. ගොවීන් ඒ කෙරෙහි විශ්වාස තැබුවා. අන්තිමේදී වුණේ-

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன )
(The Hon. Mahinda Yapa Abeywardena)

ඒ විශ්වාසය ඒ ආකාරයෙන්ම තිබෙනවා. ඒ චක්‍රලේඛය දැන් ගිහිල්ලා තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මම ඔබතුමාට කියන්නම්. චක්‍රලේඛය යැව්වා කියලා ඔබතුමා කිව්වාට, මම ඊයේත් පරීක්ෂා කෙරුවා. ඔබතුමා කැකිරාවේ ලංකා බැංකුවට කථා කරන්න. එප්පාවල මහජන බැංකුවට කථා කරන්න. ඊයේ වෙන තුරු ඒ චක්‍රලේඛය ඒ බැංකුවලට ගිහිල්ලා නැහැ. ගරු ඇමතිතුමනි, මේ තුළින් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මේකයි. ඒ නිසා ඒ ගොවීන්ට මේ මාස් කන්නය සඳහා ණය නිකුත් කරන්නේ නැහැ. ඒ ගොල්ලන්ගේ ණය පොලිය කපා හැරලාත් නැහැ; මේ කන්නය සඳහා ඒ ගොල්ලන්ට ණය ගන්න විධියකුත් නැහැ. මොකද, "ආණ්ඩුවෙන් කිව්වාට, ජනාධිපතිතුමා පත්තරවලට කිව්වාට, දේශපාලනඥයන් කිව්වාට මේ ණය කපන්න බැහැ, එහෙම නම් චක්‍රලේඛයකින් දන්වන්න ඕනෑ" කියන එකයි බැංකුව කියන්නේ. මම ඊයේ පරීක්ෂා කරලා බැලුවා. ඔබතුමා දැන් කථා කරන්න ඒ බැංකු දෙකට. කැකිරාව ලංකා බැංකුවට, එප්පාවල මහජන බැංකුවට කථා කරන්න. ඒ දෙකම රජයේ බැංකු දෙකක්. ඔබතුමා පරීක්ෂා කරලා බලන්න, මේ කාරණය ඇත්තද, නැත්තද කියලා. එහෙම චක්‍රලේඛයක් එවලා තිබුණා නම් මම ඔබතුමාට මේ කාරණය කියන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් තමුන්නාන්සේට බොහොම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ. භා. 10.24]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Agrarian Services and Wildlife)

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා මෙම සභාවට ඉදිරිපත් කරන ලද එතුමාගේ 8වැනි අය වැය ලේඛනයේ තිබෙන යෝජනා දිහා බලපුවාම අපට පෙනී යනවා, කෘෂිකර්මයට ඉතාම ඉහළ තැනක් ලබා දීලා තිබෙන බව.

විශේෂයෙන්ම කෘෂි කාර්මික රටක් වන අපේ රටේ කෘෂිකර්මය ශක්තිමත් කිරීම, ඒ වාගේම ගොවියා ශක්තිමත් කිරීම අපේ රජයේ වග කීමක් හැටියට සලකා එතුමා කටයුතු කර තිබෙනවාය කියන එක අපට පැහැදිලිව පෙනෙනවා. විශේෂයෙන්ම ගොවීන්ට කාලයක් තිස්සේ තිබුණු නොයෙකුත් ප්‍රශ්නවලට විසඳුම් මේ අය වැය මඟින් ලැබිලා තිබෙනවා. අපි 2006 වර්ෂයේ ලබා දෙන්න පටන් ගත් පොහොර සහනාධාරය තව දුරටත් ශක්තිමත්ව ලබා දෙන්න මෙම අය වැයෙන් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. 2006 වර්ෂයට කලින් අපේ රටේ ගොවියාට විශාල මුදලකට, රුපියල් 4,000ක්, රුපියල් 3,500ක් වාගේ මුදලකට පොහොර ලබා ගන්න සිද්ධ වුණා. නමුත් රජය -භාණ්ඩාගාරය- සියයට 90ක වැය බරක් දරාගෙන, සියයට 90 සහනාධාරයක් සහිතව කන්න 15ක් තිස්සේ පොහොර ලබා දෙමින් සිටිනවා. මේ වෙන කොට කන්න 15කදී එම සහනාධාරය ලබා දීලා තිබෙනවා. 15වැනි කන්නය තමයි මේ ගත වෙන්නේ. මේක ඉතාම දුෂ්කර කාර්යයක්. නමුත් එය ගොවි ජනතාව වෙනුවෙන් රජයෙන් කරන යුතුකමක් දිගටම ඉෂ්ට කිරීමක් කියලා අපි පැහැදිලිව දන්නවා.

මෙම පොහොර සහනාධාරය ලබා දෙන කොට මම කැබිනට් නොවන අමාත්‍යවරයකු හැටියටයි සිටියේ. එප්පාවල ගොවිජන මධ්‍යස්ථානයේදී තමයි මම පළමුවැනි පොහොර මිටිය ගොවීන්ට ලබා දුන්නේ. ඒ වෙලාවේ ගොවි මහත්මයෙක් ඇහුවා, "මේක කරන්න පුළුවන් වැඩක්ද, රුපියල් 3,500ට තිබෙන පොහොර මිටිය රුපියල් 350කට දෙන්න පුළුවන්ද" කියලා. ගොවීන් තුළ ඒ ගැන ලොකු සැකයක් තිබුණා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් ගරු තිස්ස අත්තනායක මැතිතුමා කිව්වා, රුපියල් 350ට පොහොර දෙන්න පුළුවන් නම් ඒක ඇලඩින්ගේ පුදුම පහන වාගේ වැඩක් වෙන්න ඕනෑ කියලා. හැබැයි, අද වන තෙක් ඇලඩින්ගේ පුදුම පහන පත්තු වෙනවා; නිවුනේ නැහැ. ඒක අපි පැහැදිලිවම කියන්න ඕනෑ. එසේ ලබා දුන් පොහොර සහනාධාරවල ප්‍රතිඵල අද තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ අවස්ථාවේ කිව්වේ මේක සහනාධාරයක් නොවෙයි, කෘෂි කර්මාන්තය වෙනුවෙන් කරන ආයෝජනයක් කියලායි. ඇත්තටම ඒක අද ආයෝජනයක් බවට පත් වෙලා තිබෙනවා.

නිදහස ලබා ගත් දවසේ ඉඳලා අපේ රටේ රාජ්‍ය නායකයෝ හිටියා; කෘෂිකර්ම ඇමතිවරු හිටියා නමුත්, මේ රට සහල්වලින් ස්වයංපෝෂිත කරන්න ඒ කිසි කෙනෙකුට බැරි වුණා. අද වන විට අපේ රට සහලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. කාටවත් ඒක නැහැයි කියන්න බැහැ.

අපේ රටේ කෘෂි කාර්මික ප්‍රදේශවලට 2010-2011 වර්ෂවලදී විශාල ගංවතුරක් ගැලුවා. අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ පොළොන්නරුවටත්, අනුරාධපුරයේ කොටසකටත් ඒ අවස්ථාවේදී ගංවතුර ගැලුවා. ඒ වේලාවේ අපට සහල් හිඟයක් ඇති වෙයි කියලා කවුරුත් හිතුවා. නමුත් අපේ කෘෂි කාර්මික ප්‍රතිපත්තිය නිසා සහල් හිඟයක් ඇති වුණේ නැහැ.

විශේෂයෙන්ම වී නිෂ්පාදනය කරන අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම වාගේ දිස්ත්‍රික්ක මේ අවුරුද්දේ මුල් කාලයේ විශාල නියඟයකට ගොදුරු වුණා. එහෙත් අපට සහල් පිට රටින් ගේන්න සිද්ධ වුණේ නැහැ. අපේ කෘෂි කාර්මික ප්‍රතිපත්තිය නිසාත්, පොහොර සහනාධාරය ලබා දීම නිසාත් අද අපේ රට සහල් අතිරික්තයක් තිබෙන රටක් බවට පත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම ගොවීන්ට අවශ්‍ය වාරිමාර්ග පහසුකම් අපි ලබා දුන්නා. විශේෂයෙන්ම කෘෂිකර්මයට අවශ්‍ය ප්‍රධානම සාධකය තමයි ජලය. ජලය ලබා දෙන්න අද විශාල වාරි මාර්ග ප්‍රමාණයක් ද, වැව් අමුණු විශාල ප්‍රමාණයක් ද හදා ගෙන යනවා. ඒ වාගේම තිබෙන වැව් අමුණු සංවර්ධනය කරනවා. කාලයක් තිස්සේ රොන් මඩ පිරිලා තිබුණු වැව් අමුණුවල රොන් මඩ ඉවත් කරනවා. මේ සියල්ලම කෘෂිකර්මය වෙනුවෙන් තමයි කරන්නේ. වාරි මාර්ග දියුණු කිරීම සඳහා විශාල මුදලක් වැය වනවා. මධ්‍යම ආණ්ඩුවට,

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

පළාත් සභාවට, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට මේ විධියට මුදල් වෙන් කරලා මහා වාරි මාර්ග, මධ්‍යම වාරි මාර්ග, සුළු වාරි මාර්ග වාගේම වැව් ප්‍රතිසංස්කරණය කරන්නේත් කෘෂිකර්මය සඳහා.

ජල බද්දක් අය කරනවා කියලා නොයෙකුත් කතන්දර ඉඳලා හිටලා විපක්ෂයෙන් කියනවා. අපේ රජය කෘෂි කාර්මිකයන්ගෙන් කවදාවත් ජල බද්දක් අය කරන්නේ නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
වයඹ පළාත් සභාවෙන් අය කරන්න හැදුවා නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අත්වැරැදීම්, කට වැරැදීම් ඉඳලා හිටලා වෙන්න පුළුවන්. ඒ ලේකම්වරයෙකුගේ කට වැරැදීමක්. ඇමතිවරයෙකුගේ කට වැරැදිලාත් නොවෙයි. ඕවා ඉතින් ඒ තරම් ගණන් ගන්න යන්න එපා. අපි ඒවා කරන්නේ නැහැ. ලේකම්වරයෙකුට බැහැ නේ, ජල බද්ද වැඩි කරන්න. එහෙනම් කැබිනට් එකෙන් ඒක තීන්දු කරන්න ඕනෑ. නැත්නම් පාර්ලිමේන්තුවෙන් තීන්දු කරන්න ඕනෑ; අදාළ ඇමතිවරයා කියන්න ඕනෑ. ලේකම්වරයාට බ්‍රේක් නැති වන්න ඇති. ඒකයි.

පොහොර සහනාධාරය ලබා දීමෙන් පසු යම් කිසි මට්ටමකට සහල් නිෂ්පාදනය වැඩි වනකොට, හාල්වල ආසනික් තිබෙනවා කියන ප්‍රශ්නය පැන නැඟුණා. පසුව ඒ පිළිබඳ විශාල මතයක් ගොඩ නැඟුණා. ඒ වාගේම ඒක රටේ කථා බහට ලක් වුණු කාරණයක් වුණා. විශේෂයෙන්ම ඒකට පිළියමක් හැටියට කාබනික පොහොර නිෂ්පාදනය කරන්න වැඩ පිළිවෙළක් අතිගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙනවා.

කිලෝ 50 කාබනික පොහොර මිටියක් රුපියල් 400කට මිලදී ගන්න පුළුවන්. ඉතින් කිලෝවක් රුපියල් 8යි. සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන්ට, අපේ නිෂ්පාදකයන්ට, අපේ රටේ ගොවියාට කාබනික පොහොර නිෂ්පාදනය කරන්න පුළුවන්.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට ටොන් 20ක් ගන්න පුළුවන්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ටොන් 20ක් නොවෙයි, මම අනුරාධපුරයෙන් ටොන් 200ක් දෙන්නම්. ටොන් 2,000ක් ඕනෑද? [බාධා කිරීමක්] හෙට අනුරාධපුරයට එන්න මම ටොන් 2,000ක් දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ටොන් පව.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ටොන් පව නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේලා ටොන් පව ගගහා හිටියාට අපි ටොන් පව ගගහා ඉන්නේ නැහැ. අපි වැඩ කරනවා. තමුන්නාන්සේලා අවුරුදු දෙකක් මේ පැත්තේ ඉඳ ගෙන ටොන් පව අතහැරියා අපි දැක්කා නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේලා පොහොර සහනාධාරය දුන්නේත් නැහැ, කාබනික පොහොර හැදුවෙත් නැහැ, රැකියාවක් දුන්නේත් නැහැ, පාරක් හැදුවෙත් නැහැ, වතුර ටිකක් දුන්නේත් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ පොහොර කොහේද තිබෙන්නේ?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තමුන්නාන්සේටත් ඕනෑ නම් දෙන්නම්. ඒවා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් ළඟ තිබෙන්නේ. ගොවීන් 16,000ක් ළඟ තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තඹුත්තේගම මාර්කට් එකේ-

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, නැහැ. තඹුත්තේගම මාර්කට් එකේ නොවෙයි, විලච්චියේ ගොවීන් ළඟ තිබෙනවා. තන්තිරිමලේ ගොවීන් ළඟ තිබෙනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා අවුරුදු දෙකක් තිස්සේ කිසි දෙයක් කරන්නේ නැතිව හිටියා. ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා නම් වැව් ටිකක් හැදුවා. අපි නැහැයි කියන්නේ නැහැ. [බාධා කිරීමක්] ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ වැව් ටිකක් හැදුවා. අනෙක් අය නිකම්ම හිටියා. අන්තිමට සෝදා ගෙනම ගියා. අපි දැක්කා නේ, 2004 සිද්ධ වුණේ මොකක්ද කියලා. වැඩ කළා නම් සෝදා ගෙන යන්නේ නැහැ නේ. 2004 සෝදා ගෙනම ගියා. වැඩ කරන කොට සෝදා ගෙන යන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උතුරු මැද පළාතේ මහ ඇමතිතුමා වැව් ගැන ප්‍රකාශයක් කරලා තිබුණා, විශාල හොරකමක් වෙලා තිබෙනවා කියා. ඒ ගැන තත්ත්වය මොකක්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මට තිබෙන කාලය විනාඩි 15යි. ඔබතුමා කෙටියෙන් කියන්න කෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, පසුගිය දවසක පුවත්පත්වලට උතුරු මැද පළාතේ අලුත් මහ ඇමතිතුමා කියලා තිබුණා, උතුරු මැද පළාත් සභාවට අයත් වැව් හැරීමේ දී විශාල වංචාවක් සිද්ධ වෙලා

තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ පිළිබඳව පරීක්ෂණ කරලා දඬුවම් දෙන්න ඔබතුමා සූදානම්ද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්, ඔව්. ඒ සියලු දේවල් ගැන දැන් පරීක්ෂණ කර ගෙන යනවා. ඔඩිට් කර ගෙන යනවා. ඒ සියලු කටයුතු කෙරෙනවා. ඒ ගැන බය වෙන්න එපා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොරකමක් කළා නම් දඬුවම් කරන්න.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්, ඔව්. ඒ ගැන පරීක්ෂණ කර ගෙන යනවා.

මේ කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කිරීමෙන් ආසනික් ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න පුළුවන්. ඒ සඳහා තමයි මේ අය වැයෙන් ඒ යෝජනා ඉදිරිපත් කරලා ප්‍රතිපාදන වෙන් කර දීලා තිබෙන්නේ. විශේෂම දේ තමයි කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කරන්න පිටුවහලක් වෙන්න කාබනික පොහොර පමණක් යොදා නිෂ්පාදනය කරන වී කිලෝවක් රුපියල් 40කට ගන්න යෝජනා කර තිබීම. ඉතිහාසය තුළ මෙතෙක් ගොවීන් වෙනුවෙන් රට වෙනුවෙන් කරපු හොඳම අය වැය යෝජනාවක් හැටියට අපි කවුරුත් මේ යෝජනාව පිළිගන්න ඕනෑ. රුපියල් 40ක් කියන්නේ ලොකු මුදලක්. මීට කලින් අවුරුදු ගණනාවක් තිස්සේ ගොවියෝ පෙළපාළි ගියා වී මිල වැඩ කරන්න කියලා. වී කිලෝව රුපියල් 28ටයි, 30ටයි තිබුණේ. දැන් රුපියල් 32 සිට 35 දක්වා වැඩි කරලා තිබෙනවා. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමනි, ඒක හොඳ යෝජනාවක් නොවෙයිද? හොඳ දේට හොඳයි කියන්න. නරක දේට නරකයි කියන්න. තමුන්නාන්සේලා හොඳ දේටත් නරකයි කියනවා. නරක දේටත් නරකයි කියනවා. අන්තිමට ඔක්කොම නරකයි. වී මිල වැඩි කරන්න කියලා නේ කිව්වේ. ඉතින් වී මිල වැඩි කරලා තිබෙනවා. කාබනික පොහොර භාවිතය වැඩි කරන්න කිව්වා. දැන් කාබනික පොහොර භාවිතය වැඩි කරලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බර්ට් පරද්දපු එක ගැන කියන්නේ මොකක්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
පරදිනවා. දිනනවා. ඒක තමයි දේශපාලනය. ඒක සාමාන්‍ය දෙයක්.

කාබනික පොහොර නිෂ්පාදනය නිසා තව 30,000කට විතර ස්වයං රැකියා ලැබෙනවා. කාබනික පොහොර නිෂ්පාදනය නිසා පිට රටට ඇදී යන විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අපේ රටේ ඉතිරි කර ගන්න පුළුවන්. රසායනික පොහොර සඳහා රුපියල් මිලියන 50,000ක විතර මුදලක් වැය වෙනවා. එයින් අඩු ගණනේ මිලියන 5ක්වත් මේ අවුරුද්දේ ඉතිරි කර ගන්න අප බලාපොරොත්තු වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයත්, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයත් එකතු වෙලා තමයි මේ කටයුත්ත කරන්නේ. අපි ඒ කටයුත්ත කරන්න ලැහැස්ති වෙලා ඉන්නවා. විශේෂයෙන්ම ඒ කාරණා දිහා බැලුවාම පොහොර සහනාධාරය ලබා දීම, කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීම, වී මිල ඉහළ දැමීම, කාබනික පොහොර භාවිතා කර නිෂ්පාදනය කරන වී කිලෝවක් රුපියල් 40ට මිල දී ගැනීම වැදගත් යෝජනායි. මෙය අපේ රටේ ගොවි ජනතාව ශක්තිමත් කරපු ඉහළම වැඩ පිළිවෙළක් හැටියට අපි දකිනවා.

අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කෘෂිකර්ම අමාත්‍යාංශයත්, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයත් සම්බන්ධ කරගෙන ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා දිවි නැගුම වැඩසටහන කරගෙන යනවා. දිවි නැගුම වැඩසටහන තුළින් හැම ගෙදරකටම පොල් පැළ, පළතුරු පැළ, ඒ වාගේම එළවළු පැළ ලබා දීලා ගෙවතු ස්වයංපෝෂිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයත්, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශත් එකතුවෙලා ආර්ථික සංවර්ධන ඇමතිතුමාගේ එම දිවි නැගුම වැඩසටහනට සහයෝගය ලබා දෙනවා. ඒ නිසා අපට රටේ එළවළු මිලෙහි යම් කිසි පාලනයක් ඇති කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාත් දන්නවා, කාලයකට එළවළු මිල ගැන මාධ්‍යවලත් රටේ හැම තැනමත් කථා බහට ලක් වන බව. අද එළවළු මිල බැහැලා තිබෙනවා. සහල් මිල අඩුයි. ඉතින් ඒක තමයි රජයකින් කෙරෙන්න ඕනෑ. කෘෂිකාර්මික ප්‍රතිපත්තියක්, කෘෂිකර්මය පිළිබඳ විශ්වාසයක් තියාගෙන කටයුතු කරන කොට ආණ්ඩුවලට ඒ ඉලක්කවලට යන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා, මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිවරයා හැටියට එතුමා ඉතාම හොඳ අය වැයක් මෙවර ඉදිරිපත් කිරීම ගැන. ගොවියා ශක්තිමත් කරන්න, කෘෂිකාර්මිකයා ශක්තිමත් කරන්න, කෘෂිකර්මය තුළින් අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන්න මේ අය වැය තුළින් අවශ්‍ය කටයුතු කර තිබෙනවා. අපේ රටේ නිෂ්පාදනයන් වැඩි කරන කොට රටේ උද්ධමනය අඩු වෙනවා. ඒ වාගේම අපි අද පිට රටින් සහල් ගෙන්වන්නේ නැහැ. ගිය අවුරුද්දේ බඩඉරිඟු මෙට්‍රික් ටොන් දහදාහක් අපි පිට රට යැව්වා. ගිය වතාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩඉරිඟු අක්කර ලක්ෂයක් පමණ වගා කෙරුණා. මේ වතාවේ අක්කර එක්ලක්ෂ තිස්දහසක් වගා කරලා තිබෙනවා. මේ අවුරුද්දේ අපේ අස්වැන්න ලැබුණාම අපට බඩඉරිඟු මෙට්‍රික් ටොන් තිස්දහසක්, හතළිස්දහසක් පමණ විදේශ රටවලට යවන්න පුළුවන් වනවා. ඒ වාගේ විශාල සංවර්ධනයක් අපි කෘෂිකර්මය තුළින් කර තිබෙනවා.

මගේ විෂයයට අයිති නිසා අපේ රටේ තිබෙන වන අලි උවදුර පිළිබඳවත් මා කථා කරන්න බලාපොරොත්තු වනවා. මේ වන කොට අපේ රටේ වන අලින්ගේ සංඛ්‍යාව හයදහසක් පමණ වනවා. 1950 පමණ වන කොට අපේ රටේ භූමියෙන් සියයට 42ක් වන ජීවීන් සඳහා වෙන් වෙලා තිබුණා. මහවැලි සංවර්ධනය තුළින් පමණක් ඉඩම් අක්කර ලක්ෂ 7ක් පමණ වන ජීවීන්ට අහිමි වුණා. 1950 වන කොට අපේ රටේ වන අලින් 2,000ක් පමණ සිටියා. මේ වන කොට වන අලි 6,000ක් පමණ සිටිනවා. වනජීවීන්ගේ භූමිය තිබෙන්නේ සියයට 21යි. සියයට 42 දැන් සියයට 21ට බැහැලා තිබෙනවා. වන ජීවීන්ගේ භූමිය භාගයක්ම අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම වන අලින් තුන් ගුණයකින් පමණ වැඩි වෙලා තිබෙනවා. ලොකු පීඩනයක් තිබෙනවා. මෙතැන අලි මිනිස් ගැටුමක් ඇති වෙන්න හේතුව එයයි. අපි මේ සඳහා විද්‍යාත්මක විසඳුමක් තෝරා ගෙන තිබෙනවා. රට පුරාම වන අලි සංරක්ෂණ මධ්‍යස්ථාන හතරක් හදන්න කටයුතු කර ගෙන යනවා.

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

හොරොව්පතාන අක්කර 3,500ක් කොටු කරලා සාදන වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානයේ වැඩ දැන් අවසන් කර ගෙන යනවා. අප්‍රේල් මාසය වන විට ඒ මධ්‍යස්ථානය විවෘත කරනවා. ලුණුගම්වෙහෙර අක්කර 6,000ක වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානයක් හදන්න සැලසුම් කර තිබෙනවා. ඒ සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 225ක් වෙන් කර දී තිබෙනවා. ඒ වැඩ කටයුත්ත ජනවාරි මාසයේ පටන් ගන්නවා. අපි භාණ්ඩාගාරයටත් දැනුම් දී තිබෙනවා, නැඟෙනහිර මාදුරු ඔය ප්‍රදේශයේ වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානයක් හදන්න කටයුතු කරන බව; ඒ වාගේම වයඹ ප්‍රදේශය ආවරණය වන සේ ගල්ගමුව පාලුකඩවල වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානයක් හදන්න කටයුතු කරන බව.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔබතුමා පසුගිය අවුරුද්දේ මේ වැය ශීර්ෂය සාකච්ඡා කරද්දී කිව්වා, අලින් සිටින ගම්මානවල ගොවීන් ලවා අලින්ගේ කෑම හදනවාය කියා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්, කෑම හදනවා. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, වට්ටක්කා දෙනවා කියා. වට්ටක්කාත් දෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හීලෑ අලින්ට නොවෙයි, වල් අලින්ට දෙන්න. ඔබතුමා පසු ගිය අවුරුද්දේ කිව්වා, -

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
හදනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
කොහේද හදලා තිබෙන්නේ?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඉස්සරවෙලා වන අලි සංරක්ෂණ මධ්‍යස්ථාන හදලා ඉන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අවුරුද්දෙන් හදන්න බැහැ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානය හදලා අලි ටික ඇතුළට දැම්මාට පසුව තමයි - [බාධා කිරීමක්] මධ්‍යස්ථානය හදන්න ඉස්සර වෙලා අලි කෑම හදලා හරි යනවාද? ඔබතුමා හරි ඉක්මන් නේ. ඒක නේ වැඩේ. අපි ඒවා ක්‍රමානුකූලව කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානවල ඇතුළත තිබෙන වැව්, අමුණු -

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පුත්තලම් දිස්ත්‍රික්කයේ වන අලි උවදුර සම්බන්ධයෙන් සාකච්ඡා කළා. [බාධා කිරීමක්]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
වල් අලින්ට "වන අලි" කියා ගෞරවයක් දීලා තිබෙනවා. බලන්න කෝ තමුන්නාන්සේලාගේ ලකුණට තමුන්නාන්සේලාට තමයි අපි ගෞරවයක් දුන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පුත්තලම් දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව, වනාතවිල්ලුව, නවගත්තේගම දැවැන්ත වන අලි උවදුරක් තිබෙනවා. දැන් ඔබතුමා සාකච්ඡා කළා, ඒ පිළිබඳව විධිමත් වැඩ පිළිවෙළක් යොදන්න. ඔබතුමාගේ කථාවේදී ඒ පිළිබඳව සඳහන් වුණේ නැහැ. ඒ පිළිබඳව තත්පරයකදී මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
දැන් විදුලි වැටවල් තිබෙන්නේ1,400යි. මේ අවුරුද්දේ විදුලි වැටවල් 1,500ක් ගහලා ගම්මාන සහ වන ජීවීන්ගේ ප්‍රදේශ අපි වෙන් කරනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කරුවලගස්වැව, නවගත්තේගම සහ වනාතවිල්ලුව සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ඔබතුමා ක්‍රියාත්මක කරනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
විදුලි වැට ගහලා, ඒ ඉඩම් සහ ඒ ජනතාව ජීවත් වන ගම් බිම් අපි ඒ කරදරවලින් මුදා ගන්න අවශ්‍ය කටයුතු ටික කරනවා. ඒ වාගේම වයඹ පළාතේ ගල්ගමුව පාලුකඩවල ප්‍රදේශයේ ප්‍රචණ්ඩ අලින් දමන්න තමයි වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානය හදන්නේ. ඇත්තටම අලි මිනිස් ගැටුමේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට විද්‍යාත්මකව අවශ්‍ය විසඳුම් ලබා දෙන බව මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමාට අපේ ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 10.41]

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)
கௌரவ தவிசாளர் அவர்களே, வரவு செலவுத் திட்ட ஒதுக்கீடுகள் பற்றிக் குழுநிலையில் ஆராயப்படுகின்ற வேளையில், மக்களின் வாழ்வாதாரப் பிரச்சினையைத்

தீர்த்துவைக்கின்ற அமைச்சுக்களாக இருக்கின்ற நான்கு அமைச்சுக்கள் இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப் பட்டுள்ளன. அந்த வகையில், வறுமையினால் வாடுகின்ற மக்கள் இந்தத் தொழில் துறைகளினூடாகத் தமது வாழ்வாதாரத்தைத் தேடுவதில் பல பிரச்சினைகளைச் சந்திக்க வேண்டியவர்களாக இருக்கின்றார்கள். குறிப்பாக வடக்கு, கிழக்கிலே வாழுகின்ற தமிழ் பேசுகின்ற மக்கள் தமது வாழ்வாதாரத் தொழில்களை மேற்கொள்ளும்பொழுது, பல இன்னல்களைச் சந்திக்க வேண்டியவர்களாக இருக்கின்றார்கள்.

கால்நடை வளர்ப்பைப் பொறுத்தவரையில், மட்டக்களப்பு மாவட்டத்திலே பல ஏக்கர் அரச காணிகள் கால்நடைகளின் மேய்ச்சல் தரைகளாக ஒதுக்கீடு செய்யப்பட ஆயத்தமாக இருந்த நிலையில், அக்காணிகளில் அம்பாறை மாவட்டத்தைச் சேர்ந்த ஊர்காவல் படையினர் அத்துமீறிக் குடியேறி, பயிர்ச்செய்கை மேற்கொண்டு வருகின்றார்கள்; இது ஓர் அத்துமீறிய நடவடிக்கை என்றே நாங்கள் கருதுகின்றோம். இவ்வாறு அவர்கள் சட்டத்துக்கு முரணான வகையில், அக்காணிகளில் பயிர்ச்செய்கையை மேற்கொண்டு வருகின்றபொழுது, முன்னர் இருந்த கிழக்கு மாகாண சபை நிருவாகம் அவர்களுடைய பயிர்களுக்குச் சட்டரீதியாகப் பாதுகாப்பு வேலிகளை அமைத்துக் கொடுத்திருக்கின்றது. சட்டத்துக்கு முரணாக, காணிகளுக்குள் அத்துமீறிக் குடியேறியவர்களுடைய பயிர்களின் பாதுகாப்புக்காக ஓர் அரசாங்கம் - கிழக்கு மாகாண சபை நிருவாகம் - பல்லாயிரக்கணக்கான ரூபாயைச் செலவுசெய்து, பாதுகாப்பு வேலிகளை அமைத்துக்கொடுப்பதென்பது எந்த வகையில் பொருந்தும் என்று நாங்கள் கேட்கின்றோம். அப்படிப்பட்டவர்களுக்கு எதிராக அரச அதிகாரிகள் சட்ட நடவடிக்கை எடுத்திருக்கிறார்கள்தான்; இல்லையென்று நாங்கள் சொல்லவில்லை. எனினும், ஒரு குறுகிய தொகையினருக்கு எதிராக மாத்திரம்தான் சட்ட நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது. இது சம்பந்தமான வழக்கு மட்டக்களப்பு நீதிமன்றத்தில் இருக்கின்றபொழுது, அவர்கள் அந்தக் காணிகளிலே வீடுகளையும் அமைத்துக்கொண்டு வாழ்வதை நாங்கள் காண்கிறோம். இப்பாராளுமன்றம் மக்களின் நலன்களுக்காகச் சட்டங்களை இயற்றுகின்றது. அச்சட்டங்கள் மீறப்படுகின்றபொழுது, அதற்கு அரசாங்கமே ஒத்துழைக்கின்றது என்று சொன்னால், இப்பாராளுமன்றம் சட்டங்களை ஆக்குவதிலே என்ன பிரயோசனம் இருக்கின்றது? என்று நான் கேட்கின்றேன். எனவே, கமநல சேவைகள் அமைச்சு இவர்களுக்கு எதிராக நிச்சயமாகச் சட்ட நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அதுமட்டுமல்லாமல், இப்பொழுது மட்டக்களப்பு மாவட்டத்திலுள்ள இந்தக் காணிகளை அம்பாறை மாவட்ட கமநல சேவை உத்தியோகத்தர்கள் நெற்காணிச் சட்டத்தின் - PLR - கீழ் பதிவு செய்துகொண்டு வருகின்றார்கள். இதுவும் ஓர் அத்துமீறிய, சட்டத்துக்கு முரணான செயற்பாடு என நான் கருதுகின்றேன். ஒரு நிருவாக மாவட்டத்தில் இருக்கின்ற காணிகளை இன்னுமொரு நிருவாக மாவட்டத்தில் இருக்கின்ற அதிகாரிகள் எவ்வாறு நெற்காணிச் சட்டத்தின்கீழ் பதிவு செய்ய முடியும்? என்று நான் இந்தச் சபையிலே கேள்வியெழுப்ப விரும்புகின்றேன்.

இது இப்படியிருக்க, இதே கமநல சேவைகள் அமைச்சினால் ஏறக்குறைய பல்லாயிரக்கணக்கான ஆராய்ச்சி உதவியாளர்கள் - Research Assistants - இலங்கையின் தென்பகுதியிலே 20 வருடங்களுக்கு முன் நியமிக்கப்பட்டிருக் கின்றார்கள். ஆனால், இன்று இருபது வருடங்களுக்குப் பின்னரும்கூட, வடக்கு, கிழக்கு மாகாண தமிழ்ப் பகுதிகளில் ஆராய்ச்சி உதவியாளர்கள் நியமனங்கள் வழங்கப்படவில்லை. இது ஏன்? என்பது கேள்விக்குறியாகவுள்ளது. இற்றைக்கு ஒரு வருடகாலத்துக்கு முன்னர் மட்டக்களப்பு மாவட்டத்திலிருந்து மட்டும் ஏறக்குறைய 18,000 விண்ணப்பதாரிகள் அழைக்கப்பட்டு நேர்முகப்பரீட்சைகள் நடைபெற்ற பொழுதிலும் அதற்குரிய பத்திரங்கள் யாவும் ஒரே கட்டாகக் கட்டப்பட்டு மூலையில் கிடப்பில் போடப்பட்டுள்ளன. அவர்களின் கதி என்ன? நான் இந்த விடயம் தொடர்பில் கௌரவ எஸ்.எம். சந்திரசேன அவர்கள் அமைச்சராக இருந்தவேளையில் அமைச்சினது ஆலோசனைக்குழுக் கூட்டத்தில் கேள்வி எழுப்பியிருந்தேன். அப்பொழுது அவற்றுக்குரிய ஆளணி அங்கீகாரம் இதுவரை கிடைக்கவில்லை என்றும் கைவசம் 326 ஆளணி மாத்திரம் இருப்பதாகவும் அங்கீகாரம் கிடைத்ததும் அவ்வெற்றிடங்களை நிரப்புவதாகவும் தெரிவித்தார். அதேநேரம், வடக்கு, கிழக்கிலே ஆராய்ச்சி உதவியாளர் நியமனத்துக்காக 1,400 வெற்றிடங்களுக்குரிய ஆளணி அங்கீகரிக்கப்பட வேண்டுமெனவும் அதற்குரிய நடவடிக்கைகளை எடுத்துக் கொண்டிருப்பதாகவும் கூறினார். எது எவ்வாறிருப்பினும், நேர்முகப்பரீட்சை நடைபெற்று ஒரு வருடமாகியும் இன்று வரையில் அதற்கு என்ன நடைபெற்றதெனத் தெரியாத நிலை காணப்படுகிறது. இலங்கையின் தென்பகுதியில் இருப்பவர்களுக்கு ஆராய்ச்சி உதவியாளர்களுக்கான ஆளணி வெற்றிடங்களை ஏற்படுத்தி நியமனங்கள் வழங்கப்படுகின்ற பொழுது, வடக்கு, கிழக்கிலே உள்ளவர்களுக்கு மட்டும் அதே வேலையைச் செய்கின்ற சந்தர்ப்பத்தை ஏன் வழங்கவில்லை? என்று நான் வினா தொடுக்க விரும்புகின்றேன்.

கௌரவ தவிசாளர் அவர்களே, மீன்பிடித்துறையை எடுத்துக்கொண்டால், மட்டக்களப்பு மாவட்டத்திலே இருபத்தையாயிரம் மீனவக் குடும்பங்கள் இருக்கின்றன. இவர்களுக்குரிய வாழ்வாதார வசதிகளை நிறைவேற்றிக் கொடுக்கவேண்டிய பொறுப்பு இந்த அமைச்சுக்கு இருக்கிறது. இப்பொழுது அங்கே ஒரு மீன்பிடிப் பயிற்சிக் கல்லூரி கட்டப்பட்டு வருகின்றது. அது வேறொரு அமைச்சின்கீழ் நிர்வகிக்கப்பட்டாலும் அதிலிருந்து வெளியேறுகின்ற இளைஞர்கள் மீன்பிடித்தொழிலை மேற்கொண்டு தமது ஜீவனோபாயத்தைத் தேடிக்கொள்ளக்கூடிய நிலையில் இருக்கிறார்கள். ஆகவே, இன்னும் ஒருசில மாதங்களில் பூர்த்தி செய்யப்படவுள்ள அந்தப் பயிற்சிக் கல்லூரியில் மீனவக் குடும்பங்களைச் சேர்ந்த ஏறக்குறைய 1,500 இளைஞர்களுக்கு ஆழ்கடலில் நீள்தூண்டில் முறையில் தொழில் செய்வதற்கான பயிற்சி அளிக்கப்பட்டால், அங்குள்ள மீனவ குடும்பங்களைச் சேர்ந்த இளைஞர்கள் அனைவருக்கும் வேலை வாய்ப்பைப் பெற்றுக்கொடுக்க முடியுமென நான் நினைக்கிறேன்.

அதுமட்டுமல்ல, நேற்று இந்தச் சபையிலே சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதியமைச்சர் அவர்கள், வடக்கு, கிழக்கிலே பல்லாயிரக்கணக்கான விதவைகள் இருக்கின்றார்கள் என்பதை ஏற்றுக்கொண்டிருந்தார். மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில், போரினால் பாதிக்கப்பட்டதாலோ அல்லது இயற்கை மரணம் ஏற்பட்டதாலோ - எதுவாகவிருந்தாலும் - அங்குள்ள மீனவக் குடும்பங்களிலே ஏறக்குறைய இரண்டாயிரம் விதவைகள் இருக்கின்றார்கள். எனவே, வாழ்வாதாரம் எதுவுமின்றி இருக்கின்ற அவர்களுக்கு, அதனை ஏற்படுத்திக் கொடுப்பதற்கு ஆவன செய்யவேண்டும் எனத் தங்களிடம் கேட்டுக்கொள்கின்றேன். இந்த விதவைப் பெண்கள் மாசிக் கருவாடு உற்பத்தியில் ஆர்வம் காட்டுகின்றார்கள். இப்பொழுது அதற்கான நவீன இயந்திரங்களும்

[ගරු පොන්. සෙල්වරාසා මහතා]

வந்திருக்கின்றன. ஆகவே, விதவைகள் தலைமைதாங்குகின்ற குடும்பங்களுக்கு இப்படியான இயந்திரங்களைப் பெற்றுக் கொடுத்து, அவர்களின் வாழ்க்கையை ஒளிமயமாக மாற்ற நீங்கள் நடவடிக்கை எடுத்தால் நிச்சயமாக உங்களுக்கு நாங்கள் நன்றியுடையவர்களாவோம்.

அதுமட்டுமல்ல, மட்டக்களப்பில் ஓர் ஐஸ் தொழிற்சாலை இருக்கின்றது. ஆனால், அங்கு பிடிக்கப்படுகின்ற மீன்களைப் பாதுகாத்து வைக்கின்ற அளவுக்கு அங்கு ஐஸ் உற்பத்தி செய்யப்படுவதில்லை. ஆகவே, அங்கு கூடுதலான ஐஸ் உற்பத்தி செய்ய நடவடிக்கை எடுக்க வேண்டும் அல்லது மட்டக்களப்பு மாநகர சபை எல்லைக்குள் இன்னுமோர் இடத்தில் ஐஸ் தொழிற்சாலை ஒன்றை அமைக்க வேண்டும். அங்கு நகரை அண்டிய புறநகர்ப் பகுதியில் பாலமீன்மடு என்ற ஒரு மீனவக் கிராமம் இருக்கின்றது. அங்கு ஆழ்கடல் மீன்பிடியில் ஈடுபடுகின்ற இயந்திரப் படகுகளின் இறங்கு துறையும் காணப்படுகின்றது. எனவே, அந்தக் கிராமத்தில் இந்த ஐஸ் தொழிற்சாலையை ஏற்படுத்துவதன்மூலம் அங்கு ஐஸ் பற்றாக்குறையை நீக்க முடியும்.

மட்டக்களப்பிலே வாழைச்சேனையில் ஓர் இறங்குதுறை அமைந்துள்ளது. அதேநேரம் மட்டக்களப்பு நகரைப் பொறுத்தவரையிலே நான் குறிப்பிட்ட பாலமீன்மடு என்ற இடத்தில் ஒரு முகத்துவாரம் இருப்பதனால் அங்கு fisheries harbour ஒன்றை அமைப்பது பொருத்தமாக இருக்கும். அவ்விடத்தில் அதனை அமைக்காவிட்டால் anchorage என்கின்ற இறங்குதுறையையாவது அமைத்துத் தருமாறு கேட்டுக்கொள்கின்றேன். மட்டக்களப்பின் தெற்கிலுள்ள கல்லாறு என்ற கிராமத்தில் அதிகளவான மீன்கள் பிடிக்கப்படுகின்றது. அந்தக் கிராமத்திலிருந்து மீனவர்கள் அதிகமான படகுகளில் ஆழ்கடலுக்குச் சென்று மீன்பிடியில் ஈடுபடுகின்றபோதிலும் அங்கு இறங்குதுறையொன்று இல்லாததனால் தங்கள் படகுகளை வாழைச்சேனைக்குக் கொண்டுசென்று நிறுத்திவைக்கவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. அதற்குப் பல காரணங்கள் சொல்லப்பட்டாலும்கூட, கல்லாறு என்னுமிடத்தில் எந்த வகையிலாவது இறங்குதுறை - anchorage ஒன்றை ஏற்படுத்தித் தருமாறு கௌரவ மீன்பிடித்துறை அமைச்சர் அவர்களை நான் கேட்டுக்கொள்கின்றேன்.

நான் ஏற்கெனவே கூறியதுபோல, இப்பொழுது மட்டக்களப்பு மாவட்டத்தில் கால்நடை வளர்ப்போர் தங்கள் கால்நடைகளை மேய்ப்பதற்கு இடமில்லாமல் இருக்கின்றார்கள். ஆகவே, அங்கே அத்துமீறிக் குடியேறியுள்ள ஊர்காவல் படைவீரர்களை அகற்றிவிட்டு, குறித்த நிலத்தைக் கால்நடை மேய்ச்சலுக்குப் பயன்படுத்த ஆவன செய்யுமாறு கௌரவ கமத்தொழில் அமைச்சர் அவர்களை விநயமாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[மு.ப. 10.55]

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தவிசாளர் அவர்களே, இன்று நடைபெற்றுக் கொண்டிருக்கும் நான்கு அமைச்சுக்களின் நிதியொதுக்கீடுகள் மீதான வரவு செலவுத் திட்டக் குழுநிலை விவாதத்தில் கலந்து கொண்டு உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சியடை கின்றேன். கடந்த முப்பது வருட காலமாக இந்த நாட்டில் புரையோடிப் போயிருந்த யுத்தத்தை முடிவுக்குக் கொண்டுவந்து சமாதானம் ஏற்படுத்தப்பட்டுள்ள இவ்வேளையில், இந்நாட்டில் பல பாரிய அபிவிருத்தித் திட்டங்கள் செயற்படுத்தப்பட்டு வருகின்றன. உண்மையில் கிழக்கு மாகாணத்தைப் பொறுத்தவரையில் அங்கு ஒவ்வொரு பிரதேசத்திலும் ஒவ்வொரு துறையும் பாரிய அபிவிருத்தி கண்டுவருகின்றது. வீதிப் போக்குவரத்துத் துறையை எடுத்துக் கொண்டால் அங்கு திருகோணமலையில் இருந்து மட்டக்களப்புக்கு ஒருசில மணித்தியாலங்களில் சென்றடையக் கூடிய வகையில் வீதி அபிவிருத்தி செய்யப்பட்டிருக்கின்றது.

யுத்த காலங்களில் கிழக்கு மாகாணத்தில் பயிர்ச் செய்கையில் ஈடுபடுத்தப்படாத நிலையிலிருந்த சுமார் 1,25,000 ஏக்கர் விஸ்தீரணமுடைய நெற்காணிகளில் தற்பொழுது பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டு வருகின்றது. அக்காலத்தில் இந்தக் காணிகள் யாவும் விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டுக்குள் இருந்ததனால் இந்த எண்ணிக்கையிலும் குறைவான விஸ்தீரணமுடைய நெற்காணிகளில் மட்டுமே நெற்செய்கை மேற்கொள்ளப்பட்டு வந்தது. ஆனால், தற்பொழுது 1,25,000 -1,35,000 ஏக்கர் வரையான நெற்காணிகளில் செய்கை மேற்கொள்ளப்படுகின்றது. இவ்வளவு ஏக்கர் காணிகளில் நெற்செய்கை மேற்கொள்ளப் படுகின்றபோதிலும் அவ்விவசாயிகளுக்கு அதனைத் திறம்படச் செய்வதில் நிர்வாக ரீதியான பல குறைபாடுகள் காணப்படுகின்றன.

எனக்கு முன் உரையாற்றிய மாண்புமிகு உறுப்பினர் பொன் செல்வராசா அவர்கள் குறிப்பிட்டதைப்போன்று 1995-96ஆம் ஆண்டு காலப்பகுதியில் வடக்கு, கிழக்கு மாகாணங்கள் தவிர்ந்த ஏனைய பிரதேசங்களில் 9,600 விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர் - ARPA - Assistant Research Productivity Assistant பதவிக்கான நியமனங்கள் வழங்கப்பட்டுள்ளன. ஆனால், வடக்கு, கிழக்கு மாகாணங்களில் இன்று வரையில் அப்பதவிக்கான நியமனங்கள் வழங்கப்படவில்லை. அந்நியமனங்கள் 80 சதவீதமான பிரதேசங்களுக்கு வழங்கப்பட்டுள்ளன. குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே ARPA இல்லாத காரணத்தினால் அங்குள்ள விவசாயிகள் பாரிய நெருக்கடிகளைச் சந்திக்கின்றார்கள். குறிப்பாக, ARPA இனால் பசளை விநியோகம் செய்வதற்கான அனுமதியை வழங்க முடியும். அங்கு அந்தப் பதவிக்கு எவரும் நியமிக்கப்படாததால் தற்பொழுது அங்குள்ள கிராம சேவையாளர்களே பசளைக்கான அனுமதியை வழங்குகின்றார்கள். ARPA நியமிக்கப்பட்டால் காலதாமத மின்றி பசளை விநியோகத்தைச் செய்வதற்கும் 'திவிநெகும' போன்ற இன்னோரன்ன வேலைத்திட்டங்களை மேற்கொள்வதற்கும் உதவியாக இருக்கும். எனவே, வடக்கு, கிழக்குப் பிரதேசங்களில் உள்ளவர்களுக்கு ARPA நியமனங்களைக் கட்டாயமாக வழங்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் சுமார் 473 சிறு குளங்கள் இருக்கின்றன. குளங்களைப் பராமரிப்பது போன்ற சில வேலைத்திட்டங்களை தொழில்நுட்ப உத்தியோகத்தர்களே மேற்கொள்ள வேண்டும். அங்கு தொழில்நுட்ப உத்தியோகத்தர்களுக்குப் பற்றாக்குறை காணப்படுகின்றது. திருகோணமலை மாவட்டத்திலே இரண்டு தொழில்நுட்ப உத்தியோகத்தர்கள் மாத்திரமே இருப்பதால் அந்தக் குளங்களைப் பராமரிப்பதற்காக மேலதிகமான தொழில்நுட்ப

உத்தியோகத்தர்களை நியமிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அத்துடன், திருகோணமலை மாவட்டத்திலுள்ள கிண்ணியா, மூதூர், குச்சவெளி ஆகிய பிரதேசங்களிலுள்ள வயல்நிலங்களுக்குச் செல்லும் பாதைகள் யுத்த சூழ்நிலையினால் கடந்த முப்பது வருட காலமாகத் திருத்தப்படாத நிலையில் உள்ளன. எதிர்வரும் 2013ஆம் ஆண்டிலாவது அந்தப் பாதைகளைப் புனரமைப்புச் செய்து தரும்படி வேண்டுகின்றேன்.

அதுமட்டுமன்றி, திருகோணமலை மாவட்டத்திலே 22 கமநலசேவை நிலையங்கள் இருக்கின்றன. ஆனால் அங்கே 14 கமநல அபிவிருத்தி உத்தியோகத்தர்கள் மாத்திரமே இருக்கின்றார்கள். இன்னும் மேலதிகமாக 8 கமநல அபிவிருத்தி உத்தியோகத்தர்கள் நியமிக்கப்பட வேண்டும். இவ்வாறான நியமனங்களை வழங்குவதன்மூலமே அப்பிரதேசத்திலுள்ள விவசாய உற்பத்திகளை மேலும் மெருகூட்டி அபிவிருத்தி செய்யமுடியுமென நான் நினைக்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் கால்நடைகள் வைத்திருப் பவர்கள் பாரிய பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். அந்த மாவட்டத்திலே 94,797 கால்நடைகள் இருக்கின்றன. அங்குள்ள 36,703 குடும்பத்தினர் அந்தக் கால்நடைகளை நம்பியே தமது வாழ்க்கையை நடத்திக்கொண்டிருக்கின்றனர். இருந்தும் அவற்றினைப் பராமரிப்பதற்கு அவசியத் தேவையாகவுள்ள மேய்ச்சல்நிலம் இல்லாததால் அம்மக்கள் செய்வதறியாது சிந்தித்துக்கொண்டிருக்கின்றார்கள். ஆகவே மேய்ச்சல் நிலம் கட்டாயம் திருகோணமலை மாவட்டத்துக்கும் தேவையென்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். மேலும், கௌரவ அமைச்சர் ஆறுமுகன் தொண்டமான் அவர்கள், மேய்ச்சல் நிலம் சம்பந்தமான விடயமொன்றுக்கு 24 செப்ரெம்பர் 2010 திகதிய, MLRCD/03/05/2010 இலக்கமுடைய அமைச்சரவைப் பத்திரமொன்றின்மூலம் அமைச்சரவையின் அனுமதியைப் பெற்றுக்கொண்டார். ஆனால், இதுவரைக்கும் அந்த மேய்ச்சல் நிலம் கால்நடை வைத்திருப்போருக்கு வழங்கப்படவில்லை. ஆகவே, மேய்ச்சல் நிலம் என்ற விடயம் முக்கியமான ஒரு பிரச்சினையாக இருந்துகொண்டிருக்கிறது. ஆகவே, குறித்த அமைச்சு இதில் கூடிய கவனம் செலுத்தி அந்த மேய்ச்சல் நிலத்தை அவர்களுக்குப் பெற்றுக்கொடுக்க நடவடிக்கையெடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

2013ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத் திட்டத்தில் விவசாயத்துறையைப் பொறுத்தவரையில், விவசாயிகளுக்கு மிகவும் நன்மை தரக்கூடிய பல திட்டங்கள் மேதகு ஜனாதிபதி அவர்களினால் முன்மொழியப்பட்டுள்ளன. அதில் இலவச விதைநெல், அடுத்த பெரும்போகம் வரை கடன் அறவிடுவதை நிறுத்தப் பணிப்பு, விவசாயிகளுக்கான தானிய காப்புறுதித் திட்டம், சேதனப் பசளை பயன்படுத்துபவர்களுக்கு நெல் கிலோகிராம் ஒன்றுக்கு 40 ரூபாய் உத்தரவாதவிலை, கைவிடப்பட்ட நெற்காணிகளைப் பயன்படுத்த 2013 யூன் வரை காலக்கெடு; தவறினால் குத்தகை அடிப்படையில் பகிர்ந்தளித்தல் என்பன அடங்குகின்றன. பயன்படுத்தப்படாத நெற்காணிகளைப் பயன்படுத்துவதற்கு எங்களுடைய விவசாயிகள் தயாராக இருக்கிறார்கள். இருந்தாலும் அங்கிருக்கின்ற உத்தியோகத்தர்களின் கெடுபிடிகளின் காரணமாக அந்தக் காணிகளைப் பயன்படுத்துவதற்கு இயலாமலுள்ளது. அத்துடன், இன்று அரசாங்கத்தினால் வகுக்கப்பட்டுள்ள நல்ல பல திட்டங்களை அமுல்படுத்துகின்ற போது சம்பந்தப்பட்ட உத்தியோகத்தர்கள் அரசாங்கத்துக்குக் கெட்டபெயர் ஏற்படுத்தாத வகையில் செயற்படவேண்டும். ஆனால், இன்று திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில் அங்கு அரச உத்தியோகத்தர் சிலர் அரசாங்கத்தினால் கொண்டுவரப்படுகின்ற திட்டங்களை அமுல்படுத்துவதற்கும் தடையாக இருந்து கொண்டிருக்கிறார்கள். இதற்கு அரசாங்கம் உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டும்.

அடுத்ததாக, மீன்பிடித் துறையை எடுத்துக்கொண்டால், மூதூர், கிண்ணியா, குச்சவெளி போன்ற பிரதேசங்களில் மீனவர்கள் அதிகமாக இருக்கிறார்கள். இருந்தாலும் அவர்கள் இற்றைவரைக்கும் புராதன மீன்பிடி முறைகளையே மேற்கொண்டு வருகிறார்கள். தொழில்நுட்பம் வளர்ந்துள்ள இந்தக் காலகட்டத்தில் நவீன முறையில் மீன்பிடித் தொழிலைச் செய்வதற்கு அரசாங்கம் பல திட்டங்களை வகுக்க வேண்டும். அத்துடன், இலங்கை சுதந்திரமடைந்த காலத்திலிருந்து இற்றைவரைக்கும் அப்பிரதேச மீனவர்களுக்கான வீடமைப்புத் திட்டம் ஏற்படுத்தப்படவில்லையென நான் நினைக்கின்றேன். ஆனால், இன்று வேறு பிரதேசங்களில் மீனவர் வீடமைப்புத் திட்டமும் இன்னும் பல வசதிகளும் செய்து கொடுக்கப்படுகின்றன. எனவே, எமது பிரதேச மீனவர்களுக்கும் வீடமைப்புத் திட்டத்தை ஏற்படுத்திக் கொடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

தற்பொழுது ஒவ்வொரு பிரதேசத்திலும் மீன்பிடித் துறைமுகம் அமைக்கப்பட்டு வருகின்றது. ஆனால், இன்னமும் திருமலை மாவட்டப் பிரதேசங்களில் மீன்பிடித் துறைமுகம் அமைப்பதற்கான எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. நானும் எங்களுடைய தலைவர் மாண்புமிகு ரவூப் ஹக்கீம் அவர்களும் அமைச்சர் அவர்களிடம் இதுபற்றிக் கேட்டபோது, மூதூர் பிரதேசத்தில் ஒரு மீன்பிடித்துறைமுகம் அமைத்துத் தருவதாகக் குறிப்பிட்டார். ஆனால், அதுசம்பந்தமாக இதுவரை எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எவ்வாறாயினும், கௌரவ அமைச்சர் அவர்கள் அதனை நிறைவேற்றித் தருவார் என்று நான் நம்புகின்றேன். நான் ஏற்கெனவே கூறியதுபோன்று உத்தியோகத்தர்கள் சிலர் அரசாங்கத்துக்கு அவப்பெயர் ஏற்படக்கூடிய வகையில் நடந்துகொள்வதை அமைச்சர் அவர்கள் கருத்திற்கொண்டு, அவர்களுக்கு எதிராக உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டு மென்று கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

[පූ. භා. 11.06 ]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කෘෂිකර්ම, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන, ගොවිජන සේවා සහ වනජීවී, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන කියන අපේ රටේ ජාතික නිෂ්පාදනයට අතිශයින් වැදගත් අමාත්‍යාංශ කීපයක් පිළිබඳ කාරක සභා අවස්ථාවේදී විවාදයට සම්බන්ධ වීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව බෙහෙවින් සතුටු වෙනවා.

විශේෂයෙන් මම මේ අමාත්‍යාංශ කීපය පිළිබඳව කරුණු කීපයක් කෙටියෙන් ඉදිරිපත් කරලා, මූලික කරුණු දැක්වීමට යාමට තමයි සූදානම් වෙන්නේ. ගරු ධීවර අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය අමාත්‍යතුමා දැන් මේ සභාවේ නැහැ. ගරු සභාපතිතුමනි, නමුත් මං මේ කාරණය දැන ගන්න කැමැතියි. මීට පෙර මෙම ධීවර අමාත්‍යාංශයෙන් මව් යාත්‍රා මිලදී ගැනීමේ

[ගරු අනුර දිසානායක මහතා]

ව්‍යාපෘතියක් ආරම්භ කළා. බහු දින ධීවර යාත්‍රාවලින් නෙළා ගත් මත්ස්‍ය සම්පත ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ශීතාගාර පහසුකම් ගැඹුරු මුහුදේදීම ලබා දීම සඳහාත්, එම මසුන් තොග ගොඩ බිමට ගෙන ඒමටත්, අවශ්‍ය විටක මරුවැල් පන්න රැකියාවේ යෙදීම සඳහාත් මච් යාත්‍රාවක් මිලදී ගැනීම කියලා තමයි මේ ව්‍යාපෘතිය ඉදිරිපත් කළේ. මේ සඳහා මිලියන 326ක් යනවාය කියලා තමයි ව්‍යාපෘති වාර්තාවේ සඳහන් වෙලා තිබුණේ.

අපි දන්නා පරිදි මෙම මච් යාත්‍රාව සකස් කිරීම සඳහා චීන සමාගමකට ලබා දීලා තිබුණා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 65ක අත්තිකාරමක් ලබා දීලා තිබුණා. ඒ යාත්‍රාවේ ඉදිකිරීම් පිළිබඳව විටින් විට අපේ නිලධාරි මහත්වරුන් ගිහිල්ලා එහි තිබෙන ශක්‍යතාවන් පිළිබඳව වාර්තාවන් ඉදිරිපත් කරලා තිබුණා. හැබැයි දැන් ඒ නැවට මොකද වෙලා තිබෙන්නේ කියලා ඇමතිවරයාගෙන් දැනගන්න කැමැතියි. අපිට ලැබී තිබෙන තොරතුරු අනුව ලංකා රජයෙන් මිලියන 65ක අත්තිකාරමක් සහිතව චීන සමාගමකට හදන්න දී තිබෙන එම නැව නැවත ශ්‍රී ලංකා ධීවර සංස්ථාවට, ධීවර අමාත්‍යාංශයට අයිති වෙනවා වෙනුවට වෙනත් සමාගමකට විකුණා දමා තිබෙනවා. ඒ නැවට මොකක්ද සිදු වුණේ කියලා වහාම අමාත්‍යවරයා මේ පිළිබඳව පාර්ලිමේන්තුවට අදහසක් ඉදිරිපත් කළ යුතුයි.

ගරු සභාපතිතුමනි, ඊළඟට පසු ගිය දා ඕස්ට්‍රේලියාවෙන් ගැබ්බර මී හරක් 500ක් ආනයනය කළා. 2,000ක ව්‍යාපෘතියක පළමුවැනි කොටස ලෙස තමයි මේ 500 ආනයනය කළේ. මේ වන විට එයින් 46 දෙනෙකු ගබ්සාවට ලක් වෙලා තිබෙනවා. හැබැයි ගබ්සාවට ලක් වීමට හේතු හොයා ගෙන යන කොට දැන් පර්යේෂණවලින් ඔප්පු වෙලා තිබෙනවා, "සැල්මොනෙල්ලා ඩබ්ලින්" කියන රෝගය මෙම සතුන්ට වැළඳිලා තිබෙනවාය කියලා. "සැල්මොනෙල්ලා ඩබ්ලින්" කියන රෝගය 1968න් පස්සේ ලංකාවේ වාර්තා වෙලා නැහැ. පර්යේෂණ වාර්තාවලට අනුව 1968 තමයි මේ පිළිබඳව සැකයක් හෝ ලබා ගත හැකි වී තිබෙන්නේ. හැබැයි දැන් ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන සතුන් හරහා අපේ සත්ව ප්‍රභේදයන්ට මෙම රෝග කාරකය පැතිරීමේ අනතුරක් අද තිබෙනවා.

ගරු සභාපතිතුමාගෙන් මා මේ කාරණය දැන ගන්න කැමැතියි. මා දැක්කා, මේ සතුන් ආනයනය කරන වෙලාවේදී, සතුන් වරායේ බාන කොට අපේ අමාත්‍යවරුන් අත්පුඩි ගහලා, මල් මාලා දාලා තමයි ඒ සතුන් පිළිගත්තේ. [බාධා කිරීමක්] ඔව්. සත්තු මැරුණේ නැහැ. සත්තු 46 දෙනෙකු ගබ්සා වෙලා තිබෙනවා. ඒ ගබ්සා වීම හේතු කොටගෙන පරීක්ෂණ කළාම ඔප්පු වෙලා තිබෙනවා, අපේ රටේ නොතිබුණු, අපේ රටින් ඉවත් කරන ලද රෝග කාරකයක් මේ සතුන් තුළ තිබුණාය කියන කාරණය. 1968න් පස්සේ මේ රෝගය අපේ රටේ වාර්තා වෙලා නැහැ. [බාධා කිරීමක්] හරි, ඒ ඔබතුමාගේ ප්‍රකාශයේ. දැන් සිදු වෙලා තිබෙන දේ තමයි විවිධ වුවමනාවන් මත ආනයනය කරන සතුන් හරහා අපේ රටේ සත්ව ගහණයට මෙතෙක් නොතිබුණු විෂබීජ සහ රෝගකාරක බෝවීමේ අනතුරකට අද මුහුණ දීලා තිබෙන එක.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පශු සම්පත් ක්ෂේත්‍රය පිළිබඳව විද්වතුන් විසින් සකස් කරන ලද විධිමත් අභිජනන ප්‍රතිපත්තියක් අපේ රටේ තිබුණා. අපට අවශ්‍යව තිබෙන්නේත් ඒකයි. අපේ රටට ගැළපෙන, අපේ රටේ පරිසරයට ඔරොත්තු දෙන අභිජනන ප්‍රතිපත්තියක් හරහා අපිට අවශ්‍ය වන සත්ව ගහණය අපි සකස් කර ගත යුතුව තිබුණා. එය කෙටි කාලීන වැඩක් නොවෙයි. අවුරුද්දෙන්, දෙකෙන් සම්පූර්ණ කළ හැකි වැඩක් නොවෙයි. නමුත් දිගු කාලීන අභිජනන ප්‍රතිපත්තියක් හරහා පමණයි අපිට අවශ්‍ය වෙන, අපේ පරිසරයට, අපේ තිබෙන රටාවන්ට, අපේ තිබෙන කළමනාකරණයේ තිබෙන තත්ත්වයන්ට ගැළපෙන පරිදි සතෙක් මේ රට තුළ නිර්මාණය කර ගන්න පුළුවන්කම තිබෙන්නේ. නමුත් දැන් සිද්ධ වෙලා තිබෙන්නේ මේකයි. උඩින් ගෙනැල්ලා එක පාරට අත හැරීම නිසා මැනැවින් දියත් කරමින් තිබුණ අපේ අභිජනන ප්‍රතිපත්තිය පවා අද අවුල් ජාලාවකට පත් වෙලා තිබෙනවා. අද අපේ ස්ථාවර අභිජනන ප්‍රතිපත්තිය වේගයෙන් දියත් වන්නේ නැතිව, අතර මැද නතර වෙමින්, විවිධ හැලහැප්පිලිවලට ලක් වෙමින් තමයි ගමන් කරමින් තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි තවත් සතුන් 1,500ක් ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන්නට තවත් සැලසුමක් තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, දැනටත් රෝග කාරක සහිත සතුන් ආනයනය කරලා තිබෙන තත්ත්වයක් තුළ, අලුතින් සතුන් 1,500ක් ආනයනය කරන්නට තමුන්නාන්සේලා තීරණයක් ගන්නවාද කියලා. එහෙම නැත්නම් මේ සභාවට,- [බාධා කිරීමක්] මම නොවෙයි, ඒ ගැන කියන්නේ පර්යේෂකයන්. ගරු සභාපතිතුමනි, මම ගිහින් ඒ සතුන්ගේ මුත්‍ර පරීක්ෂා කළේත් නැහැ, ඒ සතුන්ගේ ගොම පරීක්ෂා කළේත් නැහැ, ඒ සතුන්ගේ වලිගය ඇල්ලුවේත් නැහැ, ඒ සතුන්ගේ ඔළුව ඇල්ලුවේත් නැහැ, ඒ සතුන්ගේ මුහුණ බැලුවේත් නැහැ. නමුත් ඒ සතුන්ට තිබෙන්නේ මේ රෝගකාරකය කියලා ඒ පර්යේෂණ කරන මහත්වරු අද කියලා ඉවරයි.

1968න් පසුව අපේ රටේ ඒ රෝගකාරකය පිළිබඳව වාර්තා වෙලා නැහැ. නමුත් අද අපේ රටට ඒ රෝගකාරකය ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ සල්ලි දීලා ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වලා තිබෙන්නේ ලෙඩ. ඒ ලෙඩ ගෙනෙන විට තමුන්නාන්සේලාට හොඳයි. සතුන් ගෙනෙන විටත් කොමිස්; ලෙඩට බෙහෙත් ගෙනෙන විටත් කොමිස්. ඒක තමයි තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය. අද ඒක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ රටේ සත්ව ගහනය එක් අමාත්‍යවරයෙකුගේ හෝ එක් පුද්ගලයෙකුගේ පෞද්ගලික බුදලයක් නොවෙයි. මේ, සියවස් ගණනාවක් තිස්සේ වර්ධනය වන ලද, අපේ රටේ ජනතාවට අයත් සත්ව ගහනයක්. ඒ සත්ව ගහනයට මෙවැනි රෝග කාරක ඇතුළු කිරීම පිළිබඳව, ඒවා ගෙන ඒම පිළිබඳව අපේ විරෝධය සටහන් කරන්නට කැමැතියි.

ඒ වාගේම මම ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් දැන ගන්නට කැමැති කාරණයක් තිබෙනවා. දැන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා කොරියානු සංචාරයකට සූදානම් වෙලා ඉන්නවා. මා නිවැරදි ඇති. ඒ කොරියානු සංචාරය සම්බන්ධව ඔබතුමා නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාට - එතුමාගේ නම මෙතැන පැහැදිලිව නැහැ- ලිපියක් එවලා තිබෙනවා. ඒ ලිපියෙන් ඔබතුමා කියන්නේ කොරියාවට යන විට MoU එකක් අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කරන්න කියලායි. මම දැන ගන්න කැමැතියි කොරියාවට ගිහින් සකස් කරන්න තිබෙන MoU එක මොකක්ද කියලා. ඒ අවබෝධතා ගිවිසුම මොකක්ද?

ගරු සභාපතිතුමනි, අපේ රටේ ඉතා වටිනා ජාන සම්පතක් තිබෙනවා. ඒ ජාන සම්පත ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ගන්නෝරුවේ ජාන බැංකුවක් පිහිටුවලා තිබෙනවා. 1986 දී, ඒ කාලයේ තිබුණ තාක්ෂණයට උචිත වන පරිදි පිහිටුවන ලද ජාන බැංකුවක් අපට තිබෙනවා. අපේ රටේ ඉපදුණ වර්තමාන පරම්පරාවට, ඉපදෙන්න ඉන්න අපේ අනාගත පරම්පරාවට අයත් වටිනාම සම්පත තමයි මේ ජාන සම්පත. එය ආරක්ෂා කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම සහ අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කර දීම වර්තමානයේ අපේ වගකීමයි.

අද මොකක්ද කරමින් තිබෙන්නේ? කොරියානු රජයත් එක්ක තිබෙන එකඟතාව අනුව, ඒ ජාන සම්පත කොරියාවේ තැන්පත් කිරීම සඳහා කටයුතු කරන්න යනවා. එහෙම නොවෙයි නම් ගරු ඇමතිතුමා ඒක මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ. එම ජාන සම්පත ඉතාම වටිනා ජාන සම්පතක්; අපේ අනාගත පරම්පරාවට ආරක්ෂා කර දිය යුතු ජාන සම්පතක්. ඒක අපේ ශ්‍රී ලංකාවට, රාජ්‍යයක් ලෙස අපට අයිතිව තිබෙන ඉතාම වැදගත්, සුවිශේෂ ස්වාභාවික සම්පතක්. ඒ සම්පතට මොකක්ද අද කරන්න හදන්නේ? එය කොරියාවට අරගෙන ගිහින් ඒ රටේ ගබඩා කරන්න සැලසුමක් තිබෙනවා. ඒවා කොරියාවට අරගෙන ගිහින් මොකක්ද කරන්න හදන්නේ කියලා මම අහනවා.

කොරියාවේ ජාන සම්පත් පිළිබඳ බැංකුව ආරම්භ කළේ 2005 වර්ෂයේදී. අපට ඊට වඩා ඉතිහාසයක් තිබෙනවා. අපි අපේ ජාන සම්පත් බැංකුව ආරම්භ කළේ 1986 වර්ෂයේදී. අපේ ඉතිහාසය දිගුයි. අපේ අත් දැකීම් වැඩියි. ඒ පිළිබඳ නිපුණත්වයක් තිබෙන විද්‍යාඥයන් විශාල පිරිසක් අපට ඉන්නවා. ඒ පිළිබඳ අධ්‍යයනය කරන ලද, ඒ පිළිබඳ ප්‍රායෝගික හැදෑරීම් කරන ලද විද්‍යාඥයන් ගණනාවක් අප සතුව ඉන්නවා. අප සතුව එවැනි විද්‍යාඥයන් ගණනාවක් සිටියදී අපේ ජාන සම්පත කොරියාවට ගෙන යන්නේ ඇයි? මේ ගරු සභාවට ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් වහා කළ යුතුයි. අපේ ජාන බැංකුවේ තාක්ෂණය ප්‍රමාණවත් නැති නම්, මුදල් ප්‍රමාණයක් යොදවා, වර්තමාන තාක්ෂණයට ගැළපෙන පරිදි ඉතා හොඳින් ප්‍රතිසංස්කරණය කළ හැකියි. එසේ කරනවා වෙනුවට, මේ ජාන සම්පත කොරියාවේ ගබඩා කිරීම පිළිබඳව අපේ රතන හාමුදුරුවනෝ ඔබවහන්සේ එකඟද? මේ, අපේ රටේ තිබෙන වටිනාම සම්පත. ජාන කොල්ලයක් සිද්ධ වෙන ලෝකයක් අද තිබෙන්නේ. විවිධ බහු ජාතික සමාගම් යම් යම් රටවල තිබෙන ජාන කොල්ල කන්න, ඒවායේ පේටන්ට් බලපත්‍ර අයිතිය ඔවුන්ට ගන්න කටයුතු කරනවා. අද ඒවා වෙනුවෙන් විශාල වෙළෙඳපොළක් සකස් කර තිබෙනවා. බහුජාතික සමාගම්වල ප්‍රාග්ධනයෙන් ලෝකයේ තිබෙන සම්පත් සූරාකන ක්‍රමයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ලෝකය ඇතුළේ අපේ වගකීම තමයි, අපේ සුජාත ජාන සම්පත ආරක්ෂා කර ගැනීම. එය අනාගත පරම්පරාව වෙනුවෙන් අප ඉටු කළ යුතු වග කීමක්. හැබැයි, අද සිද්ධ කරමින් තිබෙන්නේ, ඒ ජාන සම්පත කොරියාවේ තැන්පත් කිරීම සඳහා සැලසුම් හදා තිබෙන එක. මා දන්නා පරිදි, ගරු ඇමතිතුමා තව සති දෙකකින් විතර කොරියාවේ සංචාරයක යෙදෙනවා, ඒ පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කරන්න. ඔබතුමා මේ ගරු සභාවට පැහැදිලි කිරීමක් කළ යුතුයි, ඒ ජාන සම්පතට මොකක්ද කරන්න යන්නේ කියලා. ඒ ටික තමයි ගරු සභාපතිතුමනි, සිදුවීම් හැටියට තිබෙන්නේ.

ඊළඟට, මම ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි, අපේ රටේ ගොවි ජනතාව ගැන. ගරු සභාපතිතුමනි, පොහොර සහනාධාරය දීම හෝ වී මිල රුපියල් 32 කිරීම හෝ කාබනික පොහොර යොදා නිෂ්පාදනය කරන වීවලට රුපියල් 40ක් ගෙවීම හෝ වැනි කරුණු මත නොවෙයි, අද අපේ රටේ කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවි ජනතාව මුහුණ දී ඇති ප්‍රධාන අර්බුදය මතු වී තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඉඩම් පිළිබඳ ප්‍රශ්නය අද ගොවි ජනතාවගේ ප්‍රධාන අර්බුදයක් බවට පත් වී තිබෙනවා. අපේ රටේ තුන්වන පරම්පරාවේ, හතරවන පරම්පරාවේ ගොවි අම්මා තාත්තාගේ දූවා දරුවන්ට ඉඩකඩම් නැහැ. මහවැලි ව්‍යාපාරය හැරුණුකොට, දේවහුව ව්‍යාපාරය, මින්නේරිය ව්‍යාපාරය, කවුඩුල්ල ව්‍යාපාරය, ගිරිතලේ ව්‍යාපාරය වැනි ව්‍යාපාර අවුරුදු 50ට වඩා පැරණි ව්‍යාපාර. ඒ හැම ව්‍යාපාරයකින්ම ලබා දුන් ඉඩම් ප්‍රමාණයට දැන් අනු පවුල් ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ගොවි අනු පවුල්වල ඉන්න දූවා දරුවන්ට මේ ඉඩම් ප්‍රමාණවත් නැහැ.

ඒ නිසා අපේ රටේ යළි ඉඩම් බෙදා දීමේ ක්‍රියාවලියක් වහා ආරම්භ කළ යුතුයි. මේ මාතෘ භූමියේ ඉපදුණු, මේ මාතෘ භූමියට පොහොර වන මේ රටේ දූවා දරුවන්ට අපේ රටේ ඉඩම් ලබා දිය යුතුයි. හැබැයි, අපේ රටේ දූවා දරුවන්ට ඉඩම් ලබා දෙනවා වෙනුවට තමුන්නාන්සේලාට කරන්නේ මොකක්ද? ලෝකයේ සමහර රටවලින් පළවා හරින ලද, සමහර රටවල ඉතා බරපතළ පරිසර හානිවලට වග කිව යුතු ඇමෙරිකානු ඩෝල් සමාගමට සෝමාවතිය චෛත්‍යය ළඟ අක්කර 4,500ක් දුන්නා. නමුත් අපේ ගොවි දූවා දරුවන්ට ඉඩකඩම් නැහැ. ඒ වාගේම තමයි වැලිකන්දට එහා පැත්තේ ෆාම් එකේ අක්කර 3,500කට ආසන්න භූමි ප්‍රමාණයක් බහුජාතික සමාගමකට දුන්නා. පැල්වත්ත සීනි කර්මාන්තශාලාව ළඟ අක්කර 1,000ක් ඩෝල් සමාගමට දුන්නා, කෙසෙල් වගා කරන්න. අපේ රටේ ගොවි දූවා දරුවන්ට ඉඩකඩම් නැතිව ඉන්න කොට තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය බවට පත් වෙලා තිබෙන්නේ ඒක. මේ රටේ ඉපදිලා, මේ රටට පොහොර වෙන, මේ රටේ ආර්ථිකයට හවුල් වෙන, මේ රටේ සුජාත දූ පුතුන්ට මේ රටේ ඉඩම් බෙදා දෙනවා වෙනුවට -ඔවුන්ට විශාල ඉඩම් අර්බුදයක් තිබියදී- තමුන්නාන්සේලා අද ඉඩම් දෙන්න පටන් අරගෙන තිබෙන්නේ බහුජාතික සමාගම්වලට. ඒකත් දෙන්නේ කුඩා ප්‍රමාණයකින් නොවෙයි, අක්කර දස දහස් ගණන්වලින්.

ගරු සභාපතිතුමනි, ගිරිතලේ ව්‍යාපාරයේම අක්කර 7,500ක් තිබෙනවා අනවසර ඉදි කිරීම්, අනවසර ගොවිතැන් කිරීමත් එක්කම. හැබැයි ඩෝල් සමාගමට විතරක් දීලා තිබෙනවා ඒකෙන් අක්කර 5,500ක්. මේක සාධාරණද? අද අපේ රටේ ගොවි දූවා දරුවන්ට, තුන්වැනි පරම්පරාවේ ගොවි අම්මාගේ තාත්තාගේ දරුවන්ට ඉඩම් බෙදා දෙනවා වෙනුවට තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ බහුජාතික සමාගම්වල සුද්දන්ට ඉඩම් ලබා දෙන එකයි. ගරු සභාපතිතුමනි, දේශ ප්‍රේමීත්වයේ සළුපිළි පටලවාගෙන, දේශ ප්‍රේමීත්වයේ හුනු තවරාගෙන, දේශ ප්‍රේමීත්වයේ කුරහන් ගැන කථා කරමින්, උතුරු සළුව ගැන කතා කරමින් මේ අය කරන්නේ අපේ රටේ වටිනා ඉඩම් බහුජාතික සමාගම්වලට පවරා දීමයි. ඒ නිසා අපේ රටේ ගොවි ජනතාවට යළි මෙම ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයි. බහුජාතික සමාගම්වලට ලබා දෙන මේ ඉඩම්, අපේ මේ මාතෘ භූමියේ ඉපදුණු, ගොවි අම්මා තාත්තගේ දූවා දරුවන්ට යළි ලබා දිය යුතුයි.

ගරු සභාපතිතුමනි, ඊළඟට තිබෙනවා වතුර පිළිබඳ ප්‍රශ්නය. අප දන්නවා අපේ රටේ මහා සාගර වැනි වැව් තිබෙන බව. අපේ රටේ ඉතිහාසය හොයලා බැලුවොත් අපේ වාරි කර්මාන්තය ඇතුළේ අපට මහා තාක්ෂණයක් හම්බ වෙනවා. බිසෝ කොටුව අපට හම්බ වන්නේ අපේ වාරි කර්මාන්තය ඇතුළේයි. මඩ සොරොව්ව අපට හම්බ වන්නේ අපේ වාරි කර්මාන්තය ඇතුළේයි. කලා වැවේ සිට තිසා වැවට වතුර ගෙන යන අතිශය විශ්මයජනක නිර්මාණයක් වන යෝධ ඇළ අපට හම්බ වන්නේත් අපේ වාරි කර්මාන්තය ඇතුළේයි. මේ වාරි කර්මාන්ත අපේ ඉතිහාසයේ මුතුන් මුත්තන් ගොඩ නැඟුවේ, අපේ ඉතිහාස පරම්පරාව මේවා ආරක්ෂා කළේ මොකක් වෙනුවෙන්ද? බෝල් අත්ත බැඳලා, මුට්ටි මංගල්‍යය තියලා, අලුත් සහල් මංගල්‍යය තියලා, දේව කන්නලව් කරලා මේ වැව් සම්පත ආරක්ෂා කළේ මොකක් වෙනුවෙන්ද? ඒ අපේ රටේ කෘෂිකර්මාන්තය වෙනුවෙන්. හැබැයි අද වැව් කර්මාන්තයේදී තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මොකක්ද? තමුන්නාන්සේලා අද මොකක්ද කරලා තිබෙන්නේ? අද කවුඩුල්ල වැව ලස්සන කරන ව්‍යාපෘතියක් එනවා. පරාක්‍රම සමුද්‍රය ලස්සන කරන ව්‍යාපෘතියක් එනවා. නාච්චදූව වැව ලස්සන කරන ව්‍යාපෘතියක් එනවා. ගිරිතලේ වැව ලස්සන කරන ව්‍යාපෘතියක් පටන් අරගෙන ඒ සොරොව්වත් කඩලා තිබෙන නිසා ගොවීන්ට මේ කන්නයේ වතුර දෙන්න විධියකුත් නැහැ. දැන් ගිරිතලේ ව්‍යාපාරයටත් මහ කන්නයේදී වතුර නැහැ. තමුන්නාන්සේලාගේ

[ගරු අනුර දිසානායක මහතා]

ව්‍යාපාරය වෙලා තිබෙන්නේ වැව් ලස්සන කිරීම. ඒ මොකක් වෙනුවෙන්ද? ඒ ගොවි ජනතාවට ඉඩම් දෙන්න නොවෙයි. ආර්ථිකය සම්බන්ධව තමුන්නාන්සේලා තව දුරටත් ප්‍රමුඛතාව දෙන්නේ කෘෂි කර්මාන්තයට නොවෙයි, සංචාරක ව්‍යාපාරයටයි.

සුද්දන්ට මනස්කාන්ත දර්ශන පෙන්වන්න, වැව් හුළඟ වදින්න, සංචාරක බෝට්ටු දමන්න, seaplanes බස්සවන්න, අපේ රටේ මුතුන්මිත්තෝ බැඳපු වැව්, ආරක්ෂා කරපු වැව් අද පාවිච්චි කරනවා. එදා ධාතුසේන රජ්ජුරුවෝ තමන්ගේ අතට වතුර ටික අරගෙන කිව්වා, තමන්ට තිබෙන එකම සම්පත මේ වතුර ටිකයි කියලා. පරාක්‍රමබාහු රජ්ජුරුවෝ පරාක්‍රම සමුද්‍රය හදලා කිව්වා, "අහසින් වැටෙන එක දිය බිඳුවක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට එක්වීමට ඉඩ නොදිය යුතුය" කියලා. අපේ රටේ පළමු වාරි කර්මාන්තයට මුල්ගල තියපු, බසවක්කුලම වැව හදපු පණ්ඩුකාභය රජ්ජුරුවෝ අපේ රටේ කෘෂි කර්මාන්තය වෙනුවෙනුයි වැඩ කටයුතු කළේ. හැබැයි අද වර්තමාන රජ්ජුරුවෝ මොකක් වෙනුවෙන් ද මේ වාරි කර්මාන්ත උපයෝගී කර ගන්නේ? වර්තමාන රජ්ජුරුවෝ අද අපේ රටේ වැව් කර්මාන්තය උපයෝගී කර ගන්නේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් නොවෙයි.

සුද්දාගේ මනදොළ පිනවන සංචාරක කර්මාන්තයේ තෝතැනි බවට අපේ රටේ වැව් පද්ධතිය පත් කරන්න කැබිනට් පත්‍රිකා දාලා අනුමත කර ගෙන තිබෙනවා. ටෙන්ඩර් කැඳවා තිබෙනවා, බෝට්ටු සංචාරවලට. ඒ වාගේම තමයි වැව්වලට seaplanes බස්සවන්න සැලසුම් සකස් කරලා තිබෙනවා. කෘෂි කර්මාන්තය වෙනුවෙන් පාවිච්චි කරපු වැව්, අපේ මුතුන් මිත්තන් හදපු වැව් අද තමුන්නාන්සේලා සැලසුම් කරලා තිබෙන්නේ සංචාරක ව්‍යාපාරයේ තෝතැනි බවට පත් කරන්න.

කෘෂි කර්මාන්තයේ මූලික වුවමනාවන් තමයි, ඉඩම්, වතුර සහ බීජ. ගරු සභාපතිතුමනි, අපේ රටේ තිබුණු ඉතා වටිනා ජාන සම්පතක් බීජ සම්පත. අද එය අපට මුළුමනින්ම අහිමි කරලා තිබෙනවා. අපේ ගොවි පොළවල් කඩා වැට්ටුවා; බීජ පර්යේෂණ ආයතන කඩා වැට්ටුවා. ඉතා උසස් දැනුමක් තිබුණු බීජ පර්යේෂණ නිලධාරින් අපේ බීජ පර්යේෂණ ආයතනවල සිටියා. ගරු සභාපතිතුමනි, අපි අගය කරන්න ඕනෑ, අපේ රටේ හැම දෙපාර්තමේන්තුවකටම වඩා වැඩියෙන්ම ආචාර්ය උපාධි ගත්ත නිලධාරින් ඉන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේයි. කෘෂි කර්මාන්තය පිළිබඳ හසළ දැනුමක් තිබෙන, විද්‍යා පර්යේෂණවල විවිධ අත් දැකීම් තිබෙන, විවිධ ප්‍රායෝගික අත් දැකීම් තිබෙන මහා දැනුම් සම්පතක් අප සතුව තිබුණා. අපි මේ දැනුම් සම්පත උපයෝගී කර ගත්තාද, අපේ රටට අවශ්‍ය කරන බීජ ටික නිෂ්පාදනය කරන්න? අපේ ගොවිපොළවල් ටික නඟා සිටුවන්න, අපේ පර්යේෂණ ආයතන ටික නඟා සිටුවන්න, ඒවාට මුදල් වෙන් කරන්න, මුදල් වෙන් කරලා අපට අවශ්‍ය වන බීජ ටික අපිම නිෂ්පාදනය කර ගන්න සැලසුමක් හැදුවාද? නැහැ. සමහර පර්යේෂණ නිලධාරින්ට සිද්ධ වෙච්ච දේ මොකක්ද?

විශේෂයෙන්ම අපි දන්නවා, බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ රතු බාස්මතී හාල හොයා ගත්තු - ඒවායේ කුඩා අඩුපාඩුකම් තිබුණා.- සුවඳ සහිත බාස්මතී හාල හොයා ගත්තු අපේ රටේ ප්‍රවීණ පර්යේෂණ නිලධාරි මහත්මයෙක් සිටිය බව. හැබැයි අපේ රජය සමත් වුණේ නැහැ, කෘෂි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඔහුව තියා ගන්න. ඔවුන්ට අවශ්‍ය කරන පහසුකම් නැහැ, ඔවුන්ට අවශ්‍ය කරන දිරි දීමනා නැහැ, ඔවුන්ට අවශ්‍ය කරන රැකවරණය නැහැ. ඔවුන්ට කාටද සේවය කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ? අද සමහරක් අය ඉල්ලා අස් වෙලා ගිහිල්ලා බහුජාතික සමාගම්වල සේවය කරනවා. අද පැල්වැහැර ගොවි පොළේ CIC සමාගමේ ඉතාමත් හොඳ පර්යේෂණ නිලධාරියෙක් හැටියට ඔහු කටයුතු කරනවා. ඇයි අපට බැරි වුණේ, අප සතුව තිබුණු මේ මහා දැවැන්ත සම්පත, ඒ බුද්ධිමය සම්පත, අත් දැකීම් සහිත සම්පත රැක ගන්නට?

අපේ රටේ බීජ ටික අපේ රටේ නිෂ්පාදනය කර දෙන්නට සමත් වෙන පර්යේෂණ සම්පත තමුන්නාන්සේලා ඔහේ අත් හැරලා තිබෙනවා. අද මොකක්ද, තමුන්නාන්සේලා කරමින් සිටින්නේ? සියලු බීජ ටික පිට රටින් ආනයනය කරන තැනට පත් වෙලා තිබෙනවා. අද අපේ රටේ ගොවි ජනතාව තමන්ට අවශ්‍ය කරන සියලුම බීජ -ගරු සභාපතිතුමනි, වී හැර. මා දන්නේ නැහැ, වීවලට නුදුරේදී කවර ඉරණමක් අත්වේවිද කියලා. - බහුජාතික සමාගම්වලින් යැපෙන, බහුජාතික සමාගම්වලින් ආරක්ෂා කරන, බහුජාතික සමාගම් පමණක් බෙදා හරින බීජ වෙළෙඳ පොළක් අපේ රටේ ඇති කරලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ වෙනුවෙන් ගත්ත ප්‍රතිපත්තිය මොකක්ද? 1994 සිට රට පාලනය කරනවා. අපේ රටේ බීජ සම්පත වර්ධනය කර ගන්න, අපේ රටේ බීජ සම්පත ආරක්ෂා කර ගන්න, බීජ සම්පත ප්‍රවර්ධනය කර ගන්න, පර්යේෂණ හරහා අලුත් බීජ එළිදක්වන්න මොකක්ද කරලා තිබෙන සැලසුම? කිසි දෙයක් නැහැ. ඔහේ අත් හැරලා දාලා තිබෙනවා. උදම් අනනවා, පොහොර දෙනවා; පිදුරු දෙනවා; මේ වාගේ කුඩා කුඩා දේවල් දෙනවා කියලා. ඒවා නොවෙයි වැදගත් වන්නේ. අපේ රටේ ගොවිජනතාවගේ ඉඩම්වල ප්‍රශ්න තිබෙනවා. ඔවුන්ට වතුර ප්‍රශ්නය තිබෙනවා; බීජවල ප්‍රශ්නය තිබෙනවා.

කෘෂි කර්මාන්තයේ මූලික වුවමනාවන් තමයි, ඉඩම්, වතුර සහ බීජ. ඊළඟට, යෙදවුම්. ගරු සභාපතිතුමනි, යෙදවුම්වල පොහොර සහනාධාරය පිළිබඳ ලොකු විවාදයක් තිබෙනවා. අපි පෞද්ගලිකව පිළිගන්නවා, අපේ රටේ කෘෂි කර්මාන්තය වර්ධනය විය යුත්තේ කාබනික පොහොර හරහා නොවන බව. කාබනික පොහොර යැපීම් කෘෂිකර්මාන්තයේ උපකරණයක්. ඒ කෘෂිකර්මාන්තය යැපීම් මට්ටමේ තිබියදීයි. අද කෘෂි කර්මාන්තය කාර්මික මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. එය වාණිජ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. කෘෂිකර්මාන්තය වාණිජ මට්ටමකට ඇවිල්ලා තිබෙන කොට කාබනික පොහොරවලින් පමණක් අපේ අවශ්‍යතාව පිරිමහ ගන්න බැහැ. ඒක මිථ්‍යා අදහසක්. ඒක ගල් යුගයේ අදහසක්. ඒක වැදි යුගයේ අදහසක්. එය කිසිසේත්ම කළ හැක්කක් නොවේ.

අද අවශ්‍ය වී තිබෙන්නේ කාබනික පොහොර සහ රසායනික පොහොර මිශ්‍රනයක්. පර්යේෂකයන් ඒ පිළිබඳ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳවයි අපට ප්‍රායෝගික අත් දැකීම් තිබෙන්නේ, ඒ පිළිබඳවයි අපේ රටේ ගොවි ජනතාව වැඩියෙන් දැනුවත් කළ යුතු වන්නේ. හැබැයි සිද්ධ වෙමින් තිබෙන්නේ බොරු කාබනික පොහොර මන්ත්‍රයක් මතුරන්නට පටන් ගෙන තිබීමයි. මේ තරම් හදනවා කියලා කියනවා. කොහේද ගරු සභාපතිතුමනි, එහෙම හදලා තිබෙන්නේ? ඒක මිථ්‍යාවක්. එහෙම කරන්න බැහැ. ඕනෑ නම් එහෙම කරන්න පුළුවන් මේ ආකාරයෙන්. තමන්ට වෙනත් ආදායම් ගොඩක් තිබෙනවා නම්, පාර්ලිමේන්තුවේ ඇමතිකමක් තිබෙනවා නම්, ඊට අමතරව වාහනත් තිබෙනවා නම්, ඊට අමතරව යන්ත්‍ර සූත්‍රත් තිබෙනවා නම්, විනෝදාංශයට - hobby එකට- කාබනික පොහොර කරනවා; කාබනික පොහොර යොදා වී වගා කරනවා. එහෙම විනෝදාංශයට කාබනික පොහොර යොදා වී වගා කරන අයට ඒක කරන්න පුළුවන්. හැබැයි වාණිජ කර්මාන්තයක් හැටියට, යැපුම් කෘෂි කර්මාන්තයෙන් එහා යන කර්මාන්තයක් හැටියට කාබනික පොහොර පමණක් යෙදවීම සාර්ථක වන එකක් නොවෙයි. ඒක නිකම් විනෝදාංශයට කරන්න පුළුවන්. ඒක නිකම් අත ගගා ඉන්න කරන්න පුළුවන්. ඒක නිකම් තමන්ගේ hobby එකට කරන්න පුළුවන් දෙයක්. ඒ ඇරුණු කොට ගරු

සභාපතිතුමනි, ඒක අපේ රටේ කෘෂි කර්මාන්තයේ ඉදිරි ගමනකට හිතකර පියවරක් නොවෙයි. ඒක නිසා අපි යොදවන්නට ඕනෑ එතැනට නොවෙයි. කාබනික පොහොර සහ රසායනික පොහොර සම්මිශ්‍රණයකට අපි යන්නේ කොහොමද කියන දිශාවටයි අපි අපේ පර්යේෂණ, අපේ අත්දැකීම් සහ අපේ ගොවි ජනතාව නැඹුරු කළ යුතු වන්නේ. ඒකයි ඇත්ත. ඒක තමයි කළ යුතු වන්නේ.

ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි. අනෙක් පැත්තෙන්, මේ ආණ්ඩුවෙන් පොහොර මිටිය රුපියල් 350ට දුන්නා කියලා හැම දාම කියනවා. ඔබතුමන්ලා අද ඉඳලා ඒක කියන්න එපා. මේ අය වැයෙන් පස්සේ ඒක කියන්න එපා. දැන් කියන්න, පොහොර මිටියක් රුපියල් 500යි කියලා. ඔබතුමන්ලා පොහොර මිටිය රුපියල් 350ට දීලා, රුපියල් 150ක අනිවාර්යය රක්ෂණ ගාස්තුවක් අය කරනවා. අපි ලෝක ඉතිහාසයේ කවදාකවත් එහෙම රක්ෂණ ක්‍රම දැකලා නැහැ. රක්ෂණය අය කරනවා ඉඩම් ප්‍රමාණයට; වගා කරන ප්‍රමාණයට. වගා කරන වර්ග ප්‍රමාණයට තමයි රක්ෂණ ගහන්නේ. දැන් ආණ්ඩුව අලුත් රක්ෂණ ක්‍රමයක් ගෙනෙනවා, පොහොර මිටියට රක්ෂණ ගාස්තු රුපියල් 150යි. රක්ෂණ ගහන්නේ, ගන්නා පොහොර මිටිය අනුව. රුපියල් 350ට පොහොර මිටිය ගන්න කොට අනිවාර්යය රක්ෂණ ගාස්තු රුපියල් 150යි. එතකොට පොහොර මිටියට රුපියල් 500යි.

මේ අනුව අද අපේ රටේ ගොවි ජනතාවට යෙදවුම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම කෘෂි රසායනික ද්‍රව්‍ය හා පළිබෝධ නාශකවල තිබෙන ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒවා හොඳම ප්‍රමිතියෙන් දෙනවාද, අපිට ගෙනත් තිබෙන්නේ බාල ඒවාද, ඒවා පිළිබඳව කරලා තිබෙන පර්යේෂණ මොනවාද, ඒ පිළිබඳව කරලා තිබෙන සමීක්ෂණ මොනවාද, ඒවා ගොවි ජනතාවට ලබා දෙන්නේ කොහොමද කියන එක ගැන කිසි නිනවුවක් නැහැ. බාල දේවල් ඔහේ දෝරෙ ගලා ගෙන එනවා. ඒවා පිළිබඳව කිසි පර්යේෂණයක් නැහැ. වැඩ කරන නිලධාරි මහත්වරුන්ට කොන්ද කෙළින් තියා ගෙන වැඩ කරන්න දෙන්නේ නැහැ. විවිධ බලපෑම් එනවා. තාඩන පීඩන එනවා.

ගරු සභාපතිතුමනි, අද අපේ රටේ තිබෙන්නේ රසායනික පොහොර හෝ රසායනික ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. රසායනික පොහොර සහ රසායනික ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නයක්. පොහොර කොහෙන්ද ගෙනෙන්නේ? වර්ග ගණනාවකම පොහොර සොයා ගන්න පුළුවන්. හොඳම වර්ගයේ - super එකේ- සිට කසළ ගොඩවල් දක්වා සොයා ගන්න පුළුවන්. තමුන්නාන්සේලා වැඩිපුර අපේ රටට ගෙනෙන්නේ කසළ ගොඩවල්. ඒ කසළ ගොඩවල්වල ආසනික් තිබෙන එක අරුම පුදුම දෙයක් නොවෙයි. ඒ කසළ ගොඩවල්වල විෂ ද්‍රව්‍ය තිබෙන එක අරුම පුදුම දෙයක් නොවෙයි. ලෝකයේ රසායනික පොහොරවලත් ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර තිබෙද්දී ටෙන්ඩර් මගඩි හරහා, හොරකම්, වංචා, දූෂණ හා නාස්තිය හරහා තමුන්නාන්සේලා ආනයනය කරන්නේ බාල, ප්‍රමිතියෙන් තොර, ගුණාත්මකභාවයෙන් තොර රසායනික ද්‍රව්‍ය, රසායනික පොහොර. ඒක තමයි අද ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ රටේ ගොවි ජනතාවට ඊළඟට දෙන ප්‍රශ්නය තමයි යෙදවුම් පිළිබඳ ප්‍රශ්නය. ඉඩම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ජලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. බීජ පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. යෙදවුම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට වෙළෙඳ පොළ. ගරු සභාපතිතුමනි, අද මොකක්ද තිබෙන වෙළෙඳ පොළ? ඔබතුමන්ලා දෙන්නේ සාධාරණ මිලක්ද මේ? මේක කිසි සේත්ම-

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු මන්ත්‍රීතුමා, ලෝකයේ ඕනෑම රටකට ගෙනියලා, ඕනෑම රසායනාගාරයක පරීක්ෂා කරලා මේවා ප්‍රමිතියෙන් බාලයි කියලා ඔප්පු කරලා අපට ගෙනැවිත් පෙන්වන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අනේ මට ඕනෑ නැහැ, අපේ ඇමතිතුමා. මට ඕනෑ නැහැ ඒ ගැන වැඩි විස්තර කියන්න. අපේ රතන හාමුදුරුවෝ ළඟ විමර්ශනය කරපු පත්‍රිකා වගයක් තිබෙනවා. ඒ පත්‍රිකා ටික අරගෙන බලන්න කෝ. ඔය පැත්තෙමනේ ඉන්නේ. ජේළි දෙකයි පනින්න ඕනෑ. ජේළි දෙක පැනලා මෙතැනට එන්න. අපේ රතන හාමුදුරුවන්ගෙන් ඉල්ලා ගන්න. උන්වහන්සේ මැලේසියාවේ පර්යේෂණාගාරවලට ගෙනියලා, පර්යේෂණ කරලා ගන්නා ලද ප්‍රතිඵල තිබෙනවා. ඉතින් බලන්න. තව මොකක්ද මගෙන් ඉල්ලන්නේ? මා ඒ ගැන ඊට වැඩිය යමක් කියන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මා ඒ කිව්වේ ප්‍රමිතියෙන් තොර යෙදවුම් ආනයනය නිසා ගොවි ජනතාවට තිබෙන ප්‍රශ්නයයි.

ගරු සභාපතිතුමනි, වෙළෙඳ පොළ පිළිබඳ ප්‍රශ්නයත් තිබෙනවා. අද අපේ රටේ ගොවි ජනතාව වෙළෙඳ පොළ පිළිබඳ විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි අඩුම තරමේ මේ ප්‍රශ්නයට දිගු කාලීන උත්තරයක් සොයන්න ඕනෑ. දිගු කාලීන උත්තරයක් සොයනවා නම්, අපි අපේ රටේ නිශ්චිත වගා සැලැස්මකට යා යුතුව තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව රටට අවශ්‍ය වන ද්‍රව්‍ය, කුරහන් කොච්චරද, මුං කොච්චරද, වී කොච්චරද, තිරිඟු කොච්චරද ආදී වශයෙන් අපේ නිෂ්පාදනය සකස් කරලා, ඒ සඳහා අවශ්‍ය වන ඉඩම් ප්‍රමාණය සකස් කරලා, වගා සැලැස්මක් දියත් කරන්න ඕනෑ. නමුත් අපේ රටේ කෘෂි කර්මාන්තය විසිරී තිබෙන්නේ කුඩා පවුල් ඒකක අතරයි. මහ පරිමාණ ගොවි පොළවල් අපේ රටේ නැහැ. ඒ නිසා වගා සැලැස්ම සාර්ථක කර ගන්න ටිකක් අමාරුයි. හැබැයි අපේ රටේ වගාවෙන් අඩුම තරමේ සියයට 60ක්වත් අපි දන්නා නිෂ්පාදනයක් වෙළෙඳ පොළට ගෙනෙන්න පුළුවන් නම්, අපි දැන ගෙන හදන්නේ. අපි දන්නවා, මේ මේ ප්‍රදේශවලින්, මේ මේ බිම්වලින්, මේ මේ ප්‍රමාණයෙන් සියයට 60ක් එනවා කියලා. වීවලින් මෙපමණ ප්‍රමාණයක් එනවා; අනෙක් වගාවන්ගෙන් මෙපමණ ප්‍රමාණයක් එනවා කියලා අපි දන්නවා. නිශ්චිත වගා සැලැස්මක් හදලා වෙළෙඳ පොළේ අවශ්‍යතාවන් එක්ක ගළපවමින්, ඒ අවශ්‍යතාවන්ට ගැළපෙන වගා සැලැස්මකට අප යා යුතුයි. ඒක සරල ප්‍රශ්නයක් නොවෙයි. ඒකට අපේ රටේ ගොවි ජනතාව සාමූහිකව සම්බන්ධ කර ගන්න ඕනෑ. නිෂ්පාදන සමිති හරහා ඒකාබද්ධ කරන්න ඕනෑ. තනි ගොවියාගේ නිෂ්පාදනය වෙනුවට සමිතියක නිෂ්පාදනයක් bulk එකක් හැටියට මිලදී ගන්නා සැලැස්මක් හදන්න ඕනෑ.

අද කේවල් කිරීමේ බලය තිබෙන්නේ ගොවියා අතේ නොවෙයි, මිලදී ගන්නා අතේ. ගොවියාගේ අතට කේවල් කිරීමේ බලය යන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අනෙක් හැම භාණ්ඩයකම මිල තීරණය කරන්නේ ඒ භාණ්ඩය නිෂ්පාදනය කරන කෙනා. ඔහු තමයි දන්නේ නිෂ්පාදන පිරිවැය කොච්චරද කියලා. රතිඤ්ඤා නිෂ්පාදනය කරන කෙනා රතිඤ්ඤා මිල තීරණය කරනවා. පපඩම් නිෂ්පාදනය කරන කෙනා පපඩම් මිල තීරණය කරනවා. බිස්කට් නිෂ්පාදනය කරන කෙනා බිස්කට් මිල තීරණය කරනවා. රෙදි නිෂ්පාදනය කරන කෙනා රෙදි මිල තීරණය කරනවා. ඒ විධියට හැම භාණ්ඩයකම මිල තීරණය කරන්න ඕනෑ නිෂ්පාදනය කරන

[ගරු අනුර දිසානායක මහතා]

කෙනා තමයි. ඔහු තමයි දන්නේ නිෂ්පාදන පිරිවැය. ඒ නිෂ්පාදන පිරිවැයට ඔහුගේ ලාභයත් එකතු කරලා ඔහු මිල කියනවා. හැම භාණ්ඩයකම නිෂ්පාදකයා මිල තීරණය කරන කොට කෘෂි භාණ්ඩවල විතරක් මිල තීරණය කරන්නේ මිලදී ගන්න කෙනා. ඒක අතිශයින් අසාධාරණයි. අනෙක් හැම භාණ්ඩයකම මිල තීරණය කරන්නේ හදන කෙනා. හැබැයි කෘෂි ද්‍රව්‍යවල මිල තීරණය කරන්නේ ගන්න කෙනා. මුදලාලි තමයි මිල කියන්නේ. ඇයි එහෙම වෙලා තිබෙන්නේ?

කේවල් කිරීමේ බලය අපි කොහොමද ගොවියාගේ අතට - නිෂ්පාදකයා අතට- ගන්නේ? නිෂ්පාදකයා අතට කේවල් කිරීමේ බලය ගන්න නම් තැනින් තැන විසිරී සිටින ගොවීන්, තැනින් තැන ඉන්න කුඩා ගොවි කණ්ඩායම් ඒකාබද්ධ කර නිෂ්පාදන සමිති හදන්න ඕනෑ. ගොවියාත් එක්ක මුදලාලි කේවෙල් කරන තැනට ගෙනෙන්න ඕනෑ. ගොවියා අභිමානයෙන් යුතුව තමන්ගේ යායේ පිපිඤ්ඤා නිෂ්පාදනය මෙච්චර තිබෙනවාය; අපි දෙන්නේ මේ ගණනටය කියා මුදලාලි එක්ක කේවෙල් කිරීමේ අයිතිය ගන්න ඕනෑ. ඒ නිසා මේක ඒ පැත්තට මාරු කරන්න ඕනෑ. මිල දී ගන්නා පුද්ගලයා මිල තීරණය කරනවා වෙනුවට විකුණන කෙනාට මිල තීරණය කිරීමේ බලය කොහොමද එන්නේ? ඒ නිසා තමයි ශක්තිමත් ගොවි සමිති යාන්ත්‍රණයක් අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඔවුන් තමයි මිල තීරණය කරන්නේ. ඔවුන් තමයි නිෂ්පාදන පිරිවැය දන්නේ. ඔවුන් තමයි ඉදිරි මාස හය ජීවත් වෙන්න අවශ්‍ය ප්‍රමාණය දන්නේ. ඒ නිසා ඔවුන් තමයි තීරණය කළ යුත්තේ තමන්ගේ නිෂ්පාදනයේ මිල මෙච්චරයි; කැකිරි මෙච්චරයි, පිපිඤ්ඤා මෙච්චරයි, වැටකොළු මෙච්චරයි තක්කාලි මෙච්චරයි, ලූනු මෙච්චරයි කියා. මිල තීරණය කිරීමේ අයිතිය ගොවියා අතට යන්න ඕනෑ. ඒක දිගුකාලීන වැඩක්. ඒක සරලව කරන්න පුළුවන් වැඩක් නොවෙයි. හැබැයි එතකම් මොකද කරන්න ඕනෑ? එතකම් රජය මේකට මැදිහත් වෙන්න ඕනෑ. ඒක තමයි වැදගත් වෙන්නේ. ගොවියාට තමන්ගේ අතට බලය ගන්න බැරි තාක් කල් රජය මැදිහත් වෙලා මිල තීරණය කරන්න ඕනෑ.

තමුන්නාන්සේලා වීවල මිල තීරණය කරනවා, නාඩු කිලෝවක් රුපියල් 32යි, සම්බා කිලෝවක් රුපියල් 35යි කියා. හැබැයි, බැනර් දැම්මාට වැඩක් නැහැ. ඔයිට වඩා අඩුවෙන් තමයි කිරන්නේ. කිලෝව රුපියල් 28යි, රුපියල් 30යි කිව්වාට කොහෙද ඒ ගණනට ගත්තේ? රුපියල් 22ට, රුපියල් 24ට තමයි ගත්තේ. ඒ නිසා ඒක නීතියක් නොවෙයි. ඒක තමුන්නාන්සේලාගේ බැනර්. මින්නේරිය හන්දියේ බැනර් එකක් දමනවා; තඹුත්තේගම ගොවිජන මධ්‍යස්ථානය ළඟ බැනර් එකක් දමනවා; ගලෙන්බිඳුණුවැව බැනර් එකක් දමනවා. බැනර් එකක් දමා කියනවා, වී කිලෝව රුපියල් 28යි, රුපියල් 30යි කියලා. මුදලාලිලා එහෙම ගන්නේ නැහැ. මුදලාලිලාට ගෙනෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව සම්මත කරන්න ඕනෑ, නාඩු වී කිලෝ එකක් මෙච්චරයි කියා. අපි කියනවා වී කිලෝවක් රුපියල් 40ක් කරන්න ඕනෑය කියා. වී කිලෝවක මිල රුපියල් 40ක් වුණොත් විතරයි ගොවි ජනතාවට සාධාරණ ආදායමක් ලැබෙන්නේ. හැබැයි කිලෝව රුපියල් 32යි, රුපියල් 35යි කියන එක නීතියක් බවට පත් කරන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවෙන්. නීතියක් බවට පත් කරලා කියන්න ඕනෑ, රුපියල් 32ට, රුපියල් 35ට අඩුවෙන් කිරනවා නම් දඬුවම් දෙනවාය කියා.

තමුන්නාන්සේලාට, හැම එකකටම මිල සූත්‍රයක් තිබෙනවා. ඩීසල් මිල සූත්‍රයක් තිබෙනවා; ගෑස්වලට මිල සූත්‍රයක් තිබෙනවා; කිරි පිටිවලට මිල සූත්‍රයක් තිබෙනවා. වීවලට විතරක් මිල සූත්‍රයක් නැහැ. මේ භාණ්ඩවලටත්, ගොවියාගේ නිෂ්පාදනවලටත් මිල සූත්‍රයක් හදන්න ඕනෑ. ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය, ඔවුන්ගේ ආදායම, ඔවුන්ට ලැබිය යුතු ලාභාංශය ඒකාබද්ධ කරලා මිල සූත්‍රයක් හදා වීවලට මෙච්චරයි, මෙච්චරයි කියා වාර්ෂිකව සංශෝධනය වෙන්න ඕනෑ. කන්නයෙන් කන්නයට බැරි නම් අඩු ගණනේ අවුරුද්දකට වතාවක්වත් සංශෝධනය වෙන මිල සූත්‍රයකට අපි යන්න ඕනෑ. එහෙම කරලා ඒක පාර්ලිමේන්තු නීතියක් කරන්න ඕනෑ, ඊට වඩා අඩුවෙන් කිරන්න බැහැ කියලා. අද, කිලෝව රුපියල් 32යි, රුපියල් 35යි කියලා නිකම් කිව්වාට කවුද එහෙම ගන්නේ? තමුන්නාන්සේලාට ගන්න පුළුවන් වෙන්නේ රටේ වී නිෂ්පාදනයෙන් සියයට 3ක්, 4ක් විතරයි. තමුන්නාන්සේලා හැම තිස්සේම ගන්නේ රටේ වී නිෂ්පාදනයෙන් සියයට 3යි, 4යි. ඒ නිසා සියයට 90ක් 95ක්ම ගන්නේ කවුද? මේ රටේ පෞද්ගලික අංශය. තමුන්නාන්සේලාට හස්තය මදි ඒක පාලනය කරන්න. ඒක පාලනය කරන්න මේ පාර්ලිමේන්තුව නීති සම්පාදනය කරන්න ඕනෑ.

මෙම පාර්ලිමේන්තුවේ ඕනෑ නැති නීති ඕනෑ තරම් සම්පාදනය කරනවා. ඇයි මේ පාර්ලිමේන්තුවට, බැරි රජය විසින් තීරණය කරන මිලට වඩා අඩුවෙන් වී කිරන්න බැහැ කියා නීතියක් ගෙනෙන්න. ඒක තමයි අද ගොවි ජනතාවගේ ඉල්ලීම. වී කිලෝවක් රුපියල් 40ක් කරන්නය, ඒ මිල නීතිගත කරන්නය කියා තමයි ඒ අය ඉල්ලන්නේ. ඒක නීතිගත නොකරන තාක් කල් ඒ ගොවීන්ට සාධාරණයක් ඉටු වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මොකක්ද වෙන්නේ? අපේ රටේ වීවල ආධිපත්‍යය තිබෙන්නේ ප්‍රධාන මෝල් හිමියන් දෙදෙනෙක් අතේයි. ඔවුන් අපේ රටේ වී නිෂ්පාදනයෙන් සියයට 45කට වැඩි ප්‍රමාණයක් ගන්නවා. ආණ්ඩුව සියයට 3ක් ගන්නකොට අපේ රටේ ප්‍රධාන වී මෝල් හිමියන් දෙදෙනෙක් නිෂ්පාදනයෙන් සියයට 45ක් ගන්නවා. ඔවුන් තමයි අද අපේ රටේ වී මිල තීරණය කිරීමේ නැංගුරම බවට පත් වෙලා තිබෙන්නේ. ඔවුන් තමයි මිල තීරණය කරන්නේ. ගරු සභාපතිතුමනි, ඔවුන් කරන්නේ මුල් කාලයේදී වෙළෙඳ පොළ අත් හැරලා තියනවා. ඊටපසුව වෙළෙඳ පොළ කඩා වැටෙන්න අරිනවා. ඊළඟට කඩා වැටෙන වෙළෙඳ පොළට ගිහිල්ලා මිල දී ගන්නවා.

අද කුඩා මෝල් හිමියන් මුළුමනින්ම කඩා වට්ටලයි තිබෙන්නේ. සුළු හා මධ්‍යම පරිමාණයේ මෝල් හිමියන්ගේ පැවැත්ම මුළුමනින්ම නැති කරලායි තිබෙන්නේ. ඔවුන් තමන්ගේ මෝල් බැංකුවලට උගස් තියලා ඒ ව්‍යාපාර කඩා වැටිලයි තිබෙන්නේ. ඒ නිසා මහා පරිමාණ මෝල් හිමියන් කිහිප දෙනෙක් අතේ වී මිල මුළුමනින්ම රඳා පවතිනවා. ඒ නිසා ඔවුන් තමයි අද වී මිල තීරණය කිරීමේ නැංගුරම බවට පත් වෙලා තිබෙන්නේ. ඔවුන්ගේ අතින් කොහොමද මේක ගොවියාගේ අතට ගන්නේ? ගොවියාගේ අතට ගන්න බැරි නම් අපි කියන්නේ අඩු ගණනේ ආණ්ඩුව අතට ගන්නය කියායි. වී මිල තීරණය කිරීමේ අයිතිය ආණ්ඩුව අතට ගන්න. මේ පෞද්ගලික මුදලාලිලා දෙදෙනා කොහොමද මේක කරන්නේ? කන්නයක් ඉවර වුණාම ඊළඟ කන්නය එනකම් බොහොම අමාරුවෙන් තමයි ගොවියෙක් ජීවත් වෙන්නේ.

කන්නයක් ඉවර වුණාම ප්‍රධාන මෝල් හිමියන් හෝටලයක් ගහනවා; කන්නයක් ඉවර වෙනකොට ඕස්ට්‍රේලියාවෙන් ඇපල් වත්තක් ගන්නවා; කන්නයක් ඉවර වෙනකොට වාහන දෙක තුනක් ගන්නවා; එහෙම නැත්නම් ලොකු මෝලක් දමනවා. කොහොමද එහෙම වෙන්නේ? ඇයි අපේ රටේ ගොවියාගේ නිෂ්පාදනය මෝල් හිමියන් තුන් හතර දෙනෙක් ඩැහැ ගන්නවා. ඒ හින්දා අපේ රටේ වී ගොවීන් මේ රටේ ප්‍රධාන මෝල් හිමියන් තුන් හතර දෙනෙකුගේ ග්‍රහණයට නතු වෙලායි තිබෙන්නේ. තමුන්නාන්සේලා තවමත් ධෛර්යවත් වෙලා නැහැ, මෝල් හිමියන් තුන් හතර දෙනෙකුගේ ග්‍රහණයට නතු වෙලා තිබෙන වී

ගොවියා ඔවුන්ගෙන් මුදා ගන්න. තුනෙන් දෙකක බලයක් තිබෙනවාය; ප්‍රභාකරන් පරාජයට පත් කළාය; මේ රටේ ඕනෑම දෙයක් කරන්න පුළුවන් බලයක් තිබෙනවාය කියා තමුන්නාන්සේලා කියනවා. හැබැයි තමුන්නාන්සේලාට තවමත් බැරි වෙලා තිබෙනවා, වී මිල තීරණය කිරීමේ බලය මෝල් හිමියන්ගේ අතින් වී ගොවියාගේ අයිතිය අතට ගන්න, එහෙම නැත්නම් අඩු ගණනේ ආණ්ඩුව අතට හෝ ගන්න. තවමත් එහෙම කරලා නැහැ.

අද විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, අළෙවිය පිළිබඳව. එතකොට ගොවියාට මොකක්ද ඉතුරු වෙලා තිබෙන්නේ? ඉඩම් ප්‍රශ්නයක් තිබෙනවා; වතුර ප්‍රශ්නයක් තිබෙනවා; බීජ ප්‍රශ්නයක් තිබෙනවා; යෙදවුම්වල ප්‍රශ්නයක් තිබෙනවා; අලෙවිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. කිසි දෙයක් ඉතුරු වෙලා නැහැ. කිසි දෙයක් ඉතුරු වෙලා නැති ගොවියාගේ ජීවන තත්ත්වය මොකක්ද? මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ, ගරු සභාපතිතුමනි? අප රටේ නුගත් රේඛාවෙන් පහළ බලන්න. නුගත් රේඛාවෙන් පහළ ඉන්නේ ගොවි අම්මාගේ, ගොවි තාත්තාගේ දරුවෝ. සෞඛ්‍ය අනාරක්ෂිත රේඛාවෙන් පහළ බලන්න. සෞඛ්‍ය අනාරක්ෂිත රේඛාවෙන් පහළ ඉන්නේ ගොවි අම්මාගේ, ගොවි තාත්තාගේ දරුවෝ. රක්ත හීනතාවෙන් පෙළෙන ගැබිනි මවුවරුන් බලන්න. ඒ ගොවි බිරින්දෑවරු.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එම නිසා ගරු සභාපතිතුමනි, අපේ රටේ ගොවි ජනතාවට ජීවිතයක් නැහැ. මොකක්ද ජීවිතය? යමතම් කනවා. යමතම් ජීවත් වනවා. හරිහමන් සෞඛ්‍ය සේවයක් නැහැ. හරිහමන් අධ්‍යාපනයක් නැහැ. ඔහේ ඉන්නවා. ඔහේ මැරෙනවා. කාලකණ්ණි ජීවිතයක් ගත කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ ගරු සභාවට ඇවිත් සුරංගනා කථා, මහා ලොකු පරිමාණ, මහා පරිමාණ ආදේශකයන්, මහා පරිමාණ වෙළෙඳ ව්‍යාපෘති ගැන කථා කරනවා. ඊට පෙර අපේ රටේ ගොවි ජනතාවට ජීවිතයක් ලබා දෙන්න. ඔවුන්ට ඉන්න තැනක්, ඔවුන්ට හරිහමන් ආහාර වේලක්, අධ්‍යාපනයක්, සෞඛ්‍ය සේවයක්, මානසික නිදහසක්, විනෝදාංශයක් ලබා දීම සඳහා ගොවි ජනතාවගේ ජීවිත මීට වඩා උසස් කිරීමට කටයුතු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා නතර වනවා. බොහොම ස්තුතියි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු ටී.බී. ඒකනායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[පූ. භා. 11.36]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)
ගරු සභාපතිතුමනි, අද සාකච්ඡාවට භාජනය කරන විෂය පථයන් කිහිපය ඉලක්ක කර ගනිමින් විශේෂයෙන් එක විෂයයක් කෙරෙහි පමණක් මගේ අවධානය යොමු කිරීමට කල්පනා කරනවා. විශේෂයෙන් කෘෂිකර්මයේත්, ගොවිජන සේවාවේත් මූලික ප්‍රශ්නයක් බවට පත් වී තිබෙන, වනජීවී කාර්යයේදී මතු වී තිබෙන කාරණා කිහිපයක් පිළිබඳව විතරයි මා සාකච්ඡාවට භාජනය කරන්න කල්පනා කරන්නේ. විශේෂයෙන් වන අලි ප්‍රශ්නය පිළිබඳව කියන්න ඕනෑ. බටහිර ජාතීන් ලංකාවේ කෝපි, තේ සහ රබර් වගාව ක්‍රියාත්මක කිරීමත් එක්ක වියළි කලාපයේ විතරක් නොවෙයි, තෙත් කලාපයේ පවා දීර්ඝ කාලයක් තිස්සේ අලිගහනයක් හිටපු වනාන්තර විශාල ප්‍රමාණයක් තුරන් වුණා. විශේෂයෙන් වසර 5කින් ආරම්භ කරන්න තිබුණු මහවැලි ව්‍යාපාරය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා වසර තුනකින් ආරම්භ කිරීමට කටයුතු කිරීම නිසා වනය ඉවත් කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක වුණා. උදාහරණයක් වශයෙන් ගල්ඔය, උඩවලවේ, වික්ටෝරියා, රන්ටැඹේ, මාදුරුඔය, ලුණුගම්වෙහෙර වැනි ජලාශ ආශ්‍රිත ප්‍රදේශත්, බින්තැන්න, අම්පාර ප්‍රදේශත්, ඒ වාගේම - [බාධා කිරීමක්] ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේදී ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න. එම නිසා මේ මහවැලි ව්‍යාපාරය නිසා -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. SPEAKER left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගල්ඔය මහවැලි ප්‍රදේශය ගැන නොවෙයි, වන ප්‍රදේශය ගැනයි අපි කථා කරමින් සිටියේ. මේ වන ප්‍රදේශය වල් අලින්ගෙන් ගහන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයට ඇතුළු වන්න බැරි විධියට මහවැලි ව්‍යාපාරය වශයෙන් ඒ ප්‍රදේශය නම් කළාම ඒ ප්‍රදේශයට ආදිවාසියකුටවත් යන්න බැරි වුණා. ඒ ගැන තමුන්නාන්සේලා දන්නේ නැහැ. එක පැත්තකින් එල්ටීටීඊ ප්‍රශ්නය නිසා මතු වුණු කාරණාත් එක්ක විශේෂයෙන් කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, තලෙයිමන්නාරම වැනි ප්‍රදේශවල සිටි අලිගහනය සම්පූර්ණයෙන්ම අනිකුත් ප්‍රදේශවලට සංක්‍රමණය වුණා. විශේෂයෙන් එල්ටීටීඊ තර්ජන නිසා, බෝම්බ පත්තු වීම නිසා විල්පත්තු අභය භූමි ප්‍රදේශයේ අලිගහනය සම්පූර්ණයෙන්ම අනුරාධපුරය දිස්ත්‍රික්කයට, පුත්තලම කලාපයට, ආනමඩුව ප්‍රදේශයට -වයඹ පළාතට-සේන්දු වීම ආරම්භ වුණා.

මහවැලි ව්‍යාපෘතියේ සැලසුම් හැදුවේ මේ රටේ පරිසරවේදීන්, ඒ වාගේම විවිධ විද්‍යාඥයින්. ඒ අය කැලෑ කැපීම පවා තීන්දු කළේ පියවරෙන් පියවරටයි. එසේ කළේ ලංකාවට අවශ්‍ය ප්‍රමාණයේ කැලෑ ප්‍රමාණය රැක ගැනීම සඳහාත්, වායු ගෝලය සිසිල් වීම සඳහා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම සඳහාත්ය. කැලෑ කැපීම දේශපාලන ඉලක්කයක් බවට ක්‍රියාත්මක වීම නිසා කෙටි කාලයකින් අපේ වනාන්තර විශාල වශයෙන් විනාශ වුණා. එම නිසාම වල් අලිගහනයේ සංක්‍රමණය දිගින් දිගටම සිද්ධ වුණා.

[ගරු ටී. බී. ඒකනායක මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1949.10.01වන දින වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටෙව්වේම මේ වන අලි පිළිබඳව විතරක් නොවෙයි, මේ රටේ විවිධ විෂය පථයයන් තුළ සිටින ජීවීන් පිළිබඳව කටයුතු කාරණා ක්‍රියාත්මක කරන්නයි.

ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 13ක් වනජීවී සංරක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට යොදවා තිබෙනවා. ජාතික උද්‍යාන, ස්වාභාවික රක්ෂිත, අභය භූමි, වන පිවිසුම්, දිස්ත්‍රික් මායිම් ඒ වාගේම දැඩි ස්වාභාවික රක්ෂිත මේවා සේරම එකතු කළාම ලංකාවේ මෙවැනි ස්ථාන තිබෙන්නේ 92යි. ඒ වාගේම හෙක්ටෙයාර් 983,479ක ප්‍රමාණයක් තිබෙනවා.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා අමාත්‍යවරයා වශයෙන් සිටි පසු ගිය කාලයේ  මේ පිළිබඳව විවිධ ඉල්ලීම් තිබුණු නිසාම ලංකාවේ වල් අලි ප්‍රමාණය පිළිබඳව සමීක්ෂණයක් කළා. වන අලි පිළිබඳව සමීක්ෂණය ක්‍රියාත්මක කළේ මධ්‍යස්ථාන 1,553ක දින 14ක් තුළදීයි. ඒ සංඛ්‍යා ලේඛනවලට අනුව සමස්ත අලි සංඛ්‍යාව 5,879ක් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සමීක්ෂණයේදී වාර්තා වෙලා තිබෙන්නේ ඇතුන් 122ක් පමණයි. ඒ 122 කියන්නේ සමස්ත අලි ගහනයෙන් සියයට 2යි. මේ අලි ප්‍රමාණය සැලකිල්ලට ගත්තාම අපට පෙනෙන දෙයක් තිබෙනවා. පසු ගිය කාලයේ ලංකාව පුරාම තිබෙන වනාන්තරවල හිටපු වන අලින්ට සිද්ධ වුණා, එක ප්‍රදේශයකට සංක්‍රමණය වෙන්න. ඒ සංක්‍රමණය වීම නිසා තමයි සමහර ප්‍රදේශවල අලි ගහනය වැඩි වෙලා තිබෙන්නේ.

අපි දන්නා ආකාරයට සාමාන්‍යයෙන් එක දිනයකදී වන අලියෙක් කිලෝමීටර් 20ක් විතර ඇවිදිනවා. උතුරු, නැගෙනහිර, වයඹ පළාත්වලිනුත්, අනුරාධපුර, වව්නියාව ප්‍රදේශවලිනුත්, මහවැලි වනජීවී කලාපවලිනුත්, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, දඹුල්ල වාගේ ප්‍රදේශවලිනුත් මේ අලි, මිනිස් ගැටුම් වාර්තා වෙනවා. එවැනි ගැටුම් ක්‍රියාත්මක වුණේ විවිධ ප්‍රදේශවල නිදහසේ හිටපු වන අලින්ට ඒ භූමියේ ඉන්න අවස්ථාවක් නොමැති වුණු නිසයි. 2007 සහ 2010 සමීක්ෂණ වාර්තා අනුව වෙනත් ප්‍රදේශවලට වන අලි පැමිණීමත් එක්ක මිනිස් මරණ 81කුත්, මිනිසුන්ට සිදු වුණු ශාරීරික හිංසාවල් 71කුත්, වන අලි මරණ සංඛ්‍යාව 227කුත්, දේපළ හානි සංඛ්‍යාව 1,997කුත් වාර්තා වෙලා තිබෙනවා. මේ ආකාරයේ සිදුවීම් රාශියක් සිද්ධ වුණා. ඒ නිසා  අපි කියන්නට ඕනෑ, මෙවැනි සිදුවීම් වැළැක්වීමට ක්‍රියාත්මක කරන වැඩසටහනේදී වැඩි වශයෙන් වැඩි ඉඩක් ඇති වනාන්තර ප්‍රමාණයක් වෙන් කිරීම අවශ්‍යයි කියලා. ඇත්ත වශයෙන්ම ලංකාවේ වර්ග කිලෝමීටර් 500ක් ඔබ මොබ යන්න පුළුවන් විධියේ වන පියස් ඇත්තේ 3ක් පමණයි.  එවකට හිටපු සංචාරක අමාත්‍ය ගරු කළුගල්ල මැතිතුමා, විවිධ ප්‍රදේශවලින් අනාථ වන සහ අසරණ වන අලින් ආරක්ෂා කිරීම සඳහා 1975 පෙබරවාරි 16වැනි දා  කෑගල්ල දිස්ත්‍රික්කයේ පින්නවල අලි අනාථාගාරයක් ආරම්භ කළා. මේ අලින් නඩත්තු කිරීම සඳහා විශේෂයෙන් ක්‍රමවේදයන් කිහිපයක් පසු ගිය ඉතිහාසය පුරා ක්‍රියාත්මක කළා. මේ ක්‍රමවේදයන් කොච්චර සාර්ථකද අසාර්ථකද කියන කාරණය තමයි ප්‍රධාන වශයෙන් අපට තේරුම් ගන්න සිදු වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අපි කියන්නට ඕනෑ, මේ අලින්ගේ ප්‍රහාරවලින් වගා බිම් ආරක්ෂා කිරීම සඳහා හේන් ගොවීන්, වෙනත් එළවලු වගා කරන ගොවීන්, මහවැලි ප්‍රදේශයේ ගොවීන් විවිධ ක්‍රම උපයෝගී කර ගන්නවා කියලා. අලින් එළවීම සඳහා ශබ්ද ආලෝක තරංග පාවිච්චි කිරීම, ගස් උඩට නැඟලා ගමන් කරන අලින්ට ඇසිඩ් ගැසීම කරනවා.

රැක සිට වෙඩි තැබීම, කඳන් බැඳීම, අලින් ආහාරයට ගන්නා වට්ටක්කා, පැණි කොමඩු, පැණි පුහුල් වාගේ ඒවාට වස මිශ්‍ර කිරීම, පරාල ඇණ ගහපු ලෑලි තැබීම, ගිනි බෝලවලින් ගැහීම, හක්ක පටස් වැනි පුපුරන ද්‍රව්‍ය පාවිච්චි කිරීම වාගේ දේවල් භාවිත කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍යයෙන් වල් අලියෙක් දිනකට කිලෝග්‍රෑම් 125ක් බර ආහාර ප්‍රමාණයක් ගන්නවා. ගණන් හදලා බැලුවොත් වන අලින් 5,879ට එක දිනකට කිලෝග්‍රෑම් 734,879ක් අවශ්‍යයි. දින 30කට ගණන් හැදුවොත් කිලෝග්‍රෑම් 22,046,250ක් අවශ්‍යයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, please wind up now.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. කැලේ හිටපු අලින් ගමට ආවාට පස්සේ ගස්වල පොතු, මුල්, කොළ කෑමේ ප්‍රවණතාව වෙනස් කරලා බඩ ඉරිඟු, වට්ටක්කා, පැණි කොමඩු, කැකිරි, පිපිඤ්ඤා වගේ ඒවා කනවා. පොල් ගස් විනාශ කරනවා. මේකට ප්‍රධාන වශයෙන් හේතු වුණා විශේෂයෙන් අලියාගේ ඇඟේ තිබෙන ලුණු ද්‍රාවණය. අපේ ශරීරවලටත්  ලුණු ප්‍රමාණයක් අවශ්‍යයි. අලියාට අවශ්‍ය ලුණු ද්‍රාවණය ලබා ගැනීම සඳහා ගස් වර්ග තිබුණා. එකක් තමයි ලුණුවරණ ගහ. ලුණුවරණ ගහ අපේ කැලෙන් අයින් වුණා. ඒ වාගේම, පොල් පිතිවල ලුණු තිබෙනවා. අලින්ට හැම දාම පොල් පිති කන්න හම්බ වෙන්නේ නැහැ. අපි දන්නවා පනාමුරේ ඇත් ගාල එම ස්ථානයේ පටන් ගත් හේතුව. ඒ ඇත් ගාල සමීපයේ උල්පතක් තිබුණා. ඒ උල්පත ලුණු සහිතයි. ඒ ලුණු සහිත උල්පත ඒකාබද්ධ කර ගනිමින් තමයි ඒ ඇත් ගාල ආරම්භ කරන්න කටයුතු කළේ. ඒ නිසා මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු ඇමතිතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් විනාඩියක් දෙන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
විනාඩියක් දුන්නා.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විශේෂයෙන් කථා කරන්න ඕනෑ හීලෑ අලි සම්බන්ධයෙන්. ලංකාවේ හීලෑ අලි ඉන්නේ 100කට ආසන්න ප්‍රමාණයක්. වල් අලි පහර දීම් පිළිබඳ- [බාධා කිරීමක්] තවම ගණනයක් කළේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අලි තෙමෙනවා කියලා දෙයක් තිබෙනවා. අලියාගේ heat එක වැඩි වෙන කාලයක් තිබෙනවා. ඒ නිසා හීලෑ අලි ඒ කාලයට ගස්වල බැඳලා තියාගෙන ඉන්නවා. නමුත් කැලේ ඉන්න අලි සම්බන්ධයෙන් එවැනි ක්‍රමයක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මද කිපෙනවා.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ඔව්, මද කිපෙනවා කියලාත් කියනවා; කම්මුල් තෙමෙනවා කියලාත් කියනවා. ඒ කාලයට උන් තනි වෙනවා. ඌට කියනවා තනි අලියා කියලා. ඌ තමාට හම්බ වෙන අයට පහර දෙනවා; ගෙවල් කඩනවා; නොයෙකුත් විනාශයන් කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Now, please now wind up. It is difficult to give you anymore time.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අලුත් ක්‍රමවේද කීපයක් සහ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳ කාරණයේදී විශේෂයෙන්-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
The Hon. Sajith Premadasa, please.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, මගේ වෙලාව ගන්න එපා. සමා වෙන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි- [බාධා කිරීමක්]

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මේ පිළිබඳ යෝජනා රාශියක් ක්‍රියාත්මක කරන්න- [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාගෙන් ඒ කාලය ගන්න. [බාධා කිරීමක්] මගෙන් ගන්න බැහැ ඒ කාලය.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
වැඩ කටයුතු රාශියක් ක්‍රියාත්මක කරන්න-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ mike එක off කරන්න. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මගේ නම දැන් කියන්න. එතකොට දැනුයි මගේ වෙලාව පටන් ගන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තිබෙන වෙලාව පොඩ්ඩක් කියන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
You have 25 minutes.

[පූ. භා. 11.49]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද වන විට මේ රටේ ගොවි ජනතාවට බලපාන බරපතළම ප්‍රශ්නය තමයි, පොරොන්දු වූ ආකාරයට ගොවි විශ්‍රාම වැටුප ලබා දීම මේ ආණ්ඩුව මග හැර යෑම, මේ ආණ්ඩුව ගොවි විශ්‍රාම වැටුප ක්‍රියාත්මක නොකිරීම.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් ගොවි විශ්‍රාම වැටුප ගැන කථා කරන කොට මම බලාපොරොත්තු වෙනවා, ඒ ඒ ඇමතිවරු ඒ ඒ වකවානුවල ගොවි විශ්‍රාම වැටුප ගැන කරපු ප්‍රකාශ -හැන්සාඩ් වාර්තාවල අඩංගු ප්‍රකාශ- මේ සභාවට ඉදිරිපත් කරන්න. අපේ ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා කරපු ප්‍රකාශයක් සඳහන් වෙලා තිබෙනවා 2011 මැයි 06වැනි දා හැන්සාඩ් වාර්තාවේ. එතුමා මෙසේ ප්‍රකාශ කර තිබෙනවා:

> "මේ නව විශ්‍රාම වැටුප් ක්‍රමය ස්ථාපිත කරන තුරු ගොවි විශ්‍රාම වැටුප් ලෙස 2011 ජනවාරි සිට 2011 මාර්තු දක්වා රුපියල් මිලියන 348කට ආසන්න මුදලක් රජයේ භාණ්ඩාගාරය විසින් ගෙවලා තිබෙනවා. ඒ අනුව ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳ කිසිදු අවිනිශ්චිතතාවක් ඇති කර ගන්න අවශ්‍ය නොවන අතර, නව පනත සම්මත වීමත් සමඟ තිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමයක් මඟින් විශ්‍රාම වයසට පත් වන ගොවීන්ගේ හා අනිකුත් ස්වයං රැකියාලාභීන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට රජය කටයුතු කර තිබෙනවා."

ඒ වාගේම අපේ ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා ගොවි විශ්‍රාම වැටුප ගැන ප්‍රකාශ කරලා තිබෙන දේ 2011 නොවැම්බර් 22වැනි දා හැන්සාඩ් වාර්තාවෙන් උපුටා දක්වන්න මම කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

> "මේක දැවැන්තම වැඩසටහනක් බවට පත් වෙලා තිබෙනවා. ආණ්ඩුව හැටියට අප මේකෙන් මඟ හරින්නේ නැහැ. ගොවියා අපහසුතාවට පත් කරන්නෙත් නැහැ."

එහෙම කියලා එතුමා තව දුරටත් මෙසේ කියනවා:

> "මේ ක්‍රමය හදා ගත්තාම -වැඩිම වුණොත් තව සති දෙකක් යයි-"

මේ කියන්නේ 2011 නොවැම්බර් මාසයේදීයි. එහි තවදුරටත් එතුමා මෙසේ කියනවා:

> "මේ සියලු දෙනාටම arrears එක්ක අප විශ්‍රාම වැටුප් ලබා දෙනවාය කියන ප්‍රකාශය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි."

ඔබතුමා "බොහොම ස්තුතියි" කියනවා; ගොවියාට දෙවියන්ගේම පිහිටයි. මේ එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා කරන ලද ප්‍රකාශයක් හැන්සාඩ් වාර්තාවෙන් මම උපුටා දැක්වූයේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට පසුව එවකට මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා වන ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා ඒ විවාදයේදීම 2011 නොවැම්බර් 22 මෙසේ ප්‍රකාශ කර තිබෙනවා:

> "අපේ ඇමතිතුමා කිව්වා වාගේ ඔක්තෝබර් මාසයේ මුදල් ගෙවීම සඳහා වූ කටයුත්තට අද අපට අවස්ථාව ලැබී තිබෙනවා. තැපැල් වර්ජනය අවසන් වීමත් සමඟ ඉතාම ඉක්මනින් මේ කටයුත්තට බහින්නට අවස්ථාව ලැබී තිබෙනවා. තැපැල් කාර්යාල හරහායි

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ මුදල් ගෙවන්නේ. තැපැල් කාර්යාල හරහායි මේ මුදල ගොවීන් අතට පත් වන්නට සලස්වන්නේ. එම නිසා ඒ ප්‍රමාදය මඟ හරවා අධ්‍යක්ෂ මණ්ඩලය ඉක්මනින්ම අලුත් වැඩසටහනක් තුළින් එය ක්‍රියාත්මක කරලා ගොවීන්ගේ විශ්‍රාම වැටුප් මුදල බෙදා හැරීම සඳහා වූ කටයුත්තට අද ගමන් කරලා තිබෙනවාය කියන ටික අපි මතක් කරන්නට ඕනෑ."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙහෙම කිව්වාට කවුරුත් අමනාප වන එකක් නැහැ. අපේ කෘෂිකර්ම ඇමතිතුමා වන මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාත්, එවකට ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමා වන එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමාත්, එවකට ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාත් කරලා තිබෙන්නේ මොකක්ද? මේ උත්තරීතර සභාව සම්පූර්ණයෙන්ම නොමඟ යැවීමක් කරලා තිබෙන්නේ. මේ හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙලා තිබෙන දේ ගරු මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමාට ප්‍රතික්ෂේප කරන්නට බැහැ. [බාධා කිරීම්] මේවා අසත්‍ය කාරණා නොවෙයි. මේවා හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙලා තිබෙන කරුණුයි. මම මේ හැන්සාඩ් වාර්තාවල අදාළ කොටස් සියල්ලක්ම **සභාගත*** කරනවා. හැන්සාඩ්ගත කරනවා.

හැන්සාඩ් වාර්තාව අසත්‍යයි කියලා කියන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙන දේවල් මම කිව්වේ. [බාධා කිරීම්] අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. මේ කෘෂිකර්ම ඇමතිවරයාත්, එවකට ගොවිජන සේවා හා වනජීවී ඇමතිවරයාත්, එවකට මුදල් නියෝජ්‍ය ඇමතිවරයාත් මේ රටේ ගොවි ජනතාව අමු අමුවේම පාවා දීලා තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මම ඒකයි හැන්සාඩ් වාර්තාවෙන්ම මේ ප්‍රකාශ උපුටා ගත්තේ. තමුන්නාන්සේලා මාස හයකට ඉස්සෙල්ලා අමු, පට්ටපල් බොරු බේගල් ඇද දැම්මා. පසු ගිය පළාත් සභා මැතිවරණයේදී බොරුවට මහා උජාරුවට කිව්වා, ගොවි විශ්‍රාම වැටුප ලබා දෙනවා කියලා. එහෙනම් කෝ ගොවි විශ්‍රාම වැටුප? ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ ඉඳලා ගොවි විශ්‍රාම වැටුප ලබා දීලා නැහැ. [බාධා කිරීම්] ගරු මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමාට බොහොම අමාරුයි, ඇත්ත කථා කරන කොට. තමුන්නාන්සේට ලොකු රුදාවක් ඇති වනවා, ඇත්ත කථා කරන කොට. මේවාට සවන් දෙන්න. හැන්සාඩ් වාර්තාවේ සඳහන් වූ ඒ සියලුම කරුණු කාරණා මම සභාගත කළා; හැන්සාඩ්ගත කළා. මේවා අසත්‍ය දේවල් නොවෙයි, ගරු ඇමතිතුමනි. මේවා ඇත්ත. තමුන්නාන්සේලාට බොරුව හෙළි වන කොට, තමුන්නාන්සේලාගේ නිරුවත හෙළි වන කොට තමුන්නාන්සේලා හරියට අර පෙට්‍රල් ඇමූ ගැඩවිල්ලෝ වාගේ තැනින් තැන එක එක රඟපෑම් කරනවා. ඒ නිසා මේවාට සවන් දෙන්න. බොරු කරන්න එපා. තමුන්නාන්සේලාගේ නිරුවත වසා ගන්නට නම්, මේ ගොවි විශ්‍රාම වැටුප අද ඉඳලා ගොවි ජනතාවට ලබා දෙන්න කියලා තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාල වකවානුව තුළ ගාමිණී ජයසූරිය මැතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වුණා. වයස අවුරුදු 18ත්, 54ත් අතර දායක මුදල් ලබා දුන් ගොවියාට වයස අවුරුදු 59 දී, 60 දී ඒ වැඩසටහන දියත් වුණා. මේ හැම ගොවියෙකුටම ජීවිත රක්ෂණ ක්‍රමයකුත් ලබා දුන්නා. ගරු ඇමතිතුමනි, මේ ගොවි විශ්‍රාම වැටුප ලබා දෙනවා නම්, අවමය රුපියල් 1,000යි. උපරිමය රුපියල් 4166යි. පළමුවෙන් රුපියල් 200න් පටන්ගත්තේ. ඉන් පසුව සියයට 95ක රාජ්‍ය සහනාධාරයක් තුළින් තමයි මේක රුපියල් 1,000ක් සහ රුපියල් 4166ක් දක්වා වර්ධනය වුණේ. වසර 25ක් තිස්සේ මෙය ක්‍රියාත්මක වුණා. ලක්ෂ 10ක් ගොවි ජනතාව මේ ගොවි විශ්‍රාම වැටුපට දායකවෙලා තිබෙනවා. 2011 වසරේ විශ්‍රාම වැටුප් ලාභීන් 86,500ක් සිටියා. 2011 වසරේ අප්‍රේල් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ඔවුන්ට සත පහක්වත් ගෙවලා නැහැ. මාසයකට රුපියල් මිලියන 91යි -රුපියල් කෝටි 09යි- වැය වන්නේ. 2011 අප්‍රේල් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ඒ මදිපාඩුව ගෙවන්න රුපියල් මිලියන 960ක් -රුපියල් කෝටි 96ක්- වැය වනවා. මේ ආශ්චර්යමත් ආණ්ඩුව, ගොවියාට ආදරය කරන ආණ්ඩුව, ගොවියා සුරතල් කරන ආණ්ඩුව, ගොවියා රවටන ආණ්ඩුව 2011 වසරේ ගොවි විශ්‍රාම වැටුප ලබා දෙන්නේ කවදාද කියලා මා අහන්න කැමැතියි.

එපමණක් නොවෙයි, ගරු ඇමතිතුමනි. 2012 වසරේත් ගොවි විශ්‍රාම වැටුප ක්‍රියාත්මක කරලා නැහැ. 2012 වසරේ ගොවි විශ්‍රාම වැටුප වෙනුවෙන් රුපියල් මිලියන 1092ක් -රුපියල් කෝටි 109ක් - වෙන් වන්නට ඕනෑ. ඒ 2011 දී කළ බොරුව මේ 2012 වසරේ දීත් කරනවාද කියලා මා අහන්න කැමැතියි. නව ක්‍රමයක් ක්‍රියාත්මක කරනවාය කියා රජය කියනවා. බොහොම හොඳයි. ඒ නව ක්‍රමය ක්‍රියාත්මක වනතුරු තිබුණු ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි? ඒ තිබුණු ප්‍රතිලාභ ලබා නොදෙන්නේ ඇයි? මේ සල්ලි ටික ගෙන ගිහින් තිබෙන්නේ කොහේටද? මා තමුන්නාන්සේලාගෙන් එක ඉල්ලීමක් කරනවා. කරුණාකරලා කුහකකම පැත්තක දමලා, උඩඟුකම පැත්තක දමලා කටයුතු කරන්න. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, බොරුව, ප්‍රෝඩාව, මුසාව, මුළාව පැත්තක දමන්න. පළාත් සභා මැතිවරණ වේදිකාවක්, වේදිකාවක් පාසා ඔය හැම ඇමතිවරයෙකුම කිව්වා, ගොවි විශ්‍රාම වැටුප ලබා දෙනවා කියලා. තමුන්නාන්සේලා නිරුවතින් ගැඩවිල්ලන් සේ හැසිරෙන්නේ නැතිව ගොවි විශ්‍රාම වැටුප ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න. ඔබතුමන්ලාට කොන්දක් තිබෙනවා නම්, ඔබතුමන්ලාට ආත්මගරුත්වයක් තිබෙනවා නම්, අද ඉඳලාම මේක ක්‍රියාත්මක කරන්නට ඇප කැප වෙන්නය කියලා මා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කෘෂිකර්ම ඇමතිතුමා, අපේ ගොවිජන සේවා ඇමතිතුමා නොදන්නවා නම් මම මේ කරුණු කාරණා පොඩ්ඩක් වටහා දෙන්නට කැමැතියි. 2010 වසරේ අපේ රටේ ශ්‍රම බලකායේ වාර්තාවලට අනුව රැකියා නියුක්තිකයින්ගෙන් 23,67,294ක් සිටියේ අපේ රටේ ගොවි ජනතාවයි. එය රැකියා නියුක්තිකයන්ගෙන් සියයට 31.2ක් වෙනවා. ඔවුන් රටේ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය සියයට 12යි. 2011 වසරේ දී අපේ රටේ 27,08,020ක් ගොවි ජනතාව - කෘෂිකර්මාන්තයේ නියැළෙන ජනතාව- සිටිනවා. එය රැකියා නියුක්තිකයින්ගෙන් සියයට 33ක් වනවා. ඒ අය දළ දේශීය නිෂ්පාදනයට සියයට 11.2ක දායකත්වයක් ලබා දෙනවා. අඩුම ගණනේ මේ කරුණු කාරණා දිහා බලලා, ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. ගොවියා ගැන සැබෑ කැක්කුමක්, සැබෑ කරුණාවක්, ආදරයක්, දයාවක් ඔබතුමන්ලාට තිබෙනවා නම් කරුණාකරලා තමුන්නාන්සේලාගේ ආත්ම ගරුත්වය රැකෙන අන්දමට හෙට දවසේ ඉඳලා ගොවි විශ්‍රාම වැටුප් ලබා දෙන්නට කටයුතු කරන්නය කියලා මා මේ අවස්ථාවේ දී ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මේ කාරණය ගැනත් මා මේ උත්තරීතර සභාවට කියන්නට කැමැතියි. මහා ලොකුවට ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරතුමියට -[බාධා කිරීම්] විෂම පැවැත්මලු, -[බාධා කිරීම්]

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Alhaj A.H.M. Azwer, please sit down.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අබලතාවය ලු, දුබලතාවය ලු, විෂම පැවැත්ම ලු. එහෙම කියලා දෝෂාභියෝග ගෙනෙනවා. දෝෂාභියෝග ගෙනෙන්නට ඕනෑ, කෘෂිකර්ම ඇමතිවරයාට. දෝෂාභියෝග ගෙනෙන්නට ඕනෑ, ගොවිජන සේවා ඇමතිවරයාට. මේ රටේ දස ලක්ෂයක් ගොවි ජනතාව පාවා දීලා, මුළා කරලා, රවටලා කටයුතු කිරීම ගැන දෝෂාභියෝගයක් ගෙනෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අබලතාව, දුබලතාව, විෂම පැවැත්ම තිබෙන්නේ අග්‍ර විනිශ්චයකාරතුමියට නොවෙයි, කෘෂිකර්ම ඇමතිවරයාටයි, ගොවිජන සේවා හා වනජීවී ඇමතිවරයාටයි කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ තවත් බොරුවක්, තවත් වංචාවක් එළි දක්වන්නට දැන් මම බලාපොරොත්තු වෙනවා. පසු ගිය කාලයේ ඇති වූ නියං තත්ත්වය නිසා ගොවීන්ගේ ණය කපා හරිනවාය කියලා රජය පොරොන්දු වුණා. ගොවි ජනතාව ඉල්ලීමක් කළා, ඒ පොරොන්දුව වාචිකව කිව්වාට හරියන්නේ නැහැ ලිඛිතව ලබා දෙන්න කියලා. නමුත්, ලිඛිතව ලබා දෙන එක මේ රජය,-

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
Sir, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Point of Order එකක් නැහැ. Point of Order සඳහා බොරුවට අවස්ථාව ගන්න එපා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
What is your point of Order, Hon. Dissanayake?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමා මේ සභාව නොමඟ යවනවා. ණය කපා හරිනවා කියලා පොරොන්දු වෙලා නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය පළාත් සභා මැතිවරණ කාලයේ කිව්වා, ගොවියාගේ ණය කපා හරිනවා කියලා. මම ඒ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කැමැතියි. නියඟයෙන් පීඩා විඳි ගොවි ජනතාවගේ ණය කපා හරිනවා කිව්වා. නමුත් ගොවියා කිව්වා, ඔබලා වාචිකව කියන දේ විශ්වාස කරන්න බැහැ, ඒ නිසා ඒ පොරොන්දුව ලිඛිතව ලබා දෙන්න කියලා. නමුත්, මොකක්ද මේ ආණ්ඩුව කළේ? මේ ආණ්ඩුව ගොවියාගේ ණය කපා හැරියේ නැහැ. ඡන්දය කාලයේ බුරුතු පිටින් බොරු පොරොන්දු දුන්නා. මාස් කන්නයේ බිත්තර වී ටික නොමිලේ දෙන්නම් කිව්වා. රසායනික පොහොර ටික නොමිලේ දෙන්නම් කිව්වා. සී සෑමට මුදල් දෙන්නම් කිව්වා. නමුත් ඒ එකක්වත් ක්‍රියාත්මක කරන්න බැරි වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ වෙලාවේ වැදගත් ලිපියක් සභාගත කරන්නට බලාපොරොත්තු වෙනවා. පසු ගිය පළාත් සභා මැතිවරණය ක්‍රියාත්මක වුණේ සැප්තැම්බර් මාසයේ 08වැනිදා. මැතිවරණ කාලය පුරාවටම ගොවියාට පොරොන්දු වුණා ඔවුන්ගේ ණය කපා හරිනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඡන්දය තිබුණේ 08වැනි දා. 12වැනි දා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ගොවියෙකුට ආපු ලිපියක් මම **සභාගත*** කරනවා.

මොකක්ද ඒකෙන් කියන්නේ? "ඔබගේ ණය අය කර ගන්නට අපි කටයුතු කරනවා" කියලා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඡන්දය ඉවර වෙලා දින තුනකට පස්සේ, "පත්මිණී වෙලර්ස්, බුල්නෑව" ලිපිනයේ පදිංචි ඩබ්ලිව්.ජී.පී.පී. රූපසිංහ වෙත එවපු ලිපියෙන් කියනවා. ඡන්දය කාලයේ පොරොන්දු වුණා ණය ටික කපා හරිනවා කියලා. ඡන්දය අවසන් වෙලා දින තුනක් ගියේ නැහැ, ලියුම් එව්වා ණය අය කර ගැනීමට.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
What is your point of Order, Hon. Azwer?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Member is misleading the House. ඡන්දය කාලයේ ඔබතුමන්ලා මේ බොරු ඔක්කෝම කිව්වා. ජනතාව නියඟයෙන් පීඩා වින්දත් ඡන්දය දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. You carry on with your speech, Hon. Sajith Premadasa.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැතිවරණය ඉවර වෙලා දින තුනකට පස්සේ ගොවියාට එව්වා, "ණය අය කර ගන්නවා" කියන ලිපිය. මම ඒක හැන්සාඩ්ගත කළා. මේ ලිපිය පත්මිණී වෙලර්ස්, බුල්නෑව ලිපිනයේ පදිංචි ඩබ්ලිව්.ජී.පී.පී.රූපසිංහ වෙත එවලා තිබෙනවා. මම ඉතාම වග කීමෙන් කියන්නේ. [බාධා කිරීමක්] ඔච්චර කලබල වෙන්න එපා, පොඩ්ඩක් සවන් දීලා උත්තර දෙන්න. කලබල වෙන්න එපා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

බේබි බලා ගත්ත අස්වර් මහත්තයා කථා කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලජ්ජයි කියන්න, නියඟයෙන් පීඩා විඳපු ගොවි පවුලකට දුන්නේ රුපියල් 5,000ක් වැනි සොච්චමක්. ඒ රුපියල් පන්දහසේ සොච්චම ගන්නත් දින 10ක් බරපතළ ලෙස වැඩ කරන්නට ඕනෑ. කුලියට වැඩක් කළා නම් දිවා ආහාරයත් එක්ක රුපියල් 800ක්, 900ක් ලැබෙනවා. ලජ්ජයි කියන්න. රුපියල් පන්දහසේ සොච්චම් නියං සහනාධාරය ගන්නටත් දින 10ක් වැඩ කරන්නට ඕනෑ. ගොවියාගේ කර පිටින් රාජ්‍ය බලය ලබා ගත් ඇමතිවරුන් හැටියට ඔවුන්ට රුපියල් 5,000ක සොච්චමක් ලබා දෙන්න තමුන්නාන්සේලාට ලජ්ජා නැද්ද? මම ඒ ගැන අහන්න කැමැතියි.

ඒ වගේම තවත් කරුණක් කියන්නට මම මේ අවස්ථාව උපයෝගි කර ගන්නවා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ මේ ආණ්ඩුව ඉතාම කුඨ ආකාරයට ජල බද්දකුත් ක්‍රියාත්මක කරන්නට උත්සුක වුණා; සූදානම් වුණා. නමුත් ඒ පැත්තේම ඉන්න ජනතාවාදී, ජනහිතකාමී ඇමතිවරු ලොකු උද්ඝෝෂණයක් කරපු නිසාත්, මේ රටේ ප්‍රගතිශීලී විපක්ෂය විධියට එක්සත් ජාතික පක්ෂය ලොකු බලපෑමක්, බල කිරීමක් කරපු නිසාත් ඒ ජල බද්ද හකුලා ගත්තා. මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි - මම අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැහැ- 2012.11.22 "දිවයින" පත්‍රයේ තිබෙන කරුණක්.

" වාරි ඇමතිගේ ළිං බද්දට ජල ඇමතිගේ විරෝධය"

මේක බොරුද කියලා මම අහන්න කැමැතියි.

ඒ වාගේම 2012.10.23 "අද" පත්‍රයේත් මේ විධියට තිබෙනවා:

"ළිංවලට බදු ගැනීමට ඇමති දිනේෂ්ගේ විරෝධය"

මේකත් බොරුද කියලා මම අහන්න කැමැතියි. ඒ වාගේම "අයිලන්ඩ්" පත්‍රයේ මෙහෙම තිබෙනවා.

"Dinesh opposes govt.'s proposed well water tax"

ඒකත් බොරුද? මේ හැම එකම බොරුද? [බාධා කිරීම්] ඒ කියන්නේ මේ මාධ්‍යවල ලියන්නේ බොරුද? [බාධා කිරීම්] අහ ගෙන ඉන්න. මේවා අහන කොට බොහොම අමාරුයි කියලා මම දන්නවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට මම මගේ ස්තුතිය පුද කරනවා. එතුමාගේ බරපතළ බලපෑම තුළ මේ ආණ්ඩුව මේ රටේ ගොවීන්ගේ කරපිට පටවන්නට ගිය ළිං බද්ද අහෝසි වුණාය කියන එක මම මේ ගරු සභාවේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මම බලාපොරොත්තු වෙනවා වනජීවී ක්ෂේත්‍රය ගැන ගරු ඇමතිතුමාට මගේ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න. අපේ බලපෑම තුළ මාස 14කට පස්සේ ඔබතුමන්ලා වනජීවී ක්ෂේත්‍රයට අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කළා. ඒ පිළිබඳව මගේ ස්තුතිය සහ ප්‍රණාමය අපේ ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමාට මේ අවස්ථාවේ පුද කර සිටිනවා. ගරු ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා රජයක් හැටියට තීන්දුවක් අර ගෙන උඩවලව තිබෙන කඳවුර හා සමාන අලි කඳවුරක්, ඒ කියන්නේ විපතට පත් වන වන අලි පුනර්ස්ථාපනය කිරීමේ කඳවුරක් රිටිගල ප්‍රදේශයේ ස්ථාපනය කරලා තිබෙනවා. එහෙම නේද? [බාධා කිරීමක්] රිටිගල. රිටිගල.

එහෙම නේද? හැබැයි, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, මේ අලි කඳවුර, එහෙමත් නැත්නම් මේ ඇත් අතුරු සෙවන රිටිගල ප්‍රදේශයේ ස්ථාපනය කර තිබෙන්නේ කිසිම ජල පහසුකමක් නැතිවයි. කිසිම ජල පහසුකමක් නැහැ. රුපියල් කෝටි ගණන්, ප්‍රකෝටි ගණන් - මිලියන ගණන්, බිලියන ගණන්- මේ රටේ ජාතික සම්පත වැය කරලා ඇත් අතුරු සෙවනක් ස්ථාපනය කරන කොට ජල මූලාශ්‍රයක්, වැවක් ආශ්‍රිතව ඉදි කළේ නැත්තේ ඇයි ගරු ඇමතිතුමනි? අඩුම ගණනේ තමුන්නාන්සේලාට මින්නේරිය ජලාශය ආශ්‍රිතව ඒක හදන්න තිබුණා. උඩවලවේ හදලා තිබෙන්නේ ජලාශයක් ආශ්‍රිතවයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

මාදුරුඔය ජලාශය තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මාදුරු ඔය ගැන නොවෙයි මා කථා කරන්නේ. මා කථා කරන්නේ රිටිගල ගැන. හොඳයි මම කියන දේ බොරුද? මම කියන්න් බොරුද? ගරු ඇමතිතුමනි, රිටිගල ඇත් අතුරු සෙවනට වතුර ගෙන යන්නේ ජල බවුසර්වලින්. මේකයි ඇත්ත කථාව. තමුන්නාන්සේලා වැඩේ කරලා, වරද්දා ගත්තාට පස්සේ නිකම් බොරුවට මෙතැන බුරන්න එන්න එපා. තමුන්නානේස්ලා මේවා අහ ගෙන ඉගෙන ගන්න.

මම මේ ගරු සභාවේ දී ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත විය යුතු කාරණයක් තිබෙනවා. වෘක්ෂලතා ආඥාපනත උල්ලංඝනය කරලා එක් එක්කෙනාගේ ඕනෑ එපාකම් මත යාල ජාතික වනෝද්‍යානයේ විවිධ සංචාරක කුටි ක්‍රියාත්මක වුණා. ජනාධිපතිතුමා ගැන කියන කොට පොඩ්ඩක් නිශ්ශබ්දයි නේද? හොඳයි, අහගෙන ඉන්න. බොහොම ස්තුතියි. [බාධා කිරීම්] බොහොම හොඳයි. අහගෙන ඉන්න. එක එක්කෙනාගේ ඕනෑ එපාකම් මත වනජීවී බලධරයන්ගේ, වනජීවී නිලධරයන්ගේ අත්තනෝමතික ක්‍රියාදාම තුළ ක්‍රියාත්මක වුණු ඒ පෞද්ගලික සංචාරක ව්‍යාපෘති ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න නතර වුණා.

ගරු ඇමතිතුමනි, තවත් කාරණයකට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. පොඩ්ඩක් හොයලා බලන්න ඒ ගැන. උඩවලවේ ජාතික වනෝද්‍යානයේ සහ විල්පත්තු ජාතික වනෝද්‍යානයේ යම් යම් අඩු පාඩුකම්, අක්‍රමිකතා ක්‍රියාත්මක වෙනවා කියලා මට දැන ගන්නට ලැබිලා තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ අවධානය ඒ ගැන යොමු කරනවා. යාල ජාතික වනෝද්‍යානයේ පමණක් මේක තහනම් කළාට මදි. අනෙකුත් ජාතික වනෝද්‍යානවල වනජීවී හා වෘක්ෂලතා ආඥා පනත

උල්ලංඝනය කිරීමෙන් මේ කරන වැරදි ක්‍රියාව නතර කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. [බාධා කිරීමක්] මට සීමා සහිත කාලයයි තිබෙන්නේ. පොඩ්ඩක් අහ ගන්න. පොඩ්ඩක් අහ ගෙන මගෙන් ඉගෙන ගන්න. ගරු ඇමතිතුමනි, ඇයි වන අලි සංගණන වාර්තාව තවමත් එළි දක්වලා නැත්තේ? ඇයි ඒක එළි දක්වලා නැත්තේ? මොකක්ද රහස? [බාධා කිරීමක්] ඇයි හංගා ගෙන ඉන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අලි කැමැති නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකේ කර්තෘවරුන් හැටියට කිහිප දෙනෙකුගේ නම් දා ගන්න තිබෙනවා නම්, ඒ අයගේ ඒ ආශාව ක්‍රියාත්මක කරලා ඉක්මනින්ම මේ වාර්තාව එළි දක්වන්න. ඒක හංගා ගෙන ඉන්න එපා. මොකක්ද ප්‍රශ්නය? රටේ ජනතාව දැන ගන්න ඕනෑ මේ වන අලි සංගණනය තුළින් ක්‍රියාත්මක වුණ වැඩ සටහන් මොනවාද, ක්‍රියාකාරකම් මොනවාද කියලා. ඒ නිසා මම ඔබතුමාට අවසාන වශයෙන් යෝජනාවක් කරන්නට කැමැතියි. අපේ රටේ වන අලි සම්පත උපයෝගී කර ගෙන අපේ රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගන්නට පුළුවන්. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේක වැදගත් point එකක්. කරුණාකරලා අප්‍රිකාවට ගිහින් බලන්න, ඉන්දියාවට ගිහින් බලන්න. වන සම්පත උපයෝගී කර ගෙන කෝටි ප්‍රකෝටි ගණනින් මේ රටට ඩොලර් ආදායම ලබා ගන්න පුළුවන්කම තිබියදී, අපි මේ වන සම්පත උපයෝගී කර ගෙන වන සම්පත කේන්ද්‍ර කර ගත් සංචාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. මම අඩුම තරමින් බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Thank you very much. The next speaker is the Hon. (Ven.) Athuraliye Rathana Thero. - [බාධා කිරීම්] එහා පැත්තේ time එක තමයි දුන්නේ. ඔබතුමන්ලාගේ time නොවෙයි. [බාධා කිරීම්] Do not worry. - [බාධා කිරීම්] ඒක මම දන්නවා. Hon. (Ven.) Athuraliye Rathana Thero, you can start your speech now.

[අ. භා. 12.12]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දිනයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මෙහිදී මගේ අවධානය මම පළමුවෙන්ම යොමු කරන්නට කැමැතියි අද ලංකාවේ උද්ගත වෙලා තිබෙන වර්තමාන තත්ත්වය පිළිබඳව. සාමාන්‍යයෙන් ලංකාවේ මේ වන විට සිටින දියවැඩියා රෝගීන්ගේ ප්‍රමාණය සියයට 25ක් කියලා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගෙන තිබෙනවා. ඒක ප්‍රමාණය විධියට ගත්තොත් ලක්ෂ 50ක් පමණ වෙනවා. ඒ වාගේම අද රෝහල්වල ලියා පදිංචි වූ වකුගඩු රෝගීන්ගේ ප්‍රමාණය පමණක් 35,000ක් බව වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම 2011 වසර තුළ පමණක් පිළිකා රෝගීන් 189,700ක් මහරගම පිළිකා රෝහලෙන් පමණක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සා විශාල ප්‍රමාණයකට, මේ සා දරුණු තත්ත්වයකට, රෝගී තත්ත්වයකට මේ රට පත් වුණේ කොහොමද කියලා අද කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී මගේ අවධානය යොමු කරන්නට කැමැතියි. අපි විශ්වාස කරනවා විතරක් නොවෙයි අද විද්‍යාත්මකව තහවුරු කරලාත් තිබෙනවා, විශේෂයෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් අපි අතුරු වාර්තා තුනක් ලබා ගෙන තිබෙනවා. දැනට මාස කිහිපයකට කලින් තුන්වන වාර්තාව ලැබුණා. තවත් වාර්තාවක් ඉදිරියේදී ලැබෙන්නට නියමිතව තිබෙනවා. මෙහිදී ඉතාම පැහැදිලිව කියන්නට කැමැතියි, ලංකාවේ, විශේෂයෙන්ම රජ රට ප්‍රදේශයේ රෝගීන්ගේ කෙස් සහ මිය ගිය රෝගීන්ගේ වකුගඩු පරීක්ෂා කරලා තිබෙන බව. ඒ පරීක්ෂා කිරීමේදී අධික ප්‍රමාණයක් ආසනික් තිබෙන බව ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් නිශ්චිතව තහවුරු කරලා තිබෙනවා. නමුත් මේ තත්ත්වය මෙසේ තිබියදීත් තවදුරටත් මේක වසන් කිරීමේ ව්‍යායාමයක් සමාගම්වල තිබෙන බව අපි මේ සභාවට කියන්නට ඕනෑ. මේක ඉතාම බරපතළ තත්වයක්. ඒ වාගේම ඕනෑම කෙනෙකුට අන්තර්ජාලය පාවිච්චි කරලා ලෝක සෞඛ්‍ය සංවිධානයේ තොරතුරුවලින් බලන්නට පුළුවන් ආසනික්, කැඩ්මියම් සහ රසදිය තුනම පාවිච්චි වුණාට පසුව ඇති වන රෝග පිළිබඳ තත්ත්වය. එහිදී ඉතාම බරපතළ පිළිකා කාරකයක් හැටියට ආසනික් සහ කැඩ්මියම් කියන දෙකම පිළිඅරගෙන තිබෙනවා. අද පිළිකා රෝගීන්ගේ සංඛ්‍යාව 189,700ක් කියන්නේ පසු ගිය අවුරුදු 10ට සාපේක්ෂව පිළිකා රෝගීන්ගේ ප්‍රමාණයේ අතිවිශාල වර්ධනයක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහිදී නිශ්චිතවම රජ රට ප්‍රදේශයේ ලියා පදිංචි වූ වකුගඩු රෝගීන්ගේ ප්‍රමාණය 30,000 ඉක්මවලා තිබෙනවා නම්, පසු ගිය අවුරුදු 20 තුළ මිය ගිය ප්‍රමාණය 20,000 කට වැඩි නම් තවත්, හඳුනා නොගත් රෝගීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා නම්, අද රජ රට ප්‍රදේශයේ පිරිමි නැති වෙන තරමටම මේ වකුගඩු රෝගය බලවත් තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මේ පිළිබඳව මෙම ගරු සභාවේදී අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කළා. එතුමා කිව්වා, කාබනික පොහොරවලින් විතරක් ගොවිතැන් කිරීම ගල් යුගයේ අදහසක්ය කියා. මම හිතන්නේ එය මේ ලංකාව තුළ විද්වතුන් අතර සංවාදයකට භාජනය කළ යුතු මාතෘකාවක්. අද මේ ආණ්ඩුවේ නොවෙයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පුහුණු කළ සියලු නිලධාරින්ගේ ප්‍රධාන මතවාදය මෙයයි. මේ මතය තමයි ආණ්ඩුවේ මැතිඇමතිවරුන්ටත් රටටත් සම්ප්‍රේෂණය වන්නේ. මේ සඳහා තවම සම්මුතියක් නැහැ.

කොටින්ම කිව්වොත් ජනතා විමුක්ති පෙරමුණ පවා පිළිගන්නවා, විශාල වශයෙන් පොහොර භාවිතා කරන්නේ නැතුව ගොවිතැන් කරන්න බැහැයි කියා. අපේ ස්ථාවරය මෙයයි. අද ලෝකයේ පොහොර ලබා දෙන්නේ ප්‍රධාන වශයෙන්ම තෙල්වල අතුරු නිෂ්පාදනයක් හැටියට. විශේෂයෙන්ම යූරියා. ඒ තෙල් තව අවුරුදු 20කින් 30කින් ඉවර වෙනවා. උදාහරණයක් හැටියට ස්විට්සර්ලන්තය ගත්තොත්, අද ලෝකයේ ප්‍රවණතාවක් ලෙස වාණිජ කෘෂි කර්මාන්තයක් හැටියට ගොවිතැන ව්‍යාප්ත කර තිබෙනවා. ඒ වාගේම කියුබාව, විශේෂයෙන්ම සමාජවාදීන්ට ඉතා වැදගත් රටක් හැටියට ලෝකයේ පිළිගන්න තිබෙන එකම රට. අද කියුබාව තමයි ලෝකයේ කාබනික ගොවිතැනට ඉතාම ඉහළ ආදර්ශයක් තිබෙන ලෝකයේම අංක එකේ රට බවට පත් වී තිබෙන්නේ. මෙහිදී අද ලංකාවේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව පළමුවෙන්ම අපි සම්මුතියකට එළඹෙන්න ඕනෑ. මෙය අවුරුදු හතරක්ක පහක සිට ඇති වුණු තත්ත්වයක් නොවෙයි. පසු ගිය අවුරුදු 20, 30 ඇතුළත තමයි මේ තත්ත්වය ප්‍රධාන වශයෙන්

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

වර්ධනය වුණේ. අපේ බීජ ගොවිපොළවල් අපි සම්පූර්ණයෙන්ම බහුජාතික සමාගම්වලට විකිණුවා. ප්‍රතිපත්තියක් විධියට එය සම්පූර්ණයෙන්ම වැරැදියි. ඒ වාගේම අද ලංකාවේ පලිබෝධ නාශක පිළිබඳ අනතුර හෙළිදරවු කිරීමේදීත් බීජ පිළිබඳ ප්‍රශ්නය අපේ අවධානයට ගත්තොත් ඉතාම වැදගත් වෙනවා. අද අපි ආනයනය කරන බීජවල ප්‍රමාණය පමණක් ගත්තොත් බීජ වර්ග 35ක් පමණ ආනයනය කරනවා. ලූනු, අර්තාපල්, කැරට්, ගෝවා, වට්ටක්කා, මිරිස් ඇට ආදී මේ සියලුම වර්ගයේ බීජ අපි පිටරටින් ආනයනය කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සියයට 100ක්?

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
සියයට 100ක් කියන්න බැහැ. ලංකාවේත් අභිජනනය කරනවා. සියයට සියයක් කියන එක වැරැදියි. ඔබතුමාගේ සංඛ්‍යා ලේඛනය වැරැදියි. අද එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තියයි; කරුණුයි කථා කරන්නේ. එක්සත් ජාතික පක්ෂයේ "Regaining Sri Lanka" ප්‍රතිපත්තිය මොකක්ද? ලංකාවේ ගොවිතැන අසාර්ථකය, වාණිජ කෘෂි කර්මාන්තයකට යන්න ඕනෑය, වාණිජ කෘෂි කර්මාන්තයකට නොගිහින් ලංකාව දියුණු කරන්න බැරිය, ඒ නිසා වැඩි වැඩියෙන් කෘෂි යෙදවුම් යොදන ගොවිතැනක් තමයි එදා "Regaining Sri Lanka" යෝජනා කර තිබුණේ.

අද මේ ජාතික කතිකාවතේදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය අනාගතයේ වෙනස් වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ආණ්ඩුව පැත්තෙන් අරගෙන බැලුවොත්, රට පැත්තෙන් අරගෙන බැලුවොත් අද ඒකාත්මික මතවාදයක්, ජාතික මතවාදයක් රටේ සකස් වෙලා නැහැ. අද අපි ඉන්නේ ඉතාම දුෂ්කර අවධියක. රටේ විද්වතුන් යැයි කියා ගන්නා ස්ථානගත වූ ස්වල්ප දෙනෙකුත් ඒ වාගේම බහුජාතික සමාගම්වල බලපෑමත් සෑම පැත්තකටම තිබෙන බව අප විශ්වාස කරනවා. විශේෂයෙන්ම මෙවර අය වැය කථාවේදී අතිගරු ජනාධිපතිතුමා පැහැදිලි කළා, -මම ඒ ගැන ඉතාම සතුටු වෙනවා.- මේ කෘමි නාශක භාවිතාව ලංකාවේ වකුගඩු රෝගය ඇතුළු රෝගවලට හේතු කාරකයක් බව. එතුමා එය පිළිගැනීමම ආරම්භයක් හැටියට ඉතාම වැදගත් කියා මා කල්පනා කරනවා. එතුමා අය වැය කථාවේ මේ ගැන අවධානය යොමු කර තිබෙනවා.

වී කිලෝවක් රුපියල් 40කට ගන්නවා කියා තිබෙනවා. නමුත් අපේ ඉලක්කයක් තිබෙන්න ඕනෑ. පළමුවෙන්ම අපේ දැක්ම පිළිබඳව ඔළුව ශුද්ධ කරන්නේ නැතුව මේ ඇති වෙලා තිබෙන දැවැන්ත අනතුරින් අපට ගැලවෙන්න බැහැ. අද අපි පිට රටවලින් බිලියනයකට අධික බීජ ප්‍රමාණයක් ගෙන්වන්න පටන් අරගෙන තිබෙනවා. මෙය ඉතාම අනතුරුදායක තත්ත්වයක්. මේ බීජ හදලා තිබෙන්නේ අධික කෘෂි යෙදවුම් එක්ක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කියන්න කැමැතියි, ගම්පහ දිස්ත්‍රික්කයේත් ඒ වාගේම අනෙක් දිස්ත්‍රික්කවලත් අක්කර 100කට වැඩිය මාගේ පුද්ගලික මැදිහත් වීමෙන් වගා කළ බව. කිසිම කෘෂි රසායනයක් යොදන්නේ නැතුව; කිසිම වස විසක් යොදන්නේ නැතුව; කිසිම පොහොරක් යොදන්නේ නැතුව විශේෂයෙන්ම පසෙහි බැක්ටීරියා තත්ත්වය වර්ධනය කරන ක්‍රමවේදය පාවිච්චි කර ඉතාම සාර්ථක අස්වැන්නක් ලබා ගත්තා. අපි කියන්න කැමැතියි, ගම්පහ දිස්ත්‍රික්කයේ එක තැනක අක්කරයට බුසල් 152ක් වැනි ඉහළ අස්වනු ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් වුණ බව. සමස්තයක් විධියට බුසල් 80ක ප්‍රමාණයකට යන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම අනුරාධපුරය, පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවලත් ස්වල්ප වශයෙන් වගා කළා. ඉතාම සාර්ථක ප්‍රතිඵල ලබා ගත්තා. මෙවර කන්නයේදී අපේ මැදිහත් වීමෙන් පමණක් අක්කර 500කට වඩා වගා කර තිබෙනවා. කිසිම කෘමි නාශකයක් යොදන්නේ නැතුව ඒක පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා මේ අත්හදා බැලීම අපට විශාල අනතුරක්.

අප බීජ නිෂ්පාදනය කළාම, අපේ ගොවීන්ගේ ඒ නිෂ්පාදන අද ඇතැම් සමාගම් ඇවිල්ලා මිලදී ගන්නා තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එතකොට අපට බීජ ව්‍යාප්ත කරන්න බැහැ. ලංකාවේ සමාගම්වල එහෙම බලපෑමක් තිබෙනවා. මේ සමාගම් විසින් මිනී මරලා තිබෙනවා. දේශපාලනඥයන් මරලා තිබෙනවා. විද්වතුන් මරලා තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔබවහන්සේට තව විනාඩියක් තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මෙය අතිදැවැන්ත ජාවාරමක්. ඒ නිසා මේ අනතුරින් ගැලවීම සඳහා දැවැන්ත උත්සාහයක් රටට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා අපේ දේශීය බීජ අභිජනනය කරන සැලැස්මක් අපට අවශ්‍යයි. ඒ වාගේම අපේ පාරම්පරික බීජ වර්ග සංරක්ෂණය කරලා, ඒවායේ උචිත අනුචිතභාවය බලලා ඒවා තහවුරු කිරීමේ සැලැස්මක් අවශ්‍යයි. මම උදාහරණයක් කියන්නම්. අපේ ප්‍රවේණිගත බීජ වර්ග 300කට වැඩිය අද සංරක්ෂණය වෙලා තිබෙනවා. නමුත් ගොවීන් අතරට ඒවා දෙන්න අපේ බීජ ගොවි පොළවල් අද ඉතාම සීමිත ප්‍රමාණයක් තිබෙන්නේ. බහුජාතික සමාගම් එකක්වත් ඒවා ප්‍රවර්ධනය කරන්නේ නැහැ. ඔවුන් ඊට විරුද්ධවයි ඉන්නේ. ඒ නිසා මේ බීජ ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් අද අපට අවශ්‍ය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අප මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා කෘෂිකර්ම ඇමතිවරයාට. එතුමා විවිධ කණ්ඩායම්වලට ඇහුම්කන් දෙනවා. එතුමා උපදේශක කාරක සභාවක් කැඳෙව්වා. මම ඒ ගැන එතුමාට ඉතාම ස්තුතිවන්ත වෙනවා. ඒකෙදි හැම පාර්ශ්වයක්ම අදහස් දැක්වූවා. එහිදී අපට පැහැදිලි වුණු කාරණය තමයි, මේ කොම්පෝස්ට් පොහොර භාවිතය පිළිබඳව අමාත්‍යාංශයේ බොහෝ නිලධාරීන්ට, රටේ බොහෝ අයට, ඉහළ පුටුවල ඉන්න අයට තිබෙන්නේ ඉතා සීමිත දැනුමක් බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තව තත්පර කීපයක් ගන්න කැමැතියි. ඒ නිසා අප මේ පිළිබඳව ජාතික කතිකාවතක් හරහා බලපෑමක් කළ යුතුයි. එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණ හා අනික් සියලු පක්ෂවල එකමුතුවෙන් මේ දෙය කරන්න ඕනෑ. මේ මතවාදය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. අද සියලු දෙනාම කථා කරන්නේ කරුණු. ඒ නිසා වස විසෙන් තොර ගොවිතැනක් සඳහා රටේ ජාතික ප්‍රතිපත්තිය හැදෙනකම් අපේ රටේ ජනතාවට නිදහසක් නැහැ, ස්වෛරීත්වයක් නැහැ, රටේ ආරක්ෂාවක් නැහැය කියන කාරණය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 12.22]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඉතාම වැදගත් අමාත්‍යාංශ කීපයක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරනවා. අද සාකච්ඡාවට බඳුන් වන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ගැන නම් මම කථා කරන්නේ නැහැ. ඒ අමාත්‍යාංශය ධීවරයන්ටම තියනවා. මම ඒ පාප කර්මයට ගැවෙන්න කැමැති නැහැ. විශේෂයෙන්ම අපේ මිත්‍රයා, මාත් එක්ක නාලන්දේ එකට හිටියේ, අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, පළමුවෙන්ම මම මෙන්න මේ කාරණය ඔබතුමාගෙන් අහන්න කැමැතියි. අනුර දිසානායක මන්ත්‍රීතුමා ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒක තමයි, දකුණු කොරියාවත් එක්ක ගිවිසුමක් ගහලා අපේ ජාන ටික එහේ තැන්පත් කරන්න යවනවාද කියලා. ඒකට ඔබතුමාගේ කථාවේදී පැහැදිලි උත්තරයක් දෙන්න. මොකද කෘෂිකර්මයේදී ලංකාවට තිබෙන ඉතිහාසය ලෝකයේ කිසි රටකට නැහැ. ඕනෑ නම් ඉන්දියාවට ඇති. ඊටත් වඩා අපේ ඉතිහාසය පැරණියි. අපට තිබෙන්නේ ගන්නොරුව ගොවිපොළ විතරක් නොවෙයි. ඔබතුමා දන්නවා කටුනායක තිබෙන The Institute of Post Harvest Technology එක ගැන. එතැන තිබෙන National Plant Quarantine Centre එක එක්සත් ජාතික පක්ෂය කාලයේ මම කියලා තමයි එතැන හැදුවේ. ඒ නිසා අර වැනි දෙයක් කරන්න හදනවා නම් පොඩ්ඩක් හිතන්න වෙයි. එක එක්කෙනා අපේ ජාන ටික, අපේ නිෂ්පාදන ඔක්කොම පිට රටවලට විකුණලා ඉවරයි . අපට මොනවාද තිබෙන්නේ? අපට තිබෙන්නේ හපය විතරයිද? මේ ගැන ඔබතුමාගේ කථාවේදී පැහැදිලි ප්‍රකාශයක් කරන්න.

දෙවැනි කාරණය මේකයි. අද මේ තිබෙන තත්ත්වය බලන්න. අපේ ගරු පූජ්‍ය රතන හාමුදුරුවනේ, මම ඔබවහන්සේට එක දෙයක් කියන්න ඕනෑ. අපේ "Regaining Sri Lanka" කියන වැඩ පිළිවෙළේ තිබුණේ අපේ නිෂ්පාදකයා සහ ගැනුම්කරු අතර මහා පරිමාණයේ සම්බන්ධයක් ඇති කිරීම. මම ඔබවහන්සේට ඒකත් කියන්නම්. [බාධා කිරීමක්] මම මේ වැඩ කරපු මිනිහෙක්. කථා කරලා නොවෙයි, ධර්ම දේශනාවෙන් නොවෙයි, මම හිටපු දිසා ඇමති විධියට මේ කියන්නේ. [බාධා කිරීමක්] මම ඕනෑම තැනක වාද විවාදවලට එන්නම්. මගේ මේ කාලය ගන්න එපා. මම කියන එක අහගෙන ඉන්න. ඔබවහන්සේ මට පොඩ්ඩක් සවන් දෙන්න. මම ඔබවහන්සේට බාධා කළේ නැහැ. සවන් දීමයි බුදුරජාණන් වහන්සේගේ දේශනාවෙන් ඉගැන්නුවේ. ගරු ස්වාමීන් වහන්ස, අප කළ හොඳම දෙයකට නිදසුනක් තමයි මේක. මෙතුමන්ලා බොහොම ලොකුවට දැන් කථා කරනවා බඩ ඉරිඟු පිට රට පටවනවා කියලා. කවුද පටවන්නේ? ගල්ගමුවේ රාජා කියන ව්‍යාපාරිකයා. මම වාරිමාර්ග ඇමති විධියට කටයුතු කරපු කාලයේ -ඇමෙරිකාවේ නම් කුඩා ඉඩම්වල නොවෙයි අක්කර දහස් ගණන්වල මේවා වගා කරන්නේ- ඒවා වගා කර තිබෙන ස්ථානයට මාව එක්කගෙන ගියා. කාන්තාවක් එය මෙහෙය වන්නේ. අනුරාධපුරයේ, හොරොව්පතානේ තිබුණු ඒ ගම්මානයේ නම මට දැන් අමතකයි. ඒ කට්ටිය ලැස්ති කර තිබුණා මැෂින් එකකින් උඩට නගින්න. නැග්ගාම කුඩා කුඩා ඉඩම්වල බිම පේන්නේ නැහැ, හැතැප්මක් විතර එහාට බඩ ඉරිඟු යාය තමයි පේන්නේ. ඒක "One area, one product" තිබෙන concept එකක්. අර තේ,පොල්, රබර් වාගේ එතැන ක්‍රියාත්මක වෙන එකක්. තමුන්නාන්සේලා දැන් කිව්වා බඩ ඉරිඟුවලින් ස්වයංපෝෂිතයි කියලා. අනේ, අපේ හාමුදුරුවෝ සභා ගැබෙන් පිටතට වැඩියා නේ, දානෙටද දන්නේ නැහැ.

අපේ තිබුණේ පොඩි මිනිහා සහ ලොකු මිනිහා සම්බන්ධ කර නිෂ්පාදනය කරන contracts. මම දිසා ඇමතිවරයා වශයෙන් හිටපු වෙලාවේ රාජාංගනයේ ගොවි පොළවල් ඇති කරලා, මිරිස් වැනි දේවල් නිෂ්පාදනය කරලා මැද පෙරදිගට යවන්න ගිවිසුම් ඇති කරලා කටයුතු කළා. අද ඒ අය ලොකු ව්‍යාපාරිකයෝ වෙලා මේ රටේ අපනයන ක්ෂේත්‍රයේ ඉන්නවා කියන එක කියන්න ඕනෑ.

අද විශේෂයෙන් අපි කනගාටු වෙනවා, බීජ වර්ග සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය ගැන. දැන් තමුන්නාන්සේලා අවුරුදු 17ක් බලයේ හිටියා. මේ 17 වැනි අවුරුද්ද. අපිත් ඒ කාලයේ බලයේ හිටියා, අවුරුදු 17ක්. තමුන්නාන්සේලාගේ රජය යටතේ සමෘද්ධියෙනුත් මේ බීජ වර්ග දුන්නා. දැන් අලුත් නමක් දාගෙන තිබෙනවා. තමුන්නාන්සේලා බීජ පැකට් දෙනවා තමයි. හැබැයි සමීක්ෂණයකුත් කරලා බලන්න ඔය දෙන ඒවා ගැන. පොල් පැළ ලක්ෂ 10ක් දුන්නා කියලා කියනවා. ගිහිල්ලා හොඳට හොයලා බලන්න, මව් බීජ පොල් ගස්වලින් අරගෙන ද පොල් පැළ ටික තවාන් කරලා දෙන්නේ කියලා. මේක මම පැහැදිලිව දන්නා දෙයක්. තමුන්නාන්සේලාගේ ඉලක්කය සාර්ථක කරගන්න නම්, නිලධාරින් මාර්ගයෙන් හොයලා බලන්න ගොඩවල්වල තිබෙන පොල්වලින් අරගෙන පැළ කරලා තිබෙනවාද කියලා. මේකේ භයානක තත්ත්වය මා කියන්නම්. මට තිබෙනවා හොඳ අත්දැකීම් මේ සම්බන්ධයෙන්. මොකද, මම ඒ කාලයේ තැඹිලි එහෙම එක එක් කෙනාගේ ගස්වලින් කඩවා ගෙන ගිහින් හිටෙව්වා. අන්තිමට මට ඒ ඔක්කෝම ගලවන්න වුණා. මොකද ඒ? කණාටුයි. මවු බීජයේ වටිනාකම තිබෙන්නේ එතැනයි.

ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමන්ලා එක්කාසු වෙලා ඔය දිවිනැගුම ව්‍යාපෘතිය තුළින් මේ සම්බන්ධයෙන් හරි සැලසුමක් සකස් කරලා රටට හරියාකාර මවු බීජ ටිකක් නිෂ්පාදනය කරලා දෙන්න. මෙතැන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරනවා. බීජ පැකට් දෙනවා කියනවා. ඒවා ඇත්ත. නමුත් මේවායේ අභ්‍යන්තරය මොකක්ද කියලා ඕනෑ නම් මා තමුන්නාන්සේලාට පෙන්වන්න සූදානම්. මේ මා කථා කරන්නේ විවේචන කරන්න, මඩ ගහන්න නොවෙයි. මේකේ යථාර්ථයේ තිබෙන භයානකත්වය තුළයි මා මේ කථා කරන්නේ. සමහර පැළ වර්ග ඉඩම්වල තියාගෙන ඉන්නවා. නිලධාරින් ගිහිල්ලා දෙනවා. මමත් ඔය බීජ වර්ග ගෙන්වා ගෙන තිබෙනවා. මම මේ කථා කරන්නේ මේකේ තිබෙන භයානකත්වය තුළින්. අද අපි සියයට 90ක් විතර බීජ වර්ග පිට රටින් ගෙන්වනවා, අපට මෙහේ හදා ගන්න පුළුවන් දේවල්. මොකක්ද මේ අපේ රටට වෙලා තිබෙන්නේ කියලා අපි කල්පනා කරන්න ඕනෑ. අපි හැමදාම කථා කරනවා, විවේචන කරනවා. මා ඒකට කාලය වැය කරන්න කැමැති නැහැ.

අද තමුන්නාන්සේලා වී, අතුරු බෝග වැනි දේවල් ගැන කථා කරනවා. බලන්න, දැන් පැවිල්ල එනවා. ලෝකයේ කොයි රටකටත් ඒක එන්න පුළුවන්. නමුත් තමුන්නාන්සේලා යාපහුව, ගල්ගමුව පැත්ත ගත්තොත් -මා මේ කියන්නේ අත්දැකීම් තුළින්- පැවිල්ල මොන විධියට තිබුණත් ඒ පොළොවේ නොයෙකුත් බෝග වර්ග හැදෙනවා. නොයෙකුත් බෙහෙත් වර්ග හැදෙනවා. කෘෂිකර්මය කිව්වාම ගරු ඇමතිතුමනි, ධාන්‍ය වර්ග ටිකක් හදන එක විතරක් නොවෙයි ඇතුළත් වෙන්නේ. බෙහෙත් වර්ග වගා කළොත් ඒකත් ආයුර්වේදය පැත්තෙන් ක්ෂේත්‍රයට එන්න පුළුවන්. සුළු අපනයන පැත්තෙන් ක්ෂේත්‍රයට එනවා වෙන්නත් පුළුවන්. විවිධ ක්ෂේත්‍රවලට ඇතුළත් වනවා. නමුත් තමුන්නාන්සේට එක අංශයක් දීලා, තව අයට තවත් කොටස් කොටස් දැවැද්ද වාගේ දීලා බලාගෙන ඉන්න එක නොවෙයි කරන්න ඕනෑ. මේ රටේ ආර්ථිකය දියුණු කරන්න, ආර්ථික සංවර්ධනයක් ඇති කරන්න නම් මේ ක්ෂේත්‍ර ඔක්කෝම එක විධියකට සංවර්ධනය වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය දිනවල මයියොක්කා සම්බන්ධයෙන් විශේෂඥතුමියක් විසින් වැදගත් කාරණයක් සොයා ගෙන එතුමිය ලංකාවේ හැම තැනකටම ඒ තොරතුරු බෙදා හරිනවා. Website එකටත් දාලා තිබෙනවා. ඒ විශේෂඥතුමිය website එකට දාපු විස්තරයේ සඳහන් වනවා, මයියොක්කාවලින් පිළිකා රෝගය සනීප වීම ගැන. එතුමිය වෛද්‍යවරියක් විධියට,

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

ඉතාම ශ්‍රේෂ්ඨ කාන්තාවක් විධියට දේශීය දෙයක් යොදා ගෙන කරපු ඒ ප්‍රතිකාරයේ ගුණාත්මකභාවය පිළිබඳව මේකේ සඳහන් වනවා. කවුද මේ වෛද්‍යතුමිය? ආචාර්ය සින්තියා ජයසූරිය, Ear, Nose and Throat Specialist.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. Tony Greig මහත්මයා අපි ගරු කරන commentator කෙනෙක්. එතුමා වෙනුවෙන් මේ දිනවල බෝධි පූජා පැවැත් වෙනවා. ඒක බොහොම හොඳයි. මම ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාට කියනවා, එතුමාව ලංකාවට ගෙනෙන්න කියා. බෝධි පූජා කියන්නේ මහා බලවත් දෙයක්. මම භාර ගන්නවා, කටුපිල හා මයියොක්කාවලින් එතුමාගේ රෝගය සුව කර දෙන්න. අපේ ජනාධිපතිතුමාගේ සහෝදරයාත් මෙතැන ඉන්නවා. ඔබතුමන්ලාගේ අමාත්‍යාංශවල මේ සඳහා ඒකාබද්ධ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියා මා අහනවා. ඒ සඳහා අවශ්‍ය operation room එකක් තිබෙනවාද කියලා මා අහනවා. එක් එක් අංශවල අය ඔක්කෝම රේඛීය අමාත්‍යාංශය ඉදිරියේ වාඩි වෙනවාද? ආයුර්වේද අංශය වාඩි වෙනවාද, සුළු අපනයන අංශය වාඩි වෙනවාද? ඉලක්ක - target - කරලා ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමන්ලාගේ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා කියන්න. මෙන්න මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ කථාවේදී එතුමා කිව්වා, ඉන්දියාවෙන් යාපනයට උඳු ගෙනැල්ලා තිබෙනවා කියලා. බොහොම හොඳයි. නමුත් මේ සැලැස්මෙහි ගොවියාට හරි මාර්ගය පෙන්නලා නිසි පරිදි නිෂ්පාදනය කිරීම සඳහා වූ නිවැරැදි වැඩ පිළිවෙළක්, නිසි පාලනයක් තිබෙනවාද කියලා මම අහනවා. ගරු ඇමතිතුමනි, තක්කාලි මිල මේ වාරේ වැඩි වුණොත් මොකද වෙන්නේ? කල්පිටිය, යාපනය වාගේ ලංකාවේ හැම තැනම ඉන්න ඔක්කෝම ගොවියෝ තක්කාලි වගා කරනවා. ඊට පස්සේ අස්වැන්න අරගෙන දඹුල්ල වැනි වෙළඳ පොළවලට ගිහිල්ලා එහේ කුණු බක්කියට විසි කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Hon. Member, you can continue your speech after the lunch break. The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**නියෝජ්‍ය මහ ලේකම්**
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු පෙරුමාල් රාජදුරයි මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

"ගරු පෙරුමාල් රාජදුරයි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. PERUMAL RAJATHURAI *took the Chair.*

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව බාගෙට කරමින් සිටියදීයි අතරමඟ නතර කරන්න සිද්ධ වුණේ. අපේ රට කෘෂිකර්මය අතින් පමණක් නොවෙයි වැදගත් වන්නේ. මෙය මහා පුණ්‍ය භූමියක්. පුණ්‍ය භූමියක් කියන්නේ ඇයි? අඹ ගෙඩියක් කාලා ඇටය විසි කළොත්, ගස්ලබු ගෙඩියක් කාලා ඇට ටික විසි කළොත් ඒ ඇට පැළ වෙලා පලදාවත් එනවා. ඒ තරම් පුණ්‍ය භූමියක් මේක. ඉන්දියාවේ නොවෙයි, ලෝකයේ කොහේවත් නැහැ මෙවන් භූමියක්. මේ වාසනාවන්ත පුණ්‍ය භූමියේ හැම බෝගයක්ම වාගේ වැවෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට එක ආයතනයක් නැහැ. ආයතන රාශියකට කඩලා. ඒක මහා කරුමයක් වෙලා. අපේ ගමේ ඉන්න පොඩි මිනිහා තමයි මෙයින් දුක් විඳින්නේ. රට වැසියායි දුක් විඳින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටෝනි ග්‍රෙග් මැතිතුමා ගැනයි මා කියමින් සිටියේ. මමත් නාලන්දේ cricket captain වෙලා හිටපු ක්‍රීඩකයෙක්. ක්‍රීඩකයකු විධියට මම clubsවලටත් play කළා. ටෝනි ග්‍රෙග් මැතිතුමා අපේ මේ කුඩා ද්වීපයට පුදුම සහායක් දීපු කෙනෙක්. එතුමා සුවපත් වන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. බෝධි පූජා කරන එක හොඳයි. මම බය නැතිව කියනවා එතුමා සුවපත් කරන්න පුළුවන් කියලා. මා කලින් සඳහන් කළ අපේ ඒ වෛද්‍යතුමිය අද websitesවලත් තොරතුරු පළ කරමින් මඤ්ඤොක්කාවලින් පිළිකා සුවපත් කිරීම ගැන කියනවා.

ගරු සභාපතිතුමනි, මා සිතුල්පව්වේ යද්දී, විශ්‍රාම ගිය එක්තරා මහත්මයකු කියපු කථාවක් කියන්නම්. ඒ මහත්මයාට cancer එකක් හැදිලා Cancer Hospital එකට ගියා ලු. සනීප වන්නේ නැහැ කියලා Cancer Hospital එකෙන් කිව්වාලු ගෙදර යන්න කියලා. කටුපිල ගහක මල් ටිකයි, ඇට ටිකයි රිළවු කනවා දැකලා, "මමත් කොහොමත් මැරෙන එක නේ, මාත් මේවා කනවා" කියලා ඒ මහත්මයාත් ඒවා කෑවා ලු. ඒවා කාලා එතුමාට සනීප වුණා ලු. දැන් ඒ ගම්වල අයත් කටුපිල ගහ පිළිකාවට බෙහෙතක් හැටියට ගන්නවා කියලා එතුමා මට කිව්වා. ඒ කථාව අහලා මම මගේ අයටත් ඒ ගැන කියන්න පටන් ගත්තා. ඒ අය කටුපිලවලින් සනීප වුණා. අත් දැකීම් රාශියක් ලැබුණා. ඒ වාගේ තත්ත්වයට පත් වූ සෑම කෙනකුටම මම මේ ගැන කියනවා; විස්තර සහිත කඩදාසිත් බෙදනවා. මම ටෝනි ග්‍රෙග් මැතිතුමාටත් ආරාධනා කරනවා එන්න කියලා. මොකද, අප මේ වාගේ දෙයක් කරලා ජීවිතයක් බේරනවා කියන්නේ පිනක්. අපි මේ පාර්ලිමේන්තුවේදී

එතුමාට ආරාධනා කරනවා අපේ රටට එන්න කියලා. මම ඒ වගකීම භාර ගන්නවා. එතුමා සුවපත් කරන්න පුළුවන්. බෝධි පූජාවලිනුත් විශාල සහනයක් ලැබෙනවා. මේ ප්‍රතිකාර ක්‍රමය ගැනත් මම මෙතැනදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අපේ දේවල් අගය කරන්නේ නැහැ. ප්‍රශ්නය ඒකයි. අපි ඒ සත්‍යතාවෙන් ඈත් වෙලා මහ හරිනවා. හැම බෝග වර්ගයක්ම වැවෙනවා මේ පොළොවේ. අපේ හැම ගසක්ම වාගේ ඖෂධයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදිකුම්බා ගහත් හොඳ ඖෂධයක්. උතුරු මැද පළාත් සභාවේ හිටපු විපක්ෂ නායක අනුරාධනායක මැතිතුමා මට කියපු කථාවක් මා කියන්නම්. ඔහුට gastritis හැදිලා අමාරු වෙලා දොස්තර බෙහෙත් ගත්තා ලු. ගමේ වෙද මහත්තයෙක් කිව්වාලු, ඔය මොකවත් ඕනෑ නැහැ, නිදිකුම්බා ගහ අරගෙන කොළ කැඳ හදලා බොන්න කියලා. එතුමා එහෙම කරලා ඒකෙන් සනීප වුණා කියලා මට කිව්වා. මම ඒ බෙහෙත ගැන ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් කිව්වා. මගේ රියැදුරු මහත්මයෙක් ඉන්නවා. Gastritis හැදිලා එතුමාටත් හරියට අමාරු වුණා. එතුමා වතු බලන්න යනවා ඒ නිසා එතුමා වෙලාවට කන්නේ නැහැ. ඔහුට අමාරු වෙලා බෙහෙත් ගන්නකොට මම කිව්වා, පිස්සු නැතිව නිදිකුම්බා කැඳ හදා ගෙන බීලා බලන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වාස කරන්න, සුමානයක් ගියේ නැහැ, call කරලා මට පිං දුන්නා නිදිකුම්බා කොළ කැඳ හදලා බීලා සනීප වුණා කියලා. අහක තියෙන, කටු ඇනෙන නිදිකුම්බා ගහත් ඖෂධයක්. ඉතින් මේ වාගේ විශ්වකර්ම දේශීය ඖෂධ පැළෑටි යොදා ගෙන ඖෂධ නිෂ්පාදනය කරලා අපට හම්බ කරන්න පුළුවන්. නමුත් කරුමය වෙලා තිබෙන්නේ, කනගාටුවට කරුණ වෙලා තිබෙන්නේ ඒ ගැන එකඟතාවක්, අවබෝධයක්, සැලසුමක් නැතිකමයි. ආයුර්වේද දෙපාර්තමේන්තුව අසරණ වෙලා ඉන්නවා. Navinna Ayurvedic Research Institute එක අසරණ වෙලා ඉන්නවා. මේ ඔක්කෝම ඒකාබද්ධ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් කාරණයක් කියනවා. වයඹ පළාතේ හිටපු ප්‍රධාන ඇමති විධියට වග කීමක් ඇතිවයි මා මේ කාරණය කියන්නේ. ඒ කාලයේ මම දැක්කා කරපිංචාවලට විශාල ඉල්ලුමක් එන බව. අපේ නියෝජ්‍ය මහ ලේකම්තුමාගේ ගමත් නිකවැරටිය. එහේ කරපිංචා ඇති වෙන්න තිබුණා. දැන් කරපිංචා ගෙනෙන්න යන්නේ කොහේටද? අනුරාධපුරය දිහාට ගිහිල්ලායි දැන් ගෙනෙන්නේ. එදා මම කරපිංච ගම්මාන, අඹ ගම්මාන, පශු ගම්මාන, ඖෂධ ගම්මාන ආදිය ඇති කළා. අද සැලසුමක් නැතිකම නිසයි-

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)
ගොටුකොළත් හොඳයි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔව්, ගොටුකොළත් හොඳයි. ඒක තමයි මා කියන්නේ. මේ රත්තරන් පොළොවේ හැදෙන හැම දේම වාගේ බෙහෙත්. ඇයි අපි එයින් ප්‍රයෝජන ගන්නේ නැත්තේ? මිනිසුන්ට බණින එක නොවෙයි, දිවි නැඟුම ගන්න ඉඩ දෙන එක නොවෙයි කරන්න තිබෙන්නේ. සැලසුමක් පිට වගා කිරීමේ ක්‍රමයක් ඇති කරලා ගොවියාට ආදායම් මාර්ගයක් හදලා දෙන්න ඕනෑ. මම වයඹ පළාතේ ප්‍රධාන ඇමති විධියට හිටපු කාලයේ කරපු වැඩ ගැන අපේ ගරු එස්.බී. දිසානායක මැතිතුමා දන්නවා. කල්පිටියේ වැවෙනවා ඕනෑ දෙයක්. එහේ හැම දෙයම වාගේ වැවෙනවා. එදා වාරිමාර්ග ඇමති විධියට මමත්, කෘෂිකර්ම ඇමති විධියට ගරු එස්.බී. දිසානායක මැතිතුමාත් කටයුතු කළා. එදා අපි ඒ වැඩ පිළිවෙළ දියත් කළා. අපි ස්වයංපෝෂිත වුණා සහල්වලින්. අපි අතිරික්තය ප්‍රීමා එකට ගන්න කියලා බල කෙරුවා. නමුත් අද සැලසුමක් නැතිකම නිසා ගොවියාත්, නිෂ්පාදකයාත් අනාථ කිරීමයි, විනාශ කිරීමයි කනගාටුව කියලා මම මෙතැනදී කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුවේ වාර්තාව අනුව අපි බලමු දළ ජාතික නිෂ්පාදිතයේ කෘෂි කාර්මික අංශයේ දායකත්වය මොකක්ද කියලා. 2006 වර්ෂයේ සියයට 12.13යි; 1998 දී සියයට 21.1යි; 1999 දී සියයට 20.7යි; 2000 වර්ෂයේදී සියයට 19.9යි. සාමය ඇවිල්ලා තිබෙද්දීත් දැන් තිබෙන තත්ත්වය ගැන හරි කනගාටුයි. සාමය ලැබුණු 2009 වර්ෂයේ සියයට 12යි; 2010 වර්ෂයේ 11.9යි; 2011 වර්ෂයේ පැවිල්ලක් නැතිවත් සියයට 11.2යි. මේ අනුව කෘෂිකර්මය ගිලා බැස්වීමක් තමයි දකින්න තිබෙන්නේ.

ගැමි ආර්ථිකයේ සියයට 70ක් ඉන්නේ ගොවිතැන් කරන අය. මේ අයගේ ආර්ථිකය විනාශ වෙලා, අධෛර්යවත් වෙලා අද කම්කරුවෝ විධියට ඒ අය කොළඹ හැම තැනම වැඩ කරන්න යනවා. ඒකයි ගොවි ජනතාව දිරි ගැන්වීමක් අවශ්‍යයි කියන්නේ. දිවි නැඟුම දිවි නසා ගැනීමක් කරන්න එපා. එක එක්කෙනාගේ මත වාදයට දේශපාලනය කරන්න යන්න එපා. මෙතුමාත් පළාත් සභාවක සිටි කෙනෙක්. මේ රටේ පළාත් සභා නැති කරන්නට බැහැ. Thirteen plus එක ශක්තිමත් කර බලය දෙන එකයි තිබෙන්නේ. සෑහෙන කොටසක් මධ්‍යගත ක්‍රමයකින් පාලනය කරන්නට නොවෙයි ඕනෑ, විමධ්‍යගත ක්‍රමයක් ඇති කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුරුංගා ගැන බලන්න. මේ මුරුංගාවලට ජපානයෙන් විශාල ඉල්ලුමක් ආවා. අපට මුරුංගා වවලා දෙන්න කිව්වා. Institute of Post Harvest Technology එකේ අය කියනවා, එළකිරිවල ගුණය වාගේ හත් ගුණයක පෝෂ්‍යදායක බවක් මුරුංගාවල තිබෙනවාය කියා. මේ මුරුංගා කොළ powder කර බිව්වාම ඒ විධියේ පෝෂ්‍ය ගුණයක් තිබෙනවාය කියනවා. මුරුංගාවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. ඇයි මේවා ගැන බලන්නේ නැත්තේ? අපේ ජේටන්ට් ටික ඔක්කොම විකුණනවා. අපේ රටට හරි කරුමයක් වෙලා තිබෙන්නේ. අපේ රටට ආදරයක් නැද්ද කියා දේශපාලන අංශයෙනුත්, නිලධාරි මහත්වරුන්ගෙනුත් මම අහනවා.

සුළු අපනයන භෝග ගැන කතා කරමු. සුළු අපනයන භෝග කියන එක එදා තිබුණේ මාතලේ කඳුරට ප්‍රදේශවල. 1977 වර්ෂයේදී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මාව දිසා ඇමතිවරයෙකු විධියට පත් කර, first integrated rural development project එක කුරුණෑගල ඇති කළා. අපේ ප්‍රදේශවල කෝපි, ගම්මිරිස් හරියන්නේ නැහැ කියා මතයක් තිබුණා. අර project එක ආ වෙලාවේ මම කිව්වා, මේක මට ඕනෑය කියා. ඒක ගෙනාවා. මේක ගෙනැල්ලා බෝ කරලා ගම්වල පැළ බෙදා දුන්නා. අද එයින් සාර්ථකව ආදායම් ලබනවා. සාදික්කා, කරාබුනැටි, ගම්මිරිස් විතරක් නොවෙයි, එන්සාල්, වැනිලා එහෙමත් අද මගේ ඉඩමේ තිබෙනවා. අද මගේ ඉඩමේ මා පොල් වගාව අතරට තේ වගාවත් දමා තිබෙනවා. ගරු කථානායකතුමා මගේ ඉඩම බලන්න එනවාය කිව්වා. මම වගා කරපු තේ ගෙනැවිත් තිබෙනවා. එතුමාට මම දෙනවා බලන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මේ තත්ත්වය තිබෙද්දී, මාතලේ තිබුණු research station එක කඳු රටට හරි යනවාය කිව්වා. මා කිව්වා, මගේ ප්‍රදේශයට ඕනෑ කියා. අපේ දිස්ත්‍රික්කයට අර ගෙන ඒ minor crops research station එක නාරම්මල දැම්මා. මේ තත්ත්වයයි අප හිතන්න ඕනෑ. ඇයි, අප මේ විධියට හිතන්නේ නැත්තේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Please wind up now.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය හුඟාක් ගත වී තිබෙනවා. Organic fertilizer ගැන කියන්න ඕනෑ. Neem fertilizer කියා තිබෙනවා. Do you know what Neem is? That is Kohomba tree. ඉන්දියාවේ large-scale විධියට කොහොඹ ඇටවලින්, කොළවලින් Neem fertilizer කියන එක හදනවා, organic fertilizer එකක් විධියට. ගිය අවුරුද්දේ මොනරාගල මන්ත්‍රීතුමා - [බාධා කිරීම්] මා කථා කරද්දී කිව්වා, "මම ගෙනැවිත් දෙන්නම්" කියලා. ගිය සුමානෙත් ඇහුවාම අනේ ගන්නට තැනක් නැහැ කිව්වා. ලෙඩවලට පිළියමක් හැටියට මම කොහොඹ කොළ තලලා ඉසිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනමඩුවේ ගොවියෝ හතළිස් දෙනෙක් ඊයේ උසාවියට ගෙනාවා. මොනවාට ද? නඩු දාලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට නියමිත වෙලාව අවසන්.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩියක කාලයක් විතරයි ගන්නේ. ඉගිනිමිටියේ ගොවියෝ ගොවි ණය ගෙව්වේ නැත කියා ගෙනැල්ලා එතැනට දැම්මා. තව එක කරුණක් කියා මගේ කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, ඔබතුමා මට බාධා කරනවා, කථාව අවසන් කරන්නය කියා. මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. අද Lamborghini cars - [බාධා කිරීමක්] මම දන්නේ නැහැ. ලක්ෂ 600ක් යනවා ඒ car එක ගන්න. අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කියනවා, ඒක go-kart කියා; ගොන් කරත්තයක් කියා. Motor car racing කරන එක්කෙනා කියනවා ලැම්බෝගිනි නොවෙයි, මේවා racing cars කියා. පාරේ යන්න බැහැ. අද ප්‍රවෘත්තිවලට පෙන්නුවා. වාහනය ඇතුළත් පෙන්වනවා. මේ ලැම්බෝගිනි ද මොකක් ද එක දරුවන්ට වුණත් අර ගත්තාට කමක් නැහැ කියා ගරු මර්වින් සිල්වා ඇමතිතුමා කියනවා.

දැන් රුපියල් දාහේ කාසියකුත් එන්න යනවා. මම දන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුවට පිස්සු හැදිලාද කියලා. රුපියල් දාහේ කාසියක් ලංකාවේ දෙන්න යනවා. රුපියල් දාහේ කාසියක් කියන එක සාක්කුවේ දමා ගන්න පුළුවන්ද? අද මේ රුපියල් පන්සීයෙයි, රුපියල් පන්දාහෙයි වෙනසක් තිබෙනවා ද? [බාධා කිරීම්] මම මේක පෙන්වලා කථාව අවසාන කරනවා. රුපියල් දාහ ලොකුයි, ඒක ජේනවා. මේ රුපියල් පන්සියය. මේ රුපියල් පන්දාහ. පැටලෙන්නේ නැද්ද? මට ඒක වෙලා තිබෙනවා.

මිනිස්සු දන්නේ නැහැ, පන්දාහේ කොළේ. මහ බැංකුවේ උන්ට පිස්සු. මේ බලන්න, මේ පන්දාහ කොළේ පැටලෙන්නේ නැද්ද කියලා. දැන් රුපියල් දාහේ coin එකක් දෙන්න යනවා. එතකොට ගැහැනු කට්ටිය එල්ලාගෙන යන පරණ ගෝනි මල්ලක් වාගේ එකක් ගෙනෙන්න ඕනෑ. ඉතින් මේක නේ මේ ආර්ථිකයේ තිබෙන්නේ. මිලියන 1600කින් ඔය "ලබ්බෝ ගිනි" ගෙනෙන වෙලාවේ, ඒ මුදල්වලින් පොහොර ටිකක් අරගෙන දෙන්න, ගොවියාගේ වන්දි ටික ගෙවන්න, විශ්‍රාම වැටුප් ගෙවන්න බැරි ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද ඉවර කරන්නද කියන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Yes. You are taking the time of the other Hon. Members.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

Okay, then thank you, Sir.

[අ. භා. 1.12]

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව සැලසීම සම්බන්ධව මම සන්තෝෂ වනවා. විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කයේ වැඩි වශයෙන් ඉන්නේ ධීවර ජනතාවයි. ඒ වාගේම තෙල් මිල වැඩි වුණු වෙලාවේදී ධීවර රස්සාව කරන ජනතාවට සහනාධාරයක් ලබා දෙන්න කටයුතු කිරීම ගැන මම මේ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එහිදී විශේෂයෙන්ම අපේ කතෝලික සභාවේ කාර්දිනල්තුමාත්, අපේ හලාවත රදගුරුන් වහන්සේත්, මීගමුව සහ හලාවත පදවිවල වෙරළ ආශ්‍රිත දේවස්ථානවල පියතුමන්ලාත් ඒ සාකච්ඡාවට පැමිණිලා ධීවර ජනතාවට අවශ්‍ය කරන තෙල් සහනාධාරය ලබා දෙන්න කටයුතු කළා. මේ අවස්ථාවේදී අවාසනාවන්ත විධියට එක ධීවර සහෝදරයෙක් හලාවත දී ජීවිතක්ෂයට පත් වුණා. විශේෂයෙන්ම ඒකත් අපි නතර කළා නම් තමයි හොඳ. මොකද හැම කෙනාම යම් කිසි අවස්ථාවලදී මිනිසුන් උසිගැන්වීමේ කටයුතුයි කරන්නේ. නමුත් යම් කිසි මිල වැඩිවීමක් වුණා නම් ඒක සාකච්ඡා කරලා එයට අවශ්‍ය කරන විසඳුම ලබා ගන්න අපි කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඒක කරන්න පුළුවන් වන්නේ ගරු ජනාධිපතිතුමාටයි. ඒ වෙලාවේ මම ප්‍රකාශ කළේත් මේ ගැන ගරු ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා යම් කිසි පිළියමක් ධීවර ජනතාව වෙනුවෙන් අපට ලබා දෙන්න පුළුවන්ය කියලායි. ඒ අවස්ථාවේ දී ඒ ඉවසීම තවත් තිබුණා නම් අපිට මේ හදිසි මරණයත් සිදු වෙන්නේ නැහැ. එය අවාසනාවන්ත සිද්ධියක් හැටියට අපි සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශවල ධීවර ජනතාව පල්ලියත් එක්කම තමයි ඉන්නේ. ඒ අවස්ථාවේ දී කාර්දිනල් වහන්සේත්, හලාවත රදගුරුන් වහන්සේත්, ඒ ප්‍රදේශයේ පියතුමන්ලාත් එකතු වෙලා -අපි සියලු දෙනාම- ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලූ දේ අපිට ලබා දෙන්න එතුමා කටයුතු කළා. ඒ නිසා ඒ අවස්ථාවේ දී සහභාගි වුණු සියලුම දෙනාට ධීවර ජනතාව වෙනුවෙන් අපේ ස්තුතිය පිරිනමන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ධීවර ක්ෂේත්‍රයේ අද යම් යම් ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන්ම අද මාදැල් ප්‍රශ්නය තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ නාත්තණ්ඩිය ආසනයේ ඉරණවිල අද මාදැල් හිමියෝත්, බෝට්ටු හිමියෝත් අතර යම් කිසි කැළඹිල්ලක් -ප්‍රශ්නයක්- තිබෙනවා. අපේ රටේ එක කාලයකට වලාල කාලය එනවා. අපේ පැත්තේ වලාල කාලය පටන් ගන්නේ ඔක්තෝබර් මාසයේයි. අපි කියමු, 2012 ඔක්තෝබර්වල වලාල කාලය පටන් ගත්තා නම් 2013 අප්‍රේල් -පාස්කුවේදී- අවසන් වෙනවා. ඒකට දින, වර්ෂ නැහැ. කාලයක් නැහැ. නමුත් පාස්කු කාලයේ දී තමයි ඒක මේ ප්‍රදේශයෙන් නතර වෙන්නේ. ඊට පස්සේ ධීවර ජනතාව රැකියාව කරන්න නැඟෙනහිරට යනවා. නැත්නම් මන්නාරම් දිස්ත්‍රික්කයට යනවා. උතුරට යනවා. ගිහිල්ලා ඔවුන් ඒ රැකියාව කරනවා. විශේෂයෙන්ම අද මාදැලෙන් තමයි ඉතාමත්ම හොඳ මාළු, අලුත් මාළු ජනතාවට ලබා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ වාගේම අභිංසක, දුප්පත් ජනතාවට ඉතාමත්ම රසවත් මාළු හොද්දක් කන්න පුළුවන් කාලය තිබෙන්නේ මේ මාදැල් අදින කාලයටයි. පළමුවෙන්ම මේ ධීවර කර්මාන්තය මේ රටේ පටන් ගනිද්දී ලැබුණු එකක් තමයි මේ මාදැල් කර්මාන්තය කියන එක. ඊට පස්සේ තමයි බෝට්ටු ආවේ; තෙප්පම් ආවේ; ට්‍රෝලර් ආවේ. ඒවා සේරම ආවේ ඊට පස්සේ. ඒ වාගේම වලාල කාලයට ගොඩ බිමේ ඉඳලා කිලෝමීටර් භාගයක්, කිලෝමීටරයක් විතර දුරකට තමයි මේ දැල වට කරලා මාළු අල්ලන්නේ.

පොඩි පොඩි මාළු ඇතුළු හැම මාළුම, විශේෂයෙන්ම ඉතාමත්ම හොඳ හාල්මැස්සෝ ලබා ගන්න පුළුවන් වෙන්නේ මේ මාදැල්වලිනුයි. ඒ නිසා අප මාදැල් කර්මාන්තය ආරක්ෂා කර ගන්න ඕනෑ. අද මාදැලක් කරන්නත් නැඟෙනහිර පළාතෙන් තමයි මිනිසුන්ව ගෙනෙන්නේ. ඒක හොඳ කර්මාන්තයක්. ඒ වාගේම රැකියා ලැබෙන කර්මාන්තයක්. ඒ නිසා අප මාදැල් කර්මාන්තය ආරක්ෂා කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඉරණවිල තිබෙන ප්‍රශ්නය ගැන මා සඳහන් කරන්න ඕනෑ. මාදැලක් අදින ක්‍රමය ගැන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා හලාවත පොලීසියට කියලා තිබෙන්නේ වැරදි ක්‍රමයක්. එතුමා කියා තිබෙන දේ පොලීසිය තේරුම් අරගෙන තිබෙන්නේ, "මාදැල වට කරන තැනින්ම ගොඩට අදින්න ඕනෑ" කියලායි. එහෙම එකක් නැහැ. මාදැල වට කරනවා. තමුන්ට දීලා තිබෙන භූමියේ වට කරන්න ඕනෑ. ඊට පස්සේ දිය කඩ තිබෙන පැත්තට -උතුරට යන්න පුළුවන්, දකුණට යන්න පුළුවන්- ගිහිල්ලා ගොඩට අදින්න පුළුවන්. එක්කෝ අධ්‍යක්ෂ ජනරාල්තුමා කිව්ව දේ හලාවත පොලීසියට වැටහිලා නැහැ. මා පොලීසියත් එක්ක කථා කළාම ඒ අය කිව්වේ, "අධ්‍යක්ෂ ජනරාල්තුමා කිව්වේ මෙතැනින්ම ගොඩට අදින්න ඕනෑ" කියලායි. ඒක වැරදි උපදේශයක් හැටියටයි අප දකින්නේ. මාදැල් කර්මාන්තය අප ආරක්ෂා කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හිටපු ධීවර අමාත්‍ය ෆෙස්ටස් පෙරේරා මහත්මයාගේ පුතාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. සින්නපාඩුව, තොඩුවාව, මුක්කුතොඩුවාව කියන ගම්වල අද සිංහල ජනතාව වාසය කරන්නේ මෙතුමාගේ සීයා වන බේබිසික්ඤෝ මුදලාලි නිසායි. ඒ ප්‍රදේශයේ සියලු දෙනාට ඉතාමත් හොඳ ආර්ථික තත්ත්වයක් ලැබිලා තිබෙන්නේ මාදැල් කර්මාන්තය එදා තිබුණ නිසායි. අදත් ඒ ප්‍රදේශයේ මාදැල් කර්මාන්තය තිබෙනවා.

මා ධීවර ඇමතිතුමාට තව කාරණයක් සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ධීවරයෝ ට්‍රැක්ටර් දාලා මාදැල් අදින්න ගියා. ට්‍රැක්ටර් දාලා මාදැල් ඇද්දා. ඒකෙදි වෙරළට ලොකු හානියක් සිද්ධ වුණා. ඒ ක්‍රමය නතර කරන්න ධීවර ඇමතිතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා එතුමාට විශේෂ ස්තුතියක් මා පුද කරනවා. මාදැල් කර්මාන්තය ආරක්ෂා කර ගන්න එවැනි ක්‍රමවලට ඉඩ නොදී, එදා සිට පැවත ආ විධියට කරන්නත්, ඒ වාගේම නීති රීති හරියාකාරව ඉෂ්ට කරන්නත් කටයුතු කරන්න කියලා විශේෂ ඉල්ලීමක් මා මේ අවස්ථාවේදී කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ "දිවි නැඟුම" වැඩසටහන හරහා අද සුරතල් මසුන් ඇති කිරීම ස්වයං රැකියාවක් වශයෙන් කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. "දිවි නැඟුම" වැඩසටහන යටතේ ඊට අවශ්‍ය කරන පුහුණුව හා මුදල් ප්‍රතිපාදන ලබා දී තිබෙනවා. අද දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පමණක් සියයකට වැඩි පිරිසක් ඒ සම්බන්ධව කටයුතු කරනවා. විශේෂයෙන් "දිවි නැඟුම" වැඩසටහන යටතේ නව ස්වයං රැකියාවක් හැටියට අද ඒ මඟින් ගොඩ නැඟෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ අයට අවශ්‍ය කරන උපදෙස් ලබා දීලා, පුහුණුව ලබා දීලා, මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න කටයුතු කිරීම ගැන විශේෂයෙන් මේ අවස්ථාවේදී අපේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ධීවර කාර්යාලයේ ඉන්නා සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ටත්, ඒ වාගේම ධීවර අමාත්‍යාංශයේ සියලුම දෙනාටත් මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම සුරතල් මසුන් ඇති කරන අයට ලොකු ධෛර්යයක් දෙන්න ඔවුන් කටයුතු කරලා තිබෙනවා. "දිවි නැඟුම" වැඩසටහන ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ මූලිකත්වයෙන් කෙරෙන කටයුත්තක්. එහිදී විශේෂ වැඩසටහනක් හැටියට සුරතල් මසුන් ඇති කිරීම අපි හඳුන්වා දුන්නා. වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් ඒ වාගේම හලාවත, මුන්දලම, දංකොටුව කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලත් අද සුරතල් මසුන් ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙලා, ඒ ප්‍රදේශයේ අයට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මිරිදිය මාළු සම්පත අප ආරක්ෂා කරන්න ඕනෑ. පසු ගිය කාලයේ පැවැති නියඟය නිසා අපේ මිරිදිය මාළු සම්පත ටිකක් අඩු වුණා. ගරු ඇමතිතුමනි, දැන් තහනම් දැල් භාවිතයක් සිදු වෙනවා. මැදවච්චිය මැතිවරණ කොට්ඨාසයේ වාහල්කඩ කියන වැවේ අද තහනම් දැල් පාවිච්චි කරනවා. මා පසු ගිය මැතිවරණය වෙලාවේ ඒ පළාතට ගියාම ඒක දැකලා, ඒ අවස්ථාවේ හිටපු ධීවර පරීක්ෂක මහතුන්ට ඒ බව දැනුම් දුන්නා. ඒ අනුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මිරිදිය ධීවර අංශයෙන් ඒ තහනම් දැල් සම්පූර්ණයෙන්ම අත් අඩංගුවට ගන්න කටයුතු කළා. ඒ කාර්යය දිගටම කරන්න කියලා විශේෂයෙන් මා ඉල්ලනවා. මොකද, ඒ විධියේ තහනම් දැල් පාවිච්චි කිරීමෙන් මිරිදිය ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන්ම නැති වෙන්න ඉඩ තිබෙනවා.

මේ මාළු අල්ලන්න ඕනෑ අඟල් හතරට වැඩි හිඩැස් තිබෙන දැල්වලින්. ඊට අඩු හිඩැස් තිබෙන දැල්වලින් ඇල්ලුවොත් පොඩි මාළුත් අහු වෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ තහනම් දැල් සියල්ල අත්අඩංගුවට අරගෙන ඒ අයට සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා විශේෂයෙන් ඉල්ලනවා. එදා මම දැකපු දේ ධීවර අමාත්‍යාංශයට දැනුම් දුන්නාට පස්සේ ඒ ප්‍රදේශයේ තහනම් දැල්වලින් රැකියාව කළ සියලුම දෙනා අත්අඩංගුවට අරගෙන ඒ සියලුම දැල් රාජසන්තක කරන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ ගැන මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඉදිරියේදීත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

[ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා]

ඒ වාගේම අපේ ධීවරයන්ට බලපාන තවත් ප්‍රශ්නයක් ගැන ප්‍රකාශ කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ඒක ප්‍රකාශ කරන්න ඕනෑ. අවුරුද්දේ එක්තරා කාලයකදී අපේ මීගමුවේ, හලාවත ධීවරයන් නැගෙනහිර ප්‍රදේශයට යනවා. මන්නාරමට යනවා. ඒ අවස්ථාවලදී ඒ අයගේ බෝට්ටුවලට මාසයෙන් මාසයට ලැබෙන තෙල් voucher එක ඒ නැගෙනහිර ප්‍රදේශයෙන් ලබා දෙන්නත්, ඊට පසුව නැවත ගම් බිම්වලට එද්දී ඒ අයට තෙල් පහසුකම් දෙන්නත් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අද පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත් සාකච්ඡා කරනවා. ඒ ගැනත් ටිකක් කථා කරන්න ඕනෑ."දිවි නැගුම"යටතේ අද කුකුළු පැටවු ලබා දීමේ වැඩ කටයුතු සාර්ථකව කෙරීගෙන යනවා. අපේ වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ ජනතාව ඉස්සර ඉඳන්ම කර ගෙන එන දෙයක් තමයි, තමුන්ගේ ගෙදර කුකුළන් ටික දෙනෙක් ඇති කිරීම. ඒකට අත දීමක් හැටියට අද ඒ ජනතාවට කුකුළු පැටවු ලබා දීලා තිබෙනවා. අද වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ ඒ කටයුතු ඉතා සාර්ථක ලෙස කෙරීගෙන යනවා. ඒ වාගේම කිරි හරක් ලබා දීමේ වැඩසටහනත් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන ගව පැටවුන් ලබා දීමට කටයුතු කරන්න කියලා මා විශේෂයෙන් ඉල්ලනවා.

අපේ මාදැල් කර්මාන්තය ආරක්ෂා කර ගන්න ඉදිරියේදී කටයුතු කරන්න කියන විශේෂ ඉල්ලීම ඇමතිතුමාගෙන් කරනවා. ඒ වාගේම අද ඉස්සන් ව්‍යාපාරයත් ඉතාම සාර්ථක විධියට කරගෙන යනවා. කාලයකට තමයි ඉස්සන් පැටවු දමන්නේ. එහිදී harvest කරන්න ඕනෑ; වතුර අරින්න ඕනෑ. යම් කිසි කාල සීමාවක් අනුව තමයි ඒ කටයුතු කරන්නේ. ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරන්නත්, තහනම් දැල් පාවිච්චිය සම්පූර්ණයෙන්ම තහනම් කරන්නත් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, ඉදිරියේදීත් ධීවර ජනතාව වෙනුවෙන් සේවය කරන්න අවස්ථාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 1.24]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගෙන් සියයට 40කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන ගොවීන්ගේ කටයුතු දියුණු කරන්නට තිබෙන, මේ රටේ ඉතාම වැදගත් අමාත්‍යාංශයකට වත්මන් රජය අය වැයෙන් වෙන් කරලා තිබෙන මුදල දැක්කාම අපට කනගාටුයි. කෘෂිකර්ම අමාත්‍යාංශයට මේ මුළු අය වැයෙන්ම වෙන් කරලා තිබෙන්නේ සියයට 0.40යි. ගොවිජන සේවා අමාත්‍යාංශයට නම් සියයට 3.24ක් වෙන් කර තිබෙනවා.

මේ වනකොට අද මේ රට විවලින් ස්වයංපෝෂිත වුණත් කෘෂිකර්ම අංශයේ විශාල කඩා වැටීමක් තිබෙනවා. මේ රටේ දුප්පත්කම බැලුවොත්, වැඩියෙන්ම දුප්පතුන් ඉන්නේ කෘෂි කර්මාන්තයේ නියැළී සිටින ජනතාව ඉන්නා දිස්ත්‍රික්කවලයි. ලංකාවේ වැඩිම දුප්පතුන් පිරිසක් ඉන්නේ මා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේයි. අපේ දිස්ත්‍රික්කයේ දුප්පතුන් සියයට හතළිස් ගණනක් ඉන්නවා. මීට අවුරුදු 14කට ඉස්සෙල්ලා -1998 දී - මේ රටේ දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්ම අංශයෙන් ලැබුණු දායකත්වය සියයට 21.1යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 21ක් වශයෙන් තිබුණු ඒ දායකත්වය 2011 වන කොට සියයට 11 දක්වා පහළ බැහැලා තිබෙනවා. මේකෙන්ම අපට පෙනෙනවා, මේ රටේ ගොවියාගේ දුප්පත්කම වැඩි වෙලා තිබෙන බව. අද අපේ රට විවලින් ස්වයංපෝෂණය වෙලා තිබෙනවා. අපි ඒ ගැන සන්තෝෂ වනවා. නමුත් අද වී ගොවියා මොන මට්ටමකට වැටිලා තිබෙනවාද? මා ඒ ගැන තමුන්නාන්සේට කියන්නම්. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය ආණ්ඩුවේ ආයතනයක්. ඒ ගොල්ලන් කියා තිබෙනවා, පසු ගිය 2011-2012 මහ කන්නය වාරි ජලයෙන් වී වගා කළ ගොවීන්ට වී කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 23.18ක් වැය වී තිබෙන බවත්, වැසි ජලයෙන් වී ගොවිතැන් කළ අයට රුපියල් 30.55ක් වැය වී තිබෙන බවත්. මේ රටේ පසු ගිය මහ කන්නයේ අස්වැන්න ලැබෙන කොට වී කිලෝග්‍රෑම් එකක රජයේ සහතික මිල රුපියල් 28ක් වශයෙන් තිබුණත්, ගොවීන් විකුණුවේ රුපියල් 18කට හෝ රුපියල් 20කට. මට මතකයි, මගේ දිස්ත්‍රික්කයට අල්ලපු දිස්ත්‍රික්කයේ සමහර ගොවීන්ට රුපියල් 20ටත් වී විකුණා ගන්න බැරිව ගෙවල්වල ගබඩා කර ගෙන සිටි බව. රජය කියයි, දැන් මිල වැඩියි කියලා. දැන් මිල වැඩි වෙලා තිබෙන්නේ මාස් කන්නයේ නියඟයක් ආපු නිසායි.

මුදල් ඇමතිතුමා හැටියට අතිගරු ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරමින් කිව්වා, වී කිලෝග්‍රෑම් එකක සහතික මිල රුපියල් 28ක් වුණත් රුපියල් 35කට මිල දී ගන්නවාය කියලා. එසේ කිව්වාට ඒ මිලට වී මිල දී ගන්නේ නැහැ. සහතික මිල රුපියල් 28යි කියා තමුන්නාන්සේලා කිව්වත් වෙළෙඳ පොළේදී රුපියල් 20ටයි වී මිලදී ගත්තේ. ආණ්ඩුවට පුළුවන්කමක් තිබුණේ නැහැ, වී ගොවියාට සාධාරණ මිලක් දෙන්න. ඒ නිසා මේ රටේ දුප්පත්ම කොටස හැටියට, මේ රටේ ආදායම් අඩුම කොටස හැටියට අද වී ගොවියා පත් වෙලා ඉන්නවා. අපි රජයට කියනවා, මේ ගැන රජය වග කියන්න ඕනෑය කියලා.

තමුන්නාන්සේලා කියනවා, අද මේ රට විවලින් ස්වයංපෝෂණය වෙලා තිබෙනවාය කියලා. අපි ඒක පිළිගන්නවා. ඒක වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලා පොහොර සහනාධාරය දුන්නු නිසා නොවෙයි. පොහොර දුන්නු එක ගැන අපි තමුන්නාන්සේලාට ස්තුතිය ප්‍රකාශ කරනවා. වී ගොවිතැනින් මේ රට ස්වයංපෝෂණය වුණේ, එදා ඩී.එස්. සේනානායක මැතිතුමා මිනිපේ, ගල්ඔය, පොලොන්නරුවේ, අනුරාධපුරයේ අලුත් වාරි කර්මාන්ත ආරම්භ කළ නිසායි; ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත්, ගාමිණී දිසානායක මැතිතුමාත් මේ රටේ මහවැලි ව්‍යාපාරය ආරම්භ කරලා අක්කර ලක්ෂ ගණනක් අස්වද්දපු නිසායි. එම නිසා තමයි තමුන්නාන්සේලාට කියන්න පුළුවන්, මේ රට විවලින් ස්වයංපෝෂණය වෙලා තිබෙනවා කියලා. මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා මා සමඟ එකඟ වනවා ඇති, මහවැලි ව්‍යාපාරය කරද්දී එතුමාත් එක්සත් ජාතික පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයකු නිසා. එතුමා අපි බොහොම ගරු කරන ඇමතිවරයෙක්. අපේ මිත්‍ර එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමාත් ඒක පිළිගන්නවා ඇති. මා හිතන හැටියට එම කරුණු නිසායි, මේ රට විවලින් ස්වයංපෝෂණය වුණේ.

ඒ විතරක් නොවෙයි. මුදල් ඇමතිවරයා විධියට ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් කිව්වා, වියළි දේශගුණය නිසා පසු ගිය යල කන්නයේ වගා විනාශ වුණු ගොවියාගේ ණය පොලිය කපා හරිනවා කියලා. ඡන්දෙ කාලයේ නම් කිව්වේ ණය මුදලත් කපා හරිනවා කියලායි. නමුත් ඇමතිතුමනි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බැංකුවට ගියාම මේ කන්නය සඳහා ගොවියාට ණය දෙන්නේ නැහැ. ගොවියා බැංකුවට ගිහින් ණය ඉල්ලුවාම ගොවියාට ණය දෙන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ රජය ඒ සම්බන්ධයෙන් පොරොන්දුවක්

වුණා නම්, ගොවියාට මහ කන්නයේ වී ගොවිතැන් කරන්න බැංකුවෙන් ණය ගන්න අවශ්‍ය අවකාශය ලබා දෙන්න කියලා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි. අද තමුන්නාන්සේලා "අපි වවමු-රට නගමු" වැඩසටහන ක්‍රියාත්මක කරනවා. "ගම නැගුම" වැඩසටහනෙන් හෝ "ගැමි දිරිය" වැඩසටහනෙන් ඇට 50ක් විතර තිබෙන ඇට පැකට් එකක් දුන්නා. නමුත් අපේ ගොවීන්ගේ අටුවල තිබෙන්නේ ඇට පැකට් නොවෙයි, ඇට කිලෝග්‍රෑම් ගණන්, සේරු ගණන්. තමුන්නාන්සේලා 'අපි වවමු-රට නගමු' කිව්වාට මේ වාර්තාවලින් පෙනෙනවා, 2007 වර්ෂයේ පිට රටින් ගෙන්වලා තිබෙන්නේ එළවලු කිලෝග්රෑම් දහස් 12,761යි; 2010 දී 'අපි වවමු-රට නගමු' වැඩ පිළිවෙළ යටතේ ඇට බෙදලා, මල් පෝච්චිවල බටු වවලාත්, 2007 දී එළවලු කිලෝග්රෑම් දහස් 12,761ක් ලෙසට තිබුණු ඒ ප්‍රමාණය කිලෝග්රෑම් දහස් 20,994 වන තෙක් වැඩි වෙලා තිබෙනවා කියලා. අපි එහෙම නම් රජයට - තමුන්නාන්සේලාට- කියනවා, මේ ඇට පැකට් එකක් දීලා, පෝච්චිවල බටු වවලා, පෝච්චිවල තක්කාලි වවලා ගොවි නිෂ්පාදන වැඩි කරන්න බැහැයි කියලා.

ඒ විතරක් නොවෙයි, මහ බැංකු වාර්තා අනුව 2002 දී මිරිස් හෙක්ටයාර් 16,287ක වගා කරලා තිබෙනවා; 2011 වන කොට එය හෙක්ටයාර් 13,000ට බැහැලා තිබෙනවා. අපි අහනවා, 'ගම නැගුම', 'ගැමි දිරිය' වැඩසටහන්වලින් දුන්න ඇටවලින් වගා කරලා තිබෙන්නේ කොහේද කියලා. ඒ විතරක් නොවෙයි, මුං ඇට අක්කර 11,000ක් වගා කරලා තිබෙනවා. එය අක්කර 9,000ට බැහැලා තිබෙනවා. කුරක්කන් අක්කර 5,777ක් වගා කරලා තිබෙනවා. එය අක්කර 5,200ට බැහැලා තිබෙනවා. මයියොක්කා අක්කර 26,000ක් වගා කරලා තිබෙනවා. එය අක්කර 24,000ට බැහැලා තිබෙනවා. මේ රටේ අලවලින් අපි ස්වයංපෝෂණය වුණා. අල වවන ගොවීන් අද අඩුවෙලා තිබෙනවා. 2002 දී හෙක්ටයාර් 6,605ක් අල වවන කොට මේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයේ වගා වැඩ පිළිවෙළ යටතේ අල වැවීම අක්කර 4,480ට බැහැලා තිබෙනවා. කෘෂිකර්ම ඇමතිතුමනි, ඕනෑ නම් තමුන්නාන්සේට මේ වාර්තා ටික අපි දෙන්නම්.

ඒ විතරක් නොවෙයි, 2005 දී ගෙන්වලා තිබෙන්නේ ලොකු ලූනු ටොන් 110,000යි, තමුන්නාන්සේලා මේවා නිෂ්පාදනය කරන කොට අද ඒක158,000ක් වෙලා තිබෙනවා. අපට කියන්න බලන්න ඇමතිතුමනි, මෙයින් රජයේ වගා වැඩ පිළිවෙළ සාර්ථක වෙලා තිබෙනවාද කියලා. නැහැ. එහෙම සාර්ථක වෙලා තිබෙනවා නම් අපි පිට රටින් ගෙන්වන දේවල් අඩු වෙන්න ඕනෑ. අපට අවශ්‍ය කුරක්කන් ටිකවත් තවම හදා ගන්න බැරි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා රුපියල් ලක්ෂ ගණන්, කෝටි ගණන්, බිලියන ගණන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා. අපට කනගාටුයි, වවන්නෙත් කෘෂිකර්ම අමාත්‍යතුමා නොවෙයි, ආර්ථික සංවර්ධන ඇමතිතුමායි. වවන්නේ ගොවි ජන සේවා ඇමතිතුමා නොවෙයි, ආර්ථික සංවර්ධන ඇමතිතුමායි. ලොකු පෝස්ටර් ගහ ගෙන ලොකු වැඩසටහන් දා ගෙන සල්ලි වියදම් කර ගෙන මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා නම් මේ රටේ නිෂ්පාදනය වැඩි වන්න ඕනෑ. තමුන්නාන්සේලා කියන විධියට අද උතුරු නැගෙනහිරත් මේ නිෂ්පාදනයට එක්කහු වෙලා තිබෙනවා. උතුර නැගෙනහිර එක්කහු වෙලාවත්, සමහර භෝගවල මේ නිෂ්පාදන ප්‍රමාණයවත්, වගා කරන අක්කර ගණනවත් වැඩි වෙලා නැහැ. එහෙම නම් අසත්‍ය ප්‍රචාරණවලට, අසත්‍ය සටන් පාඨවලට සීමා වුණු වැඩ පිළිවෙළකුයි තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්නේ. මම කෘෂිකර්ම ඇමතිතුමාගෙන් අහන්නේ මේ රටේ ජනතාවගෙන් සියයට 40ක් වූ ගොවීන් වෙනුවෙන් රජය වෙන් කරන්නේ සියයට 0.40 නම්, අපි කෘෂිකර්මය නඟා සිටුවන්නේ කොහොමද කියලායි.

ඒ විතරක් නොවෙයි, අද ආනයනය කරන සියලු දේ මම ඕනෑ නම් කියන්නම්. 2005 දී මිරිස් ආනයනය කර තිබෙන්නේ මෙට්‍රික් ටොන් 27,000යි, අද වන කොට මෙට්‍රික් ටොන් 37,000ක් ආනයනය කරනවා. 2005 දී සෝයා බෝංචි ආනයනය කර තිබෙන්නේ මෙට්‍රික් ටොන් 1,310යි; දැන් මෙට්‍රික් ටොන් 1,600ක් ආනයනය කරනවා. මේ හැම අතුරු භෝගයක්ම මේ රටේ නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. ඒක නිසා තමයි කෘෂිකර්ම අංශයෙන් දළ දේශීය නිෂ්පාදනයට එක්කහු වෙන දේ අඩු වෙලා තිබෙන්නේ.

මම දන්නවා, අපේ දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු වවන බව. මම අහනවා, එයට රජය දෙන දායකත්වය මොකක්ද කියලා. අනුරාධපුරයේයි, මොනරාගලයි තමයි බඩ ඉරිඟු වවන්නේ. බඩ ඉරිඟුවලින් ස්වයංපෝෂණය වෙලා තිබෙනවා. ගොවියා බඩ ඉරිඟු වවන කොට තායිලන්තයෙන් එන බඩ ඉරිඟු බීජ දෙස අද බලා ගෙන ඉන්න වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ අවුරුද්දේ පෞද්ගලික අංශය තායිලන්තයෙන් ගෙනාපු සමහර බඩ ඉරිඟු බීජවල තත්ත්වය පසු ගිය අවුරුදුවල ගෙනාපු බීජවල තත්ත්වය තරම් හොඳ නැහැ.

අපි ආණ්ඩුවට කියනවා, ගොවීන්ට සහන මිලකට මේ බඩ ඉරිඟු බීජ ලබා දෙන්න වැඩ පිළිවෙළක් හදන්න කියලා. මේවා සහතික මිලකට ලබා ගන්න. පසුගිය මහකන්නයේ ගොවීන් නෙළා ගත් බඩ ඉරිඟු තවමත් ඔවුන්ගේ ගෙවල්වල අටුවල තිබෙනවා. බඩ ඉරිඟු මිල වැඩි වුණේ නැහැ. රජයක් විධියට ගොවියා ආරක්ෂා කිරීම තමුන්නාන්සේලාගේ යුතුකමක් වෙනවා. ඒ නිසා මේ බඩ ඉරිඟුවලට සහතික මිලක් ලබා දෙන්න. රජය කරපු වැඩ පිළිවෙළක් නිසා නොවෙයි, මේ බඩ ඉරිඟු වගාව ස්වයංපෝෂිත වුණේ. ගොවියාට අඩු තරමේ ණය මුදලක් ලබා දීමක්වත්, ආධාර මුදලක් ලබා දීමක්වත් වුණේ නැහැ. ඒ මොනවාවත් තිබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවියාව දිරිමත් කරන්නේ කොහොමද? මොනරාගල දිස්ත්‍රික්කයේ මායිමේ තිබෙන, ගොවියෝ හේන් කොටපු ඉඩම් ටික ඔක්කොම අක්කර 50,000ක් විතර වෙනවා. ඒවා මැනලා, වෙන් කරලා, ඒවාට පාරවල් හදලා, තමුන්නාන්සේලාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් පුවත් පත් දැන්වීමක් දමලා තිබුණා, ලොකු කොම්පැනිකාරයින්ට ඇවිල්ලා අක්කර දාහ ගණනේ ගන්න කියලා. තමුන්නාන්සේලා ගොවියාට සලකන්නේ මෙහෙමද? මොනරාගල දිස්ත්‍රික්කයේ සිටින්නේ ලංකාවේ දුප්පත්ම මිනිස්සු වැඩියෙන්ම ඉන්නේ තමුන්නාන්සේලාට ඡන්දය දුන්න කට්ටියයි. තමුන්නාන්සේලා වැඩිම ඡන්ද ප්‍රතිශතයක් ලබා ගෙන තිබෙන්නේ අපේ දිස්ත්‍රික්කයෙනුයි. එහෙම නම් ඒ මිනිසුන්ට අත දෙන එක තමුන්නාන්සේලාගේ යුතුකමක් වෙනවා නේද? ඒ දිස්ත්‍රික්කයේ තිබෙන ඉඩම් ටික ලොකු ලොකු කොම්පැනිකාරයින්ට, පෞද්ගලික සමාගම්වලට දෙන්නේ නැතිව -අක්කර දහස් ගණන් දෙන්නේ නැතිව- ඒ ගොවීන්ට බීජ ටිකක් ගෙනැත් දීලා, ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීලා, ගොවීන් නගා සිටුවන එක නේද තමුන්නාන්සේලාගේ යුතුකම වන්නට ඕනෑ. ගරු ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමා, අපනයන බෝග අංශය තමුන්නාන්සේට අයත් වන්නේ නැහැ නේද? ඒකට වෙනම ඇමතිවරයෙක් සිටිනවා.

මා හිතන විධියට දැන් මේ කෘෂිකර්ම අමාත්‍යාංශය කොටස් 15කට විතර කඩලා තිබෙනවා. ඉස්සර කෘෂිකර්ම අමාත්‍යාංශයයි, ගොවිජන සේවා අමාත්‍යාංශයයි එකට තිබුණේ. දැන් කොටස් හතර පහකට කඩලා තිබෙනවා. ඇයි ඉතින් ඇමතිවරුත් පැටව් ගහනවා වගෙයි නේ. ඉස්සර කෘෂිකර්ම, ගොවිජන සේවා ඒ

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ඔක්කොම එක ඇමතිවරයෙක් යටතේයි තිබුණේ. දැන් පශු සම්පත් වෙනම, කෘෂිකර්ම වෙනම, ගොවිජන සේවා වෙනම, සුළු අපනයන බෝග වෙනම, ඒ ආකාරයටයි තිබෙන්නේ. හෙට අනිද්දා වනකොට තවත් කොටස්වලට කැඩෙයි.

අපේ මාතලේ දිස්ත්‍රික්කයේ මේ දවස්වල හොඳ ගම්මිරිස් අස්වැන්නක් තිබෙනවා. ඒවාට හොඳ මිලකුත් තිබෙනවා. නමුත් අද වෙළෙඳ පොළේ වෙළෙන්දෝ පිරිසක් මේ මිල පාලනය කරනවා. අද රුපියල් 800ට මිලට ගත්තොත්, හෙට වනකොට රුපියල් 700යි. වෙළෙන්දෝ පිරිසක් මේක ඒකාධිකාරියක් කරගෙන සිටිනවා. අපි රජයෙන් ඉල්ලා සිටිනවා, මෙයට මැදිහත් වෙලා ගොවියාට සාධාරණ මිලක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා; ඒ වාගේම මේ ගම්මිරිස් වගාව තව ව්‍යාප්ත කරන්න කියලා. එයට ජාත්‍යන්තර වශයෙන් විශාල ඉල්ලුමක් තිබෙනවා. මා බැලුවා, අපි පලතුරු ආනයනය කරද්දී වැඩියෙන්ම මේ රටට ගෙනල්ලා තිබෙන්නේ මොනවාද කියලා. වැඩියෙන්ම මේ රටට ආනයනය කර තිබෙන්නේ දොඩම්. ඒ දවස්වල අපේ බිබිල පළාත දොඩම්වලට බොහොම ප්‍රසිද්ධියක් ඉසිලුවා. කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. මේ සියයට 0.40න් නම් මේ කටයුත්ත කරන්න බැහැ, ඇමතිතුමනි. අඩු තරමේ සල්ලි ටිකක් වැඩිපුර ඉල්ලාගෙන මේ වගාව ව්‍යාප්ත කරන්න. රුපියල් කෝටි ගණනක මුදලක් වැය වෙනවා, දොඩම් ආනයනය කරන්න.

අපේ දිස්ත්‍රික්කය කෙළවර හම්බේගමුව කියන ගමට මම ඊයේ පෙරේදා ගියා. එහි බොහොම සාර්ථක ගොවියෙක් ඇපල් වගා කර තිබුණා. හොඳ ඇපල් ඵලදාවක් තිබෙනවා. මේවා තමයි ව්‍යාප්ත කරන්නට ඕනෑ, ගරු ඇමතිතුමනි. එහෙම නැතිව ගම නැගුම, රට නැගුම කියලා බෝඩ් ගහලා හරියන්නේ නැහැ. ඇට පැකට් විකුණලා හරියන්නෙත් නැහැ. ඉදිරියේ දී මේ ගොවීන්ට තමුන්නාන්සේලා ආධාර ලබා දෙන්න. ඒ ගොවීන් බැංකුවලින් ණය ලබාගෙන මේ වගාවන් කරන්නේ. මම ඇහුවාම කිව්වා, ඒ ගොවියා එක ඇපල් පැළයක් ලබා ගෙන තිබෙන්නේ රුපියල් 1,000 ගණනේ කියලා. ඒ ඇපල් වර්ගය මෙහි වැවෙනවා. පැළයක් රුපියල් 1,000 ගණනේ ඒ ගොවියා ලබා ගෙන තිබෙන්නේ. රජය සහනාධාර දෙන්නට ඕනෑ මේවා සඳහායි.

ඒ විතරක් නොවෙයි, මා හිතන විධියට අද මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි, කෘමි නාශක සඳහා වැය වන මුදල. අද පොහොර ගෙන්වන්නට වැය වනවා වාගේ තුනෙන් එකක මුදලක් වැය වෙනවා මේ වල් නාශක සහ කෘමි නාශක බෙහෙත් ගෙන්වන්න.

පෞද්ගලික අංශය සියයට 40ක, 50ක විශාල ලාභයක් මේකෙන් ගන්නවා. තමුන්නාන්සේලා පොහොර සහනාධාරය දෙන නිසා, කුඹුරු අක්කරයක් වගා කරන්න පොහොරවලට රුපියල් එක්දහස් ගණනක් යන කොට කෘමි නාශක සහ වල් නාශකවලට අක්කරයකට රුපියල් හාරදාහක් යනවා. කරුණාකරලා අපි කියනවා, මේ කෘමි නාශක සහ වල් නාශක බෙහෙත් ගෙනෙන්න හොඳ වැඩ පිළිවෙළක් හදන්න කියලා. එහෙම වැඩ පිළිවෙළක් නැති නිසා අද ව්‍යාපාරිකයන් අධික ලාභයක් ලබනවා.

ආසනික් කථාව ගැන මා කියන්න යන්නේ නැහැ. ආසනික් ගැන අපේ ගරුතර හාමුදුරුවෝත් කිව්වා; අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමාත් කිව්වා. කරුණාකරලා කෘෂිරසායනික අඩු මිලට ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. මේ කෘෂිරසායනිකවල මිල වැඩි නිසා තමයි ගොවියාගේ පිරිවැය වැඩි වෙන්නේ. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ගොවියා අද අන්ත අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගොවිතැන් කරලා ලාභ නැති නිසා ගොවීන්ගේ දරුවන් ගොවිතැන් කරන්නේ නැතුව කොළඹ ඇවිල්ලා සිමෙන්ති අනනවා; කම්කරු වැඩ කරනවා. අලුත් පරපුර ගොවිතැනට යොමු කරන්න නම් එහි ලාභය වැඩි වෙන්න ඕනෑ. මේ රජයට කිසි වැඩ පිළිවෙළක් නැහැ, මේ රටේ කෘෂිකර්මය නංවන්න. ඒ සඳහා වියදම් කරලා තිබෙන මුදලෙන්ම ඒක කියන්න පුළුවන්. කොළඹ නගරයේ ශාරීරික ව්‍යායාම කරන, ඇවිදින ස්ථාන හදන්න බිලියන ගණනක් වෙන් කරන කොට ඒකෙන් සියයට එකක් මේ රටේ ගොවීන්ට වෙන් කරලා නැහැ. මම ඊයේ, පෙරේදා දැක්කා නුගේගොඩ වැලි පොළ හදනවා. ඒකට මිලියන 500ක් යනවා ලු. මම අහන්නේ, මේවා කරනවා වෙනුවට ගමට ගිහිල්ලා වැවක් හැදුවා නම් මොකද වෙන්නේ කියලයි. මේවායේ දුප්පත් මිනිස්සු ඇවිදින්න යනවාද? මේවායේ ඇවිදින්න යන්නේ සල්ලිකාරයෝයි.

නාගරික සංවර්ධන අධිකාරියට විශාල මුදලක් වෙන් කරලා තිබෙන්නේ මොකටද? දුප්පත් මිනිසුන්ට ඇඟ අඩු කරගන්න, සෞඛ්‍ය ආරක්ෂා කරගන්න ඇවිදින්න ඕනෑ නැහැ. පොහොසත් මිනිහාට තමයි තමුන්නාන්සේලා ඒ කටයුත්ත කරලා තිබෙන්නේ. මම ගරු ඇමතිතුමාගෙන් නැවත වරක් ඉල්ලා සිටිනවා, පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා හරි ඔබතුමාට වියදම් කරන්න තිබෙන මුදල වැඩි කරගෙන ගොවියා වෙනුවෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

[අ. භා. 1.44]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා, මේ සම්බන්ධයෙන් විවේචන වාගේම සියලුම අදහස් ප්‍රකාශ කිරීම ගැන. මොකද කෘෂි කර්මාන්තය කියලා කියන්නේ අපේ රටේ ආර්ථිකයට ඉතාමත්ම වැදගත් කර්තව්‍යයක්; වැඩ කොටසක් කරන ක්ෂේත්‍රයක්. අපට පුළුවන් මේක ඕනෑම අතකට හරවන්න. කෘෂි කර්මාන්තයේ දියුණුව කියලා කියන්නත් පුළුවන්; අපට මෙහෙම දෙයක් වුණේ නැහැ කියලා කියන්නත් පුළුවන්. මොකද, කෘෂි කර්මාන්තය කියලා කියන්නේ විවිධ වෙනස්කම්වලට ලක් වෙච්ච ක්ෂේත්‍රයක්. එක යුගයක අපට කිව්වේ, කෘෂි නිෂ්පාදන වෙනත් රටවලින් ලාභෙට ගන්න පුළුවන් නම් එහෙන් ගෙනෙන්න, මෙහේ වවන්න එපා කියලායි. ලාභෙට ගන්න තැනින් අරගෙන පරිභෝජනය කරන්නය කියන මතයක් ඒ යුගයේ දැරුවා. ඒ වාගේම කෘෂිකර්මය වෙනුවෙන් කිසිම මුදලක් වෙන් කළේත් නැහැ. එහෙම තිබුණු යුගයක තමයි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ නායකත්වය අරගෙන කෘෂි කර්මාන්තය දියුණු කරන්න විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ. ඒ යුගයේ තිබුණු යුද්ධයත් එක්ක එතුමා මේ වැඩ පිළිවෙළ ආරම්භ කළාට හරියට කරගෙන යන්න බැරි වුණා. නමුත් අද ඊට වඩා වෙනස්. අපේ අතිගරු ජනාධිපතිතුමා මේ ක්ෂේත්‍රය කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කරලා අපට වුවමනා කරන මුදල් සියල්ලම වෙන් කර දීලා තිබෙනවා. මෙතුමන්ලා කියනවා, නිෂ්පාදනය අඩු වුණාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාල වකවානුවේ බඩ ඉරිඟු ගැන අපි කථා කෙරුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකම බිමේ තමයි බඩ ඉරිඟු වගා කරන්න තිබෙන්නේත්, මිරිස් වගා කරන්න තිබෙන්නේත්. එහෙමත් නැත්නම් වෙනත් බෝග වර්ග වගා කරන්න තිබෙන්නේත් ඒ බිමමයි.

ගොවියා ලාභදායී ව්‍යාපාරයට යොමු වනවා. බඩ ඉරිඟුවලින් වඩා ලාභ නම්, මිරිස් වගාවෙන් ඉවත් වෙලා බඩ ඉරිඟු වගාවට ගොවියා යොමු වනවා. ඒකට අපි කවදාවත් බාධා කරන්නේ නැහැ. ඒකට අපි ඒ උදවියට තව තවත් ශක්තිය, ධෛර්ය ලබා දෙනවා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලා බීජ නිෂ්පාදනය ගැනත් කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බීජ නිෂ්පාදනය වෙනුවෙන් පසු ගිය වසර දෙක, තුන ඇතුළත අපේ අතිගරු ජනාධිපතිතුමා විශාල මුදල් සම්භාරයක් වෙන් කර දීලා තිබෙනවා. මේක ඉක්මනින් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. හොඳ බීජයක් වර්ධනය කරන්න, ඒක අත් හදා බලන්න, ඒක ගොවියාට නිකුත් කරන්න දීර්ඝ කාලයක් අපට ගත වනවා. දැන් කිව්වා වාගේම පිට රටින් බීජ ගෙන්වන ආකල්පය අපට දුන්නේ එදා හිටපු ඒ උදවියයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
තමුන්නාන්සේත් මේ පැත්තේ හිටියේ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ පරණ ඒවා කථා කරන්න එපා. අද ගොවියා ව්‍යාපාරික ගොවියෙක් බවට පත් වෙලා තිබෙනවා. ඒ උදවිය බලන්නේ වඩා හොඳින් ලාභ ලබා ගන්නයි. ඒ නිසා තමයි දෙමුහුං බීජ සඳහා මේගොල්ලන් යොමු වන්නේ.

මට මතකයි, පසු ගිය උතුරු-මැද පළාතේ ඡන්ද කාලයේ අපේ මර්වින් සිල්වා ඇමතිතුමා මට කථා කරලා කිව්වා, බඩ ඉරිඟු බීජ හිඟයක් තිබෙනවා කියලා. මම එවේලේම කිව්වා, අපේ මහඉලුප්පල්ලම ගොවිපළේ සම්පත් බීජ කිලෝග්‍රෑම් 25,000ක් තිබෙනවා, ගෙනියන්න කියලා. ඒවා ගෙනියන්න කිසිම ගොවියෙක් ආවේ නැහැ. අපි සූදානම් වෙලා හිටියා, ඔවුන් ආවොත් මේ බීජ ලබා දෙන්න. නමුත් කිසි කෙනෙක් ආවේ නැහැ. මොකද ඒ ගොවීන් ඊට වඩා විශ්වාසයෙන් තායිලන්තයෙන් ගෙන්වන බීජ පාවිච්චි කරනවා. මේකට විසඳුමක් නැහැ. අපි ඒ වෙනුවෙන් තවත් බීජයක් හදලා දෙන්නේ නැත්නම්, අපි මේ වෙනුවෙන් මේ බීජ දියුණු කරන්නේ නැත්නම් ඒකට විසඳුමක් නැහැ. අනෙක් වර්ගවලත් එහෙමයි. ගොවීන් අතර මේක ප්‍රචලිත කරන්න අඩුම ගණනේ අවුරුදු තුනක්, හතරක් යනවා. මෙවර අය වැයෙන් අපට ඒ සඳහා මුදල් ලබා දීලා තිබෙනවා. ඒ අනුව මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න රුපියල් මිලියන සියයක් අපට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දැන් ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කෙරුවා, මහඉලුප්පල්ලම ගොවිපළේ බීජ නැහැ කියලා. නමුත් මහඉලුප්පල්ලමේ බීජ තමයි මිරිස් වගාව සඳහා මේ සැරේ අපි නිකුත් කරලා තිබෙන්නේ. ඒක ඉතාමත් ජනප්‍රියයි. ගොවියෝ ඉතාමත් සන්තෝෂයෙන් ඒ බීජ භාවිතා කරනවා.

ඊළඟට ලූනු බීජ ගැන කථා කළා. මේ මොහොත වෙන කොට අපි ලූනු බීජ ලංකාවට ගෙන්වීම සම්පූර්ණයෙන් තහනම් කරලා තිබෙන්නේ. අපට අවශ්‍ය තරම් බීජ පසු ගිය කන්නයේ අපි නිෂ්පාදනය කර ගත්තා. ඒ වාගේම තවත් අතිරික්ත කොටසක් එනම් කිලෝග්‍රෑම් 6,000ක් මේ මොහොත වෙන කොටත් කටුනායක අපේ බීජ ගබඩාවේ තිබෙනවා. අපට ඊළඟ කන්නයට අවශ්‍ය වන්නේ කිලෝග්‍රෑම් 35,000යි. ඒ 35,000ත්, 6,000කට වැඩි ප්‍රමාණයක් දැනට අපේ අතේ තිබෙනවා. ගොවියෝ අතේත් තිබෙනවා, ඒ හා සමාන ප්‍රමාණයක්. අපි ලබන වර්ෂයේත් බීජ ගෙන්වන්නේ නැහැ. ඉදිරි කාල සීමාවේත් බීජ ගෙන්වීම සම්පූර්ණයෙන් අපි නතර කළා. මේ සැරේ බීජ නිෂ්පාදනය කිරීම සඳහා අපි ගොවියාට අවශ්‍ය සම්පූර්ණ සහයෝගය ලබා දීලා, සම්පූර්ණ වැඩ පිළිවෙළ සකස් කරලා දීලා තිබෙනවා.

ඒ වාගේමයි ලොකු ලූනු නිෂ්පාදනයත්. දැනට ගලවා තිබෙන මේ කන්නයේ අපි මෙට්‍රික්ටොන් 110,000ත්, 120,000ත් අතර ප්‍රමාණයක් මේ වෙන කොට නිෂ්පාදනය කරලා තිබෙනවා. එයින් භාගයක්වත් තවම විකිණුනේ නැහැ. ඒ අස්වනු තවමත් ගෙවල්වල තිබෙනවා. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කෙරුවා, ගොවියාට කේවල් කිරීමේ ශක්තියක් දෙන්න කියලා. අද ලොකු ලූනු ගොවියා කේවල් කිරීමේ ශක්තියක ඉන්නවා. මොකද අපි ඒ උදවියට ගබඩා කරන්න අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. අපේ දේශීය ලූනු මාස හයක් හෝ හතක් තියා ගන්න පුළුවන් ප්‍රමාණයට අපි ගබඩා හදලා දීලා තිබෙනවා. දැන් ඒ ගබඩාවල් ප්‍රයෝජනයට අරගෙන තමයි ඒ උදවිය අද වෙළෙන්දත් එක්ක හෙට්ටු කරන්නේ. මේ මොහොත වන කොට දඹුල්ලේ ලොකු ලූනු කිලෝග්‍රෑම් එක රුපියල් 65යි. ඒ කියන්නේ මේ මොහොත වෙන කොට දඹුල්ලේ ලොකු ලූනු කිලෝග්‍රෑම් එකකට ගොවියා රුපියල් 65 ගණනේ ලබා ගන්නවා. ඒක තමයි අපට වුවමනා කරන්නේ. ඒවාට කිසි කෙනෙක් කථා කරන්නේ නැහැ. මේක විකිණුනේ නැත්නම්, විකුණන්න බැරිනම් තමයි කථා කරන්නේ. මේ මොහොත වන කොට ඒ ලූනු විකිණෙනවා.

ඊළඟට, බීජ ගොවිපළ වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරන සියලුම පහසුකම් අපි ලබා දීලා තිබෙනවා. 2015 වෙනකම් රුපියල් බිලියන 700ක් වසර තුනක් සඳහා අපට ඒ වෙනුවෙන් ලබා දීලා තිබෙනවා. මම ඒකයි ඔබතුමන්ලාට කිව්වේ, මේ වැඩ පිළිවෙළ අවුරුදු ගණනාවක් ඉදිරියට යන වැඩ පිළිවෙළක් කියලා. ඒ හින්දා ඒ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළට ඒ අනුව මුදල් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම අවශ්‍ය කරන දෙමුහුන් බීජවලින් අපට ලෙහෙසියෙන් නිෂ්පාදනය කරන්න පුළුවන් බටු සහ තක්කාලි. අපි දැනටමත් ඒ වැඩසටහන් ආරම්භ කරලා තිබෙනවා. අනෙක් ඒවා එහෙම ලෙහෙසියෙන් ආරම්භ කරන්න බැහැ. ඒක ටිකක් කල් යන, ටිකක් අමාරු වැඩක්. ඊළඟට අර්තාපල් ගැන කථා කළා. මෙච්චර කාලයක් අපි අර්තාපල් මෙට්‍රික්ටොන් 15,000ත්, 20,000ත් අතර ප්‍රමාණයක් ආනයනය කරලා තිබෙනවා. මම සතුටින් කියනවා, 2012 වර්ෂයේ අද වන තෙක් ලංකාවට ආනයනය කරලා තිබෙන්නේ අර්තාපල් මෙට්‍රික් ටොන් 1,200ක් පමණයි කියා.

අලුත් වැඩසටහන යටතේ අපි පටක රෝපණ වැඩ පිළිවෙළ සහ නවීන තාක්ෂණය භාවිත කරලා, බීජ නිෂ්පාදනය කිරීම සඳහා ගොවීන් උනන්දු කරලා ඒ වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක කර ගෙන යනවා. අපට දැඩි විශ්වාසයක් තිබෙනවා, 2015 වන විට මේ වැඩ පිළිවෙළ අපට සියයට 100ක් සම්පූර්ණ කරන්න පුළුවන් බවට. ඒක තමයි අපට වුවමනා කරන්නේ. මෙම විශේෂ වැඩසටහන යටතේ අපි දේශීය වශයෙන් නිෂ්පාදනය කරන බීජ ගොවීන් අතර ඉතාමත්ම ජනප්‍රියයි. ඒ උදවිය අපේ බීජවලින් ලබන අස්වැන්න, විශේෂයෙන් අපේ අර්තාපල් සහ ලොකු ලූනු බීජවලින් ලැබූ අස්වැන්න පිට රටින් ගෙනා බීජවලින් ලැබූ අස්වැන්න වගේ දෙගුණයකට හා සමානයි කියලා ගොවීන් අත් දැකීමෙන් කියනවා. තමුන්නාන්සේලා ගිහිල්ලා ඒ උදවිය මුණ ගැහිලා කථා කරලා බලන්න. දඹුල්ලට ගිහිල්ලා බලන්න; market එකේ විතරක් ඇවිදින්න එපා. දඹුල්ලේ ගොවියෝත් මුණ ගැහිලා කථා කරලා බලන්න මොනවාද සිද්ධ වෙන්නේ කියලා. වෙළෙඳ පොළේ - market එකේ - විතරක් ඇවිදලා මේ රටේ දේශපාලනය කරන්න පුළුවන් වෙන්නේ නැහැ. අපි තමුන්නාන්සේලාට කියනවා, අපි මේ ගරු සභාවට දන්වනවා මේ වැඩ පිළිවෙළ අපි ඉතාමත්ම සාර්ථකව ඉදිරියට ගෙන යනවා කියලා. අපට ඉක්මනින් ප්‍රතිඵල ගන්න බැහැ. කවදාවත් පැය 24න් කෘෂි කර්මාන්තයේ ප්‍රතිඵල ගන්න බැහැ.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, ඒ කාලයේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයෙන් ලැබුණු ප්‍රතිශතය සියයට 21යි, දැන් සියයට 11යි දශම ගණනයි කියලා. ඒක ඇත්ත. එහෙම වෙන්න හේතුවක් තිබෙනවා. කෘෂි කර්මාන්තයෙන් ලැබෙන ආදායම විවිධ ක්ෂේත්‍රවල value addition හැටියට බෙදිලා ගියා. අද වන කොට අපි bulk tea අපනයනය කරන්නේ නැහැ. හුඟක් වෙලාවට අපි අපනයනය කරන්නේ packet කරපු -අගය එකතු කරපු- තේ. ඒක අපි ලැබූ ජයග්‍රහණයක්. ඒ වාගේමයි අනෙකුත් ක්ෂේත්‍රයන්ගෙන් ලැබූ ආදායම ඊට වඩා වැඩි වුණා. ඇඟලුම් නිෂ්පාදනයෙන් ලැබෙන ආදායම ඊටත් වැඩි වුණා. ඒ නිසා එම ආදායම් සියල්ල කෘෂි කර්මාන්තයෙන් ලැබූ ආදායමට වඩා වැඩි වුණා. ඒ නිසා සමස්තයක් විධියට අපේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය ප්‍රතිශතයක් ලෙස අඩු වුණා. කෘෂි කර්මාන්තයේ නිෂ්පාදනය අඩු වෙලාවත්, එහෙම නැත්නම් වෙනත් හේතුවක් නිසාවත් නොවෙයි එහෙම වුණේ. දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය දෙන වෙනත් අංශ දියුණු වීමේ හේතුව නිසායි එහෙම වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙච්චර කාලයක් අපි අපේ අවධානය යොමු කරලා තිබුණේ වී වගා කරන්න; අපට අවශ්‍ය තරම් සහල් නිෂ්පාදනය කරන්න. අපි ඒ ඉලක්කය ඉක්මවා ගියා. ඊළඟට ආනයනය සඳහා අපි විශාල වශයෙන් මුදල් වියදම් කරන, අපේ රටේ මුදල් විශාල වශයෙන් ඇදිලා යන බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩි කර ගන්න කටයුතු කළා. අපි එම නිෂ්පාදනයත් ඉක්මවා ගියා. ඊළඟට අපි අනෙකුත් නිෂ්පාදන කටයුතු සඳහා යොමු වෙනවා. මුං ඇට නිෂ්පාදනය අරගෙන බැලුවොත්, 2011 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුවත් -2012 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අපට තවමත් ලබා ගන්න බැරි වුණා- ඒ වාගේම දළ ඇස්තමේන්තු අනුවත් අපේ අවශ්‍යතාවෙන් සියයට 92ක් මේ මොහොත වන විට මේ රටේ නිෂ්පාදනය කරලා තිබෙනවා. අපි තුන්වැනි කන්නයේත් වැඩ ආරම්භ කරලා තිබෙනවා. අපි පසු ගිය කන්නයේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පමණක් මුං ඇට මෙට්‍රික්ටොන් 8,000ක් ලබා ගත්තා. අපේ මුළු දේශීය අවශ්‍යතාවම වන්නේ මුං ඇට මෙට්‍රික් ටොන් 26,000යි. නමුත්, පසු ගිය කන්නයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පමණක් එයින් මෙට්‍රික් ටොන් 8,000ක් අපි ලබා ගෙන තිබෙනවා. මේ විධියේ වැඩ පිළිවෙළක් දැන් ක්‍රියාත්මක වී ගෙන යනවා. ඒ ගැන අපි ආඩම්බර වෙනවා.

ඒ වාගේම තමයි සෝයාබෝංචි වගාවත්. පසු ගිය කාලයේ සෝයාබෝංචි වවන්න ගොවියෝ කැමැති වුණේ නැහැ. ඒ ගොල්ලන්ට වෙළෙඳ පොළක් තිබුණේ නැහැ. අද ඒ සඳහා වෙළෙඳ පොළ ඇති වෙලා තිබෙනවා. දැන් මේ ක්ෂේත්‍රයට විශාල වශයෙන් බීජ ලබා දීලා ලබන වර්ෂය වන විට අඩුම ගණනේ අපේ අවශ්‍යතාවෙන් සියයට 75 දක්වාත්, 2014 වර්ෂය වන විට සියයට 100ක ඉලක්කය දක්වාත් යන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට යන්න ඕනෑ. සියල්ලම එක සැරේ කරන්න බැහැ.

මේ අවස්ථාවේ ගොවි විශ්‍රාම වැටුප පිළිබඳව මට තව එක පිළිතුරක් දෙන්න තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු කියපු තොරතුරු සම්පූර්ණයෙන්ම වැරැදියි. මේ මොහොත වන විට වයස අවුරුදු 60ට වැඩි ගොවීන් 1,230 දෙනෙකුට අපි රුපියල් 6,000 ගණනේ ගෙවා තිබෙන බව මම කියනවා. තවත් ගොවීන් 13,389කට ගෙවන්න මේ වන විට කටයුතු කරලා තිබෙනවා. ඉදිරි කාල සීමාව තුළ ඒ කටයුතු සිද්ධ වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්ෂේත්‍රයේ අපි බිත්තර වී ලබා දීම ගැනත් කියන්න ඕනෑ. පසු ගිය කාලයේ ඇති වූ නියඟයෙන්, ගංවතුරින් විනාශ වූ කුඹුරු සියල්ලටම බිත්තර වී නොමිලයේ ලබා දීමේ වැඩසටහන රජය ක්‍රියාත්මක කළා. ඒ වැඩ පිළිවෙළ තුළ මේ කන්නයේදී විතරක් බිත්තර වී බුසල් 2,87,000ක් බෙදා දී තිබෙනවා. ඒ බුසල් 2,87,000ම දුන්නේ නොමිලයේ. ඒවා දෙන කොට පොළොන්නරුවේ වී බුසලක් අඩංගු එක වී මල්ලක පිදුරු කුඩු තිබුණා. සාමාන්‍යයෙන් කමතක වී එකතු කරන කොට අවසානයේදී එන්නේ පිදුරු කුඩුයි. සමහර වෙලාවට ඒකත් එක්ක අපද්‍රව්‍යයත් එකතු වෙනවා. මොකද, ඒ මිනිස්සු වී විකි කරන්නේ නැහැ. මේ බිත්තර වී ගොඩේ එහෙම පිදුරු කුඩු ප්‍රමාණයක් තිබුණා. අපේ එක්තරා දේශපාලන පක්ෂයකට පන්දම් අල්ලන පළුගස්දමන රාජපක්ෂ ගොවි මහත්තයා ඒක අරගෙන ගිහිල්ලා පත්තරයට පෙන්වලා, රූපවාහිනියෙන් පෙන්වලා, මහා විශාල විලෝපයක් කළා. වී බුසල් 2,87,000ක් බෙදන කොට එකක තමයි මේවා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක වැරදි නැහැ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක පෙන්වන්න ඉස්සර වෙලා අපට කියන්න තිබුණා, මෙන්න මෙහෙම වැරැද්දක් වෙලා තිබෙනවා කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක පෙන්වා දීම වරදක්ද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
පත්තරයේ දමන්නේ ඇයි? එහෙම කරන්නේ අනවශ්‍ය විධියට දේශපාලන ප්‍රචාරයක් ගන්නයි. පත්තරයේ දමන්න වුවමනා නැහැ. ඊට පස්සේ ප්‍රතිඵලය වුණේ මොකක්ද? "දිවයින" පත්‍රයේ කර්තෘතුමා මේ ගැන මට නොසෑහෙන්න බැනලා කතුවැකියක් ලිව්වා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒවා දෙන්න ඉස්සර වෙලා ප්‍රමිතිය බලන්නේ නැද්ද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ප්‍රමිතිය බලනවා. ඒ වී බුසලේ පැලවීමේ ප්‍රතිශතය සියයට 98යි, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි කිලෝ භාගයක් විතර පිදුරු කුඩු තිබුණා. ඒක තමයි පෙන්වුවේ. ඕනෑම කමතක වී එකතු කරන කොට ඒවා එකතු වෙනවා. මෙහේ සීතල කාමරවල ඉඳ ගෙන පත්තරවලට ලියන්න පුළුවන්. නමුත් ගොවිතැන් කරන තැන්වලට ගිහිල්ලා බැලුවොත් මේ බව පෙනෙනවා. අවසාන කොටස අත් දෙකෙන් එකතු කරලා දමන්නේ. එතකොට පිදුරු කුඩුත් ටිකක් වැටෙනවා. වී බුසල් 2,87,000ක් බෙදුවාම එක බුසලක තිබුණ එක තමයි highlight කළේ; මේ රටේ ප්‍රචාරය වන්නේ. ඒ වගේ තමයි ඔබතුමන්ලාත් කරන්නේ. ඔබතුමා කරන්නේත් ඒ කාර්යයම තමයි. අපි මෙච්චර කාර්යයක් කරන කොට ඔබතුමාත් ඔය වාගේ එකක් විතරක් අරගෙන ඇවිල්ලා කථා කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අපේ වගකීම ඒක.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
බොහොම හොඳයි. ඒක තමයි වගකීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තත්ත්වය ඒකයි. මේ කරන වැඩ පිළිවෙළට අපට රටෙන් ලැබෙන සහයෝගය ඒකයි. නමුත් මෙහි ඇත්ත තත්ත්වය මේකයි. පිට පිට කන්න දෙකක් පාළු වුණොත් අපේ රටට බිත්තර වී නැහැ. ගබඩා කරලා තියන්න ක්‍රමයක් නැහැ. ඉන් එහාට යන්න බැහැ. පිට පිට කන්න දෙකක් පාළු වුණොත් බිත්තර වී පිටරටින් ගෙන්වන්න වෙනවා. දැන් කන්න දෙකක් පාළු වුණා. ඒත් අපි අමාරුවෙන් හරි මේ ප්‍රශ්නය විසඳා ගත්තා. නමුත් අනාගතයේ මේ විධියේ දේශගුණ විපර්යාසයන් වුණොත් දෙක තුන වෙන්න පුළුවන්. මේ විධියට මේ රටේ, ලෝකයේ සිදු වන දේශගුණික විපර්යාසයන් දිහා බැලුවාම මේවා දෙකක් තුනක් වෙන්න බැරි නැහැ. එහෙම වුණොත් අපි ඉතාමත් අවාසනාවන්ත තැනකයි ඉන්නේ. ඉතින් අපි මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. ඒකට කරන්නේ මොකක්ද? එහෙම නම් අපි හොඳ ගබඩා පහසුකම් ඇති කර ගන්නට ඕනෑ. බීජයක ප්‍රරෝහණ ශක්තිය අඩු වන්නේ නැතිව අඩු ගණනේ අවුරුද්දක්, දෙකක් ගබඩා කර ගැනීමේ හැකියාව අපට තියෙන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ ගැන අනාගතයේ අපට හිතන්න වෙනවා. ඒකටයි අපි අපේ මිත්‍රයින්ගෙන් උදවු ඉල්ලන්නේ; සහයෝගය ඉල්ලන්නේ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ජාන තාක්ෂණය ගැන ප්‍රකාශ කළා. කොරියානු ජන රජය විසින් කළ බීජ සංරක්ෂණය පිළිබඳව යම්කිසි කථිකාවතක් ඇති වුණු බව ඇත්ත. නමුත් ඒ මිනිස්සුන්ට අපේ ජාන ගෙන යන්න අවශ්‍ය නැහැ. ඒ අයට අපේ ජානවලින් කිසි ප්‍රයෝජනයක් නැහැ. මේ ක්ෂේත්‍රයේ නිෂ්පාදන තත්ත්වය අතින් ඒ ගොල්ලන් අපට වඩා ඉදිරියෙන් ඉන්නවා. අපට වුවමනා කරන්නේ ජාන ප්‍රවේශම් කරන්නයි. අපි මෙච්චර කාලයක් අපේ ජාන ප්‍රවේශම් කරන්නයි උත්සාහ කළේ. අපේ වැරැද්දත් ඒකයි. අපි දෙමුහුන් බීජවලට ගියේ නැහැ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩි දෙනෙක් කල්පනා කළේ, දේශීය ජාන ආරක්ෂා කර ගැනීම ඒවා සුරැකීම අපේ වැඩ පිළිවෙළ වෙන්න ඕනෑ කියලායි. දෙමුහුන් බීජවලට අපේ ගොවීන් පුහුණු කරන්න අපි උත්සාහ කළේ නැහැ. මම හිතන විධියට ඒක බරපතළ අඩුපාඩුවක්. ඒක ඒ කාලයේ ඉඳලා කල්පනා කළේ නැහැ. දැන් අපි එහෙම කල්පනා කරනවා. අපි වීවලටත් ඉදිරි අනාගතයේ දෙමුහුන් බීජ නිෂ්පාදනය කරන්න වැඩ පිළිවෙළක් සකස් කරනවා. එහෙම නැති වුණොත් අපට ලෝකයත් එක්ක යන්න බැරි වෙනවා.

වියට්නාමයේ අක්කරයකට වී මෙට්‍රික් ටොන් 10ක්, 15ක් ගන්න කොට, තවමත් මෙට්‍රික්ටොන් 4ක් 5ක් අරගෙන අපට ඒ ගොල්ලන් එක්ක තරග කරන්නත් බැහැ; අපේ අවශ්‍යතා සම්පූර්ණ කරන්නත් බැහැ; අපේ නිෂ්පාදන වියදම අඩු කර ගන්නත් බැහැ. ඒ නිසා අපි ලබන අවුරුද්දේ ඉඳලා සෑම ක්ෂේත්‍රයකම දෙමුහුන් බීජ වර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා. ඒක අපි කරනවා. අපේ කාර්මික නිලධාරි මහත්වරු ඒ වැඩ පිළිවෙළ දැන් ආරම්භ කර ගෙන යනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එහෙම නම් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ சிவசக்தி ஆனந்தன்! உங்களுக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருக்கின்றன.

[பி.ப. 2.02]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய குழுநிலை விவாதத்தில் எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் தந்ததையிட்டு நன்றி தெரிவிக்கின்றேன். எங்களுடைய வன்னி மாவட்டமானது முற்றுமுழுதாக விவசாயம் மற்றும் கால்நடை வளர்ப்பைப் பிரதானமான தொழிலாகக் கொண்டதாகும். அந்த மாவட்டத்திலுள்ள விவசாயிகள் கடின உழைப்பாளிகள்; கடந்த காலத்தில் வியர்வை சிந்தி, கடினமாக உழைத்து மிகவும் செல்வந்தர்களாக வாழ்ந்தவர்கள். இறுதிக் கட்டப் போரின்போது வவுனியா, மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி ஆகிய நான்கு மாவட்டங்களையும் சேர்ந்த விவசாயிகள் 2,000க்கும் மேற்பட்ட உழவு இயந்திரங்களை முள்ளிவாய்க்கால்வரை கொண்டுவந்து நிறுத்திவிட்டு இடம்பெயர்ந்தனர். பின்னர் இடைத்தங்கல் முகாம்களிலிருந்து வந்த அவர்களால் மீண்டும் அவற்றை எடுக்கமுடியாத ஒரு துர்ப்பாக்கிய நிலைவரம் ஏற்பட்டிருக்கிறது. போரின்போது ஒருசில உழவு இயந்திரங்கள் அழிந்திருந்தாலும்கூட, பெருந்தொகையான உழவு இயந்திரங்கள் அரசாங்கத்தினால் திட்டமிடப்பட்டு கொள்ளையிடப்பட்டுள்ளன. ஒரு தொகை உழவு இயந்திரங்கள் துண்டு துண்டாக வேறாக்கப்பட்டு உதிரிப்பாகங்களாக விற்பனை செய்யப்பட்டிருக்கின்றன. பல நூற்றுக்கணக்கான உழவு இயந்திரங்களின் நிறம் மாற்றப்பட்டு வன்னியில் இருக்கின்ற இராணுவ முகாம்களில் இருக்கின்றன. இற்றைவரை அவற்றை இராணுவத்தினர் பாவிக்கின்றார்கள். குறிப்பிட்ட முகாமிலுள்ள இராணுவத்தினர் தம்முடைய உழவு இயந்திரங்களைப் பாவிக்கின்றார்களென பல விவசாயிகள் முறையிட்டிருக்கிறார்கள். அவற்றைத் தரும்படி கேட்டபோது தாங்கள் எச்சரிக்கப்படுகிறார்களென்று அவர்கள் கூறுகி றார்கள். ஏன், நான் இவற்றைக் குறிப்பிடுகின்றேனென்றால், அந்த வன்னிப் பிரதேசங்கள் முழுக்க முழுக்க விவசாயத்தை நம்பி வாழ்ந்த ஒரு பகுதியென்பதை நினைவுபடுத்துவதற் காகத்தான்.

அங்கு மக்கள் செழிப்பாக வாழ்ந்தார்கள். போருக்குப் பின்னராவது இந்த அரசாங்கம் அந்த விவசாயிகளுடைய உழவு இயந்திரங்களை முழுமையாக, முறையாகக் கையளித்திருக்க வேண்டும். பல தடவைகள் அரசாங்க அதிபர்கள் மற்றும் பிரதேச செயலாளர்களூடாக அந்த உழவு இயந்திரங்கள் அவர்களிடம் கையளிக்கப்படுமென்றும் அதற்கான ஆவணங்களை ஒப்படைக்குமாறும் பொலிஸ் நிலையங்களில் முறைப்பாடு செய்யுமாறும் சொல்லப்பட்டது. அதற்கமைய எத்தனையோ விவசாயிகள் பொலிஸில் முறைப்பாடு செய்தார்கள்; அந்த ஆவணங்களை எடுத்துச் சென்று அந்த அதிகாரிகளைச் சந்திப்பதற்காக பல தடவை படியேறி இறங்கியும் அவை முறையாகக் கையளிக்கப்படவில்லை. ஆகவே, அந்த விவசாயிகளுடைய நன்மை கருதி, அந்த 2,000

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

உழவு இயந்திரங்களுக்கும் என்ன நடந்தது? யார் அவற்றைக் கொள்ளையடித்தார்கள்? யார், யார் அவற்றைப் பாகங்களாகப் பிரித்து இரும்புக்காக விற்றார்களென்பதைக் கண்டறிய எதிர்காலத்தில் பகிரங்க விசாரணை நடத்தப்பட வேண்டும். அதுமட்டுமல்ல, அந்த விவசாயிகள் வியர்வை சிந்தி உழைத்து வாங்கிய ஒவ்வொரு உழவு இயந்திரத்துக்கும் பதிலாக உரிய நட்டஈட்டை இந்த அரசாங்கம் வழங்க வேண்டும். அப்படிச் செய்வதனூடாகத்தான் இந்த நாட்டில் நல்லிணக்கத்தையும் நம்பிக்கையையும் கட்டியெழுப்ப முடியுமென்பதை இந்த வேளையில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, விவசாயிகளின் நெல்லைக் கொள்முதல் செய்வதில் அரசாங்கம் வருடா வருடம் எவ்வாறான உத்தரவாத விலையை அறிவித்தாலும்கூட பெரும் நடை முறைப் பிரச்சினைகள் - முக்கியமாக இரண்டு பிரச்சினைகள் - எதிர்நோக்கப்படுகின்றன. முதலாவது, எங்களுடைய மாவட்டங்களில் நெல்லை முழுமையாகக் கொள்முதல் செய்வதற்குப் போதிய நிதி இல்லை; இரண்டாவது, அப்படிக் கொள்முதல் செய்யப்படுகின்ற நெல்லைச் சந்தைப்படுத்து வதற்குப் போதிய களஞ்சிய வசதிகள் இல்லை. ஆகவே, அங்குள்ள ஒவ்வொரு மாவட்டத்திலும் இதற்கான நிதி வசதியையும் களஞ்சிய வசதியையும் ஏற்படுத்திக் கொடுக்க வேண்டும் என்று அமைச்சரவர்களிடம் இவ்விடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதைவிட, வன்னி மாவட்டத்தில் குறிப்பாக வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மூன்று மாவட்டங்களிலும் கிட்டத்தட்ட 460 குளங்கள் நீண்ட காலமாகப் புனரமைக்கப் படாமல் இருக்கின்றன. அதனால், இன்றைக்கு அந்தக் குளங்களில் ஏற்படுகின்ற ஒரு சிறு உடைப்பைக்கூடச் சரிக்கட்ட முடியாத ஒரு நிலைவரம் இருக்கின்றது. இதனால் இவற்றின் நீர்ப்பாசனத்தின் கீழ்வரும் 100 - 200 ஏக்கர் வயல் நிலங்கள் செய்கை பண்ணப்பட முடியாதுள்ளது. அதேநேரம் அந்தந்த கமநல சேவை நிலையங்களுக்கூடாக குறித்த இயந்திரங்களை வழங்கினால் சம்பந்தப்பட்டவர்கள் சிறிய உடைப்புக்களை எல்லாம் சரி செய்ய முடியும். எனவே, நீண்ட காலப் போருக்குப் பிறகு அங்கு மீள்குடியேறிய மக்கள் இன்று விவசாயம் செய்யமுடியாத ஒரு துர்ப்பாக்கிய நிலையில் இருக்கின்றார்கள். ஆகவே, அரசாங்கம் இந்த 460 குளங் களையும் புனரமைப்பதற்கு உரிய நடவடிக்கை எடுக்க வேண்டும்.

அதேநேரம் முல்லைத்தீவு மாவட்டத்தில் கரைதுறைப்பற்று பிரதேசத்துக்குட்பட்ட கொக்கிளாய், கருநாட்டுக்கேணி, கொக்குத் தொடுவாய் போன்ற கிராமங்களிலுள்ள மக்களுக்குச் சொந்தமான கிட்டத்தட்ட 500 ஏக்கர் வயல் நிலங்கள் இன்று அபகரிக்கப்பட்டிருக்கின்றன. அதாவது அவ்வளவு நிலங்களும் தென்பகுதியைச் சேர்ந்த சிங்கள சகோதர மக்களால் அபகரிக்கப்பட்டு நெல் விதைக்கப்பட்டிருக்கின்றன. குறிப்பாக கொக்கிளாய் பிரதேசத்தில் இருக்கக்கூடிய எரிந்த காடு, முந்திரிகைக்குளம், ஆமியன்குளம் ஆகிய மூன்று கிராமங் களிலும் உள்ள 500 ஏக்கர் வயல் காணிகளே தென்பகுதிச் சிங்கள மக்களால் அபகரிக்கப்பட்டுள்ளன. அந்தத் தமிழ் மக்கள் அங்கே மீள்குடியேறிக் கிட்டத்தட்ட ஒரு வருடம் கடந்த நிலையில், இவ்வருடம் அந்த நிலங்களில் செய்கை பண்ணச் சென்றபோது இது அவர்களுக்குத் தெரியவந்தது. இருந்த போதிலும் அந்த மக்களுக்குத் தற்காலிக வீடுகளோ மற்றும் அடிப்படை வசதிகளோ இதுவரை வழங்கப்படவில்லை. அதேநேரம் அந்த வயல் நிலத்தையே நம்பி வாழ்கின்ற இவர்களின் வாழ்வாதாரம், தொழில் முதலிய சகல வசதி வாய்ப்புக்களும் பாதிக்கப்பட்டிருக்கின்றன. ஆகவே, இந்த நிலைமை தொடரக்கூடாது. ஒரு பக்கத்தில் மக்களை மீள்குடி யேற்றுவதாகவும் அவர்களுக்கான வாழ்வாதார உதவிகளைச் செய்வதாகவும் சொல்லிக்கொண்டு, மறுபக்கத்தில் இப்படி யான வேலைகளைச் செய்வதை அரசாங்கம் நிறுத்த வேண்டும். ஆகவே, அங்கு சிங்கள மக்கள் அத்துமீறிக் குடியேறி விவசாயம் செய்வது குறைந்தபட்சம் இவ்வருடம் காலபோகத் துடனாவது நிறுத்தப்பட்டு, அந்தக் காணிகள் மீண்டும் அந்தத் தமிழ் மக்களிடம் ஒப்படைக்கப்பட வேண்டுமென நான் இந்த நேரத்திலே உங்களிடம் விநயமாக வேண்டுகின்றேன்.

இப்பொழுது இங்கே கௌரவ அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் இருக்கின்றார். அவர் பல தடவைகள் முல்லைத்தீவுக்கு விஜயம் செய்திருக்கின்றார். இன்று தென் பகுதியைச் சேர்ந்த சிங்கள மீனவர்கள் அங்கு கொக்கிளாய் பகுதியிலே வந்து மீன்பிடிக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, அங்கு பத்து - பதின்மூன்று குடும்பங்களைத் தவிர வேறு யாரையும் அனுமதிக்கக்கூடாது என்று நீங்கள் உத்தரவிட்டிருக்கின்றீர்கள். அந்த வகையில் நீங்களும் உங்களுடைய அமைச்சும் சரியான முறையில் நேர்மையாக வேலை செய்தாலும் இன்று பெருந்தொகையான சிங்கள மீனவர்கள் உங்களுடைய சொல்லை மீறி, அங்கு வந்து சட்டவிரோதமான முறையில் வலைகளைப் பாவித்து மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்றார்கள். இதனால் அந்த இடம்பெயர்ந்த மக்களின் தொழில் பாதிக்கப்பட்டுள்ளது. அதேநேரம் சட்டவிரோதமான முறையில் தொழில் செய்கின்றவர்களுக்கு அங்கிருக்கின்ற படைத்தரப்பினர் சகல விதத்திலும் பாதுகாப்புக் கொடுப்பதாக அந்த மக்கள் முறையிடு கின்றார்கள். ஆகவே, அவ்வாறு தொழில் செய்பவர்களைத் தடைசெய்து, தயவுசெய்து நீங்கள் அந்த மக்களின் வாழ்வா தாரத்துக்கு ஆவன செய்ய வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து கால்நடை வளர்ப்பைப் பொறுத்தமட்டில், வன்னி மாவட்டத்தில் 75 சதவீதமான மக்கள் ஆடு, மாடு மற்றும் கோழி வளர்ப்பில் ஈடுபடுகின்றார்கள். ஆனால், குறித்த திணைக் களத்தில் ஆளணி, கட்டிடம், வாகனம் போன்ற பல்வேறு தேவைகள் ஈடுசெய்யப்படாமல் இருக்கின்றன. ஆகவே, அந்தக் குறைபாடுகள் நிவர்த்தி செய்யப்பட வேண்டும். மேலும், வன்னி மாவட்டத்தில் இருக்கின்ற ஆயிரத்துக்கும் மேற்பட்ட குளங்களில் நன்னீர் மீன் உற்பத்தியைப் பெருக்குமுகமாக அக்குளங்களில் மீன் குஞ்சுகளை விடுவதற்கும் அங்கு நன்னீர் மீன் வளர்ப்புத் திட்டங்களை முறையாக முன்னெடுப்பதற்கும் நடவடிக்கை எடுக்குமாறு கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Alhaj A.H.M. Azwer will now take the Chair.

***අනතුරුව ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. PERUMAL RAJATHURAI *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 2.12]

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ප්‍රදේශයක් නියෝජනය කරන මා හට කථා කරන්න මේ විනාඩි කිහිපය මදි කියලා මා හිතනවා.

රටේ සම්පත් රට තුළ රැක ගැනීමේ මහින්ද චින්තන ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින්, ධීවර ජනතාවට නැංගුරම් තොටුපොළවල් ලබා දීමට සහ ධීවර ජනතාව ශක්තිමත් කිරීමට මෙවර මිලියන 2,000කට වැඩි මුදලක් වෙන් කිරීමට ගත්ත පියවර පිළිබඳව ජනාධිපතිතුමාට මා පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා. එකී පරමාර්ථය පෙරදැරි කර ගනිමින් අපේ ගරු ඇමතිතුමාට අපි යෝජනා කළා, වරින්වර හමු වෙලා අපි මේ කටයුතු සම්බන්ධව සාකච්ඡා කරමු කියලා. එතුමා ඒ අනුව මේ වනකොට විශේෂයෙන්ම මීගමු ප්‍රදේශයේ ධීවර සංවිධාන සමඟත් සාකච්ඡා කරලා, මුළු ලංකාව පුරාම ඒ ධීවර සමිති ඒකරාශී කරලා, නිලධාරින් සමඟ සහෝදරත්වයෙන් කටයුතු කරමින් ධීවර ජනතාවගේ යහපත වෙනුවෙන් පියවර ගණනාවක් ඉදිරියට තබමින් ඉන්නවා.

මෙවර අය වැය ලේඛනයෙන් අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් උම්බලකඩ, කරවල වැනි ද්‍රව්‍ය ආනයනය කිරීමේදී අය කරන බදු ප්‍රමාණයත්, ඒ වාගේම ආනයනය කරන ටින් මාළුවලට අය කරන බදු ප්‍රමාණයත් වැඩි කරලා තිබෙනවා. ගරු ඇමතිතුමාගේ මූලිකත්වයෙන් මේ වන කොට රට තුළ ටින් මාළු කර්මාන්තශාලා ගණනාවක් ඇති කරලා, අපේ රටේ අපේ අයට, අපේ රටේ මාළු කෑමට ගන්න හැකි වන ආකාරයට කටයුතු කරලා තිබෙනවා. නැව්වලින් ඇවිල්ලා අපේ සාලයා, සූඩයා පිට රටට අරගෙන ගිහිල්ලා, නැවත ටින්වලට දාලා මෙහේට ගෙනෙනවාට වඩා, ඒ ටින් මාළු අපේ රටේම නිෂ්පාදනය කර ගන්න විශාල පියවරක් ගෙන තිබීම ගැන මා මේ අවස්ථාවේදී සන්තෝෂ වනවා. ටින් මාළුවල ආනයන බද්ද වැඩි කිරීම පිළිබඳවත් ගරු මන්ත්‍රීවරයෙක් බොහොම වේදනාවෙන් කථා කළා මා අහගෙන හිටියා. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළ, මේ රටේ ටින් මාළු නිෂ්පාදනය කිරීම විතරක් නොවෙයි, සහල් ඇතුළු අනෙකුත් වුවමනා ද්‍රව්‍ය -ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන් හැම දෙයක්ම- ලංකාවේම නිෂ්පාදනය කර ගන්නා වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා.

ඒ වාගේම මාළු පිළිබඳවත් අපි මීට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ගැන මේ වන කොට සාකච්ඡා කරගෙන යනවා. පිට රටින් ගෙන එන මාළුවලටත් බදු අය කිරීමේ ක්‍රමයක් හදලා, ඒකටත් තහංචි දමන වැඩ පිළිවෙළක් හැදුවොත් අප තවත් ශක්තිමත් වනවා කියලා මා හිතනවා.

පසු ගිය වාරයේ ගරු ඇමතිතුමා සමඟ පැවැති සාකච්ඡාවේදී එතුමා එක්ක අපේ පොඩි මත ගැටුමක් ඇති වුණා. ඒක සහෝදරත්වයේ මත ගැටුමක්. දැන් ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඒක පොඩ්ඩක් අවුස්සන්න හැදුවා. නමුත් ඒ මත ගැටුම ඇති වුණේ මොකක් නිසාද? අපි ධීවරයා වෙනුවෙන් කථා කළ නිසා. ජනතාව අප පාර්ලිමේන්තුවට එවා තිබෙන්නේ පුටු උඩ ඉඳගෙන හැම එකටම "හා" කියන්න නොවෙයි. ධීවරයාට ප්‍රශ්නයක් ඇති වුණාම අපි පාර්ලිමේන්තුව තුළ ඒ වෙනුවෙන් හඬ නඟන්නේ ඒ අවශ්‍යතා ඉටු කර ගන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ මාළු විකුණා ගන්න බැරි කාලවලදී, ඒකට අවශ්‍ය පියවර ගන්න බැංකු හා සාකච්ඡා කරලා ධීවර සංස්ථාවට අවශ්‍ය ණය පහසුකම් සලසා දීම මඟින් ධීවරයා දිරිමත් කරන්න, ධීවර සමිති දිරිමත් කරන්න මේ වන කොට ගරු ඇමතිතුමා වැඩ පිළිවෙළක් සලසා ගෙන යෑම පිළිබඳව මා එතුමාට ස්තුතිවන්ත වනවා.

ඒ තුළින් අපට ඉතාම හොඳ මාළු කෑල්ලක් අතරමැදියාගෙන් ගන්නේ නැතිව, ධීවරයා ළඟට ගිහිල්ලා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදා ගන්න පුළුවන්.

ඊට අමතරව, අද ධීවර ක්ෂේත්‍රයත් "දිවි නැඟුම" හරහා සම්බන්ධීකරණය කරන වැඩ පිළිවෙළක් සකසා ගැනීමේ හැකියාව තිබෙනවා. අද අපේ රටේ මත්ස්‍ය කර්මාන්තය තුළින් නිපදවන මාළු -කරවල, ටින් මාළු, ජාඩි විතරක් නොවෙයි- කල් තබා ගැනීමට හැකි පාරම්පරික ක්‍රම අපේ ධීවරයා ළඟ තිබෙනවා. පළාත් සභා තුළින්, ධීවර සංස්ථාව තුළින්, ධීවර අමාත්‍යාංශය තුළින්, නාරා ආයතනය තුළින් මේ පිළිබඳ සමීක්ෂණ කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපේ නිලධාරින්ට පුළුවන් මීට වඩා ධීවර ජනතාවත් එක්ක, ධීවර සමිතිත් එක්ක සම්බන්ධ වෙලා මේ පරීක්ෂණවලින් සොයා ගත්ත දැනුම ධීවරයාට ලබා දීලා, ධීවරයාව නඟා සිටුවන්න කටයුතු කරන්න.

උදාහරණයක් විධියට එක කාරණයක් කියන්න පුළුවන්. අපේ මීගමු කළපුවේ සහ අනෙක් කළපුවල එක කාලයකට "කොස්සා" කියන මත්ස්‍යයා විශාල ලෙස බීජ දමනවා. මේ කොස්සා පැටවුන් යම් යම් ව්‍යාපාරිකයෝ විශාල මුදලකට මිලදී ගන්නවා. එහෙම අරගෙන විදේශ ගත කරනවා. නමුත් මේ කාර්යය මීට වඩා ක්‍රමවත් විධියට කරන්න පුළුවන් කොහොමද කියලා අපි බලන්න ඕනෑ.

ඒ වාගේම මම ගරු ඇමතිතුමාට කිව්වා පොකිරිස්සා ගැන කාරණයක්. මේ වන විට මගේ ගම් ප්‍රදේශයේ තරුණයෙක් පොකිරිස්සන් බීජවලින් පැටවුන් ලක්ෂ ගණනක් බෝ කරලා, ඒ පැටවුන්ගේ ජීවත්වීමේ හැකියාව කොයි තරම්ද කියලා සොයා ගෙන තිබෙනවා. අපි ඒ වාගේ තරුණයන් ඉදිරියට ගේන්න ඕනෑ. මොකද, පොකිරිස්සා කියන්නේ අද ලෝකයේ විශාල ඉල්ලුමක් තිබෙන, විශාල ධනයක් උපයන්න පුළුවන් මාළුවෙක් නිසා. මේ වාගේ තවත් මත්ස්‍යයන් ඉන්නවා. මොදා, කොස්සා, ආඳා වැනි ලංකාව තුළ සිටින මත්ස්‍යයන් සම්පතක් ලෙස වර්ධනය කර ගන්නා වැඩ පිළිවෙළක් අපට මේ නිලධාරින් ලවා කර ගන්න පුළුවන්. ධීවර අමාත්‍යාංශයේ වේවා, ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යාංශයේ වේවා මේ ඕනෑම අමාත්‍යාංශයක නිලධාරියා තමයි ගරු ඇමතිතුමාට මඟ පෙන්වන්නා, ප්‍රධානියා වෙන්න ඕනෑ. ඒ නිලධාරියාට ඒ පිළිබඳව දැනුම් සම්භාරයක් තිබෙන්නට ඕනෑ.

මම අහගෙන සිටියා, අද අපේ මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමා මාදැල් සම්බන්ධ ප්‍රශ්නයක් කථා කළා. ලංකාවේ ධීවර ඉතිහාසය පටන් ගත්තේ මාදැලෙන්. මාදැල් මාළුවා තමයි ඉතාම රසවත්ම මාළුවා. ඒ මාළුවා පණ පිටින් ගොඩට ගෙනැත්, කිසිම විෂ බීජයක් ඇතුළු වෙන්නේ නැතිව පැය ගණනක් තුළ බෙදා හරින්නට පුළුවන්. නමුත් අද මාදැල් කර්මාන්තයට කන කොකා හඬන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. අද යාන්ත්‍රික බෝට්ටු නිසා මාදැල් කර්මාන්තයට ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. මගේ ප්‍රදේශයේ ධීවර ජනතාව කියන්නේ මහා පරිමාණයෙන් වැලි ඉවතට ගැනීම නිසා මාදැල් කර්මාන්තයට මේ හානිය සිද්ධ වෙනවා කියලායි. අද ඒ ප්‍රදේශයේ තිබෙන ගල්, වැලිවලින්

[ගරු සරත් කුමාර ගුණරත්න මහතා]

වැහෙන්නේ නැති නිසා මාදැල් වට කරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම කුඩා බෝට්ටු මාදැල් වට කරන වෙලාවට ඇවිල්ලා, මාදැලට එන මාළු රැළට බාධා වන පිළිවෙළට දැල් එළලා මාදැල්වලට එන මාළු අඩු කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ නිසා අපේ ධීවරයන් විශාල පිරිසක් යැපෙන පාරම්පරික මාදැල් කර්මාන්තයටත් යම් කිසි වැඩ පිළිවෙළක් නිලධාරින් යොදවලා ක්‍රියාත්මක කරන්න කියලා විශේෂයෙන් මම අපේ ගරු ඇමතිතුමාට යෝජනා කරනවා.

ඊට අමතරව ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙරළ සංරක්ෂණ කාර්යය අයිති නොවුණත්, වෙනත් අමාත්‍යාංශයකට ඒ කාර්යය පැවරී තිබුණත්, "ධීවර" කියන වචනයත් එක්කම අපට එය බල පානවා. මේ වන විට මීගමුවේ සිට පුත්තලම දක්වා මුහුදු තීරයේ ධීවරයා වෙරළ ඛාදනය නිසා බොහොම අඩ පණ තත්ත්වයට පත් වෙලා සිටිනවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මීට මාස ගණනකට පෙර උස්වැටකෙයියාව වෙරළට ඇවිල්ලා, මුහුදු වැලි ගොඩට ගෙන එන මහා යන්ත්‍රයක් අරගෙන ඇවිත් පරීක්ෂණයක් කළා, වෙරළට වැලි දාලා වෙරළ පුළුල් කරන්නේ කොයි ආකාරයටද කියලා. අපි ඒ කටයුත්ත මීටර් ගණනවක් තුළ කරලා ඉතා සාර්ථක ප්‍රතිඵල ලැබුවා. අපි එතැනදී දැකපු දේ තමයි, දියඹින් වැල්ල අරගෙන ඒම තුළ, වැල්ල වෙරළට ඒමෙන් වැළකෙන බව; ගල්, වැලිවලින් නොවැසෙන බව. ඒ වැල්ල සම්පූර්ණයෙන්ම ඒ මුහුදු තීරය තුළයි කරකැවෙන්නේ. උදාහරණයක් කිව්වොත්, උස්වැටකෙයියාවේ ඉඳලා දුංගල්පිටිය, සෙත්තපප්පාඩුව, මීගමුව දක්වාම වෙරළ තීරයේයි ඒ වැලි කරකැවෙන්නේ. ඒ නිසා ඒ වැඩ පිළිවෙළට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරනවා කියලා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා පොරොන්දු වුණා. එහෙම නැතිව තාවකාලික ගල් වැටියක් දැමීම තුළින්වත්, වැලි ගෝනි-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ඒ සඳහා රුපියල් මිලියන 400ක් වෙන් කරලා තිබෙනවා.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
ඒ සඳහා රුපියල් මිලියන 400ක් වෙන් කිරීම ගැන ඉතාම සන්තෝෂයි. මම හිතනවා ඒ තුළින් අපට විශාල ප්‍රයෝජනයක් ලැබෙයි කියලා. ඒ වාගේම සුරතල් මසුන් ඇති කිරීමේ වැඩ පිළිවෙළවල් තිබෙනවා. මම ගරු ඇමතිතුමාට මතක් කර සිටිනවා, ධීවර සංවිධාන සමඟ කරන සාකච්ඡා ලබන වසර තුළත් වරින් වර සිදු කළොත් ඔබතුමා යන මේ ගමනට විශාල හයියක්, ශක්තියක් ලැබෙයි කියලා. අපි ඒ සඳහා ඔබතුමාට සහයෝගය දක්වන්නට සූදානම්. ඒ සහයෝගයත් ලබා ගෙන මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න.

මීගමුව ධීවර දිස්ත්‍රික්කයේ වෙරළ තීරයේ දිග කිලෝමීටර් 40ක් -කැළණි ගං මෝයේ සිට මා ඔය දක්වා- වන අතර මීගමුව, ජා ඇල, වත්තල සහ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මෙම ධීවර දිස්ත්‍රික්කය තුළට අයත් වේ. මෙය, ධීවර ජනගහනය 38364 කින්ද, ධීවර පවුල් 8266 කින්ද, සක්‍රිය ධීවරයින් 9500 කින්ද, අඩු ආදායම්ලාභී ධීවර පවුල් 3789කින්ද, ධීවර ගම්මාන 82 කින්ද, ග්‍රාමීය ධීවර සංවිධාන 55කින්ද, ධීවර පරීක්ෂක කොට්ඨාස 13කින්ද, ධීවර තොටුපළ 112 කින්ද, ධීවර වරායන් 01කින්ද, ක්‍රියාත්මක අයිස් යන්ත්‍රාගාර 13 කින්ද, මත්ස්‍ය අපනයන කර්මාන්තශාලා 17කින්ද, යාත්‍රාංගන 19කින්ද, බහුදින ධීවර යාත්‍රා -IMUI- 148 කින්ද, එක් දින යාත්‍රා -1 DAY- 115කින්ද, පිටත එංජින් සහිත යාත්‍රා -OFRP- 1828කින්ද, යාන්ත්‍රික නොවන පාරම්පරික යාත්‍රා -NTRB- 1698කින්ද, යාන්ත්‍රික පාරම්පරික යාත්‍රා -MTRP- 05කින්ද, මා දැල් -NBSB- 30 කින්ද සමන්විත වෙයි.

මීගමුව ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා මා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනවා.

01. වර්තමානයේ ශ්‍රී ලංකා මුහුදු තීරය තුළ අල්ලනු ලබන මත්ස්‍ය සම්පත් මීගමුව මත්ස්‍ය වෙළඳ සැලට ගෙන ඒම නිසා මීගමුව ප්‍රදේශයේ රැකියාව කරන ධීවරයාට තමන්ගේ නිෂ්පාදනවලට නිසි මිලක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මීගමුව ධීවර කර්මාන්තය විශාල ලෙස කඩා වැටී ඇති අතර තරුණ ධීවරයින් කර්මාන්තයෙන් ඉවත්වීමත් තම තරුණ ධීවර පුතුන් මෙම තත්ත්වයන් තුළ කර්මාන්තයට ඇතුල් නොවීමත් හේතුවෙන් ඉදිරියේදී මීගමුව ධීවර කර්මාන්තය විශාල ලෙස කඩා වැටීමට ලක්වීමක් සිදු වී ඇති බැවින් මීගමුවට පිටතින් ගෙනෙන මසුන් අලෙවිය නතර කිරීම.

02. ලංකා ධීවර සංස්ථාවේ සෘජු මැදිහත්වීමෙන් එම සංස්ථාවට අවශ්‍ය මත්ස්‍ය ප්‍රමාණ මිලදී ගැනීමේදී ධීවර කාර්මිකයාගෙන්ම ලබා ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් වශයෙන් රුපියල් ලක්ෂ 50 පමණ මුදලක් ක්‍රියාත්මක ධීවර සමිතිවලට ලබා දී අතරමැදි තැරැව්කරුවන්ගෙන් ධීවර කාර්මිකයා ආරක්ෂා කර වැඩි මිලකට මසුන් අලෙවි කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම.

03. මත්ස්‍ය අස්වැන්න බහුල කාල සීමාවන්වලදී පිට රටින් මසුන් මෙරටට ගෙන ඒම තහනම් කර දේශීය ධීවර ආරක්ෂා කර ගැනීම සඳහා නව අණ පනත් හා නීති ඇති කිරීම.

04 සුන්දර මීගමුව කලපුව අද වන විට විවිධ හේතූන් මත ගොඩ කිරීම සිදු වන අතර එය වැළැක්වීමට නිසි නීති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් දිනෙන් දින කලපුව ගොඩ කිරීම සිදු වන බැවින් එම කටයුතු නතර කර කලපු ධීවරයා ආරක්ෂා කිරීම සඳහා නව නීති රීති ඇති කිරීම.

05. කලපු ධීවර කර්මාන්තයට ධීවර සහනාධාර ක්‍රමයක් ඇති කිරීම

06. සුළු පන්න ධිවරයින් සඳහා තම යාත්‍රා හා දැල් පන්න ආදිය සඳහා සහනාධාර වැඩ පිළිවෙළක් ඇති කිරීම හා මා දැල් ධීවරයින් සඳහා විශේෂ ණය ක්‍රමයක් ඇති කිරීම

07. බහු දින ධීවර කර්මාන්තය සඳහා කෙටි කාලීන ණය ක්‍රමයක් සකස් කර දීම බහුදින ධීවර යාත්‍රා රැකියාවට පිටත් කිරීමේදී ඇති වන කෙටි කාලීන ණය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කෙටි කාලීන ණය ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් ඇති කිරීම.

08. බහුදින ධීවර යාත්‍රා රක්ෂණය කිරීම දිස්ත්‍රික්කය තුළ ඇති සියලුම ධීවර යාත්‍රා එක් රක්ෂණ ආයතනයකින් රක්ෂණය කිරීම හා තමා අයත්ව සිටින එම ධීවර සංවිධාන මගින් එම රක්ෂණ කටයුතු සිදු කිරීම.

09. බහුදින ධීවර කර්මාන්තයේ එම යාත්‍රා සඳහා උපයෝගී කර ගන්නා නාවුක උපකරණ රේඩියෝ සෙටලයිට් ඇතුළු ධීවර උපකරණ නව යාත්‍රාවේ ලියාපදිංචිව පිටරටින් ගෙන ඒමට අවසර ලබා දීම.

10. සුළු පන්න ධීවරයින්ට හා මා දැල් ධීවරයින්ට රැකියා කිරීම නොහැකි වන පරිදි සිදු කරන මුහුදෙන් වැලි ගැනීම හේතු කොට ගෙන ස්වාභාවික මුහුද පතුලේ ගල් මතුවීම නිසා ධීවර කර්මාන්ත නිසි අයුරින් සිදු කිරීමට නොහැකි වීම මත එම ධීවරයින් තම රැකියාව කර ගෙන යාමට නොහැකි වී ඇති බැවින් මුහුදේ වැලි හැරීම නතර කිරීමට වැඩ පිළිවෙළක් ඇති කිරීම.

11. පිට රට යවන ටූනා වැනි මත්ස්‍යයින්ගේ මිල මට්ටම ස්ථාවරව තබා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් ඇති කිරීම (ඒකාධිකාරී වෙළඳ පොළ බිඳ දැමීම සඳහා)

12. කරවල නිෂ්පාදකයින් මසුන් වැඩි කාලයට පිට රටින් කරවල ගෙන ඒම තුළ දේශීය ධීවරයාට තම නිෂ්පාදන අලෙවියට අපහසු වීම.

13. තහනම් පන්න තුළින් ධීවර සම්පත් විනාශ කිරීම නතර කිරීම හා එම නීතිවිරෝධි වැඩ පිළිවෙළවල් නතර කිරීම සඳහා සයුරු ආරක්ෂක වැඩ පිළිවෙළක් ඇති කිරීම

14. මෙම කාලය තුළ විදේශ රටවලට අපගේ බහුදින ධීවර යාත්‍රා අත් අඩංගුවට ගෙන තිබීම හා එම යාත්‍රා රාජ සන්තක කර ඇති බවට දැන ගැනීමට ලැබී ඇති අතර පෙරසේම රජය මැදිහත්ව එම යාත්‍රා නිදහස් කර ගැනීම සඳහා ක්‍රියා කිරීම.

15. මීගමුව මත්ස්‍ය වෙළඳ පොළවල පහසුව සඳහා රථ ගාලක් ඇති කිරීමට ප්‍රතිපාදන වෙන් කර දීම හා එය කඩිනමින් ඉදි කිරීම.

16. ජල මට්ටම ඉහළ යන කාලයේදී මෝය පිටාර ගැලීම නිසා සෑම වසරකම සිදු වන ජීවිත හා දේපළ විනාශ වීම වළකා ගැනීමට මීගමුව කම්මල්තොට මෝය හාරා පුළුල් කර දී එම ධීවරයින්ට අපහසුතාවයකින් තොරව තම රැකියාව කර ගෙන යාමට අවස්ථාව සලසා දීම.

17. මීගමුව වැල්ලවිදිය ප්‍රදේශයේ ගොඩ ගල මත ජැටියක් ඉදිකර දී එහි නැංගුරම් පොලක් ස්ථාපිත කර විශාල යාත්‍රා ප්‍රමාණයක් එකවර ගාල්කර තැබීමට හා එය සංචාරකයින්ටද පරිහරණය කර හැකිවීම මත ප්‍රතිලාභ රැසක් ද අත්වීම හේතුවෙන් එම ජැටිය ඉක්මනින් සාදා දීම.

18. ධීවර ක්ෂේත්‍රයේ ඇති ප්‍රධාන පෙළේ ආදායම් උත්පාදන මාර්ගයක් වන ඉස්සන් ජලජීවී වගාවට අවශ්‍ය ණය අරමුදල් ලබා දීම හා දැනට යහපත් තත්ත්වයේ ඉල්ලීමක් පවතින හේතුවෙන් එම කර්මාන්තය දිරිගැන්වීම සඳහා අවශ්‍ය සහන ක්‍රම මඟ පෙන්වීම් ලබාදීම හා කර්මාන්තයට අලුත් ආයෝජනයන් හඳුන්වා දීම.

19. දැනට දමා ඇති ගල්වැටිය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පළගතුරේ ධීවර තොටුපලේ ධීවරයින්ට දැඩි අවදානම් තත්ත්වයට මුහුණ දීමට සිදු වී ඇත. එම නිසා පළගතුර ධීවර තොටුපළේ දමා ඇති ගල්වැටිය තව මීටර් 100ක පමණ දුරක් දික්කර දීම.

20. මීගමුව ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය නිරීක්ෂණය කර ගැටලුකාරී තත්ත්වයන් සඳහා යෙදිය යුතු පිළියම් සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තාවක් පිළියෙල කිරීම

21. ධීවර වැඩිහිටියන් සඳහා යම් විශේෂ මාසික ආධාරය ලබා දීම.

22. ධීවර ජනතාවගේ මූල්‍ය තත්ත්වය උසස් කිරීමටත් ඉතිරි කිරීම හා තැන්පතු ක්‍රම පිළිබඳව ධීවර ජනතාව උනන්දු කිරීමටත් කෙටි කාලීන ණය පහසුකම් ලබා ගැනීමටත් හැකි වන පරිදි දිස්ත්‍රික් ධීවර බැංකු ක්‍රමයක් හඳුන්වා දීම.

ලංකාවේ සම්පත්, ලංකාවේ රැක ගන්නා අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ චින්තනය සාර්ථක කර ගන්න ඔබතුමාට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ස්තුතියි. ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ. භා. 2.20]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. අපි සියලු දෙනාම එකඟ වෙනවා, ධීවර කර්මාන්තය කියන්නේ ශ්‍රී ලංකාවට ඉතාම වැදගත් කර්මාන්තයක් කියා. ඒ වාගේම අප රට වටා තිබෙන මුහුදු සීමාවත් එහි සම්පතුත් ආරක්ෂා කිරීම රජයේ වගකීමක් වෙනවා. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය කියන්නේ ඉතාම බලගතු අමාත්‍යාංශයක්. නමුත් මෑත කාලයේදී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයෙන් එක් එක් අංශ අඩු කර තමයි තිබෙන්නේ. අපට හොඳ ඇමතිතුමෙක් ඉන්නවා. එතුමාට වඩ වඩා වගකීම් දීලා ඒ තුළින් ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටලු ඔක්කොම විසඳා ගැනීමට පියවරක් ගනියි කියා මා හිතනවා.

අපේ මුහුදු තීරයට ඉන්දියානු ධීවරයන් පැමිණ අපේ මත්ස්‍ය ප්‍රමාණය අරගෙන යනවා කියා මේ ගරු සභාවේ දිගින් දිගටම අවධානය යොමු කළා. ඒ වාගේම ඉන්දියානු ධීවරයන් අපේ ශ්‍රී ලංකා නාවික හමුදාවත්, ධීවර ජනතාවත් එක්ක ගැටිලා විවිධ ප්‍රශ්න ඇති කර ගෙන තිබෙනවා. ඒ වාගේම මෙම ප්‍රශ්නය ගැන දිගින් දිගටම මේ ගරු සභාවේ කථා කළා. මේ ප්‍රශ්නය සම්බන්ධව ප්‍රවෘත්ති නිවේදන මා ළඟ තිබෙනවා. ඒවා මා **සභාගත*** කරනවා.

මේ ප්‍රශ්නය දිගින් දිගටම ඇදීගෙන යන බව අපට පෙනෙනවා. මෙයට පිළිතුරක් අවශ්‍යයි. ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකාව එක් වෙලා එකාබද්ධව පිළිතුරක් දීම අවශ්‍යයි. ඔබතුමන්ලා දන්නවා, තමිල්නාඩු ප්‍රාන්තයේ දේශපාලන පසුබිම හරහා අද අපේ කච්චතිව් දූපත පවා ඒ ගොල්ලන්ට ආයෙමත් ගන්න කියා බලපෑම් කර ගෙන යන බව. මෙය ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් ලෙස සලකා එයට විසඳුමක් දෙන්න කියා මම මේ අවස්ථාවේදී සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

ඉන්දියන් ධීවරයෝ පමණක් නොවෙයි එන්නේ. අපිට දැන ගන්න ලැබුණා, 2012 අගෝස්තු 5 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාව නිවේදනයක් නිකුත් කරමින් නැඟෙනහිර වෙරළේදී චීනයේ යාත්‍රා දෙකක් අත් අඩංගුවට ගත් බව. ඒ යාත්‍රා දෙකේ චීන ජාතිකයන් 38දෙනෙකුත් ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකුත් සිටියාය කියා වාර්තා වුණා. අන්තිමට මොකද වුණේ? අපේ රටේ නීතිය ශ්‍රී ලාංකිකයන්ටයි ඒ චීන ජාතිකයන්ටයි එක සේ ක්‍රියාත්මක වුණාද? නැහැ. අපේ ශ්‍රී ලාංකිකයන්ව අධිකරණයට ඉදිරිපත් කළා. ලක්ෂයක ඇප මත තමයි ඔවුන් නිදහස් කළේ. නමුත් එදා ඒ චීන ජාතිකයන්ව තානාපති කාර්යාලයට භාර දීලා තිබුණා. අපි අහනවා, මේ වාගේ නීති දෙකක් ක්‍රියාත්මක කිරීම තුළින්, වෙනත් රටවලින් අපේ මුහුදු සීමාවට ඇවිත් අපේ මත්ස්‍ය සම්පත කොල්ල කන එක නවත්වන්න පුළුවන්ද කියා. අපේ ධීවරයෝ වෙනත් රටවලට ගිහින් ඔවුන් අතින් යම්කිසි නීති විරෝධී ක්‍රියාවක් සිදු වුණාම අපේ ධීවරයන්ට අවුරුදු ගණනාවක් ඒ හිර ගෙවල්වල

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

ලගින්න සිදු වෙනවා. නමුත් අපි පිළිගන්නවා, චීනය කියන්නේ වැදගත් රටක් බව. ඒ චීනයෙන් අපට ආධාර ලැබෙනවා. නමුත් යම්කිසි වරදක් වුණා නම් නීතිය එක සේ ක්‍රියාත්මක කරන්න ඕනෑ. චීන ජාතිකයන්ව නිදහස් කිරීමයි ශ්‍රී ලාංකිකයන්ට දඬුවම් කිරීමයි වැරැදියි කියා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම නොවැම්බර් 15 වන දා යුරෝපා සංගමයෙන් නිවේදනයක් නිකුත් කර තිබෙනවා. එහි කියා තිබෙනවා, අපේ ලංකාව ඇතුළු රටවල් 8ක් නීති විරෝධී ලෙස ජාත්‍යන්තර මුහුදේ මසුන් මැරීමට ගොස් අපට අනතුරු හැඟවීමක් කර තිබෙන බව.

එහිදී කියා තිබෙනවා, යුරෝපා සංගමය අපේ රටත් එක්ක දිගින් දිගටම සාකච්ඡා කරලා, නීති විරෝධී ලෙස මසුන් මැරීමේ කටයුතු තහනම් කරන්න කිව්වත්, මේ රජය මන්දගාමී ලෙස ඒ කටයුතු කරන නිසා අපට මේ අනතුරු ඇඟවීම කර තිබෙන බව. ඒ විතරක් නොවෙයි. ඉදිරියේදී මේ ක්‍රියාවලිය නතර නොවුණොත් ඒ මඟින් තහංචි පැනවීමට පවා ඉඩ ඇති බව මේ නිවේදනයේ සඳහන් කරනවා. මේ නිවේදනයත් මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප දන්නවා, මේ රජය ඉස්සරත් GSP Plus සහනාධාරයට පයින් ගහලා හිතුවක්කාර ලෙස වැඩ කරන්නට ගිහින් අපේ රටේ කර්මාන්තශාලාවලට විශාල පාඩුවක් සිද්ධ වුණු බව; අපේ ධීවර කර්මාන්තයට විශාල පාඩුවක් සිද්ධ වුණු බව. ඒ විතරක් නොවෙයි. "The Sunday Times" පුවත්පතේ ලිපියක් තිබෙනවා. අපේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමිය ප්‍රකාශයක් කර තිබෙනවා. එතුමිය ඇත්තටම ඒ ප්‍රශ්නය ගැන විවෘතව කථා කර තිබෙනවා. ඒක අප පිළිගන්නවා. හැම ප්‍රශ්නයක්ම එකවර විසඳන්න බැහැ. ප්‍රශ්නයක් තිබෙනවා නම් විවෘතව කථා කර එය විසඳන්නට යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. අපට අවශ්‍ය වන්නේ එයයි. සමහර වෙලාවට මේ රජයේ සිටින ඇමතිවරු මොනවා කිව්වත් පිළිගන්නේ නැහැ. ප්‍රශ්නයක් තිබෙනවාය කිව්වාට පිළිගන්නේ නැහැ. අපේ ක්‍රීඩා ඇමතිතුමාත් මෙතැන ඉන්නවා එතුමාටත් අප සුභ පතනවා. මා දැක තිබෙනවා, එතුමාත් ක්‍රීඩාවේ ප්‍රශ්න තිබෙන බව පිළිගෙන තිබෙනවා. එය ඉතාමත් වැදගත් සාධකයක්. ක්‍රිකට්වල ප්‍රශ්න තිබෙනවාය කිව්වා. අප විවාදයක් තිබ්බා, football වල ප්‍රශ්නයට. එතුමා එය පිළි අරගෙන තිබුණා. ප්‍රශ්න විසඳා ගන්න තිබෙන පළමුවන පියවර එයයි.

Indian Ocean Tuna Commission එකට ගිය වෙලාවේදී අපේ රටට දෝෂාරෝපණයක් ඇවිත් තිබුණා. එයට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාය කියා ඇමතිතුමා කිව්වා. එය ඉක්මනින් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ක්‍රියාත්මක කළේ නැත්නම් ඒ Commission එකේදී අපට වෙනත් රටවලින් චෝදනා එල්ල වෙන්න ඉඩ තිබෙනවා. එයින් ජාත්‍යන්තර මුහුදේ මසුන් මැරීමට යන අපේ ධීවරයන්ට අසාධාරණයක් සිදු වන්නට ඉඩ තිබෙනවා. එම නිසා ඒ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරන ලෙස මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප හිතන හැටියට ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය දියුණු කළ හැක්කේ ධීවරයා ශක්තිමත් කිරීමෙනුයි. මොකද, දිගු කාලීන සාම්ප්‍රදායික කර්මාන්තයක් හැටියට මේ ධීවර කර්මාන්තය පවත්වාගෙන ගියා. අසූව දශකයේදී මේ ධීවර කර්මාන්තය යාන්ත්‍රීකරණය කරන්නට කටයුතු කළා. සහනදායී පදනම මත බෝට්ටු, දැල්, එන්ජින්, ආම්පන්න ආදිය දී ලබා දී යාන්ත්‍රීකරණය කළා.

යාන්ත්‍රීකරණයෙන් අපේ මත්ස්‍ය අස්වැන්න විශාල ලෙස වැඩි වුණා. යුද්ධය තිබුණු නිසා උතුරු නැඟෙනහිර මුහුදු ප්‍රදේශ අපට අහිමි වුණා. ඒ නිසා ධීවර කර්මාන්තය පහළට වැටුණා. නමුත් දිගටම යාන්ත්‍රීකරණය වුණා. මා හිතන හැටියට අද අවශ්‍යතාව වන්නේ මෙයයි. නොයෙකුත් පරිසර දූෂණ සිදු වන නිසා මසුන් අඩු වීම වැනි කාරණා මුල් කරගෙන, දැනට ධීවරයෝ යන ප්‍රදේශවල මසුන් අඩු වන්නට පටන් ගෙන තිබෙනවා. එම නිසා ධීවරයන්ට ගැඹුරු මුහුදට යන්නට සිදු වෙලා තිබෙනවා. ගැඹුරු මුහුදට යන්නට අපේ දුප්පත් ධීවරයාට බෝට්ටු, දැල් ආදිය ගන්නට ආයෝජනයක් කරන්න සල්ලි නැහැ. රජයේ ප්‍රතිපත්තියක් ලෙස මේ සඳහා ආයෝජනය කරනවාය කියා තීරණයක් ගන්න ඕනෑ. ඒ සඳහා මුදල් වෙන් කර, ධීවරයාට ගැඹුරු මුහුදට යන්නට අවශ්‍ය බෝට්ටු, දැල් ආදිය සහනදායී පදනම මත ලබා දෙන්නට ඕනෑ. ඒවා ලබා දෙන්නට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

මේ අය වැය ලේඛනයෙන් ධීවරයාට දී තිබෙන සහන මොනවා ද කියා බලන්න. මම Sri Lanka Customs එකේ website එකට ගිහින් බැලුවා, එක් එක් ධීවරයා පාවිච්චි කරන එන්ජින් වර්ග, දැල් වර්ග ඒ වාගේම බෝට්ටු හදන්න තිබෙන අමු ද්‍රව්‍ය සඳහා බදු පනවා තිබෙන්නේ කොහොමද කියා.

මම හිතන්නේ ධීවරයාට අවශ්‍ය වෙන මේ ආම්පන්නවලට බදු පනවන එක අසාධාරණයි. මොකද ඒ ධීවරයා අද ඉතාම අමාරුවෙන් තමයි රස්සාව කරගෙන යන්නේ. ධීවරයා ඒ දුප්පත්කමින් මුදාගන්න නම්, ඔහු සමාජයේ තව තවත් ඉහළ මට්ටමකට ගේන්න නම් අප ධීවරයාට මීට වඩා අත හිත දෙන්න ඕනෑ. බලන්න, අද ධීවර දැල්වලට බදු පනවන හැටි. අද ධීවර දැල්වලට සියයට 15ක Customs' duty එකක් අය කරනවා. සියයට 10ක surcharge එකක් ගන්නවා. ඒ වාගේම ධීවර දැල්වලට VAT එක සියයට 15යි; PAL එක සියයට 3යි; SRL එක සියයට 1යි. ඊළඟට බෝට්ටු එන්ජින් ගැන බලමු. බෝට්ටු එන්ජින්වලට අද Customs' duty වශයෙන් සියයට 2.5ක් අය කරනවා; surcharge එක සියයට 10යි; VAT එක සියයට 15යි; PAL එක සියයට 3යි; SRL එක සියයට 1යි.

අපට මේ අවස්ථාවේදී මේ racing carsවලට පනවන බදු අඩු කරන්න පුළුවන් නම්, මිහින් එයාර් වැනි තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නඟන බංකොලොත් ගුවන් සමාගම් පවත්වාගෙන යන්න පුළුවන් නම් මේ බදු අඩු කරන්න බැරි ඇයි? අද නියෝජ්‍ය ඇමතිලාත් එක්ක ඇමති මණ්ඩලය 93යි. එවැනි ඇමති මණ්ඩලයක් පවත්වාගෙන යන්න පුළුවන් නම් ධීවරයාට සහනයක් දෙන්න බැරි ඇයි කියලා අප මේ අවස්ථාවේදී ප්‍රශ්න කරනවා. බලන්න, මේ බදු පනවලා අද බෝට්ටු එන්ජින් එකක් කීයක් වෙලාද කියලා. අද බෝට්ටු එන්ජින් එකක් වෙනුවෙන් ධීවරයාට ලක්ෂ තුනකට වඩා ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ රටේ සමස්ත නීතිය බිඳ වැටීමේ කර්මයත් ධීවර කර්මාන්තයට බලපාලා තිබෙනවා. අපට මතකයි, ධීවර ප්‍රශ්නයක් මුල් කර ගෙන මන්නාරම අධිකරණයට පවා ප්‍රහාරයක් එල්ල කළ ආකාරය. එතැනදී ඇමතිවරයෙක් ඒ විනිශ්චයකාරතුමාට නියෝගයක් දෙන්න ගිහිල්ලා එතුමා අමාරුවේ වැටුණු හැටි අප එදා දැක්කා. මා හිතන්නේ දහඅටවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් දේශපාලනයට යට කළ පොලීසිය හා නිලධාරින්ට මෙම ක්‍රියා කලාපය පාලනය කර ගන්න බැරි වුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, please refrain from making reference to that Mannar case because it is under *sub judice*.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

අද දේශපාලන හයිය අරගෙන නීති විරෝධීව මසුන් මැරීම දිගින් දිගටම කරගෙන යනවා. අපේ ගරු ධීවර ඇමතිතුමාත් ඒක පිළිගන්නවා ඇති. මොන නීති පැනෙව්වත්, මොන තහංචි දැම්මත් ඒ ප්‍රාදේශීය දේශපාලනඥයන්, ඒ වාගේම අනික් ඇමතිවරු ඒවා පිටිපස්සේ ඉන්න නිසා, ඒ දේශපාලන හයිය අරගෙන ක්‍රියා කිරීම නිසා අද අපේ මත්ස්‍ය සම්පත විනාශ කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. මේක දිගින් දිගටම ගියොත් -අපේ මුහුදේ තිබෙන ඒ සම්පත් ටික විනාශ වුණොත්- නැවත ඒවා හදා ගන්න එක ලේසි නැහැ. ඒ නිසා අප මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට කියනවා ඒ පිළිබඳ ක්‍රමවත් වැඩ පිළිවෙළක් හදන්න කියලා. සමහර වෙලාවට පොලීසිය පවා, ආරක්ෂක අංශ පවා ඒ ගැන මන්දගාමී ස්වරූපයකින් කටයුතු කරන බව අපට පෙනී යනවා. මොකද ඒවා නැවැත්තුවේ නැත්නම් අනික් ධීවරයොත් ඒවා ගැන බලාගෙන ඉන්නවා. ඒ ධීවරයන්ට අසාධාරණයක් වුණාම තමයි වැඩි වැඩියෙන් ධීවර උද්ඝෝෂණ, ඒ ධීවර ප්‍රශ්න -අපේ සරත් ගුණරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වා- ඉදිරියට එන්නේ. මම ඒ ගැන වැඩිය කථා කරන්නේ නැහැ.

ඊළඟට තිබෙනවා මාදැල් පිළිබඳ ප්‍රශ්නය. මා හිතන්නේ මාදැල්වලට බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රශ්න ඇති වනවා. ඒ වාගේම අනික් ධීවරයන් සමඟ ඒ මාදැල්කරුවන් ගැටීම වැනි ප්‍රශ්න ඇති වනවා. එවැනි අවස්ථාවල, සමහර වෙලාවට දේශපාලනය බලය අරගෙන බලගතු පුද්ගලයන් මේවා මැදට පැනලා අහිංසක ධීවරයන් තළා පෙළා දමලා නීතිය හරියටම ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ. ඒකේ රැකවරණය රජය භාර ගත යුතුයි. ඒ ධීවරයා ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ රජය භාර ගත යුතුයි. ඒ නීතිය හරියට ක්‍රියාත්මක කිරීමේ රැකවරණය, පොලීසියට හරියට අණ දීමේ වගකීම රජය භාර ගත යුතුය කියන කාරණය මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මට තව තත්පරයක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කරුණු ටික මුල් කරගෙන එන වසර වෙන කොට ධීවරයා දුප්පත්කමෙන් මුදාගන්න වඩ වඩාත් කටයුතු කරන්න කියමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY ] *took the Chair.*

[பி.ப. 2.36]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ தவிசாளர் அவர்களே, கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொள்ள எனக்குச் சந்தர்ப்பம் கொடுத்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவிப்பதுடன், வடபகுதி கடற்றொழிலாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள் தொடர்பான கருத்துக்களை முன்வைப்பதற்கு இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்த விழைகின்றேன்.

யுத்தத்துக்குப் பின்னர் வடக்கு, கிழக்கு மாகாணக் கடற்றொழிலாளர்களுடைய நலன்களில் அக்கறைகொண்டு அவர்களுடைய முன்னேற்றத்துக்காக உதவிய கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர் மாண்புமிகு ராஜித சேனாரத்ன அவர்களுக்கு நான் இச்சந்தர்ப்பத்தில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். யுத்த காலகட்டங்களில் பாரிய நெருக்கடிக்குள்ளாகியிருந்த கடற்றொழிலாளர்களின் வாழ்வாதாரம் இன்று படிப்படியாக முன்னேற்றமடைந்து வருகின்றது. மேதகு ஜனாதிபதி அவர்கள் சமர்ப்பித்த யுத்தத்துக்குப் பின்னான வரவு செலவுத் திட்டங்களிலே, 2013ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில்தான் வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள மக்களின் வாழ்வாதார முன்னேற்றத்துக்காகவும், குறிப்பாக அப்பிரதேச கடற்றொழிலாளர்களின் முன்னேற்றத்துக்காகவும் மேம்பாட்டுக்காகவும் எனப் பாரியளவு நிதியை ஒதுக்கீடு செய்துள்ளார். அதேபோல் கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சுக்கும் பெருந்தொகை நிதியை ஒதுக்கீடு செய்துள்ளார். அதற்காக அவருக்கு நான் நன்றி தெரிவிக்கின்றேன்.

மாண்புமிகு அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் எமது வடக்கு, கிழக்கு மாகாண மக்களின் மனங்களை நன்கறிந்தவர். அவர் இந்த அமைச்சினூடாக அம்மக்களுடைய மேம்பாட்டுக்காகத் தன்னாலியன்ற உதவிகளை எமக்கு வழங்கிக் கொண்டிருக்கின்றார். இருப்பினும் இன்னும் சில பிரச்சினைகள் தீர்க்கப்படாதவையாகத் தொடர்கின்றன. அவற்றை இந்த அவையிலே அவருடைய கவனத்துக்குக் கொண்டுவருவதனூடாக நிவர்த்தி செய்ய முடியும் என்ற எனது நம்பிக்கையை வெளிப்படுத்தி, அவ்விடயங்களை முன்வைக்க விரும்புகின்றேன்.

குறிப்பாக இலங்கையின் வடக்கு, கிழக்கு கடற்கரைப் பிரதேசங்கள்தான் கடற்றொழில் மேற்கொள்ளப்படுகின்ற பாரியளவு கடல்நீர்ப்பரப்பைக் கொண்டவையாக இருக்கின்றன. அங்குள்ள கடற்றொழிலாளர்களினால் பிடிக்கப்படுகின்ற மீன்களைச் சந்தைப்படுத்துவதில் எழுந்துள்ள பிரச்சினையானது இன்னமும் தொடர்ந்துகொண்டிருக்கின்றது. அதனை நிவர்த்தி செய்வதற்குப் பல்வேறு நடவடிக்கைகள் எடுக்கப்பட்டபொழுதிலும், தனியார் மீன் விற்பனைத் தரகர்கள் கடற்றொழிலாளர்களினால் பிடிக்கப்படுகின்ற மீன்களுக்கு நியாயமான விலைகளை நிர்ணயிக்காதிருக்கும் நிலைமை கருத்திலெடுக்க வேண்டிய விடயமாக

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

இருக்கின்றது. ஆகவே, குறிப்பாக வட மாகாணத்தில் பிடிக்கப்படும் மீன்களுக்கு நிலையான விலையை நிர்ணயம் செய்து சந்தைப்படுத்தும் வாய்ப்பை ஏற்படுத்திக் கொடுப்பதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமென வேண்டுகின்றேன்.

மேலும், இந்த வரவு செலவுத் திட்டத்தினூடாக கடற்றொழில் துறைமுகங்களின் அபிவிருத்தி என்ற அடிப்படையில், விருத்தி செய்யப்படுவதற்காகக் குருநகர் கடற்றுறைமுகம் தெரிவுசெய்யப்பட்டிருப்பதற்கு நான் நன்றி தெரிவிக்கின்றேன். அதேபோன்று மாதகல், பருத்தித்துறை, இன்பருட்டி போன்ற இடங்களிலும் கடற்றொழில் துறைமுகங்களை அமைப்பதற்கான நடவடிக்கைகளைச் சமகாலத்தில் மேற்கொள்ள வேண்டுமென நான் இங்கு வலியுறுத்துகின்றேன். அதேபோன்று கிளிநொச்சி மாவட்டத்தில் உள்ள பள்ளிக்குடா, நாச்சிக்குடா, வலைப்பாடு, கிளாலி போன்ற இடங்களில் கடற்றொழில் இறங்கு துறைகளை அமைப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டிய அவசியத்தையும் நான் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

அப்பிரதேசங்களில் தொடர்ந்தும் அமுலிலிருக்கும் 'பாஸ்' நடைமுறை அம்மக்கள் எதிர்கொள்ளும் பாரிய பிரச்சினையாக இருக்கிறது. யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டு நான்கு வருடங்களை அண்மித்துள்ள நிலையிலும் கடற்படையினரால் 'பாஸ்' நடைமுறை தொடர்ந்தும் பின்பற்றப்படுவது அங்குள்ள கடற்றொழிலாளர்களுக்கு மிகப்பெரிய அசௌகரியத்தை ஏற்படுத்திக்கொண்டிருக்கிறது. குறிப்பாக, மன்னாரிலிருந்து முல்லைத்தீவு வரையிலுள்ள பல்வேறு பகுதிகளில் தொடர்ந்தும் 'பாஸ்' நடைமுறை இருந்து வருகின்றது; இது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயம். இது கடற்றொழிலாளர்களின் தொழில் உரிமையை மறுக்கின்ற செயற்பாடாகும். எனவே, அவர்களை இரண்டாந்தரப் பிரஜைகளாக நடத்தும் போக்கு தவிர்க்கப்படவேண்டும். யாழ். மாவட்டத்திலே குறிப்பாக, நயினாதீவு, கிளாலி, சுழிபுரம், திருவடிநிலை, மாதகல் பிரதேசங்களிலும் கிளிநொச்சி மாவட்டத்திலே பூநகரி பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பகுதிகளிலும் பள்ளிக்குடா, இரணைமாதாநகர், வலைப்பாடு போன்ற பிரதேசங்களிலும் முல்லைத்தீவு, மன்னார் ஆகிய மாவட்டங்களிலும் இந்த 'பாஸ்' நடைமுறை இறுக்கமாகக் கடைப்பிடிக்கப்படுகின்றது. இது அநாவசியமான ஒரு நடைமுறையென்றுதான் நான் கருதுகின்றேன். கௌரவ அமைச்சர் அவர்கள் இவ்விடயம் தொடர்பாகப் பல்வேறு முயற்சிகளை எடுத்திருக்கின்றார். இந்த நடைமுறையானது ஒரு குறுகிய காலத்துக்கு இல்லாமல் செய்யப்பட்டாலும்கூட, மீண்டும் ஏதோ ஒரு வகையில் பின்பற்றப்படுகின்றது. எனவே, இவ்விடயத்தைக் கவனத்திலெடுத்து, இது தொடர்பாகப் பாதுகாப்பு அமைச்சுடன் பேச்சுவார்த்தை நடத்தி, அதற்கான நிரந்தரத் தீர்வொன்றினைப் பெற்றுத்தரவேண்டும் என்று நான் கௌரவ அமைச்சரவர்களிடம் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், கற்கோவளம் முதல் தொண்டைமானாறு வரையுள்ள கடலரிப்பு நிலைமையைத் தடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்படவேண்டும். இதனால் கடற்றொழிலாளர்கள் பல்வேறு அசௌகரியங்களுக்கு உள்ளாகின்றனர். அதேநேரம், கடல் நீர் கிராமங்களுக்குள் புகும் நிலைமையும் அங்கு இருக்கின்றது. கடந்த காலங்களில் இதனைத் தடுப்பதற்கு சில முயற்சிகள் எடுக்கப்பட்டாலும்கூட, அது யுத்தத்தின் காரணமாக முழுமையாக நடைமுறைப்படுத்தப்படவில்லை. எனவே, கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் உங்களுடைய அமைச்சினூடாக இக்கடலரிப்பைத் தடுப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சரவர்களே, கிளிநொச்சி மாவட்டத்தில் பள்ளிக்குடா, புளியம்பொக்கணை ஆகிய பிரதேசங்களில் ஏற்கெனவே 'ஐஸ்' தொழிற்சாலைகளை அமைப்பதற்கு நீங்கள் கொள்கையளவில் இணக்கம் தெரிவித்திருக்கின்றீர்கள். அவற்றை நடைமுறைப்படுத்த வேண்டுமென்று கேட்டுக்கொள்வதோடு, முல்லைத்தீவு மாவட்டத்திலும் 'ஐஸ்' தொழிற்சாலையொன்றை நிறுவுவதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமென்றும் கேட்டுக்கொள்கிறேன். அதனை அங்கு நிறுவுவதன்மூலம் அங்கிருக்கின்ற கடற்றொழிலாளர்களுக்கு அவர்களது உற்பத்திகளை உரியமுறையில் பாதுகாத்து, சந்தைப்படுத்தக்கூடிய வாய்ப்புக்களை ஏற்படுத்திக் கொடுக்கமுடியும். அத்துடன், அட்டைத் தொழிலில் ஈடுபட்டுள்ள உள்ளூர் கடற்றொழிலாளர்களுக்கு உரிமம் மறுக்கப்பட்டது தொடர்பாகவும் நான் உங்களது கவனத்துக்குக் கொண்டுவருகின்றேன். தற்பொழுது, தென்பகுதிகளிலிருந்து வருபவர்களுக்குத்தான் அட்டைத்தொழிலில் ஈடுபடுவதற்கு அதிக சந்தர்ப்பம் வழங்கப்படுகின்றது. உள்ளூர் தொழிலாளர்களுக்கு அந்த வாய்ப்பு மறுக்கப்பட்ட நிலைமை இருப்பதால், நீங்கள் அவர்களையும் கருத்திலெடுத்து, அவர்களுக்கும் வாய்ப்புக்களை வழங்கவேண்டுமென இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அவ்வாறே, நான் இன்னுமொரு முக்கிய விடயத்தையும் இங்கே குறிப்பிட விரும்புகின்றேன். வடமராட்சி கிழக்கிலுள்ள சுண்டிக்குளம் என்ற கடல் பிரதேசத்திலே கிட்டத்தட்ட 50க்கும் மேற்பட்ட கடற்றொழிலாளர்கள் மீள்குடியேறுவதைப் படையினர் தடுக்கின்றார்கள். இது தொடர்பாக நான் பாதுகாப்புத் தரப்பினருடன் தொடர்புகொண்டு கேட்டபோது, "அங்கு அதிகளவு கண்ணிவெடி இருப்பதனால், தற்போதைக்கு அவர்களை அங்கு மீள்குடியேறுவதற்கு அனுமதிக்க முடியாது" என்று கூறினார்கள். ஆனால், அட்டை season க்கு தென்பகுதிகளிலிருந்து வருபவர்களுக்கு சுண்டிக்குளப் பிரதேசத்துக்குச் செல்வதற்கு அனுமதி வழங்கப்படுகின்றது. உண்மையாகவே அப்பிரதேசத்தில் கண்ணிவெடி இருக்குமாக இருந்தால், யாரும் போகமுடியாத ஒரு சூனியப் பிரதேசத்துக்கு எப்படி தென்பகுதியிலிருந்து வருபவர்களுக்கு மட்டும் செல்லமுடியுமென்று எனக்குப் புரியவில்லை. இச்செயற்பாடானது, உள்ளூரிலுள்ள சில படையினரின் அனுமதியுடன்தான் இடம்பெறுகின்றது. உங்களுடைய அமைச்சு இதற்கு அனுமதி வழங்கியிருக்காது என நான் நிச்சயமாக நம்புகின்றேன். எனவே, நீங்கள் இவ்விடயத்தில் கவனம் செலுத்தி, அந்த உள்ளூர் தொழிலாளர்களுக்கும் அத்தொழிலில் ஈடுபடுவதற்கு வாய்ப்புக்களை ஏற்படுத்திக் கொடுப்பதற்கு நம்பிக்கையானதொரு தீர்மானத்தை எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

ஏற்கெனவே நான் உங்களிடம் குறிப்பிட்டதுபோல, கிளாலிப் பிரதேசத்தில் கடற்றொழிலாளர் ஓய்வு மண்டபம் அமைப்பதற்கு உங்களது அமைச்சினூடாக 30 இலட்சம் - மூன்று மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது; அதற்காக நான் நன்றி தெரிவிக்கின்றேன். ஆனால், இக்கட்டிடத்தை அமைப்பதற்கு கடற்படையினர் தடையாக இருக்கின்றார்கள். அந்தக் கட்டிடம் அமைய இருக்கின்ற இடம் யாழ்ப்பாணம் பேராயருக்குச் சொந்தமானது.

அந்த நிலத்தைக் கடற்றொழிலாளர் அமைப்புக்கு வழங்குவதாக உறுதிப்படுத்தி அவர் கடிதம் கொடுத்திருக்கிறார். கடற்றொழிலாளர் அமைப்பு அந்தக் கட்டிடத்தை அமைக்க முற்படும்போது, அது தங்களுக்கு எதிர்காலத்தில் கிடைக்கவேண்டிய நிலமென்றும் அந்த நிலத்தில் கட்டிடம் அமைக்க அனுமதிக்க முடியாதென்றும் சட்டத்துக்குப் புறம்பாக கடற்படையினர் தடுக்கிறார்கள். இது விடயத்தில் நீங்கள் பாதுகாப்பு அமைச்சுடனோ, கடற்படைத் தளபதிகளுடனோ பேசி, அவர்களுக்கு அந்தக் கட்டிடத்தை அமைப்பதற்குரிய அனுமதியைப் பெற்றுக்கொடுக்க நடவடிக்கையெடுக்க வேண்டுமென்று நான் இங்கு வலியுறுத்திக் கூறுகின்றேன்.

மேலும், மன்னார் போன்ற பிரதேசங்களில் 'டைனமைற்' போன்ற வெடிமருந்துகளைப் பாவித்துக் கடற்றொழில் செய்யும் நடவடிக்கைகளும் நடைபெறுகின்றன. இதை ஏதோ ஒரு வகையில் கட்டுப்படுத்த வேண்டும். இந்த நடைமுறை சட்டத்துக்குப் புறம்பானது; இதை அனுதிக்க முடியாது. ஆகவே, இது விடயத்திலும் நீங்கள் உரிய கவனம் செலுத்த வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

எங்கள் பகுதியிலுள்ள கடற்றொழில் திணைக்கள அலுவலகங்களில் ஏராளமான பதவி வெற்றிடங்கள் இருக்கின்றன; கௌரவ அமைச்சர் அவர்களுக்கும் அது தெரியும். அந்த வெற்றிடங்களை நிரப்புவதற்கு நீங்கள் முயற்சி எடுத்திருக்கிறீர்கள். யாழ் பல்கலைக்கழகத்தில் டிப்ளோமா பயிற்சிநெறியை முடித்தவர்களை FIs - Fisheries Inspectors- ஆக உள்வாங்குவதற்கு நீங்கள் மிகவும் முயற்சிசெய்து மந்திரி சபை அனுமதியைப் பெற்றீர்கள். இப்போது அதற்கான விண்ணப்பங்கள் கோரப்பட்டிருக்கின்றன. நேர்முகப் பரீட்சையும் நடைபெறும் தறுவாயில் இருக்கின்றது. அதை விரைவுபடுத்துவது அங்கு கடற்றொழிலை விருத்தி செய்வதற்கும் கடற்றொழில் சம்பந்தமான முக்கியமான நடவடிக்கைகளை மேற்கொள்வதற்கும் உதவியாக இருக்கும். வட பகுதியில் குறிப்பாக, கிளிநொச்சி மாவட்டத்தில், ஏனைய பதவிநிலை உத்தியோகத்தர்களுக்கான வெற்றிடங்களும் காணப்படுகின்றன. அண்மையில், பூநகரி பிரதேசத்தில் நிர்மாணிக்கப்பட்ட கடற்றொழில் திணைக்கள அலுவலகத்தைக்கூடத் திறக்க முடியாத அளவுக்கு அங்கு உத்தியோகத்தர்களுக்கான பற்றாக்குறை நிலவுகின்றது. ஆகவே, இது விடயத்தில் நீங்கள் ஆக்கபூர்வமான முடிவுகளை எடுத்து அவற்றைச் செயற்படுத்த வேண்டுமென்று நான் இங்கு வலியுறுத்துகின்றேன்.

இதேநேரத்தில், வெளியிணைப்பு இயந்திரங்களைப் பயன்படுத்தும் யாழ்ப்பாணம், கிளிநொச்சி ஆகிய மாவட்டங்களைச் சேர்ந்த கடற்றொழிலாளர்கள் கிட்டத்தட்ட 900 பேருக்கு மண்ணெண்ணெய் நிவாரண முத்திரைகளை வழங்குவது காலதாமதப்படுத்தப்படுகிறது. ஏற்கெனவே நடந்த ஆலோசனைக் குழுக் கூட்டத்தின்போதும் நான் இந்த விடயத்தை உங்களது கவனத்துக்குக் கொண்டு வந்திருக்கிறேன். ஆகவே, இவ்விடயத்திலும் நீங்கள் கவனம் செலுத்த வேண்டுமென்று கேட்டுக்கொள்ளுகின்றேன்.

அடுத்ததாக, நன்னீர் மீன் பிடித்தொழிலில் கணிசமான முன்னேற்றம் ஏற்பட்டுள்ளது. கிளிநொச்சி மாவட்டத்தில் பாரிய குளங்கள் உட்பட சிறு குளங்களில் நன்னீர் மீன்பிடித் தொழிலை விருத்தி செய்வதற்காக சிறு இன மீன் குஞ்சுகள் விடப்பட்டன. அந்தத் தொழிலில் ஈடுபட்டிருந்தவர்களுக்கு அது மிகுந்த பயனைக் கொடுத்துக்கொண்டிருந்தது. துரதிஷ்ட வசமாக கடந்த கோடை காலத்தில் கடும் வரட்சி நிலவிய காரணத்தினால் இப்போது அந்த மீன் இனங்கள் இறந்து விட்டன. ஆகவே, அந்தக் குளங்களில் திரும்பவும் மீன் குஞ்சுகளை வளர்ப்பதற்கு உங்களது அமைச்சுக்கூடாக நடவடிக்கை எடுக்க வேண்டும். அதன்மூலம் நன்னீர் மீன்பிடித் தொழிலைத் தொடர்ந்தும் விருத்தி செய்யலாம்.

மேலும், காரைநகர் படகு திருத்தும் நிலையம் அமைந்துள்ள இடத்தைக் கடற்படையினர் தொடர்ந்தும் தங்களது கட்டுப்பாட்டுக்குள் வைத்திருக்கின்றார்கள். கடந்த காலங்களில் யாழ். மாவட்டத்திலுள்ள பழுதடைந்த படகுகளைத் திருத்துவதற்கும் புதிய படகுகளை நிர்மாணிப்பதற்கும் இந்தப் படகு திருத்தும் நிலையம் பாரிய பங்கினை வகித்ததென்பது உங்களுக்குத் தெரியும். நீங்கள் நேரடியாகச் சென்று அதைப் பார்த்துமிருக்கிறீர்கள். ஆகவே, கடற்படையினரின் கட்டுப்பாட்டிலிருந்து அதனை மீட்டுத் தருவதற்கான நடவடிக்கைகளை நீங்கள் மேற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

எங்கள் கடற்றொழிலாளர்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதிலும் வடக்கு, கிழக்கு மாகாணங்களை நாட்டின் மீன் உற்பத்தியில் முக்கிய பாத்திரத்தை வகிக்கச் செய்வதிலும் தங்களது அமைச்சு அதிக கவனம் செலுத்தி வருகின்றது. அதே முயற்சியில் இன்னும் சில காலங்களுக்குத் தொடர்ந்தும் ஈடுபட்டால், வடக்கு, கிழக்கு கடற்றொழிலாளர்களின் வாழ்வாதாரம் மேம்படுவதோடு, இலங்கையின் தேசிய மீன் உற்பத்தியில் வடக்கு, கிழக்கு மாகாணங்கள் குறிப்பிட்ட இலக்கையடையும் என்ற நம்பிக்கையையும் வெளிப்படுத்தி, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඊළඟට ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

[අ. භා. 2.50]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු සභාපතිතුමනි, ධීවර අමාත්‍යාංශය පිළිබඳව අදහස් කීපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ රටේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශාල දායකත්වයක් සපයන්න පුළුවන් අමාත්‍යාංශයක් තමයි, ධීවර අමාත්‍යාංශය. නමුත් ඒ පිළිබඳව විශේෂයෙන් අපි කරුණු කීපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. මේක ඇමතිතුමාට කරන විවේචනයක් නොවෙයි. මොකද එතුමාට මේක බේරන්න බැහැ. පසු ගිය කාලය පුරාම මේ රටේ ආර්ථිකය හැසිරෙව්ව ප්‍රතිපත්තිමය කාරණා පදනම් කර ගත්තාට පස්සේ අපි සමහර වෙලාවට දකිනවා, අධ්‍යාපනය හරි වෙනත් ක්ෂේත්‍රවල හරි "ඇමතිවරයා ඉල්ලා අස් වෙනු" කියලා සටන් පාඨයක් හැදෙනවා. නමුත් මේ ඇමතිවරු ඉල්ලා අස් වුණාට මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ කියන කල්පනාවේ ඉඳගෙන තමයි මම මේ කරුණු එකතු කරන්නේ.

ගරු සභාපතිතුමනි, කොහොමටත් මේ අය වැය සන්දර්ශනයට ලක් කළ අය වැයක්. මේ රටේ නිෂ්පාදනය ඉලක්ක කළ අය වැයක් නොවෙයි. මේ අය වැයේ තිබෙන්නේ ණය ගැනීම, බදු ගැහීම හා විකිණීමයි. ඊට එහා නිෂ්පාදනයක් ඉලක්ක කළ, ඒ සඳහා ප්‍රමුඛතාව දී තිබෙන තත්ත්වයක් අපට මේ අය වැය තුළ පෙනෙන්න නැහැ. විශේෂයෙන්ම ධීවර අමාත්‍යාංශයට අදාළව ගත්තත් ඒක එහෙම තමයි.

[ගරු අජිත් කුමාර මහතා]

ගරු සභාපතිතුමනි, මට වේලාව මදි නිසා මම 2006 ඉඳලා 2013 දක්වා අය වැයවලදී ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙනුවෙන් ඇස්තමේන්තුගත කර තිබෙන මුදල් ප්‍රතිපාදන ඇතුළත් ලේඛනය මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා

එය 2006 දී මිලියන 3,927යි. 2007 දී 6,836යි. 2013 දී මිලියන 2,687යි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! The Hon. Alhaj A.H.M. Azwer will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2006 -2013 වන තුරු බැලුවොත් නැංගුරම් පොළවල් හදන්න, වරාය තොටු පොළවල් හදන්න ජනාධිපතිතුමා වෙනමම රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබුණා. ඒ ඔක්කොම සැලකුවත් එන්න එන්නම ධීවර අමාත්‍යාංශයේ වෙලා තිබෙන්නේ සමස්ත ප්‍රතිපාදන වෙන් කිරීම කප්පාදු කිරීමයි. පාර්ලිමේන්තු අධ්‍යයන ඒකකය විසින් අපට ලබා දුන් ඒ කරුණු ඇතුළත් ඇස්තමේන්තු පිළිබඳ සමාලෝචනය මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ධීවර කර්මාන්තයේ නිෂ්පාදනය දියුණු කිරීමට ප්‍රතිපාදන වෙන් කිරීම මෙවර අය වැයෙන් වැඩිවෙලා නැහැ. රටේ මුදලේ අගය අවප්‍රමාණය වෙන්න වෙන්න, ඒ ප්‍රමාණය වැඩි වෙන්න එපායැ. එහෙම වෙලාත් නැහැ. ප්‍රමාණයෙනුත් අඩුයි. ප්‍රතිශතයක් විධියටත් අඩුයි. අර වෙන් කර තිබෙන ප්‍රමාණයට අමතරව මෙවර මිලියන 971ක් අඩුවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි සන්දර්ශනවලට වෙන් කරන මුදල් එන්න එන්න වැඩිවෙලා තිබෙනවා. මේ සභාවේ ඒ ගැන කථා කළ නිසා මම ඒ ගැන දිගට කථා කරන්න යන්නේ නැහැ. "දැයට කිරුළ" ප්‍රදර්ශනයට විතරක් වසර දෙකකදී බිලියන 60ක් වෙන් කරලා තිබෙනවා. "දැයට කිරුළ" ප්‍රදර්ශනයට වෙන් කරන මුදලෙන් දහයෙන් පංගුවක් තමයි ධීවර අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන්නේ. මෙය ඉතාම බේදනීය තත්ත්වයක්. එහෙම නම් මේ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආර්ථික ප්‍රතිපත්තියේ තිබෙන්නේ නිෂ්පාදනය දියුණු කරන ආර්ථික දැක්මක් නොවෙයි. මේ රටේ ධීවරයා, ගොවියා, -කෘෂිකර්ම ක්ෂේත්‍රය ගැනත් කථා කළා- මේ රටේ නිෂ්පාදකයන්, මේ රටේ ශ්‍රම සම්පත මේ රටේ නිෂ්පාදනයට දායක කර ගන්නා ක්‍රියාවලියක් මේ ආර්ථික ප්‍රතිපත්තියේ නැහැ. ඒ නිසා එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒකයි මම කිව්වේ මේක ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි කියලා. මෙය රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රශ්නයක්. දැන් "දැයට කිරුළ" ප්‍රදර්ශනයට වෙන් කරන මුදල් ප්‍රමාණයට සාපේක්ෂව ගත්තොත් එයින් දහයෙන් එකයි ධීවර අමාත්‍යාංශයට -පඩිනඩි ගෙවීලි, වාහනවලට තෙල් ගහන්න, විදේශ සංචාරවලට- වෙන් කර තිබෙන්නේ. එතකොට මොකක්ද තත්ත්වය? මම ඒකයි කිව්වේ මේ අය වැය නිෂ්පාදනය ඉලක්ක කළ අය වැයක් නොවෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නිර්දේශයට අනුව පුද්ගලයෙකු දිනකට ලබාගත යුතු මාළු ප්‍රෝටීන් ප්‍රමාණය ග්‍රෑම් 60යි. ඒක පුද්ගල මාළු පරිභෝජනය ඇතුළත් ලේඛනය මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

පුද්ගලයකුගේ ඒක පුද්ගල මාළු පරිභෝජනය 2012 දී ග්‍රෑම් 31යි. ඒ ප්‍රමාණය තිබෙන්නේ පිට රටිනුත් මාළු ගෙන්නුවාට පසුවයි. ඒ ඔක්කොම කරලා මේ රටේ මිනිසුන්ගේ මාළු පරිභෝජනය ග්‍රෑම් 31යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ සමහර පළාත්වල ඉන්නවා, -[බාධා කිරීමක්] ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ මූලාශ්‍රය පදනම් කරගෙන තමයි මම මේක ඉදිරිපත් කරන්නේ. ගරු ඇමතිතුමනි, යම් වැරැද්දක් තිබෙනවා නම් ඔබතුමා එය නිවැරැදි කරන්න. [බාධා කිරීමක්]

කමක් නැහැ, සියයට 38.2යි කියමු කෝ. නමුත් ගරු ඇමතිතුමනි, පුද්ගලයකු දිනකට ලබාගත යුතු මාළු ප්‍රෝටීන ප්‍රමාණය ග්‍රෑම් 60යි. ඒ කියන්නේ, ධීවර කර්මාන්තය ආශ්‍රිත ප්‍රදේශවල මිනිසුන් මාළු යම් ප්‍රමාණයක් පරිභෝජනය කරන තත්ත්වයක් තිබුණත් සමහර පළාත්වල මිනිසුන් මාළු කන්නේම නැහැ කියන එකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාළු නිෂ්පාදනයට මොකද වෙලා තිබෙන්නේ? මාළු ආනයනය කරන ප්‍රමාණය -විදෙස්වලින් මාළු ගෙන්වන ප්‍රමාණය- වැඩි වෙන්න පටන් ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න වෙලාව මදි නිසා ඒ සම්බන්ධ අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛනය සභාගත කරන්න මම ඔබතුමාගේ අවසරය ඉල්ලනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ආනයනය අඩු වෙලා තිබෙනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ප්‍රමාණය ගැනයි මා කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනයන ප්‍රමාණය අඩු වෙලා කියා ඇමතිතුමා කියන නිසා මම ඒ සංඛ්‍යා ලේඛනය කියවන්නම්. ශ්‍රී ලංකා රේගුව සහ අමාත්‍යාංශයේ වාර්තා අනුව 2010 දී කරවල, ටින් මාළු, මාළු, උම්බලකඩ ඇතුළු සියල්ලේ ආනයන ප්‍රමාණයේ එකතුව මෙට්‍රික් ටොන් 80,013යි. 2012 දී මෙට්‍රික් ටොන් 87,130යි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
වාර්තාව මොකක්ද?

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මේක රේගු වාර්තා සහ අමාත්‍යාංශ වාර්තා පදනම් කරගෙන පාර්ලිමේන්තුවේ හදන ලද වාර්තාව. මම ඒ වාර්තාව මගේ කථාව අවසානයේදී සභාගත කරන්න බලාපොරොත්තු වනවා ඇමතිතුමනි. මහ බැංකුවේ වාර්තාව බැලුවත් ඒ බව සනාථ වෙනවා. ශ්‍රී ලංකා රේගුවේ, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා බැලුවත් ඒ බව සනාථ වෙනවා. මම ඒ වාර්තාත් මගේ කථාව අවසානයේදී සභාගත කරනවා. ආනයන ප්‍රමාණය වැඩි වෙලායි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අඩු වෙලා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ප්‍රමාණය වැඩි වෙලා. ප්‍රතිශතාත්මකව අඩු වෙලා ඇති. එහෙම නම් කොහේද නිෂ්පාදනයක් වැඩි වෙලා තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාළු අපනයන ප්‍රමාණය අරගෙන බලමු. 2010 දී අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 18,325යි; 2012 දී මෙට්‍රික් ටොන් 20,814යි. 2010 දී ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 80,013යි; 2012 දී මෙට්‍රික්ටොන් 87,130යි. මෙය සඳහන් වෙලා තිබෙන්නේ 2013 අය වැය ඇස්තමේන්තුවේ, 3වන වෙළුමේ, 208වන පිටුවේයි. ගරු ඇමතිතුමනි, මේ ඔබතුමා ඉදිරිපත් කරපු වාර්තායි; වෙනත් කවුරුවත් ඉදිරිපත් කරපු වාර්තා නොවෙයි. ආනයන ප්‍රමාණය වැඩි වෙලා. මෙට්‍රික්ටොන් 80,013 ඉඳලා මෙට්‍රික් ටොන් 87,130 දක්වා වැඩි වෙලා. ඒ වාර්තාවම තමයි මා අර ඉස්සර වෙලා ඉදිරිපත් කළේ. 2013 අය වැය ඇස්තමේන්තුවේ, 3වන වෙළුමේ, 208වැනි පිටුව බලන්න, ගරු ඇමතිතුමනි. මේ මගේ වාර්තාවක් නොවෙයි. මේ කිසිම දෙයක් මා හැදූ ඒවා නොවෙයි. ඔබතුමා ඉදිරිපත් කළ වාර්තාවක් පදනම් කරගෙනයි හදලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාළු නිෂ්පාදනයට අදාළ, දළ ජාතික නිෂ්පාදිතයේ පංගුව කුමක්ද? 2000 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 2.7යි. 2011 දී සියයට 1.3යි. මා කිව්වේ ඒකයි, රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ රජයට, මේ පාලනයට, ධීවර අමාත්‍යාංශයේ මොනයම් හෝ තැනක නිෂ්පාදනය වර්ධනය කරන සැලැස්මක් නැහැ. සංදර්ශනය පෙන්වන සැලැස්මවල් තමයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු ඇමතිතුමනි, මට විනාඩි 15යි තිබෙන්නේ. අමාරුවෙන්, රණ්ඩු වෙලා ඉල්ලා ගත්ත වෙලාවක් තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මගේ කාලය ගන්න එපා කියලා. මම නොවෙයි මේ කියන්නේ. අමාත්‍යාංශයේ සහ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවෙයි තිබෙන්නේ. ඒවාත් එක්ක හැපුනොත් මගේ වෙලාව සැහෙන්න යනවා. මේ ඔබතුමාගේ පොතෙන්ම ගත්තු ඒවා. ගරු ඇමතිතුමනි, නිෂ්පාදනය වැඩි කරන්න මොකක්ද තිබෙන සැලැස්ම? ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අද ඉල්ලීමක් කරනවා සොයා බලන්න කියලා, මාළු පිට රටින් ගෙන්වීම ගැන. එය බරපතළ තත්ත්වයක්. ඊයේත් අදත් ගාල්ල වරායට මාලදිවයිනෙන් කෙළවල්ලන් ගෙනාවා. ගරු ඇමතිතුමනි, අදත් ගෙනාවා, ගාල්ල වරායට.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
කොහෙන්ද?

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මාලදිවයිනෙන්. ගෙනාවේ "Tropic" කියන කොම්පැනි එකෙනුයි. ඔබතුමා ඒ ගැන සොයා බලන්න කියලා මම කාරුණිකව ඉල්ලනවා, ගරු ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒවා exportවලට.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

නමුත් exportවලට ගෙනාවාම මොකක්ද වෙන්නේ කියලා ඔබතුමා දන්නවාද? කුරින් 1,500ක් විතර, ඒ කියන්නේ කිලෝ 50,000ක් විතර ප්‍රමාණයක්. එයිනුත් මොකක්ද සිද්ධ වන්නේ? නිෂ්පාදනය වැඩි වන්නේ නැහැ. එය, මෙහේ මිනිසුන් නිෂ්පාදනය කරපු මාළුවල මිලටත් ප්‍රශ්නයක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය සහතික මිලයි. එහෙම නැත්නම් පාලන මිලයි. සමහර නිෂ්පාදනවල මිල තීරණය කරන්නේ, එක්කෝ නිෂ්පාදකයා, එහෙමත් නැත්නම් ගන්නා මිනිහා. ධීවර කර්මාන්තයේ මාළු මිල තීරණය කරන්නේ කවුද? මාළු අල්ලන මිනිහාත් නොවෙයි; ගන්නා මිනිහාත් නොවෙයි. ඒ නිසා එහි බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මෙයින් ධීවරයන්ට සාධාරණයක් නැහැ, පාරිභෝගිකයන්ට සාධාරණයක් නැහැ. අපි දන්නවා ධීවර සංස්ථාව යම් ප්‍රමාණයකට මැදිහත් වෙනවා කියලා. නමුත් ගරු ඇමතිතුමනි, මම අහනවා ඔබතුමාගෙන්, ධීවර සංස්ථාව තොටු පොළට ගිහිල්ලා මාළු ගන්නා ක්‍රියාවලිය හරියටම සිදු වනවාද කියලා. එහෙම සිද්ධ වන්නේ නැහැ. එය ඉතා පැහැදිලියි. මම උදාහරණ ඕනෑ තරම් කියන්නම්. මේ ඒ ගැන හබ කරන්න වෙලාවක් නොවෙයි. මම එය ඇස් දෙකෙන් දැක තිබෙනවා.

නිෂ්පාදනය කරන අයවත්, පරිභෝජනය කරන අයවත් නොවෙයි මිල තීරණය කරන්නේ; අතරමැදියෝයි. ඒ නිසා වහාම මේ සම්බන්ධයෙන් සැලැස්මක් තිබිය යුතුයි. අතරමැදියෝයි මිල තීරණය කරන්නේ. අතරමැදියෝ විශාල ප්‍රමාණයක් ධීවරයන් ගසා කනවා. ඒ තත්ත්වය නිසා මොකක්ද වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මාළුවලට පාලන මිලක්, සහතික මිලක් නැහැ. මිල තීරණය කරන්න බැහැ ධීවරයාට. ඉල්ලන ගණනට, තුට්ටු දෙකට දෙන්න ඕනෑ. ඒ නිසා ධීවරයා හැම දාම කඩ මලු ඇඳගෙන, හම්බ කර ගත්තු ගණන වියදම් කරලා, ආපසු තුට්ටු දෙකක් නැති මිනිහා බවට පත් වෙනවා.

[ගරු අජිත් කුමාර මහතා]

නමුත් මෙහිදී අතරමැදි කණ්ඩායමක් ඉන්නවා ඉතාම සුබෝපභෝගී තත්ත්වයෙන්, අර සහල් නිෂ්පාදනයේදී වාගේම. ඒ නිසා ඒ අවාසනාවන්තත ඉරණම මේ රටේ ධීවර කර්මාන්තයේ යෙදෙන වැඩි දෙනෙකුටත් අත් වනවා.

මුහුදත් එක්ක ඔට්ටු වෙලා, මුහුදත් එක්ක සටන් කරලා තම ජීවිතය බේරා ගෙන ගොඩට එන ධීවරයා, ගොඩදීත් පරාදයි. ඔවුන් හැම දාම ඉන්නේ කඩමාල්ල ඇඳ ගෙන; හැම දාම ඉන්නේ ගෙයක් නැතිව; හැම දාම ඉන්නේ දරුවාට අධ්‍යාපනයක් දෙන්න බැරිව. මේ තත්ත්වය වෙනස් කරන්න නම් අනිවාර්යයෙන්ම මාළුවලට සහතික මිලක්, ඔවුන්ට මිල තීරණය කිරීමේ යම් හැකියාවක්, එහෙමත් නැත්නම් රජයෙන් මාළු මිල තීරණය කිරීමේ ක්‍රියාවලියක් තිබෙන්න ඕනෑ. දැන් එහෙම එකක් නැහැ. නමුත් එහෙම ක්‍රියාවලියක් හදන්න පුළුවන්. ඒ සඳහා යෝජනා අප ළඟ තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මාළු තිබෙන කාලයටත් ධීවරයා හාන්සියි. මාළු නැති කාලයටත් ධීවරයා හාන්සියි. මාළු නැති කාලයට මාළු නැති නිසා හාන්සියි. මාළු තිබෙන කාලයට මිලක් නැති නිසා හාන්සියි.

ඇමතිතුමාත් දන්නා විධියට ඊයේ පෙරේදාත් මාළු සුනාමියක් ආවා නේ. මාළු කිලෝ එක රුපියල් පණහට, හැටට, සීයට බැස්සා. හැබැයි, වෙළෙඳ පොළේ මාළු මිල අඟපුවාම අපේ ඇඟේ මාළු නටනවා. මොකක්ද ඒකෙන් ධීවරයාට වුණු සෙත? ගාල්ල උසාවිය ළඟ රත්ගම වැල්ල තොටුපොළින් මාළු අල්ලලා ගොඩට ගේනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි එතැනදීම ධීවරයාගෙන් ඒ මාළු අරගෙන මුදලාලිට දීලා, එතැනදීම ඒ ගත්ත ගණනට වඩා විශාල ගණනකට විකුණනවා. ඒ නිසා සාමාන්‍ය මිනිහාට මාළු කන්නත් බැහැ.

මාළු වැඩි කාලයටත් ධීවරයා හාන්සි වෙන්නේ ඇයි? මාළු සම්බන්ධයෙන් පසු අස්වනු සම්බන්ධ ක්‍රියාවලියක් අපට තියෙනවාද? නැහැ. මාළු කරවල කරනවා, උම්බලකඩ කරනවා හැර සාර්ථක පසු අස්වනු ක්‍රියාවලියක් අපට නැහැ; ඒකට ක්‍රමවේදයක් නැහැ; ඒකට සැලැස්මක් නැහැ; ඒ ගැන අධ්‍යයනයක් නැහැ. ඒක එහෙම වෙන්නේ කොහොමද?

මම ගිය මාසයේ ගිහිල්ලා තංගල්ල ධීවර කාන්තා සංවිධානය හම්බ වුණා. ඔබතුමා දන්නවා, දෙවුන්දර, කුඩාවැල්ල ප්‍රදේශ උම්බලකඩ කර්මාන්තය හොඳට කරන ප්‍රදේශ බව. අද මොකක්ද ඒ කර්මාන්තයට වෙලා තිබෙන්නේ? මම මේ හැන්සාඩගත කරන ලේඛනවල තිබෙනවා, උම්බලකඩ කොයිතරම් ප්‍රමාණයක් අපේ රටට ගෙන්වනවාද කියලා; කොයිතරම් කරවල ගෙන්වනවාද කියලා; කොයි තරම් අමු මාළු ගෙන්වනවාද කියලා. ඉතින් මෙවැනි තත්ත්වයකදී මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි කළ යුත්තේ? මේ කර්මාන්තය සඳහා අනිවාර්යයෙන් හොඳ ප්‍රතිපත්තියක් හැදෙන්න ඕනෑ. නමුත් එහෙම හොඳ ප්‍රතිපත්තියක් මේ පාලනයෙන් හදන බවක් අපට පෙනෙන්න නැහැ. ඒකයි මම කිව්වේ, මේක ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි කියලා.

මාළු පිට රටින් ගෙන්වලා සහතික මිලක් හදන්න බැහැ; පාලන මිලක් හදන්න බැහැ. මොකද, ඒ මත මාළු මිල තීරණය වන නිසා. ඒ නිසා විශේෂයෙන් ඒ කෙරෙහිත් ඔබතුමාගේ අවධානය මම යොමු කරවනවා.

අනෙක් කාරණය, නිෂ්පාදන වියදම. ධීවර නිෂ්පාදන වියදම ඉතා බරපතළ ප්‍රශ්නයක්. ධීවරයන්ට ඉන්ධන ප්‍රශ්නය තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනුවෙන් අරගලයක් කරලා ධීවරයෝ ජීවිතයක් පරිත්‍යාග කළා. ඒ ධීවර සහෝදරයා ඇතුළු ධීවර සහෝදර ප්‍රජාවට අපේ ප්‍රණාමය ඒ වෙනුවෙන් මේ අවස්ථාවේදී පුද කරනවා. ඔවුන් සටනක් කරලා තමයි තෙල් සහනාධාරය ලබා ගත්තේ. ඔවුන් රුපියල් හැත්තෑහතරට තෙල් ඉල්ලුවේ. දැන් රුපියල් 9,300ක් දෙනවා, එක් දින යාත්‍රාවකට.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
භූමිතෙල් සහනාධාරය.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඔව්. භූමිතෙල්, එක් දින යාත්‍රාවකට. එතකොට දැන් මොකක්ද වෙන්නේ? දැන් මේ සිදු වන වියදමත් එක්ක ඔවුන්ට තුනෙන් පංගුවක්,- [බාධා කිරීමක්] ඔව්, භූමිතෙල් සහනාධාරය හැටියට දෙන්නේ රුපියල් 9,300ක්. දැන් මොකක්ද වෙන්නේ? ධීවරයෙක් සාමාන්‍යයෙන් මාසයකට දවස් විස්සක් මුහුදු ගියොත් නිෂ්පාදන වියදම රුපියල් 28,000ට වඩා වැඩි වෙනවා. තෙල්වලට විතරක් නිෂ්පාදන වියදමෙන් තුනෙන් පංගුවකට එහා වැය වෙනවා. නමුත් ඔවුන්ටසහනාධාරය හැටියට රුපියල් 9,300යි හම්බ වෙන්නේ. ඒ නිසා මුහුදු යෑමෙන් පාඩුයි. ඒ නිසා සමහරු මොකක්ද කරන්නේ? ඔවුන් බහු දින යාත්‍රාවල කුලියට යනවා. නැත්නම් දැල් මහන්න යනවා. එහෙමත් නැත්නම් ඉදි කිරීම් කර්මාන්තයේ කුලී වැඩට යනවා. මම මේ කරුණු සාක්ෂි ඇතිවයි කියන්නේ. භූමිතෙල් සහනාධාරයට රුපියල් 9,300යි ලැබෙන්නේ ඇමතිතුමනි. ඔබතුමා මේ ගැන සොයා බලන්න. සමහරු ඒ සහනාධාරය විකුණනවා. ඇයි? මුහුදු යනවාට වඩා ලාභයි වෙනත් කුලී වැඩකට ගිහිල්ලා, බහුදින යාත්‍රාවක වැඩට ගිහිල්ලා, ඒ රුපියල් 9,300 කට හම්බවෙන ඉන්ධන ටික අඩු ගණනකට දීලා දමන එක. එහෙමත් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාල වේලාව අවසානයි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඊළඟට ආම්පන්න මිල. නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, දැන් ආම්පන්නවල වටිනාකමෙන් තුනෙන් පංගුවකට වඩා වැඩියි tax එක කියලා. දැල්වලට විතරක් ගරු ඇමතිතුමනි, සියයට 34ක් tax වදිනවා. 2008 දී දැල් කට්ටලයක් තිබුණේ රුපියල් 7,300ට. ඒ දැල් කට්ටලය දැන් රුපියල් 24,000යි. ඒකට tax එක විතරක් රුපියල් 8,100 යි. ඒ නිසා ධීවර ආම්පන්න වෙනුවෙන් ඇති මේ tax සම්පූර්ණයෙන් ඉවත් කරන්න ඕනෑ. මොකද, ධීවරයා කරන්නේ නිෂ්පාදනයක් නිසා. මේ සම්බන්ධයෙන් අදාළ ලේඛන මම **සභාගත*** කරනවා.

විශේෂයෙන්ම ධීවර රක්ෂණය පට්ටපල් බොරුවක් වෙලා තිබෙනවා. ඔවුන්ට රක්ෂණ ඔප්පුවක්වත් දීලා නැහැ, receipt එකක් විතරයි තිබෙන්නේ. උතුරේ ධීවර ප්‍රශ්නය ගැන 28 වන දා අපි කථා කරමු. මම ඒ සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ ධීවරයන් පිළිබඳ කටයුතු වෙනස් විධියකට සිද්ධ වෙන්න ඕනෑ. විශේෂයෙන් "ධීවර සංවිධාන එකමුතුව" විසින් ප්‍රසිද්ධ කරපු පත්‍රිකාවකුත් මම මූලාසනයේ අවසරය මත **හැන්සාඩගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම තවත් ප්‍රශ්න ගනණාවක් තිබෙනවා. ඒ පිළිබඳව කථා කිරීමට සභාව කල් තැබීමේ විවාදයේදී අවස්ථාව ලැබෙයි කියලා හිතනවා. ධීවරයන්ගෙන් මම ඉල්ලා සිටිනවා, ඉල්ලීම් කිරීමට පමණක් සීමා නොවී, මේ ගැන අරගලයක් කරන්න එකතු වෙන්න කියලා.

*** සභාමේසය මත තබන ලද ලේඛන:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:*
*Documents tabled:*

**Summary of Budget Estimates-Ministry of Fisheries and Aquatic Resources**

Rs.mn

| Description | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 Revised | 2012 Revised | 2013 Estimate |
|---|---|---|---|---|---|---|---|---|
| Recurrent Expenditure | 579 | 763 | 857 | 766 | 752 | 787 | 1028 | 877 |
| Capital Expenditure | 3348 | 6073 | 4359 | 6660 | 5840 | 3663 | 2630 | 1811 |
| **Total** | **3927** | **6836** | **5216** | **7426** | **6592** | **4450** | **3658** | **2687** |
| | | | | | | | | |

Source; Budget Estimate Reports 2011,2012,2013

**Table 6.1 : Export Quantity of Fish and Fishery Products ( Mt)**

| Exported Item | 1983 | 1990 | 1995 | 2000 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012(1) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Prawns | 1,720 | 1,855 | 2,781 | 4,855 | 1,800 | 1,837 | 2,023 | 854 | 1,432 | 1,262 | 1,380 | 1,510 |
| Lobsters | 207 | 165 | 283 | 164 | 183 | 168 | 184 | 249 | 133 | 166 | 199 | 160 |
| Crabs | na | na | 898 | 554 | 1,012 | 568 | 1,151 | 1,283 | 2,048 | 1,848 | 2,104 | 2,030 |
| Beche de Mer | 56 | 36 | 248 | 87 | 258 | 153 | 208 | 180 | 105 | 178 | 272 | 230 |
| Ornamental Fish | na | na | na | na | na | na | na | na | na | na | na | na |
| Chank & Shells | 144 | na | 746 | 698 | 546 | 451 | 564 | 493 | 451 | 617 | 413 | 440 |
| Shark Fins | 57 | 51 | 127 | 119 | 74 | 75 | 67 | 51 | 65 | 69 | 91 | 40 |
| Molluscs | na | 1 | 51 | 15 | 300 | 106 | 713 | 1,460 | 241 | 496 | 1,023 | 1,690 |
| Fish Maws | na | na | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 4 | 4 |
| Fish | 209 | 821 | 1,978 | 11,873 | 10,960 | 14,301 | 15,473 | 15,014 | 13,857 | 13,372 | 12,594 | 14,390 |
| Others | - | - | 12 | 188 | 851 | 987 | 1,039 | 1,008 | 381 | 316 | 382 | 320 |
| **Export Quantity** | **2,393** | **2,931** | **7,126** | **18,554** | **15,985** | **18,647** | **21,423** | **20,593** | **18,714** | **18,325** | **18,462** | **20,814** |

Source : Custom Returns/ Statistics Unit - Ministry of Fisheries and Aquatic Resources Development
(1) Targets

**ඒක පුද්ගල මාළු පරිභෝජනය**

**පුද්ගලයෙකුගේ ඒක පුද්ගල මාළු පරිභෝජනය දිනකට/ග්‍රෑම් (g)**

| | |
|---|---|
| 1995/96 | 18.8 |
| 2002/03 | 23.4 |
| 2006/07 | 25 |
| 2009/10 | 29.9 |
| 2012 | 31 |

**මූලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය**

**වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නිර්දේශයට අනුව පුද්ගලයකු දිනකට ලබාගත යුතු මාළු ප්‍රෝටීන ප්‍රමාණය ග්‍රෑම් 60 කි. (60 g)**

[අ. භා. 3.04]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ගොවිජන සේවා හා වනජීවී සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශවල වැය ශීර්ෂ ගැන කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම තමුන්නාන්සේට ස්තූතිවන්ත වෙනවා. මට මේ වෙලාවේදී මතක් වෙනවා, "මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟ සුබා" කියන ගුත්තිල කාව්‍යයේ තිබෙන කවියක පදයක්. ඒ මොකද, රටට මේ තරම් වැඩ කරපු, වැඩ කරන්න සැලසුම් හදන අමාත්‍යාංශ තුනක් ගැන විනාඩි නවයක වාගේ කෙටි කාලයක් තුළ කථා කරන්න කරුණු සාරාංශ කර ගන්නේ කොහොමද කියන එක මට ලොකු ප්‍රශ්නයක් නිසා.

මේ අය වැයේදී අතිගරු ජනාධිපතිතුමා කෘෂිකර්ම ක්ෂේත්‍රය නැංවීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා. රටේ කෘෂිකර්මය නැංවීමේදී තවත් ආයතන කිහිපයක් දියුණු කරන්න වෙනවා. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වී වගාව අරගෙන බැලුවොත්, ඒ සඳහා ජලය අවශ්‍ය වෙනවා. ජලය ලබා ගන්න නම්, ඒ සඳහා වාරි මාර්ග දියුණු කරන්න ඕනෑ. ඒ නිසා එතුමා මේ අය වැයෙන් උමා ඔය, යාන් ඔය, මොරගහකන්ද වැනි වාරිමාර්ග සංවර්ධනය සඳහා රුපියල් බිලියන 102ක් වැනි විශාල ධනස්කන්ධයක් වෙන් කරලා කෘෂිකර්මය දියුණු කිරීමට අවශ්‍ය ඒ අවශ්‍යතාව සපුරා තිබෙනවා. වාරිමාර්ග පහසුකම් හරියට නැත්නම්, ඒ අවශ්‍යතාව ඉෂ්ට කර ගන්න බැරි නම්, කෘෂිකර්මය දියුණු කිරීම කිසි සේත්ම කරන්න බැහැ.

පසු ගිය නියං කාලයේදී අපේ ප්‍රදේශය මහත් දුෂ්කරතාවකට මුහුණ පෑවා. වැව් හිඳී ගියා; වී වගාව සහමුලින්ම විනාශ වෙලා ගියා. ඒ අවස්ථාවේ අතිගරු ජනාධිපතිතුමා ගොවි නියෝජිතයන් සමඟ සාකච්ඡා කරලා ක්ෂණික වැඩ පිළිවෙළක් ගෙන ගියා. මේ ගරු සභාවේදී එක් මන්ත්‍රීවරයෙක් කිව්වා, ඒ දවස්වල එක් අයකුගෙන් දවස් 10ක් වැඩ අරගෙන රුපියල් 5,000ක් දුන්නා කියලා. ඒක රජය විසින් කරපු යෝජනාවක් නොවෙයි. ගොවි ජනතාවම තමයි කිව්වේ, "අපි මේ වෙලාවේ වැඩ කරන්නම්, ඒ සඳහා අපට මේ විධියේ ගෙවීමක් කරන්න" කියලා.

අපේ රටේ ගොවිතැන් කිරීමේදී යල, මහ වශයෙන් කන්න දෙකක් තිබෙනවා. ඊසාන දිග සහ නිරිත දිග මෝසම් වශයෙන් කොටස් දෙකකින් අපේ රටට වර්ෂාපතනය ලැබුණා. හැබැයි, එන්න එන්නම කැලෑව විනාශ වුණාට පස්සේ ඊසාන දිග මෝසම් වැස්සත්, නිරිත දිග මෝසම් වැස්සත් ලැබෙන්නේ මොන කාලයකද කියලා කියන්න බැරි තත්ත්වයක් ඇති වන විධියට අද කාලගුණය විපර්යාසයකට ලක් වෙලා තිබෙනවා. ඊට ප්‍රධානම හේතුව වෙලා තිබෙන්නේ රටේ වනාන්තර ප්‍රමාණය සියයට 18 දක්වා අඩු වීමයි. ඒ නිසා වනාන්තර ප්‍රමාණය සියයට 35 දක්වා වැඩිදියුණු කිරීමට, එහෙම නැත්නම් වන වගාව දියුණු කිරීමට මේ අය වැයෙන් විශාල ධනස්කන්ධයක් ගරු ජනාධිපතිතුමා වෙන් කර තිබෙනවා. කෘෂිකර්මය කෙරෙහි පරිසරයත් ඉතා වැදගත් ලෙස බලපාන නිසා එවැනි තීරණයක් අරගෙන තිබෙනවා.

ඒ වාගේම රුපියල් මිලියන 72ක් පමණ වැය කරමින් හරිත සරසවියක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. නවීන ලෝකයත් සමඟ ඉදිරියට යෑම සඳහා තාක්ෂණය ඉතාම වැදගත් වෙනවා. මධ්‍යම ආණ්ඩුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත්, පළාත් සභාවල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවලත් තාක්ෂණ නිලධාරින්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ නිසා කෘෂිකර්ම විද්‍යාල පහක් නවීන තාක්ෂණය ඇතිව නවීකරණය කරලා, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීලා, ඒ පාඨමාලා හැදෑරීම සඳහා ඇතුළු කර ගන්නා සිසුන් ප්‍රමාණය 400 සිට 1500 දක්වා වැඩි කිරීම සඳහා 2013 වර්ෂයට රුපියල් මිලියන350ක් වෙන් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒක ඉතාම වැදගත් වෙනවා. මොකද, රාජ්‍ය අංශයට පමණක් නොව පෞද්ගලික අංශයටත් මේ තාක්ෂණ නිලධාරින්ගේ අවශ්‍යතාව තිබෙන නිසා. අනාගතයේදී ඒ නිලධාරින්ගෙන් රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයටත් ප්‍රයෝජන ගන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමා අනාගතය දෙස බලලා ඒ අවශ්‍ය කටයුතු ඉටු කර තිබෙනවා.

කෘෂිකර්ම ක්ෂේත්‍රයට තිබෙන ඊ ළඟ අවශ්‍යතාවය තමයි, ඉඩම්. හෙක්ටෙයාර් 125,000ක ඉඩම් සංවර්ධනය කර වගා බිම් බවට පත් කිරීමට මේ අය වැයෙන් සැලසුම් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමෙකු කථා කළා, කෘෂිකර්ම ක්ෂේත්‍රයේදී අනාගත පරම්පරාව වෙනුවෙන් යම් කිසි සැලස්මක් නැහැ කියලා. නමුත් මේ අය වැය තුළින් කෘෂිකර්ම අංශය දියුණු කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන පහසුකම් ලබා දී තිබෙනවා.

නිෂ්පාදනයෙන් සියයට 40ක් පමණ අපතේ යාම අද අපට ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ වාගේම ගබඩා පහසුකම් නොමැති තත්ත්වයකුත් තිබෙනවා. ගොවියා තමන්ගේ වී ටික ගත්තාම ක්ෂණිකව අඩු මිලකට හෝ විකිණීමට උත්සාහ කිරීමට එක හේතුවක් වන්නේ තමාගේ නිවසේ වී ගබඩා කර තබා ගැනීමට

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

හැකියාවක් හෝ පහසුකමක් නොමැතිකම නිසයි. තමාගේ නිවසේ වී ගබඩා කර තබා ගැනීමට පහසුකමක් නොමැති නිසා ඔහු අඩු මිලකට හෝ වී ටික අළෙවි කිරීමට උත්සාහ ගන්නවා. එයට පිළියමක් වශයෙන් ගෘහස්ථ ගබඩා ඇති කිරීමට කටයුතු කළයුතු වෙනවා. ගෘහස්ථ ගබඩා ඇති කිරීමෙන්, තමන්ගේ වී ටික ගෙදරට ගෙනාවායින් පසුව තමන්ට අවශ්‍ය වෙලාවට වී ටික වෙළෙඳ පොළට නිකුත් කිරීමට ගොවියාට හැකි වෙනවා.

වෙළෙඳ පොළට එක වරම එන වී නිෂ්පාදනය පාලනය කර ගැනීමටත් මෙයින් අවස්ථාව සැලසෙනවා. ඒ සඳහා මුදල් වෙන් කර තිබීම කෘෂිකර්ම ක්ෂේත්‍රය නැංවීම සඳහා ගන්නා ලද උත්සාහයක් බව මා කියන්න ඕනෑ. ඔයාමඩුව වැනි, මෙට්‍රික් ටොන් 70,000ක් පමණ ගබඩා කළ හැකි පහසුකම් තිබෙන ගබඩා අනික් දිස්ත්‍රික්කවලත් ඉදි කිරීමට සැලසුම් කර තිබෙනවා. එයත් කෘෂිකර්ම ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා ගත් උත්සාහයක් බව මා කියන්න ඕනෑ. අපි දන්නවා, නිරන්තරයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වී වගාව රඳා පවතින්නේ පොහොර සහනාධාරය මතයි කියලා. කෘෂි කාර්මික ප්‍රදේශයක ජීවත් වන පුද්ගලයෙක් වශයෙන් මා දකිනවා, 2004-2005 කාලය වන විට ඉතා භයානක ලෙස වී නිෂ්පාදනය පහත වැටී තිබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි භාගයයි තිබෙන්නේ.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. පොහොර සහනාධාරය නැවත ඒ හා සමානවම ලබා දීම සඳහා කටයුතු කිරීම ගැන අතිගරු ජනාධිපතිතුමාට අප ස්තුතිවන්ත විය යුතුයි. ගොවියා තමන්ගේ ශ්‍රමය වැය කරලා තමයි කෘෂි රක්ෂණ ක්‍රමයට දායක වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මඟින් ඔහු බලාපොරොත්තු වෙනවා, තමන් වයස්ගත වූ පසුව කිසියම් මුදලක් ලබා ගත හැකි වෙයි කියා. ලොකු මුදලක් නොවෙයි, රුපියල් 1,000ක් වුණත් ඔහුට ඒ මුදල ඉතා වටිනවා. ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා දෙපොළගෙන් මම ඉල්ලීමක් කරනවා, "කිරි කළයකට ගොම ටිකක් දැම්මා වාගේ" කටයුතු නොකර ගොවි විශ්‍රාම වැටුප ඉතා ඉක්මනින් ලබා දීමට කටයුතු කරන්නටය කියා. ඒ ඉල්ලීම කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[අ. භා. 3.13]

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය ඇමතිතුමාත්ඉන්නවා. අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂ සම්බන්ධයෙන් සාකච්ඡා වන මේ අවස්ථාවේදී කෘෂි කර්මාන්තය පිළිබඳව අදහස් හා යෝජනා කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට මා කියන්න ඕනෑ, උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කය හා පොළොන්නරුව දිස්ත්‍රික්කය තමයි වැඩිපුරම වී නිෂ්පාදනය කරලා මේ රටට බත සපයන්නේ. එවැනි ගොවි ජනතාවක් නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට මුලින්ම මා සතුටු වෙනවා, මෙවර අය වැයෙන් වී වලට රුපියල් 32ත් රුපියල් 35ත් අතර සහතික මිලක් නියම කිරීම පිළිබඳව. නමුත් මා හිතන්නේ රුපියල් 40ක් විතර ගෙවනවා නම් ගොවියාව මීට වැඩිය සතුටුදායක තත්ත්වයකට ගෙනෙන්න පුළුවන් වෙයි කියලායි. ගොවිතැන මුල් කර ගත් ජන සමාජයක් සහිත අපේ රට අපනයනය සඳහා මහා පරිමාණයෙන් වී නිෂ්පාදනය කිරීමට තවමත් අපොහොසත් වී තිබෙනවා. ඒ ගැන මා විශේෂයෙන්ම කනගාටු වෙනවා. මා පසු ගිය අය වැයේදී ප්‍රකාශය කළා බාස්මතී හාල් වාගේම, සම්බා හාල් අපනයනය කිරීමට ගොවීන් උනන්දු කර වීම රජයේ වග කීමක් කියලා. ඒ වාගේ දේවල්වලට ගොවීන් තව තවත් උනන්දු කරවනවා නම් අප එය ඉතාමත් අගය කරනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාමාන්‍යයෙන් වී වගා කරන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 54,478ක් පමණ වෙනවා. ඒ වාගේම තමයි මහවැලි කලාපවල වී වගා කරන ප්‍රමාණය හෙක්ටයාර් 17,558ක් පමණ වෙනවා. දළ වශයෙන් ගත්තාම හෙක්ටයාර් 72,036ක විතර බිම් ප්‍රමාණයක් වී වගා කරනවා. මෙය බොහොම විශාල බිම් ප්‍රමාණයක්. අපට මෙවැනි බිම් ප්‍රමාණයක කුඹුරු වගා කරන්න පුළුවන්කම තිබෙනවා. මා හිතනවා, එහෙම වී වගා කළොත් ආනයන මට්ටමට සහල් නිෂ්පාදනයක් ඇති කරලා අපේ ගොවි ජනතාව අතට මීට වැඩිය මුදල් ප්‍රමාණයක් ලබා ගන්න කටයුතු සැලසුම් කරන්න පුළුවන් කියලා.

2012 යල කන්නයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි ප්‍රදේශවල පමණක් අක්කර 63,407ක පමණ බිම් ප්‍රමාණයක් වගා කළා. එයින් අක්කර 50,725ක් පමණ නියඟයෙන් විනාශ වුණා. එය කවුරුත් දන්නා දෙයක්. ඒ වාගේම මහවැලි නොවන කලාපවල -විලච්චිය, කනදරාව, පදවිය වැනි ප්‍රදේශවල- හෙක්ටයාර් 50,000ක විතර කුඹුරු ප්‍රමාණයක් විනාශයට ලක් වුණා. සමස්තයක් වශයෙන් ගත්තාම අක්කර ලක්ෂයක පමණ කුඹුරු හානියට පත් වෙලා තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තාම ඊට වැඩිය බිම් ප්‍රමාණයක කුඹුරු හානියට ලක් වෙලා තිබෙනවා. රජය කොයි තරම් කිව්වත් ඒ ගොවි පවුල්වලට හරියාකාරව සහනයක් ලැබිලා නැහැ. ඒ ගොවි පවුල්වලට අඩු තරමේ වන්දියක්වත් හරි විධියට ලැබිලා නැහැ කියන එක අප මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ අයට වන්දි ලබා දී තිබෙනවාය කියා ඇමතිතුමා කිව්වාට අප දන්නා විධියට නම් හරියට ඒ අයට වන්දි මුදල් ලබා දීලා නැහැ.

පසු ගිය කාලයේ ඇති වූ නියඟයෙන්, ගංවතුරින් විනාශ වූ කුඹුරු සියල්ලටම බිත්තර වී නොමිලයේ ලබා දුන් බව අපේ කෘෂිකර්ම අමාත්‍යතුමා කිව්වා. ඒ බිත්තර වී වුණත් හරියාකාරව ගොවි ජනතාව අතරේ බෙදී ගිහිල්ලා නැහැ. මා හිතන්නේ ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වා, ඒක TV එකෙත් පෙන්නුවා කියලා. මාධ්‍ය සංදර්ශන හරහා නම් එය පෙන්නුම් කළා. නමුත් බොහොම සීමිත පිරිසකට -තැන් දෙකකට, තුනකට වාගේ- බිත්තර වී බුසල් දෙකක්, තුනක් විතර තමයි අප දන්නා විධියට ලැබිලා තිබෙන්නේ. ඒ ලබා දුන්න බිත්තර වී- [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සද්ද නොකර ඉන්න කෝ. අපි අනුරාධපුර දිස්ත්‍රික්කයට ගිහිල්ලා නැත්නම් අපට- [බාධා කිරීමක්] ඔබතුමාගේ කථාවේදී ඔබතුමා කියන්න කෝ. අපි දන්නා කරුණු ගැන මේ කියන්නේ. මේ වෙලාවේ- [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමියට කථා කරන්න ඉඩ දීලා, වාඩි වෙලා අහ ගෙන ඉන්න කෝ.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
ඒ ලබා දීලා තිබෙන- [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Let the Fair Member speak.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
[බාධා කිරීම්] ගරු ඇමතිතුමා, ඔබතුමාගේ රාජකාරිය ඕක නේ. හැම තිස්සේම නැගිට නැගිට බාධා කිරීම තමයි රාජකාරිය.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Please allow the Fair Member to speak. - [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කථා කරන්න.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
ඒ ලබා දුන්න බිත්තර වී ප්‍රමිතියකින් තොර බව මාධ්‍ය වාර්තාවල පළ වෙලා තිබෙනවා. ඒ වාගේම පැළ වීමේ ශක්‍යතාව ඉතාම දුර්වල තත්ත්වයකයි තිබෙන්නේ. අප දන්නවා ඒ බිත්තර වීවල පිරිසිදුභාවයත් බොහොම පහළ මට්ටමක තිබෙන බව. ඒ ගැන ගොවි ජනතාව අපත් එක්ක සාකච්ඡා කර තිබෙනවා.

ඒ වාගේම බීජ වී, එළවලු බීජ පවා නිසි ප්‍රමිතියකින් තොරව තිබෙනවාය කියන එකයි මේ අවස්ථාවේදී අපි මතක් කරන්න ඕනෑ. මේ පිළිබඳව සොයා බැලීම් කටයුතු කරනවාය කියලා 2013 අය වැය ලේඛනයේ සඳහන් වෙලා තිබෙනවා මා දැක්කා. මා හිතන හැටියට එය බොහොම වැදගත්. ඒ සම්බන්ධයෙන් සොයා බලා මීට වඩා ප්‍රමිතියකට බීජ වර්ග ලබා දෙන්න කටයුතු කරනවා නම් ඉතා හොඳයි කියා මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි. පොහොර සහනාධාරය ගැන කිව්වා. අද මේ පොහොර සහනාධාරය දෙන එක හොඳයි. නමුත් රුපියල් 350ට තිබුණු පොහොර සහනාධාරයට තව රුපියල් 150ක් එකතු කර තිබීම සාධාරණ නොවෙයි කියන එකයි අපි කියන්නේ. එතකොට කිලෝග්‍රෑම් 50ක පොහොර මිටියක් රුපියල් 500ක පමණ මුදලකට තමයි ගන්න සිද්ධ වන්නේ. එම නිසා එහි සාධාරණයක් නැහැයි කියන එකයි අපි දකින්නේ. එම නිසා මා හිතන්නේ - [බාධා කිරීමක්] ඔබතුමා Jack-in-the-box වගේ කෑ ගහන්නේ නැතුව ඉන්නවාද? අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මහඉළුප්පල්ලම බීජ හා පර්යේෂණ ගොවිපොළ ඉතා පහළ මට්ටමකට වැටී තිබෙනවා. ඒ පිළිබඳව සොයා බලා මීට වඩා ගුණාත්මක තත්ත්වයෙන් එහි කටයුතු කරනවා නම් හොඳයි කියා මා මතක් කර සිටිනවා. ඒ වාගේම බීජ ගොවිපොළවල් සකස් කිරීම ගැනත් වැඩි අවධානයක් යොමු කරනවාය කියා අය වැය ලේඛනයේ සඳහන් කර තිබෙනවා. ඒ කටයුතු ඒ විධියට කෙරෙනවා නම් හොඳයි. ඒ වාගේම නිරාවිය සත්ව ගොවිපොළ පිළිබඳවත් ඇමතිතුමාගේ අවධානය මීට වඩා යොමු කරන්නය කියා අපි ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි. මට ප්‍රථමයෙන් කථා කළ අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමාත් කිව්වා, දැයට කිරුළ වාගේ ව්‍යාපෘතිවලට විශාල මුදලක් වෙන් කරලා නිකරුණේ මුදල් නාස්ති කරනවාය කියලා. 2012 දී අපේ ගොවි ජනතාවගේ ණය මුදල කපා හැරලා නැහැ. පොලිය විතරයි කපා හැර තිබෙන්නේ. එම නිසා අපි යෝජනා කරනවා, ගොවි ජනතාවගේ ඒ ණය මුදලත් සම්පූර්ණයෙන්ම කපා හරිනවා නම් හොඳයි කියලා. මොකද, ඒ අය නැවත වගා කිරීමකට යන කොට මේ තිබෙන ණයයි, ගන්න බලාපොරොත්තු වන ණයයි ගොඩ ගැහෙන කොට අපේ ගොවි ජනතාවට ඉතා අපහසු තත්ත්වයක් තමයි උදා වන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙනුත් ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට බදු සහන ලබා දීම ගැනත් කියන්න ඕනෑ. මේ අය වැය ලේඛනය දිහා බලන කොට බදු සහන ලබා දීලා තිබෙන්නේ racing carsවලටයි, go-kartsවලටයි. ඉතින් මා හිතන හැටියට මේ රටේ මීට වඩා වැඩ කොටසක් කරන අපේ ගොවි ජනතාව දිහා බලා ඒ ගොවි ජනතාවගේ tractorsවලට, යන්ත්‍රෝපකරණවලට, ඒ වාගේම උදලු තල හා අනිකුත් කෘෂි උපකරණවලට ඊට වඩා සහනයක් ලබා දෙනවා නම් හොඳයි. මොකද, අද මේ වන කොට රෝද හතරේ ට්‍රැක්ටරයක මිල රුපියල් ලක්ෂ 4කට වඩා වැඩි මුදලකින් මිල වැඩි වෙලා තිබෙනවා. මා හිතන හැටියට ගොවි ජනතාවට මීට වඩා සහනයක් ලබා දෙන්න පුළුවන්.

ගොවි විශ්‍රාම වැටුප ගැන හැමදෙනාම කථා කළා. ඒ වාගේම ඇමතිතුමා කිව්වා, ගොවි විශ්‍රාම වැටුප ලබා දීලා තිබෙනවාය කියලා. හැබැයි අපි දන්නා තරමට නම් අපේ ජනතාව අතර ඒ ගොවි විශ්‍රාම වැටුප ලබා දීලා නැහැ. එම නිසා කරුණාකරලා එම විශ්‍රාම වැටුප ලබා දෙන්න කටයුතු කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා. මොකද, ඒ ගොවි ජනතාවගේ මුදල්වලින් තමයි ගොවි විශ්‍රාම වැටුප හැදිලා තිබෙන්නේ.

එතකොට ඒ තිබුණු විශ්‍රාම වැටුපට මොකක්ද වුණේ කියන එක පිළිබඳව ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අඩුම තරමේ ඒ ගොවි විශ්‍රාම වැටුප මේ ගොවි ජනතාවට ලබා දෙන්න කටයුතු කරන්න කියන එකත් මේ අවස්ථාවේ දී නැවතත් මතක් කරනවා. මා හිතන්නේ දැයට කිරුළට සමගාමීව ගොවීන්ගේ කෘෂිකාර්මික ඉඩම්වලට ඔප්පු ලබා දෙන්න කටයුතු කරලා තිබුණාට ඒවා ලැබිලා නැහැ. ඒ නිසා කරුණාකරලා ඉඩම් කච්චේරියක් පවත්වලා මේ ගොවීන්ට බැංකු ණයක් හරි ලබා ගන්න පුළුවන් විධියට තමන්ගේ ඒ කෘෂි ඉඩම්වලට අවශ්‍ය ඔප්පු ටික ලබා ගන්න කටයුතු සලස්වා දෙන්නය කියන එකත් මේ අවස්ථාවේ දී මතක් කර සිටිනවා. ඒ වාගේම ගබඩා ගැන කථා කරනකොට, මා හිතන්නේ අද අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තාම, වී වාගේම අනෙකුත් බෝග වර්ග ගබඩා කරන ගබඩා ගණනාවක් අද නිකම් වසා දමලා තිබෙනවා. ඒ නිසා ඒ වාගේ තැන් ගැනත් සොයා බලා කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම අනුරාධපුර දුම්රියපොළ අසල තිබෙන සේනානායක ගබඩාව අද වසා දමා තිබෙනවා. ඒ වාගේම ශ්‍රාවස්තිපුර ගබඩාවක් තිබෙනවා. ඒ වාගේම කලාවැව ආසනය ගත්තාමත් ගබඩාවල් ගණනාවක් තිබෙනවා. මේවා ගැන සොයා බලා, මේවා නැවත සංවර්ධනය කරලා පාවිච්චි කරන්නට පුළුවන් විධියට යථා තත්ත්වයකට ගෙනෙන්න කටයුතු කරන්නය කියන එකත් මේ අවස්ථාවේ දී මතක් කරනවා.

"දිවි නැගුම" හරහා මා හිතන විධියට විශාල මුදලක් වියදම් කරලා එළවලු වගා කිරීමට කටයුතු කරලා තිබෙනවා. නමුත් අද අපි සාමාන්‍යයෙන් මැකරල් කිලෝ එකක් ගත්තොත් රුපියල් 200ක් විතර වෙනවා. වැටකොළු කිලෝ එකක් ගත්තොත් රුපියල් 150ක් විතර වෙනවා. මේ "දිවි නැගුම" වැඩසටහන හරහා කිකිළි පැටවුන් මහා විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. නමුත් අපි කවුරුත් දන්නවා අද බිත්තරයක් ගන්න ගියොත් බිත්තරයක් රුපියල් 12යි, රුපියල් 13යි කියා. [බාධා කිරීමක්] ඔබතුමා කොයි කඩෙන් ගන්නවාද මං දන්නේ නැහැ. ඊයේත් මම ගිහිල්ලා ගත්තා, බිත්තරයක් රුපියල් 12යි, රුපියල් 13යි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
ඒ නිසා මේ වාගේ දේවල් ගැන සොයා බලන්න කියලා ඉල්ලීමක් කරනවා. මේවාට විශාල මුදලක් වියදම් කරනවා නම් අනෙක් පැත්තෙන් ජනතාවට සහනයක් ලැබෙන්නත් කටයුතු කරන්නට ඕනෑ කියලා මා හිතනවා. ඔබතුමා මගේ කාලය අවසන් කියලා කිව්වාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්, තව විනාඩි භාගයක් තිබෙනවා.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
ඒ නිසා ඒ ගැනත් සොයා බලා ජනතාවට මීට වඩා සහනයක් ලබා දෙනවා නම් හොඳයි කියලා මා හිතනවා.

මේ ආණ්ඩුව දැන් අවුරුදු 18ක, 19ක පමණ කාලයක් රට පාලනය කර තිබෙන බව අපි දන්නවා. මේ වනකොට මොරගහකන්ද ඒ වාගේම යාන්ඔය වැනි ව්‍යාපෘති හරහා අපේ ගොවි ජනතාවට ජලය ලබා දෙන්න බලාපොරොත්තු වනවා. නමුත් තව වනතුරු ඒ කටයුතු අවසන් කරලා නැහැ. ඉතින් මේවා බෝඩ් ලෑලිවලට විතරක් සීමා කරන්නේ නැතිව මේ කටයුතු පුළුවන් තරම් ඉක්මනට අවසන් කරන්න කියලා ඉල්ලා සිටිනවා. කාලය හරස් වෙලා තිබෙන නිසා මගේ කථාව මේ අවස්ථාවේ දී මා **සභාගත*** කරනවා.

මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, අපේ අමාත්‍යවරුන් දෙපළට මේ වැඩ කටයුතු මීට වඩා සාර්ථකව කරගෙන යන්නට පුළුවන් වෙයි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.28]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කෘෂිකර්ම අමාත්‍යාංශයත්, ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යාංශයත්, ඒ වාගේම ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයත් යන වැඩදායක අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරන දවසක්. අපි පිළිගන්නට ඕනෑ, අතිගරු ජනාධිපතිතුමා විසින් මේ රටේ හැම තැනකම කෘෂි ආර්ථිකයක් හදන්නට සැලසුම් විතරක් නොවෙයි, අති විශාල සහනයක් දීලා තිබෙන බව. පසුගිය පළාත් සභා මැතිවරණයේ දී එය අපට ඔප්පු වුණා. කොතරම් නියඟයක් තිබුණත් ඒ විශ්වාසය තහවුරු කරගෙන අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයට ජනතාව එකඟ වුණු බව. ඒ එක පැත්තක්. අනෙක් පැත්තෙන් මේ ගැනත් අපි එතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ රටේ ධීවර ප්‍රජාවට අපේ රටේ මහ මුහුදෙන් තුනෙන් දෙකක්ම නැතිව හිටපු කාලයක් තිබුණා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත්, මමත් වවුනියාවට ගිහිල්ලා පළමුවෙන්ම මැණික්ෆාම් එකේ දී තමයි එහි සිටි අනාථයන්ට ප්‍රකාශ කළේ, "දැන් ඔන්න මුහුදු යන්න පුළුවන්" කියලා. ඊළඟට අපි ගිහිල්ලා ත්‍රිකුණාමලයටත් ඒ පණිවුඩය දුන්නා. ඉස්සෙල්ලා ඉල්ලුවේ මුහුදු යන්න අවස්ථාවක්. වෙන මුකුත් නොවෙයි ඉල්ලුවේ. ඒ ටික අපි කරලා දුන්නා. ඒක අද ධීවරයන්ට ලොකු ශක්තියක් වෙලා තිබෙනවා. මට මතකයි, එතුමාට මේ අමාත්‍යාංශය භාර දෙද්දී එය අසාර්ථක වෙයි කියලා තමයි භාරදුන්නේ. නමුත් එතුමා වක්කඩත් කළපුවක් කර ගත්තා. ඒ වාගේ නායකත්වයක් තිබෙන කෙනෙකු යටතේ අපට පුළුවන් වෙනවා, අපේ රටේ ආර්ථිකය දියුණු කරන්න පාදක වන අමාත්‍යාංශ දෙක, තුන ඉදිරියට ගෙන යන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද කථා කරන්නේ යෝජනා කිහිපයක් ගැන පමණයි. කාටවත් චෝදනා කරන්නේ නැහැ. අද අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන ප්‍රශ්නය. මේ වන විට බෝට්ටු 400ක්, 500ක්, 600ක් ගිහිල්ලා තිබෙනවා. ඒ යන බෝට්ටු ආපසු එන්නේ නැහැ. ධීවර කර්මාන්තයේ යෙදෙන දෙවැනි පරම්පරාවේ ධීවරයන් ඉන්නේ සියයට එකයි. දෙවැනි පරම්පරාවේ ධීවරයන්ගෙන් විශාල ප්‍රමාණයක් ඕස්ට්‍රේලියාවට යනවා. මේකට පිට පළාත්වල ඉන්න යම් කිසි දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වෙනවා. ආණ්ඩු පක්ෂයේ කියලා මම කියන්නේ නැහැ. නොයෙකුත් පැතිවල දේශපාලන හස්ත මේ හරහා ක්‍රියාත්මක කිරීම තුළ අද ධීවර කර්මාන්තයේ අනාගතය සුරක්ෂිත වීම අවදානම් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මෙයයි. මම ධීවර ඇමතිවරයා හැටියට හිටපු කාලයේ ෆ්‍රින්ජර්ස් කියන බ්‍රසීල තානාපතිතුමා එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය දැනුම ලබා ගෙන රුවලයි, එන්ජින් එකයි දෙකම එකතු කරලා යාත්‍රාවක් හැදුවා. මොකද අපි දැක්කා, ධීවර කර්මාන්තයේදී දරන්න වෙන ලොකුම පිරිවැය තිබෙන්නේ ඩීසල්වලට කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ අපට සාකච්ඡාවක් තිබුණා. එතැනදීත් අපි මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළා. ගුවන් යානාවලට යන වියදමෙන් සියයට 50ක් ඩීසල්වලට යනවා. නඩත්තු වියදමත් එක්ක සියයට 80ක් එතැනටම වෙන් කරන්න ඕනෑ. ගුවන් යානාවකට නඟින්න ඉස්සෙල්ලාම සියයට 80ක් ඒ සඳහා වෙන් කරන්න ඕනෑ. අපි මේක අවම කර ගන්නේ කොහොමද? ඒකට යෝජනා වුණේ අවුරුදු 15ක් 18ක් පරණ planesවලට යන ඉන්ධන වියදම වැඩි නිසා අලුත් planes ටිකක් ගෙනෙන්න ඕනෑය කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට hybrid වාහන තිබෙනවා. ඉන්දියාව අපව ආදර්ශයට අරගෙන අපි පටන් ගත්තු යාත්‍රා හදන එක අත් හදා බලලා මේ වෙද්දී යාත්‍රා 33ක් හදලා තිබෙනවා. ඉන්ධන වියදම ඉතාමත් අවම තත්ත්වයකට යොමු කරන hybrid ධීවර යාත්‍රා හදලා තිබෙනවා. ඒ වාගේම අපි ice plants හදන්නේ සාමාන්‍ය වතුරවලින්. Ice plantsවලට sea water තිබුණොත් ලොකු පිරිවැයක් ඉතුරු කර ගන්න පුළුවන්. Cost එක අඩු කර ගන්න පුළුවන්. ධීවර අමාත්‍යාංශය නිසි ආකාරයෙන් කළමනාකරණය කරගෙන යන්න ගරු ඇමතිතුමාට ශක්තිය, ධෛර්ය ලැබෙන්න ඕනෑය කියලා අපි ප්‍රාර්ථනා කරනවා. ඕනෑම ආයතනයක් පවත්වා ගෙන යද්දී ආදායම් උපයන්න දරන වියදම ගැන සැලකිලිමත් වෙන්න ඕනෑ. අපට පොත්වල ආදායම පෙන්වන්න පුළුවන්. හැංගිච්ච වියදම් -hidden expenses- ටික බලද්දී අපට පේනවා අපි කොතැනද ඉන්නේ කියලා. ව්‍යාපාර

ප්‍රජාව අතුරින් දේශපාලනයට පිවිසි කෙනෙකු විධියට මට හිතෙනවා, කොතරම් දුරට අපි මේ තත්ත්වය කළමනාකරණය කරන්න ඕනෑද කියලා. ව්‍යාපාරික කළමනාකාරිත්වය තමයි මේකට ලොකුම කාරණය. ඒ එක පැත්තක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පෙරේදා අපි සාකච්ඡා කෙරුවා, සුරතල් මසුන් හඳුන්න කියලා. සුරතල් මසුන්ට හොඳ ඉල්ලුමක් තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, ඒ ඉල්ලුම හය මාසයකට සැරයක් තිබෙන්නේ. ඒ සුරතල් මසුන් කුඹුරුවල ඇති කිරීමට මමත් ලොකු උත්සාහයක් දැරුවා. නමුත් කුඹුරුවල ඒ වැඩේ කරන්න බැහැ. ඒ වතුර හොඳම වතුර වෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන් හය මාසයකට පස්සේ ඒ ඉල්ලුම බහිනවා. Connecting flight තිබෙනවා නම් අපට පැය 24ක්, 48ක් තුළ ඒ ගමනාන්තයට ගොස් ඒ සුරතල් මසුන් භාර දෙන්න පුළුවන්. එසේ වීමේදී තිබෙන ලොකුම ගැටලුව තමයි අපට ඒ කළමනාකාරිත්වය තිබෙනවාද කියන එක. Plane කළමනාකාරිත්වයට කොච්චර ඉඩ ප්‍රස්ථාව තිබෙනවාද කියන එක ගැන ආර්ථික සංවර්ධන ඇමතිතුමා වශයෙන් බැසිල් රාජපක්ෂ මැතිතුමා සැලකිලිමත් විය යුතුයි. මොකද ඔබතුමා දක්ෂයෙක්. ඔබතුමාට පුළුවන් වෙනවා, යමක් කියපුවාම ඒ ගැන හොඳට කල්පනා කරලා බලන්න.

ඊළඟ කාරණය තමයි අපේ තල්මසුන් ව්‍යාපාරය. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ සංචාරක ව්‍යාපාරයට පාදක වන තල්මසුන් ව්‍යාපාරය අපි ආරම්භ කෙරුවා. මේකෙන් ඩොලර් මිලියන 15ක්, 20ක් හම්බ වෙන්න පටන් ගත්තා. මොකද අරාබි මුහුදේ ඉඳලා මාලදිවයිනට තමයි මේ මත්ස්‍යයන් වඩාත් පිවිසින්නේ. මොකද එතැන මුහුදේ උෂ්ණත්වය සාමාන්‍ය තත්ත්වයට තිබෙනවා. ලවණ ගතියත් සාමාන්‍ය තත්ත්වයට තිබෙනවා. නමුත් ඔවුන් කථා කරන්නේ හර්ඩ්ස්වලින්. අපි කථා කරන්නෙත් හර්ඩ්ස්වලින්. සාමාන්‍යයෙන් තල්මසෙකුට හර්ඩ්ස් 0 සිට120 දක්වා දැනෙනවා. අපට හර්ඩ්ස් 20 - 20,000 දක්වා දැනෙනවා. ඒ කියන්නේ කිලෝමීටර් දහසක් දුර ඉන්න තල්මසෙක් හර්ඩ්ස්වලින් ගෙන්වා ගන්න පුළුවන්. නමුත් නැව්වලින් සිදු වන පරිසර දූෂණය නිසා, ශබ්ද දූෂණය නිසා අද ඒ මත්ස්‍ය සනත්වය අඩු වෙලා තිබෙනවා කියලා පැහැදිලිවම පේනවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරයට අත්වැලක් දෙන මේ ව්‍යාපාරයේ අරමුණු සාක්ෂාත් කරන්න නම් -ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ යාල අභය භූමිය හැදුවා වාගේ- මාළුන්ටත් අභය භූමියක් හැදුවොත් විශාල ඉල්ලුමක් අපට තිබෙන්න පුළුවන්; ඒ සඳහා නවතාවයෙන් යුතුව කටයුතු කරන්නත් පුළුවන්.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම් උදේනි වික්‍රමසිංහ මැතිතුමා ගොවිජන සේවා හා වනජීවී කියන ක්ෂේත්‍ර දෙකම ගැන සොයා බලනවා. උදේනි වික්‍රමසිංහ මැතිතුමා හොඳ වැඩ ටිකක් කරලා තිබුණා. එතුමාත් මට මේ අවස්ථාවේදී සිහිපත් වෙනවා. මොකක්ද එතුමා කරලා තිබුණේ? ඒ වැඩ කරන අයට රුපියල් 500 ඉඳලා රුපියල් 2,500 දක්වා දීමනාවක් දීලා තිබුණා. ඒ වැඩ කරන අයට ලොකු ප්‍රශ්නයක් තිබුණා. මේ දීමනාව ලබා දීම තුළින් එය අවම කරලා තිබෙනවා. පාරවල් හදා දීලා තිබෙනවා. අපිත් අභය භූමිවලට ගියාම තිබෙන ලොකුම ගැටලුව හොඳ පාරක් නැතිකමයි. එතැනට කොටු වෙලා ඉන්න මිනිස්සුන්ගේ දුක්ගැනවිලි තිබෙනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා වැඩිහිටි අයට දීමනාවක් ලබා දීලා තිබෙනවා. හැම පරාසයක්ම බලමින් තමයි මේ කටයුතු සාක්ෂාත් කරන්න පුළුවන් වන්නේ. ධීවර කර්මාන්තය කළමනාකරණය කරන්න ඕනෑ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. ධීවර කර්මාන්තය තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කරන්න නම්, ecosystem approach ක්‍රමය අනුගමනය කරන්න ඕනෑ. ඒ කියන්නේ මාළු ඇල්ලීමේදී ගළපන උපක්‍රමයයි. දැලට කුඩා මාළු පැටව් ආදිය හසු වීම වැළැක්වීම තමයි කරන්න ඕනෑ. මොකද මාළු තණකොළ කන්නේ නැහැ නේ. ලොකු මාළු එන්න නම් පොඩි මාළු ඉන්න ඕනෑ. හොඳම උදාහරණය මාලදිවයින. මාලදිවයිනේ පුංචි මාළු ටික ලස්සනට ඉන්නවා. පුංචි මාළු කන්න ලොකු මාළු එනවා. මාලදිවයිනේ ධීවරයින් පුංචි මාළු ටික ඉතුරු කරලා ලොකු මාළු ටික අල්ලා ගන්නවා. බහුදින යාත්‍රාවලින් මාළු අල්ලද්දි අපි දැකපු ප්‍රධාන කාරණයක් තිබෙනවා. ඒ බහුදින යාත්‍රාවට ලොකු මාළු කිලෝග්‍රෑම් 15,000ක් හම්බ වනවා නම්, පුංචි මාළුත් කිලෝග්‍රෑම් 15,000ක් හම්බ වනවා. ඒවායෙන් value addition ගන්න මොනවාද කරන්න පුළුවන් කියලා තවම අපි කල්පනා කරලා නැහැ. ධීවර කර්මාන්තය හරියට කළමනාකරණය කර ගත්තොත් ඒ තුළින් අපට රුපියල් බිලියනයක් හොයන්න පුළුවන්. අපි විශ්වාස කරනවා, ඔබතුමන්ලා එකතු වෙලා වැඩ කර ගෙන යාවි කියලා. සමහර නිලධාරීන් ඉන්නවා, එක එක දේවල් කියලා දේශපාලනඥයන් රවටනවා.

අපි, "වැලිගොව්වා" ගොඩ දාලා දුන්නා. ග්‍රීස් ගාලා, ඉටි ගාලා තමයි වැලිගොව්වා ගොඩ දැම්මේ. මට ආරංචියක් ආවා, ඒකත් චීන කොම්පැණියකට දීලා තිබෙනවා කියලා. ගරු ධීවර ඇමතිතුමා බලන්න, මේක ඇත්තද නැත්තද කියලා. මේක හොයා බලන්න. ඒක බදු දීලා තිබෙනවාද කියලා බලන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ වේලාව නම් හරි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒංගොල්ලන්ට වැලි කියුබ් එකක් රුපියල් 300 බැගින් දීලා තිබෙනවා. මේවා කරන්නේ කවුද? මේ කරුණු කාරණා හොයා බලන්න. අනෙක් එක මේවා බදු දෙනවාට වඩා කළමනාකරණය කරමින් හොඳ යටිතල පහසුකම් දීලා ධීවරයාව ශක්තිමත් කරන්න.

අතිගරු ජනාධිපතිතුමා සාගර විශ්වවිද්‍යාලය විවෘත කරපු හින්දා අද දෙවැනි පරම්පරාවට ධීවර කර්මාන්තයට අවතීර්ණ වන්න උචිත අවස්ථාවක් ලබා දීලා තිබෙනවා.

මට බොහොම අඩු වේලාවක් තිබෙන්නේ. මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. චෝදනා නැතිව යෝජනා කරමින් මම මේ කටයුත්ත කරන්නේ. ධීවර කර්මාන්තය ගැන මටත් කැක්කුමක් තිබෙනවා. ධීවර කර්මාන්තයේ මමත් අවුරුදු පහක් හිටියා. විශේෂයෙන්ම මුහුදුබඩ ජීවත් වන අපටත් මේ පිළිබඳව යම් කිසි හැඟීමක් තිබෙන නිසා මේ කටයුතු කරන්න කියලා යෝජනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
அடுத்ததாக, மாண்புமிகு அடைக்கலநாதன் அவர்கள்! உங்களுக்கு 15 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளன.

[பி.ப. 3.37]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்கள் சபைக்குத் தலைமைதாங்கும் இவ்வேளையில் இந்தக் குழுநிலை விவாதத்திலே பேசுவதில் மகிழ்ச்சியடைகின்றேன். இந்த நாட்டின் பொருளாதாரத்துக்கு விவசாயம், கடற்றொழில், கால்நடை ஆகிய மூன்று துறைகளும் பெருமளவு பங்களிக்கின்றன. அந்த வகையில், இந்த நாட்டை முன்னேற்றுவதில் முக்கிய பங்காற்றுகின்ற இந்த அமைச்சுகளுக்கான நிதி ஒதுக்கீடுகள் மீதான இந்த விவாதத்திலே, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பாக ஏற்கெனவே ஒருசில உறுப்பினர்கள் உரையாற்றியிருந்தாலும் கூட, எங்களுடைய மக்களில் பெரும்பாலானோரின் வாழ்வாதாரமாக இருக்கின்ற விவசாயம் மற்றும் கடற்றொழில் சம்பந்தமாக நானும் ஒருசில வார்த்தைகளைக் கூற விரும்புகின்றேன்.

வரட்சியால் பாதிக்கப்பட்ட விவசாயிகள் பெற்ற கடன்களுக்கு வட்டி அறவிடப்படுவது நிறுத்தப்படுமென்று மேதகு ஜனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்ட உரையின்போது அறிவித்திருந்தார். எங்களுடைய வன்னிப் பிரதேசத்திலே இடம்பெயர்ந்த விவசாயிகள் இருக்கின்றார்கள். உண்மையிலே விவசாயிகள் பெற்ற கடனுக்கான வட்டியை நிறுத்தினாலும்கூட, அந்தக் கடனை அடைப்பதற்கு அவர்கள் மிகவும் திண்டாடுகின்ற சூழல் அங்கு காணப்படுகின்றது. ஏனென்றால், எதிர்வரும் பெரும்போக செய்கையை அவர்கள் கடன்பட்டுத்தான் செய்ய வேண்டும். அறுவடை செய்கின்றபோது, ஏற்கெனவே பெற்ற கடனோடு இந்தக் கடனையும் அடைக்கவேண்டிய திண்டாட்டத்திலே எங்களுடைய விவசாயிகள் இருக்கின்றார்கள். ஆகவே, விவசாயிகள் பெற்ற ஒட்டுமொத்தக் கடனையும் நீக்க வேண்டுமென்ற ஒரு கோரிக்கையை நான் இந்தச் சபையிலே முன்வைக்க விரும்புகின்றேன்.

அதேவேளை, வன்னி மாவட்டத்தில் பசளை மானியம் கொடுக்கப்பட்டாலும், அதன் நிறையானது அந்தரிலிருந்து குறைக்கப்பட்டிருக்கின்றது. இயற்கைப் பசளையைப் பயன்படுத்துவதை ஊக்குவிப்பதற்காக அது குறைக்கப்படுவதாகச் சொல்லப்படுகிறது. ஆனால், உண்மையில் அப்படிச் செய்யப்படுவதற்கான காரணம் என்னவென்பதை எங்களால் அறிய முடியவில்லை. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் அதுபற்றித் தெளிவுபடுத்த வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, எங்களுடைய மன்னார் மாவட்டத்தில் பிரதான குளமாகிய கட்டுக்கரைக்குளத்தின் நிர்மாணப் பணிகள் பாரிய செலவிலே மேற்கொள்ளப்பட்டு வருகின்றன. ஆனால், அந்தப் பணிகள் சரியான முறையில் மேற்கொள்ளப்படுகின்றனவா? அதன் செலவுகள் எவ்வாறு கையாளப்படுகின்றன? என்பவை பற்றி அறிய முடியவில்லை. ஆகவே, அந்தக் குளத்தின் நிர்மாணப் பணிகள் முடிவடைந்த பின்னர், அதற்குச் செலவான தொகை எவ்வளவென்பதை இந்தச் சபையில் தெரிவிக்கவேண்டும் என்ற கோரிக்கையையும் நான் முன்வைக்கின்றேன்.

மேலும், கால்நடை வளர்ப்பு விவசாயிகளைப் பொறுத்தமட்டிலே அவர்களுடைய கால்நடைகளைச் சொந்த இடங்களில் வைத்துப் பாதுகாப்பதற்கு அவர்கள் மிகவும் சிரமப்படுகின்றார்கள். மேய்ச்சல் நிலம் இல்லாத பெருங்குறை அங்கு காணப்படுகின்றது. அவர்களுடைய கால்நடைகளை அவர்கள் ஆங்காங்கே மேய விடுகின்றபோது விவசாயச் செய்கையில் ஈடுபடுகின்ற விவசாயிகளுக்கும் அவர்களுக்குமிடையில் பிரச்சினைகள் ஏற்படுகின்றன. சிலவேளைகளில் அடிபிடி நடைபெறுகின்ற சாத்தியக்கூறும் காணப்படுகின்றது. ஆகவே, பயிர்ச்செய்கையில் ஈடுபடுகின்ற விவசாயிகளுக்கு எந்தப் பாதிப்பும் ஏற்படாத வகையில், கால்நடைகளை மேய விடுவதற்காக உடனடியாக மேய்ச்சல் நிலத்தை கொடுத்து இந்தப் பிரச்சினையைத் தீர்த்துவைக்கவேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, எமது மீனவ சமூகம் சார்பாகவும் சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். 1985ஆம் ஆண்டு வடக்கு, கிழக்கிலே 48 சதவீத மீன் உற்பத்தி செய்யப்பட்டது. ஆனால், இன்று அங்கு 25 சதவீதத்துக்கும் குறைவாகத்தான மீன் உற்பத்தி செய்யப்படுகின்றது. எனவே, மீன் உற்பத்தியில் வீழ்ச்சி ஏற்பட்டதற்கான காரணத்தைக் கண்டுபிடித்து அதை நிவர்த்தி செய்ய முன்வர வேண்டும். அப்போதுதான் எங்களுடைய மீனவ சமூகத்தினருக்கு நல்ல எதிர்காலத்தை உருவாக்க முடியும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். முல்லைத்தீவு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள கொக்கிளாய் போன்ற பகுதிகளுக்கு அதிகளவிலான தென்னிலங்கை மீனவர்கள் மீன்பிடிக்கச் செல்கிறார்கள். கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்திலே கவனம் செலுத்தி, அவர்களைக் கட்டுப்படுத்துகின்ற நடவடிக்கைகளை எடுத்தாலும்கூட, இப்பொழுதும் அந்த நிலைவரம் தொடர்ந்துகொண்டிருக்கின்றது. அங்குள்ள எமது மீனவர்கள் இடம்பெயர்ந்து துன்பப்பட்டு எவ்வளவோ கஷ்டங்களின் மத்தியில் இப்பொழுதுதான் தங்களுடைய வாழ்க்கையை மீள ஆரம்பித்திருக்கிறார்கள். தற்பொழுது அவர்கள் சொந்தக் காலில் நிற்பதற்கு முயற்சிக்கின்ற ஒரு சூழ்நிலையிலே, தென்னிலங்கை மீனவர்களின் இந்தக் கெடுபிடியானது அவர்களை மிகவும் துன்பத்துக்குள்ளாக்கியிருக்கின்றது. ஆகவே, இந்த நிலைமையைக் கவனத்திற்கொண்டு அதற்குரிய நடவடிக்கை எடுக்கவேண்டும் என்பதை வலியுறுத்த விரும்புகின்றேன்.

இப்போது யுத்தம் முடிந்துவிட்டது; சமாதானம் நிலவுகின்றதென்று அரசாங்கம் சொல்கிறது. ஆனால் மன்னார், யாழ்ப்பாணம் போன்ற மாவட்டங்களைப் பொறுத்தமட்டிலே மீன்பிடிப்பதற்கான pass நடைமுறை என்பது இன்றைக்கும் தொடர்ந்துகொண்டிருக்கின்றது. இந்தப் pass முறையின் பிரகாரம், அது ஒவ்வொரு வருடமும் புதுப்பிக்கப்பட வேண்டும்; எந்த இடத்திலிருந்து அவர்கள் தொழிலுக்காகக் கடலுக்குச் செல்கிறார்களோ, அந்த இடத்திற்கே திரும்பி வரவேண்டும் என்பது போன்ற நிபந்தனைகள் விதிக்கப்பட்டுள்ளன. அதாவது, அவர்கள் வேறு இடத்தில் சென்று கரையொதுங்குகின்றபோது, "pass க்குரிய வழியாக வரவேண்டும்; மாற்று வழியைப் பயன்படுத்தக்கூடாது" என்று கடற்படையினரால் துன்புறுத்தப்படுகின்றனர். அதுமட்டுமல்ல, pass ஐப் பறிக்கின்ற செயற்பாடுகளும் அடுத்தமுறை pass தரமுடியாதென்று மிரட்டப்படுகின்ற நிலைமையும் காணப்படுகின்றது. சிலசமயங்களிலே நேரம் போய்விட்டதென்று அல்லது மறதியினால் pass ஐ எடுக்காமல் சென்றுவிட்டால், கடற்படையினர் அவர்களைக் கைதுசெய்து நீதிமன்றத்தில் ஆஜர்படுத்துகின்ற நிலைமையும் காணப்படுகின்றது. அந்தளவுக்கு இந்தப் pass நடைமுறையினால் எமது மீனவர்கள் மிகவும்

துன்பப்பட்டுக்கொண்டிருக்கிறார்கள். ஆனால், தேர்தல் காலங்களில் மட்டும் இந்தப் pass முறையை நீக்கப்படுகிறது; பிறகு அது மீண்டும் நடைமுறைக்கு வருகின்றது. தற்போது மூன்றரை வருடங்களாக யுத்தமில்லை, சமாதான சூழல் நிலவுகின்றது என்று சொல்லப்படுகின்றது. அப்படியானால் ஏன் இந்த pass முறை நடைமுறைப்படுத்தப்படுகின்றது? என்று மிகவும் வேதனையுடன் இந்தச் சபையிலே உங்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Hon. Member, actually there is no rule in this country for the pass system. Nobody can take a person to court and charge him. You had better take legal action. That is the best thing.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

Thank you, Hon. Minister.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Go to court, get some fishermen to file an FR case. There is no rule; there are no Emergency Regulations now. So, they have no authority to do that.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

Thank you very much.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Repeatedly, I have told that to these people.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

நன்றி அமைச்சர் அவர்களே, நாங்கள் உடனடியாக நீதிமன்றத்தை நாடுகின்ற முயற்சியை மேற்கொள்கின்றோம்.

அடுத்ததாக, எண்ணெய் மானியம் தொடர்பாக கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்தி, அதனைக் கண்காணிக்க வேண்டும். ஏனென்றால், வறுமை நிலையிலுள்ள எமது மீனவர்கள் எண்ணெய் மானியம் பெறுவதற்காகக் குறித்த காரியாலயங்களுக்குச் செல்கின்றபோது, அவற்றுக்கு அனுமதியளிக்கும் நிலை மிகவும் குறைவாகக் காணப்படுகின்றது.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

We are giving them an electronic fuel card. So, they do not need to worry about anything. Whatever quantity of fuel they pump, that gets recorded along with the balance. So, it will be very easy for the fishermen.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

Thank you. கௌரவ அமைச்சர் அவர்கள் உடனுக்குடன் பதிலைக் கூறும்போது சந்தோசமாக இருக்கிறது.

அடுத்த விடயம், ஒட்சிசன் சிலிண்டர் பாவிக்கின்ற நடைமுறைக்கு கொழும்பிலிருந்துதான் அனுமதி வழங்கப்படுகின்றது. அங்கே சாதாரண மீனவர்கள் ஆழ்கடலுக்குச் சென்று கடலட்டை, சங்கு போன்ற விலையுயர்ந்த கடல் உயிரினங்களைப் பிடிப்பதற்கு இந்த முறையானது ஒரு தடையை ஏற்படுத்துகிறது.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

We do not issue any permits for that from Colombo. From Colombo, we issue permits only for exports. For them to fish sea cucumbers, permits are issued by the Assistant Director of that particular district. If they have done anything wrong, you just make a complaint to me. Then, I will inquire into that and take necessary action.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

Thank you.

அடுத்து, தென் இலங்கை மீனவர்கள் 97 பேர் South Bar என்ற இடத்திலே தொழில் செய்யலாம் என்று குறித்த இரண்டு மீனவ சமூகங்களுக்கும் இடையில் ஓர் ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டது. ஆனால், இப்பொழுது அவர்கள் 125 பேருக்கு மேல் அங்கு சென்று கொட்டில்களை அமைத்துக் கொண்டிருந்து தொழில் செய்கின்றார்கள். இவர்களின் வாடிகள் அமைக்கப்பட்டுள்ளதால் எமது கரைவலை மீனவர்கள் மிகவும் சிரமத்திற்குள்ளாகின்றனர். *[இடையீடு].* South Bar - Mannar.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

In Mannar, there is a dispute about that. I will be in Mannar on Sunday, the 2nd of December to distribute some boats. You also can come because we are distributing some boats donated by the Indian Government to the fishermen. I will be there on 2nd of December 10 o'clock. I also want to discuss this matter with the authorities there. So, you can come.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

Okay. Thank you very much.

அடுத்த முக்கியமான விடயம், இந்திய trawler களின் வருகை பற்றியது. எங்கள் கடற் பிரதேசத்திலே சுமார் 95 மெற்றிக் தொன் மீன், வருடாந்தம் இந்திய மீனவர்களால் பிடிக்கப்படுகின்றது. இதனால் எமது நாட்டுக்குச் சுமார் 750 மில்லியன் ரூபாய் இழப்பு ஏற்படுகின்றது. கௌரவ அமைச்சர் அவர்களே! எமது தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் கடந்தமுறை இந்தியப் பிரதமரைச் சந்தித்தபோது இந்திய

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

மீனவர்களின் வருகையைத் தடைசெய்யும் வகையில் ஓர் ஆலோசனையை முன்வைத்தது. அதாவது, இந்திய மீனவர்கள் மத்தியில் ஆழ்கடல் மீன்பிடியை ஊக்குவிப்பதன்மூலம் அவர்கள் எமது எல்லைக்கு வருகின்ற வாய்ப்பு மிகவும் குறையும் என்று நாங்கள் ஆலோசனை கூறியிருந்தோம். அதேபோல, எங்களுடைய மீனவர்களுக்கும் ஆழ்கடல் மீன்பிடி உபகரணங்கள் வழங்கப்படவேண்டும் என்றும் கேட்டிருந்தோம். அதனை அவர்கள் ஒத்துக்கொண்டிருக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே! நீங்களும் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டும்.

இன்று எங்களுடைய ஆழ்கடல் மீனவர்கள் தங்கள் படகுகளை நிறுத்தி வைப்பதில் சிரமப்படுகின்றார்கள். உதாரணமாக மைலிட்டி பாதுகாப்பு வலயம் என்பதனால் அங்கு யாழ்ப்பாணம் ஆழ்கடல் மீன்பிடி சமாசத்துக்குச் சொந்தமான trawler நங்கூரமிடுவது தடுக்கப்பட்டுள்ளது. இன்று வட மாகாணத்திலே குறிப்பாக, வன்னி மற்றும் யாழ்ப்பாண மாவட்டங்களில் புதிதாக இரண்டு - மூன்று சிறிய harbour களை உருவாக்கும் திட்டத்தை நீங்கள் அறிவித்திருக்கின்றீர்கள். அதற்கு மன்னார் மாவட்டத்தில் சிலாவத்துறை அடையாளம் காணப்பட்டிருக்கின்றது. ஆனால், அங்கு இன்னும் கூடுதலாக அதாவது பேசாலை, வங்காலை, தலைமன்னார் ஆகிய மூன்று இடங்களிலும் படகுகள் நங்கூரமிடும் சிறிய துறைமுகங்களை நிறுவ ஏற்பாடு செய்வது நல்லது. இதேபோல் யாழ்ப்பாணத்திலும் செய்தால் அங்குள்ள ஆழ்கடல் மீனவர்களும் நன்மையடைவர்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்குரிய நேரம் முடிந்துவிட்டது.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அடுத்து, தேவன்பிட்டி மீனவர் பிரச்சினை. அதிலும் கௌரவ அமைச்சர் அவர்கள் தலையிட்டால் நியாயம் கிடைக்கும் என்று நாங்கள் நம்புகின்றோம். ஏனென்றால், இன்று அங்கு குறித்த இரண்டு சமூகங்களும் அடிபட்டுக் கொண்டிருக்கின்றன. அண்மையில் அங்கு அட்டை வளங்கள் எல்லாம் சேதப்படுத்தப்பட்டிருக்கின்றன. ஆகவேதான் தேவன்பிட்டிப் பிரச்சினையில் உங்கள் பார்வையைச் செலுத்த வேண்டும் என்று கேட்கின்றோம்.

மேலும், கௌரவ அமைச்சர் அவர்களே! இந்தியா எத்தகைய அன்பளிப்புக்களைச் செய்தாலும், அவையெல்லாம் சம்பந்தப்பட்ட எல்லோருக்கும் சமமாகப் பங்கிடப்படும் வகையில் நீங்கள் உங்கள் பார்வையைச் செலுத்த வேண்டும் என்றும் கேட்டுக்கொண்டு, இறுதியாக, இந்த நாட்டிலே முக்கிய வருமானம் ஈட்டித் தருகின்ற விவசாயம் மற்றும் கால்நடை வளர்ப்புத் தொழில்களையும் ஊக்குவிக்க நடவடிக்கை எடுக்கவேண்டும் என்று சம்பந்தப்பட்ட அமைச்சர்களிடம் கேட்டு, வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු වී.කේ. ඉන්දික මන්ත්‍රීතුමා.

[අ. භා. 3.52]

**ගරු වී.කේ. ඉන්දික මහතා**
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයේ අට වන අය වැය ලේඛනයේ කාරක සභා අවස්ථා විවාදයේදී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. අය වැය ලේඛන 7ක් ඉදිරිපත් කළ අප රජය මහින්ද චින්තනයට අනුව නිසි පරිදි කටයුතු කළ නිසා තමයි, විටින් විට පැවැත්වූ හැම මැතිවරණයක්ම ජයග්‍රහණය කළේ. නැවත නැවත අප වෙත බලය ලබා දෙන්නට ජනතාව කටයුතු කළේ ඒ නිසාය කියන එක අපි ආඩම්බරයෙන් කියන්න ඕනෑ. අපි ඒ කටයුතු නිසියාකාරව ඉටු කළේ නැත්නම් අපට මෙවන් ජයග්‍රහණ අත් කර දෙන්න රටේ ජනතාව කටයුතු කරන්නේ නැහැ. ජනතාවට සෑහෙන සේවාවක් ඉටු කර තිබෙන නිසා තමයි අපට ඒ බලය ලබා දීලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ පක්ෂවලට හැම දාමත් මේ අය වැය නීරසයි. ඒක තමයි අපේ රටේ අභාග්‍යය කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, අපි කරන හොඳ දේත්, නරක දේත් එක ගොඩකට අර ගෙන තමයි හැම දාම විපක්ෂය කටයුතු කරන්නේ. ඒ නිසා තමයි, පසු ගිය කාලයේ මේ රට සහලින් ස්වයංපෝෂිත වෙන කොට විපක්ෂයේ අයට ඒවා පෙනුනේ නැත්තේ.

අද ලංකාව පුරාම ඇති ප්‍රධාන මාර්ග පද්ධතිය සකස් වෙලා. අතුරු මාවත් සියයට 75කට වඩා සකස් වෙලා අවසානයි. සහලින් ස්වයංපෝෂිත රටක් හැටියට අප අද සහල් අපනයන කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම පසු ගිය වකවානුව තුළ මේ රටේ ධීවර කර්මාන්තය ගොඩ නඟන්නට සුවිශාල මෙහෙවරක් කිරීම සම්බන්ධයෙන් මා මේ අවස්ථාවේ අපේ ගරු ධීවර ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලාගේ වැඩ කොටස සාර්ථකව ඉටු කරමින් ධීවරයාට නිසි සහන ලබා දෙන්නට කටයුතු කළා. රජයක් හැටියට අද ධීවරයා රැක ගන්නට, ධීවරයා ගොඩ නඟන්නට වැඩපිළිවෙළ රාශියක් ක්‍රියාත්මක වෙනවා. අපේ රජය ඩීසල් මිල වැඩ වුණා කියලා බලා ගෙන හිටියේ නැහැ. ධීවරයාට ඩීසල් සහනාධාරය ලබා දෙන්න කටයුතු කළා. ඒක ධීවරයාට විශාල සහනයක් වුණා. සියයට 90ක සහනාධාරය යටතේ බෝට්ටු, දැල් ආම්පන්න ලබා ගන්නට ධීවරයාට අවකාශ සලසා දී තිබෙනවා. මේවා ඉටු කළ නිසා තමයි අද උතුරේත්, නැඟෙනහිරත්, දකුණේත් එක හා සමානව ධීවර කර්මාන්තය කරන්නට ධීවර කාර්මිකයාට අවශ්‍ය ශක්තිය ලැබී තිබෙන්නේ.

ඒ වාගේම අක්‍රිය වෙලා තිබුණ ධීවර සංස්ථාව යළි ගොඩ නඟලා, ධීවර සංස්ථාවෙන් පාරිභෝගිකයාට ඉටු විය යුතු සාධාරණය ඉටු වෙනවා. ඒ පිළිබඳවත් අපි සන්තෝෂ වෙනවා. අද ධීවර කර්මාන්තය කරන ධීවර කාර්මිකයාගේ අස්වැන්න ධීවර සංස්ථාවෙන් සාධාරණ මිලකට ලබා ගෙන, පාරිභෝගිකයාට සාධාරණ මිලකට ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. ඒ නිසා අද කළුකඩයට ගිහිල්ලා මාළු කිලෝව රුපියල් 700ට, 800ට

ගන්න අවශ්‍ය වන්නේ නැහැ. ගමේ ජනතාවට අවශ්‍ය මාළු ධීවර සංස්ථාවේ අළෙවිසලට ගියාම අඩු මුදලට ලබා ගන්න පුළුවන්කම අද ලැබී තිබෙනවා. ධීවර සංස්ථාවේ වෙළෙඳසල් නැත්නම් ගමේ කෙනකුට අද මුහුදු මාළු කෑල්ලක් කන්න ලැබෙන්නේ නැති බව ගම්බද අය හැටියට අප දන්නවා. එහෙම නොවුණා නම්, ගමේ ජනතාවට මාළු වෙනුවට ඒ මුදලාලිලාගේ ගණන් තමයි අද කන්න වෙන්නේ. ඒ නිසා ඒ ධීවර වෙළෙඳසල් ඉතාම සාර්ථකව ගමේ ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කරනවාය කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසු ගිය කාලයේ ඇති වූ නියඟයත් සමඟ මේ රටේ මිරිදිය ධීවර කර්මාන්තයට විශාල බාධක එල්ල වුණ බව අපි දන්නවා.

ජලාශ විශාල ප්‍රමාණයක් සිඳී ගියා. ඒ ජලාශවල මිරිදිය කර්මාන්තය කර ගෙන ගිය ධීවර කාර්මිකයන්ට විශාල අපහසුතාවන්ට පත් වෙන්න සිදු වුණා; මත්ස්‍ය අස්වැන්න අහිමි වුණා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා වෙන් කළ මුදලින් ගරු අමාත්‍යතුමා පසු ගිය වකවානුව තුළ මිරිදිය ධීවර කර්මාන්තය ගොඩ නැංවීම වෙනුවෙන් සුවිශාල වැඩ කොටසක් කළා. මත්ස්‍ය පැටවුන් ලබා දීලා, ඔරු සහ දැල් ආම්පන්න ලබා දීලා ඒ ජනතාව දිරිමත් කළා. ඒ තුළින් ගම්වල ජීවත් වන ජනතාවට පෝෂ්‍යදායී ආහාර වේලක් සකස් කර ගන්න හැකියාව ලැබුණා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා.

ඒ වාගේම අපි දන්නවා, පොකුණු තුළ මත්ස්‍ය වගාව දිරි ගන්වන්නට ධීවර අමාත්‍යාංශයත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් එකතු වෙලා විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ බව. ඒ තුළින් අද ගම්වල විශාල පිරිසක් පොකුණු තුළ මත්ස්‍ය වගාවට යොමු කරලා තිබෙනවා. ඒක ඉතාම සාර්ථක ව්‍යාපාරයක්; ඉතාම ලාභදායී ව්‍යාපාරයක්. ඒ මත්ස්‍ය අස්වැන්න ඔවුන්ගේ පරිභෝජනයට ගන්නවා වාගේම වෙළෙඳ පොළට නිකුත් කරන්නත් පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ අනුව පොකුණු තුළ මත්ස්‍ය වගාව සඳහා විශාල ආධාර මුදලක් ලබා දීලා ඒ අය දිරි ගැන්වීම කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි දන්නවා අපේ රටේ කාලීන වගාව සඳහා යොදා ගන්නා වැව් සහ ජලාශ තිබෙන බව. ඒ වැව් මත්ස්‍ය වගාව සඳහාත් කාලීනව යොදා ගන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. අපේ ගම්වල ධීවර සමිති ඒ කටයුතු ඉතාම සාර්ථකව ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම නිත්‍ය ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම සිදු කරනවා. මම ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා, පසු ගිය කාලය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශාල වැව් ප්‍රමාණයකට මත්ස්‍ය පැටවුන් තැන්පත් කර දීම පිළිබඳව. ඒ පිළිබඳව මා එතුමන්ලාට ස්තුතිය හා ගෞරවය පුද කරන්න ඕනෑ. අපි දන්නවා, නිත්‍ය ජලාශවල අද ඉතාම සාර්ථකව මේ මිරිදිය මත්ස්‍ය වගාව සිදු කරන බව. මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ලබා දීපු ඒ ශක්තිය සහ සහයෝගය නිසා අපේ ගම්වල අහිංසක ජනතාවටත් අද පොකිරිස්සන් හා සමාන ඉස්සන් පරිභෝජනයට ගන්නට හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිරිදිය ධීවර කර්මාන්තය කර ගෙන යන්න අපි කොතරම් දැල් ආම්පන්න දුන්නත්, කොතරම් සහන දුන්නත් වැඩක් වෙන්නේ නැහැ, ධීවර ජනතාව කළමනාකාරිත්වයට යොමු කරන්නේ නැත්නම්. ඒ සඳහා ගෙන යන වැඩ පිළිවෙළ තව තවත් ශක්තිමත් කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. නිසි කළමනාකාරිත්වයක් තුළින් විතරයි නියම ආකාරයෙන්, එක විධියට ධීවර ජනතාවට මේ කර්මාන්තය කර ගෙන යන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා ඔවුන්ට අවශ්‍ය ශක්තිය දෙනවා වාගේම නිසි කළමනාකාරිත්වයකට ඔවුන් යොමු කරලා, ඒ ඒ තොටුපොළවල පවත්නා නීති නිසියාකාරව ක්‍රියාත්මක කරවලා, තහනම් දැල් ඉවත් කරලා, තහනම් පන්න ක්‍රම නැවැත්වීමට කටයුතු කරනවා නම් ඒක විශාල මෙහෙවරක් වෙයි කියලා මම විශ්වාස කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ධීවර අමාත්‍යාංශය තුළින් ධීවර වරායන් සහ ධීවර නැංගුරම් පොළවල් ගොඩ නංවන්නට සහ වැඩි දියුණු කරන්නට රුපියල් මිලියන 2,000කට වැඩි මුදලක් ලබා දීලා තිබෙනවා. එය ධීවර ජනතාවගේ සුබසිද්ධිය සඳහා කළ දෙයක්. හම්බන්තොට, සිලාවතුර, ගන්දර ආදී විශාල ධීවර තොටුපොළවල් සහ නැංගුරම් පොළවල් සකස් කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සකස් කරලා තිබෙන වැඩ පිළිවෙළ තුළින් වැලිපටන්විල නැංගුරම් පොළේ පළමුවෙනි අදියරේ කටයුතු ඉටු කරලා තිබෙනවා. එහි දෙවෙනි අදියරත් ක්‍රියාත්මක කරලා වැලිපටන්විල නැංගුරම් පොළ සකස් කරලා දෙන්න කියන ඉල්ලීමත් කරනවා ගරු අමාත්‍යතුමනි.

අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ධීවර අමාත්‍යතුමා විධියට ඔබතුමාත්, මේ රජයත් ගෙන යන වැඩ පිළිවෙළ ගැන මගේ ස්තුතිය සහ ගෞරවය පුද කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු එච්.ආර්. මිත්‍රපාල නියෝජ්‍ය ඇමතිතුමා - නැත.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මන්ත්‍රීතුමා - නැත.

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මිනිත්තු 15ක් තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
බලෙන්ම ඉල්ලා ගන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, ආණ්ඩු පක්ෂයේ වැඩි මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ඉන්නවා.

[අ. භා. 4.02]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මා එක කරුණක් කියන්න ඕනෑ. රටට වැදගත් වුණු අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී රජයේ වැදගත් වග කියන ඇමතිවරුන්ගේ ක්‍රියා කලාපය ගැන පුංචි කනගාටුවක් තිබෙනවා. මම හිතනවා, මේ අවස්ථාවේ කෘෂිකර්ම ඇමතිතුමාත්, එහෙමත් නැත්නම් ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාවත්-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තේ බොන්න ගියා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
තේ එක ගෙන්වා ගෙන බොන්න තිබුණා. නැත්නම් එළියේ එක්කෙනෙක් හරි ඉන්න තිබුණා. ඒ දෙන්නාම එකට තේ බොන්න යන එක මේ වේලාවේ ඒ තරම් ශුභදායක නැහැ. ඒ ගැන මම වැඩිය කථා කරන්නේ නැහැ. මොකද "I don't know why, එහෙම වෙන්නේ ඇයි" කියන එක්කෙනා පිටිපස්සේ ඉන්නවා. කෙළින්ම බෝතල් පාරක්වත් ඔළුවට වදීවිද දන්නේත් නැහැ. රාජිත සේනාරත්න ඇමතිතුමාටත් දැන් ගොඩක් දේවල් කිව්වා. ඇමතිතුමනි, ඒ කියපු ටික කරන්න. නැත්නම් සිංදුවක් කියන්න ගිය වෙලාවට සුනිල් පෙරේරාට වුණා වාගේ ප්‍රශ්නයක් එයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ වැදගත් මාතෘකාව සම්බන්ධයෙන් වචන කීපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මම ගොඩක් සතුටු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ නිර්මාතෘවරයා තමයි එදා ප්‍රකාශ කළේ, "මඩ සෝදා ගත් කල ගොවියා රජ වනවා" කියලා. ඒ නිසා තමයි වක්කඩෙන් අත සෝදා ගෙන නාම යෝජනා පත්‍රයට අත්සන් කරපු, ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය වන වර්තමානයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කමත, ඉපනැල්ල, වක්කඩ මට ආගන්තුක තැනක් නොවෙයි කියලා ගොවි ජනතාවගේ ප්‍රසාදය ලැබුවේ. එතුමා එහෙම ප්‍රසාදය ලැබුවේ අන්න ඒ හේතුව නිසාය කියන එක මතක තියා ගන්නට ඕනෑ.

නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලය තුළ ගොවි ජනතාව වෙනුවෙන් ලබා දුන් විශ්වාසය යථාර්ථයක් වුණාද කියන කාරණය පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවේ මැතිඇමතිවරු නම් සැදී පැහැදී සිටින්නේ තමන්ගේ අමාත්‍යාංශ බේරා ගන්නයි. එහෙමත් නැත්නම් අලුත් අමාත්‍යාංශයක් ගන්නයි. මේ පිටුපස සිටින ගරු වී.කේ. ඉන්දික මන්ත්‍රීතුමාලා වාගේ උදවිය බලන්නේ කොහොම හරි ඇමතිකමක් හෝ නියෝජ්‍ය ඇමතිකමක් ගන්නයි. ඒ සඳහා full try එකක් දමනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එක්සත් ජාතික පක්ෂය ගැනයි කියන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
එක්සත් ජනතා නිදහස් සන්ධානය ගැනයි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කම්මැලි වෙලා ඉන්න වෙලාවේ, සියලුම දෙනා නිදිමත වෙලා ඉන්න වෙලාවේ, ෆ්‍රෙඩී සිල්වාගේ සින්දුවක් මට මතක් වුණා. "අලුත් කලාවක් සොයා ගත්තා මං දියුණු වෙන්න ඕනෑ නම්- නිකං ඉන්නෙපා කොහොම කොහොම හරි ගහපල්ලා බන් පෙත්සම්" එහෙමයි එදා කිව්වේ. අද ඇමතිවරු ඒක ලස්සනට මෙහෙම කියනවා. පිටුපසින් ඒ සින්දුව ලස්සනට කියනවා මම අහගෙන හිටියා. "අලුත් කලාවක් සොයා ගත්තා මං ඇමතිකමක් රැක ගන්න ඕනෑ නම් - නිකං ඉන්නෙපා කොහොම කොහොම හරි මහ රජාට දාපල්ලා සුබ පැතුමක්." කියනවා. පත්තරේ බලපුවාම - [බාධා කිරීමක්] එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා බෙරේ පදේ ගහන්න එතකොට මම සින්දුව කියන්නම්. එතකොට ගැළපෙනවා. එහෙමවත් ගළපා ගන්න බැරි කෙනෙක් නේ ඉන්නේ. එහෙමවත් පොඩ්ඩක් පුරුදු වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමා වැඩ කළේ නැති වුණාට, මෙතරම් විදේශ ණය බරකුත් තියා ගෙන ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය සමරන අවස්ථාවේ "ලංකාදීප" පත්තරේ ජනාධිපතිතුමාට full පිටුවක සුබ පැතුමක් නම් දමා තිබුණා. ඒක කොහොමද තිබුණේ? එහි මෙන්න මේ විධියට සඳහන් කර තිබුණා:

"ගොවිජන රිද්මය හඳුනා ගත් ඔබ
නිල්ල පිරුණු රටක අසිරිය විඳිනට
නව අරුණළු උදා කළා දේශයට....

දැනුමෙන් සපිරි ගොවියෙකු තනන්නට
පිටරටියනට ගැති නොවී සිය රට දේ නැගුමට
අපේ බිමට අපේ බීජ නිපදවා අප වෙනුවෙන්
දුන්නා සහන මිලකට පොහොරත් රජයෙන්
පුරන් කුඹුරු අස්වද්දා නිලට නිලේ
සහලින් පිරෙව්වා කුසගිනි නොඑන ලෙසින්....

පෙර රජ දවස පෙරදිග ධාන්‍යාගාරය විලසට
වැජඹුණු අපේ රට නැවතත් අස්වද්දන්නට සහලින්
කැපවුණු නිසා ඔබමය අප ගොවි රජිඳුන්....

නොරටින් ගෙනෙන දේ හට පනවා සීමා
සිය රට දේ රැක ගැනුමට දිවි දුන්නා
ගොවියා රජෙකු ලෙස අභිසෙස් දරනට
මග හෙළි කලේ ඔබය නායකයෙකු ලෙස
ගොවිකම හඳුනන නායකයෙකු වූ ඔබට
තුති පුද කරමු ගොවිදන ලෙස අපි සැවොම...."

මෙහෙම පළ කර තිබුණේ "ලංකාදීප" පත්තරේයි. ලංකාවේ හැම පත්තරයකම කෘෂිකර්ම ඇමතිතුමාගේ සහ ගෝලයන්ගේ පදවි ප්‍රාප්තියේ පණිවුඩය තිබුණා. මේවා දමන්නේ කවුද? මේවා දමන්න මුදල් ලැබෙන්නේ කොහෙන්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මහ අපරාධයක්. වැඩ කරන්නේ නැතුව තමන්ගේ ලකුණු දමා ගන්න, තමන්ගේ තනතුර බේරා ගන්න මෙවැනි දේවල් කිරීම ගැන අපි ඉතාමත්ම කනගාටු වෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රධාන තේමාව වුණේ, "අපි පෙරට රට එකට" කියන එකයි. ගමේ මිනිස්සු නම් ඒකට හොඳ කථාවක් කියනවා. "තොපි පෙරට අපි වළට" කියා තමයි අපේ ගමේ මිනිස්සු නම් ඒකට කියන්නේ. ඒ මොකද? මෙතුමන්ලා පෙරට. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එක්සත් ජාතික පාක්ෂිකයෝයි එහෙම කියන්නේ කුළල් කා ගැනීමට.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ශබ්දය වැඩියි. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව අද - [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔයගොල්ලන්ගේ ඒවාට අපිව ආදේශ කරන්න එපා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
පිටුපස ඉඳගෙන නියෝජ්‍ය ඇමතිකමක් ගන්න දඟලන මන්ත්‍රීවරු මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අපි වවමු රට නගමු" කියන එක බෝඩ් ලෑල්ලට පමණක් සීමා වුණා. කෘෂිකර්ම ඇමතිතුමාම කිව්වා, මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ගෙනාපු "අපි වවමු රට නගමු" වැඩසටහන සම්පූර්ණයෙන්ම අසාර්ථකයි කියා. අපිද එහෙම කිව්වේ? ආපු අලුත් ඇමතිවරයා කිව්වේ. "අපි වවමු රට නගමු" වැඩසටහන -මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාගේ වැඩසටහන- අසාර්ථකයි කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද කිව්වේ?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
කෘෂිකර්ම ඇමතිතුමා භාර ගත් වෙලාවේ කිව්වා. [බාධා කිරීමක්] ඔබතුමාලා පත්තර කියවන්නේ නැහැ නේ. ඔබතුමාලා දෙන දේ කාලා වෙන දෙයක් බලා ගෙන ඉන්න මිනිස්සු. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ කථාවේදී වීවලට සහතික මිලක් දෙනවා කියා ප්‍රකාශයක් කළා. බොහොම හොඳ දෙයක්. අපි හොඳ දේට හොඳයි කියනවා. අපි නරක දේට නරකයි කියනවා වාගේ හොඳ දේට බොහොම හොඳයි කියනවා. ඒක හොඳයි. හැබැයි, මේ වාගේ කථා හැම දාම අහනවා නේ. හැම දාම අය වැය කථාවක් ආවාම අරක දෙනවා මේක දෙනවා මේ මිලට දෙනවා කියනවා. හැබැයි, බඩු ගන්න ගියාම එහෙම ගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා, ගොවීන්ගේ වගාවන්ට වූ දේ. අපි දැක්කා, මහ පාරේ කිරි හලන හැටි. අපි දැක්කා වීවලට ගිනි තියන හැටි; අපි දැක්කා එළවලු ආර්ථික මධ්‍යස්ථානවලට ගෙනැල්ලා කුණු කූඩයට විසි කරන හැටි. ලංකාවේ අතිවිශාල ප්‍රමාණයක් යැපෙන්නේ කෘෂි ආර්ථිකයකින්. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ කෘෂිකාර්මික අමාත්‍යාංශයයි, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයයි බද්ධ වෙන්න ඕනෑ. මේ අමාත්‍යාංශ දෙක අතර ඒකාබද්ධ වැඩ පිළිවෙළක් තිබුණොත් තමයි හොඳ මිලක්, හොඳ වෙළෙඳ පොළක් මේ ගොවීන්ට ලැබේවි කියලා අපට හිතන්න පුළුවන් වන්නේ. දැන් වෙලා තියෙන්නේ, ගොවියාගේ බෙල්ලට ලණු දෙකක් දමලා මී හරකායි එළ හරකායි ලණු දෙක දෙපැත්තට අදිනවා වාගේ දෙයක්. සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය එක පැත්තකට අදිනවා; කෘෂිකර්ම අමාත්‍යාංශය තවත් පැත්තකට අදිනවා. ඒකෙන් ගොවියා සම්පූර්ණ වශයෙන් අසරණ තත්ත්වයට පත් වෙලා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඈත අතීතයේ අපේ අත්තලා මුත්තලා, කිරිකිත්තලා ඒ අයට අවශ්‍ය බීජ ටික - වට්ටක්කා ඇට, වැටකොළු ඇට, මෑ ඇට- හදා ගත්තේ ලිප් බොක්කේ හංගලා. කුඹුරට අවශ්‍ය බීජ වී ටික නිපදවා ගත්තේ වී බිස්සේ හංගලා. අද බීජ පිළිබඳව අතිවිශාල ප්‍රශ්නයක් තිබෙනවා. බීජවල අයිතිය සම්පූර්ණයෙන් නැති වෙලා තිබෙනවා. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගොවියෙකුට ගොවිතැන සඳහා අත්‍යවශ්‍ය වූ සාධක හතරක් තිබෙනවා. පළමුවැනි එක ඉඩම්; ඊළඟට බීජ, ඊළඟට ජලය, හතරවනුව වෙළෙඳ පොළ. අද බලන්න, තක්කාලි බීජවල මිල කොපමණ ඉහළ ගිහින් තිබෙනවාද කියලා. මා අහගෙන හිටියා, ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, තක්කාලි ඇටවල මිල මොන තරම් අධිකද කියලා.

දැන් අපි සියලු දේවල්වල මිල අධිකයි, අධිකයි කියනවා. ඒකට හේතුව තමයි නිෂ්පාදන පිරිවැය වැඩි වීම. නිෂ්පාදනයට යන වියදම වැඩි නිසා තමයි අද සියලු දේවල්වල මිල වැඩි වෙලා තිබෙන්නේ. මේකෙදී දැවැන්තම ප්‍රශ්නය තමයි ජලය පිළිබඳ ප්‍රශ්නය. මා හිතනවා, ජල ප්‍රශ්නයත් මේ ආණ්ඩුව ගොවීන් වෙනුවෙන් කළමනාකරණය කළේ නැහැ කියා. ඔබතුමන්ලා දන්නවා, 2001 වර්ෂයේදී රටේ ජලය විකුණන්න අණ පනතක් ගෙනාපු බව. ඒකට ගොවීන් විරුද්ධ වුණු නිසායි ඒ අණ පනත එළියට විසි වුණේ. ලෝකයේ වතුර විකුණපු එකම රට බොලිවියාව. නමුත් බොලිවියාවේ ගොවීනුත්, ශිෂ්‍යයෝත් පාරට බැහැලා ඒක වෙනස් කර ගත්තා. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද "ඉන්" කියලා වතුර විකුණන ජාත්‍යන්තර ආයතනයක් තිබෙනවා. ලෝකයේ හැම තැනම කැරකිලා, කැරකිලා අන්තිමට මේ "ඉන්" කියන ජාත්‍යන්තර ආයතනයේ ප්‍රධාන කාර්යාලයත් අද තිබෙන්නේ ශ්‍රී ලංකාවේ. දැන් අපට ලොකු සැකයක් තිබෙනවා. මේ පිඹුරු පත් හදන්නේ, ලංකාවේ තිබෙන වතුර ටිකත් පිට රටකට විකුණන්නද කියන භයානකත්වය තිබෙනවා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද ඉඩම් අයිතීන් ගැන කථා කළා. ඒ වාගේම ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මා නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රදේශයේ රත්කිඳ ජලාශය තිබෙන ප්‍රදේශයේ, හොබරියාව හන්දියෙන් එහාට අක්කර දහස් ගණනක් බුක්රේඩ් සමාගමට, ඩීඑස්අයි සමාගමට ගෝල්ඩන් ලයිට් සමාගමට දීලා තිබෙනවා. ඔහිය රක්ෂිතයේ විශාල කොටසක් දීලා තිබෙනවා. හල්දුම්මුල්ල සොරගුණේ දේවාලයට අයිති අක්කර 675ක් වාසු රාසයියා කියන මනුෂ්‍යයාට හෝටලයක් සහ ගොල්ෆ් පිට්ටනියක් හදන්න දීලා තිබෙනවා. මේවායේ හිටපු ගොවීන්ට අද මොකද වෙන්නේ? ඒ ගොවීන්ට යන එන තැන් නැති වෙලා තිබෙනවා. ඒ ගොවීන් ආරක්ෂා කරන්න කිසිම වැඩසටහනක් මේ වන කොටත් දියත් කර නැහැ. නිෂ්පාදන සඳහා හොඳ බීජ අවශ්‍යයි කියලා අපි සියලු දෙනා කිව්වා. රටවල බීජ නිෂ්පාදනය කරන පර්යේෂණ ආයතන අතිවිශාල ප්‍රමාණයක් මේ රටේ සකස් විය යුතුයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ ශිෂ්‍යයන්ට කෘෂි පාඨමාලා දැනුම ලබා ගන්න තිබුණේ පල්ලෙකැලේ කෘෂිකර්ම ඒකකය විතරයි. මේ අපේ ගරු දිළුම් අමුණුගම මැතිතුමා එහෙම දන්නවා ඇති, දැන් ඒ භූමියේත් ගුවන් තොටුපොළක් හදන්න නම් කරලා තිබෙන බව. ඒක වෙනස් කරනවාද? [බාධා කිරීමක්] ඒක වෙනස් කරනවාලු. බොහොම හොඳයි. ඒකයි මා ඒක ඒ දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරයාගෙන්ම ඇහුවේ. එකවරම උත්තරය හම්බ වුණා. ඒක අයින් කළාලු. බොහොම හොඳයි.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, "කථාව දෝලාවෙන්, ගමන පයින්" කියලා කියමනක් තිබෙනවා. "නිල්ල පිරුණු රටක්", "කෙතට අරුණැල්ල", "අපි වවමු - රට නගමු" මේවා ඔක්කෝම වේදිකාවට පමණක් සීමා වෙලා තිබෙනවා. ජල ගැටලුවෙන්, නියඟයෙන්, වගා පාළුවෙන්, අස්වනු විකුණා ගන්න බැරිව ගොවීන් අති විශාල වශයෙන් දුක් විඳිනවා. රටට ණයවෙලා කරපු වගා බිම් විනාශ වීම නිසා ගොවීන්ට සහනයක් වශයෙන් වගා ණය අත්හිටුවන බව ජනාධිපතිතුමා කිව්වා. නමුත් ඒක කරන කාලයක්, දින වකවානුවක් ගැන ප්‍රකාශ කළේ නැහැ. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒ සම්බන්ධයෙන් වන සියලු ලිපි අද ඉදිරිපත් කළා අපි දැක්කා.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, බිත්තර වී බෙදුව හැටිත් කථා කරන්න ඕනෑ. ගිරිතලේ ගොවීන්ට බෙදුවා ඒටී 307 කියන බිත්තර වී වර්ගය. ඒ වී වර්ගය තෙත් කලාපයට අයිති වන වී වර්ගයක්, වියළි කලාපයේ -උෂ්ණ කලාපයේ- ප්‍රදේශවලට බෙදුවාට. උෂ්ණ කලාපයට බෙදන්න ඕනෑ ඒවා තෙත් කලාපයට දීලා තිබෙනවා. එම නිසා විශාල ප්‍රශ්නයක් ඇති වුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
**(மாண்புமிகு ஹரின் பர்னாந்து )**
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. සිංහලයාගේ සංස්කෘතිය තිබුණේ ගමයි - පන්සලයි, වැවයි - දාගැබයි කියලා යි. නමුත් වර්තමානයේ තිබෙන්නේ; රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ වැවයි - හෝටලයයි, ගමයි-බාර් එකයි කියන එක බව හොඳින් මතක තියා ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ මට නියමිත කාලය අවසාන වී තිබෙන බැවින් සුභාෂිතයේ තිබෙන පුංචි කවියක් පිළිබඳව මතක් කරමින් මගේ කථාව අවසාන කරන්නට සූදානම් වෙනවා.

"උදක් සමින් පිඹලු පමණින් බැරම
පසක් ලොහොම දා අලු වෙයි වෙන වෙනම
දූකක් පැමිණ ගුණවත් දන ලූ සුසුම
වගක් නසනු විසිතුරු කොට කියනු කිම"

මතක තියාගන්න ඕනෑ, ජනතාව බොරුවෙන් හැම දාම ගොනාට අන්දන්නට බැහැ කියන එක. ''ගොවීන්'' කියන්නේ, මේ රටේ ආණ්ඩු බිහි කළ උදාරතර කණ්ඩායමක්. එමනිසා මේ මයින හමින් පිඹලා ඉතාමත් බර ඇති ලෝහ වර්ග පහක් වෙන වෙනම පුළුස්සා අළු කර ගන්නවා වාගේ තමයි, දුකට පත් ගුණවත් ජනයා හෙළන සුසුමෙන් එක රැයකින්ම විනාශ කරන්නට පුළුවන් බව අප දැන ගන්නට ඕනෑ. ආණ්ඩුව හිතනවා, ඒ අය අති බලවත්ය කියා. ආණ්ඩුවක් පෙරළා දැමීමට මේ සියලු දෙනාට එක රැයකින් හැකි වන බව මතක තියා ගන්නට ඕනෑ. මේ රැවටීම හැම දාම කරන්නට බැරි බවත් මතක් කරමින් මම නිහඬ වෙනවා. මේ පිටිපස්සේ සිට කෑ ගැසූ මන්ත්‍රීතුමන්ලාට මම සමාව දෙන බවත් කියනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
මීළඟට ගරු එච්.ආර්. මිත්‍රපාල නියෝජ්‍ය අමාත්‍යතුමා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන් නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

[අ. භා. 4.16]

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින අය වැය කාරක සභා අවස්ථාවේදී වැය ශීර්ෂ කිහිපයක් සාකච්ඡා කරන මේ අවස්ථාවේදී, පශු සම්පත් අමාත්‍යාංශය හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳවයි මගේ අදහස් දැක්වීම සීමා කර තිබෙන්නේ. එමනිසා අපේ රටේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ වැදගත් වූ අමාත්‍යාංශය පිළිබඳව මා මුලින්ම මතක් කරන්නට කැමතියි.

විශේෂයෙන් අපේ රටේ ආහාර පිළිබඳව කථා කරනකොට අපේ කිරි සම්පත ගැනත්, ඒ වාගේම බිත්තර සහ මස් වර්ග ගැනත් මේ අමාත්‍යාංශයේ අවධානය යොමු කර තිබෙනවා. මේ රටේ ආහාර අවශ්‍යතාවෙන් විශාල නිෂ්පාදන කර්තව්‍යයකට සහභාගි වන අමාත්‍යාංශයක් හැටියට මේ අමාත්‍යාංශය ගැන අප සතුටු වෙනවා. මේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කරන්නට පුළුවන් වුණු වර්ෂයක් හැටියට 2012 වර්ෂය ඉතිහාසයට එකතු වෙනවා.

අප ආරම්භ කළ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නට ලැබුණේ විශේෂයෙන් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගිය වර්ෂයට පෙර වර්ෂයේ එතුමාගේ අය වැය කථාවේදී මේ රටේ කිරි ගොවියා ශක්තිමත් කරන්න යෝජනා ගෙන එමින් කටයුතු කිරීම නිසායි. ඒ අවස්ථාවේ රුපියල් 30ට තිබුණු කිරි ලීටරය රුපියල් 50ට වැඩි කළා. ඒ අනුව රජයේ කිරි ගැනුම්කරුවා හැටියට මිල්කෝ ආයතනයට හැකි වුණා මේ මිල ගොවියාට ගෙවන්න. එම නිසා අපේ රටේ කිරි කර්මාන්තය සඳහා නිෂ්පාදකයන් විශාල ලෙස ඇතුළු වන්නට පටන් ගත්තා. මේ වර්ෂය අවසාන වන විට මේ රටේ කිරි නිෂ්පාදනය ජාතික අවශ්‍යතාවෙන් සියයට 50කට ළං වෙය කියා අප බලාපොරොත්තු වෙනවා. ජාතික අවශ්‍යතාවෙන් සියයට 40ක කිරි නිෂ්පාදනයක් මේ රටේ දැනටත් සිද්ධ වෙනවා. ඒ අනුව අප විශාල පිම්මක් ඉදිරියට ගිහින් තිබෙනවා. සියයට විසි ගණනකට තිබුණු ජාතික කිරි නිෂ්පාදිතය සියයට 40 දක්වා සියයට සියයකින් පමණ වැඩි කරන්නට මේ කාලය තුළ හැකි වී තිබෙනවා. මේ ආකාරයට මේ වර්ධනය තවත් ඉදිරියට ගෙන ගිහින් මේ රටේ ජාතික කිරි අවශ්‍යතාව සම්පූර්ණ කරන්න අපට පුළුවන්කම ලැබේවි.

විශේෂයෙන් අප පුරුදු වෙලා තිබෙන විධියට විදේශ රටවලින් ආනයනය කරන ලද කිරිපිටිවලින් දීර්ඝ කාලයක් ජීවත් වෙච්ච මේ රටේ ජනතාවට අලුතෙන් මේ රටේ කිරි භාවිතය පුරුදු කිරීම ටිකක් අමාරු වැඩක් වන්නට පුළුවන්. විශේෂයෙන් බාලපරම්පරාව පුරුදු වෙලා ඉන්නේ පිටරටින් ආනයනය කරන කිරිපිටි භාවිතයටයි. නමුත් ඒවායින් අපේ ශරීර සෞඛ්‍යයට, පෝෂණයට ලැබෙන ගුණාත්මකභාවය පිළිබඳව ප්‍රශ්න තිබෙනවා.

කුරුලු උණ රෝගය නිසා අපට ගිය අවුරුද්දේ බිත්තර පිළිබඳ ප්‍රශ්නයක් ඇති වුණා. ඒ නිසා බිත්තරවල මිල මට්ටම ඉහළ යන්න පටන් ගත්තා. මේකට හොඳ පිළිතුරක් හැටියට අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දිවි නැගුම වැඩසටහන යටතේ ගෘහස්ථ ඒකකවලට කිකිළි පැටවුන් බෙදා දීමේ ව්‍යාපාරය ආරම්භ කළා. ඒ නිසා පසු කාලීනව පාරිභෝගිකයාට වාසිදායක විධියට බිත්තරවල මිල මට්ටමේ අඩු වීමක් සිදු වුණා. ඒ වාගේම ගෘහස්ථවල මේ කිකිළි පැටවුන් ඇති කරපු පවුල්වල අයගේත් ආර්ථිකයට විශාල

ශක්තියක් ලැබෙන්න පටන් ගත්තා. විශේෂයෙන්ම ලංකාව වැනි රටක ගෘහස්ථ පරිභෝජනය සඳහා ආහාර නිෂ්පාදනය කිරීමේ වැදගත්කමක් තිබෙනවා. විශාල පරිමාණයේ වතු නැති, විශාල පරිමාණයේ නිෂ්පාදන රටාවක් නැති රටක් හැටියට අපට අපේ ගෙදර ගැන, අපේ කුඩා ඉඩම ගැන හිතලා ආර්ථිකය වර්ධනය කර ගැනීමේ වැඩ පිළිවෙළක් ගැන කල්පනා කරන්න වෙනවා. විශේෂයෙන්ම මේ ප්‍රශ්න ඇති වන වෙලාවේ අපේ වෙළෙඳ අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා ලක් සතොස හරහා බිත්තර සහ කුකුළු මස් බෙදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නත් අපට පුළුවන්කම ලැබුණා. ඒ අනුව රට පුරාම පාරිභෝගික ජනතාවට එතැනිනුත් යම් කිසි සහනයක් ලැබෙන්න පටන් ගත්තා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2012 වර්ෂයේ තවත් වැදගත් සිද්ධියක් තමයි අප ඕස්ට්‍රේලියාවෙන් කිරි දෙනුන් ආනයනය කිරීම. දැනට තිබෙන තොරතුරු අනුව මා හිතන්නේ අවුරුදු 40කට විතර පස්සේ තමයි අප ඒ කාර්යය කළේ. කලින් ඒ සතුන් මෙරටට ආනයනය කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. විශේෂයෙන්ම අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේත්, මුදල් අමාත්‍යාංශයේත් මැදිහත් වීම මත ඒ අවස්ථාවත් උදා කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ ආනයනය කරන ලද කිරි දෙනුන් උසස් ගණයේ, උසස් ආරක් ඇති සතුන්. එය අද අපේ රටේ කිරි කර්මාන්තය දියුණු කරන්න ගත්ත තවත් වැදගත් පියවරක්. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මූලික වෙලා අද බෝපත්තලාවේ අපේ ගොවිපළවල ඒ සතුන් ඇති කරනවා. අද ඒ එක සතෙකුගෙන් කිරි ලීටර් 20ක් විතර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ අන්දමට කිරි දෙනකගෙන් ගන්න පුළුවන් කිරි ප්‍රමාණය වැඩි කර ගැනීමත් වැදගත් වෙනවා.

මේ රටේ සාම්ප්‍රදායික කිරි දෙනුන්ගේ කිරි නිෂ්පාදනය කිරි ලීටර් 3යි, නැත්නම් 4යි. සමහර වෙලාවට ඊටත් අඩුයි. ඒ අනුව අපට කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමේ අපහසුකම් තිබුණා. හොඳ වර්ගයේ, හොඳ ආරක් ඇති සතුන් මේ රටේ බෝ කර ගැනීමේ අඩු පාඩුවක් අපට තිබුණා. නමුත් ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වන ලද මේ සතුන් නිසා අපට හොඳ ආරම්භයක් හදන්න පුළුවන් වුණා. අප ගැබ්බර සතුන් තමයි ලංකාවට ගෙනාවේ. අද උදේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කිව්වා මේ සතුන් කිහිප දෙනෙක් Salmonella dublin කියන විෂබීජය ආසාදනය වීම නිසා මිය ගියාය කියලා. ඒක සත්‍ය කථාවක් නොවෙයි. මොකද ඒ සතුන් ඕස්ට්‍රේලියාවේ ඉඳලා දුර ගමනක් ආවා. ඒ සතුන් නැවේ තමයි අරගෙන ආවේ. ලංකාවට ගොඩ බාන්න ඉස්සර වෙලා ඩුබායිවලට ගිහින් එතැනින් පාකිස්තානයටත් ගිහිල්ලා ආපහු එන ගමන් තමයි අපට ඒ සතුන් ලැබුණේ. සතුන්ට ඇති වුණු ඒ තත්ත්වය තුළ - ඒ ගෙනාපු සතුන් නොවෙයි- ඔවුන් බිහි කරපු කුඩා පැටවුන් කීප දෙනෙක් තමයි මිය ගියේ. ඉතින් ඒක සාමාන්‍ය සිදු වීමක් හැටියට තමයි අප දකින්නේ. එය බරපතළ ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි-

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒ සතුන් flight එකේ ගෙනාවා නම් ඉවරයි නේ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඔබතුමා ළඟදීම flight එකේ යවයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා. බය වෙන්න එපා. [බාධා කිරීමක්] ඒක තමයි. බලා ගෙන ඉන්න. ළඟදීම ලෑස්ති කරයි වැඩේ. දැන් ෆොන්සේකාට යන එන මං නැහැ. ඔබතුමා ගියත් හරි විනාශයි. ඒ මනුෂ්‍යයාත් ඉවරයි. නැති කරලා ආවා. අහිංසකයා අපරාදේ, අද වෙල මැද්දේ තනියම සින්දු කියනවා. හැබැයි මේක එක්සත් ජාතික පක්ෂයේ කුමන්ත්‍රණයක්ද දන්නේ නැහැ. ෆොන්සේකා මැතිතුමා නැති කරලා දමන්න කරපු වැඩ පිළිවෙළක් විධියට තමයි අපට මේක පේන්නේ. කොහොම වුණත් ඔබතුමා කරපු වැඩේ හොඳයි. එළියට ආවාට පස්සේ කිසිම වටිනාකමක් නැති පුද්ගලයකු බවට පත් වුණා. ඔබතුමා මොන හිතකින් ගියාද මම දන්නේ නැහැ. මොනවා හිතිලා ගියාද දන්නේ නැහැ. ඔබතුමාට මම උත්තර දෙන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමාට මම කියන්න ඕනෑ, මේ සත්තු -[බාධා කිරීමක්] ඒක හරි. මොකක් හරි දමා ගන්න. කැමැති එකක් දමා ගන්න.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට මම පිළිතුරක් දෙන්න ඕනෑ. මොකද එතුමා කිව්වා Salmonella කියන රෝගය නිසා මේ සත්තු මිය ගියාය කියලා. ඉතින් අපි නැවත සැරයක් කියනවා, එහෙම රෝගයකින් ඒ සත්තු මිය ගියේ නැහැයි කියලා. මොකද, දැන් ජනතා විමුක්ති පෙරමුණට නම් salmonella රෝගය වැළඳිලා තමයි තිබෙන්නේ. ඒ නිසා ඒ අයගේ කාල සීමාව ක්‍රමයෙන් අඩු වෙලා ගිහිල්ලා, වඳ වීගෙන ගිහිල්ලා එතැනින් පස්සේ සදහටම ඉවර වෙලා යන තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ ගැන මම ඊට වඩා යමක් කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා -මේ මහජන ආයතනයට ඇවිල්ලා- මහජනයා නොමඟ යවන්න මේ රටට ඒ වැරැදි ප්‍රකාශ කරන එක වැරැදියි. අපි මේ රටේ කිරි කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය කටයුතු විශාල වශයෙන් කර ගෙන යනවා.

පශු වෛද්‍ය කාර්යාල ලංකාව පුරාම 302ක් තිබෙනවා. ඒ සෑම කාර්යාලයකම අපේ පශු වෛද්‍යවරයෙක් ඉන්නවා. ඊට අමතරව පශු සම්පත් සංවර්ධන නිලධාරින් දෙන්නෙක්, නැත්නම් තුන්දෙනෙක් ඉන්නවා. නමුත්, ඒ කාර්ය මණ්ඩලය කිසිසේත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා අපේ ගරු අමාත්‍යතුමා -පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා- මේ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, පශු වෛද්‍ය කාර්යාලවලට පශු වෛද්‍යවරු දෙදෙනෙක් පත් කරන්න. ඒක හොඳයි. මොකද, රජයේ රෝහල්වල ඉන්න වෛද්‍යවරුන්ගේ ළඟට ලෙඩ්ඩු එනවා වගේ පශු වෛද්‍යවරු ළඟට ලෙඩ වුණු සත්තු එන්නේ නැහැ. පශු වෛද්‍යවරයා සතුන් ළඟට යන්න ඕනෑ. ගමනාගමනය සඳහා ඒ වෛද්‍යවරුන්ට පහසුකම් නැහැ. අනිත් එක සතුන්ගේ රෝගී තත්ත්වයන්ට ප්‍රතිකාර කිරීමට වෛද්‍යවරුන්ට දුර ගමන් යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා එක කාර්යාලයකට වෛද්‍යවරු දෙදෙනෙකු පත් කිරීමේ කිසිම වරදක් නැහැ. ඒක අපේ සත්ත්ව ගහනයට කරන සේවයක්, සත්ත්ව ගහනය වැඩි කර ගන්න උදව්වක් හැටියට තමයි අපි දකින්නේ.

ඒ විතරක් නොවෙයි, එම වෛද්‍යවරුන්ට ගමනාගමනය පිළිබඳ ප්‍රශ්න තිබුණා. පශු වෛද්‍ය කාර්යාලවලට අපි මේ වර්ෂයේ අලුතින් double cab වර්ගයේ රථ 45ක් ගෙනැල්ලා දීලා තිබෙනවා. ලබන වර්ෂයේදීත් ඉතිරි අයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපයා දෙන්න ගරු ආරුමුගන් තොණ්ඩමන් අමාත්‍යතුමා මේ වන විට වැඩ කටයුතු කරලා තිබෙනවා. ඒ ගැන අපි මුදල් අමාත්‍යාංශයට ස්තුතිවන්ත වෙනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පශු වෛද්‍යවරුන්ගේ ප්‍රමාණය වැඩි කළාට කමක් නැහැ. ඔය පැත්තේ 171 දෙනෙක්ම ඉන්නවානේ ප්‍රතිකාර ගන්න.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ඇයි, ඔය පැත්තේ කට්ටිය. ඒ නිසා 225ක්ම ඉන්නවා කියලා කියන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

මේ පැත්තේ නම් නැහැ. ඔය පැත්තේ ඉන්නවාද කියලා බලන්න ඕනෑ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ඔය පැත්තේ කට්ටිය ගැන සමහර අය කියනවා. මොකද, අවුරුදු කීයක් පැරදී පැරදී ඉන්නවාද? මොළේ තිබුණා නම් ඔහොම වෙන්නේ නැහැනේ. මොළේ තිබෙන්නේ තිබෙන්නට ඕනෑ තැන නොවෙයි. ඒකයි ප්‍රශ්නය. [බාධා කිරීමක්] ඔව්, තමුන්නාන්සේලාගේ නායකතුමා ළඟදීම තමුන්නාන්සේ ගැන වග බලා ගනී. ෆොන්සේකාට කළ අපරාධය බලන්න.

අද අපේ කිරි නිෂ්පාදනය පිළිබඳ වැදගත්ම ආයතනය හැටියට මිල්කෝ ආයතනය තිබෙනවා. මිල්කෝ ආයතනයේ නිෂ්පාදන කර්මාන්තශාලාවක් නාරාහේන්පිට තිබෙනවා. දිගන, පොළොන්නරුව හා අඹේවෙල කර්මාන්තශාලා තිබෙනවා. මම මතක් කරන්න අවශ්‍යයි, එම කර්මාන්තශාලා ඉතා පැරණි කර්මාන්තශාලා බව. ඒ නිසා අපේ නිෂ්පාදන ධාරිතාවට එම කර්මාන්තශාලාවලින් ලබා ගන්න පුළුවන් සේවය ක්‍රමයෙන් හීන වීගෙන යනවා. ඒ නිසා මේවා නවීකරණය කරන්න විශේෂයෙන්ම ගරු ආරුමුගන් තොණ්ඩමන් අමාත්‍යතුමා ඩෙන්මාර්ක් රජයත් සමඟ කථා කරලා තිබෙනවා. එම නවීකරණය කිරීමේ කටයුතු ඉතා ඉක්මනින් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. වැඩි වන කිරි නිෂ්පාදනයෙන් වටිනාකම් එකතු කළ නිෂ්පාදන මේ රටේ ප්‍රචලිත කරන්න අපට ඒ තුළින් වඩාත් හොඳ අවස්ථාවක් ලැබෙයි.

නාරාහේන්පිට තිබෙන කර්මාන්තශාලාව එතැනින් පිටස්තර පළාතකට ගෙන යන්නත් කටයුතු කර ගෙන යනවා. පරිසරයට ගැළපෙන විධියට, වාණිජ වශයෙන් වඩා වාසිදායක විධියට මෙම කර්මාන්තය හැඩ ගස්වන්න තමයි එතැනදීත් අපි බලාපොරොත්තු වන්නේ. ඒ නිසා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගැනත් අපි මතක් කරන්න අවශ්‍යයි. අපි විදේශ රටවලින් ගෙනාපු කිරි එළදෙනුන් සියලු දෙනාම බෝපත්තලාවේ ජාතික පශු සම්පත් මණ්ඩලය භාරයේ තමයි ඉන්නේ. ඊට අමතරව තවත් කිරි එළදෙනුන් 1,500ක් අපි මේ මාසයේ අන්තිමට, නැත්නම් ලබන අවුරුද්ද මුල වෙන කොට මේ රටට ගේනවා. අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව 2016 වන විට මේ රට කිරිවලින් ස්වංපෝෂිත කරන්නයි. ඒ අරමුණ කරා ළඟා වෙන්න කරන්න තිබෙන සෑම දෙයක්ම මේ අමාත්‍යාංශය විසින් කරන බව මම මේ වෙලාවේ වග කීමක් ඇතුව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ සඳහා අපේ අමාත්‍යාංශයේ සියලු දෙනාම කැප වෙලා වැඩ කරනවා. අපි ඇවිත් තිබෙන දුර බැලුවාම ඒ අයගේ කැප වීම අපට විශාල ශක්තියක් වී තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශයේ නිලධාරින් සියලු දෙනා, මිල්කෝ ආයතනයේ සභාපති වික්‍රමසිංහ මැතිතුමා, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපති ඇල්ලේගල මැතිතුමා, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය කුමාර ද සිල්වා මැතිතුමා ඇතුළු අපේ සියලු නිලධාරින්ට, ඒ වාගේම අනෙක් අවශේෂ සියලු දෙනාට අපේ ස්තුතිය පුද කරනවා. අපේ අමාත්‍යාංශය හා සම්බන්ධ තවත් ආයතන රාශියක් තිබෙනවා. ඒ සියලු ආයතනවල ප්‍රධානින් මේ කර්තව්‍යය සාර්ථක කර ගන්න විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. මේ අය වැය සම්පාදනයේදීත්, මේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යෑමේදීත් ඔවුන් දුන් සහයෝගයට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ ස්තුතියත් පුද කරමින්, මේ රටේ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් ඉදිරි වර්ෂය තුළ -2013 වර්ෂය තුළ- අපි තවත් පියවරක් ඉදිරියට තබන බව මතක් කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The next speaker is the Hon. V.S. Radhakrishnan. You have nine minutes.

[பி.ப. 4.30]

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டின் பொருளாதாரத்தில் விவசாயத்துறையே மிக முக்கிய பங்கை வகிக்கின்றது. மேதகு ஜனாதிபதி அவர்களுடைய தலைமையிலான ஆட்சியில் இன்று இந்த நாட்டின் விவசாயிகள் மிகவும் முன்னேற்றகரமான சூழ்நிலையிலே இருக்கின்றார்கள். அதற்குக் காரணமாக அமைந்த மானிய முறையில் உரம் வழங்கலானது மிகவும் வரவேற்கத்தக்க விடயம். இருப்பினும், விவசாயத்துறை மேலும் முன்னேற்றமடைய வேண்டியுள்ளதென்பதை நாம் புரிந்துகொள்ள வேண்டும். இன்று உலகின் பல்வேறு நாடுகளிலே நவீன தொழில்நுட்ப முறைகளைப் பயன்படுத்து வதன் காரணமாக விவசாயம் முன்னேற்றடைந்து வருகின்றது. எமது நாட்டிலும் இவ்வாறாக நவீன தொழில்நுட்ப முறைகளைப் பயன்படுத்துவதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அதாவது எமது நாட்டிலே நவீன தொழில்நுட்ப முறைகள் பரீட்சார்த்தமாக மேற்கொள்ளப் படுகிறதே தவிர, அந்நடைமுறைகள் நேரடியாக விவசாயிகளைச் சென்றடைவது மிகவும் அரிதாகவே இருக்கின்றது. ஆகவே, இத்தகைய நவீன தொழில் நுட்பமுறைகள் நேரடியாக விவசாயிகளைச் சென்றடைய வேண்டும் என்பதே எனது ஆதங்கமாகும். அப்பொழுதுதான் விவசாயத்துறை மேலும் முன்னேற்றமடைவதற்கான வழிவகைகள் உருவாகும். மாண்புமிகு அமைச்சர் அவர்கள் இதனைக் கருத்திற்கொள்ள வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

அதேநேரத்தில் இன்று இலங்கையிலுள்ள இளைஞர்களைப் பொறுத்தவரை அவர்கள் விவசாயம் செய்வதை விடுத்து வேலைவாய்ப்புத் தேடி வெளி நாடுகளுக்குச் செல்கின்றார்கள். இதன்காரணமாக

எதிர்காலத்தில் இலங்கையிலே விவசாயம் செய்வதற்குத் தொழிலாளர்கள் இல்லாத நிலைமை ஏற்படும். அத்தகைய நிலைமை உருவாவதைத் தடுப்பதற்கான நடவடிக்கைகளை இந்த அமைச்சு மேற்கொள்ள வேண்டும். உதாரணமாக, இன்றைய இளைஞர் சமுதாயத்தினர் நவீன தொழில்நுட்ப முறையில் விவசாயத்துறையை மேம்படுத்துவதனை ஊக்குவிக்குமுகமாக அவர்களுக்கு வங்கிக்கடன் வசதிகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அவ்வாறு செய்வதன்மூலம் எதிர்காலத்தில் இளைஞர்கள் வெளிநாடுகளுக்கு வேலை தேடிச் செல்வதை விடுத்து, உள்நாட்டிலேயே தொழில்வாய்ப்புப் பெற்று வாழக்கூடிய சூழ்நிலையை ஏற்படுத்த முடியும் என்பதை நான் இங்கே தெரியப்படுத்த விரும்புகின்றேன்.

அதுபோல், விவசாயம் என்பது வெறுமனே விவசாயிகளுக்கான தொழிலாக மட்டுமன்றி, அது தொழில்நுட்ப ரீதியிலே உயர்ச்சிபெற்று வர்த்தகரீதியாகச் செயற்படுத்தப்படும் நிலை உருவாக்கப்பட வேண்டும். அதன்மூலம் விவசாயிகள் இலாபமடைந்து தமது விவசாய உற்பத்தியை மென்மேலும் பெருக்கக்கூடிய நிலைமையை உருவாக்கக்கூடியதாக இருக்கவேண்டும். அதற்கேற்றவாறு விவசாயிகளின் உற்பத்திப் பொருட்களைச் சந்தைப்படுத்தும் வசதிகளும் இருக்க வேண்டும். சில இடங்களிலுள்ள விவசாயிகள் தமது விளைபொருட்களை விற்கமுடியாத சூழ்நிலைக்குத் தள்ளப்படுகிறார்கள். விவசாயிகளுக்கு இத்தகைய நிலைமை தொடர்ந்து இரண்டு தடவைகள் ஏற்படுமாயின் அவர்களுக்கு மூன்றாவது தடவை விவசாய நடவடிக்கைகளில் ஈடுபடும் எண்ணமே ஏற்படாது. ஆகவே, விவசாயிகள் தமது விளைபொருட்களை விற்பனை செய்யும்பொழுது அவர்களுக்குப் பொருளாதார ரீதியான பிரச்சினைகள் ஏற்படாதிருப்பதனைத் தடுப்பதற்கு உரிய நடவடிக்கைகளை இந்த அரசாங்கம் எடுக்கவேண்டியது மிக முக்கியமாகும்.

எமது மேதகு ஜனாதிபதி அவர்களும் கௌரவ பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்களும் இந்த நாட்டில் உற்பத்திகளைப் பெருக்க வேண்டுமென்ற நோக்கத்துடன் பல்வேறு முயற்சிகளை மேற்கொண்டுவருவது வரவேற்கத்தக்கது. இருப்பினும், இன்று வெளிநாடுகளிலிருந்து அதிகளவு பொருட்கள் இறக்குமதி செய்யப்படுவதனை நாம் காணக்கூடியதாக இருக்கின்றது. இவ்வாறு இறக்குமதிகளைச் செய்து இந்த நாட்டின் தேவைகளை ஈடுசெய்தால், இந்த நாடு ஒரு விவசாய நாடாக இருக்க முடியாது. ஆகவே, விவசாய உற்பத்திக்கு முதலிடம் அளிக்கக்கூடிய சூழ்நிலையை இந்த நாட்டில் உருவாக்க வேண்டும். அதற்கு வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்வதைத் தடைசெய்து உள்ளூர் உற்பத்தியைப் பெருக்கக்கூடிய நிலைமையை உருவாக்க வேண்டும்.

இந்தியப் பிரதமர் நேரு அவர்களுடைய ஆட்சிக்காலத்தில் இந்தியாவில் பஞ்சம் ஏற்பட்டது; உணவுப் பொருட்களுக்கும் தானியங்களுக்கும் பெருந்தட்டுப்பாடு நிலவியது. அந்தவேளையில்தான் பஞ்சாப் மாநிலத்தில் பசுமைப் புரட்சி உருவாகியது. அந்தப் பசுமைப் புரட்சியின் மூலமாகத்தான் இன்று இந்தியா விவசாய உற்பத்தியில் தன்னிறைவு கண்டுள்ளது. இன்று அங்கு எல்லா வகையான தானியங்களும் உற்பத்தி செய்யப்படுகின்றன; எல்லா வகையான மரக்கறி வகைகளும் உற்பத்தி செய்யப்படுகின்றன. இன்று இந்தியாவில் உற்பத்திசெய்யப்படாத தானியங்களே இல்லை எனலாம். அதுமட்டுமல்ல, இன்று அனைத்து உணவு வகைகளையும் வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யுமளவுக்கு உணவுற்பத்தியில் இந்தியா தன்னிறைவடைந்துள்ளது. அதேபோன்று இலங்கையிலும் விவசாயத்துறையில் பசுமைப் புரட்சியை ஏற்படுத்துவதற்கான நடவடிக்கை எடுக்கப்பட்டால், நிச்சயமாக எமது நாட்டின் விவசாயமும் வளர்ச்சியடையக்கூடிய நிலைமை உருவாகும் என்பதைக் குறிப்பிட விரும்புகின்றேன்.

இந்த நாட்டிலே 25,000 ஹெக்டெயர் பரப்பளவுள்ள காணிகள் விவசாயம் செய்யப்படாத நிலையில் இருப்பதாக மேதகு ஜனாதிபதி அவர்கள் தெரிவித்திருக்கின்றார். இவ்வாறான காணிகள் தோட்டப்புறங்களில் இருந்தாலும் சரி, நாட்டுப் புறங்களில் இருந்தாலும் சரி, அவற்றை விவசாயம் செய்வதற்குப் பயன்படுத்தவேண்டும் என்பதே மேதகு ஜனாதிபதி அவர்களுடைய நோக்கமாகும். இது தொடர்பில் என்னுடைய அபிப்பிராயம் என்னவென்றால், இந்த நாட்டில் பயன்படுத்தப்படாமல் இருக்கின்ற காணிகளை அப்பிரதேசத்தில் இருக்கின்ற இளைஞர்களுக்குப் பிரித்துக்கொடுத்து, அவர்களை விவசாயத்தில் ஊக்குவிப்பதற்கான நடவடிக்கைகளை எடுத்தால், அது மிகவும் நன்மை பயக்கக்கூடியதும் பாராட்டக்கூடியதுமான விடயமாக இருக்கும் என்பதாகும். அதேபோல், கால்நடை உற்பத்தியில் ஈடுபடுகின்றவர்களுக்கு மேய்ச்சல் தரைகளுக்காக இவ்வாறான நிலங்களைப் பகிர்ந்து கொடுக்கலாம். இன்று புல்லுக்கு - புற்றரைகளுக்கு - அதிக தட்டுப்பாடு நிலவுகின்றது. ஆகவே, இவ்விடயத்தில் விவசாயத்துக்கும் கால்நடை வளர்ப்புக்கும் அதிக முக்கியத்துவம் கொடுக்கவேண்டும்.

இன்று எமது நாட்டுக்கு வெளிநாடுகளிலிருந்து பால் மா இறக்குமதி செய்யப்படுகின்றது. ஆனால், இந்த இரு அமைச்சுகளும் கால்நடை அபிவிருத்தியில் அதிக அக்கறை செலுத்துவதன்மூலம் பால் உற்பத்தியில் எமது நாட்டைத் தன்னிறைவடையச் செய்யக்கூடிய சூழலை எங்களால் உருவாக்கமுடியும். பால் உற்பத்தியை மேலும் அதிகரிப்பதனூடாக எமது மக்களுக்கு காலையிலோ அல்லது மாலையிலோ ஒரு கோப்பை பால் வழங்கக்கூடியதாக இருக்கும். எமது நாட்டுக்குப் பால் மா இறக்குமதி செய்யப்படுவதைப் படிப்படியாக நிறுத்துவதற்கு நடவடிக்கை எடுத்தால், இந்த நாட்டின் பால் உற்பத்தியை அதிகரிக்கமுடியும். இவ்வாறான நடவடிக்கைகளின் மூலமாக இந்த நாட்டிலுள்ள விவசாயத்துறையை மிகவும் வளர்ச்சியடைந்த ஒரு துறையாக மாற்ற முடியும். அதற்கான வசதிகளும் இந்த நாட்டிலே இருக்கின்றன.

இன்று 'திவிநெகும' வேலைத் திட்டத்தினூடாகத் தோட்டப் பகுதிகளிலே சிறுசிறு தோட்டங்களில் விவசாயம் செய்யப்பட்டு வருகின்றது. எனினும், இதனை மேலும் அதிகரிப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டும். குறிப்பாக, நுவரெலியா பகுதிகளிலோ அல்லது தோட்டப்பகுதிகளிலோ விவசாயம் செய்கின்றவர்களை ஊக்குவிப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்கவேண்டும். நான் முன்பு சொன்னதுபோல், விற்பனைக் கூடங்கள் அதிகரிக்கப்பட வேண்டும். அதாவது, விவசாயிகள் உற்பத்தி செய்கின்ற பொருட்களை விற்பனை செய்வதற்கு நடவடிக்கை எடுக்கப்படல் வேண்டும். விற்பனை நடவடிக்கைகளை 'திவிநெகும' திட்டத்தில் உள்ளடக்கினால், விவசாயிகளுக்கு நிச்சயமாகப் பலன் கிடைக்கும். ஆகவே, இவ்வாறான நடவடிக்கைகளை மேற்கொண்டு, பால் உற்பத்தி, விவசாய உற்பத்தி - மரக்கறி மற்றும் நெல் - என்பவற்றில் நமது நாட்டைத் தன்னிறைவடையச் செய்வதற்கு அரசாங்கம் முயற்சிக்க வேண்டும். அதற்கான ஒரு நல்ல திட்டத்தை மேதகு ஜனாதிபதி அவர்களும் கௌரவ அமைச்சர்களும் கொண்டு

[ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා]

வருவார்கள் என்ற எதிர்பார்ப்புடன், எனக்குச் சந்தர்ப்பமளித்தமைக்கு நன்றிகூறி, என்னுடைய உரையை நிறைவுசெய்துகொள்கின்றேன். நன்றி.

[අ. භා. 4.38]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය වැය විවාදයට අද දවසේදීවත් සහභාගි වන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මුදල් අමාත්‍යතුමා මේ සභාවට අය වැය කථාව ඉදිරිපත් කරමින් කෘෂිකර්මය පිළිබඳව, පොහොර සහනාධාරය පිළිබඳව ලස්සණ ප්‍රකාශයක් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවර අය වැය කථාවේ 18වැනි පිටුවේ මෙහෙම සඳහන් වෙනවා:

"ගරු කතානායකතුමනි, ඉදිරියේදී නියඟවලින් ඇති වන මෙවැනි හානි වළක්වා ගැනීමට ප්‍රවේශ විය යුතු වෙනවා. එබැවින් 2013 සිට පොහොර සහනාධාරය ලබන සියළුම ගොවීන්ට වගා රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට මා යෝජනා කරනවා. මෙවැනි ආපදාවන් සඳහා බැංකු, මූල්‍ය රක්ෂණ ආයතනවලින් සිය වාර්ෂික ලාභයෙන් සියයට එකක් ජාතික රක්ෂණ භාරකාර අරමුදලට ගෙවීම අනිවාර්ය කිරීමට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරනවා. පොහොර සහනාධාරය ලබන සෑම ගොවියකුම කිලෝ 50 ක රසායනික පොහොර මල්ලකින් රුපියල් 150 ක රක්ෂණ ගාස්තුවක් යටතේ මෙම අනිවාර්ය රක්ෂණ ක්‍රමයේ සාමාජිකයකු කර ගැනීමට කටයුතු කරනවා."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වගා රක්ෂණ ක්‍රමය ආරම්භ වුණේ මහින්ද චින්තනය යටතේ නොවෙයි. මහින්ද චින්තනය එන්න ඉස්සර වෙලා ගොවීන්ගේ වගා ආරක්ෂා කිරීම සඳහා වගා රක්ෂණ ක්‍රමයක් ආරම්භ කරලා තිබුණා. හානියට පත් වුණු වගාවන් සඳහා ගොවීන්ට ඒ අනුව රක්ෂණ වන්දි ලබා දුන් අවස්ථා අනන්තවත් තිබෙනවා. මහින්ද චින්තන යටතේ ගොවියාට රුපියල් 350 ගණනේ දෙනවා කිව්ව පොහොර මිටිය මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් රුපියල් 150කින් වැඩි කරලා ගොවියා ගොනාට අන්දමින් හෙමිහිට කියනවා, අනිවාර්ය රක්ෂණ ක්‍රමයක් සඳහා පොහොර මිටියකින් රුපියල් 150ක් ගන්නවා කියලා. මේවා විහිළු කථා නේ. මේවා ගොවියා ගොනාට අන්දන කථා නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පොහොර මිටිය රුපියල් 150කින් වැඩි කළා කියලා කෙළින්ම කියා ගන්න බැරිව මෙතැනට ඇවිල්ලා මුදල් ඇමතිතුමා කියනවා, රක්ෂණය සඳහා පොහොර මිටියකින් රුපියල් 150ක් අය කරනවා කියලා. රක්ෂණය සඳහාය කියලා රුපියල් 150කින් පොහොර මිටිය වැඩි කරනවා කියමු. මම අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, එක පොහොර මිටියකින් රුපියල් 150 ගණනේ වැඩි කරලා ගොවීන්ගෙන් ගන්නා රුපියල් 150ක මුදල ඔබතුමන්ලා තැන්පත් කරන්නේ කුමන රක්ෂණ සංස්ථාවේද, එහෙම නැත්නම් කුමන රක්ෂණ සමාගමේද, ඒ වගකීම පවරන්නේ කුමන රක්ෂණ සමාගමකටද කියා.

වගාව හානි වුණාම එක අක්කරයකට, එහෙම නැත්නම් එක හෙක්ටෙයාරයකට වී වගාව සඳහා ඔබතුමන්ලා කොපමණ රක්ෂණ වන්දි මුදලක් ගෙවනවාද? වෙනත් ආර්ථික වගාවන් සඳහා කොපමණ මුදලක් ගෙවනවාද? ධාන්‍ය වගාවන් සඳහා කොපමණ මුදලක් ගෙවනවාද? ගොවියා ගැන කැක්කුමක් තිබෙන බව කියන, ගොවියා වෙනුවෙන් හඬා වැළපෙන මහින්ද චින්තන රජයට අය වැය වාර්තාව මහින් බොහොම සෘජුව සඳහන් කරන්න තිබුණා, අපි අසවල් රක්ෂණ සමාගමේ ඒ මුදල් තැන්පත් කරනවා කියලා. අනෙක් කාරණා සම්බන්ධයෙන් මෙහි කියනවා නේ බැංකුවලින් මෙතරම් ප්‍රමාණයක් ගන්නවා, මූල්‍ය ආයතනවලින් මෙතරම් ප්‍රමාණයක් ගන්නවා කියලා. එවැනි කතන්දර කියනවා නේ. එහෙම නම් මේ සම්බන්ධයෙනුත් ඇතුළත් කරන්න තිබුණා, අපි අසවල් රක්ෂණ සමාගමේ මේ මුදල තැන්පත් කරනවා, ගොවීන්ට මෙන්න මේ මේ විධියට විවිධ වූ වගාවන් සඳහා රක්ෂණ මුදලක් ගෙවනවා කියලා. නමුත් එහෙම කතන්දරයක් මෙහි නැහැ. සම්පූර්ණයෙන් කළේ ගොවියාගේ පොහොර මිටිය රුපියල් 150කින් වැඩි කිරීමයි. පොහොර මිටිය රුපියල් 150කින් වැඩි කරලා ගොවියාට නොදැනෙන්න ගොවියාට පොකැට් ගැහුවා. ගොවියා ගොනාට ඇන්දවීමකුයි මෙතැනදී සිදු කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවර අය වැය ලේඛනයේ 19වැනි පිටුවේ 12.2 යටතේ සඳහන් මෙහෙම සඳහන් වෙනවා:

"පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කරමින් කාබනික පොහොර නිෂ්පාදනය කරන කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන් දිරිගැන්වීම සඳහා එම පොහොර කිලෝ 50 ක මිටියක් රුපියල් 400 ක සහතික මිලකට මිලදී ගැනීමේ වැඩපිළිවෙලක් ලංකා පොහොර සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනවා."

පෞද්ගලික අංශයේ ආයෝජන මෙම නිෂ්පාදනවලට දිරිගැන්වීම සඳහා කාබනික පොහොර ව්‍යාපෘතිය ඇති කරනවා කියලා කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාබනික පොහොර මිටියක් නිෂ්පාදකයාගෙන් රුපියල් 400කට මිලදී ගන්නවාය කියනවා. මේ කිලෝ පණහක පොහොර මිටියක ප්‍රමිතිය මොකක්ද? මේ කාබනික පොහොරවල අඩංගු විය යුතු සංයුතිය මොකක්ද? මේ කිසිවක් මෙතැන සඳහන් වෙලා නැහැ. මේ කාබනික පොහොර මිටිය -කිලෝ පණහේ මිටිය- අරගෙන ගොවියාට විකුණන්නේ කීයටද? ඒ කතන්දරයත් නැහැ. කාබනික පොහොර කිලෝ පණහක මිටියක් රුපියල් 400ට ගන්නවාය කියන කතන්දරයක් විතරක් කියලා තිබෙනවා. මේ, ගොවියා ගොනාට ඇන්දවීම සඳහා කරන ලද ප්‍රකාශ දෙකක් පමණයි. මම අපේ කෘෂිකර්ම ඇමතිතුමාට කියනවා, රක්ෂණය සඳහා කපා ගන්නා වූ මේ රුපියල් 150ක මුදල -පොහොර මිටියකින් වැඩිපුර අය කර ගන්නා වූ රුපියල් 150ක මුදල- ඔබතුමන්ලා කුමන රක්ෂණ සමාගමක, කුමන රක්ෂණ සංස්ථාවක, එහෙමත් නැත්නම් වෙනත් කුමන ආයතනයක තැන්පත් කරනවාද කියලා අද හෝ අද බැරි නම් වෙන වේලාවක හෝ -දැන් මගේ වෙලාව අරගෙන වුණත් ප්‍රශ්නයක් නැහැ- මේ අය වැය විවාදය අතරතුර වග කීමක් ඇතිව කියන්න කියලා. ගොවියාට කුමන අන්දමින් මේ වන්දිය දෙනවාද කියන එක පිළිබඳව ප්‍රකාශයක් කරන්න කියා මා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂි කර්මාන්තය පිළිබඳ බොහෝ දෙනා කථා කරපු නිසාත්, ධීවර කටයුතු පිළිබඳ වැය ශීර්ෂය ගැනත් කථා කරන්න තිබෙන නිසාත්, මම කෘෂිකර්මාන්තය ගැන කථා කරන්නට වැඩිපුර කාලය ගන්නේ නැහැ. කොහොම නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රාජිත සේනාරත්න අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී හැම දාම මට වචන කීපයක් කථා කරන්නට අවස්ථාව ලැබෙනවා. එතුමාට ටිකක් කේන්ති ගියාම මට මොනවා හෝ කියලා බණිනවා. එක්කෝ 'කොස්සා' කියනවා, 'පොලිස්කාරයා' කියනවා. 'ඔළුව පැළුවා' කියනවා. මොනවා හෝ එකක් කියලා මට බණිනවා. මම හිතනවා, අද නම් මට බණින්නේ නැතිව, බාධා කරන්නේ නැතිව ගරු සභාවේ ඉඳියි කියලා. [බාධා කිරීමක්] අපි ඉතින් කොහොමත් ෂේප් එකේ යන කට්ටිය නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ධීවර කර්මාන්තය පිළිබඳව කථා කරන කොට නිරන්තරයෙන්ම ධීවර අමාත්‍යතුමා කියන කථාවක් තමයි, "ධීවර කර්මාන්තය ඉහළ නංවලා තිබෙනවා. මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරලා තිබෙනවා. ටින් මාළු කර්මාන්තශාලාවක් ගාල්ලේ ආරම්භ කරලා පිට රටින් ටින් මාළු ගෙන්වන්නේ නැතුව රුහුණු රටින් ටින් මාළු දෙන්නට කටයුතු කරලා තිබෙනවා" කියන එක. ඒ වාගේම ධීවර සංස්ථාවේ ඉහළ ප්‍රගතියක් තිබෙනවා කියලා තමයි ගරු අමාත්‍යතුමන් නිරන්තරයෙන්ම මාධ්‍ය තුළත් ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළත් කියනවා අපි දකින්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය වකවානුව තුළ නැව්වල නැඟලා, බෝට්ටුවල නැඟලා ජීවිතය අනතුරේ තියා ගෙන දහස් ගණන් ජනතාව දිගින් දිගටම ලංකාව අත හැරලා ඕස්ට්‍රේලියාවට ගියා. ඕස්ට්‍රේලියාවට යන මේ ජනතාව ගැන සොයලා බලන කොට වැඩිම පිරිසක් ලංකාව අතහැරලා ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා තිබෙන්නේ ධීවර කර්මාන්තයේ යෙදිලා ඉන්න උදවිය කියලා කිව්වොත් එය අසත්‍යයක් නොවෙයි. අපි මුහුද ආශ්‍රිත ප්‍රදේශ නියෝජනය කරන්නේ. ඒ ප්‍රදේශවල විශාල පිරිසක් -තරුණ උදවිය, වැඩිහිටි උදවිය- අද ලංකාව අත හැරලා ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා තිබෙනවා. ඇයි, ඒ අය ලංකාව අතහැරලා ඕස්ට්‍රේලියාවට යන්නේ? ධීවර කර්මාන්තයේ එතුමා කියන විධියේ ප්‍රගතියක් තිබෙනවා නම්, ධීවර කර්මාන්තයෙන් හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන් නම්, ධීවරයාට සහනදායී තත්ත්වයක් තිබෙනවා නම්, ඔවුන්ට හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා නම් ධීවරයන් තමන්ගේ අඹු දරුවන් සමඟ මේ රටේ ජීවත් වන්නේ නැතිව පැය ගණන් දවස් ගණන් ගෙවා ගෙන අනතුරුදායක ගමනකින් ඕස්ට්‍රේලියාවට යන්නේ ඇයි?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
යන්න පාර දන්නා අය යන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
තමුන්නාන්සේලා පෙන්වන තරමක් පෙන්වන්නේ වැරදි පාරවල් නේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මන්ත්‍රීතුමා, මුහුද අයිනේ ඉන්න ධීවර අය විතරක් නොවෙයි, රට මැද ඉන්න අයත් ඕස්ට්‍රේලියාවට යනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
රට මැද අය ගැනත් කියන්න පුළුවන් සොයිසා මන්ත්‍රීතුමා. ඒ ගැනත් මම කියන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ධීවර කර්මාන්තයේ ඉන්න උදවියට තමන්ගේ දවස ගෙවලා, වෙහෙස මහන්සි වෙලා, වියදම් කරන ඉන්ධන ටිකටවත්, ආම්පන්න ටිකටවත්, ශ්‍රමයටවත් සරිලන ආදායමක් ලබා ගන්න තිබෙන අපහසුව නිසා තමයි ඔවුන්ගෙන් බහුතරයක් අද ලංකාව අතහැරලා ඒ අනතුරුදායක ගමනින් ඕස්ට්‍රේලියාවට යන්න පටන් අරගෙන තිබෙන්නේ.

මේ ධීවර කර්මාන්තයේ තිබෙන ප්‍රගතිය මොකක්ද? දැන් බලන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ධීවර අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්න අවස්ථා ගණනාවකදී කථා කරලා තිබෙනවා, හලාවත ධීවර වරාය ගැන. එක පැත්තකින් හලාවත ධීවර වරායේ මෝය කට තිබෙනවා. අනෙක් පැත්තෙන් ධීවර මාළු වෙළෙඳ සැල තිබෙනවා. ඒ තැන්වල අර්බුද රාශියයි. ඒ ධීවර වරායේ අවුරුද්දෙන් මාස හයක් වැඩ කරන්න විධියක් නැහැ. මාස හයක්ම ධීවරයා කරන්නේ තමන්ගේ ආම්පන්න ටික පටවාගෙන මෝය කටේ වැල්ලේ බෝට්ටුව කිලෝමීටරයකට ආසන්න ප්‍රමාණයක දුරක් තල්ලු කරන එක. මේ කරුණ ධීවර අමාත්‍යතුමා බොහොම පැහැදිලිව දන්නවා. හලාවත ධීවර වරාය දියුණු කරලා ඒකට පහසුකම් වැඩි කරනවා කියලා මහින්ද චින්තනය යටතේ කිව්වා.

හිටපු අමාත්‍යතුමෙකු වන එස්.ඩී.ආර්. ජයරත්න මහතා - පියංකර ජයරත්න මැතිතුමාගේ පියාණන්- අපි කෘතවේදීව මේ අවස්ථාවේ මතක් කරනවා. එතුමා හලාවත ආසනය නියෝජනය කරන වෙලාවේ මෙයට තාවකාලිකව හරි විසඳුමක් හෙව්වා. අවුරුදු ගණනාවකට ඒ විසඳුම බලපෑවා; ක්‍රියාත්මක වුණා. හැබැයි අද ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අද ඒකත් විනාශ වෙලායි තිබෙන්නේ. ඉන් පසුව ආපු කිසිම ධීවර ඇමතිවරයෙකුට හෝ මහජන නියෝජිතයෙකුට පුළුවන්කමක් ඇති වෙලා නැහැ, තුන්දහසකට වැඩි බෝට්ටු ප්‍රමාණයක් පාවිච්චි කරන හලාවත ධීවරයන්ගේ වරාය හදලා දෙන්නවත්, මෝය කට සකස් කරලා දෙන්නවත්. අවස්ථා ගණනාවකදී අපේ ඇමතිතුමාත් කිව්වා, "මේ කටයුත්ත ඉදිරියේදී කරනවා, ඉදිරියේදී කරනවා" කියලා. Dredger යන්ත්‍රයක් ගෙනැල්ලා වැලි ටික අදිනවා කිව්වා. මම දන්නේ නැහැ, dredger යන්ත්‍රයක් ගෙනැල්ලා එතැන වැලි අදිනවාද කියලා. මේ වන කොට තිබුණු "වැලි ගොව්වා" මාසයකට ලක්ෂ හතරකට කුලියට දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ dredger එකෙන් වැලි ටික ඇද්දාම ඒවායේ ගණන් පියවා ගන්නේ ඒ වැලි ටික විකුණලා. එතැන තිබෙන පූජ්‍ය ස්ථානය ඒකට විරුද්ධයි. දැන් අපි ඒ ගොල්ලොත් එක්ක සාකච්ඡා කරගෙන යනවා. දැන් එතුමන්ලා එයට එකඟ වෙලා තිබෙනවා. ඒ විසඳුම ලැබෙන තුරු අපට ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්න බැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මට ගිය සැරේ හම්බ වුණේත් ඔය උත්තරේමයි. හරියටම අදට අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. ඒ උත්තරේ සිට මේ උත්තරය දක්වා අවුරුද්දක කාල පරිච්ඡේදයක් ගත වෙලා තිබෙනවා. හැබැයි, විසඳුම එතැනමයි; සාකච්ඡාව එතැනමයි; සාකච්ඡාවේ ප්‍රතිඵල නැහැ - no action, talk only. NATO සංවිධානය වාගේයි, මෙතුමාගේ සාකච්ඡා. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට දොස් කියනවා නොවෙයි. අද ඒ ධීවරයන් පත්වෙලා තිබෙන තත්ත්වයයි මා කියන්නේ. 3,500කට වැඩි බෝට්ටු ප්‍රමාණයකට මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ ගැන සාකච්ඡා කරනවාය කියනවා. නමුත් විසඳුමක් නැහැ. මේක බොහොම අවාසනාවන්ත තත්ත්වයක්. ඒ වාගේම තමයි හලාවත මාළු වෙළෙඳ සැල. පසු ගිය අවුරුදු 18න් 16ක් තිස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන සන්ධානය වෙන්න පුළුවන්, මහින්ද චින්තන ආණ්ඩුව වෙන්න පුළුවන්, පොදු ජන එක්සත් පෙරමුණ වෙන්න පුළුවන් මොන මළ ඉලව් නමකින් තිබුණත් ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තිබුණේ. [බාධා කිරීමක්] අවුරුදු 18න්, අවුරුදු 2ක් රනිල් මහත්තයා හිටියා, මතක තියා ගන්න.

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

ගරු චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේට ගණනුත් මතක නැහැ නේ. ඕක නේ කියන්නේ. වල් අලියා වන අලියා කළාට පස්සේ තමුන්නාන්සේට ඒකත් මතක නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද වනතුරුත් පුළුවන්කමක් නැහැ, හලාවත මාළු වෙළෙඳසලට ටෙන්ඩර් කැඳවලා, නියමිත පරිදි ඒ ගනුදෙනු සිදු කරන්න. අදත් සිදු වෙන්නේ අත යට ගනුදෙනුව පමණයි. තමුන්නාන්සේට ඒ ගැන පාලනයක් නැහැ. නගර සභාව යටතේ තමයි ඒ පාලනය තිබෙන්නේ. අපි ඒක පිළිගන්නවා. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ ක්‍රියාත්මක වන අංශයක් තිබෙනවා. එදාත් මා ඔබතුමාට මේ ගැන මතක් කළා. ධීවරයා මුහුදෙන් අල්ලා ගෙන එන මාළු ටික විකුණන්න තැනක් ගැන ඔබතුමා අවධානය යොමු කරන්න ඕනෑ. නගර සභාව එක්ක එකතු වෙලා හරි ඒ වැඩ කටයුත්ත කළ යුතුයි. නමුත් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ ව්‍යාපාරිකයන්ට සිදු වෙලා තිබෙන්නේ කප්පම්කරුවන්ට ගෙවන කප්පම් මුදලත් එක්ක වැඩි මුදලක් දෙන්න සිදු වෙලා තිබෙන එකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම තමයි කල්පිටිය ප්‍රදේශයේ දැනට ආරම්භ වෙලා තිබෙන ඩොල්ෆින් සහ තල්මසුන් බලන්න යන කාර්යය. ඒ කාර්යයටත් අපේ වනජීවී ඇමතිතුමා දැන් මැදිහත්වෙලා ඉන්නවා. වනජීවී ඇමතිතුමා මැදිහත්වෙලා ඒ සඳහා ටිකට් කැඩීමේ ව්‍යාපාරයක් ආරම්භ කරලා තිබෙනවා. ඒකට යම් යම් නීති රීති, රෙගුලාසි වගයක් ගෙනැල්ලා තිබෙනවා. ඒක ඉතා හොඳ කාර්යයක් කියලා අපි අනුමත කරනවා. අපි ඒ කටයුත්තට ප්‍රශංසා කරනවා. මොකද, ඒ යන උදවියගේ ආරක්ෂාව තිබෙන්න ඕනෑ නිසා. ඒ යන උදවියගේ ආරක්ෂාව සැලසීම සඳහා එවැනි ක්‍රියාමාර්ග ගැනීමේ වරදක් නැහැ. හැබැයි එක ගැටලුවක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි.

සංචාරක කර්මාන්තය ඒ පැත්තේ යම්තමින් ආරම්භ කළා විතරයි. ඩොල්ෆින් සහ තල්මසුන් නරඹන්නට සංචාරකයන් එන්න පටන් ගත්තා විතරයි. නමුත් ඒ සඳහා අය කරන්න පටන් අරගෙන තිබෙන මුදල නම් ටිකක් ඉහළයි කියලා පෙනෙනවා. ඒ නිසා සමහර සංචාරකයන් පසු බසින්නට පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා මේ කර්මාන්තය පුරුදු කර ගන්න තුරු, හුරු කර ගන්න තුරු, මේ කර්මාන්තය ඒ පැත්තේ දියුණු කර ගන්න තුරු, හැකියාවක් තිබෙනවා නම් මීට වඩා අඩු මුදලක් අය කරන්න. ඒකට හැකියාවක් නැති වෙන්න හේතුවක් නැහැ. මෙතෙක් ඒ සතුන් බලන්න නොමිලේ ගියත්, දැන් එක පාරටම ඩොලර් 20ක් අය කරන්න පටන් ගෙන තිබෙනවා. අඩුම තරමින් ඩොලර් 10කින්වත් ආරම්භ කළා නම් දීර්ඝ කාලයක් මේ කටයුත්ත පවත්වාගෙන යන්න පුළුවන් වෙයි. ඒ ව්‍යාපෘතිය හරහා රැකියා ටිකක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ කට්ටියගේ පැවැත්මත් මේ හරහා සිද්ධ වෙනවා. ඒ නිසා මේ මුදල අඩු කළොත් මේ ප්‍රදේශයේ වෙළෙඳසල් ටිකකුත් ආරම්භ කර ගන්න පුළුවන් වෙයි. සංචාරක හෝටල්වලටත් වැඩි පිරිසක් ගෙන්වා ගෙන තව තව ආදායම වැඩි කර ගන්න පුළුවන් වෙයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මම ඒ ගැන බලන්නම්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
බොහොම ස්තුතියි, ඔබතුමාට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ධීවර අමාත්‍යාංශය යටතේ වැඩ කටයුතු රාශියක් සිද්ධ වෙනවා. මේ අමාත්‍යාංශය යටතේ ධීවර සංස්ථාව තිබෙනවා. ධීවර සංස්ථාව යටතේ තමයි මා හිතන හැටියට නුවරඑළිය සංචාරක බංගලාව තිබෙන්නේ. නුවරඑළිය සංචාරක බංගලාව අලුත්වැඩියා කරන්න ලක්ෂ 58කට ඇස්තමේන්තු කළා. ධීවර සංස්ථාවේ සිවිල් ඉංජිනේරු අංශයක් තිබෙනවා. සේවකයන් විශාල පිරිසකුත් ඉන්නවා. සේවකයන් විශාල පිරිසක් සිටිය දී, සිවිල් ඉංජිනේරු අංශයක් තිබිය දී, සිවිල් ඉංජිනේරුවරයෙක් සිටියදී නුවරඑළිය සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීමේ ලක්ෂ 58ක කොන්ත්‍රාත්තුව පිට පුද්ගලයෙකුට දුන්නා, තමන්ගේ සංස්ථාවේ ඉන්න කාර්ය මණ්ඩලය යොදවලා කරන්නේ නැතිව.

ඒ කොන්ත්‍රාත්තුව තුළ විවිධ දූෂණ, අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. ඒ දූෂණ, අක්‍රමිකතා සිදු වීම කොපමණද කියනවා නම්, බේරුවල හෝටලයකින් ඉවත් කරන ලද උපාංග තමයි නුවරඑළිය සංචාරක බංගලාවට ගෙනැල්ලා සවි කර තිබෙන්නේ. මේවා පිළිබඳව පැමිණිලි ඇවිල්ලා මේ වන කොට ජනාධිපති විමර්ශන අංශය විභාගයක් පටන් අරගෙනත් තිබෙනවා. සංස්ථාවේ විශාල සේවක පිරිසක් සිටියදී, චිත්‍රලාල් කියන පුද්ගලයකුට තමයි මේ කොන්ත්‍රාත්තුව දීලා තිබෙන්නේ; සිවිල් ඉන්ජිනේරුවරයකු සහ කාර්ය මණ්ඩලයකුත් සිටියදී. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා බිල්පත් **28**ක්. ඒ බිල්පත් **28**ම, නුවර එළියේ G.B. Enterprises කියන ආයතනයෙන් මේ ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා මිලදී ගත්ත භාණ්ඩවල බිල්පත්. ඒ බිල්පත්වල photocopy මා ළඟ තිබෙනවා. ඒ බිල්පත් එකකවත්, භාණ්ඩවල මිල ගණන් කොතැනකවත් සඳහන් වෙලා නැහැ. භාණ්ඩවල ප්‍රමාණය තිබෙනවා. ඒ බිල්පත් 28හිම භාණ්ඩ ලැයිස්තුව තිබෙනවා; මිල ගණන් සඳහන් වෙලා නැහැ. සමහර බිල්පත්වල ප්‍රවාහන ගාස්තු විතරක් සඳහන් කරලා තිබෙනවා, රුපියල් 250යි; රුපියල් 750යි ආදී වශයෙන්. ඒ එකම භාණ්ඩයකවත් මිල ගණන් සඳහන් වෙලා නැහැ. ඒ මොකද? ඒ කොන්ත්‍රාත්තුව දූෂිත ගනුදෙනුවක්; දූෂිත ව්‍යාපාරයක්. ඒ තුළ තිබෙන දූෂිත බව තමයි ඒකෙන් පිළිබිඹු වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ඒ බිල්පත් 28 **සභාගත*** කරනවා.

මේ බිල්පත් 28ම අරගෙන විමර්ශනයක් කළොත්, මේ බිල්පත් ලියා තිබෙන පුද්ගලයාගේ අත් අකුරුත් එක්ක, ගනුදෙනුව දාපු පුද්ගලයාගේ අත් අකුරු සංසන්දනය කළොත් ඉතාමත්ම පැහැදිලිව පෙනෙනවා මේක වංචා සහගත, දූෂිත ගනුදෙනුවක් කියලා. මේ සම්බන්ධව දැනට විමර්ශනය කර ගෙන යනවා. විමර්ශන නිලධාරීන්ටත් පහසු වෙයි මා ඒ බිල්පත් සභාගත කළ නිසා. ජනාධිපති විමර්ශන අංශයට අවශ්‍ය වුණොත් ඒවා ප්‍රයෝජනයට ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් සංස්ථාවේම සිවිල් ඉන්ජිනේරු අංශයෙන් ආලා මින්නේරියේ තිබෙන සංචාරක බංගලාව repair කරන්න. ඒ පිළිබඳව පැමිණිල්ලකුත් නැහැ; ජනාධිපති විමර්ශන අංශයට දැනුම් දීලත් නැහැ; දෝෂාරෝපණයකුත් නැහැ; තත්ත්වයත් හොඳින් තිබෙනවා. මෙසේ තමන්ගේ සම්පත් තිබෙද්දීත් කොන්ත්‍රාත්කරුවෙකුට මේවා භාර දීලා, දූෂිත ක්‍රියාවලියක් සිදු වෙන්න ඉඩ දීලා, තමන්ගේ නම නරක් කර ගන්න හදන්නේ ඇයි? ගරු ඇමතිතුමා හොඳ වැඩකාරයෙක්. එතුමාට තිබුණා තමන්ගේ තත්ත්වය ඉතාම හොඳින් ආරක්ෂා වන පරිදි මේ කර්තව්‍ය සිවිල් ඉන්ජිනේරු අංශයටම පවරලා කරන්න. ඒ වාගේම තමයි කලමැටිය සංචාරක

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

බංගලාව. ඒකෙත් ලක්ෂ 37ක ඇස්තමේන්තුවක්. මීද්දෙනියෙන් ගලවා ගෙන ගිය පරණ A/C එකක් තමයි කලමැටිය සංචාරක බංගලාවේ සවි කළේ. ඉතින් මේවා පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ. කවුද, මේ කොන්ත්‍රාත්තුව කරන්නේ? ඒ කොන්ත්‍රාත්කරුවා ඇයි පරණ ඒවා අරගෙන ගිහිල්ලා එතැන සවි කරලා හරි හම්බ කරන්න හදන්නේ? එහෙම නම් කොතැනක හෝ රැකවරණයක් මෙහි තිබෙනවා. ඒ රැකවරණය නිසා තමයි මේවා කරන්නේ. දැන් කලමැටිය සංචාරක බංගලාවේ කොන්ත්‍රාත්තුව සම්බන්ධවත් විමර්ශනයක් පවතිනවා. මොකද, ගරු මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිවරයා හැටියට ජනාධිපතිතුමා අය වැය කථාවේදී කලමැටිය වරාය පිළිබඳවත් කථා කළා. එතුමා කලමැටිය වරාය පිළිබඳව සඳහන් කරලා තිබුණ නිසා මට ඒ සංචාරක බංගලාව පිළිබඳවත් අවධානය යොමු කරන්න හිතුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා හැටියට ජනාධිපතිතුමා කිව්වා, කිසිම රජයේ ඉඩමක් විදේශිකයන්ට දෙන්නේ නැහයි කියලා. හැබැයි විදේශිකයන්ට සම්පූර්ණයෙන්ම විකුණනවා කියන, සින්නක්කර පදනම යටතේ විකුණුවේ නැති වුණාට, මේ වන කොටත් කිරින්ද වරාය මැනලා, තක්සේරු කරලා අවසාන කෙටුම්පත් ටිකත් සකස් කර ගෙන යනවා කොරියානු විදේශ සමාගමකට කිරින්ද වරාය භාර දෙන්න, ලංකා ධීවරයන්ගෙන් ඉවත් කරලා. කියන්නේ එක කථාවක්, කරන්නේ තව එකක්. අර කියමනක් තිබෙනවා, "හක්කෙ බුදු රැස් බොක්කෙ දඩ මස්" කියලා. අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට කියපු කතන්දරේ නොවෙයි ඊට හාත්පසින්ම වෙනස් කතන්දර තමයි පසුව ක්‍රියාත්මක වෙන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකා ධීවර සංස්ථාව සතුව තිබුණ ඉතාමත්ම වටිනා අංශයක් තමයි බේරුවල අයිස් යන්ත්‍රාගාරය. බේරුවල අයිස් යන්ත්‍රාගාරයෙන් ඉතා ඉහළ ආදායමක් ලැබෙනවා. ඉතා ඉහළ ආදායමක් ලබපු බේරුවල අයිස් යන්ත්‍රාගාරය අද වන කොට බදු දීලා. දැන් බදු ගත්ත කට්ටිය තමයි මේ ක්‍රියාත්මක වෙන්නෙ. "Iceman" කියන කොම්පැනියට සංස්ථාව සතුව තිබුණු, ලාභ ලබන ආයතනයක් බදු දීලා. සංස්ථාව, එහෙම නැත්නම් රජය සතුව තිබෙන මේ දේපළ "Iceman" කියන කොම්පැනියට බදු දෙන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද? අලුතෙන් ඉදි කරන්න තිබෙනවා නම්, කඩා වැටිච්ච එකක් ගොඩ නඟන්න තිබෙනවා නම්, රජයට සහ සංස්ථාවට එය ගොඩ නඟන්න බැරි නම් පිට කෙනෙකුට දීලා හෝ ගොඩ නැඟුවාට කමක් නැහැ. ඉතා හොඳින් ක්‍රියාත්මක වන, ලාභ ලබන ආයතනයක් තමයි මේ විධියට බදු දීලා තිබෙන්නේ; එහෙම නැත්නම් වෙනත් ආයතනයකට උගස් කරලා තිබෙන්නේ.

ගරු මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමාගේ අය වැය කථාවේදී මත්ස්‍ය සම්පත රැක ගන්නා හැටි කොහොමද කියන එක ගැන ප්‍රකාශ කරලා තිබෙනවා.

දැන් බලන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අය වැය ලේඛනයේ 28වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

"ආහාර සුරක්ෂිතතාවය, ජීවනෝපාය කටයුතු වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය වෙනුවෙන් ධීවර අංශයේ සංවර්ධනය රජයේ තවත් ප්‍රමුඛතාවයක් වෙනවා. රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙළ මඟින් ධීවර වරාය පද්ධතිය නඩත්තු කිරීම, ගබඩා හා වෙළඳපල යටිතල පහසුකම් සපයාදීම, ධීවර බෝට්ටු ලබාදීම, වෙරළබඩ මුහුදු තීරුවල හා ගැඹුරු මුහුදේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහාත් යොමු කර තිබෙනවා."

දැන් ගරු ජනාධිපතිතුමා උත්සාහ කරනවා, මේ ආයතන ටික රැක ගෙන ඒවායින් ඵලදායී සේවයක් ධීවරයාටත්, රටේ ජනතාවටත් ලබා දෙන්න. හැබැයි ඵලදායී ලාභයක් ලබන, යහපත් ප්‍රතිඵල තිබෙන ආයතන මේ වන කොට ලංකා ධීවර සංස්ථාව බදු දීලා තිබෙනවා. ලංකා ධීවර සංස්ථාව සතුව තිබෙන සියලුම වාහන මේ වන කොට ලංකා බැංකුවට උකස් කරලාත් අවසානයි. ඒකයි වත්කමේ තත්ත්වය.

ඒ විතරක් නොවෙයි. දැන් බලන්න, මාළු මිල දී ගැනීම ගැන. මාළු මිල දී ගත් ව්‍යාපාරිකයන්ට අතිවිශාල මුදලක් ගෙවන්න තිබෙනවා. අද ලංකා ධීවර සංස්ථාව ණය ආයතනයක් බවටයි පත් වෙලා තිබෙන්නේ. මා දන්නා විධියට ලංකා ධීවර සංස්ථාව රුපියල් මිලියන 538ක් ණයයි. උපකරණ මිල දී ගත් තැන්වලට ගෙවන්න තිබෙනවා. ඒ වාගේම මාළු මිල දී ගත් අයට ගෙවන්න තිබෙනවා. මාළු මිල දී ගත් ව්‍යාපාරිකයන් ඇවිත් ලංකා ධීවර සංස්ථාවෙන් චෙක්පත අරගෙන ගියාම චෙක්පත return වෙනවා. එහෙම නැත්නම් එය අගරු චෙක්පතක් බවට පත් වනවා. මෙන්න මේ තත්ත්වයට ලංකා ධීවර සංස්ථාවේ ආර්ථික තත්ත්වය පහළට වැටිලා තිබෙනවා. රුපියල් මිලියන 538ක් ණය තිබෙන ආයතනයක් බවට අද ලංකා ධීවර සංස්ථාව පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අජිත් කුමාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ පසු ගිය කාලයේ මාළු සුනාමිය හැමුවා. මත්ස්‍ය සම්පත බොහොම වැඩි වුණා. නැඟෙනහිර ප්‍රදේශවලින් අතිවිශාල අන්දමින් මාළු එන්න පටන් ගත්තා. හැබැයි ලංකා ධීවර සංස්ථාව මැදිහත් වෙලා ඒ මාළු මිල දී ගත්තා. මිල දී ගත්තේ කීයටද? කිලෝග්‍රෑම් එකක් රුපියල් 300 ගණනේ ටොන් 26,750ක් මිල දී ගත්තා. අපට තිබුණු ශීතාගාර - cold rooms - "Iceman" කොම්පැනිය වාගේ ඒවාට දීලා තිබෙන නිසා අර මිල දී ගත් මාළු ගබඩා කර තබා ගන්න අවශ්‍ය ප්‍රමාණයට ඉඩකඩ තිබුණේ නැහැ. කිලෝග්‍රෑම් 1ක් රුපියල් 300 ගණනේ මිල දී ගත් මාළු ටික, මේ හේතුව නිසා දැන් අද නරක් වෙමින් තිබෙනවා. එම නිසා අද සිද්ධ වෙලා තිබෙනවා, කිලෝග්‍රෑම් එක රුපියල් 30 ගණනේ ඒ මාළු ආපසු විකුණන්න.

ඒ විතරක් නොවෙයි. කාඩ්බෝර්ඩ් පෙට්ටි ව්‍යාපාරයක් කළා. රුපියල් 2,500,000ක පමණ පොල්ල තියලා කාඩ්බෝඩ් පෙට්ටි ව්‍යාපාරයේ කළමනාකාරවරයා පැනලා ගිහින් තිබෙනවා. එය විගණනයටත් ලක් වෙලා තිබෙනවා. අද වන කල් විමර්ශනයක් සිදු වන්නේ නැහැ. ඒ වාගේම මෙම ආයතනයට බඳවා ගත යුතු නිශ්චිත සේවක සංඛ්‍යාව 745යි. හැබැයි අද එහි සේවකයන් 1,236දෙනෙක් ඉන්නවා. නිශ්චිත සේවක සංඛ්‍යාවට අමතරව 491දෙනෙක් ඉන්නවා. මේ නිසා ආයතනය පාඩුවෙන් පාඩුවට පත් වෙලා තිබෙනවා. කල් වෙලාව නොමැති නිසා මේ කියන ලද කාරණාවලට අදාළ ලිය කියවිලි සියල්ල මා **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම කිසිදු කාර්යයක නිරත නොවී වෙනත් වැඩිපුර දීමනා ලබන අයත් එම ආයතනයේ ඉන්නවා. ඒ දීමනා ලබන අයගේ ලැයිස්තුවත් මට ඉදිරිපත් කරන්න පුළුවන්.

විනාඩි දෙකකින් මගේ කථාව අවසන් කරනවා. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව මහා වංචා සිද්ධ වන තැනක්. එම සංස්ථාවේ සභාපතිවරයෙක් සිටියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම සභාපතිවරයාගේ නම - ඔහු දැනටත් සේවයේ ඉන්නවාද දන්නේ නැහැ.- අනුරුද්ධ සේනාරත්න. ඔහු අපේ ගරු ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක්. දැන් මේ අනුරුද්ධ සේනාරත්න මහත්මයා බේරුවල මධ්‍යම යාන්ත්‍රික වැඩ

---

*** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

පොළේ සේවකයින් විධියට දෙදෙනකු ඉන්නවාය කියලා මාසිකව රුපියල් 34,811ක වැටුපක් ලබා ගන්න වවුචරයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සේවකයින් දෙදෙනාගේ නම් දෙක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සේවා අංකය 13029 ප්‍රදීප් කුමාර හා සේවා අංකය 13030 දසනායක. මෙම වවුචර් General Managerට ඉදිරිපත් කරලා, ඔහු එය අනුමත කරලා තිබෙනවා, වැටුප ගෙවන්න. එතකොට -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
විනාඩියකින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

පඩි ගෙවන්න ගිහින් බලන කොට මේ නමින් නිලධාරින් දෙදෙනෙක් නැහැ. ආරක්ෂක අංශයෙන් සොයා බැලුවා. නමුත් මේ නමින් නිලධාරින් දෙදෙනෙක් නැහැ. හැබැයි මේ සම්බන්ධීකරණ ලේකම්වරයා වවුචරයක් ඉදිරිපත් කරනවා, අසවල් වෙලාවට සේවයට පැමිණියා, අසවල් වෙලාවට පිටව ගියා, පඩි ගෙවන්නය කියලා. මේ අදාළ ලිය කියවිලි සියල්ලම මා ළඟ තිබෙනවා. වංචා සහගත විධියට රජයේ මුදල්, එහෙම නැත්නම් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මුදල් ගසා කන්නයි ලෑස්ති වෙලා තිබෙන්නේ. මේ සියලු දේවල් පිළිබඳ විමර්ශනයක් පවත්වා නැහැ. අවාසනාවක මහිම. එම නිසා අද ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වැඩි ප්‍රමාණයක් හොර ගුහාවක් බවට පරිවර්තනය වෙමින් තිබෙනවා. මේ නිසා තමයි ලංකා ධීවර සංස්ථාවත්, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවත් දිගින් දිගටම කඩා වැටෙන්නේ.

මේ අවස්ථාවේදී මම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගෙන්වත් ඉල්ලීමක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි - ජනාධිපතිතුමා සිටියා නම් මට එදා වාගේ කරුණු පැහැදිලි කරලා දෙන්න තිබුණා - කරුණාකරලා ජනාධිපති විමර්ශන අංශයේ පෞද්ගලික අවධානය මේ පිළිබඳව යොමු කරවලා මේ ටික විභාග කරවන්න කටයුතු කරන්න. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාව අපහසුතාවට පත් කරන්නට නොවෙයි; මේවා එතුමා කරනවා කියලා, එතුමාට චෝදනා කරනවාත් නොවෙයි. නමුත් යම් යම් උදවිය ඉඳ ගෙන කරන ක්‍රියාවලිය තුළ මේ සංස්ථාවත් රාජ්‍ය ආයතනත් දිගින් දිගටම කඩා ගෙන වැටෙනවා. අන්න ඒ කඩා ගෙන වැටෙන එක වළක්වා ගැනීම සඳහායි මේ පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ.

[අ. භා. 5.03]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බල්ලෝ බුරනවා, ගැල ඉදිරියටම යනවා. ඒ ගැල ඉදිරියට යනකොට කොහොමත් බල්ලෝ බුරන එක කරනවා. ඒකෙන් ගැල නවතින්නේ නැහැ. ඒ වාගේ කථාවක් සම්බන්ධයෙන් එච්චරයි මට කියන්නට තිබෙන්නේ. අද මගේ කථාව ආරම්භ කරන්නට ඉස්සර වෙලා මම ඉතාමත් ස්තුතිවන්ත වෙන්න කැමැතියි, ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට. විශේෂයෙන්ම අපේ ද්‍රවිඩ සන්ධානයේ මන්ත්‍රීවරුන් පවා ධීවර අමාත්‍යාංශයත්, මගේ ක්‍රියාමාර්ගයත් ගැන ඉතාමත්ම ප්‍රශංසනීය මුඛයෙන් කථා කළා. නමුත් ප්‍රශංසාව කියන එක දන්නේ නැති, වාරයක් නැති අයත් සිටිනවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා පසුපස ගිහින් පස්සේ ඇවිල්ලා මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක තේ බීලා, නියෝජ්‍ය ඇමතිකම්, ආරක්ෂක ඇමතිකම් ඉල්ලලා ඒවා දෙන්න බැහැ යි කියපුවාම ඊට පස්සේ බොරුවට මහින්ද චින්තනයට බැණ බැණ ගිහින්, ආයෙත් එතුමා පස්සෙන් දුවගෙන ගිහින් තේ කෝප්පයක් බීලා රනිල් වික්‍රමසිංහට විරුද්ධව කථා කරලා, ගුටි කාලා, මිය යන්නට කිට්ටු කරලා සිටිද්දී අපේ නෝනාත් උදවු කරලා බේරා ගෙන, ඊට පසුව සජිත් ප්‍රේමදාස මහත්මයා පසුපස ගිහින් එතැනින් ඉවර වෙලා, ආපසු සරත් ෆොන්සේකා මහත්මයා පසුපස ගිහින් සරත් ෆොන්සේකා ළඟ හිටපු අය දැන් අනෙක් පැත්තට ගියාම එතැනිනුත් අනාථ වුණු අයයි එහෙම කියන්නේ. ඉතිං යන එන මං නැති මෙවැනි පුද්ගලයින්ගේ කථා මොන කථාද? මේවා අමූලික බොරු. බේරුවල අයිස් යන්ත්‍රාගාරය අපි දීලා ලු.

බේරුවල අයිස් යන්ත්‍රාගාරය තවමත් තිබෙන්නේ ධීවර සංස්ථාවට. බේරුවල ධීවර වරායේ තිබෙන අයිස් යන්ත්‍රාගාරය දුන්නේ මම නොවෙයි, මට ඉස්සර හිටපු ඇමතිවරුන්. තිස්දාහකට දුන්න එක මම ඊට වඩා වැඩි කර ගත්තා. එක්ලක්ෂ ගණනක් වැඩි කර ගත්තා. එච්චරයි මම කරපු වෙනස්කම. මේවා අමූලික බොරු. නුවරඑළියේ බඩු ගත්තා ලු කොන්ත්‍රාත්කාරයෙක්. ඒ මනුෂ්‍යයාට ගිහිල්ලා බඩු ගන්න අපි කියන්න ඕනෑද? කොන්ත්‍රාත්කාරයෙකුට දුන්නාම කොන්ත්‍රාත්කාරයා තමයි ඒක කරන්නේ. මේවාට උත්තර දෙන්න මම කාලය නාස්ති කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ තුට්ටු දෙකේ කසිකබල් දේවල් නොවෙයි, ඔබතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන් ධීවර කර්මාන්තයට බලපාන ඉතාමත් වැදගත් කරුණු ඉදිරිපත් කළා. මා ඒවා ගැන කථා කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටින අවස්ථාවේ මම කියන්න කැමැතියි, අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය මේ ඔක්තෝබර් මාසය වනකොට මෙට්‍රික් ටොන් 3,40,410ක් වෙලා තිබෙනවා. පසුගිය අවුරුද්දේ අපි ලංකා ඉතිහාසයේ වාර්තාගත අස්වැන්න ලෙස මෙට්‍රික් ටොන් 4,40,000ක් ලබා ගත්තා. ඒ කියන්නේ මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසය වනකොට පසුගිය අවුරුද්දට වඩා මත්ස්‍ය නිෂ්පාදනය සියයට 16කින් වැඩි කර ගෙන තිබෙනවා. මොකද, පසුගිය අවුරුද්දේ තිබුණේ මෙට්‍රික් ටොන් 2,79,970යි. මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසය වනකොට එම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,40,490ක් වෙලා තිබෙනවා.

මිරිදිය කර්මාන්තය ගත්තොත්, අපි පසුගිය අවුරුද්දේ මාස 10ට ලබා ගත්තේ මෙට්‍රික් ටොන් 40,110යි. මේ වනකොට එම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 62,580ක් වෙලා තිබෙනවා. ඒ අනුව නිෂ්පාදනය සියයට 39කින් වැඩි වෙලා තිබෙනවා. සම්පූර්ණ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 4,45,000යි. මේ මාස 10ට විතරක් මෙට්‍රික් ටොන් 4,02,960ක් අපි වාර්තාගත කරලා තිබෙනවා. එම නිසා මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ මේ අවුරුද්දේ ධීවර කර්මාන්තයේ මත්ස්‍ය නිෂ්පාදනය පසුගිය අවුරුද්දටත් වඩා දෙසැම්බර් 21වැනිදා වනකොට වැඩි වෙනවා. ඒ වාගේම දළ දේශීය නිෂ්පාදනය ගැන මම කියන්නම්. අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමාත් මේ ගැන කරුණු දැක්වූවා. එතුමා ඒවා ගත්තේ කොහෙන්ද මම දන්නේ නැහැ.

ජලජීවී නිෂ්පාදනය වැඩි වුණු ආකාරය මම පෙන්වන්නම්. 2009 දී මෙට්‍රික් ටොන් 46,560යි. 2010 දී 52,410යි. 2011 දී 59,560යි. 2012 සැප්තැම්බර් මාසය වනකොට 57,430ක් වෙලා තිබෙනවා. ඒ වාගේම ඉස්සන් නිෂ්පාදනය ගත්තොත්, 2009 දී මෙට්‍රික් ටොන් 3,550යි. 2010 දී 3,480යි. 2011 දී 4,150යි. 2012 සැප්තැම්බර් මාසය වනකොට 2,930යි. ඒ වාගේම මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම ගත්තොත්, ජල ජීවී වගා අධිකාරියෙන් එය කරලා තිබෙනවා. 2009 දී මිලියන 26.93යි. 2010 දී මිලියන 34.18ක්. 2011 දී මිලියන 43.27ක්. 2012 සැප්තැම්බර් මාසය වනකොට මිලියන 29.86ක් තිබෙනවා. ඒ වාගේම මම පෙන්වන්නට ඕනෑ, විශේෂයෙන්ම උතුරට දීලා තිබෙන මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව විතරක් 6,368,830ක් වෙනවා. අපි තැන්පත් කරලා තිබෙන මිරිදිය ඉස්සන් පසු කීටයන් සංඛ්‍යාව 1,100,000යි. ඔක්කොම එකතුව 7,468,830යි. ඒ අපි උතුරට විතරක් දීලා තිබෙන ප්‍රමාණය.

අපේ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා මෙතැන නැහැ. එතුමා කථා කළා, දළ දේශීය නිෂ්පාදනය ගැන. මම ඒ ගැන විස්තර ඉදිරිපත් කරන්නම්. අපි නිෂ්පාදනය කරපු මත්ස්‍ය වටිනාකම ගත්තොත් 2010 වර්ෂයේ දෙවන quarter එකට විතරක් මිලියන 24,276යි. 2011 වර්ෂයේ දෙවන quarter එක වෙන කොට ඒක වැඩි වෙලා තිබෙනවා, මිලියන 28,227කට. එය 2012 වර්ෂයේ දෙවන quarter එක වෙන කොට මිලියන 36,744කට වැඩි කර ගෙන තිබෙනවා. පළමුවැනි කාර්තුවේදී සියයට 4.9කින් වර්ධනය වුණු මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2011 වර්ෂයේ පළමුවැනි කාර්තුවේදී සියයට 8.2කින් වර්ධනය වෙලා මේ අවුරුද්දේ දෙවැනි quarter එක වෙන කොට සියයට 19.9කින් වර්ධනය වෙලා තිබෙනවා. 2010 වර්ෂයේ පළමුවැනි quarter එක වෙන කොට සියයට 10කට තිබුණු සාගර මත්ස්‍ය සම්පතෙහි වර්ධනය අද වෙන කොට සියයට 34.7 වෙනකල් වර්ධනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ සම්පූර්ණ වර්ධනය සියයට 9.6 ඉඳලා සියයට 33.3 වෙන කල් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් විධියට ගත්තොත් 2010 වර්ෂයේ සියයට 1.4ට තිබුණු වර්ධනය මේ වන කොට සියයට 2.1ක් වනතෙක් වර්ධනය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ මන්ද පෝෂණයට එරෙහිව අපි ගෙන යන සටනේදී අපේ රටේ මිනිසුන්ගෙන් සියයට 72ක්ම සත්ව ප්‍රෝටීන් හැටියට පරිභෝජනය කරන්නේ මත්ස්‍යයනුයි. ඒ නිසා 2013 - 2014 වෙන කොට මේ රටේ මන්ද පෝෂණය ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. 2009 වර්ෂයේ අපේ රටේ ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 28යි. 2010 වෙන කොට ග්‍රෑම් 31.9 වුණා. 2011 වෙන කොට ග්‍රෑම් 36.7 වෙලා 2012 මේ වෙන කොට ග්‍රෑම් 38.2ක් වෙන කල් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම වාර්ෂික පරිභෝජනය බැලුවොත් කිලෝ 10.2කට තිබුණු ප්‍රමාණය 2010 වර්ෂයේ කිලෝ 11.66කට වැඩි වෙලා, 2011 වර්ෂයේ කිලෝ 13.3කට වැඩි වෙලා, 2012 වර්ෂයේ සැප්තැම්බර් වෙන කොට කිලෝ 13.9කට වැඩි වෙලා තිබෙනවා.

අපි අලුත් මත්ස්‍ය විශේෂ ආරම්භ කළා. මත්ස්‍ය සම්පත විතරක් නොවෙයි, මීගමුවේ සහ කින්නියාවල අපි මෝදා මත්ස්‍ය නිෂ්පාදනය පටන් ගත්තා. මේ වන විට අපි 402,850ක් පැටව් තැන්පත් කරලා තිබෙනවා. අපේ වික්ටර් ඇන්ටනී මන්ත්‍රීතුමා තමයි මුලින්ම ඒ යෝජනාව ගෙනාවේ. මේක යුරෝපයේ විශාල ඉල්ලුමක් තිබෙන මත්ස්‍ය සම්පතක්. ඒ ව්‍යාපෘතිය අපි ආරම්භ කළා. ඒ වාගේම තමයි, බෙල්ලන් වගාව. මන්නාරමේත්, කොළඹ කොරලවැල්ලෙත් දෙකේම බෙල්ලන් වගාව කරනවා. මන්නාරමේ බෙල්ලන් වගාවෙන් විශාල ප්‍රතිලාභයක් ගන්නේ ඉතාමත්ම අහිංසක, දරිද්‍රතාවයෙන් හිටපු දෙමළ ජනතාවයි. තරු පහේ හෝටල් ඔක්කෝටම සපයන්නේ අපි ඒ ආරම්භ කරපු බෙල්ලන් ව්‍යාපෘතියේ බෙල්ලනුයි. අද සුළු ප්‍රමාණයක් අපනයන කරනවා. මේවා ලංකාවේ ඉස්සෙල්ලාම ආරම්භ කළේ පසු ගිය කාලයේයි. ඒ වාගේම තමයි මුහුදු පැළෑටි.

අපි ජපානයේ ව්‍යාපාරිකයෙක් එක්ක යාපනයේ ජනතාවගේ ජීවන තත්ත්වය ගොඩ නැඟීම සඳහා මුහුදු පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙනවා. ඒකේ pilot project එක දැන් ඉවර වෙමින් තිබෙනවා. ඒක අවසාන වෙන කොට 20,000කට රැකියා දෙන්න ඔවුන් පොරොන්දු වෙලා තිබෙනවා. ඒ project එකෙන් මේ වනකොට මුහුදු පැළෑටි අස්වැන්න වශයෙන් කිලෝ 40,600ක් නෙළා ගෙන තිබෙනවා. ඒ මුහුදු පැළෑටි නිෂ්පාදනය කරන්නේ පිට රට යැවීම සඳහායි. විසිතුරු මසුන් ව්‍යාපාරය ගත්තොත් මේ වන විට 626,013ක් මත්ස්‍යයන් විකුණලා තිබෙනවා. 2003 වර්ෂයේදී මිලියන 624ක් තිබුණු අපනයනය 2011 වන කොට මිලියන 1,112කට වැඩි කර ගන්නට පුළුවන් වෙලා තිබෙනවා.

අද කථා කළ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා කිව්වා, අපේ ආනයන වැඩි වෙලා අපනයන අඩු වෙලා කියලා. ඒක සම්පූර්ණ මිථ්‍යාවක්. එතුමා එළියටත් ඇවිත් කථා කළා. මම කිව්වා, මා ළඟ සම්පූර්ණ දත්තයන් ටික තිබෙනවා, මම ඒවා දෙන්නම් කියලා. ගිය අවුරුද්දේ අපනයන ආදායම මිලියන 15,692ක් අපි මුදල්වලින් ගත්තා. මේ අවුරුද්දේ අපි අපනයනයෙන් මිලියන 20,195ක් -බිලියන 20ක්- අපි හම්බ කළා. ඒ කියන්නේ සියයට 29ක වර්ධනයක් තිබෙනවා. ඒ වාගේම ප්‍රමාණයෙන් ගත්තොත් ගිය අවුරුද්දේ මෙට්‍රික් ටොන් 12,974ක් වුණු එක මේ අවුරුද්දේ මෙට්‍රික් ටොන් 14,427ක් වෙනවා. සියයට 11ක වර්ධනයක් තිබෙනවා. මෙහි සුවිශේෂත්වයක් තිබෙනවා. අපි මෙච්චර කල් වැඩිම මත්ස්‍ය ප්‍රමාණයක් යැව්වේ යුරෝපයටයි. නමුත් මේ වන කොට අපි ජපානයට සියයට 38ක් අපනයනය කරනවා. යුරෝපයට සියයට 33ක් අපනයනය කරනවා. ඇමෙරිකාවට සියයට 18කුත්, අනෙකුත් රටවලට සියයට 12කුත් අපනයනය කරනවා. යුරෝපයට අඩුවෙමින්, ජපානය සහ ඇමෙරිකානු වෙළෙඳ පොළට අපි අවතීර්ණ වෙලා තිබෙනවා.

ඒ වාගේම ආනයනයන් අරගෙන බැලුවොත්, ගිය අවුරුද්දේ අපි මෙට්‍රික් ටොන් 60,086ක් ලංකාවට ආනයනය කළා. මේ අවුරුද්දේ අපට ඒක මෙට්‍රික් ටොන් 54,926 දක්වා අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 12කින් අපේ ආනයන අඩු කර ගෙන තිබෙනවා. එතකොට අපට සියයට 23ක වාසියක් තිබෙනවා. අපි අපනයනය කරන ප්‍රමාණය සියයට 11කින් වැඩි කර ගෙන ආනයන සියයට 12කින් අඩු කර ගෙන තිබෙනවා.

මෙහි ප්‍රධානම දේ තමයි, උම්බලකඩ ආනයනය සියයට 44කින් අඩු කර ගෙන තිබීම. ඒ වාගේම කරවල ආනයනය සියයට 26කින් අඩු කර ගෙන තිබෙනවා, හාල්මැස්සන් කරවල ආනයනය සියයට 6කින් අඩු කර ගෙන තිබෙනවා. ප්‍රමාණය ගත්තොත්, මාළු ආනයනය සියයට 17කින් අඩු වෙලා තිබෙනවා. මේ විධියට බැලුවාම ආනයන කළ මෙට්‍රික් ටොන් ප්‍රමාණය අඩු වීමට ප්‍රධානම හේතුව තමයි ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන දිවි නැගුම වැඩ පිළිවෙළ. අපි හදන උම්බලකඩ ටික, අපි හදන කරවල ටික, අපි හදන ජාඩි ටික නිසා අද අපට උම්බලකඩ ආනයනය සියයට 44කින් අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. කරවල ආනයනය සියයට 26කින් අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. හාල්මැස්සන් කරවල ආනයනය සියයට 6කින් අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම මාළු ආනයනය සියයට 17කින් අඩු කර ගන්නට පුළුවන් වෙලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

අපි ටින් මාළු කර්මාන්තශාලා 4ක් විවෘත කළා. පළමුවැනි කර්මාන්තශාලාව අපි ගාල්ලේ විවෘත කළා. මේ සියලුම ඇමතිවරු දන්නවා, එදා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ ඉඳලා ලංකාවේ ටින් මාළු කර්මාන්තශාලාවක් ආරම්භ කරන්න උත්සාහ කළ බව. අපේ අතිගරු ජනාධිපතිතුමාත් උත්සාහ කළා. මේ වෙලාවේදී අපි පළමුවැනි ටින් මාළු කර්මාන්තශාලාව ලංකා ධීවර සංස්ථාවත්, දේශීය පෞද්ගලික අංශයත් එකතු වෙලා ගාල්ලේ ආරම්භ කළා. ඒ කර්මාන්තශාලාව කඩා ගෙන වැටෙන්නේ නැතිව ක්‍රියාත්මක වන කොට ඒක දිහා බලා ගෙන ඉඳලා තමයි පෞද්ගලික අංශය සම්පූර්ණ ආයෝජනයක් කරන්නට ආවේ. ඒ නිසා දෙවැනි කර්මාන්තශාලාව මාතර විවෘත කළා. තුන්වැනි එක පැලියගොඩ ආරම්භ කළා. හතරවැනි එක මුන්දලම ආරම්භ කරලා තිබෙනවා. එම කර්මාන්තශාලා 4න් අපි දවසකට සැමන් ටින් 38,000ක් හදනවා. තව මාසයක් දෙකක් යන කොට එම ප්‍රමාණය 64,000ක් වෙනවා. මේ රජයට මම ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. අපි ඉල්ලීමක් කළා ආනයනය කරන ටින් මාළුවලට බදු අය කරන්න කියලා. මොකද, පසු ගිය කාලයේ ජීවන වියදම ඉහළ යනවා කියලා ඒ සඳහා වන බද්ද අඩු කළා. එතකොට මේ කර්මාන්තශාලා හෙල්ලුණා. ඒ නිසා මේ කර්මාන්තකරුවන්ට නිෂ්පාදන කටයුතු කර ගෙන යන්න අපහසු වුණා. මතක තියා ගන්න, ටින් මාළු ආනයනය කියන්නේ තනිකරම මාෆියාවක්. එක්තරා සමාගමක් තිබෙනවා, මම නම කියන්නේ නැහැ. පැරණි අරක්කු සමාගමක් කොන්දේසියක් දාලා තිබෙනවා. ඒ සමාගම වෙළෙඳ සැල්වලට කියලා තිබෙනවා, දේශීය නිපැයුම් ගන්නවා නම් ප්‍රසිද්ධ වෙලා තිබෙන ඒ ගොල්ලන්ගේ ටින් මාළු ඒ කඩවලට දමන්නේ නැහැ කියලා. පිට රටින් ගේන ඒවා ගත්තාට කමක් නැහැ, දේශීය නිෂ්පාදන ගන්න එපා කියලා තිබෙනවා. එහෙම තමයි ඒ ගොල්ලෝ කඩාකප්පල් කරන්න හදන්නේ.

මේ රටේ පෞද්ගලික අංශයේ ප්‍රධානම supermarkets කොටස් දෙකක් තිබෙනවා. ඒ දෙකෙන් එකක්වත් දේශීය නිෂ්පාදන ගන්නේ නැහැ. එවැනි තත්ත්වයක් තුළ තමයි අපි මේ කටයුතු කරන්නේ. මම සතොසත් එක්ක කථා කළාට පස්සේ ඒවා බෙදා හැරීමේ කටයුතු සතොස ආරම්භ කළා. තව ටික දවසක් යන කොට අපේ නිෂ්පාදන ධාරිතාව ටින් 64,000ක් වෙනවා. නමුත්, අපට දවසකට ටින් 130,000ක් ඕනෑ. තව මාස හයක්, හතක් යන කොට, ඒ ගොල්ලන් වැඩ මුර දෙක කරන කොට සහ lines වැඩි කරන කොට අපට පුළුවන් 130,000ම මේ කර්මාන්තශාලා හතරෙන් ලබා ගන්නට.

එදා ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, මේ කර්මාන්තශාලා වහලා දාන්න යනවා කියලා. ඇත්තටම ඒක එතුමාගේ වරදක් නොවෙයි. එතුමා මට ගෙනැල්ලා පෙන්නුවා ලංකාදීප පත්තරේ. ලංකාදීප පත්තරේ "ගුරුදා විග්‍රහය" තුළින් තමයි ඒක කියා තිබෙන්නේ. ඒ ගොල්ලන්ගේ දේශපාලන විග්‍රහත් ඉතින් ඔය වගේ තමයි. ගුරුදා විග්‍රහයෙන් තමයි කියන්නේ ඒ කර්මාන්තශාලා වහනවා කියලා. මේ කර්මාන්තශාලා වහනවා, ඒ නිසා ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති වැරැදියි කියලා ඒ විග්‍රහයෙන් මුළු ආණ්ඩුවටම ගහනවා. ගාල්ලේ ටින් මාළු කර්මාන්තශාලාව ඇරලා තිබියදීත් ඒක වහනවාලු. ඒක ගැන බැලුවේ නැහැයිලු. මාළු කොහෙන්ද ගෙන්වන්නේ? තමුන්නාන්සේලා දැන ගන්න, රුපියල් 70ට, 80ට තිබුණු ලින්නා මාළු අද රුපියල් 220 දක්වා උඩට ගිහිල්ලා තිබෙන්නේ ලින්නා මාළු ටික අරගෙන මේ කර්මාන්තශාලාවල ටින් මාළු නිෂ්පාදනය කරන නිසායි. ඒක කුඩා ධීවරයින්ට තිබෙන විශාලම සම්පතක්.

මේ සියලු දෙනාම ආණ්ඩුවේ ආර්ථිකය ටින් මාළු කර්මාන්තශාලාවකින් විග්‍රහ කරනවා. මෙවැනි අයගේ ආර්ථික විග්‍රහ තමයි පත්තරවල තිබෙන්නේ. සතිපතා පළ කරන ජාතික පුවත් පතක "ගුරුදා විග්‍රහය" කියන කොටසකින් තමයි මෙහෙම කියන්නේ. මම මේ වාගේ මිනිස්සුන්ට හිනා වෙනවා. ඒ වාගේම මෙවැනි අය ගැන ඉතාමත්ම කනගාටු වෙනවා. මම ඇත්තටම නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. එදා මම ඔබතුමාට දෝෂාරෝපණය කළ එකට මට සමා වෙන්න. මම දන්නේ නැහැ, ඒක මේ වගේ පත්තරයක තිබුණු එකක් කියලා. මම හිතුවේ කොහේ හරි තිබෙන කඩමාල්ලක් උස්සා ගෙන ඇවිල්ලා කියවනවා කියලා. නමුත්, මේ වාගේ ජාතික පුවත් පතක් කිව්වාම ඕනෑ කෙනෙක් විශ්වාස කරනවා. නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා විතරක් නොවෙයි, මම වුණත් විශ්වාස කරනවා. ඔබතුමාගේ තාත්තා බොහොම ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. මම ආදරය කරපු මනුස්සයෙක්. එදා මම හිතුවා, එතුමාගේ පුතා ඇයි මෙහෙම කථා කරන්නේ කියලා. මට අද තේරෙනවා, පුතාත් එතුමා වාගේ තමයි කියලා.

ලංකා ධීවර සංස්ථාව ගැනත් කථා කළා. මේ වන කොට ලංකා ධීවර සංස්ථාව වෙළෙඳ සැල් 122ක් ආරම්භ කරලා තිබෙනවා. සතොස වෙළෙඳ සැල් 233කට අපි මාළු දමනවා.

Co-op City සියල්ලටම අපි මාළු දමනවා. ඒ වාගේම ආර්ථික මධ්‍යස්ථාන සියල්ලටම අපි මාළු දමනවා. මට තිබෙන ප්‍රශ්නය තමයි, මට ආණ්ඩුවෙන් ශත පහක්වත් ලැබෙන්නේ නැති එක. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, රුපියල් මිලියන 600ක් සතොසට දුන්නා. මේ සැරේත් රුපියල් මිලියන 500ක් දුන්නා. මට ශත පහක්වත් නැහැ. මම ශත පහක්වත් මහ භාණ්ඩාගාරයෙන් ඉල්ලන්නේත් නැහැ. මට ලංකා බැංකුවෙන් ණය ටිකක් දුන්නොත් ඇති. දැන් ඒක කර ගෙන යනවා. ඒ වාගේ මට ණය ටිකක් දුන්නොත් මම ඒ ණයත් ගෙවලා, එන අවුරුද්දේ මැද වන කොට ලාභත් ලබා ගන්නවා. ඒක නිසා දුප්පත් මිනිස්සුන්ට කන්න දෙන්න, අඳින්න දෙන්න තිබෙන මහ භාණ්ඩාගාරයේ සල්ලි මට අවශ්‍ය නැහැ. මට බැංකු ණයක් ලැබුණොත් මේ ඉතුරු ටිකත් මම කරනවා.

2010 මැයි වන කොට- අපි එනකොට- ධීවර සංස්ථාවේ සේවකයින්ට අර්ථසාධක අරමුදල් ගෙවා තිබුණේ නැහැ. රුපියල් 13,454,918ක් හිඟ තිබුණා. දැන් ඒවා ඔක්කොම ගෙවා අවසන්. විශ්‍රාම පාරිතෝෂික - gratuity - ගෙවා තිබුණේ නැහැ. රුපියල් 11,119,059ක් හිඟ තිබුණා. එතකොට ඔක්කොම රුපියල් 24,573,977ක් කාගේවත් ශත පහක ආධාරයක් නැතිව අපි ගෙවා තිබෙනවා. ඒ වාගේම 2010 මැයි මාසයේ සිට මේ දක්වා අපි සේවක අර්ථසාධක අරමුදල් ගෙවා තිබෙනවා, රුපියල් 69,702,340ක්. ඒ වාගේම ETF ගෙවා තිබෙනවා, රුපියල් 10,692,657ක්. Gratuity ගෙවා තිබෙනවා, රුපියල් 4,998,232ක්. මේ වන කොට අපි ඔක්කොම ගෙවා තිබෙනවා, රුපියල් 85,393,229ක්. 2010 මැයි සිට අපි සේවක ආපදා ණයත් ගෙවා තිබෙනවා, රුපියල් 17,600,000ක්. එතකොට අපි සේවකයින්ට ගෙවා තිබෙන මුළු මුදල රුපියල් 127,567,206ක්. අපි මේ මුදල් ගෙවා තිබෙන්නේ කාගේවත් ආධාර උපකාර නැතිවයි. ඒ ධීවර සංස්ථාවට තමයි අර මනුස්සයා -ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා- අර ඔච්චර දේවල් කිව්වේ. හොරකම් කරන කොට සංස්ථා මේ තරම් දියුණු වනවා නම්, හොරකම් කරන්න කියලා මම කියනවා. ඇයි ඒක අලුත්ම ආර්ථික න්‍යායක් නේ.

ලංකා ධීවර සංස්ථාවේ ලාභ-අලාභ බලන්න. 2009 වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාවේ අලාභය රුපියල් 103,889,475ක් වුණා. 2010 දී රුපියල් 59,423,908ක් දක්වා අපට මේ අලාභය අඩු කර ගන්නට පුළුවන් වුණා. 2011 වන කොට නැවතත් මේ අලාභය රුපියල් 68,969,869කට වැඩි වුණා. ඒ වුණත් මේ අවුරුද්දේ ජූනි වන කොට අපි මේ අලාභය රුපියල් 9,561,000කට අඩු කර ගත්තා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! Hon. Minister, you have two more minutes.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නෙක් අද කථා කළේ නැහැ නේ. ඒ නිසා වෙලාව ඉතුරු වෙලා ඇති. මට තව පොඩි වෙලාවක් දෙන්න.

ඒ විධියට අද ලංකා ධීවර සංස්ථාව මේ තරම් විශාල ප්‍රගතියක් ලබා තිබෙනවා. අපි අලාභත් අඩු කර ගෙන, ඒ වාගේම වෙළඳ සැලුත් වැඩි කරලා තිබෙනවා. අපි සේවකයෝ වැඩියෙන් ගත්තා ලු. වෙළඳ සැල් 121ක් විවෘත කරන කොට අලුතෙන් සේවකයෝ ගන්න ඕනෑ. ඒ සඳහා හැම දිස්ත්‍රික්කයකින්ම අපි සේවකයින් ගත්තා. සේවකයෝ ගත්තේ ඒ ඒ පළාත්වල මන්ත්‍රීවරුන්ගෙන්. මම කවුරුවත් පිට පළාත්වලට යැව්වේ නැහැ.

ඒ විතරක් නොවෙයි, පසු ගිය දවස්වල විශාල වශයෙන් මාළු ගොඩ ගහන්න පටන් ගත්තා. මාළු ගොඩ ගහන්න පටන් ගත්තාම මිනිස්සුන්ට මාළු විකුණා ගන්න බැරි වුණා. සමහර මාළු කිලෝග්‍රෑම් එකක් රුපියල් 70ට, 80ට වඩා වුණේ නැහැ. මොකද වුණේ? එදා වහාම මම ලංකා ධීවර සංස්ථාවට කථා කරලා, අතිගරු ජනාධිපතිතුමාටත් කථා කරලා මහජන බැංකුවෙන් රුපියල් මිලියන පහක් ඉල්ලා ගත්තා. හැබැයි ඒකත් දීලා තිබෙන්නේ සියයට තිහක පොලියකට, OD එකක්. අතිගරු ජනාධිපතිතුමා කියලාත් එහෙමයි මුදල් ලැබුණේ. ඒ මුදල අරගෙන ලංකාව පුරාම ඉන්න අහිංසක ධීවරයින්ගෙන් ඉහළ මිලකට අපි මාළු මෙට්‍රික්ටොන් 280ක් ගත්තා. එහෙම අරගෙන ඒ මිනිස්සුන්ව බේරා ගත්තා. ඔවුන් බේරා ගැනීම සඳහා අපට රුපියල් මිලියන 170ක් විතර වැය වුණා. මාළු මෙට්‍රික්ටොන් 150ක් අපි උතුරෙන් ගත්තා. ගරු සරවනපවන් මන්ත්‍රීතුමනි, මතක තියා ගන්න. ඒ වාගේම තවත් මාළු මෙට්‍රික්ටොන් 80ක් අපි නැඟෙනහිර පළාතෙන් ගත්තා.

අපි ධීවරයින්ට නොයෙක් සහනත් ලබා දුන්නා. පසු ගිය කාලයේ මේ රජය "දියවර දිරිය" කියලා සියයට හතරක පොලියකට ණය යෝජනා ක්‍රමයක් ඇරඹුවා. ඒ පොලිය ආණ්ඩුවෙන් ගෙව්වා. ඒ පොලිය ගෙවන්න ගිය අවුරුද්දට විතරක් ආණ්ඩුව වියදම් කළා, රුපියල් මිලියන 12.38ක්. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට 67,687 දෙනෙක් බැඳී තිබෙනවා. ඔවුන් මාසයකට ගෙවන්න ඕනෑ රුපියල් 300යි. අවුරුදු 60 ඉඳලා ඔවුන්ට රුපියල් 10,000ක විශ්‍රාම වැටුපක් ලැබෙනවා.

අපි ධීවර රක්ෂණ ක්‍රමයකුත් ආරම්භ කළා. 8,746 දෙනෙක් මේ රක්ෂණ ක්‍රමයට බැඳී තිබෙනවා. අපි ධීවරයින්ව ආදායම් බද්දෙන් නිදහස් කර ගෙන තිබෙනවා. ධීවරයින් ආදායම් බදු ගෙවන්නේ නැහැ. ධීවරයින්ට සියලුම බලපත්‍ර ගාස්තු නිදහස් කරලා තිබෙනවා. ජාතික ධීවර සම්මේලනය අපි හදා තිබෙනවා. ඒකේ සාමාජිකයෝ 92,406ක් ඉන්නවා. මාසිකව අපි රැස් වෙලා ඒ ඒ පළාත්වල ධීවරයින්ගේ ප්‍රශ්න සාකච්ඡා කරනවා.

එන අවුරුද්දේ මුල් භාගයේ ඉඳලා VMS - Vessel Monitoring System එකේ satellite මඟින් මාළු අල්ලන ක්‍රම, ඒ කියන්නේ මාසයක් තිස්සේ රස්තියාදු වෙලා මාළු අල්ලනවා වෙනුවට fishfinder එක අතට දීලා fishfinder එකෙන් දවස් තුනෙන් ඒ මාළු අල්ලන ක්‍රම අපි හොයා ගෙන තිබෙනවා.

ඒ වාගේම, වෙනත් මුහුදු සීමාවකට යනවා නම් නාවික සැතපුම් එකකට පෙර warning signals, ඒ වාගේම කුනාටු, වැහි එනවා නම් ඒ පිළිබඳ කාලගුණ වාර්තා ලබා ගන්න, හදිසි තත්ත්වයක් ඇති වුණොත් රතුපාට බොත්තමක් තද කරලා අහළ පහළ තිබෙන යාත්‍රා ගෙන්වා ගෙන ඒ ගොල්ලන්ව බේරා ගන්න පුළුවන් විධියට Vessel Monitoring System එක ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ඉන්ධන සහනාධාරය ගැනත් කියන්න ඕනෑ. බහුදින යාත්‍රාවකට අපි එක වාරයකට රුපියල් 31,200ක් ගෙවනවා. එක්දින යාත්‍රාවකට රුපියල් 19,200ක් ගෙවනවා. එක්දින යාත්‍රාවකට භූමිතෙල් සඳහා රුපියල් 9375ක් ගෙවනවා. මතක තියා ගන්න මේ සඳහා මාසයකට රුපියල් මිලියන 300කට වැඩි මුදලක් අපි වියදම් කරන බව. ඒ කියන්නේ අවුරුද්දකට රුපියල් බිලියන 3.6ක් ඉන්ධන සහනාධාරයට විතරක් ධීවරයින් වෙනුවෙන් මේ ආණ්ඩුව වැය කරනවා. මේ තරම් මුදලක් ධීවරයින් වෙනුවෙන් වැය කළේ කොයි ආණ්ඩුවද කියලා මම අහනවා. ගොවීන්ට දෙන සහනාධාරවලට අමතරව, වාර්ෂිකව රුපියල් බිලියන 3.6ක් - මිලියන 3600ක්, රුපියල් කෝටි 360ක්- ධීවරයින් වෙනුවෙන් අවුරුද්දකට ගෙවනවා. ඒ වාගේම මාළු ඇම බද්දෙන් නිදහස් කර ගත්තා. ඒ වාගේම "දිවි නැඟුම" යටතේ දොළොස් වර්ගයක ධීවර ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. පවුල් 18192ක් මේ සඳහා සම්බන්ධ වෙලා තිබෙනවා. අපේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ "දිවි නැඟුම" වැඩසටහන යටතේ ධීවර කර්මාන්තය ගොඩ නැඟීම සඳහා ගිය අවුරුද්දේ රුපියල් මිලියන 236ක් වෙන් කර දී තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, please wind up now.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මම කථාව අවසන් කරනවා. ඔබතුමාගේ උතුරු පළාතෙන් මම මගේ කථාව ඉවර කරනවා. ඔබතුමන්ලා දන්නවා, යුද්ධයට පෙර අපේ නිෂ්පාදනයෙන් සියයට 43ක් උතුරු පළාතෙන් ලබා දුන් බව. 2009 දී ඒ ප්‍රමාණය සියයට 7ට කඩා ගෙන වැටුණා. මේ අවුරුද්ද මැද වෙන කොට ඒ ප්‍රමාණය සියයට 18 දක්වා වර්ධනය කර ගන්නට අපට පුළුවන් වුණා. අපි යාපනය ice plants 9ක් දමලා තිබෙනවා. මන්නාරමේ 6ක් දමලා තිබෙනවා. මුලතිව්වල 1ක් දමලා තිබෙනවා. දෙකක් CFC. ඒ වාගේම මාළු අර ගෙන කොළඹට ගේන්න ධීවර සංස්ථාවෙන් freezer trucks 7ක් දමලා තිබෙනවා. ඒ නිසා තමයි අද යාපනයේ ධීවරයන්ට මාළුවලට සාධාරණ මිලක් ලැබෙන්නේ. අපි ඒ සියලුම වැඩ කටයුතු කරලා තිබෙනවා. ගිය අවුරුද්දේ නැඟෙනහිර මඩකලපුවට විතරක් අපි රුපියල් බිලියන 1.2ක් වියදම් කරලා තිබෙනවා. කල්මුණේ, මඩකලපුවේ හැම පළාතකම ඩයිනමයිට් ගහන ඒවා සම්බන්ධයෙන් නඩු 603ක් පවරා තිබෙනවා. ඒකෙන් 497ක් තිබෙන්නේ ඩයිනමයිට් සහ නීති විරෝධී දැල් ආම්පන්න සම්බන්ධයෙනුයි. මේවා සම්බන්ධයෙන් අධිකරණයට ගියාට පස්සේ විනිශ්චයකාරවරුන් රුපියල් 2000ක් දඩ ගහලා ඒ මිනිස්සු නිදහස් කරනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා දැන් අපි ධීවර පනත් සංශෝධනය කරලා මේවාට විරුද්ධව කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තවත් බොහෝ දේවල් කියන්න පුළුවන්. නමුත් මම කථාව අවසන් කරනවා. ජාතික වශයෙන් පමණක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් අපේ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

කර්මාන්තය පිළිගෙන තිබෙනවා. මෙවර ලෝක ආහාර, සෞඛ්‍ය සංවිධානයට අපි ගියා. එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ තමයි FAO එක තිබෙන්නේ. ඒක තමුන්නාන්සේලා දන්නවා. ඉදිරි අවුරුදු දෙක තුළ ධීවර කර්මාන්තය කර ගෙන යාම සඳහා FAO එකෙන් ලෝකයෙන් රටවල් පහක් Bureau එකට පත් කළා. Bureau එකට පත් කළ ඒ රටවල් පහෙන් ලංකාව එක රටක් බවට පිළිගත්තා. මුළු ආසියාවෙන්ම ලංකාව විතරයි තේරුණේ. ඒකට හේතුවක් තිබෙනවා. මෙතෙක් කලක් තේරුවේ එක්කෝ වියට්නාමය, එක්කෝ තායිලන්තය. තායිලන්තය සහ වියට්නාමය අපට වඩා හුඟක් ඉදිරියෙන් සිටියා. නමුත් පසු ගිය අවුරුදු දෙක ගත්තාම වියට්නාමයේ සහ තායිලන්තයේ ධීවර කර්මාන්තයේ වර්ධනයට වඩා අපේ රට වර්ධන වාර්තාවක් තැබූ නිසා තමයි ලංකාව තෝරා ගත්තේ. ඒ වාගේම රටවල් 13ක කෙටුම්පත් කමිටුවක් දැම්මා. ඒකටත් ලංකාව තෝරා ගත්තා. ඒ විතරක් නොවෙයි IOTC කොමිසමේ උප සභාපති ධුරය අපේ ලේකම්තුමියට දුන්නා. ඒ වාගේම ආසියා ෆැසිපික් කොමිසමේ උප සභාපති ධුරය දුන්නා. එයින් පැහැදිලි වන්නේ ලංකාවේ විතරක් නොවෙයි, විදේශ රාජ්‍යයන් පවා අපව පිළිගෙන තිබෙනවා කියන එකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ රටේ අය පිට කලාපවලට ගිහිල්ලා බලෙන් මත්ස්‍ය අස්වැන්න ලබා ගැනීම පිළිබඳව යුරෝපා කොමිසම එක්කත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගොල්ලෝ අපට ඒ පිළිබඳව warning signals දීලා තිබෙනවා. ජනවාරි මාසයේ 1වැනි දා ඉඳලා ඒ පිළිබඳව මම දැඩි ක්‍රියා මාර්ග ගන්නට තීන්දු කර තිබෙනවා. අපේ ධීවර පනතත් සංශෝධනය කරලා ඒ අයට දඩ ගහනවා විතරක් නොවෙයි, නැවියන්ගේ licences cancel කරලා වරායවලට ඇතුළත් වෙන්න නොදෙන්න කටයුතු කරනවා. අපි බේරුවල වරායට ගියාම එක් කෙනෙක් තහනම් මෝරෙක් අර ගෙන පෙන්නුවා. මම ඒ කට්ටියට ධීවර වරායට ඇතුල් වෙන එක වහාම තහනම් කළා. ඒ වාගේ දැඩි ක්‍රියා මාර්ග ගන්නවා. මම කියලා තිබෙන්නේ ජනවාරි මාසයේ ඉඳලා මේ වාගේ වැරදි වැඩ කරලා කිසිම ධීවරයකුට අමාත්‍යාංශයට එන්න එපා, කිසිම කෙනෙක් උදවු කරන්නේ නැහැ කියලායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තව බොහෝ දේවල් කියන්න තිබෙනවා. නමුත් ඔබතුමාට ඉතාමත්ම ස්තුතිවන්ත වෙමින් මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්, සියලුම ආයතන ප්‍රධානීන් ඇතුළු මට සහාය දුන් සියලු දෙනාටමත් අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත්, අතිගරු ජනාධිපතිතුමාටත් -මම ඉල්ලූ බොහෝ දේවල් ලබා දුන්නා. අය වැය ලේඛනයෙනුත් බොහෝ බදු දමලා මට මේ කර්මාන්තය ඉදිරියට ගෙන යන්නට උදවු කළා. - මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
The next speaker is the Hon. Eric Prasanna Weerawardhana. You have seven minutes.

[අ. භා. 5.27]

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේ මේ රටේ ජනතාවට ආහාර සපයන කෘෂිකර්ම, ගොවිජන සේවා සහ වනජීවී, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන යනාදී අමාත්‍යාංශවල වැය ශීර්ෂ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම පිළිබඳව මා ඉතාමත් සන්තෝෂ වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අතුරින් මා පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ එන කිරි සම්පත පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වනවා. මහින්ද චින්තනය සහ මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ යටතේ, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් එකතු වෙලා අද අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 30ක් සපුරාලන්න හැකි මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම 1977 අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 70ක් අපේ රට තුළ නිෂ්පාදනය කළ බව මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. නමුත් ගහක් එක වර කපා දමන්න පුළුවන් වුණත් පැළයක් සිටුවා එය මහා ගසක් -වෘක්ෂයක් - බවට පත් කරන්න කාලාන්තරයක් යනවා. ඒ නැති කළ අපේ කිරි සම්පත නැවත ලබා ගන්න අද අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ සාර්ථකව වැඩ කටයුතු ක්‍රියාත්මක වීම පිළිබඳව මා සතුටු වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම කිරි පිටි මිලදී ගැනීම නිසා අද වන කොට ඩොලර් මිලියන 350ක පමණ මුදලක් මේ රටෙන් එළියට යනවා. අපි, අපේ රට තුළ කිරි නිෂ්පාදනය වැඩි කර ගත්තොත් ඒ මුදල අපේ රට තුළ ඉතිරි කර ගන්න පුළුවන්. ඒ වාගේම නොයෙකුත් ක්ෂේත්‍රවල රැකීරක්ෂා ලක්ෂ ගණනක් බිහි කර ගන්න පුළුවන්. ඒ වාගේම පෝෂණයෙන්, ගුණයෙන් ඉහළ හොඳ කිරි වීදුරුවක් අපේ ජනතාවට, අපේ දරු පරපුරට ලබා ගැනීමේ හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය සම්බන්ධයෙන්, ගව පාලනය සම්බන්ධයෙන් ඒ ගොවි ජනතාවට අභියෝග කිහිපයකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. ප්‍රධාන අභියෝගයක් තමයි ගව පාලනය කරන ගොවීන්ට තණ කොළ සපයා ගැනීමේ ප්‍රශ්නය. ජනගහන වර්ධනයත් එක්ක මේ ප්‍රශ්නය ඉතාමත් තදින් බලපා තිබෙනවා. කිරි ගොවීන්ට පාරවල්වල, අනුන්ගේ ඉඩම්වල පවා ගිහිල්ලා තණ කොළ සපයා ගන්න සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම මෙහි අනාගතය පිළිබඳව කල්පනා කළොත්, අපට ලොකු ගැටලුවක් තිබෙනවා. එනම්, මේ විධියට ගියොත් අනාගතයේ අපේ රටේ තරුණයන් මේ ගව පාලනය සඳහා යොමු වේවිද කියන ගැටලුව අපට මතු වෙනවා. ඒ කියන්නේ පාරවල් ගානේ ගිහිල්ලා, පාරවල් අයිනේ තිබෙන තණ කොළ, වෙනත් ඉඩම්වල තිබෙන තණ කොළ කපාගෙන, තණ කොළ මිටි ඔළුවේ තියාගෙන අරගෙන ඇවිත් ගව ගාල්වල ඉන්න ගවයන්ට කන්න දීලා මේ කටයුත්ත කරන එක අපේ තරුණයන්ට අභිමානවත් රැකියාවක් වන එකක් නැහැ කියා මා හිතනවා. ඒ විධියට ගියොත් ඒකට අපේ තරුණයෝ යොමු වේවිද කියන ගැටලුව තිබෙනවා. ඒ නිසා මහනුවර දිස්ත්‍රික්කය ඇතුළත ඒ තෙත් කලාපයේ තිබෙන අක්කර දහස් ගණනක් වන වගා නොකළ -පුරන්- කුඹුරු මේ ගව පාලනය සඳහා යොදා ගන්න කියා ඉල්ලා සිටිනවා. ඒක අපි දැනටමත් යෝජනා කරලා තිබෙනවා. මොකද, මහනුවර දිස්ත්‍රික්කය කියන්නේ කිරි ගව පාලනය සඳහා ඉතාමත් යෝග්‍ය දිස්ත්‍රික්කයක්. ඒ නිසා ඒ කුඹුරුවල CO-3 වැනි උසස් වර්ගයේ තෘණ වර්ග වගා කරලා ගව ගාලක් ඒ කුඹුරේ ඉහත්තාවේම හදලා අභිමානයක් තිබෙන ගොවි පොළක් වශයෙන් ඒ කිරි ගව පාලනය කරගෙන යාමේ හැකියාව තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මේ අවස්ථාවේ වී ගොවිතැන ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න කැමැතියි. අපේ ප්‍රදේශවල අක්කරයක වී අස්වැන්න දළ වශයෙන් බුසල්

20යි, 30යි. වියළි කලාපයේ අක්කරයකට වී බුසල් 120ක්, 150ක් ලැබෙන කොට අපේ පැත්තේ ලැබෙන්නේ 20යි, 30යි. ඒ වාගේම පූර්ණ කාලීනව මහන්සි වෙලා, තෙල් පොහොර ගහලා, ස්වාභාවික උවදුරු මොනවත් වුණේ නැත්නම් මේ ප්‍රමාණය බුසල් 50ක්, 55ක් දක්වා වැඩි කර ගන්න පුළුවන්. ඒ වාගේම කුඹුර කොටන්න, හාන්න, පැළ සිටුවන්න, පොහොර යොදන්න, ගොයම් කපන්න, මැෂින්වලට කුලී ගෙවීම්, වී ඇඹරුම් කුලී ගෙවීම් වැනි වියදම් ගත්තොත් රුපියල් 35,000ක විතර වියදමක් යනවා අස්වැන්න ලබා ගැනීම සඳහා. අපේ ගොවීන් එක්ක කථා කරලයි මා මේ ගණන් හදලා බැලුවේ. මේකෙදී ප්‍රවාහනය, කෑම බීම, ශ්‍රමය ගැන හිතන්නේ නැතිවයි මා මේ කියන්නේ. ඒ වාගේම කුඹුරු අක්කරයක් වගා කරලා උපරිම වී බුසල් 50ක් ලැබෙනවා කියා උපකල්පනය කළොත්, වී කිලෝවකට රුපියල් 55 ගණනේ ගණන් හදලා බැලුවොත්, රුපියල් තිස්හත්දහසක මුදලක් ලැබෙනවා. නමුත් ඒ විධියටම වෙන්නේ නැහැ. ඒ නිසා මහනුවර දිස්ත්‍රික්කය ඇතුළත තෙත් කලාපයේ වී ගොවිතැන් කිරීම ආර්ථික වශයෙන් පාඩුයි කියන කාරණය කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම උඩරට කලාපයේ මහනුවර දිස්ත්‍රික්කය තුළ ජනතාව වී ගොවිතැනට යොමු වුණේ කොහොමද? දකුණු ඉන්දියානු ආක්‍රමණත් එක්ක අපේ රාජධානි මාරු වෙලා, මාරු වෙලා ඇවිල්ලා උඩරට රාජධානිය නිර්මාණය වුණාට පස්සේ ඒ වාගේම පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආක්‍රමණත් එක්ක උඩ රටට මේ ජාතිය සීමා වුණාට පස්සේ, නොකා නොබී මැරෙන්නේ නැතිව ඉන්න මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට කුඹුරු ගොවිතැන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව තමයි ඒ ජනතාව කුඹුරු ගොවිතැන් කරන්න පටන් ගත්තේ. මේ සඳහා පස, දේශගුණය වාගේ දේවලින් බාධා ඇති වුණත් ඒ කාලයේ ඒ ගොවිතැන කිරීමට සිද්ධ වුණා.

අද වන විට අපි එකීය රටක්. අද අපේ රටට සුද්දන්ගේ බලපෑමක් නැහැ. ඒ ප්‍රශ්න, ආක්‍රමණ මොකුත් නැහැ. තිබුණු ප්‍රශ්නය වන දශක තුනක යුද්ධයත් අතිගරු ජනාධිපතිතුමා අවසන් කළා. ඒ නිසා අද "සහල් නැළිය" වාගේ ප්‍රදේශ අස්වද්දලා තිබෙනවා. මේ නිසා අද වී ගොවිතැනට හොඳ කලක් ගිහින් තිබෙනවා. ඉතාම හොඳ අවශ්‍ය නිෂ්පාදන රටට ලැබෙන නිසා මේ පුරන් කුඹුරු ඉඩම් ගව පාලනය සඳහා යොදා ගන්න කියලා මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා.

සාමාන්‍යයෙන් අක්කරයක ගවයන් 6 දෙනෙකු ඇති කරන්න පුළුවන්. එක ගොවිපොළකින් කිරි ලීටර් 50ක් හම්බ වෙනවා කියලා උපකල්පනය කළොත්, රුපියල් 2,500ක ආදායමක් දවසකට එනවා. ඒ අනුව මාසයකට රුපියල් 75,000ක් වැනි ආදායමක් ලබා ගන්න පුළුවන්. ඒ ගණන එන්නේ අඩුවෙන්ම ගණන් හදලා බැලුවොත්. අපේ ප්‍රදේශවල කුඹුරු වගා කරලා අවුරුද්දකටම රුපියල් 75,000යි ගන්න පුළුවන්. නමුත් ගව පාලනයෙන් මාසයකට රුපියල් 75,000ක් ගන්න පුළුවන්. අපි මේ පිළිබඳ කරුණු අපේ අතිගරු ජනාධිපතිතුමාට, අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට සහ පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාට ඉදිරිපත් කරලා pilot project එකක් විධියට ගව පාලන ව්‍යාපෘති හාරිස්පත්තුව, පූජාපිටිය ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම, කිරි ගව පාලනය කරන්න කැමැති නම් ලංකාවේ ඕනෑම කෙනෙකුට අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා විශාල ශක්තියක් ලබා දීලා තිබෙනවා. මේ ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට ගවයෙකු සඳහා රුපියල් 30,000ක් සහ ගව ගාලක් හැදීම සඳහා රුපියල් 35,000ක සහනාධාරයක් ලබා දෙනවා.

අවසාන වශයෙන් මා මේ කාරණය කියන්න කැමැතියි. අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධයෙන් එක එක විවේචන කරනවා. අද අපේ මිනිසුන් නඟා සිටුවන්නට ග්‍රාමීය යාන්ත්‍රණයක් අවශ්‍යයි. ධීවර වුණත්, කෘෂිකර්ම වුණත්, ගොවිජන සේවා සහ වනජීවී වුණත්, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන වුණත්, කර්මාන්ත හා වාණිජ කටයුතු වුණත් ඒ ඕනෑම දෙයක් ගම තුළට අරගෙන යන විට හොඳ අධීක්ෂණයක්, හොඳ තේරීමේ ක්‍රියාවලියක් තිබිය යුතුයි. මේ වැඩ පිළිවෙළ හැම අමාත්‍යාංශයකින්ම කරන්න ගියොත් හැමෝටම එකම ක්‍රියාව කරන්න වෙනවා. ඒ නිසා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා මේ වැඩ පිළිවෙළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කිරීම ගැන. අනාගතයේ පත්වන ඕනෑම ආණ්ඩුවකට මේ කාර්යය වැදගත් වෙනවා. මේ අමාත්‍යාංශ සියල්ලේම ක්‍රියාකාරකම් ගමට අරගෙන යන විට ඒ සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් අවශ්‍ය වෙනවා. මේ වැඩ පිළිවෙළ ගමට ගෙන යෑම වෙනුවෙන් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුති වන්ත වන අතර, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයටත් ස්තුතිවන්ත වනවා.

මහනුවර දිස්ත්‍රික්කයේ තෙත් කළාපවල කුඹුරු ගොවිතැන වෙනුවට ගව පාලනය කර ගෙන යන්න අවශ්‍ය කටයුතු සලස්වලා, ඒ ශක්තිය ඒ ජනතාවට ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.35]

**ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මට විනාඩි 6ක කාලයක් හෝ ලබා දීම පිළිබඳව.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම සාක්ෂාත් කර ගන්නට එතුමා විසින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනයේ කෘෂිකර්ම, ගොවිජන සේවා සහ වනජීවී සහ පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ කථා කිරීමට ලැබීම-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Mr. Deputy Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair*

**ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)

ගරු සභාපතිතුමනි, ඈත අතීතයේ ඉඳලාම ලංකාවේ දියුණු කෘෂි කර්මාන්තයක් තිබුණා. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ තිබුණේ යැපුම් කෘෂි කර්මාන්තයක්. පසුව එය වාණිජ කෘෂි කර්මාන්තය දක්වා ව්‍යාප්ත වුණා. අතීතයේ අපේ රටේ දියුණු වාරි පද්ධතියක්

[ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා]

තිබුණා. එම වාරි ශිෂ්ටාචාරය ලෝකයේ අනෙකුත් රටවලට ආදර්ශයක් වුණා. ගරු සභාපතිතුමනි, වැව් බැඳි රාජ්‍යය නමින් හැඳින්වුයේ අපේ රටයි. අහසින් වැටෙන්නා වූ සෑම ජල බිඳක්ම උපයෝගී කර ගෙන රටේ ජීවත් වන්නා වූ ජනතාවට අවශ්‍ය ආහාර පාන සැකසීමට අතීතයේ සිට සිංහල රජ දරුවන් කටයුතු කළා.

අද කෘෂි කර්මාන්තයට අයත් අංශ කිහිපයක් අපට පෙන්වා දීමට පුළුවන්. විශේෂයෙන්ම ඒ අතර වී වගාව, අනෙකුත් බෝග වගාව, වැවිලි බෝග වගාව, පශු සම්පත් කටයුතු, ධීවර හා ජලජ සම්පත් කටයුතු, ඉඩම් හා වනාන්තර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 2011 වසරේදී අප රජය විසින් ශ්‍රම බලකාය පිළිබඳව සමීක්ෂණයක් සිදු කළා. එහිදී ලබා දුන් තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 33.7ක් වූ ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වෙලා තිබෙන්නේ කෘෂි කර්මාන්තයයි. ගරු සභාපතිතුමනි, රටක වෙසෙන ජනතාවගේ සුබ සාධනය, ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සහතික කිරීම මෙන්ම රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා වන මූලික අංශයක් ලෙස කෘෂිකර්ම අංශය හඳුන්වන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, කෘෂිකාර්මික ප්‍රදේශයක ජීවත් වන පුද්ගලයකු හැටියට කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ මා අත්දුටු ගැටලු රාශියක් තිබෙනවා. පාරම්පරික ගොවි මහතුන්ගේ දරුවන් වෙනත් රැකියාවලට යොමු වීම, කෘෂි කර්මාන්තයේ යෙදෙන්නන් තුළ දක්නට ලැබෙන උදාසීනභාවය, කෘෂි කර්මාන්තය නංවාලීමට ප්‍රමාණවත් තරම් යටිතල පහසුකම් නොලැබීම, නව තාක්ෂණික දැනුම ගොවි ජනතාවට නොතිබීම, ඵලදායී බීජ වර්ග හා රෝපණ ද්‍රව්‍ය හිඟකම, වගාව සඳහා යොදන පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය ඵලදායීතාවයෙන් තොරව යෙදවීම, කාබනික පොහොර ගැන ගොවි මහතුන්ගේ ඇති ආකල්ප, වගා අස්වනු ආරක්ෂා කර ගැනීමේ උපක්‍රමවල ඇති ගැටලු, අස්වනු වෙළෙඳ පොළට සැපයීමේදී භාවිත කරනු ලබන ක්‍රමවේදයේ අපහසුතා ඒ අතර වෙනවා. කෘෂි කර්මාන්තය මුහුණපාන මෙකී ගැටලු නිරාකරණය කිරීමට අපේ රටේ සිටි විවිධ පාලකයන් උත්සාහ ගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දූරදර්ශී නායකත්වය යටතේ, එතුමාගේ අත්දැකීම් උපයෝගී කර ගෙන එම ගැටලු විසඳන්න මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා. ඒ අනුව අපගේ රජය විසින් දස අවුරුදු ප්‍රතිපත්ති රාමුවක් ඉදිරිපත් කළා. ඒ අනුව දේශීය ආහාර සුරක්ෂිතතාව දේශීය ආහාර නිෂ්පාදනය මඟින් ඉටු කිරීමට කටයුතු කරනවා. මේ අනුව ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ වෙසෙන ජනගහනයට ඕනෑම වේලාවක හිඟයකින් තොරව ඔවුන්ගේ ආහාර පාන ගුණාත්මක ආකාරයෙන් දේශීයව ලබා දීමට අප රජය කටයුතු කරමින් සිටිනවා.

ලංකාවේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමට මෑත කාලීනව අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛව අප රජය ක්‍රියා මාර්ග රාශියක් ක්‍රියාත්මක කරනවා. ඉන් පළමු වැන්න ලෙස 2005 වසරේ අප රජය ගොවි ජනතාව වෙත ලබා දුන් පොහොර සහනාධාරය මට සිහිපත් කළ හැකියි. මේ වෙනුවෙන් රජය විශාල මුදලක් වැය කරනවා. විශේෂයෙන් මුල් අවධියේ එය වී වගාවට විශේෂ වූ අතර වර්තමානයේ අනෙකුත් බෝග වගාවන් කෙරෙහිද ව්‍යාප්ත වෙලා තිබෙනවා. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා අනුව වී නිෂ්පාදනය සඳහා රජයේ මූල්‍ය දායකත්වය මේ සභාවට ඉදිරිපත් කිරීමට මා කැමැතියි. ඒ ලේඛනය මා **සභාගත*** කරනවා.

ගරු සභාපතිතුමනි, 2011, 2012 මහ කන්නය ගැන කථා කළොත්, රජයේ පොහොර සහනාධාර මිල හා වෙළෙඳ පොළේ පවත්නා මිල පෙන්වා දීමට මා කැමැතියි. යූරියා පොහොර කිලෝ 50ක බෑගයක සාමාන්‍ය වෙළෙඳ පොළේ මිල රුපියල් 3,097ක් වෙනවා. එහෙත් අප රජයෙන් ගොවි මහත්වරුන් වෙත එය ලබා දෙන්නේ රු. 350ක් වැනි සුළු මුදලකටය. මේ සඳහා රජය සියයට 89ක මූල්‍ය දායකත්වයක් සපයනවා. ගරු සභාපතිතුමනි, ටීඑස්පී පොහොර සඳහා රාජ්‍ය මූල්‍ය දායකත්වය සියයට 89ක්ද එම්ඕපී පොහොර සඳහා සියයට 89ක මූල්‍ය දායකත්වයක්ද සපයනවා. මේ ආකාරයේ මූල්‍ය දායකත්වයක් සපයමින් තමයි ගොවි ජනතාවට රුපියල් 350ට පොහොර මිටියක් අපි ලබා දෙන්නේ.

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් මෙවන් සහනාධාරයක් ලබා දෙන කිසිම රජයක් ශ්‍රී ලංකා ඉතිහාසයේ නැහැ කියා මා විශ්වාස කරනවා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගොවි ජනතාවගේ දහදිය සුවඳ හඳුනා ගත් ජනනායකයකු බැවින් මෙවැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බව මට කියන්න පුළුවන්.

එපමණක් නොව රසායනික පොහොර භාවිතයට මෙන්ම කාබනික පොහොර භාවිතයටද ගොවියා යොමු කිරීමටද කටයුතු කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
කාලය අවසාන වී ඇත. තව මන්ත්‍රීවරු තුන් දෙනෙක් කථා කරන්න සිටිනවා.

**ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)
ගරු සභාපතිතුමනි, මගේ කථාවේ ඉතුරු කොටස මා **සභාගත*** කරනවා.

**[අ.භා.5.42]**

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු සභාපතිතුමනි, 2013 වර්ෂයේ අය වැය කාරක සභා අවස්ථාවේදී අද දින කෘෂිකර්ම, ගොවිජන සේවා හා වනජීවී, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කෙරෙන මේ මොහොතේ විශේෂයෙන්ම, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව - ඒ තුළ ඇති වී තිබෙන වර්ධනය, ප්‍රවර්ධනය පිළිබඳව- කථා කිරීමේදී අපි දකිනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ඉතිහාස ගත වන විශේෂ කාරණා කිහිපයක් මෙම අමාත්‍යාංශය තුළ සිදු කරන්නට යෙදුණු බව; කිසිම රජයකට -එක්සත් ජාතික පක්ෂ රජයකට හෝ අනෙකුත් රජයන්වලට- කරන්නට බැරි වුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර තිබෙන බව. දියර කිරි මිල වැඩි කරන්නට බැහැයි කියන තත්ත්වයක් තිබියදී රුපියල් 30ට තිබුණු කිරි මිල වැඩි කර තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ රජයත් එක්ක එකතු වෙලා ජනතා විමුක්ති පෙරමුණ පරිවාස රජයක් හදා ගෙන, අනුර කුමාර දිසානායක මහත්මයා එහි කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය භාර ගත්තා. එදා අනුර දිසානායක මහත්මයාට කර ගන්න බැරි වුණු වැඩ සටහන් රාශියක් තිබුණා. රජයෙන් පිටත සිටියදී එතුමා අඩු පාඩු දැක්කත්, ඒවා වෙනස් කරන්නට ඕනෑය කියා සිතුවත් අමාත්‍යාංශය භාර ගත්තාට එතුමාටත් කර ගන්නට බැරි වුණු වැඩසටහන් රාශියක්, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මෙම පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර තිබෙනවා. අපි මේ දොස් කියනවා නොවෙයි. සමහර වෙලාවට නිලධාරින්ගේ වේවා, දේශපාලන අධිකාරියේ උනන්දුවක් නැතිකම වන්නට පුළුවන්, ඒ අවස්ථාවේ රටට අවශ්‍ය කරන කිරි නිෂ්පාදනය වැඩි කර ගන්නට මේ රටට එළදෙනුන් ගෙන ඒමේ විශාල බාධාවක් තිබුණා. නමුත් අති ගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ විශේෂ මැදිහත් වීමත් එක්ක, ගරු තොණ්ඩමන් අමාත්‍යතුමාගේ මැදිහත් වීමත් එක්ක එයට තිත තබලා, අප ඒ එළදෙනුන් ලංකාවට ගෙන එන්නට කටයුතු කළා. මේ වන විට ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. ඉදිරියට තවත් එය ශක්තිමත් කර මේ රටේ දේශීය කිරි ගොවියා නගා සිටුවන වැඩ පිළිවෙළට තවත් ශක්තියක් දෙන්නට හැකියාව ලැබී තිබෙනවා. ඒ ගැන අප එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ කිරිපිටි නිෂ්පාදනය තුළ පසු ගිය කාලයේ මාෆියාවක් තිබුණා. මේ අය කිරිපිටි මිල ඉහළ දමන අවස්ථාවලදී මේ රටේ පාරිභෝගික ජනතාව විශාල අපහසුතාවකට මුහුණ දුන්නා. ඒ වාගේ වෙලාවක අතිගරු ජනාධිපතිතුමා සෘජු තීන්දුවක් අර ගෙන පිටරටින් ආනයනය කරන කිරිපිටිවල බදු වැඩි කර දේශීය කිරි ගොවියා ශක්තිමත් කරන්නට ගෙන යන වැඩ පිළිවෙළ ගැන අප පැහැදිලිවම එතුමාට ස්තුතිවන්ත වෙනවා. එයට හේතුව මෙයයි. මීට වසර දෙකකට කලින් දේශීය කිරි අවශ්‍යතාවයෙන් සියයයට 20ක් පමණයි අප රට තුළ නිෂ්පාදනය වුණේ. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයත් එක්ක අද එය සියයට 42 දක්වා වැඩි කරන්නට හැකියාව ලැබී තිබෙනවා.

මේ වැඩ පිළිවෙළ ඉදිරියට ශක්තිමත් කර ගෙන ගියොත් 2015 වනවිට කිරිපිටි ආනයනය සම්පූර්ණයෙන්ම නවත්වා මේ රටේ කිරි අවශ්‍යතාව -පිටිකිරි නොවෙයි. විශේෂයෙන්ම දියර කිරි- සම්පූර්ණයෙන්ම සපුරා ලන්නට පුළුවන් වෙනවා. ජාත්‍යන්තරයේ අනෙක් රටවල පිටිකිරි එතරම් භාවිතා කරන්නේ නැහැ. නමුත් අපේ ජනතාවට අප එය පැහැදිලි කර දෙන්නට ඕනෑ. මේ රටේ ජනතාව යම් මට්ටමකින් මුළා වෙලා ඉන්නවා ද කියා අපට හිතෙනවා. මොකද මේ පිටිකිරි පස්සේ යන නිසා. ඊට වඩා පෝෂ්‍යදායි වන්නේ, දරුවන්ට වැදගත් වන්නේ දියර කිරි කියන එක අප මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

ඒ වාගේම කුකුළු බිත්තර මිල පාරිභෝගිකයන්ට දරා ගන්නට බැරි තරමට ඉහළ ගිය වෙලාවක අපට රජයක් විධියට මැදිහත් වෙලා පාරිභෝගිකයාට ඔරොත්තු දෙන තත්ත්වයකට බිත්තර මිල ගෙන එන්නට හැකියාව ලැබුණා. එදා වසා තිබුණු LANLIB ආයතනය තුළ ගිය වසරේ පමණක්-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
කථාව අවසාන කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න. ගිය වසරේ පමණක් කුකුළු පැටව් පන්ලක්ෂ හැත්තෑදහස් එකසිය හතළිහක් අභිජනන මධ්‍යස්ථානය තුළ - LANLIB ආයතනය තුළ - නිෂ්පාදනය කර , ඒ පැටව් ගොවි ජනතාවට, ඒ නිවාසවලට ලබා දීම තුළ විශාල විධියට බිත්තර අවශ්‍යතාව සපුරා ගන්නට හැකියාව ලැබුණා. එදා කුකුල් මස් අවශ්‍යතාවත් සපුරා ගන්නට අප කුකුල් මස් විශාල වශයෙන් ආනයනය කළා. ඒ සඳහා විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අපෙන් වැය වුණා. අද එය අත්හිටුවීමට පුළුවන්වෙලා තිබෙනවාය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී පැහැදිලිව කියා සිටිනවා.

අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු බොහොම බුද්ධිමත්ව, අවබෝධයෙන් යුතුව කථා කරන කොට, සමහර අය ඒ ජනතාව ගැනවත් වගකීමක් නැතිව කථා කළා. රජය කරන හොඳ දේවල් ගැන අප කියන්න ඕනෑ. ඒ වාගේම අඩු පාඩුවක් තිබෙනවා නම් ඒකත් කියන්න ඕනෑ. නමුත් රජය අද වැඩි වශයෙන් රටට වැඩදායි වැඩ කර තිබෙන නිසා තමයි සෑම මැතිවරණයකින්ම විශිෂ්ට ජයග්‍රහණ ලබන්නේ. අද පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය තුළින් විශේෂ වැඩ කොටසක් සිද්ධ වෙලා තිබෙන බව මතක් කරමින්, ගරු සභාපතිතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 5.48 ]

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனி)
(The Hon.Victor Antony)
ගරු සභාපතිතුමනි, බොහොම අඩු කාල වේලාවක් මට තිබෙන්නේ. මට මේක කලින් දැන්වුවා නම් මම මේ වේලාව අර වටිනා කථාවක් කරපු ගරු ඇමතිතුමාට දෙනවා. කොහොම නමුත් ගරු සභාපතිතුමනි, ඇට නැති දිවට ඕනෑ විධියට වචන හරවන්න පුළුවන් කියලා කියනවා. ඒ මොනවා කිව්වත්, අපේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා නොබියව ධීවර අමාත්‍යාංශයේ කටයුතු කළාය කියන එක අප සන්තෝෂයෙන් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. එතුමාට තිබුණේ සුළුපටු අභියෝග නොවෙයි. ඒ සියලු අභියෝග ජයග්‍රහණය කර ගෙන එතුමා අද ධීවර අමාත්‍යාංශය හරිහැටි ක්‍රියාත්මක කරනවාය කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම තහනම් දැල් ප්‍රශ්නයේදී එතුමා සෘජුව සිටියා. එතුමා ධනපති මුදලාලිලාට නැමුණේ නැහැ. එතුමා දුප්පත් ධීවරයා උදෙසා කටයුතු කළා. ඒ නිසා මෙවර විශාල අස්වැන්නක් ලැබෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. ලයිලා දැල් කියන්නේ පොඩි මුදලාලිලා නොවෙයි ලොකු මුදලාලිලා පාවිච්චි කරන එකක්. නමුත් එතුමා ලයිලා දැල් පවා තහනම් කර දැම්මා. සුරුක්කු තහනම් කළා. තල්ලු දැල් තහනම් කළා. කුඩු දැල් තහනම් කළා. ඒක හොඳ ජයග්‍රහණයක් කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මට තිබෙන්නේ ඉතාම සුළු වෙලාවක් වුණත් මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ඒක තමයි අද ඉරනවිල ප්‍රදේශයේ පවතින මාදැල් ප්‍රශ්නය. එදා තිබුණු මාදැල් නොවෙයි අද තිබෙන්නේ. එදා සිටි ජනගහනය නොවෙයි අද ඉන්නේ. අද එහි ධීවර පවුල් 3,000ක් ඉන්නවා. එදා හිටියේ ධීවර පවුල් 50යි. අද ධීවර ජනතාව විතරක් 3,000ක් සුළු ධීවර ආම්පන්න තියාගෙන ඉන්නවා. මේ 3,000 කොහොමද මාදැල්

[ගරු වික්ටර් ඇන්ටනි මහතා]

අදින කොට රස්සාව කරන්නේ? මාදැල්, පනතකින් ආව එකක් බව ඇත්තයි. නමුත් අප ආරක්ෂා කරන්න ඕනෑ සුළු ධීවරයායි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. ඒක නිසා සුළු ධීවරයා ආරක්ෂා කිරීම සඳහා ඒ කටයුත්තත් ඉෂ්ට කර දෙන ලෙස මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට මගේ කෙටි කාලය තුළ මතක් කළ යුතුයි අප කරන්න ඕනෑ කාරණා තුනක් පිළිබඳව. ගරු ඇමතිතුමනි, මගේ පෞද්ගලික මතයේ හැටියට පළමුවෙනි කාරණය තමයි ධීවරයා ශක්තිමත් කිරීම. ඒ කියන්නේ ධීවර ජන ජීවිතය ශක්තිමත් කිරීම. ඒක තමයි මේ අමාත්‍යාංශයේ පළමුවෙනි කාරණය හැටියට මා දකින්නේ. දෙවැනි කාරණය හැටියට මා විශ්වාස කරන්නේ මත්ස්‍ය සම්පත ආරක්ෂා කිරීමයි. ඒ කියන්නේ මුහුදු සම්පත් ආරක්ෂා කිරීම. මත්ස්‍ය සම්පත නැත්නම් ධීවරයාට කවදාවත් ජයග්‍රහණය කරා යන්න බැහැ. තුන්වැනි කාරණය තමයි මාළු කන පාරිභෝගික ජනතාවට ලාභයට, පහසුවට හොඳ මාළු ලබා දෙන වැඩ පිළිවෙළක් ඇති කිරීම. මේ කාරණා තුළ තමයි අප පැවතෙන්න ඕනෑ කියන එකයි මා විශ්වාස කරන්නේ. මේ කාරණා තුන අපට හරියට කරන්න පුළුවන් නම් මා හිතන්නේ ධීවර අමාත්‍යාංශයෙන් අංග සම්පූර්ණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි. ඔබතුමා මේ කටයුතු සාර්ථකව කරගෙන යන එක ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා.

ගරු සභාපතිතුමනි, සමහර අය නොයෙක් කථා කිව්වා. කට කැඩුණු කථා කියමින්, අසත්‍ය වාර්තා ඉදිරිපත් කළා. ඒවා සේරම සත්‍ය වාර්තා නොවෙයි. ඒ වාර්තා අරගෙන පහර පිට පහර ගැහුවා. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වැටිලා, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයක් නැහැ කියන හැටියටයි එතුමන්ලා කථා කළේ. නමුත් සත්‍ය වශයෙන්ම මත්ස්‍ය සම්පත අතින් ලෝකයේ ඉහළම තැනක අද ලංකාව ඉන්නවාය කියන එක අප සන්තෝෂයෙන් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. එවැනි තත්ත්වයක් තුළ අප ඉතාම සන්තෝෂ වෙනවා, අද ධීවර ජන ජීවිතය ඉතාම හොඳ තත්ත්වයකට ඇවිත් තිබෙනවා. එදා අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණු ආකාරයට අද ඒ දුප්පත්, අහිංසක ධීවරයා ආරක්ෂා කරගෙන කටයුතු කරනවා. අප සුබ පතනවා ගරු ඇමතිතුමාට. ලබන අවුරුද්ද වෙන කොට මේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ඉතාම වාසනාවන්ත විධියට ඉහළම තත්ත්වයකට ගෙන එන්නට එතුමාට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[අ. භා. 5.52]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

ගරු සභාපතිතුමනි, මට ලැබුණේ විනාඩි කීපයක් වුණත් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා ඒ විනාඩි කීපය හරි ලැබීම පිළිබඳව. අදහස් දැක්වූ හැම කථිකයකුටම අපේ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ඉතාම පැහැදිලිව, නියම විධියට උත්තර දුන්නා.

ගරු සභාපතිතුමනි, මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව අතිගරු ජනාධිපතිතුමා, විශේෂයෙන් ගරු බැසිල් රෝහණ රාජපක්ෂ ඇමතිතුමා අපේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ පවතින විසිතුරු මත්ස්‍ය කර්මාන්තය පිළිබඳ අවධානය යොමු කරලා එම කර්මාන්තය වැඩිදියුණු කරන්න අවශ්‍ය වන්නා වූ සියලු පියවර ගෙන තිබෙනවා. පවතින බාධක හඳුනා ගෙන ඉදිරි කාල සීමාව තුළ එම කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වන විශාල කාර්ය භාරයක් අද වන විට අපි කරගෙන යනවා. අලුතින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන අයකුට පටන්ගැන්මේදී රුපියල් 37,500ක් දීලා, දැනටමත් කර්මාන්තය කරගෙන යන කෙනකුට රුපියල් 75,000ක් වැනි මුදලක් ලබා දීලා ඉදිරි අනාගතයේදී ලංකාව ලෝකයට විසිතුරු මත්ස්‍යයන් සපයන මධ්‍යස්ථානයක් බවට පත් කරන්න අවශ්‍ය ප්‍රතිපාදන සපයලා, මෙම කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. ධීවර අමාත්‍යාංශයට විතරක් තනිවම මේ කටයුතු කරගෙන යන්න බැහැ.

මේ සඳහා ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ, ඒ වාගේම ආරක්ෂක අංශ ඇතුළු අනෙකුත් අංශවල සහයෝගය අවශ්‍යයි. ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා, නිලධාරි මහත්වරුන් ඇතුළු අපි ඔක්කෝම එකතු වෙලා, පැවැති ප්‍රශ්න සම්බන්ධයෙන් සාකච්ඡා කරලා එකී ගැටලු නිරාකරණය කරගෙන ඉදිරි කාල සීමාව තුළ මෙම කර්මාන්තයේ දියුණුව උදෙසා විශාල වැඩ කොටසක් කරගෙන යනවා.

ගරු සභාපතිතුමනි, එම කර්මාන්තය අද ලෝකයේ හැම රටකම වාගේ ඉතාම ආකර්ෂණීය කර්මාන්තයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ මත්ස්‍ය සම්පත, ඒ වාගේම අපේ පැළෑටි නොයෙක් හේතූන් නිසා -අපේ නීති රීතිවල තිබෙන නොයෙක් අඩු පාඩු නිසා- පිට රටවලට ගෙන ගිහිල්ලා එම මත්ස්‍යයන්, එහෙම නැත්නම් ඒ පැළෑටි වෙනත් රටවලට විකුණනවා. අපේ රටේ තිබුණු නීති රීති නිසා එම පැළෑටි, එහෙම නැත්නම් මත්ස්‍යයින් අපේ ස්ථානවල බෝ කරලා, වැඩිදියුණු කරලා විදේශවලට යවන්න පුළුවන්කම තිබුණේ නැහැ. නමුත් ඒ තිබුණු බාධක ඉවත් කරලා, අවශ්‍ය නීති රීති ගෙනැල්ලා ඊට අවස්ථා ලබා දීමට මේ වන විට කටයුතු කර තිබෙනවා. ඒ මඟින් ඉදිරි කාල සීමාව තුළ හොඳ ආදායමක් අපේ රටට ලබාගැනීමේ හැකියාව ඇති වෙනවා. ඒ වාගේම, ඒ මඟින් තරුණ තරුණියන් රාශියකට රැකියා සැපයීමේ අවස්ථාවද සැලසෙනවා. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය අනෙක් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණයක් ඇතිව තමයි කරගෙන යන්න ඕනෑ. මොකද, අපට තනිව කටයුතු කරන්න බැහැ.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශයට සම්බන්ධ නොවුණත්, මා මිත්‍ර ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමාත් මගේ දිස්ත්‍රික්කයට අල්ලපු දිස්ත්‍රික්කයේ සිටින නිසා විශේෂ කාරණයක් කියන්න මා කැමැතියි. එතුමා කියපු පරිදි අපේ රටේ අලි ගහනය 7,000ක්, එහෙම නැත්නම් 8,000ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා; ඉඩම් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. අද අලින්ට වාසය කිරීම සඳහා, කෑම සඳහා අවශ්‍ය කරන පරිසරය හම්බ වෙලා තිබෙනවා. අතීතයේ මේ රටේ තිබුණා ඇත් ගාල්. ඇත් ගාල්වලින් අලි අල්ලලා, හීලෑ කරලා, හාම්පුතුන්ට ලබා දීලා, පෙරහැර වැනි සංස්කෘතික කටයුතු සඳහා ආගමික සිද්ධස්ථානවලට ලබා දුන්නා. 1970-1977 කාලය තුළ කලුගල්ල ඇමතිතුමා හිටපු කාලයේ වන අලි අල්ලලා, හීලෑ කරලා ඒ ඒ පුද්ගලයන්ට ලබා දුන්නා. අද ඒ අලින්ගෙන් 100ක් විතර තමයි ඉතිරි වෙලා ඉන්නේ. ඒ අලිත් දැන් වයසට ගිහින් තිබෙන නිසා මම යෝජනා කරනවා, අද ඉන්න 7,000ක් විතර වන අලින්ගෙන් යම් ප්‍රමාණයක් හීලෑ කරලා ඒ අලි නඩත්තු කරන්න පුළුවන් පන්සල්වලට, පල්ලිවලට, කෝවිල්වලට, එහෙම නැත්නම් විවිධ පුද්ගලයන්ට ලබා දීලා අනාගතයේදී අපේ රටේ පෙරහැර වැනි කටයුතු සඳහා යොදාගැනීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා.

මොකද, දැනට ඉන්න හීලෑ අලි ප්‍රමාණය මිය ගියාට පස්සේ තවත් කාලයක් යන කොට පෙරහැරවලට කැලයෙන් අලි අල්ලලා යවන්නත් බැහැ. පෙරහැරවලට යවන්න වෙන්නේ මිනිසුන් විසින් ඔසවාගෙන යනු ලබන, අලියකුගේ ආකෘතියක් සහිත කුඩුවක්.

ඒ නිසා පවතින නීති රීති වෙනස් කරලා හෝ අපේ රටේ අලි හදන්නට කැමති, අලි නඩත්තු කරන්න පුළුවන් අයට, රැකබලා ගන්න පුළුවන් අයට මේ අලි ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා. විශේෂයෙන්ම අලි - මිනිස් ගැටුම නිසා බොහෝ අලි ආබාධවලට ලක් වෙනවා; මරණයට පත් වෙනවා. ඒ වාගේම කෝච්චිවල හැපිලා, කෑම නැතිව, වතුර නැතිව, වළවල්වල වැටිලා නිකම් මැරිලා යනවා. ඊට වඩා හොඳයි ඒක කරන්න පුළුවන් අයට මේ අලි ලබා දීලා, නැතිවෙලා යන අලි සම්පත රැක ගන්න එක. අපි මේ ගැන නොබියව කථා කරන්න ඕනෑ. අපි මේක රටට, ජනතාවට කියන්න ඕනෑ. මොකද මේ අලි ගැන කඳුළු හෙළන NGO තිබෙනවා. ඔවුන් ඒවා ගැන විරුද්ධව පත්තරවලට ලියනවා; කථා කරනවා. නමුත් ඒවායේ කිසිම සත්‍යතාවක් නැහැ. කොටින්ම කියතොත් කැලේ කන්න බොන්න නැතිව අලියෙක් ඉන්නවා නම් මේ එක සංවිධානයක්වත් ගිහිල්ලා ඔවුන් ගැන සොයා බලන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ ගොල්ලන් අඩුම තරමින් මොනම දෙයක්වත් කරන්නේ නැහැ. පිට රට NGOවලින් එන සල්ලිවලින් බොරුවට පත්තරේට ලියවිල්ලක් දාලා ඒ ගොල්ලන්ගේ ගණන අරගෙන කට වහගෙන ඉන්නවා.

ඒ නිසා ඔබතුමාගේ අවධානයට මම මෙය යොමු කරනවා. අතිගරු ජනාධිපතිතුමා මේ විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඉදිරි කාලසීමාව තුළ මේ රටේ වැනසීගෙන යන අලි සම්පත ආරක්ෂා කරගෙන, අපේ සංස්කෘතික උරුමයන් ඒ වාගේම අපේ ආගමික කටයුතුත් හරියාකාරව කරගෙන යන්නට අවස්ථාව සැලසේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා.

අපි අද අලි වැටවල් හරි ගස්සා ගෙන යනවා. මේ අවුරුදු ගණන තුළ අපි හදපු අලි වැටවල් දිහා බැලුවොත් ලංකාව වට කරලා ගහන්න පුළුවන් ප්‍රමාණයේ අලි වැටවල් සංඛ්‍යාවක් අද වන කොට ඉදි වෙලා තිබෙනවා. නමුත් ඒවායේ ප්‍රතිඵල ලබා ගැනීමට අපිට හැකියාවක් ලැබිලා නැහැ. මොකද අලි වැටවල් විතරක් ගහලා මේ අලි - මිනිස් ගැටුම අවම කිරීමට හැකියාව ලැබෙන්නේ නැහැ. මොකද එදා පටන් ගත්තු මහවැලියේ අවිධිමත් ක්‍රම නිසා තමයි මේ අලි - මිනිස් ගැටුම උග්‍රවෙලා තිබෙන්නේ කියන කාරණය අද නොදන්නා දරුවෙක් පවා නැති තරම්.

විශේෂයෙන්ම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් විශාල අලි ප්‍රමාණයක් ඉන්නවා. ඒ නිසා ඉදිරියේදී අපිටත් ඒ අලි නිසා කරදර ඇති වෙන්න පුළුවන්. ඒ කරදර නැති කරන්න කටයුතු යොදන්න කියන එකයි මා ඉල්ලා සිටින්නේ. මම සූදානම් කරගෙන ආව කථාව සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කරන්න වෙලාව නැති නිසා එය **සභාගත*** කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිමින් මා නවතිනවා. ස්තුතියි.

**සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:**
**சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::**
Rest of the speech tabled:

මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව ඉදිරිපත් වන හත්වන අය වැය විවාදයට මා හට අදහස් දැක්වීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සලකනවා. 2012 වසර තුළ දී බාහිර හා අභ්‍යන්තර කම්පන කිහිපයකට මුහුණු දෙමින් ලෝකයේ දියුණු රටවලට සාපේක්ෂව ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කර ගන්නට හැකි වූ වසරක් ලෙස මෙම වසර හඳුනාගත හැකියි. උදාහරණ ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථික වර්ධන වේගය සියයට 2.4% ලෙස වාර්තා වනවා. අනිකුත් යුරෝපා රටවල ආර්ථික වර්ධන වේගය ඒ හා සමාන මට්ටමක තිබිය දී අපගේ ආර්ථික වර්ධන මට්ටම 6.8ක මට්ටමක පවත්වා ගැනීමට අපට හැකියාව ලැබී තිබෙන බව සඳහන් කළ හැකියි. එසේම දිගු කාලීනව ආර්ථික වර්ධන ඉලක්ක සපුරා ගැනීමට මහින්ද චින්තන පස් අවුරුදු සැලැස්ම දෙවන වරට මේ අය වැයත් එක්ක ඇරඹෙනවා. ආර්ථික වර්ධන ඉලක්ක කරා යාම එහි අරමුණයි. උදාහරණ වශයෙන් 2013 වසර දී අපේක්ෂිත ආර්ථික වර්ධන ඉලක්කය 7.5%ක් ද 2014 දී එය 14.5% හා 2015 දී 8.3%ක ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමේ දිගු කාලීන සැලැස්මක් අප රජය සතුයි. ඇතැම් අප්‍රිකානු රටවල් අප අත්පත් කර ගන්නා ආර්ථික ඉලක්ක කෙරෙහි අවධානයෙන් සිටින බවට වාර්තා වෙනවා. ඔවුන් තම රට සංවර්ධනය කිරීමට මෙරට ආර්ථික ක්‍රියාකාරකම් ආදර්ශයට ගැනීමට බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, පසු ගිය එක්සත් ජාතික පක්ෂ රජය පැවති සමයේ අපගේ විදේශ ණය ගැතිභාවය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 138ක් පමණ වුවත්, මහින්ද චින්තනය යටතේ එය වර්තමානය වන විට සියයට 78ක් දක්වා පහත අගයකට ගෙන එන්නට අප රජයට හැකියාව ලැබිලා තියෙනවා. එසේම බොහෝ අය මෙවර අය වැය විවේචනය කරනුයේ එහි ඇති සාධනීය තත්ත්වය පිළිබඳව විචාරශීලිව බැලීමකින් තොරව යැයි සඳහන් කළ හැකියි. විශේෂයෙන් 2009 වර්ෂයේ දී පැවති ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය කරමින් රට ස්ථාවර මට්ටමකට ගෙනවිත් තිබෙනවා. අද ඇතැම් අය චෝදනා කරනවා, යුද්ධය අවසන්ව තිබියදීත් ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු තවත් අමාත්‍යාංශ දෙකකට පමණක් විශාල මුදලක් අය වැයෙන් වෙන් කර ඇතැයි කියා. කරුණු කෙසේ වුවද වර්තමානය වන විට අපගේ යුද වියදම දළ දේශීය නිෂ්පාදනයෙන් 2.1%කින් පහත හෙළීමට මෙම ආණ්ඩුවට හැකිවෙලා තිබෙනවා. ඒ වාගේම අප රටේ ජනතාවගෙන් බහුතරය මැදි ගණයේ ආදායම් ලබන්නන් බවට පත්වෙලා තිබෙනවා. විරැකියාව 4%කින් පහත හෙළීමට හැකිවෙලා තිබෙනවා. එසේම අය වැය පරතරය 6.4% දක්වා පහත හෙළීමට හැකිවෙලා තිබෙනවා. අය වැය හිඟය පාලනය කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී 1977න් පසුව මෑත කාලීනව අය වැය හිඟය මෙතරම් පහත මට්ටමකට ගෙන ආ කාලයක් නොමැති තරම්. 1978 - 1987 කාලය තුළ දී අය වැය හිඟය 14.1%ක් ලෙස ද, එසේම 1988 සිට 2008 දක්වා 8.7%ක් ලෙස ද, 2009 වර්ෂයේ දී අය වැය හිඟය 9.8%ක් ලෙස ද වාර්තා වුණ ද මෙම වසරේ දී එය 6.4 දක්වා පහත හෙළීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස හඳුනා ගත හැකියි.

ගරු සභාපතිතුමනි, 1988 වර්ෂයේ සිටම අපගේ වර්තන ගිණුමේ අඛණ්ඩ හිඟයක් හඳුනා ගැනීමට හැකි වුණා. එම තත්ත්වය අයහපත්කාරී ප්‍රතිඵල ගෙන එන්නක්. මෙහිදී පුනරාවර්තන වියදම් ඉහළ යාම නිසා ඉතුරුම් හිඟතාවකට මුහුණ දෙන්න සිදු වුණා. එම තත්ත්වය තුළ ප්‍රාග්ධන සම්පාදනයට ඇති ඉඩකඩ සීමා වීම නිසා රජයට විදේශ ණය ලබා ගැනීමට සිදුවනවා. එය දිගු කාලීනව අයහපත් බලපෑමක් ඇති කරනවා. ඇතැම් අය චෝදනා කරනවා, ආණ්ඩුවේ වියදම් හා බදු ප්‍රතිපත්තිය පිළිබඳව. මෙම අය වැය ධනපතියන්ට සෙත සලසන එකක් කියලා කියනවා. දේශීයත්වය නඟා සිටුවන්නට දරන වෑයම, දේශීය ආර්ථිකයේ සම්පත් බෙදී යාමේ රටාව වාගේම ආදායම් රටාව සාධනීය ආකාරයට වෙනස් කරන්නට වියදම් හා බදු ක්‍රමයේ යම් යම් වෙනස් කිරීම්වලට ලක් කිරීමෙන් හැකි වෙනවා. එම බලපෑම තුළින් බහුතරයක් වූ අඩු ආදායම්ලාභී පවුල්වල ජන කොටසෙහි සුබසාධනය සැපිරීම සඳහා දරන වෑයම ඇතැම් අය දකින්නේ පටු දැක්මකින්. විශේෂයෙන්ම නියඟය හේතුවෙන් අපගේ කෘෂි ආර්ථිකයට තදබල පහරක් වැදුණා. මෙය සෘජුව ගොවීන් සඳහා බලපෑවා. මෙවර අය වැය තුළින් වගා හානි වූ ගොවීන්ට නොමිලේ බිත්තර වී ලබා දීමට යෝජනා කොට තිබෙනවා. එසේම ගොවි ණය සඳහා සහන කාලයක් දෙන්නට ද, පොහොර සහනාධාරය අඛණ්ඩව ලබා දීමට ද යෝජනා වී තිබෙනවා. එපමණක් නොව කුමන බාධාවක් පැවතිය ද වී අස්වැන්න පෙර වසරට සාපේක්ෂව 0.2% හෝ 2012 වසරේ ඉහළ යතැයි අපේක්ෂා කරනවා. එසේම වීවලට රුපියල් 40වැනි සහතික මිලක් ලබා දීම ගොවි ජනතාවගේ සුරක්ෂිතභාවය ඇති කිරීමට මහින්ද චින්තන හත්වැනි අය වැය ගත් ප්‍රමුඛ තීන්දුවක් ලෙස හඳුනාගත හැක.

ගරු සභාපතිතුමනි, ආර්ථික වර්ධනයක් සමඟ සංවර්ධනය ඊට සමගාමීව පවත්වාගෙන යාමට මහින්ද චින්තනය යටතේ කටයුතු කරනවා. සාක් කලාපීය රටවලට සාපේක්ෂව ඉහළ සංවර්ධන මට්ටමක් පවත්වාගෙන යෑමට අප රජයට හැකිවීම ආඩම්බරයට හේතුවක්. මෙයට ලබා දිය හැකි කදිම උදාහරණයක් ලෙස මන්ද පෝෂණය පිළිබඳ දර්ශකය ඉදිරිපත් කරන්න පුළුවන්. 21% පමණ පැවති මන්ද පෝෂණය 9% දක්වා පහත මට්ටමකට ගෙන එන්න රජයට හැකියාව ලැබිලා තියෙනවා. ඇතැම් අය තර්ක කරනවා, මෙය "ලැම්බෝ ගිනි" අය වැයක් ලෙස. මෙය හුදු කතාන්දර පමණයි. සරලව අපගේ ආර්ථික ඉතිහාසය සලකා බලන විට 1977න් පසුව රාජ්‍ය අංශයේ පරිභෝජන ශීඝ්‍රයෙන් ඉහළ ගියා. ඒ නිසා රාජ්‍ය පරිභෝජන වියදම ඉහළ යාමක් හඳුනා ගන්න පුළුවන්. ඉහළ ගිය පරිභෝජන වියදම් පියවා ගන්න හිටපු පාලකයන් මොනවාද කළේ? වැඩි වැඩියෙන් ආනයනය කරන්න පටන් ගත්තා. ඒ තත්ත්වය තුළ විදේශීය භාණ්ඩ විශාල වශයෙන් මෙරටට එන්න ගත්තා. අවසානයේ දී දේශීයව පැවති ඇතැම් ළදරු කර්මාන්ත බිඳ

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

වැටෙන්න ගත්තා. ඒ විතරක් නොවෙයි, දේශීයව පැවති විදුලි උපකරණ කර්මාන්ත, දේශීය අත්යන්ත්‍ර කර්මාන්ත, කඩදාසි කර්මාන්ත වැනි කර්මාන්ත බිඳ වැටුණා. රැකියා වියුක්ති අනුපාතය ඉහළ ගියා.

මෙවර අය වැය මඟින් දිළිඳුකම තුරන් කිරීම, ජලය හා පරිසරය ආරක්ෂා කිරීම සහ පර්යේෂණ හා තාක්ෂණය දියුණු කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කොට පවතින බව විශේෂ ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකියි.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි, විදේශ විනිමයට ඇති ඉල්ලුම වැඩි වුණා. රුපියලේ අගය විදේශීය මුදලට සාපේක්ෂව බාල්දු වෙන්න පටන් ගත්තා. ඒ වාගේම ආනයන වියදම ඉහළ ගියා. ඊට සරිලන විධියට අපනයන වියදම ලැබුණේ නැහැ.  අවසානයේ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වුණා. විදේශ ණයගැති බව පුළුල් වුණා. අප ණයගැති රාජ්‍යයක් බවට පත් වුණා. මේ තත්ත්වය මෙවර අය වැය තුළින් පාලනය කරන්න සැලසුම් කරලා තියෙනවා. නිෂ්පාදන ආර්ථිකයක් මැයෙන් මෙම තත්ත්වය වැඩිදුරටත් විස්තර කරලා තියෙනවා.

ගරු සභාපතිතුමනි, නිදහසේ ඉඳලා දේශීය කෘෂි කර්මාන්තය නංවන්න විවිධ පියවර, සැලසුම් ක්‍රියාත්මක කරලා සහ යෝජනා කරලා තියෙනවා. උදාහරණ වශයෙන් ගොවි ජනපද ව්‍යාපාර, බහුකාර්ය වාරි මාර්ග යෝජනා ක්‍රම, කෘෂි කාර්මික පනත්, ඉඩම් පනත්, පොහොර සහනාධාර ලබා දීම 1950 දී ආරම්භ වෙනවා. උදාහරණයක් ලෙස පොහොර සහනාධාරය සලකා බලන විට 1990 දී පොහොර සහනාධාරය නතර වෙනවා. නමුත් 2005 වන විට නැවත එය අරඹලා තියෙනවා. ඒ විතරක් නොවෙයි, මහින්ද චින්තන ප්‍රතිපත්තිය අනුව "නිල්ල පිරුණු කෙතක් - බත බුලතින් පිරුණු හෙටක්" යන තේමාව යටතේ නව දැක්මක් කෘෂි කාර්මික ක්ෂේත්‍රයට ඇතුළත් කොට තිබෙනවා. මහින්ද චින්තනයට අනුව සියලුම ගොවීන්ට සහන මිලක් යටතේ යූරියා පොහොර, වී ගොවීන්  සඳහා පොහොර සහනාධාර ද අඛණ්ඩව ලබා දෙන්න කටයුතු කළා. විශේෂයෙන් ඇතැම් කෘෂි කාර්මික අපනයන සඳහා පනවා තිබුණු බදු ඉවත් කිරීමට, සුපිරි ග්‍රාමීය ණය සඳහා වැය කළ මුදල ඉහළ දැමීමට, ඇතැම් කෘෂි භාණ්ඩ සඳහා ආනයන බදු වැඩි කරමින් දේශීය ගොවියා රැක ගැනීමට කටයුතු කළා.  විශේෂයෙන් "මහින්ද චින්තන ඉදිරි දැක්ම" යටතේ මෙම ක්ෂේත්‍රයේ උන්නතිය කෙරෙහි වාගේම, බහුතර ජනතාව කෙරෙහි අවධානය යොමු කරවා තියෙනවා.

ගරු සභාපතිතුමනි, දිළිඳුකම පිටු දැකීම සඳහා ජනසවිය, සමෘද්ධිය වැනි විශාල ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා සහ ක්‍රියාත්මක වෙනවා. යම් ප්‍රමාණයකින් දිළිඳුකම අඩුවීමක් හඳුනාගත හැකි වුව ද ග්‍රාමීය අංශයේ හා වතු අංශයේ දිළිඳුකමෙහි අඩුවීමක් සිදු වී ඇත්තේ අවම වශයෙන්. මෙහිදී සලකා බැලිය යුත්තේ මොවුන් දිළිඳුකමේ සිරවී සිටින්නට බලපා ඇති පසු බිම් සාධක මොනවාද කියායි. අප රටේ ග්‍රාමීය අංශයේ පවතින දිළිඳුකමට පවුල් ලක්ෂ 18ක් පමණ ප්‍රමාණයකට මුහුණ දෙන්න වෙලා තියෙනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා 'දිවි නැඟුම" වැඩසටහනින් මෙම තත්ත්වයට පිළියම් යොදමින් පවතිනවා. විශේෂයෙන් ග්‍රාමීය ජන කොටස්හි ආදායම් උත්පාදන මාර්ග වැඩිදියුණු කිරීම, අධ්‍යාපනය, සෞඛ්‍ය, මහාමාර්ග, ප්‍රවාහන, බැංකු, වෙළෙඳ පොළ සබඳතා පුළුල් කිරීමට විදුලි බලය, ජල සම්පාදනය හා ග්‍රාමීය මූල්‍ය අංශය වැඩිදියුණු කිරීම "දිවි නැඟුම" වැඩසටහන මඟින් සිදු කෙරෙමින් පවතිනවා. ඉහත අඩුපාඩු සැපිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට තිබෙනවා. සමස්තයක් ලෙස සලකා බලන විට ඇතැම් අය "ලැම්බෝ ගිනි" අය වැය සෙල්ලම් ආර්ථිකයක් ලෙස එල්ල කරන චෝදනා පුස්සක්  පමණක් බව අවධාරණය කරන්න කැමතියි. විශේෂයෙන් මෙම ආර්ථිකය එදා වේල හොයා ගන්නා එකක් නොව, දිගු කාලීන සැලසුමකට අනුව ක්‍රියාත්මක වන්නක් බව අවධාරණය කළ යුතුයි.

ගරු සභාපතිතුමනි, මෙවර අය වැය තුළින් ධීවර ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට පවතිනවා. විශේෂයෙන් ආහාර සුරක්ෂිතතාවය, ජීවනෝපාය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය වෙනුවෙන් ධීවර අංශයේ සංවර්ධනය සඳහා රජය ප්‍රමුඛතාව ලබා දී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපගේ දේශීය මුහුදු තීරය නාවික සැතපුම් 12ක් වන අතර, යාබද කලාපය නාවික සැතපුම් 24ක සහ අනන්‍ය ආර්ථික කලාප නාවික සැතපුම් 200ක් පමණ වෙනවා. මිරිදිය හා ජලජීවී වගා සම්පත් ලෙස කළපු හා නදී තිරයන්  හෙක්ටෙයාර් 158,000 හා කඩොලාන කලාප, ලවණ වගුරු, මඩ වගුරු හෙක්ටෙයාර් 71,000ක් පවතිනවා. (ඇමුණුම අංක 01 බලන්න)

ඇමුණුම් අංක 01

| යටිතල පහසුකම් | 2005 | 2011 |
|---|---|---|
| ක්‍රියාත්මක ප්‍රධාන ධීවර වරායන් | 12 | 18 |
| ඉදිකරමින් පවතින ධීවර වරායන් | 08 | 02 |
| යෝජිත ධීවර වරායන් | - | 04 |
| නැංගුරම් පොළවල් | 33 | 40 |
| ධීවර තොටුපොළවල් | 860 | 860 |
| අයිස් කර්මාන්තශාලා | 47 | 85 |
| දෛනික අයිස් නිෂ්පාදන ධාරිතාවය (මෙ.ටො) | 1066 | 2371 |
| ශීතාගාර | 11 | 36 |
| ශීතාගාර ධාරිතාවය (මෙ.ටො) | 2872 | 3550 |
| බෝට්ටු නිෂ්පාදනාගාර | 32 | 54 |
| ධීවර ආම්පන්න නිෂ්පාදන කර්මාන්තශාලා | 03 | 06 |
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන | 03 | 04 |
| විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන | 01 | 04 |
| ජාතික ජලජීවී අභ්‍යාස මධ්‍යස්ථාන | | 01 |
| මිරිදිය ඉස්සන් බෝ කිරීමේ ස්ථාන | - | 02 |
| කිවුල් දිය මත්ස්‍ය, සෞඛ්‍ය හා පරිසරය අභයීම් රසායනාගාර | - | 01 |
| කිවුල්දිය ඉස්සන් බෝකිරීමේ ස්ථාන | - | 01 |
| ප්‍රජා පාදක කුඩා මත්ස්‍ය තවාන | 03 | 01 |
| ජලජීවී ව්‍යාප්ත කාර්යාල | 01 | 10 |
| සමුද්‍ර ධීවර යාත්‍රා සංචිතය | | |
| ගැඹුරු මුහුදු යාත්‍රා | 10 | 29 |
| බහුදින යාත්‍රා | 1328 | 3875 |
| එක්දින යාත්‍රා | 1164 | 1120 |
| පිටසවි ෆයිබර් ග්ලාස් (මීටර 6-8) | 11010 | 19890 |
| යාන්ත්‍රික පාරම්පරික යාත්‍රා | 1660 | 20430 |
| යාන්ත්‍රික නොවන පාරම්පරික යාත්‍රා | 14739 | 48272 |
| මාදැල් පන්න බෝට්ටු | 593 | 991 |

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ගරු සභාපතිතුමනි, ධීවර ක්ෂේත්‍රයේ මේ වන විට  සෘජු හා වක්‍ර රැකියාවල නියුතු පිරිස 525,000ක් පමණ වේ. කෙසේ වුවද මිලියන 2.6ක පමණ ජනතාවක් තම ජීවනෝපාය ලෙස ධීවර ක්ෂේත්‍රයේ නියැළෙනවා. මේ පිළිබඳ වැඩි විස්තර ඇමුණුම්  අංක 02හි සඳහන් වේ.

ඇමුණුම් අංක (02)

| ධීවර අංශයේ මානව සම්පත් | ඒකකය | 2010 | 2011 | 2012 (අපේක්ෂිත) |
|---|---|---|---|---|
| ධීවර පරීක්ෂක කොට්ඨාස | සංඛ්‍යාව | 148 | 148 | 148 |
| කරදිය ධීවර පවුල් | සංඛ්‍යාව | 184100 | 187340 | 187680 |
| කරදිය ධීවරයින් | සංඛ්‍යාව | 217920 | 218760 | 219430 |
| කරදිය ධීවර පවුල්වල ජනගහනය | සංඛ්‍යාව | 816500 | 820580 | 823230 |
| මිරිදිය ධීවරයින් | සංඛ්‍යාව | - | 27360 | 30663 |
| ජලජීවී වගා ධීවරයින් | සංඛ්‍යාව | - | 11420 | 13316 |
| සෘජු හා වක්‍ර රැකියා | සංඛ්‍යාව | 475000 | 525000 | 530000 |
| ධීවර කටයුතු හා සබැඳි ජීවනෝපායන් | මිලියන | 2.4 | 2.5 | 2.6 |

ගරු සභාපතිතුමනි, මෑත කාලීනව සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනයක් හඳුනාගත හැකි වන අතර, කරදිය හා මිරිදිය යන දෙඅංශයේම වර්ධනයක් හඳුනා ගැනීමට පුළුවන.

(ඇමුණුම් අංක 03.)

| වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය | ඒකකය | 2010 | 2011 | 2012 ඉලක්කය |
|---|---|---|---|---|
| කරදිය අංශය | මෙට්‍රික්ටොන් | 332260 | 385270 | 495900 |
| කරදිය වෙරළ තීරය | මෙට්‍රික්ටොන් | 202420 | 222350 | 236370 |
| අක් වෙරළ/ ගැඹුරු මුහුද | මෙට්‍රික්ටොන් | 129840 | 162920 | 259530 |

| වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය | ඒකකය | 2010 | 2011 | 2012 ඉලක්කය |
|---|---|---|---|---|
| මිරිදිය හා ජලජීවී වගා අංශය | මෙට්‍රික්ටොන් | 52410 | 59560 | 79300 |
| මිරිදිය මසුන් ඇල්ලීම | මෙට්‍රික්ටොන් | 44380 | 50050 | 66500 |
| ජලජීවී වගාව | මෙට්‍රික්ටොන් | 4550 | 5360 | 6800 |
| ඉස්සන් ගොවිපළ | මෙට්‍රික්ටොන් | 3480 | 4150 | 600 |
| **මුළු නිෂ්පාදනය** | | **384670** | **444830** | **575200** |

ගරු සභාපතිතුමනි, දළ දේශීය නිෂ්පාදනය සඳහා ධීවර අංශයේ දායකත්වය 2011 පළමුවන හා දෙවන කාර්තුව සසඳා බැලීමේ දී මේ වර්ෂය තුළ එම දායකත්වය 26%කින් වර්ධනය වී ඇත. එය 2012 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදනයට 2.1% දායකත්වයක් දක්වා ඇත. දේශීය ඒකපුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම තුළින් දෛනික ජීවිතයට පුද්ගලයෙකුට අවශ්‍ය කැලරි, ප්‍රෝටීන් හා මේද අවශ්‍යතාව සපුරාලීමට ධීවර අමාත්‍යාංශය අපේක්ෂා කරන අතර, ඒ තුළින් මන්ද පෝෂණය තුරන් කිරීමට අප අපේක්ෂා කරනවා. පසු ගිය 2009 වසර හා සසඳමින් සලකා බලන විට සෑම අංශයකම මත්ස්‍ය නිෂ්පාදන ඉහළ නැංවීමට අමාත්‍යාංශයක් විධියට අපට හැකියාව ලැබිලා තියෙනවා.

අපගේ මුළු මත්ස්‍ය නිෂ්පාදනය වෙරළාසන්න මුහුදේ දී මෙට්‍රික්ටොන් 194,260ක ඉලක්කයක් පැවතිය ද අපට 97%ක ඉලක්කයක්, එනම් මෙට්‍රික්ටොන් 188,260ක  මත්ස්‍ය අස්වැන්නක් නෙළා ගැනීමට හැකියාව ලැබුණා. එසේම ගැඹුරු මුහුදේ අක්වෙරළ ඉලක්ක වුණේ මෙට්‍රික්ටොන් 163,640ක්. අපට මෙට්‍රික්ටොන් 112,830ක අස්වැන්නක් නෙළා ගැනීමට හැකි වුණා. එය ප්‍රතිශතාත්මකව 69%ක්. මිරිදිය හා ජලජීවී වගාව මෙට්‍රික්ටොන් 59,020ක අස්වැන්නක් බලාපොරොත්තු වුණා. ඒ තුළින් 99%ක ඉලක්ක සපුරා ගැනීමට අපට හැකියාව ලැබුණා. විශේෂයෙන් සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 416,920ක් අපේක්ෂා කළා. ඉන් සියයට 86ක්, එනම් මෙට්‍රික්ටොන් 359,570ක ඉලක්ක සපුරා ගැනීමට හැකියාව ලැබුණා. සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය 2011 වසරට සාපේක්ෂව සියයට 12ක වර්ධනයක් අත්පත් කර ගැනීමට මෙම වසර තුළ අපට හැකියාව ලැබුණ බව මේ  ගරු සභාවට සඳහන් කළ යුතුයි.

ගරු සභාපතිතුමනි, වෙරළාසන්න ධීවර කර්මාන්තයේ ඉකුත් වසරට සාපේක්ෂව සියයට 16ක ප්‍රගතියක් අත්පත් කරගනු ලැබුව ද මෙය ගැඹුරු මුහුදට සාපේක්ෂව මත්ස්‍ය අස්වැන්නේ යහපත් තත්ත්වයක්. එසේම මිරිදිය මත්ස්‍ය කර්මාන්තය තුළ දී පෙර වසරට සාපේක්ෂව 39%ක කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කරගත හැකි වුණා. මිරිදිය හා ජලජීවී වගාව ආශ්‍රිතව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ සුවිශේෂී වර්ධනයක් වාර්තා කිරීමට හැකි වුණා. මිරිදිය මත්ස්‍ය අස්වැන්න වර්ෂ 2009 සිට 2012 වර්ෂයේ පහත ලෙස සටහන් වේ. ඉහළ වර්ධනයක් අත්පත් කර ගැනීමේ හැකියාවක් ලැබිලා තිබෙන බව මෙයින් හෙළිවෙනවා.

| වර්ෂය | නිෂ්පාදිතය මෙට්‍රික්ටොන් |
|---|---|
| 2009 | 1720 |
| 2010 | 1840 |
| 2011 | 2170 |
| 2012 (ජනවාරි - ජූලි) | 1460 |

එසේම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනයේ වර්ධනයක් හඳුනා ගත හැකි අතර එය පහත පරිදි දැක්විය හැක.

| වසර | වැවු ගණන | මත්ස්‍ය ඇඟිල්ලන් යෙදවූ ප්‍රමාණය |
|---|---|---|
| 2009 | 23 | 1136344 |
| 2010 | 35 | 1180070 |
| 2011 | 28 | 1581450 |
| 2012(ජනවාරි - අගෝස්තු) | 53 | 1678292 |

ඇඟිල්ලන් නිෂ්පාදනයේ වර්ධනයක් සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ද ඉහළ මට්ටමක පැවතුණා. මොදා මත්ස්‍ය කර්මාන්තය තුළින් ද ඉකුත් වසරට සාපේක්ෂව ඉහළ වර්ධනයක් අත්පත් කර ගැනීමේ හැකියාවක් ලැබුණා.

2011 වර්ෂයේ දී මොදා මත්ස්‍ය කොටු කින්නියා කළපුව ආශ්‍රිතව හැත්තෑවක් පමණ ඇති කරන ලද අතර, මත්ස්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 470ක් පමණ වුණා. එය මෙම වසරේ ජනවාරි සිට සැප්තැම්බර් කාලය වන විට මත්ස්‍ය කොටු 254ක් දක්වා ඉහළ නැංවීමට හැකියාවක් ලැබුණා.

ගරු සභාපතිතුමනි, "දිවි නැඟුම" ජාතික වැඩසටහනට සමගාමීව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ  පහත ආකාරයට 2011 වසර හා  2012 වසර තුළ දී ධීවර අංශයේ සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්නටත්, ඉන් ප්‍රතිඵල ළඟා කර ගැනීමටත් හැකියාව ලැබුණා.

**දිවි නැඟුම ප්‍රගතිය**

**ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය 2012**

| | ආහාර පිණිස පොකුණු තුළ | ඒකාබද්ධ මත්ස්‍ය | විසිතුරු මත්ස්‍ය | මට්ටයන් වගාව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිලාභීන් ප්‍රමාණය | 58 | 2 | 23 | 18 | 101 |
| ප්‍රතිලාභීන් ප්‍රමාණය | 40 | 1 | 23 | 18 | 82 |
| ගිවිසුම් සහ ප්‍රමාණය | 25 | 1 | 14 | 18 | 58 |
| පළමු වාරිකය නිදහස් කිරීම | 25 | 1 | 14 | 18 | 58 |
| දෙවන වාරිකය නිදහස් කිරීම | - | - | | - | |
| එකතුව | 468750 | 25000 | 252000 | 337500 | 1083250 |

ගරු සභාපතිතුමනි, ජලජීවී වගා හා ඉස්සන් වගාව සංවර්ධනය සඳහා අමාත්‍යාංශය මඟින් දියත් කෙරුණු ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස 2011 වසරට සාපේක්ෂව සමස්ත මිරිදිය ධීවර කර්මාන්තය 2012 සැප්තැම්බර් මාසය වන විට අපේක්ෂිත ඉලක්කවලින් 81%ක ඉලක්කයක් සපුරා ගැනීමට හැකි වුණා.

මිරිදිය මත්ස්‍ය කර්මාන්තය අත්කර ගෙන ඇති ප්‍රගතිය සලකා බලන විට ඉතිහාසයේ නොවූ විරූ ආකාරයේ මත්ස්‍ය අස්වැන්නක් නෙළා ගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවා. ඉස්සන් වගාවෙහි 2011 වසරට සාපේක්ෂව යම් අඩුවීමක් තිබුණ ද අපගේ ඉලක්ක මඟින් 60% සපුරා ගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ අනුව 2011 වසරට සාපේක්ෂව 2012 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් අතර කාලය තුළ දී පහත ආකාරයට මිරිදිය මත්ස්‍ය අස්වැන්නක් නෙළා ගැනීමට හැකියාව ලැබුණා. මිරිදිය නිෂ්පාදන මඟින් ඉකුත් වසරට සාපේක්ෂව 43%ක ප්‍රගතියක් ද, මිරිදිය වගාව මඟින් 38%ක ප්‍රගතියක් ද, ඉස්සන් වගාවෙන් අපේක්ෂිත ඉලක්කයෙන් 60%ක් ද, සමස්ත මිරිදිය හා ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනයෙන් 39%ක ප්‍රගතියක් ද අත්කර ගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවා. 2012 වසර තුළ දී "උතුරු වසන්තය" සඳහා තැන්පත් කරන ලද මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව මිලියන 3.80ක් සහ මිරිදිය ඉස්සන් පැටවුන් මිලියන 0.45ක් තැන්පත් කොට තිබෙනවා. ඒ වාගේම "නැඟෙනහිර නවෝදය" යටතේ මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 9.29ක් ද, මිරිදිය ඉස්සන් මිලියන 2.96ක් ද ජලාශවලට පැටවුන් යොදා තිබෙනවා. එසේම පසු ගිය වසරට සාපේක්ෂව මිරිදිය මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය 54%ක වර්ධනයක්, එනම් 2011 වසර තුළ දී මිලියන 9.29ක් නිෂ්පාදනය කරන ලදී. 2012 වසරේදීම මිලියන 14.27ක මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබී තිබෙනවා. එසේම තිලාපියා පිරිමි මඟින් නිෂ්පාදනය වැඩි කිරීමට "දිවි නැඟුම" වැඩසටහන යටතේ කටයුතු කරන අතර, ජානමය වශයෙන් වැඩිදියුණු කළ තිලාපියා විශේෂ වර්ධනය කිරීමේ වැඩසටහනක් ද දැනට ආරම්භ වෙලා පවතිනවා.

ගරු සභාපතිතුමනි, මෙරට විසිතුරු මත්ස්‍ය කර්මාන්තය වසර 80ක පමණ ඉතිහාසයකට උරුමකම් කියනවා. නමුත් මෙම කර්මාන්තය නඟා සිටුවීම සඳහා  පැවති විවිධ රජයන් විවිධ ප්‍රතිපත්ති, තීන්දු ගෙන තිබුණ ද එයින් සාර්ථක ඵල නෙළා ගැනීමට හැකියාවක් ලැබිලා නැහැ. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය විදේශ විනිමය උපයා ගත හැකි ඉතා හොඳ අවස්ථාවක්. මෙරට ලෝකයේ විසිතුරු මත්ස්‍ය ප්‍රභේද 1,600ක් පමණ හඳුනා ගෙන තිබෙනවා. අප රට තුළ දී දැනට 200ක් පමණ හඳුනා ගෙන  තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයට අදාළව වැඩසටහන් පාරිසරික තත්ත්ව වාගේම ගුණාත්මයෙන් ඉහළ මානව සම්පතත් අප රට

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

සතුයි. මෙම වාසිදායක තත්ත්වය තුළ විසිතුරු මත්ස්‍ය කර්මාන්තය වර්ධනය සඳහා බැසිල් රාජපක්ෂ මැතිතුමන්ගේ උපදෙස් මත විශේෂ කාර්ය සාධන බලකායක් ද පිහිටවනු ලැබුවා. එමඟින් ජාත්‍යන්තර වෙළෙඳ පොළට ශ්‍රී ලාංකේය ප්‍රමිති නාමයකින් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනයක් හඳුන්වා දීමට කටයුතු කරනවා. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ප්‍රවර්ධනයට යම් යම් බාධක තිබුණ ද ඒවා එම ආයතන සමඟ සාකච්ඡා කොට පිළියම් යෙදීමට කටයුතු කරගෙන යනවා.

ගරු සභාපතිතුමනි, විසිතුරු මත්ස්‍ය කර්මාන්ත නඟා සිටුවීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් අතර පැවති ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීමට හැකියාව ලැබුණා.

මෙරට ඒක දේශීය ජලජ පැළෑටි, පටක රෝපණය, සාමාන්‍ය රෝපණය මඟින් නිෂ්පාදනය කර අපනයනය කිරීමට අවසර ලබාදීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය එකඟතාවකට සහ ඊට අදාළ නීති සම්පාදනයට කටයුතු කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එකඟ වුණා.

ගරු සභාපතිතුමනි, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ප්‍රගතිය සඳහා "දිවි නැඟුම" වැඩසටහන යටතේ නව ව්‍යාපෘති ආරම්භ කිරීමට වාගේම විසිතුරු මත්ස්‍ය කර්මාන්තකරුවන් සඳහා ගුණාත්මයෙන් ඉහළ මත්ස්‍ය පැටවුන් වෙළෙඳ පොළට නිකුත් කිරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීමට කටයුතු කළා. මේ සඳහා වෙන් කොට ඇති මුදල මිලියන 62.4ක් වෙනවා. මේ යටතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තකරුවන් 832 දෙනෙකු මෙම වර්ෂය තුළ දී තෝරාගෙන තිබෙන අතර අදියර දෙකක් යටතේ මෙම මුදල් ලබා දීම සිදු කරනවා. ඉතුත් දා පොළොන්නරුවේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තකරුවන් 308කට මුදල් ආධාර ලබා දුන් අතර, පුත්තලම දිස්ත්‍රික්කයේ 67 දෙනෙකු සඳහා ද මුදල් ආධාර ලබා දීමට කටයුතු කරලා තියෙනවා.

ගරු සභාපතිතුමනි, "උතුරු වසන්තය" යටතේ ඉරණමඩු ප්‍රදේශයේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, මුලතිව් හි ඒකාබද්ධ කෘෂි කාර්මික ජීවනෝපාය නඟා සිටුවීම යටතේ මුලතිව් ජලාශ 16ක මත්ස්‍ය ඇඟිලිලන් වගා කිරීමේ වැඩසටහනක් ද, "නැඟෙනහිර නවෝදය" යටතේ පුදුකුඩිඉරිප්පු හා මඩකලපුවේ ඉස්සන් අභිජනනාගාර නියාමක ව්‍යාපෘතීන් ද, මුලතියන්කට්ටු හා ඔඩ්ඩුසුඩාන් හි කුඩා පරිමාණ අභිජනනාගාර ස්ථාපිත කිරීම ඇතුළු අංශ ගණනාවක් ඔස්සේ මිරිදිය කර්මාන්තයේ උන්නතිය සඳහා ඉකුත් වසර තුළ ක්‍රියාත්මක කරලා තියෙනවා.

එසේම ආනයන-අපනයන වෙළෙඳාමේ කැපී පෙනෙන වර්ධනයක් පවතින බව ගරු සභාවට පෙන්වා දීමට කැමතියි. අපගේ අපනයන ආදායම 2010 වර්ෂයේ දී රුපියල් මිලියන 175ට තිබුණත්, එය 2011 වර්ෂයේ දී රුපියල් මිලියන 198ක් දක්වා වර්ධනය කර ගැනීමට අපට හැකියාව ලැබිලා තියෙනවා. ඒ වාගේම 2012 වර්ෂයේ අපගේ ඉලක්කය මිලියන 153ක්. මීට සාපේක්ෂව අපගේ ආනයන වියදම යම් පහත හෙළීමක් 2010 වසරට සාපේක්ෂව ඉකුත් වසරේ දී හඳුනා ගන්න පුළුවන්.

(ඇමුණුම අංක 4)

| මත්ස්‍ය වෙළෙඳ සැල් සැකසුම | ඒකකය | 2010 | 2011 | 2012 ඉලක්කය |
|---|---|---|---|---|
| මත්ස්‍ය වෙළෙඳ සැල් | සංඛ්‍යාව | 75 | 103 | 120 |
| මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන (පොදු රාජ්‍ය මණ්ඩල ප්‍රමිති අනුමත) | සංඛ්‍යාව | 26 | 29 | 30 |
| මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන (වෙනත්) | සංඛ්‍යාව | 5 | 5 | 5 |
| වාර්ෂික අපනයන ආදායම | | 19834175 | 21876198 | 27760217 |
| වාර්ෂික අපනයන ධාරිතාව | | 18325 | 18462 | 20814 |
| වාර්ෂික ආනයන වියදම | | 14162125 | 16240147 | 19520153 |
| වාර්ෂික ආනයන ධාරිතාව | | 800135672 | 819575636 | 871308240 |
| මත්ස්‍ය වෙළෙඳ ශේෂය | | 50 | 51 | 64 |

විශේෂයෙන් ඉහළ අපනයන ආදායමක් ලබා ගැනීමේ අරමුණින් ජාත්‍යන්තරව විශාල තරඟයකට මුහුණ දීමට අපට සිදුවන අතර, අපගේ මත්ස්‍ය අපනයනය යුරෝපා සංගමයට 33%, ජපානය සඳහා 38%, ඇමෙරිකා එක්සත් ජනපදය සඳහා 18%, යුරෝපා සංගමයට 10%ක් සහ අනෙකුත් රටවල් සඳහා 02% වශයෙන් අපනයනය කෙරෙනවා. මේ සඳහා මත්ස්‍ය පිරිසැකසුම් කර්මාන්තශාලා 34ක් ක්‍රියාත්මක වන අතර, ඉන් 24ක්ම යුරෝපා සංගමය මඟින් ලියා පදිංචි කොට තිබෙනවා.

විශේෂයෙන් දේශීය මත්ස්‍ය අලෙවිය සම්බන්ධයෙන් වැඩි දායකත්වයක් පෞද්ගලික අංශය දක්වන අතර ධීවර සංස්ථාවෙහි දායකත්වය 10%ක් පමණ වනවා. එම නිසාම දේශීය අලෙවි ජාලය ශක්තිමත් කිරීම සඳහා සිල්ලර මසුන් අලෙවිකරණය නවීකරණය කිරීමකට ලක් සතොස හා කෝප් සිටි හරහා අලෙවි ජාලය නවීකරණය හා ශක්තිමත් කිරීමට කටයුතු කොට තිබෙනවා. ටින් මාළු කර්මාන්ත ශාලා ඇරඹීම තුළ වාර්ෂිකව ටින් මාළු ආනයනය සඳහා ගිය වියදම් පාලනයට මෙන්ම අවම කර ගැනීමට අපේක්ෂා කරනවා. මෙරට ධීවර ක්ෂේත්‍රය තුළ ධීවර යාත්‍රා භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතිනවා. ඉන් හැඟවෙන්නේ ධීවර ක්ෂේත්‍රය කෙරෙහි දැනට පවතින නැඹුරුතාව වැඩි වී ඇති බවයි. 2012.07.08 දින ජාතික ධීවර සම්මේලනය පිහිටුවා එමඟින් ධීවර ගැටලු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම කරනවා. ධීවර යාත්‍රා රක්ෂණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ධීවර ප්‍රජාවගේ ගැටලුව කෙරෙහි විශේෂ අවධානයක්, සැලකිල්ලක් යොමු කරමින් කටයුතු කිරීම සහ ඔවුන්ට අවශ්‍ය කඩිනම් සේවය සැපයීම හේතුකොට ගෙන ධීවර ක්ෂේත්‍රයේ නව පිබිදීමක් ඇතිවෙලා තියෙනවා. ධීවර යාත්‍රා රක්ෂණයේ දී පෙර වසරට සාපේක්ෂව ඉහළ වර්ධනයක් හඳුනාගත හැකියි.

**ක්‍රියාත්මක ධීවර යාත්‍රා**
**1997 - 2012**

| වර්ෂය | ධීවර යාත්‍රා | ඇතුළ එන්ජිම සහිත | | බාහිර එන්ජිම සහිත | | යාන්ත්‍රික නොවන |
|---|---|---|---|---|---|---|
| 1997 | 24411 | 1764 | 1351 | 8300 | 1771 | 14225 |
| 2000 | 27595 | 1430 | 1170 | 8690 | 1205 | 15100 |
| 2005 | 29312 | 1328 | 1164 | 11010 | 1660 | 14150 |
| 2008 | 39717 | 2809 | 1940 | 14747 | 3179 | 17042 |
| 2012 | 55250 | 4360 | 1740 | 23370 | 22320 | 21650 |

**ධීවර යාත්‍රා රක්ෂණය කිරීමේ ප්‍රගතිය**

| යාත්‍රා වර්ගය | 2010 රක්ෂණය කළ ප්‍රමාණය | 2011 රක්ෂණය කළ ප්‍රමාණය | 2012 රක්ෂණය කළ ප්‍රමාණය |
|---|---|---|---|
| බහුදින යාත්‍රා | 2602 | 2533 | 2813 |
| එක්දින යාත්‍රා | 457 | 326 | 421 |
| පිටත සවිකරන ලද එන්ජින් සහිත යාත්‍රා | 151 | 160 | 282 |
| එකතුව | 3210 | 3019 | 3516 |

එසේම දිනෙන් දින ඉහළ යන ලෝක ඉන්ධන මිල හමුවේ ධීවර කර්මාන්තය සඳහා ඉන් ඇති වන බලපෑම පාලනයට අපගේ රජය විසින් ධීවරයන් සඳහා ඉන්ධන සහනාධාර ලබාදීම අඛණ්ඩව පවත්වාගෙන යනවා. වගකිව යුතු රජයක් විධියට අපට එය ධීවර ජනතාව වෙත පවරන්න බැහැ. අනික දේශීය මත්ස්‍ය පාරිභෝගිකයා පිට එය පවරන්න බැහැ. ඒ සඳහා රජය සැප්තැම්බර් මාසයේ පමණක් මිලියන 314ක මුදලක් ඉන්ධන සහනාධාර වශයෙන් ලබා දෙනවා. ඇතැම් අය තර්ක කරනවා, ධීවරයාට මේ අය වැයේ සහන නැහැ කියලා. ඒ අයගෙන් මම අහන්න කැමතියි, විවේචන කරනවාට වඩා අප කරන සේවය අගය කරන්න බැරි ඇයි කියලා. අඩුපාඩු පවතිනවා නම් එය පෙන්වා දීලා ගමනක් යන්න එන්න කියලා ආරාධනා කරන්න කැමතියි. ඉන්ධන සහනාධාරය ලබාදෙන ආකාරය පහත ලෙස සඳහන් කළ හැකියි.

**යාත්‍රා වර්ගය අනුව ඉන්ධන සහනාධාරය ලබාදෙන ආකාරය**

| යාත්‍රා වර්ගය | ප්‍රමාණය මසකට ලීටර් | උපරිම සහනාධාරය මසකට ලීටර | ආධාර ලබාගත් යාත්‍රා |
|---|---|---|---|
| බහුදින යාත්‍රා | 2600 (ඩීසල්) | 31200 | 3768 |
| එක්දින යාත්‍රා | 1600 (ඩීසල්) | 19200 | 494 |
| පිටත සවි කරන ලද එන්ජින් සහිත යාත්‍රා | 375 (භූමිතෙල්) | 9375 | 18398 |
| යාන්ත්‍රික පාරම්පරික | 375 (භූමිතෙල්) | 9375 | 1611 |

ඉන්ධන මිල ඉහළ ගිය පසු ගිය මාර්තු මාසයේ සිට මේ දක්වා ඉන්ධන සහනාධාරය සඳහා රජය වැය කළ මුදල රුපියල් මිලියන 1677කි.

දැනට ධීවර යාත්‍රා 24271 සඳහා ඉන්ධන සහනාධාර මාසිකව රජය විසින් ලබා ගනු ලබනවා. ඒවා පහත පරිදි ඉන්ධන සහනාධාර ලබා ගන්නා යාත්‍රා ප්‍රමාණය මාසිකව ඉහළ යාමක් හඳුනා ගත හැකිය.

| මාසය | ඉන්ධන සහනාධාර සඳහා වැය කරන මුදල |
|---|---|
| 2012 මාර්තු | මිලියන 200 |
| 2012 අප්‍රේල් | මිලියන 285 |
| 2012 මැයි | මිලියන 286 |
| 2012 ජුනි | මිලියන 289 |
| 2012 ජුලි | මිලියන 299 |
| 2012 අගෝස්තු | මිලියන 308 |
| 2012 සැප්තැම්බර් | මිලියන 314 |
| එකතුව | මිලියන 1677 |

ගරු සභාපතිතුමනි, "දිවි නැඟුම" ජාතික වැඩසටහන යටතේ ධීවර කර්මාන්තය නඟා සිටුවීම සඳහා අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් වන "රට ආහාරයෙන් ස්වයං පෝෂණය කිරීම" යන තේමාව යටතේ ව්‍යාපෘති 12ක්, ප්‍රතිලාභීන් 18192ක් ආවරණය වන ආකාරයට ධීවර දෙපාර්තමේන්තුව මඟින් රුපියල් මිලියන 26.75ක් ද, නැක්ඩා ආයතනය මඟින් රුපියල් මිලියන 209.55ක් ද ඉකුත් වසර තුළ වැයකොට සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. "දිවි නැඟුම" ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත ලෙස සඳහන් කළ හැකිය.

**2012 දිවි නැඟුම ව්‍යාපෘතියේ ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ඉලක්කගත ප්‍රතිලාභීන් ගණන | තෝරාගත් ප්‍රතිලාභීන් ගණන | තාක්ෂණික පුහුණුව අවසන් කළ ප්‍රතිලාභීන් ගණන | ව්‍යාපෘති ආරම්භ කළ ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| ආහාරය සඳහා පොකුණු තුළ මසුන් / ඉස්සන් | 1000 | 748 | 405 | 355 |
| විසිතුරු මසුන් වගාව (නව) | 1000 | 766 | 379 | 308 |
| පොකුණු තුළ ඇසිත්තන් / ඇහිල්ලන් වගා | 400 | 149 | 52 | 24 |
| ඒකාබද්ධ මසුන් වගාව | 200 | 168 | 68 | 53 |
| විසිතුරු මත්ස්‍ය වගාව (වැඩි දියුණු | 2000 | 882 | 471 | 187 |
| බෙල්ලන් වගාව | 142 | 100 | 29 | 18 |
| කාලීන ජලාශවල මසුන් වගාව | 10000 | 10000 | ජලාශ සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීම අවසන් කර ඇත. | |
| වතු ජලාශවල මසුන් වගාව | 500 | 400 | ජලාශ 40ක් සහ ප්‍රතිලාභීන් 400ක් තෝරා ගැනීම අවසන් | |
| දුම් කරවල නිෂ්පාදනය | 50 | 38 | 20 | උපකරණ මිල දී ගැනීම සිදු |
| මුහුදු පැළෑටි | 225 | 20 | | |
| කුඩු තුළ මොදා මත්ස්‍ය වගාව | 43 | 43 | 43 | 43 |
| ධීවර පසු අස්වනු තාක්ෂණය කරවල/ උම්බලකඩ / ජාඩි | 2675 | 2675 කරවල - 1923 ජාඩි - 312 උම්බලකඩ - 440 | 2675 | |
| එකතුව | 18192 | 15946 | 3666 | 865 |

ගරු සභාපතිතුමනි, පශ්චාත් සුනාමි වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන සහ පශ්චාත් සුනාමි ජීවනෝපාය සහය සහයෝගීතාව වැඩසටහන මඟින් ධීවර කාර්මික පවුල්වල සාමාජිකයින් සාම්ප්‍රදායික නොවන කර්මාන්ත සඳහා ඇතුළත් කිරීම, ඒ තුළින් නව නිෂ්පාදන හා විවිධ කර්මාන්ත කෙරෙහි නැඹුරු කරවීම, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය ආශ්‍රිතව ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ යටතේ ව්‍යවසායකයින් 1278 ආහාර පිරිසැකසුම්, කිරි පට්ටි, ඇඳුම් මැසීම වැනි කර්මාන්ත සඳහා යොමු කෙරුණු අතර දකුණු හා ගිණිකොණ දිග ආසියා කලාපය සඳහා ප්‍රාදේශීය ජීවනෝපාය වැඩසටහන් මඟින් සුළු පරිමාණ මූල්‍ය පහසුකම් සලසා දෙමින් සුළු පරිමාණ ව්‍යවසායක කණ්ඩායම් බිහි කිරීමට කටයුතු කොට තිබෙනවා. ආර්ථික කලාප 04කට වර්ගීකරණය කරමින් මෙම කටයුත්ත ක්‍රියාත්මක වනවා. මීගමුව හා බත්තලංගුණ්ඩුව ප්‍රදේශවල ඇති කිරි පට්ටි, කොහු නිෂ්පාදන, පොල් තෙල් නිෂ්පාදන වැනි කර්මාන්ත සඳහා බලගැන්වීමක් සිදු කරනවා.

වසර 30කට ආසන්නව පැවති යුද්ධය නිමා කිරීමෙන් පසු උතුරේ පහත සඳහන් ආකාරයට ධීවර කර්මාන්තය නඟා සිටුවීම සඳහා පියවර ගෙන තිබෙනවා.

**යාපනය දිස්ත්‍රික්කය සඳහා ඉටු කරන ලද මෙහෙය.**

| | |
|---|---|
| මරුවැල් පන්න | 15 |
| ප්‍රජාශාලා ඉදිකිරීම | 2 |
| ධීවර විශ්‍රාම ශාලා ඉදිකිරීම | 4 |
| මලයිතුරෙයි ධීවර වෙන්දේසි පොළ ඉදිකිරීම | |
| කාකතිවු ජැටියට ප්‍රවේශ වීම සඳහා මාර්ගය ඉදිකිරීම | |

**කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා ඉටු කරන ලද මෙහෙය.**

| | | |
|---|---|---|
| මරුවැල් පන්න | - | 10 |
| පිටත සවිකරන එන්ජින් | - | 226 |
| දැල් කට්ටල | - | 300 |
| මිරිදිය ධීවර යාත්‍රා හා ආම්පන්න | - | 35 |
| මසුන් අලෙවි කිරීමේ පෙට්ටි සහ පාපැදි | - | 53 |
| ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම | - | 01 |
| වෙන්දේසිශාලා ඉදිකිරීම | - | 01 |

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

**මන්නාරම් දිස්ත්‍රික්කය සඳහා ඉටු කරන ලද මෙහෙය.**

| | | |
|---|---|---|
| දැල් කට්ටල | - | 4200 |
| මරුවැල් පන්න | - | 30 |
| පිටත එන්ජින් සවිකරන බෝට්ටු | - | 175 |
| පිටත සවිකරණ එන්ජින් | - | 175 |
| ධීවර නිවාස ඉදිකිරීම | - | 34 |
| ළිං ඉදිකිරීම | - | 02 |
| ධීවර එන්ජින් ගබඩා මධ්‍යස්ථාන ඉදිකිරීම | - | 01 |
| ධීවර සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම | - | 02 |
| මහාමාර්ග ඉදිකිරීම | - | 05 |
| ප්‍රජාශාලා ඉදිකිරීම | - | 01 |

තලෙයිමන්නාරම් ජැටිය සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම

**මුලතිව් දිස්ත්‍රික්කය සඳහා ඉටු කරන ලද මෙහෙය.**

| | |
|---|---|
| දැල් කට්ටල | - 7946 |
| මරුවැල් පන්න | - 60 |
| මිරිදිය ධීවර යාත්‍රා හා ආම්පන්න | - 300 |
| තෙප්පම් | - 42 |
| පිටත එන්ජින් සවිකරන බෝට්ටු | - 252 |
| පිටත සවිකරන එන්ජින් | - 252 |
| මසුන් අළෙවි කිරීමේ පෙට්ටි සහ පාපැදි | - 154 |
| ධීවර යාත්‍රා (අඩි 18- අඩි 21) | - 25 |
| එන්ජින් ( අශ්ව බල 15) | - 25 |
| ජීවිතාරක්ෂක කබා | - 350 |
| අයිස් ගබඩා ඉදිකිරීම | - 01 |
| ප්‍රජාශාලා ඉදිකිරීම | - 03 |
| මහාමාර්ග ඉදිකිරීම | - 01 |

ගරු සභාපතිතුමනි, ධීවර ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය ඇති කිරීම සඳහා විශාල වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය ඉකුත් වසර තුළ දී ඉටු කෙරුණා. රුපියල් මිලියන 101ක වියදමින් වර්ග අඩි 9100 වූ ටොන් 35ක ධාරිතාවෙන් යුතු වෙළෙඳ කුටි 64කින් සමන්විත ත්‍රිකුණාමල ධීවර වෙළෙඳ පොළ විවෘත කෙරුණා. එසේම නිලාවෙලි ධීවර වරාය 2012 අගෝස්තු මස 20 දින ධීවර ජනතාවට අත්පත් කරනු ලැබුවා. මේ සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 450ක් පමණ වන අතර, ධීවර යාත්‍රා 180කට එමඟින් ඉඩ සැලසෙනවා. එසේම සාගර පර්යේෂණ දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 300ක වියදමින් සමුද්‍රිකා නෞකාව දියත් කළා. සිලාවතුර, ගන්දර, ගුරුනගර් හා කලමැටිය යන ධීවර වරායන් 04න් මිරිස්ස, හික්කඩුව, බේරුවල, ගාල්ල හා හම්බන්තොට ධීවර වරායන් ප්‍රතිසංස්කරණයට මෙවර අය වැය තුළින් රුපියල් මිලියන 2000ක් වැඩි කිරීමට යෝජනා වී තිබෙනවා.

නිලාවෙලි ධීවර වරාය මඟින් පහත වාසි ධීවර ජනතාවට අත්පත් වෙනවා.

වරායේ පහසුකම් ලබා ගන්නා ධීවරයින් සංඛ්‍යාව - 800

ඍජු ප්‍රතිලාභීන් ගණන - 1000

වක්‍ර ප්‍රතිලාභීන් ගණන - 500

ධීවර පවුල් - 568

2012 වර්ෂය සඳහා අපේක්ෂිත ධීවර අස්වැන්න - මෙ.ටො 7650

තටාකයේ ධාරිතාව හෙක්ටෙයාර් - 8

භූමි ප්‍රමාණය හෙක්ටෙයාර් - 7

ජැටිය මීටර් 1000ක් දිගය.

ඉන්ධන ධාරිතාවය ඩීසල් ලීටර - 36000

භූමිතෙල් ධාරිතාවය ලීටර් - 18000

ටොන් 10 ධාරිතාවයෙන් යුත් ශීතාගාර පහසුකම්

ජලය ලීටර් 8000ක් ගබඩාකර තැබිය හැක.

වෙන්දේසි ශාලාවක්, දැල් ශාලාවක්, ගැස් මධ්‍යස්ථානයක්, බිම් තරාදි හා වාහන නැවතුම් පොළකින් සමන්විතය.

මීට අමතරව දැල් ආම්පන්න බෙදා දීම, මිරිදිය කර්මාන්තයේ වැව් ප්‍රතිසංස්කරණය, ධීවර තොටුපළ ඉදිකිරීම සිට විශාල යටිතල පහසුකම් සංවර්ධනයක් ඉකුත් වසර තුළ හමාර කොට ධීවර ජනතාවට ලබා දී තිබෙනවා.

**ඉෆාඩ් ව්‍යාපෘතිය යටතේ යටිතල පහසුකම් (සම්පූර්ණ සහ සිදුවෙමින් පවතින)**

| | | |
|---|---|---|
| ගොඩබෑමේ මධ්‍යස්ථාන (සිංහපුර, සල්පෙ ආරු, පලච්චේනයි, කලුවන්තාර්ඩි, පාලම් මඩු, කල්ලාර්, අඩ්ඩාලච්චේනෙයි) | - | 06 |
| නැංගුරම්පොළ (වාහරෙයි, සින්නමර්තු, සුදුවැල්ල) | - | 04 |
| ධීවර පිවිසුම් මාර්ග | - | 07 |
| ප්‍රජා මධ්‍යස්ථාන | - | 21 |
| නිවාස | - | 119 |
| අපවහන පද්ධති | - | 05 |
| මුළුතැන් ගෙවල් | - | 81 |
| වැසිකිළි | - | 43 |
| පාලම් / බෝක්කු | - | 02 |
| විදුලි සැපයුම | - | 02 |
| ක්ෂුද්‍ර කර්මාන්ත (ණය සැපයුම් ගණන) | - | 1278 |
| ත්‍රිකුණාමලය මත්ස්‍ය වෙළෙඳ පොළ | - | 01 |

- සයුරෙහි දී ආරක්ෂාව තර කිරීම හා අන්තරායදායකත්වය අවම කිරීම.
- බත්තලන්ගුංඩුව, පුංචිගුංඩුව, පල්ලියවත්ත යන ස්ථානයන්හි සූර්යාලෝක කුළුණු 06ක් ස්ථාපිත කිරීම.
- මීගමුවේ මුහුදු බත් වී ඇති ස්ථානයන්හි ප්‍රතිදීප්ත පහන් ස්ථාපිත කිරීම.
- කල්පිටිය ප්‍රජාව සඳහා විවිධ ක්‍රියාකාරකම්වලින් යුක්ත වූ කුඩා බෝට්ටු භාර දීම.

ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශය ලෙස අප ධීවර ක්ෂේත්‍රයට අමතරව සංචාරක කර්මාන්තයට උර දෙනවා. තල් මසුන් නැරඹීමේ ව්‍යාපෘතිය මඟින් ඉකුත් වසරේ ඉපයූ ආදායම රුපියල් මිලියන 6.7ක්. මෙය ශුද්ධ ලාභයක් ලෙස තමයි වාර්තා වෙන්නේ. එසේම වාලච්චේන කළපුව හා නැඟෙනහිර වෙරළ සඳහා බෝට්ටු සංචාර හඳුන්වාදීමක් සිදුකර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ධීවර ක්ෂේත්‍රය නඟා සිටුවීමේ දී ධීවර පවුල්වල කාන්තාවන්, ආබාධිතයින් සඳහා වෙනම වැඩපිළිවෙළක් ද, උතුරු ප්‍රදේශයේ වෙනම කෘෂිකාර්මික වැඩසටහනක් ද, ධීවර පවුල්වල ජීවන තත්වය නඟා සිටුවීම සඳහා වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් ධීවර අමාත්‍යාංශයක් වශයෙන් ධීවර ක්ෂේත්‍රයේ නිෂ්පාදන, අළෙවිය වාගේම ධීවර ප්‍රජාවන්ගේ ජීවන තත්වය නඟා සිටුවීමටත්, තත්ත්වයේ ප්‍රමිතියට අනුකූල නිෂ්පාදන ඉදිරිපත් කිරීමටත්, යටිතල පහසුකම් සංවර්ධනය කරමින් මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව ආසියාවේ ආශ්චර්ය කරා යන ගමනේ දී සහ 2016 වසරේ දී අපේක්ෂිත ආර්ථික ඉලක්කයන් සපුරා ගැනීමට ධීවර අමාත්‍යාංශයට මහත් රුකුලක්, සවියක් වන්නට හැකියාව ඇතැයි ද ඊට අප සූදානම් යැයිද සඳහන් කළ හැකියි.

විශේෂයෙන් මෙම අමාත්‍යාංශය ශක්තිමත් ලෙස ඉදිරියට ගෙන යාමට කටයුතු කරන ගරු අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමන්ට ද, ඒ සඳහා මහා සහායක් ලබා දෙන අමාත්‍යාංශ ලේකම් ආචාර්ය දමිතා ද සොයිසා මහත්මියට ද, අප ආයතනවල සභාපතිවරුන් සහ අධ්‍යක්ෂක ජනරාල්වරු ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ විශේෂ ස්තූතිය පිරිනමන අතර, ඔබ සැමට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 131,250,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 22,100,000

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 22,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 346,230,000

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 346,230,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 1,145,550,000

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,145,550,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**285 වන ශීර්ෂය.- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 260,350,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 260,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 34,460,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 34,460,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 1,956,170,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,956,170,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 1,498,100,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,498,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 131,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச்
செலவு ரூபா 22,100,000

"தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 22,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 346,230,000

"தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 346,230,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச்
செலவு ரூபா 1,145,550,000

"தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,145,550,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 285.- கமத்தொழில் திணைக்களம்**

நிகழ்ச்சித் திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 260,350,000

"தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 260,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச்
செலவு ரூபா 34,460,000

"தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 34,460,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,956,170,000

"தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,956,170,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,498,100,000

"தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,498,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 131,250,000, for Head 118, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 22,100,000

Question, "That the sum of Rs. 22,100,000, for Head 118, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 346,230,000

Question, "That the sum of Rs. 346,230,000, for Head 118, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 1,145,550,000

Question, "That the sum of Rs. 1,145,550,000, for Head 118, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**HEAD 285.- DEPARTMENT OF AGRICULTURE**

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 260,350,000

Question, "That the sum of Rs. 260,350,000, for Head 285, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 34,460,000

Question, "That the sum of Rs. 34,460,000, for Head 285, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 1,956,170,000

Question, "That the sum of Rs.1,956,170,000, for Head 285, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,498,100,000

Question, "That the sum of Rs.1,498,100,000, for Head 285, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"179 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 76,265,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

179 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 13,650,000

"179 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 13,650,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

179 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 37,866,840,000

"179 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 37,866,840,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

179 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 129,450,000

"179 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 129,450,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

179 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**281 වන ශීර්ෂය.- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 229,385,000

"281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 229,385,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 56,000,000

"281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 56,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 3,238,900,000

"281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,238,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 474,000,000

"281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 474,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**284 වන ශීර්ෂය.- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 531,610,000

"284 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 531,610,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

284 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 642,900,000

"284 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 642,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

284 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 76,265,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச்
செலவு ரூபா 13,650,000

"தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 13,650,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ்
செலவு ரூபா 37,866,840,000

"தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 37,866,840,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச்
செலவு ரூபா 129,450,000

"தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 129,450,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 179, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 281.- கமநல அபிவிருத்தித் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 229,385,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 229,385,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 56,000,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 56,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 3,238,900,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 3,238,900,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 474,000,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 474,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 284.- வனவிலங்குப் பாதுகாப்புத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 531,610,000

"தலைப்பு 284, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 531,610,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 284, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 642,900,000

"தலைப்பு 284, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 642,900,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 284, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 76,265,000, for Head 179, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 179, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 13,650,000

Question, "That the sum of Rs. 13,650,000, for Head 179, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 179, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs.37,866,840,000

Question, "That the sum of Rs. 37,866,840,000, for Head 179, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 179, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 129,450,000

Question, "That the sum of Rs. 129,450,000, for Head 179, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 179, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**HEAD 281.- DEPARTMENT OF AGRARIAN DEVELOPMENT**

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 229,385,000

Question, "That the sum of Rs. 229,385,000, for Head 281, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 56,000,000

Question, "That the sum of Rs. 56,000,000, for Head 281, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 3,238,900,000

Question, "That the sum of Rs. 3,238,900,000, for Head 281, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 474,000,000

Question, "That the sum of Rs. 474,000,000, for Head 281, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**HEAD 284.- DEPARTMENT OF WILDLIFE CONSERVATION**

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 531,610,000

Question, "That the sum of Rs. 531,610,000, for Head 284, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 284, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 642,900,000

Question, "That the sum of Rs. 642,900,000, for Head 284, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 284, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

"140 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 150,406,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

140 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 126,230,000

"140 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 126,230,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

140 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,748,500,000

"140 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,748,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

140 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**292 වන ශීර්ෂය.- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 311,556,000

"292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 311,556,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 60,400,000

"292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 60,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 472,500,000

"292 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 472,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 140, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 150,406,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 140, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 126,230,000

"தலைப்பு 140, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 126,230,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 140, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,748,500,000

"தலைப்பு 140, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,748,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 140, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 292 .- விலங்கு உற்பத்தி சுகாதாரத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 311,556,000

"தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 311,556,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 60,400,000

“தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 60,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 472,500,000

“தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 472,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 150,406,000, for Head 140, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 140, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 126,230,000

Question, "That the sum of Rs. 126,230,000, for Head 140, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 140, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,748,500,000

Question, "That the sum of Rs. 1,748,500,000, for Head 140, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 140, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**HEAD 292. - DEPARTMENT OF ANIMAL PRODUCTION AND HEALTH**

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 311,556,000

Question, "That the sum of Rs. 311,556,000, for Head 292, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 60,400,000

Question, "That the sum of Rs. 60,400,000, for Head 292, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 472,500,000

Question, "That the sum of Rs. 472,500,000, for Head 292, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

“139 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 154,834,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

139 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 58,450,000

“139 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 58,450,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

139 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 475,050,000

“139 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 475,050,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

139 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,394,500,000

“139 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 1,394,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

139 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**290 වන ශීර්ෂය.- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 246,688,000

"290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 246,688,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 357,800,000

"290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 357,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 154,834,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 58,450,000

“தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 58,450,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 475,050,000

“தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 475,050,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,394,500,000

“தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,394,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 139, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 290.- கடற்றொழில், நீர்வளங்கள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 246,688,000

“தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 246,688,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 357,800,000

“தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 357,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 154,834,000, for Head 139, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 139, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 58,450,000

Question, "That the sum of Rs. 58,450,000, for Head 139, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 139, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 475,050,000

Question, "That the sum of Rs. 475,050,000, for Head 139, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 139, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,394,500,000

Question, "That the sum of Rs. 1,394,500,000, for Head 139, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 139, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**HEAD 290.- DEPARTMENT OF FISHERIES AND AQUATIC RESOURCES**

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 246,688,000

Question, "That the sum of Rs. 246,688,000, for Head 290, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 290, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 357,800,000

Question, "That the sum of Rs. 357,800,000, for Head 290, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 290, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

*එකල්හි වේලාව අ. භා. 6.00 වුයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.*

*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2012 නොවැම්බර් 24 වන සෙනසුරාදා.*

*அப்பொழுது நேரம் பி. ப. 6.00 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2012 நவம்பர் 24, சனிக்கிழமை.*

*It being 6.00 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Saturday, 24th November, 2012.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු විජිත බේරුගොඩ මහතා.

Order, please! Will an Hon.Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

## "වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය" මැඩලීම
## "வெலிகம தென்னோலை வாடல்' நோயை" கட்டுப்படுத்தல்
## CONTROL OF "WELIGAMA COCONUT LEAF WILTING DISEASE"

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයන් ආශ්‍රිතව 'වැලිගම කොළ මැලවීමේ' රෝගය හේතුවෙන් පොල් ගස් ලක්ෂ 03කට අධික ප්‍රමාණයක් දැනට ජනතාවට අහිමිව තිබේ. මේ රෝගය තවදුරටත් පැතිර ගියහොත් එදා පොල් පිට රට පටවමින් අප රටේ ඇති කළ ජාතික අභිමානය අහිමි වන තත්ත්වයක් උද්ගත විය හැකිය.
>
> එහෙයින් මෙම රෝගය මැඩලීම සඳහා කටයුතු කොට, එමගින් පොල් නිෂ්පාදනය වැඩි කරලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුවට යෝජනා කර සිටිමි."

ශ්‍රී ලංකාවේ මහා පරිමාණයේ නිෂ්පාදනය කරන වගාවන් අතර පොල් වගාවට ප්‍රධාන තැනක් හිමි වනවා. පොල් ගසේ නිජ භූමිය විධියට හඳුන්වන්නේ මැලේසියාව එහෙම නැත්නම් ඉන්දුනීසියානු දූපත්. එහෙම ආරම්භ වුණු මේ පොල් වගාවන් බොහෝ ඈත අතීතයේදී නැව්වලින් රැගෙන විත් හෝ එහෙමත් නැත්නම් මුහුදේ ගසා ගෙන ඇවිත් ලංකාවේ පොල් වගාව ව්‍යාප්ත වුණා කියලා තමයි ඉතිහාසයේ දකින්නේ. අද පොල් ගස මේ රටේ ජනතාවත් එක්ක බද්ධ වෙලා, මිනිසාට නැතුවම බැරි ශාකයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා වැවිලි කර්මාන්තයේ හදවත විධියටත් මෙය අපට හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම සාමාන්‍ය ජනතාවගේ කල්ප වෘක්ෂය විධියටත් හඳුන්වන්නේ පොල් ගසයි. ජනතාවට නොමසුරුව පොල් ගසේ තිබෙන හැම දෙයක්ම පරිත්‍යාග කරන නිසාවෙන් මේ ශාකය ගැන අද ජනතාවගේ සිත් තුළ බැඳීමක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ පොල් වගාව අපි ආරක්ෂා කර ගන්න ඕනෑ.

කෘෂි කර්මාන්තයේ ප්‍රධාන කොටස් දෙකක් තිබෙනවා. ඒ තමයි පාරිභෝගික කෘෂි කර්මාන්තය හා වැවිලි කෘෂි කර්මාන්තය. වැවිලි කෘෂි කර්මාන්තයේ තේ සහ රබර් වගාව ඇරුණාම පොල් වගාව අපනයන ආදායමක් ලබා දෙන භෝගයක්. 2011 වර්ෂයේදී රුපියල් බිලියන 47.3ක ආදායමක්, 2010 දී රුපියල් බිලියන 32ක පමණ ආදායමක් මේ පොල්වලින් උපයනු ලැබුවා කියන කාරණය මේ අවස්ථාවේදී සිහිපත් කරන්නට ඕනෑ. ඒ වාගේම දළ දේශීය නිෂ්පාදිතයට සමස්ත වැවිලි භෝග වගාවෙන් එකතු කරන්නේ සැලකිය යුතු ප්‍රතිශතයක්. ඒ වාගේම පොල් වගාවෙනුත් සියයට 1.1ක වාගේ ප්‍රතිශතයක් ජාතික නිෂ්පාදනයට එකතු කරනවා.

ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල වාර්ෂික පොල් පරිභෝජනය පොල් ගෙඩි 116ක් විතර වනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ ජනතාවගේ දෛනික ආහාර වේලක අඩංගු කැලරි ප්‍රමාණයෙන් සියයට 15ක් පමණ පොල්වලින් ලබා දෙනවා. ඒ වාගේම ප්‍රෝටීන්වලින් සියයට 5ක් ලබා දෙන්නේ මේ පොල්වලින්. ශ්‍රී ලාංකික ජනතාවගේ ආදායමෙන් සියයට 5ක් පමණ පොල් වගාව ආශ්‍රයෙන් ලබා දෙනවා. පොල් ඉඩම්වලින් සියයට 56.42ක, එහෙමත් නැත්නම් පොල් වගාවෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයක දායකත්වය ලබන්නේ පොල් ත්‍රිකෝණයෙන්; එනම් ගම්පහ, කුරුණෑගල, හලාවත ඇතුළු ප්‍රදේශවලිනුයි. ඊට අමතරව, දකුණේ සහ නැගෙනහිර වෙරළබඩ තීරවල සමස්තයක් විධියට

ගත්තොත් රටේ හැම ගෙවත්තකම වාගේ පොල් වගා කරනවා. ඒ පොල් වගා කරන්නේ විශේෂයෙන් අපි දන්නවා, ජනතාවගේ ආහාර වේලට විශේෂයෙන්ම පොල් නැතුවම බැරි නිසායි. ආහාරය රසවත් කර ගන්න වාගේම දෛනික ආහාර වේලටත් පොල් අවශ්‍ය වෙනවා. දුගී පැල්පතක ඉන්න මිනිසාගේ සිට මහා මැදුරුවල ගත කරන ධනවතුන්ටත් මේ පොල් අත්‍යවශ්‍යයි. ඒ නිසා රටක් විධියට අතිගරු ජනාධිපතිතුමා මේ රටේ කෘෂි කර්මාන්තය පාදක කර ගෙන ජාතික ආර්ථිකයක් ගොඩ නඟන්න විශාල සැලසුම් හදලා විශාල උත්සාහයක් දරන අවධියේ මේ පොල් වගාව අපි ආරක්ෂා කර ගන්නට ඕනෑ.

අපි දකිනවා, 2010 වසරේදී මේ රටේ පොල් නිෂ්පාදනය අඩු වුණු බව. පොල් මිල ඉහළ ගියා. විපක්ෂය ජනතාව අතරට ගිහිල්ලා "පොල් නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. මේකට බලධාරින්ගේ විශේෂ අවධානයක් යොමු වෙලා නැහැ, ඒ නිසා පොල් පිටරටින් ගෙන්වන්න සිද්ධ වෙනවා." කියමින් රජය අපහසුවට පත් වන මතවාද පැතිරුවා. ඒ වෙලාවේ තමයි අතිගරු ජනාධිපතිතුමා, මේ පොල් නිෂ්පාදනය වැඩි කරලා ජාතික ඵලදාව වැඩි කරලා අපනයන ආදායම වැඩි කරලා මේ රටේ සමස්ත පොල් නිෂ්පාදනය වැඩි කරන්න තරුණ මන්ත්‍රීවරයකු වූ ගරු ජගත් පුෂ්පකුමාර මැතිතුමාට මේ විෂය පැවරුවේ. අද එතුමා ඒ ඉලක්කය කරා මේ අමාත්‍යාංශය මෙහෙයවමින් ඉන්නවා. අද පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, සීමාසහිත හලාවත වැවිලි සමාගම, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම එතුමාගේ අමාත්‍යාංශයට ඇතුළත් වෙලා තිබෙනවා. මම දකිනවා, පොල් කර්මාන්තය නංවාලීම සඳහා ජගත් පුෂ්පකුමාර ඇමතිතුමාට පැහැදිලි දර්ශනයක් සහිත වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා. එතුමා ගමින් ගමට යමින් "කප්රුක පුරවර" වැඩසටහන ක්‍රියාත්මක කරමින්, "කප්රුක සමිති" පිහිටුවමින් පාසල්වල හය වසරෙන් ඉහළ ළමයින්ට පොල් පැළ දීලා ඒවා තම ගෙවත්තේ වගා කරන්නට උපදෙස් ලබා දෙමින් පාසල් දරුවන්ගේ සිට පොල් වගාව පිළිබඳව දැනුවත්කමක් ලබා දෙන්න කටයුතු කරනවා.

අපේ සංස්කෘතිය අනුව ජන ජීවිතයත් එක්ක බැඳිලා තිබෙන වගාවක් තමයි පොල් වගාව. ඒ නිසා අපට අමතක කරන්න බැරි ලෙස අපේ ජීවන රටාව, ආහාර රටාව යන සියලු දෙයටම පොල් වෘක්ෂය අපට වැදගත් වෙනවා. අනාදිමත් කාලයක ඉඳලා අපේ ජන ජීවිතය තුළට, ජනතාවගේ සිතුම් පැතුම්වලට පොල් වෘක්ෂය බද්ධ වෙලා තිබෙනවා. සෞභාග්‍යයේ සහ සමෘද්ධියේ සංකේතය විධියට පොල් මල සහිත පුන්කලස අපේ සමාජ සංස්කෘතියේ අනන්‍යතාව පෙන්නුම් කරන අංගයක් වෙලා තිබෙනවා. ප්‍රඥාවේ සහ බුද්ධියේ පරිපූර්ණත්වයේ සංකේතයක් විධියට පොල් තෙල් පහන සලකනවා. සමාජ ජීවිතයේදී අපි දකිනවා විවිධ අවස්ථාවල ගොක් කොළවලින් සැරසිලි කරනවා. ඒ නිසා තමයි පොල් ගස කල්ප වෘක්ෂයක් විධියට අප හඳුන්වන්නේ.

අවුරුදු 2500ක් වූ අපේ බෞද්ධ ඉතිහාසයේ සිට මෙතෙක් පැවත ගෙන ආපු අපේ පොල් වගාව අනාගත පරපුරටත් සංරක්ෂණය කරලා, ආරක්ෂා කර දීලා පරම්පරාවෙන් පරම්පරාවට පවත්වා ගෙන යන්න අපි ඇත්තටම අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. අපි පොල් වගා කරන භූමි ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ. පොල් නිෂ්පාදනය වැඩි කර ගන්න ඕනෑ. එමඟින් අපේ අපනයන ආදායම වැඩි කර ගන්න ඕනෑ. දැනට පොල් වගාව පැතිරිලා තිබෙන පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශ ආර්ථික වටිනාකමකින් යුතු භූමි හැටියට හඳුන්වන්න පුළුවන්. අද ඒවා ජනාකීර්ණ ප්‍රදේශ වෙලා තිබෙනවා.

ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවලා තිබෙන්නේත් ඒ ප්‍රදේශවලයි. ඒ පොල් ගස් තිබෙන ඉඩම්වල ආර්ථික වටිනාකම වැඩි නිසා සමහර වෙලාවට වෙනත් කටයුතු සඳහා යොදවනවා. ඒ නිසා පොල් ඉඩම් අඩු වන කොට, පොල් වගාව ක්‍රමයෙන් අඩු වන කොට, අනෙක් පැත්තෙන් ජනගහනය වැඩි වන කොට විවිධ රෝගවලට මේ පොල් වෘක්ෂය ගොදුරු වීම නිසා අපේ පොල් ඵලදාව අඩු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, පොල් වගාවට සතුන් සහ පළිබෝධකයෝ හානි කරන බව. පොල් ගස පුංචි කාලයේ සිට වේයා, කළු කුරුමිණියා, රතු කුරුමිණියා, වල් ඌරන්, ඉත්තෑවන්, ඌරු මීයන්, පොල් කොළ දළඹුවන්, පොල් මයිටාවා, දඬුලේනුන්, රිළවුන් යනාදී පළිබෝධකයන් සහ සතුන් පොල් වගාව විනාශ කිරීම සඳහා බොහෝ ක්‍රියාකාරකම් කරනවා. ඒවායෙනුත් අපි පොල් ගස ආරක්ෂා කර ගන්න ඕනෑ. හරියට දත් 32 මැද්දේ තිබෙන දිව වාගේ අපේ පොල් වගාව ආරක්ෂා කළ යුතුයි.

වැලිගම කොළ මැලවීමේ රෝගය මෑතකදී තමයි -2006 ඉඳලා - ආරම්භ වුණේ. ඒ රෝගය වැලිගමෙන් ආරම්භ වෙලා අද හම්බන්තොට, ගාල්ල, මාතර වාගේ ප්‍රදේශ පුරා බලවත් ව්‍යසනයක් විධියට පැතිරිලා ගිහින් තිබෙනවා. එයින් පොල් ගස් ලක්ෂ තුනක් විතර විනාශයට පත් වෙලා තිබෙනවා. සමහර පොල් වගා කරන අපේ ගොවීන් කැමැති නැහැ ඒ පොල් ගස් විනාශ කරන්න. මොකද, ඒ ගස්වල ඵලදාව තිබෙනවා. ඵලදාව තිබෙන කොටම රෝගයට ගොදුරු වෙලා තිබෙන නිසා ඵලදාව දැක දැක ගස් ඉවත් කිරීමට විරෝධය පළ කරනවා. අනෙක් එක ඒගොල්ලන්ගේ බලාපොරොත්තුවක් තිබෙනවා, කොළ මැලවීමේ රෝගය ඉවත් වුණොත් පොල් වගාව යථාවත් වෙයි කියලා. සමහර වෙලාවට ඒ අය ජීවත් වෙන්නේ පොල් වගාවෙන්. මා ඉස්සර වෙලා කිව්වා වාගේ මේ රටේ ජනතාවගෙන් සියයට 5ක් විතර පොල් වගාව ආශ්‍රයෙන් තමයි ජීවනෝපාය ශක්තිමත් කර ගන්නේ. ඒ නිසා අපට ඒ අය ගැන හිතන්න වෙනවා. ඒගොල්ලන්ට ජීවත් වීමට ආදායම් මාර්ගයක් යථාවත් කර ගන්නට යම් කිසි ජීවනෝපායකට ඒ අය යොමු කරන්න අපේ ගරු අමාත්‍යතුමාට මූලිකත්වය දෙන්න වෙනවා.

අපට ප්‍රශ්නයක් තිබෙනවා මේ කොළ මැලවීමේ රෝගය තිබෙන්නේ ලංකාවේ විතරද කියලා. පොල් වගා කරන රටවල් ලෝකයේ තව තිබෙනවා. පිලිපීනය, කේරළය, ඉන්දුනීසියාව, මැලේසියාව වගේ රටවල්වල පොල් වගා කරනවා. මේ රෝගය ඒ රටවලටත් බලපාලා තිබෙනවාද? එහෙම බලපාලා තිබෙනවා නම් ඒවාට පර්යේෂණ කරලා තිබෙනවාද? පර්යේෂණවලින් සාර්ථක ප්‍රතිඵල ලැබිලා තිබෙනවා නම් ඒවා ලංකාවට ආදේශ කරලා තිබෙනවාද? ගරු අමාත්‍යතුමා මේ ගරු සභාව ඒ ගැන දැනුවත් කළොත් වඩා හොඳයි කියලා අප විශ්වාස කරනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමාගෙන් ඇසිය යුතු පුංචි ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මෙම රෝගය වැළැක්විය හැකිද? මෙම රෝගය වැළැක්විය නොහැකි නම් ඒ සඳහා ගන්නා විකල්ප ක්‍රියාමාර්ග මොනවාද යන්න ගරු අමාත්‍යතුමා මේ ගරු සභාවට පැහැදිලි කරනවාද? ඒ වාගේම රෝගය වැලඳුණු ගස් පිළිබඳව යම් කිසි විද්‍යාත්මක පර්යේෂණයක් කර තිබෙනවාද? පර්යේෂණ කර ඇත්නම් ඒවායේ නිර්දේශ මොනවාද? ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරලා තිබෙනවාද? පොල් වගා කරන රටවල් පිළිබඳව මම කලිනුත් සඳහන් කළා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තව මන්ත්‍රීතුමන්ලා තුන් දෙනෙක් කථා කිරීමට නියමිතව තිබෙනවා.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව පොඩි කොටසක් විතරයි මට කියන්න තිබෙන්නේ. ඒ නිසා මට තව සුළු වෙලාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

මේ කරුණු පිළිබඳව ගරු අමාත්‍යතුමා විශේෂ ප්‍රකාශයක් සමඟ පැහැදිලි කිරීමක් කරනවා නම් වඩා හොඳයි. ඊට අමතරව මම කිව්වා, ජාතික ආර්ථිකයේ හදවත විධියට පොල් කර්මාන්තය හඳුන්වන්න පුළුවන්ය කියා. ඒ විෂයය හරියට කරන්න පුළුවන් අමාත්‍යවරයකුට ජනාධිපතිතුමා ඒ වගකීම බාර දී තිබෙනවා. එතුමාගෙන් ඇසිය යුතු තවත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මහජන නියෝජිතයන්, ඒ වාගේම රටේ ජනතාව ඒ පිළිබඳව දැනුවත් විය යුතුයි කියා මා විශ්වාස කරනවා.

රටේ පොල් අස්වැන්න වැඩි කිරීමට අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළවල් මොනවාද, ඒ අනුව පොල් අස්වැන්න පිළිබඳව කර ඇති පුරෝකථන මොනවාද, එමෙන්ම 2010 වර්ෂයේ මෙන් නැවතත් පොල් හිඟයක් ඇති වේවිද යන කරුණු පිළිබඳව සංඛ්‍යා ලේඛන සහිතව ගරු අමාත්‍යතුමා විසින් මේ ගරු සභාවට කරුණු කාරණා පැහැදිලි කරනවා නම් වඩා හොඳයි. ඒ වාගේම මෙම රෝගය වැළඳී ඇති පොල් වගාවන් තිබෙන ප්‍රදේශවල ජනතාවගේ ආදායම් තත්ත්වය දියුණු කිරීමට ගෙන ඇති කෙටි කාලීන හා දිගු කාලීන වැඩ පිළිවෙළවල්, මධ්‍යකාලීන වැඩ පිළිවෙළවල් මොනවාද, මේ සියල්ල සඳහා අමාත්‍යාංශයට යම් වැඩ පිළිවෙළක් තිබේද යන කරුණු පිළිබඳව ගරු ඇමතිතුමා කරුණු ඉදිරිපත් කරන්නේ නම් ඉතා වැදගත් යයි මා කල්පනා කරනවා. මූලාසනයෙන් කථාව අවසන් කරන්නටය කියන නිසා මම තව වචන කිහිපයක් පවසා මගේ කථාව අවසන් කරනවා. තරුණ අමාත්‍යවරයෙක් විධියට ගරු ජගත් පුෂ්පකුමාර මැතිතුමා, පොල් කර්මාන්තයට එල්ල වෙලා තිබෙන බාධක, අභියෝග, තර්ජනවලට සාර්ථක විසඳුමක් ලබා දී මේ රටේ පොල් නිෂ්පාදනය වැඩි කරලා, අනාගත පරපුරට මහා පවුරක් විධියට මේ පොල් වගාව සංරක්ෂණය කරලා, සුරක්ෂිත කරලා අනාගතය වෙනුවෙන් කටයුතු කරාවිය කියන විශ්වාසය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා ඉතාමත් වටිනා, කාලෝචිත යෝජනාවක් මේ ගෞරවනීය සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනාව අනුව අද අපේ උතුම් වගාවක් වන පොල් වගාව රැක ගැනීම -ආරක්ෂා කර ගැනීම- ඉතාමත් වැදගත් වෙනවා. විශේෂයෙන්ම දකුණු පළාතේ වැලිගම ප්‍රදේශයේ ඇති වුණු මෙම භයානක කොළ මැළවීමේ හා කුණු වීමේ රෝගය අද බරපතළ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒක නිසාම අද ලක්ෂ තුන හමාරකට වැඩි පොල් ගස් සංඛ්‍යාවක් ගලවා ඉවත් කරන්න සිදු වෙලා තිබෙනවා. සමහර අය මේ රෝගය වැළඳුණු පොල් ගස් තවදුරටත් තබා ගෙන කටයුතු කිරීම නිසා ඉදිරියට තවත් අමාරු තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. මුළු පොල් සංහතියටම, ඇතැම් විට මුළු ලංකාවටම රෝගය බෝ වෙලා ලංකාවෙන් පොල් වගාව තුරන් වෙයි කියන මහා භයක් දැන් අප කා තුළත් ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ආර්ථිකය පිළිබඳව අමුතුවෙන් කිව යුතු දෙයක් නැහැ. ලංකාවේ ආර්ථිකය ගැන කථා කරනකොට ප්‍රධාන වගාවන් වශයෙන් තේ, පොල් රබර්, කියා තමයි අපි කියන්නේ. අනිවාර්යයෙන්ම ආර්ථිකයේදී පොල් වගාව දෙවන ගණයට වැටෙනවා. ඒ නිසා "පොල්" කියන්නේ අප විසින් අපනයනය කරන ප්‍රධාන භෝගයක්. විදේශ විනිමය විශාල ලෙස ගලා ගෙන එන කර්මාන්තයක් හැටියට පොල් කර්මාන්තය අපට හඳුන්වන්න පුළුවන්. යම් යම් කාලවලදී ලංකාවේ පොල් අපනයනය අඩු වෙලා තිබෙනවා. නමුත් අද පොල් කර්මාන්තය වැටෙන්නේ නැතිව හරියට කර ගන්න පුළුවන්කමක් තිබෙනවා නම්, විදේශ විනිමය අපේ රටට ගලාගෙන එන කර්මාන්තයක් හැටියට අපි මේ කර්මාන්තය දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් කර්මාන්තය ගැන බලන විට අද අපට යම් කිසි සුබ ගමනක් යන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා. ඊට හේතුව අපේ ඇමතිතුමායි. අද අපේ ගරු ඇමතිතුමා දවසේ පැය විසි හතරම ඒ සඳහා මිඩංගු කරනවා. පොල් කර්මාන්තය පිළිබඳ විවිධ විශ්ලේෂණ ඉදිරිපත් කරමින්, විවිධ දුර්වල පැති බිඳ දමමින් පොල් කර්මාන්තය ඉහළම තත්ත්වයට ගෙනෙන්නට එතුමා අද කටයුතු කර ගෙන යන බව අපට පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මහින්ද චින්තනයට අනුගත වුණු "දිවි නැගුම" ව්‍යාපෘතිය යටතේ අද පොල් වගාවට සුවිශේෂ ස්ථානයක් ලබා දී තිබෙනවා. අද එතුමා වෙනම නිර්මාණයක් කරනවා, මුළු ශ්‍රී ලංකාව පුරාම පොල් පැළ ලක්ෂ ගණනක් බෙදා හරින්නට. ඒ වාගේම පොල් කර්මාන්තය ඉතාම නිශ්චිත, පැහැදිලි කර්මාන්තයක් හැටියට කර ගෙන යන්නට අවශ්‍ය සියලුම විශේෂඥ උපදෙස් පොල් සංවර්ධන මණ්ඩලයෙන් සපයන්න තරම් අද එතුමා ඒවා ශක්තිමත් කර තිබෙනවා. ඉස්සර නම් පොල් පැළ බෙදනවාය කිව්වාම ජනතාව ඇවිල්ලා, පොල් පැළ තුන හතරක් හරි අරගෙන යනවා. සාමාන්‍ය ජනතාව ඒවා ගෙවල්වලට අරගෙන ගියාම ඒවා තියපු තැනම මුල් අදිනවා. ඒ අයට ඒවා හිටුවන්න උනන්දුවක් නැහැ. සමහර වෙලාවට ඒ පොල් පැළ තිබුණු තැන්වලම මුල් ඇදලා ඒවා විශාල ගස් බවටත් පරිවර්තනය වෙලා.

අද එහෙම නැහැ. අද ඒ සඳහා ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. පොල් පැළය දෙන්න නම් අද අනිවාර්යයෙන් වළ කපන්න ඕනෑ. පොල් පරීක්ෂණ නිලධාරි මහත්මයෙක් ගිහින් අනිවාර්යයෙන්ම එය බලන්න ඕනෑ. උපදේශන සේවා සපයන්න ඕනෑ. ඊට පස්සේ තමයි සිටු වන්න පොල් පැළ ටික දෙන්නේ. ඒවාට අවශ්‍ය පොහොර ඇතුළු සියලුම දේ විශේෂඥ උපදෙස් මාර්ගයෙන් එතුමා සපයනවා. ඒ අනුව සාර්ථක පොල් වගාවකට ලංකාව පදනම් දමා තිබෙනවා. එයට හිමිකම් කියා ගෙන යනවා. එම නිසා අපේ වර්තමාන ඇමතිතුමා යටතේ පොල් වගාව පිළිබඳ කිසියම් විශ්වාසයක් හා බලාපොරොත්තුවක් ගොඩ නඟා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අවාසනාවට අද පොල් වගාවට විවිධ රෝග ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගොබ කුණු වීම, අංකුර කුණු වීමේ රෝගය, කඳෙන් වෑහීමේ රෝගය, පත්‍ර අංගමාරය, ගනෝඩර්මා රෝගය -එය පස ආශ්‍රිත රෝගයක් හැටියටයි අප හඳුන්වන්නේ-, ඒ වාගේම කළු කුරුමිණි හානිය, වැලිගම කොළ මැලවීමේ හා කුණු වීමේ රෝගය, රතු කුරුමිණි රෝගය වැනි රෝග ගණනාවක් අද පොල් කර්මාන්තයට බෝ වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. කථා කරන්න තව මන්ත්‍රීවරයෙක් ඉන්නවා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
එම නිසා අද ලොකු සටනක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. කුරුණෑගල, හලාවත, කොළඹ පොල් ත්‍රිකෝණය පිළිබඳව අද ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ සඳහා ඇමතිතුමා අද විශාල වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පොල් කර්මාන්තය පිළිබඳව ඉතාමත් විධිමත් වැඩසටහනක් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක වීම පිළිබඳව අපි ඉතා සන්තෝෂ වනවා. එවැනි තත්ත්වයක් තුළ අපේ අපනයන භෝගයක් හැටියට, ඒ වාගේම ජාතික අපනයන භෝගයක් හැටියට පොල් කර්මාන්තය සුවිශේෂී ස්ථානයක තබා ගන්න පුළුවන්ය කියන හැඟීම අද අපට මතු වෙලා තිබෙනවා. ඒ වාගේම මෙවැනි දේශීය අපනයන භෝගයක් මෙන්ම ආර්ථිකයේ ප්‍රධාන භෝගයක් පිළිබඳව මෙම සභාවට කරුණු ඉදිරිපත් කරමින්, ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාව සලසා දුන් අපේ විජිත බේරුගොඩ මැතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉතාම වැදගත් මෙම යෝජනාව සම්බන්ධයෙන් පොල් ත්‍රිකෝණය නියෝජනය කරන මහජන නියෝජිතයකු හැටියට මට අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. මේ කාර්යයේදී විශේෂයෙන්ම අපේ ගරු ඇමතිතුමාගේ කැප වීම පිළිබඳව මා මුලින්ම අගය කරනවා. මොකද, අගය කළ යුත්ත අපි අගය කරන්න ඕනෑ. මා හිතන හැටියට අපේ අතිගරු ජනාධිපතිතුමා අපේ ජගත් පුෂ්පකුමාර ඇමතිතුමාට මෙම අමාත්‍යාංශය භාර දුන්නේ අභියෝගයකුත් එක්කයි. අපි දැක්කා, සමහර අවස්ථාවක විවිධ රූපවාහිනී නාළිකාවල වාද විවාදවලට සහභාගි වෙන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන් එන කොට එතුමන්ලා පොල් බෑ දෙකක් අරගෙනයි ආවේ කියලා. පොල් බෑ දෙක අරගෙන ඇවිල්ලා මේ පොල් බෑයේ ගණන මේකයි, මේ පොල් බෑයේ ගණන මේකයි කියා රට තුළ විශාල වශයෙන් ආන්දෝලනයක් ඇති කළා. ඇත්තෙන්ම එම අවස්ථාවේදී පොල් මිලත් වැඩි වෙලා තිබුණා. ඒ සම්බන්ධයෙන් ක්‍රමානුකූලව, නිර්මාණශීලී වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යන්න කියලා අතිගරු ජනාධිපතිතුමා ජගත් පුෂ්පකුමාර අමාත්‍යතුමාට මෙම අමාත්‍යාංශය භාර දුන්නාට පස්සේ ඉතාම ක්‍රමානුකූලව ඒ වැඩ පිළිවෙළ දියත් කරලා, අද ජනතාවගේ ආහාරය සඳහා ගන්න පොල් පිළිබඳව තිබුණු ප්‍රශ්නය විසඳා ගෙන, එම තත්ත්වය සාමාන්‍ය වශයෙන් පාලනය කර ගෙන යන්න පුළුවන් වාතාවරණයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අද විපක්ෂයටත් ඒ පිළිබඳව කිසිම හඬක් නඟන්න බැරි තත්ත්වයකට පත් කරන්න හැකියාව ලැබී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම ඒ වෙනුවෙන් නිලධාරින්ගේ කැප වීම පිළිබඳවත් මා කියන්න ඕනෑ. අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කවල සේවය කරන නිලධාරින් ඉතාම හොඳින් වැඩ කටයුතු කරන බව අපි මේ පාර්ලිමේන්තුවේදී කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. ඒ අය ඉතාම උනන්දුයි. ඒ අය අපව සොයා ගෙන එනවා. අපේ අදහස් හා යෝජනා එක්ක ගමේ ජනතාව වෙනුවෙන් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයේ හා පොල් සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරින් කටයුතු කර ගෙන යන බවත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මට තව විනාඩි දෙකක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට විනාඩි 7යි තිබෙන්නේ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
විශේෂයෙන්ම සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පාඩු ලබන ආයතන අතරයි තිබුණේ. හැබැයි ඒ ආයතනය ලාභ ලබන තත්ත්වයට පත් කරන්න මේ කාලය තුළදී හැකියාව ලැබී තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා මේ අවස්ථාවේදී එම කාරණයත් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම පොල් වගාකරුවන්ට විශාල සහන ලබා දී තිබෙන බවත් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ දී ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අද උදේ වරුවේත් මා පඩුවස්නුවර ප්‍රදේශයේ අවමඟුල් කටයුත්තකට සහභාගි වන්නට ගියා. ඒ ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම කොහු ආශ්‍රිත කර්මාන්තයේ යෙදෙන අය ඉන්නේ. පොල් වගාව ආශ්‍රිත කර්මාන්තවල යෙදෙන අය තමයි ඉන්නේ. ඒ අයගේ පහසුකම් පිළිබඳව සොයා බලන්න ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳයි කියන එකත් මතක් කරන්නට කැමැතියි. ගරු ඇමතිතුමනි, අද පොල් කර්මාන්තයට විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි. මීළඟට ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පිළිතුරු දෙන්න ගරු ඇමතිතුමාට විනාඩි 10ක් අවශ්‍යයි. නමුත් තව විනාඩි 06යි ඉතිරි වෙලා තිබෙන්නේ.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
අපි තව විනාඩි 05ක් වැඩි කර ගනිමු.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බැහැ. ස්ථාවර නියෝග අනුව පස් වරු 6.30ට සභාවේ කටයුතු අවසන් කරන්නට ඕනෑ.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පළමුවෙන් ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම ගරු වික්ටර් ඇන්තනි මන්ත්‍රීතුමාටත්, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වනවා, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරමින් රටේ ජනතාව දැනුවත් කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන.

විශේෂයෙන්ම මේ රටේ පොල් වගාවට ඇති වුණු භයානක රෝගයක් තමයි, වැලිගම ප්‍රදේශයේ පොල් ගස්වලට බෝ වුණු කොළ මැලවීමේ සහ කොළ කුණු වීමේ රෝගය. 2006 වර්ෂයේ දී අපි ඒ පිළිබඳව දැන ගෙන සමීක්ෂණයක් කළා. එහිදී වාර්තා වුණා, ලක්ෂ තුනහමාරක් පමණ පොල් ගස් ඉවත් කිරීමට සිදු වෙයි කියලා. අපි මේ ගැන විශේෂ අවධානය යොමු කරලා 2010 වර්ෂයේ දී පොල් ගස් 17,280ක්, 2010 වර්ෂයේ දී 75,535ක්, 2012 වර්ෂයේ නොවැම්බර් මාසය වනකොට 77,138කුත් වශයෙන් පොල් ගස් 1,69,953ක් සම්පූර්ණයෙන් ඉවත් කරන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ වාර්තා අනුව කියන ප්‍රමාණයම ඉවත් කරන්නට සිදු වන්නේ නැහැ. තවත් ගස් 75,000ක් පමණ ඉවත් කරන්නට සිදු වෙයි කියලා මා විශ්වාස කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති මේ රෝගී ගස් සම්පූර්ණයෙන්ම ඉවත් කරලා, මේ රෝගයේ පැතිරීම සීමා කරලා තිබෙනවා; පාලනය කරගෙන තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේත් රෝගී ගස් 552ක් තිබුණා. ඒවාත් ඉවත් කරලා, පසු ගිය මාසය වනකොට මාතර දිස්ත්‍රික්කයේත්, ගාල්ල දිස්ත්‍රික්කයේත් සම්පූර්ණයෙන් ඒ රෝගය පාලනය කරලා තිබෙනවා. අපි මේ වෙනකොට දෙවිනුවර, මාතර, වැලිගම, දෙනිපිටිය වැනි ප්‍රදේශවල ඇති මේ රෝගය පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. ඒ ප්‍රදේශවලට විශාල කණ්ඩායමක් යොදවලා මේ රෝගය පාලනය කරන්න කටයුතු කරගෙන යන බව විශේෂයෙන්ම මතක් කරන්නට කැමැතියි.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ සඳහන් කළ පරිදි, දිවයිනේ දකුණු ප්‍රදේශයේ පැතිරී ඇති පොල් කොළ මැලවීමේ හා පොල් කොළ කුණු වීමේ රෝගය මර්දනය කිරීමටත්, රෝගී ගස් සලකුණු කිරීමටත්, ගස් ඉවත් කිරීමටත්, ඒ සඳහා වන්දි ලබා දීමටත්, විකල්ප ආදායම් සඳහා අතුරු බෝග වගා කිරීමටත්, මේ රෝගයට ඔරොත්තු දෙන කොළ කුන්දිරා වර්ගයේ පොල් පැළ ලබා දීමටත් කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා ලබන වර්ෂය වෙනුවෙන් මේ සඳහා රුපියල් මිලියන 200ක් අපට වෙන් කර දීලා තිබෙන බවත් සන්තෝෂයෙන් මතක් කරන්නට කැමැතියි.

අපි මේ රෝගය ගැන විදේශ රටවලිනුත් විමසා බැලුවා. ඉන්දියාවේත් මේ රෝගය තිබෙනවා. මේ රෝගය හරියට ඒඩ්ස් රෝගය වාගෙයි. මැරෙනතුරු හොඳින් ඉන්නවා. නමුත් බෙහෙත් නැහැ; ප්‍රතිකාර නැහැ. Phytoplasma රෝගයක් නිසා තමයි මේ තත්ත්වය තිබෙන්නේ. ඉන්දියාවේ Cochin International Airport එකේ ඉඳලා කිලෝ මීටර් 200ක් විතර දුරට මා ගියා. සම්පූර්ණයෙන්ම ඒ ප්‍රදේශයේ මේ රෝගය ව්‍යාප්ත වෙලා තිබුණා. ඉන්දියාවේ විශේෂඥයන්ගෙන් මා ඒ ගැන ඇහුවාම කිව්වේ, "දැන් කරන්න දෙයක් නැහැ, මේ රෝගයට ප්‍රතිකාර නැහැ, දැන් මේ ගස් ඉවත් කරලා රෝගය පාලනය කරන්නත් කාලයක් නැහැ, ඒ නිසා අපි රෝගයත් එක්කම ජීවත් වෙනවා" කියලා යි. ඒ වාගේම ඒ රෝගයට react කරන ප්‍රභේද හඳුන්වා දෙන්නට ඒ අය කටයුතු කරන බව මතක් කරන්නට ඕනෑ. මේ රෝගය සම්බන්ධව අපි කලින් දැනගත් නිසා රට පුරාම ව්‍යාප්ත වෙන්නට ඉඩ නොදී කටයුතු කරන්න අපට වාසනාව ලැබිලා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්ති තුළින් වැවිලි ක්ෂේත්‍රයේ නව පුනරුදයක් ඇති කිරීම වෙනුවෙන් ගත් ඉදිරි පියවරක් ලෙස 2010 වර්ෂයේ දී පොල් සංවර්ධනය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටෙව්වා. ඒ වාගේම අපේ ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපට විශාල අභියෝගයක් වුණේ පොල් මිල පාලනයන කර ගැනීමයි. ඒ වාගේම අපි 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය සඳහා වූ ක්‍රමෝපාය සැලැස්මක් සකස් කර, එය 2011 වර්ෂයේ දී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර අනුමත කර ගත් බව විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. පොල් ගස් ප්‍රමාණය වැඩි කිරීමටත්, කුඩා ඉඩම් හිමියන් ප්‍රජා මූල සංවිධානගත කර පොල් ඵලදාවේ වැඩිම දායකත්වයක් දරන ඔවුන් මේ සඳහා යොමු කරන්නත්, ඒ වාගේම අතුරු බෝග වගා කරන්නත් විශේෂ අවධානයක් යොමු කරන්නට බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සඳහන් කරන්නට ඕනෑ, 2011 වසරේ සිට 2016 දක්වා වූ කාලය තුළ පොල් පැළ මිලියන 32ක්, එනම් තුන්කෝටි විසි ලක්ෂයක් වගා කරන්නට අපි සැලසුම් කර තිබෙන බව. පසු ගිය අවුරුද්දේ පැළ ලක්ෂ 40ක් වගා කළා. මේ අවුරුද්දේ පැළ ලක්ෂ 90ක් අපි සකස් කරලා තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ නායකත්වයෙන් "දිවි නැඟුම" වැඩසටහන ඔස්සේ පැළ ලක්ෂ 40ක් වගා කරන්නට අපි අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඉදිරි පැළ ප්‍රමාණය අපි "කප්රුක පුරවර" වැඩසටහන සහ "කප්රුකයි සිප්නැණයි" වැඩසටහන ආදී වැඩසටහන් තුළින් ලබා දීමට කටයුතු කරන බවත් මතක් කරන්නට කැමැතියි.

විශේෂයෙන්ම තමුන්නාන්සේලා සඳහන් කළා වාගේ විවිධ රෝග සහ පොල් මයිටාවන් සඳහා විශේෂ ප්‍රතිකාරයක් තිබුණේ නැහැ. ඒ කාලයේ පොල් වගා කිරීමේ මණ්ඩලයේ නිලධාරින් කිව්වේ, දැවි තෙල්වලට ගෙන්දගම් කුඩු කලවම් කරලා පොල් ගහේ කරටියේ ගාන්න කියලායි. ඒක ප්‍රායෝගිකව කරන්න බැහැ. ඒ නිසා ඒ මයිටාවන් විනාශ කරන විලෝපීය මයිටාවෙක් අපි හඳුනා ගත්තා. ඒ මයිටාවන් බෝ කිරීම සඳහා විද්‍යාගාර 20ක් හදන්න අපි කටයුතු කරලා තිබෙනවා. දැනටමත් අපි විද්‍යාගාර 11ක වැඩ අවසන් කරලා තිබෙනවා. අපි ක්‍රමක්‍රමයෙන් ඒ අත්හදා බැලීම් කටයුතු කරගෙන යනවා. මේ තත්ත්වය ඉතාම සාර්ථක වෙලා තිබෙන බව අපට වාර්තා වෙලා තිබෙන බව සඳහන් කරන්න කැමැතියි.

මම මුලින් සඳහන් කළා වාගේ, අප වගා කිරීමට බලාපොරොත්තු වන පොල් පැළ මිලියන 32න් මේ අවුරුද්ද වන විට මිලියන 13ක් නිෂ්පාදනය කිරීමේ වැඩ අවසන් කරලා බෙදා දීම් කරනවා. ඉතිරි ප්‍රමාණය නිෂ්පාදනය කිරීම අපි 2014 වන කොට අවසන් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. ඒ සඳහා අපි 2016 වෙන තුරු ඉන්නත් බලාපොරොත්තු වෙන්නේ නැහැ. ලබන අවුරුද්දේ පැළ 95 ලක්ෂයකුත්, ඊ ළඟ අවුරුද්දේ පැළ 95 ලක්ෂයකුත් වගා කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා මේ උත්තරීතර සභාවේදී සඳහන් කළ ආකාරයටම 2016 වර්ෂය වන කොට පොල් ගෙඩි 1,003,650ක් නිෂ්පාදනය කරන්න හැකියාව ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම 2020 වර්ෂය වෙන කොට පොල් ගෙඩි මිලියන 4,200ක් දක්වා වැඩි කරන්න සැලසුම් සකස් කරලා අවශ්‍ය කටයුතු කරගෙන යන බව මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම ගිය වසරවලට වඩා -2010, 2011 වසරවලට වඩා- 2012 වසරේ අපේ රටට විශාල අපනයන ආදායමක් ලැබෙමින් පවතිනවා. විශේෂයෙන්ම අපි නව පොල් ප්‍රභේද හඳුනාගෙන තිබෙනවා. පසු ගිය 12වැනි දා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පොල් දිනය සැමරීමේ උත්සවයේදී අපි නව පොල් ප්‍රභේද වර්ග දෙකක් හඳුන්වා දුන්නා. මේ වනතුරු ප්‍රභේද හතරයි තිබුණේ. මා පොල් පර්යේෂණ ආයතනයේ නිලධාරින්ට විශේෂයෙන්ම උපදෙස් දුන්නා, ඉලක්ක අනුව වැඩ කරන්න කියලා. 2016 වෙන කොට නව පොල් ප්‍රභේද හතරක්වත් හඳුනා ගන්න කියලා ඉලක්කයක් ලබා දුන්නා. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ වන විට "කප්සෙත" සහ "කප්සුවය" නමින් රෝගවලට ඔරොත්තු දෙන අලුත් පොල් ප්‍රභේද දෙකක් හඳුන්වලා දෙන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.

ඒ වාගේම කොහු නිෂ්පාදනය ගැන සඳහන් කළා. මම අමාත්‍යාංශය භාර ගත්ත අවස්ථාවේ පිට රටින් කොහු ගෙනෙන්න විවිධ සමාගම් යෝජනා කළා. නමුත් මම ඒකට එකඟ වුණේ නැහැ. අපි මේ "කප්රුක පුරවර" වැඩසටහන ඔස්සේ ඈත දුෂ්කර සියඹලාණ්ඩුව, මුලටියන, ගොඩකවෙල, වීරකැටිය වාගේ ප්‍රදේශවල පොල් වගා කරන අයගේ පොල් ලෙලි එකතු කරලා ඒ අයට මිලක් ලබා දෙන්න, ඒ පොල් කටුවලට මිලක් ලබා දෙන්න, ඒ පොල් ඉරටුවට මිලක් ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ වාගේම ගමේ කාන්තාවන්ට පොල් කර්මාන්තය හරහා ආදායම් උත්පාදනය වන විධියේ වැඩසටහන් නිර්මාණය කරන්නත් අපි අවශ්‍ය පියවර ගත්ත බව මතක් කරනවා. විශේෂයෙන්ම ඒ සඳහා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අපට විශාල සහායක් දුන්නා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා අපේ වැඩසටහන දිරිමත් කළා. ඒ දිරිමත් කරන්න සහාය දුන්නේ කොයිතරම්ද කිව්වොත්, අද මේ යෝජනාවට විපක්ෂව කථා කරන්නවත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙකු මේ සභාවේ නැහැ.

ඒ නිසා මේ කටයුතුවලට සහාය වෙන සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

**සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:**
சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::
Rest of the speech tabled:

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්ති තුළින් වැවිලි ක්ෂේත්‍රයේ නව පුනරුදයක් ඇති කිරීම වෙනුවෙන් ගත් ඉදිරි පියවරක් ලෙස 2010 වර්ෂයේ පොල් සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවනු ලැබූ අතර මා එම අමාත්‍යාංශයේ විෂය භාර අමාත්‍යවරයා ලෙස පත්කරනු ලැබිණ. අමාත්‍යාංශය ආරම්භයේදීම 2010 වසරේ පොල් අස්වැන්න අඩුවීම නිසා ඇතිවූ පොල් මිල ඉහළයාම මා ඉදිරියේ වූ විශාලම අභියෝගය විය. මාස කිහිපයක් තුළ වෙළඳපල කළමනාකරණය කිරීමෙන් පොල් මිල ඉහළයාම පාලනය කළ අතර එම අවස්ථාවේදීම ඉදිරියේදී මෙවැනි මිල වැඩිවීමක් නොවීමට වගබලා ගැනීම සඳහා පොල් වගාව නැංවීමට මහින්ද චින්තන ප්‍රතිපත්ති අනුව යමින් ජාතික පොල් සංවර්ධන සැලැස්ම අප අමාත්‍යාංශය විසින් සකස් කොට 2011 වසරේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව එහි අඩංගු ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කලා. මෙම සැලැස්මෙන් මූලික ඉලක්ක 08ක් හඳුනාගත් අතර රටේ ආහාර හා කර්මාන්ත ඉල්ලුම සපුරා ගැනීම සඳහා 2016 වසර වන විට සමස්ත පොල් නිෂ්පාදනය වසරකට ගෙඩි මිලියන 3650 දක්වා වැඩි කිරීමත්, ප්‍රමාණවත් පොල් ඵලදාවක තිරසාරභාවය තහවුරු කරගැනීම සඳහා පොල් ගස් ප්‍රමාණය වැඩිකිරීමටත්, කුඩා ඉඩම් හිමියන් ප්‍රජා මූල සංවිධාන ගත කර පොල් ඵලදාවේ වැඩිම දායකත්වයක් දරණ ඔවුන් මේ සඳහා යොමුකර වැඩි වැඩියෙන් අවස්ථා ජනිත කර දිළිඳුකම පිටුදැකීමත්, සත්ව පාලන අතුරු භෝග වගාකිරීම හරහා පොල් ඉඩම්වල ඵලදායිතාවය හා ආදායම වැඩිකිරීමත්, පරිසර හිතකාමී සහ ආර්ථික වශයෙන් ඵලදායී වන කර්මාන්ත ඇතිකිරීමත්, වැඩි වැඩියෙන් විදේශ විනිමය උපයාගැනීම සඳහා පොල් නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමත්, නව තාක්ෂණ ක්‍රම ඇති කිරීම හා පවත්නා තාක්ෂණය වැඩි දියුණුකිරීමත්, පොල් ආශ්‍රිත කර්මාන්තවල විවිධාංගීකරණයක් ඇති කිරීමෙන් ආදායමද ඉහළ නැංවීමත් මෙම ඉලක්ක 08 වේ. මෙම ඉලක්ක ළගාකර ගැනීම සඳහා මෙම සැලැස්මේ ක්‍රමෝපායන් 50 ක් පමණ හඳුනාගෙන ඇති අතර ඒ යටතේ ක්‍රියාකාරකම්ද හඳුනාගෙන වාර්ෂික සැලැස්ම යටතේ මෙම ක්‍රියාකාරකම් හඳුනාගත් ප්‍රමුඛත්ව අනුව පෙළගස්වා 2011 වසරේ සිට ක්‍රියාත්මක කරමින් පවතී. මේ අවස්ථාවේ ගරු සභාවේ දැන ගැනීම සඳහා අප අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති කිහිපයක් ගැන විස්තර කරන්නට මම කැමතියි. අතිගරු ජනාධිපතිතුමා 2011 වසරේදී පොහොර සහනාධාරය පොල් සඳහාද ලබාදුන් අතර මෙම සහනාධාරය නිසි ලෙස වගාවට යොදා ගනිමින් පසෙහි සරුබව වැඩිකිරීම සහ පෝෂණ ඌනතාවයන්ට පිළියම් යෙදීම මඟින් පොල් අස්වැන්න වැඩිකර ගැනීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය හා පෞද්ගලික අංශයද සහභාගි කරගනිමින් වාර්ෂික පුහුණු වැඩසටහන් හා ජංගම තාක්ෂණ සේවා දිවයින පුරා පවත්වාගෙන යාමට කටයුතු කරගෙන යනවා. එමෙන්ම පොහොර භාවිතයේ උපරිම ප්‍රයෝජන ලබාගැනීමට පොල් ඉඩම්වල තෙතමන සංරක්ෂණය, වැසි ජල සංරක්ෂණය හා ජල සම්පාදනය උනන්දු කිරීමටද එමෙන්ම කෘමි උවදුරු හා රෝග වලින් සිදුවන හානිය අඩුකරගැනිම වෙනුවෙන්ද මෙම ආයතන දෙක විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් ගම් මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවතිනවා. තවද අලුතින් පොල් ප්‍රභේද හඳුනාදීමෙන්ද සුදුසු තාක්ෂණ ක්‍රම ප්‍රචලිත කිරීම තුළින්ද පොල් අස්වැන්නේ වැඩිවීමක් අපේක්ෂා කෙරේ. පසුගිය ඔක්තෝබර් 12 වෙනි දින ජාත්‍යන්තර පොල් දිනය සැමරීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයේදී පොල් පර්යේෂණ ආයතනය විසින් අලුතින් සොයාගත් පොල් වර්ග 02 ක් කප්සුවය සහ කප්සෙත යන නම්වලින් දොරට වැඩවීම කලා. ඉහල ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙන් සමස්ත පොල් නිෂ්පාදනය 20% කින් පමණ වැඩිකරගත හැකි අතර ගිය වසරේ වාර්ෂික ඉලක්කය ඉක්මවා පොල් ගෙඩි මිලියන 2808 ක වාර්ෂික ඵලදාවක් ලබාගත් අතර මෙම වසරේ අයහපත් කාලගුණයක් පැවතියද පොහොර සහනාධාරය ක්‍රියාත්මක කිරීම තුළින් අප අපේක්ෂා කළ ගෙඩි මිලියන 2900ක වාර්ෂික ඉලක්කය ළගාකර ගැනීම අපහසු නොවන බව මගේ හැඟීමයි. එමෙන්ම මෙම පොල් ඵලදාව දීර්ඝකාලීනව පවත්වාගෙන යාම සඳහා 2016 වන විට පොල් පැළ මිලියන 32 ක් වගා කිරීමට අමාත්‍යාංශය විසින් වැඩසටහන් කීපයක් යටතේ කටයුතු කරමින් පවතිනවා. මෙහිදී කප්රුක පුරවර වැඩසටහන යටතේ අක්කර 05 දක්වා නොමිලේ පැළ ලබාදීමත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක වන දිවි නැගුම වැඩසටහන හරහා අක්කර 2 ½ දක්වා කුඩා ගෙවතු සඳහා නොමිලේ පැළ ලබාදීමත් ප්‍රධාන වශයෙන් සිදුකරන අතර කප්රුකයි සිප්නැණනයි වැඩසටහන යටතේ 06 වසරේ ඉගෙනුම ලබන පාසැල් සිසුන්ට පැළ 02 බැගින් ලබාදීමත් සම්බුද්ධ ජයන්ති වැඩසටහන යටතේ විහාරස්ථාන 2600 ක පැළ සිටුවීමත් පසුගිය 2011 වසරේ සිට ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව මෙම වසරේ මෙම වැඩසටහන හරහා ලබාදීම සඳහා පොල් පැළ මිලියන 09 ක් දැනටමත් සූදානම් කර තිබෙනවා. පසුගිය මාස කිහිපය තුළ පැවති වියළි කාලගුණය නිසා බොහෝ පළාත්වල පොල් පැළ ලබාදීම සිදු නොකළ අතර වැසි ලැබීමත් සමඟ මෙම වැඩසටහන යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා පොල් පැළ ලබාදීම වේගවත් කර තිබෙනවා. මෙය තවදුරටත් වේගවත් කරගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ජන්ම දිනය සහ පදවි ප්‍රාප්තියේ 07 වන වසර සම්පූර්ණ වූ පසුගිය 18 දින

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

පොල් පැළ දශ ලක්ෂයක් කප්රුක පුරවර ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 60 ක පමණ හඳුනාගත් සමෘද්ධි කොට්ඨාශයක බෙදාදීම ආරම්භකලා. ඒ අනුව ඉදිරි සති දෙකක කාලය තුළ මිලියනයක පමණ පොල් පැළ මෙම වැඩසටහන යටතේ ලබාදීමට සූදානම් කර තිබෙනවා. සමස්ත පොල් අස්වැන්නට 70% කටත් වඩා දායකත්වයක් දරන්නේ කුඩා පොල් වතු හිමියන්ය. එම නිසා වඩා හොඳ පොල් අස්වැන්නක් ලබාගැනීම ඔවුන් දිරිමත් කිරීමට අවශ්‍යවනවා. ඒ සඳහා ඇති කළ වැඩසටහන තමා කප්රුක පුරවර වැඩසටහන. එය ගිය වසරේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 22 කින් ආරම්භ කර දැනට ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 62 ක් ආවරණය කරමින් සමිති 2600 ක් පමණ පිහිටුවා තිබෙනවා. 2016 වන විට ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 180 ක මෙම සමිති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට සැලසුම් කිරීමට අදහස් කර ඇති අතර වැඩසටහන යටතේ 2016 වනවිට සමිති 7200 ක් සම්පූර්ණයෙන් පිහිටුවීමට කටයුතු කරනවා. පොල් අස්වැන්න වැඩි කරගැනීමට අමතරව ගොවි පවුල්වල ආදායම ඉහළ නැංවීමත් ප්‍රජා තවාන් ඇතිකිරීමත් පෞද්ගලික අංශය හා ඒකාබද්ධව නව කර්මාන්ත ඇති කිරීමත් එම නිෂ්පාදන සඳහා වෙළඳපල ඇති කිරීමත් මේ යටතේ යෝජිත අනෙකුත් ක්‍රියාකාරකම් වෙනවා. පොල් වගාව සඳහා කාබනික පොහොර භාවිතා කිරීම ප්‍රචලිත කිරීමටද අමාත්‍යාංශය මෙම සැලැස්ම යටතේ හඳුනාගෙන ඇති අතර මෙම වසරේ අයවැයෙන් අතිගරු ජනාධිපතිතුමා මේ සඳහා රුපියල් මිලියන 100ක කාබනික පොහොර සහනාධාරයක් ලබාදීම තුළින් ලබන වසරේ සිට එම ව්‍යාපෘතියද ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය දැනටමත් සැලසුම් සකස් කරමින් පවතිනවා. මෙම ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් පොල් අස්වැන්න වැඩිකිරීමට ක්‍රියාත්මක වෙමින් පවතින අතරතුර අයහපත් කාළගුණයත් විවිධ රෝගාබාධත් අපේක්ෂිත පොල් අස්වැන්න ලබාගැනීමට ප්‍රධාන තර්ජනයක් ලෙස දක්වන්න පුළුවන්. එහිදී ප්‍රධාන වශයෙන් මයිටා උවදුර, රතු හා කළු කුරුමිණි හානි ප්‍රධාන වශයෙනුත් වේයන්ගෙන් සිදුවන හානි, මීයන් හා අනෙකුත් සතුන්ගෙන් සිදුවන හානි කුඩා ප්‍රමාණයෙනුත් සිදුවේ. මෙම හැම රෝගයකටම වඩා

වැලිගම ආශ්‍රිතව පැතිරී ප්‍රදේශ ගණනාවකට පැතිර ගිය ගොබ කුණුවීමේ රෝගය පොල් ගසට හැදෙන මාරාන්තික රෝගයකි. ආරම්භයේදී ගස් ලක්ෂ 03ක් පමණ ප්‍රමාණයකට මෙම රෝගය පැතිර ඇතැයි ඇස්තමේන්තු කලද දැනට එම ප්‍රමාණය ලක්ෂ 02කට නොවැඩි බව සොයාගෙන ඇති අතර හම්බන්තොට දිස්ත්‍රික්කය රෝග මුක්ත කලාපයක් ලෙස දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අතර ගාල්ල දිස්ත්‍රික්කයේ රෝගය පැතිරීම සම්පූර්ණයෙන්ම වාගේ පාලනය කර ඇති අතර මාතර දිස්ත්‍රික්කයේ රෝගී ගස් ඉවත් කිරීම කඩිනම් කිරීම මඟින් රෝගය පැතිරීම වැළැක්වීමට කටයුතු කර තිබෙනවා. මේ සඳහා ප්‍රදේශවාසී ජනතාවගෙන් ලැබෙන සහයෝගය අපි ඉතා අගය කොට සලකනවා. අතිගරු ජනාධිපතිතුමා විසින් 2011 වසර මුලදී පොල් වගාවට ලබාදුන් පොහොර සහනාධාරය නිසා අයහපත් කාලගුණ තත්වය හා වැලිගම ගොබ කුණුවීමේ වැනි රෝග තත්වයන් තිබියදීත් මේ වසරේ ඉලක්කගත අස්වැන්න වන ගෙඩි මිලියන 2900 ක ඉලක්කයට යාමට හැකිවේ යැයි බලාපොරාත්තු වෙන අතර 2016දී අප බලාපොරොත්තුවන ගෙඩි මිලියන 3650ක ඉලක්කයද ලෙහෙසියෙන්ම ළගාකරගත හැකි බව මගේ විශ්වාසයයි.

*එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.30ට, 2012 නොවැම්බර් 15 වන දින සභා සම්මුතිය අනුව, 2012 නොවැම්බර් 24 වන සෙනසුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது, பி.ப 6.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2012 நவம்பர் 15ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2012 நவம்பர் 24, சனிக்கிழமை மு.ப.9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 6.30 p.m.,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly at 6.30 p.m. until 9.30 a.m. on Saturday, 24h November, 2012, pursuant to the Resolution of Parliament of 15th November, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.